# THE ADVENTURE AT THE LIGHT HOUSE

# ප්‍රදීපාගාරයේ වික්‍රමය

සහ තවත්
ෂර්ලොක් හෝම්ස් කථා



චන්දන මෙන්ඩිස්

www.sinhalaelibrary

# ප්‍රදීපාගාරයේ වික්‍රමය

සහ තවත්
ෂර්ලොක් හෝම්ස් කථා

අසංක්ෂිප්ත පරිවර්තනය
**චන්දන මෙන්ඩිස්**

**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**
141/2, දුව් පාර, බැද්දගාන, කෝට්ටේ





ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්

www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

මෙම ග්‍රන්ථයට ඇතුළත් වන්නේ පහත සඳහන් කථාන්තරවල සිංහල පරිවර්තන ය.

1. THE CASE OF VANDERBILT AND THE YEGGMAN
2. THE FATE OF ISADORA PERSANO
3. THE ADVENTURE AT THE LIGHT HOUSE
4. THE REPULSIVE STORY OF THE RED LEECH
5. SIR RAYMOND THURSTON MURDER



# පටුන


1. වැනැම් හි හැටඹුව 9
2. ඉසදෝරා පර්සානෝ අබිරහස 54
3. ප්‍රදීපාගාරයේ වික්‍රමය 87
4. රතු කූඩැල්ලා 139
5. උපන්දින සාදය 185




www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print





# චැතම්හි ගැටලුව

'95 අවුරුද්දේදී මගේ මිතුරු ෂර්ලොක් හෝම්ස් මහතාගේ අවධානය යොමුකිරීමට සිදුවූ තවත් සිද්ධියක් ජූනි මාසයේදී ඇතිවිණි. කැනරි කුරුල්ලන් ඇතිකළ විල්සන්ගේ මරණයට ටිකකලට පසු, අපි මේ සිද්ධියට මුහුණදුන්නෙමු. එක් දිනක් මගේ ගිලානාගාරය වෙත ලැබුණු විදුලිපුවතක මෙසේ සඳහන් විය.

**"අද හවස දෙකයි තිහට බේකර් වීදියට එන්න. සිත් ඇදගන්නා පරීක්ෂණයක් ලැබීමට නියමිතයි.**

**එස්.එච්."**

හැටිහැටියේම මා කැඳවමින්, මගේ මිත්‍රයා එවන මෙවැනි විදුලිපුවත්වලට, මේ වනවිට මම පුරුදු වී සිටියෙමි. එද සවස්වරුවේ ගිලානාගාරයේ වැඩකටයුතු කිරීම සඳහා, හිතවත් වෛද්‍යවරයෙකු ගෙන්වා ගැනීමට මට හැකිවිය. කුලීරියක නැගී මම ප්‍රමාද නොවී බේකර් වීදියට ගියෙමි. සිතේ සතුට සමග ඇතිවුණු උද්දාමයෙන්, හෝම්ස් කාමරයේ ඉහළ පහළ සක්මන් කරමින් සිටි අයුරු මම දුටුවෙමි.

"මගේ හිතවත් වොට්සන්" ඔහු කීවේ මා විසිත්ත කාමරයට ඇතුළුවෙද්දීය. "ඔබට එන්න හැකිවීම ගැන මට හරි සන්තෝෂයි. අද උදේ තමයි මට මේ පරීක්ෂණය හම්බවුණේ. බොහොම සිත්ගන්නාසුලු එකක්. ඔබට මතකද, වොට්සන්, ලන්ඩන් නගරයෙන් පිට ගම්බද පළාත්වල එක දිගට සිදුවුණු, එකම පිළිවෙළේ ගෙවල් බිඳීම් කීපයක් ගැන මං ඔබට කිව්වා? ඔබට මතක නැද? අර දුර්ලභ වටිනා කලාකෘති හොරකම් කළ අවස්ථා ගැන? දැන් මතකයි වගේ. හෝ හෝ! එහෙනම් කියවලා බලන්න මේ ලියුම" ඔහු ලිපියක් මගේ අතේ තැබුවේය.



Reading Purpose Only, Not For Print
www.sinhalaelibrary.com

ඔයිටස්ටෝන් මන්දිරය
ලිට්ල් වෝල්ඩන්,
සමර්සෙට්.

ගිනවත් ෂර්ලොක් හෝම්ස් මහතාණෙනි,

දින දෙකකට පෙර මගේ නිවස ගෙවල් බිඳුමකට ලක්විය. මගේ පරම්පරාවේ මුතුන් මිත්තන්ගෙන් මට උරුම වී තිබූ වටිනා භාණ්ඩ කිහිපයක් හොරුන් විසින් රැගෙන ගොස් ඇත. මේ පළාතේ පොලිසිය මගින් මේ ගැන පරීක්ෂණයක් අරඹන ලදී. එහෙත් කිසිදු හෝඩුවාවක් සොයාගැනීමට, ඔවුන් මේ දක්වාත් සමත්වී නැත. ඔවුන්ගේ දක්ෂතාවය ගැන තවදුරටත් මගේ විශ්වාසයක් නොමැත.

පොලිසියට විසඳීමට නොහැකි මෙවැනි සංකීර්ණ ගැටලු විසඳීමට, ඔබ සතු දක්ෂතාවය ගැන මට අසන්නට ලැබිණ. එහෙයින් මේ ගැන සොයාබැලීම ඔබට භාරගත හැකි නම් මම අතිශයින්ම කෘතඥවෙමි. මේ ගැන වැඩිදුර කතාබස් කර ගැනීමට අඟහරුවාද සවස් තුනට ඔබේ නිවසට පැමිණීමට මම බලාපොරොත්තු වෙමි. ස්තුතියි.

මෙයට අවංක,
සර් මැක්ස්වෙල් මුවුන්.

"දැන් මෙන්න මෙක කියවලා බලන්න වොට්සන්" ලිපිය මගේ අතින් උදුරාගෙන, හෝම්ස්, "ස්ක්‍රැප්" පොතක් මගේ දෑතට තල්ලු කළේය. පුවත්පත්වල ඔහුගේ සිත් ඇදගැනීමට සමත් වූ පුවත්ති කපා පොත්වල අලවා, "ස්ක්‍රැප් පොත්" සකස්කිරීම හෝම්ස්ගේ සිරිතක් විය.

එම පිටුවේ පුවත්පත් කොටස් හතක් විය. පසුගිය අවුරුදු දෙකක කාලය තුළ, රටපුරා තිබුණ ප්‍රභූ මන්දිරවලින් කළ සොරකම් පිළිබඳව එහි සඳහන් විය. ඒවා කියවීමට මම උත්සාහ කළෙමි. එහෙත් මගේ මිතුරා පිටිපසින් පැමිණ, තම අදහස් පළකිරීමට පටන්ගත් නිසා, පුවත්ති කියවා බැලීමට මට අවකාශයක් නොලැබිණ.

"ඔබට පෙනෙනවාද මං දන්නේ නෑ වොට්සන්" හෝම්ස් කීය. "මේ හැමතැනකදීම අපරාධය සිදුකරල තියෙන්නේ එකම පිළිවෙළකට, ඔහු අනුගමනය කරල තියෙන්නේ එකම රටාව කියල





කිව්වොත් නිවැරදියි. හැමඑකක්ම රාත්‍රී කාලයේ නිවසට හොරෙන් ඇතුළුවී කළ සොරකම්. හැමඑකක්ම සිදුවෙලා තියෙන්නේ ගිම්හාන සෘතුවේ. හැම අපරාධයකටම ගොදුරුවෙලා තියෙන්නේ, ලන්ඩනයට සමීප ගම්මානවල පිහිටි ප්‍රභූනිවාස. විශාල ප්‍රමාණයේ සිතියමක, මං මේ තැන් හොඳින් අධ්‍යයනය කරල බැලුවා. මේ හැම තැනක්ම තියෙන්නේ ප්‍රධාන දුම්රිය මාර්ගයක. දුම්රියපොළක ඉඳලා හැතැක්ම තුනක් හෝ ඊට අඩු දුරක. වෙනත් විදියකින් කියනවා නම්, පයින් යන දුරක. මේ හොරකම් සිදුකරලා තියෙන්නේ ඉතා සූක්ෂ්ම, කපටි මොළයක් ඇති කෙනෙක්. ඒ මොකද මේ හොරකම් සිදුවෙද්දී, ඒ ගැන එකම ගෙදරක අයවත් දැනගිටියේ නැහැ. ගෙවල් දෙකක්ම ඔවුන්ගේ ආරක්ෂාවට ඇති කළ බල්ලන් හිටියා. නමුත් ඒ බල්ලන් බුරන්නටම, නිදිබෙහෙත් යෙදූ මස් කෑමට දීලා, උන් නිහඬකර තිබෙනවා.

මේ අපරාධකාරයා හෝ අපරාධකාරයින්ගේ තවත් පුදුමාකාර ගුණාංගයක් ඉස්මතුවෙලා පෙනෙනවා. ඒ තමයි, ඔවුන් සොරකම් කරන්නේ එක්තරා තෝරාගත් බඩු කිහිපයක් පමණයි. ඔවුන් ගන්නේ කලාත්මක සහ ඓතිහාසික වටිනාකමක් ඇති දුර්ලභ භාණ්ඩ පමණයි. රිදීපිඟාන්, මුතුමැණික්, ස්වර්ණාභරණ කිසිවක් ඔවුන් සොරකම් කරන්නේ නෑ. ඒවාට අතක් තියලවත් නෑ. මට හොඳටම විශ්වාසයි අපට මුහුණදෙන්න වෙලා තියෙන්නේ, ලන්ඩනයේ පදිංචි බොහොම දක්ෂ, පළපුරුදු හොර තක්කඩියෙකුට ය කියල. ඔහු මේ අපරාධ කිරීමට යන්නේ දුම්රියෙන්. ඒ සඳහා යොදාගන්නේ කාගේ කුමන මන්දිරයද කියන එක ඔහු තීරණය කරන්නේ, තෝරාගන්නේ හොඳින් හිතා බලලා"

"ඒ වුණත් පොලිසිය කියන්නේ ඔවුනට කිසිම හෝඩුවාවක් ලැබිල නැති බවයි." මා කීවේ සර් මැක්ස්වෙල්ගේ ලිපිය පෙන්වමිනි.

"හූ" හෝම්ස් කීවේ පොලිසිය ගැන තම අප්‍රසාදය පළකරන ගමනිනි. "ඔවුන් දන්නෙ නෑ බලන්න ඕන කොහේද කියලා. මේ හොරකම් ගැන මං මගේ අවධානය යොමුකරල තිබුණේ, මාස ගණනක් කලින් සිට. මේකට ගොදුරුවුණු කවුරු හරි කෙනෙක් මගෙන් උදව් ඉල්ලාවි කියලා මට හිතිලා තිබුණා. දැන් මන්න මගේ වෙලාව ඇවිත්. මං කියන දේ විශ්වාස කරන්න වොට්සන්. මේ



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

හොර තක්කඩියා කවුරු වුණත්, ඔහු ඉතාම බුද්ධිමත් කෛරාටික පුද්ගලයෙක්. මගේ තීක්ෂණ නුවණ යොදවලා, ඔහුගේ තීක්ෂණ නුවණ පරාජය කරන්න පුළුවන්ද කියලා බලන්න මේක හොඳ අවස්ථාවක්. මං ඒ අභියෝගය භාරගන්නේ බොහොම සන්තෝෂයෙන්"

හෝම්ස් තම දෑත් එකට පිරිමදිමින්, කාමරයේ ඉහළ පහළ වේගයෙන් සක්මන් කරන්නට පටන්ගත්තේය. ඒ ඔහුගේ සිතේ ඇතිවී තිබූ දැඩි උද්යෝගය නිසා බැව් මම තේරුම් ගතිමි. තමාට විසඳීමට තවත් ගැටලුවක් ලැබෙන නිසා, මගේ මිත්‍රයා සිටියේ සතුටෙන් මෙන්ම නොඉවසිල්ලෙනි. ඔහුගේ සක්මන නැවතුණේ, කවුරුන් හෝ පැමිණි බව සංඥා කරමින් අප නිවසේ සීනුව නාදවූ පසු ය.

"වොට්සන්! වෙලාව හරියටම හතයි. ඒ ඔහු වියයුතුයි"

අපේ සේවක ළමයා වූ බිලි විසින් අමුත්තා උඩුමහලේ විසිත්ත කාමරය වෙත කැඳවාගෙන එන ලදී. සර් මැක්ස්වෙල් බුවුන් සෞඛ්‍ය සිරුරක් තිබූ මැදිවියේ කෙනෙකු බව පෙනිණ. රතු පැහැති මුහුණක් තිබූ ඔහු, වෙනත් දේ කථාවට කාලය ගත නොකොට කෙළින්ම කාරණයට පිවිසියේය. "හෝම්ස් මහත්මයා" ඔහු කීය. "ඔබේ හා මගේ වටිනා කාලය නාස්තිකරමින් නිකරුණේ දොඩවන්න මං කැමති නෑ. හොරකම සිදුවුණේ මෙන්න මේ පිළිවෙළටයි.

උන් ගෙදර ජනේලයක් ඇරගෙන ගෙට ඇතුළුවෙලා. ඒක වෙලා තියෙන්නෙ සිකුරාදා ර... නැත්නම් සෙනසුරාදාට එළිවෙන පාන්දර. මට වත් ගෙදර හිටි වෙන කිසිකෙනෙකුටවත් කිසිම ශබ්දයක් ඇහුණෙ නෑ. සේවකයන්ට ඒ ශබ්ද නොඇහුණු එකේ පුදුමයකුත් නෑ. ඒ මොකද ඔවුන් නිදාගන්නේ මැදුරේ නැගෙනහිර පැත්තේ අංගනයේ. හොරකම සිදුවුණු විසිත්ත කාමරය තියෙන්නේ බටහිර පැත්තේ අංගනයේ. මගේ කාමරය පිහිටි කොටස තියෙන්නේත් ඈතින්.

උන් ඒ විසිත්ත කාමරයේ වීදුරු ජනේලයක, අගුල කිට්ටුවෙන් වීදුරුවේ කෑල්ලක් කපලා. එතැනින් ඇතුළට අත දමලා, අගුල ඇරලා, ජනේලයත් ඇරගෙන. එතැනින් තමයි හොරා ගේ ඇතුළට පැනගෙන තියෙන්නේ. හොරකම් කරගෙන ගිහින් තියෙන්නේ ඒ කාමරයේ තිබුණු බඩු"





"ඔබ කියන්නේ හොරකම් කරගෙන ගියෙන බඩු හැම එකක්ම හුගක් වටිනා ඒව කියලද?" හෝම්ස් විමසුවේය. "කලාත්මක හෝ දුර්ලභ පෞරාණික බඩුද?"

සර් මැක්ස්වෙල් පුටුවෙන් ඉහළට එසවුණේ මවිතයට පත්වය.

"දෙයියෝ සාක්කි! ඔබ කොහොමද හෝම්ස් මහත්මයා ඒක දන්නෙ? ඒත් ඔබ කියූ දේ ඇත්තයි. ඒ හැමදෙයක්ම අයෙමන් කොහෙන් හරි මිලට ගන්න පුළුවන් දේවල් නෙමෙයි. මගේ පරම්පරාවෙන් මට උරුමවුණු ඉතාම දුර්ලභ මිල කළ නොහැකි දේවල්. නිකොලස් හිලියාඩ් විසින් සිතුවම් කරන ලද, මගේ මුත්තාගේ කුඩා ප්‍රමාණයේ චිත්‍රයක්. ස්කොට්ලන්තයේ සුප්‍රසිද්ධ රජින - මේරි රැජිනට අයත්ව තිබූ යාච්ඤා පොතක්. ඒකෙ පිටකවරයට මුතුඇට අල්ලා හැඩවැඩ කර තිබුණා. ඇරගන්ති සුප්‍රකට කැතරීන් ඇගේ පෞද්ගලික ප්‍රාසාදයේ තබා තිබූ රන් කුසලානයක්. මේවායේ මිල මෙච්චරයි කියා කියන්න බැරිවා තරමක් නෙමෙයි. මේවා ලෝකයේ වෙන කොහෙන් හෝ සොයාගන්නට බැහැ. මෙහැනදී මට හිතාගන්න බැරි පුදුමය කියන්නේ, තවත් සමහර බඩුවලට හොරු අත තියලාවත් නැහැ. කෑමකන කාමරයේ තිබූ රිදී පිගන් හා හැන්ද ඒ සමහරක්"

"ඔබතුමාගේ විස්තරයේ හැටියට මං තේරුම්ගත්තේ මෙයයි" හෝම්ස් කීය. "සොරකම් කරගෙන ගිහින් තියෙන බඩු ඔක්කොම ප්‍රමාණයෙන් කුඩා ඒවා. ඒ නිසාම පහසුවෙන් ගෙන යා හැකි ඒවා. එහෙම නේද?"

"ඒක ඇත්ත හෝම්ස් මහත්මයා. ඒය හැමදෙයක්ම කුඩා ගමන්මල්ලක දමාගෙන යන්න පුළුවනි. මං තවත් කරුණක් මෙහිදී මතක් කළ යුතුයි. හොරකම් කරගෙන ගොස් තිබෙන මේ පෞරාණික දේවල් කිසිවක්, මං කාටවත් පෙනෙන විදියට තබා තිබුණේ නැහැ. ඒවා තිබුණේ කුඩා අල්මාරි දෙකක් ඇතුළේ සුරක්ෂිතව. හොඳ වර්ගයේ සවිමත් යතුරු තහඩු ඒ අල්මාරිවල සවිකර තිබුණා. ඒවල වීදුරු කවුළුත් නැහැ. ඒකෙන් හිතාගන්න තියෙන්නේ ඒවා හොරයතුරු යොදා විවෘත කර ඇතිබව."

"හැබෑට?" හෝම්ස්ගේ දෙනෙත් වඩාත් දීප්තිමත් විය.

"හෝම්ස් මහත්මයා" සර් මැක්ස්වෙල් කීය. "ඔබ මේ ගැටලුව විසඳීම භාරගෙන, මගේ නැතිවුණු දේවල් හොයා දෙන්න



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

පුළුවන්ද? එහෙම නම් ඔබ ඉල්ලන ගාස්තුව කීයක් වුණත් කමක් නෑ. මං කැමතියි මේ කටයුත්ත ඔබට භාරදෙන්න. ඒ දේවල් හොයාදෙන්න ඔබට බැරිවුණත්, මේ තක්කඩියා අල්ලා හිරේට දමන්න ඔබ ක්‍රියාකළ යුතුයි මහත්මයා. පරණ කියමනක් තියනවා නොවැ, ඉංග්‍රීසි ජාතිකයාට තිබෙන මාලිගාව, ඔහුගේ ගෙදර කියලා. මේ විදියේ හොර තක්කඩින් නිදහසේ හැසිරෙද්දී අපි කොහොමද සැනසිල්ලේ නිදාගන්නේ?"

"සර් මැක්ස්වෙල්, ඇයි ඔබ හොර තක්කඩින් කියා සඳහන් කළේ?" හෝම්ස් ඇසීය. "මේකට එක්කෙනෙකුට වැඩි ගණනක් සම්බන්ධයි කියල ඔබට හොඳට විශ්වාසද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. මේ වැඩේට දෙන්නෙක් සම්බන්ධයි. ඇයි මම ඔවුන් බිව් වයින් ගැන සඳහන් කළේ නැද්ද? නෑ? ඒක මට අමතක වුණා. උන් ඒ හොරකම කරගෙන ගෙදරින් පිටවෙලා යන්න කලින්, මගේ වයින් එකතුවේ වටිනාම වයින් බෝතලයකුත් ඇරලා. 1867 දී ප්‍රංශයේ නිෂ්පාදනය කොට, පදම් කළ අගනාම වයින් බෝතලයකින්. උන් වීදුරු දෙකක් බිලා. ලැජ්ජා නැති හොර තක්කඩි. හිස් වීදුරු දෙක තිබුණා කෑමකන කාමරයේ."

"ඒ වීදුරු කවුරුවත් අතින් අල්ලා එහාට මෙහාට කළාද?" හෝම්ස් ඇසුවේය.

"නැහැ මහත්මයා" සර් මැක්ස්වෙල් කීය. "හොරකම ගැන දැනගත් වහාම, මං සේවකයන්ට නියම කළා කෑමකන කාමරයේ හා විසිත්ත කාමරයේ දේවල් වහලා අගුළු දමන්න. පොලිසිය ඇවිත් පරීක්ෂා කරන තුරු කිසිවක් ඉවත්කරන්න එපා කියල මං ඔවුනට කිව්වා. මේ පරීක්ෂණය භාරව ඉන්න පොලිස් පරීක්ෂකයා බිෆාන් නම් කෙනෙක්. වයින්වීදුරු සෝදිසි කර බලන්න ඔහු උනන්දුවක් දක්වූයේ නැහැ. ඒ නිසා කෑමකන කාමරය තවමත් වැහු ගමන්මයි. බිෆාන් සහ ඔහුගේ පොලිස්කාරයන් හොරකම ගැන හෝඩුවාවක් හොයන්නේ ගේ ඇතුළේ නෙමෙයි, ගෙයින් පිට. ඒ යක්කු මගේ උද්‍යානය පුරා ඇවිදලා මල්පාත්ති පාගලා විනාශකරනවා. ඉතාම දුර්ලභ ග්ලොක්සිනියා මල් වර්ගයක්, මං හරි අමාරුවෙන් හොයාගත්තා. ඒකෙ මල්පාත්ති සාද තිබුණේ මිදුලේ. පොලිස්කාරයන්ගේ සපත්තුවලට පෑගිලා, පොඩිවෙලා; ඒ මල්පැලවලට වී ඇති විනාසය දිහා බලන්න බෑ. ඒවා ආයෙත්





ඉතින් පැලවෙන්නේ නෑ. ඔබට කැඳවන්න කියල මං කල්පනා කළ එක හේතුවක් අන්න ඒක. බිෆාන් සහ ඔහුගේ අය නවදුරටත් මගේ මල්වත්ත විනාශකරන්න කලින්, මේ පරීක්ෂණය භාරගන්න මහත්මයා. එහෙම කළොත් ඒක ලොකු උදව්වක්. මට මෙච්චර අලාභ හානි කරලත්, බිෆාන් කියනවා හොරුන්ගේ කිසිම හෝඩුවාවක් නැතිලු. අඩි සටහන් කිසිවක් නැතිලු. මේක කළේ කවුද කියලා හිතාගන්නවත් බැඳැලු. මට ඉවසන්න බැරි අන්න ඒ කතාවට. ඒ ගමන ඊයෙ ඔහු මට කිව්වා, අපි මේක ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට භාරදෙමු කියලා. ඒ කියන්නේ පොලිස් සපත්තුවලින් මගේ මල්වත්තේ ඉතුරු මල්පැල ටිකත් පොඩිකරලා විනාස කරනවා කියන එකයි. හොඳ අපූරුවට තියෙයි. ඊයේ පෙරේද කොල්පෝටර් දළු ම්බුවුණු ගෝයා ලිලී සහ මෝව් ටියුලිප් මල්පාත්ති දෙකක් තියෙනවා. ඒ ටිකත් විනාශකරල දාන්න පොලීසියට බැරියැ!"

බිෆාන් කළ යෝජනාව සිහිවී සර් මැක්ස්වෙල් මුවුන්ගේ දෙනෙත් කෝපයෙන් දිළිසුණු අයුරු මම දුටුවෙමි.

"සර් මැක්ස්වෙල්, මං මේ පරීක්ෂණය භාරගන්නෙ බොහොම කැමැත්තෙන්." හෝම්ස් කීවේ අපේ අමුත්තාගේ සිත් සැනසෙන අයුරෙනි. "මේ දොස්තර වොට්සන් තමයි පරීක්ෂණවලදී මගේ සහකාරයා. ඔබේ නිවසට ඔහුත් කැඳවාගෙන ඒම ගැන විරුද්ධත්වයක් නැහැ නේද? ඔබේ මල්පාත්තිවලට අපි දෙන්නාගෙන් නම් හානියක් වෙන්නෙ නෑ. මං ඒ ගැන ඔබට සහතික වෙන්නම් මහත්මයා."

"හරි. බොහොම ස්තුතියි. ඒක එහෙනම් තීන්දුයි. මට හරි සතුටුයි" සර් මැක්ස්වෙල් කීය. "මං දුම්රිය කාලසටහන පරීක්ෂා කළා. ලිවර්පූල් වීදියේ දුම්රියපොළෙන් ඉස්සෙල්ලා බලා පිටත්වෙන දුම්රියක් තියෙනවා උදේ 10යි 15ට. ඒක ග්‍රේට් වෝල්ඩන් දුම්රිය පොළේ නවත්වනවා. මේ දුම්රියේ පැමිණීම ඔබට පහසුද? එහෙම නම් මට පුළුවනි ඔබ දෙදෙනා කැඳවාගෙන යාමට, මගේ අශ්වකරත්තය දුම්රියපොළට එවන්න. මගේ ගෙදර තියෙන්නේ ලිට්ල් වෝල්ඩන්වල. දුම්රියපොළේ ඉඳල එතැනට හැතැක්ම දෙකයි. මා සමග දවල් කෑමට ඔබ ඉන්නවානේ. විශිෂ්ටයි. එහෙම නම් ඔබ හෙට උදේ එන බව මං බිෆාන්ට දැනුම් දෙන්නම්"

අපේ අමුත්තා පිටත්ව යාම සඳහා අසුනෙන් නැගිටිද්දී, ඔහුට මඳකට නවතින මෙන් හෝම්ස් සංඥා කළේය.

"ඔබ පිටත්වී යන්න කලින් මා දැනගත යුතු තවත් කාරණා දෙකක් තියෙනවා සර් මැක්ස්වෙල්" හෝම්ස් කීය. "පළමුවෙනි එක ඔබේ කෑමකාමරයට ඇතුළුවීමට කිසිකෙනෙකුට ඉඩදෙන්න එපා..... පරීක්ෂක බීෆාන්ටවත්. ඊළඟ කාරණය: මෑතකදී ඔබේ නිවසට, ඔබ හමුවෙන්න නාඳුනන අමුත්තන් කවුරුහරි ආවද?"

එම කරුණ ගැන සිහිකිරීම සර් මැක්ස්වෙල්ට අපහසු වූ බවක් පෙනිණ.

"මා හමුවෙන්න නම් හුගක් අය ආවා. ඒත් නාඳුනන අය....?" ඔහු කීවේ මඳවේලාවක් කල්පනා කිරීමෙන් අනතුරුවය. "මට මතක තරමින් එහෙම කෙනෙක් ආවේ නැහැ. කොයි එකටත් මං මගේ සේවකයන්ගෙන් අහල බලන්නම්. ඒක මං නොවරදවාම කරන්නම්"

අමුත්තා අපෙන් සමුගෙන පිටත්ව ගිය පසු, හෝම්ස් මා දෙසට හැරුණේ අපමණ සන්තෝෂයෙනි.

"වොට්සන්. මං ඔබට කිව්වා නේද හොරුන් යොදගෙන ඇති උපක්‍රමය ගැන? මේකත් සිද්ධවෙලා තියෙන්නෙ මීට කලින් සිදුවූ ඒවල පිළිවෙළටමයි. මේ නිවස තියෙන්නෙත් දුම්රිය පොළේ ඉඳල සැතපුම් දෙකක් පමණ දුරින්. කාටවත් කිසිම ශබ්දයක් අහන්න ලැබිල නෑ. ගෙය බිඳගෙන ආව එකත්, බොහොම දක්ෂ ලෙස කරල තියෙනවා. ගෙනිහිං තියෙන්නෙත් හොරාගත් බඩු කිහිපයක් පමණයි. දැන් අපේ දත්තවලට තවත් දෙයක් එකතුකරන්න පුළුවනි. ඒ තමයි මේකට හොරුන් දෙන්නෙක් සම්බන්ධවෙලා බව. ඒ දෙන්නාම දක්ෂකම අතින් එක සමානා, ඒ වෘත්තියේ හොඳ ප්‍රවීණයන්. මේ පරීක්ෂණය මං භාරගත්තේ බොහොම සතුටෙන්. මේක අපට කලකින් ලැබුණු හොඳ අභියෝගයක්"

"නාඳුනන අමුත්තන් කවුරුවත් ගෙදරට ආවද කියල, ඔබ සර් මැක්ස්වෙල්ගෙන් ඇහුවේ ඇයි?"

"මං හිතුවා වොට්සන් ඔබ ඒ කාරණාව තේරුම් ගන්න ඇති කියල. හොරුන් ගෙට ඇතුළුවෙලා තියෙන්නෙ විසිත්ත කාමරයේ ජනේලයකින්. වටිනා පෞරාණික බඩු තැන්පත් කර තිබුණෙත් එතැනයි. ඔවුන් අරගෙන ගියෙත් එහි තිබූ වටිනාම දේ පමණයි. ඒකෙන් මොකක්ද වොට්සන් අපට තේරුම් ගන්න පුළුවන්?"





"වටිනා දේ තියෙන්නෙ කොහේද කියලා ඔවුන් හොඳින් දැන හිටියා?"

"හරියටම හරි. තමන් ඇතුළුවෙන්න ඕන කොතැනටද කියන එක, ගේ බිඳින්න කලින් ඔවුන් දැනහිටියා." හෝම්ස් කීය. "එපමණක් නොවෙයි. ඒ කාමරයේ වටිනාම බඩු හංගලා තියෙන්නෙ කොතැනද, ගන්න ඕන මොනවද කියන එකත් දැනහිටියා. වොට්සන් ඔබ පිටවෙලා යන්න කලින්, අර රාක්කයෙන් මට පොතක් අරගෙන දෙන්න. ඔය උඩම තට්ටුවේ තියෙන්නෙ..... "එංගලන්තයේ පෞරාණික වලව්" කියන පොත..... හරි මයිකල් ගිලෙස්පීගෙ පොත තමා. හරි බොහොම ස්තුතියි. පරීක්ෂණ කටයුතු මං මේ මොහොතේම පටන්ගන්නවා. යළිත් මං ඔබව බලාපොරොත්තු වෙන්නෙ හෙට උදේට. උදේ නවය වෙනකොට මෙහේට එන්න වොට්සන්. එතකොට ලිවර්පූල් වීදියෙන් 10.15 දුම්රිය අල්ලාගන්න අපට අමාරු වෙන එකක් නෑ"

මගේ සියලු වැඩකටයුතු නවත්වාදමා, මා බේකර් වීදියේ නිවහනට පැමිණියේ හෝම්ස්ගේ ඉල්ලීම නිසාය. එහෙත් වැඩි පමාවකින් තොරව පිටවී යාමට ද මට මෙසේ අණ ලැබිණ. එයින් මගේ සිතේ ඇතිවූයේ නොසතුටකි. එහෙත්, ඒ කිසිවක් ගැන තැකීමක් නොකළ හෝම්ස්, මේ වනාවිට තම වැඩකටයුතු අරඹා අවසන්ය. ගිනිකොණදිග එංගලන්තයේ විශාල සිතියමක් දිගහැරගත් ඔහු, එය අධ්‍යයනය කළේ ගිලෙස්පීගේ පොත ද උදව්කර ගනිමිනි. ඒ සමගම කුඩා පොතක කරුණු සටහන් කරගන්නා ආකාරය ද මම දුටුවෙමි.

වචනයක් හෝ කථා නොකොට මම නිවහනෙන් පිටවී ගියෙමි.

පසුවද උදයේ මා එහි පැමිණෙන විටත්, කලින් ද හෝම්ස්ගේ පැවති උද්‍යෝගය එලෙසින්ම තිබිණි. අපට දුම්රියපොළ වෙත යෑමට කැඳවූ කුලීරිය නිවසේ දොරටුව අසල විය. වැඩි පමාවක් නොවී අපි දුම්රියපොළ වෙත ආවෙමු. කලින්ද තමා කළ විමර්ශනයේ ප්‍රතිඵල ඔහු අතර මගදී මා හමග පැවසුවේය.

"ලියුම් දුසිම් දෙකකට වඩා මං ලියුවා වොට්සන්" ඔහු කීය. "මීට කලින් මේ විදියේ හොරකම්වලට ගොදුරුවුණු වලව්කාරයින් වෙත ලියුම් පහයි. අනෙක් ඒවා ඉදිරි කාලයේදී මේ විධියේ ඉරණමකට ගොදුරුවීමට ඉඩ ඇති, පෞරාණික වලව්වල වාසය කරන අයට.

මං ඔබට කිවූ විදියට, දුම්රියස්ථානවලට සමීප වලව් තියෙනවා විශාල ගණනක්."

"මේ ආකාරයේ හොරකම් ඉදිරියේදී තව තවත් කරාවි කියලද ඔබ හිතන්නේ?" මම ඇසීමි.

"කිසිම සැකයක් නෑ. මට ඒක හොඳටම විශ්වාසයි" ඔහු පිළිතුරු දුන්නේය. "මේ හොරකම් ගිම්හාන කාලුවේදී පමණක් සිදුවෙන හොරකම් මාලාවක්. දැන් ජුනි මාසය. ලබන සැප්තැම්බර්වලට කලින් අඩු ගණනේ, තවත් එක් හොරකමක්වත් සිදුවේවි. ඒ ගැන මට නම් කිසිම සැකයක් නෑ. මං යැවූ ලියුම්වලට පිළිතුරු ලැබෙන තුරු මං ඉන්නේ නොඉවසිල්ලෙන්. ඒවා ලැබුණාම මට කියන්න පුළුවනි, ඊළඟ කොල්ලකෑම සිදුවෙන්නේ හරියටම කොහේද කියල"

ලිවර්පූල් වීදියේ දුම්රියපොළෙන් දුම්රියකට නැගුණු අපට ඉඩකඩ තිබූ මැදිරියක් පිවිසීමට හැකිවිය. පැයක පමණ ගමනකින් පසු අපි ග්‍රේට් වෝල්ඩන් වෙත ළඟාවූයෙමු. සෞභාග්‍යයෙන් පිරුණු වෙළඳ නගරයක් වූ එහි තිබුණේ දුකුම්කලු පෙනුමකි. සර් මැක්ස්වෙල්ගේ රියදුරා අප එනතුරු දුම්රියපොළේ බලා සිටියේය.

අප පිටත්වී යාමට පෙර මගේ මිතුරා රියදුරා වෙත ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය.

"මේ නගරයේ අංක එකට තිබෙන හොඳම තානායම මොකක්ද?"

"ජෝජ් තානායම" රියදුරා පිළිතුරු දුන්නේ පැකිළීමකින් තොරවය.

හෝම්ස් එම පිළිතුරෙන් සෑහීමට පත්වූ බව මම දුටුවෙමි. එම ප්‍රශ්නය නැඟීමට හේතුව ඔහු මට පැහැදිලි නොකෙළේය. ඒ වෙනුවට ඔහු කළේ අප ගමන්කළ මගෙහි දෙපස ඉතා උනන්දුවෙන් නැරඹීමය.

වයිට්ස්ටෝන් වලව්ව ඉතාම පැරණි, ඉතාම විශාල මන්දිරයක් බව අපි ඇතුළුවීම දුටුවෙමු. එහි එක් එක් කොටස් විවිධ කාලවලදී නිර්මාණය කළ ඒවා බැව් සිතාගත හැකිවිය. ටියුඩර් රජපරපුර සමයේ නිමකළ එක් අංගනයක් නැගෙනහිර පැත්තේ තිබූ අතර පළමුවැනි හෝ දෙවැනි චාල්ස් රජ සමයේ ඉදිකිරීම් අනෙක් පසින් විය. නිවසේ ඉදිරිපස කොටස ජෝජ් රාජසමයේ ඉදිකළ එකක් බව





මම තේරුම් ගතිමි. සර් මැක්ස්වෙල් මුවුන් අප පිළිගත්තේ එතැනදීය.

"හෝම්ස් මහත්මයා" ඔහු කීය. "ඔබේ පැමිණීම ගැන මට සන්තෝෂයි. බීම වීදුරුවක් බීලා ටිකක් විවේක අරගෙන ඔබ....."

"නැහැ මහත්මයා. මං කැමතියි පරීක්ෂාව වහාම පටන්ගන්න"

"එය කොතැනින් අරඹන්නද ඔබ බලාපොරොත්තු වෙන්නෙ?"

"මං කැමතියි පරීක්ෂාව කෑමකන කාමරයෙන් පටන්ගන්න." හෝම්ස් කියද්දී මම පුදුමයට පත්වූයෙමි. "අර වයින් වීදුරු සෝදිසි කරලා බලමු, අනික් ඒවාට කලින්"

කෑමකන කාමරය පිහිටියේ ද, මා මුලින්ම සඳහන් කළ පෞරාණික අංගනයේය. එහි අල්මාරි, මේසපුටු සියල්ල, ශක්තිමත් ඕක් අරටුවෙන් නිමකළ ඒවා විය. වීදුරු අල්මාරියක තිබූ රිදී පිඟන් දැසක් අපි දුටුවෙමු. මේ කිසිවක් සොරකම් කිරීමට සොරුන් උත්සාහයක් දරා නොමැත.

සර් මැක්ස්වෙල් සඳහන් කළ වයින්වීදුරු තබා තිබුණේ, ආහාරගැනීමට යොදාගන්නා පටු දිගු මේසයක කෙළවරකය. හොරුන් පානය කළ වයින්වල මණ්ඩි තවමත් වීදුරුවල අඩියේ ඉතිරිව තිබූ බැව් අපි දුටුවෙමු. එම වීදුරු අතින් නොඇල්ලූ මගේ මිතුරා, ඉදිරියට නැමී තම කාචයෙන් වීදුරුදෙක පරීක්ෂා කළේය.

"සර් මැක්ස්වෙල්" හෝම්ස් කීය. "වැඩිදුර පරීක්ෂා කරන්න, මට මේවා ලන්ඩන් නගරයට ගෙනයන්න උවමනා වෙනවා. ඒවා අසුරා ගැනීම සඳහා මට කාඩ්බෝඩ් පෙට්ටියක් සහ කපු පුළුන් ස්වල්පයක් අවශ්‍යයි"

"ආ ඒකෙ ප්‍රශ්නයක් නෑ" කී ගෙහිමියා සේවකයෙකු කැඳවීම සඳහා සීනුවක් නාද කළේය. "ඔබේ පරීක්ෂණයට මේවා කොහොම ප්‍රයෝජනවත් වේවිද කියන එක මට නම් හිතාගන්නවත් බෑ. ඒ වුණාට ඔබේ කැමැත්තක් හෝම්ස් මහත්මයා"

සේවකයා විසින් ගෙන එන ලද ද්‍රව්‍ය උදව්කරගෙන වයින් වීදුරු අසුරා ගැනීම කරන ලද්දේ මගේ මිතුරා විසිනි.

"හරි. දැන් මං කැමතියි අපරාධය සිදුවුණු තැන පරීක්ෂා කර බලන්න" හෝම්ස් කීය.

අප එම ස්ථානය බලා යමින් සිටියදී සර් මැක්ස්වෙල් එක්වරම මෙසේ පැවසුවේ තමාට යමක් හදිසියේ සිහිවූ අයුරෙනි.



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

"හෝම්ස් මහත්තයා, ඔබ ඊයේ මුගෙන් ඇහුවා නේද, කවුරු හරි නාඳුනන අමුත්තො ගෙදරට ආවාද කියලා? මට ඒ වෙලාවෙ කිසිම කෙනෙක් ගැන මතක් වුණේ නෑ. මේ වයින් වීදුරු නැවත දුටුවාමයි මට මතක්වුණේ. ඇයි සෑහෙන කාලෙකට ඉස්සර වෙලා මේ ගෙදරට අමුත්තෙක් ආව නේන්නම්. ඔහු මේ හොරකමට සම්බන්ධද කියන එක නම් මං දන්නේ නෑ. දවල් කෑමට පස්සෙ වයින් වීදුරුවකින් මං ඔහුට සංග්‍රහ කළා. වයින්වල අනර්ඝ බව ඒ වෙලාවෙ ඔහු හරියට අගය කළා."

හෝම්ස් හිස ඔසවා තම දෙනෙත් ප්‍රභුවරයා වෙත යොමු කළේය. මට සිහිවූයේ සතුන් දඩයමට උදව්කරගන්නා සුනඛයකු ඉවක් දනුණු විට, තම අවධානය ඒ දෙසට යොමුකරන ආකාරයයි.

"ඒ කොයිතරම් කාලයකට ඉස්සරද සර් මැක්ස්වෙල්?"

"කෝ බලන්න..... මං හිතන්නෙ ඔහු ආවෙ පහුගිය නොවැම්බර් කාලෙ. ඒ කියන්නෙ මාස 7කට විතර කලින්. ඔහු ඇමරිකානු මහාචාර්යවරයෙක්, ටියුඩර් රාජපරම්පරාව සමයේ ගෘහනිර්මාණ ශිල්පය ගැන විශේෂඥයෙක්. ඔබ දකින්න ඇති මගේ නිවසේ එක අංගනයක් ඒ යුගයේ ඉදිකළ එකක් බව. එය ඔහුට නරඹන්න අවස්ථාවක් දෙන්න පුළුවන්ද අහලා මට ලියුමක් එවල තිබුණා."

පරීක්ෂණයක යෙදෙද්දී වැදගත් සලකුණක් දකින්නට ලැබුණු විට හෝම්ස්ගේ සම්පූර්ණ අවධානය යොමුවන්නේ එය වෙතය. එම වෙලාවට බාහිරව ඔහුගෙන් දකින්නට ලැබෙන්නේ නිවුණු සන්සුන් බවකි. එහෙත් ඇතුළතින් ශක්තිය උතුරායාමෙන් ස්පන්දනය වන යන්ත්‍රයක් මෙන් ඔහු නොසන්සුන් වෙයි. මම ඒ බව හොඳින් දන සිටියෙමි.

"ඒ ලියමන තවමත් ඔබ ළඟ තියෙනවද?" හෝම්ස් විමසුවේය.

"සමහර වෙලාවට ඒක තවමත් මගේ ලිපිලේඛන අතරේ තියෙන්න පුළුවනි. ඔබ මේ කාමරය සෝදිසි කරන අතරේ මං හොයල බලන්නම්."

මෙසේ කී සර් මැක්ස්වෙල් තම කන්තෝරු කාමරයට යන අතරේ, අපි ඔහුගේ විසිත්ත කාමරය වෙත ගියෙමු. එය ඉතා විශාල කාමරයක් විය. එක් බිත්තියක වූ ජනේල තුන විවෘත වූයේ, මල් වවා තිබූ උද්‍යානයට බැව් අතට පෙනිණ. එම කොටසේ වහල, දොර ජනේල හා උළුවහු සෑදීම සඳහා ඕක් දැවය විශාල ලෙස





යොදාගෙන තිබූ බව අපි දුටුවෙමු. එක් ජනේල වීදුරුවක රවුමක් කපා තිබූ අයුරු ඈත සිටම දැකිය හැකි විය. මිනිස් අතක් දැමීමට ප්‍රමාණවත් තරම් ඒ රවුම කපා තිබුණේ, ජනේලයේ අගුල සමීපයෙනි. කාමරය හරහා ගිය හෝම්ස් වීදුරුවේ කැපූ තැන ද ජනෙල් පඩිය ද පරීක්ෂා කර බැලුවේය.

"හොඳ පුරුදුකාරයෙක් ඉතාම සැලකිල්ලෙන් කළ වැඩක්" හෝම්ස් කීය. "වීදුරුව කැපීමට පාවිච්චි කරලා තියෙන්නෙ, දියමන්ති තුඩක් සහිත වීදුරු කපන උපකරණයක්. ඒ විදියට වැඩ කටයුතුවල යෙදෙන්නේ, මේ සොරුන්ගේ විශේෂඥයෝ. දැන් බලන්න මේ ජනෙල් පඩිය දිහා. අපේ මිත්‍රයන් කාමරයට ආව හැටින්, පිටවෙලා ගිය හැටිත් මෙතැන සලකුණු වෙලා තියෙනවා. ජනේලයෙන් එහා පැත්තේ මල් පාත්තියේ පා සටහන් නැහැ" හෝම්ස් කීවේ ජනෙල් පියන විවෘත කොට හිස එළියට දමා බලමිනි. "මල් පාත්ති නම් සෑහෙන්න පොඩිවෙලා තියෙනවා, බර සපත්තුවලින්. අහා! මේ මොනවද මේ? වොට්සන්. කරුණාකරල මට ඔය කුඩාදේ අල්ලන අඬුව අරගෙන දෙන්න"

හෝම්ස්ගේ කුඩා උපකරණ තිබූ මල්ලෙන් ඔහු ඉල්ලූ දෙය රැගෙන දුනිමි. මිළඟට මා උත්සාහ කළේ ඔහු සොයාගත් සියුම් දේ කුමක් ද යන්න හඳුනාගැනීමටය.

"මේ පුළුන් ස්වල්පයක් නේද?" මම ඇසීමි.

"පුළුන්? නෑ වොට්සන්. කාචය ආධාරයෙන් පරීක්ෂා කරල බැලුවොත් ඔබට පෙනේවි මේ මොනවද කියල. මේ දුඹුරුපාට ෆෙල්ට් රෙද්දකින් ගැළවී ගිය සියුම් කෙඳි ස්වල්පයක්. එහෙම ගැළවෙන්න හේතුව වුණේ ජනේල රාමුවේ තිබූ පතුරක් - උල්තුඩක්. ඔබට පෙනෙනවාද මේ කෙඳි සමග දැවටුණු පස්කැටිති? අපේ මිත්‍රයන්ගේ පාසටහන් එළියේ සලකුණු නොවුණු එකේ පුදුමයක් නෑ. ඔවුන් ෆෙල්ට්වලින් සකස්කරගත් සෙරෙප්පුවලින්, පා ආවරණය කරගෙනයි ඇවිත් තියෙන්නෙ. මේ හොරකම ඔවුන් සිදුකරලා තියෙන්නෙ, ඉතාම පළපුරුදු වෘත්තීය හොරුන්ගේ පිළිවෙළට. මෙහෙම දෙයක් නිරීක්ෂණය කරන්න අපට අවස්ථාවක් ලැබීමත් වාසනාවක්." කියූ හෝම්ස් තම සාක්කුවෙන් කුඩා ලියුම් කවරයක් ගෙන, දුඹුරු පැහැති කෙඳි ස්වල්පය එහි තැන්පත්කොට, කවරය සටහන්පොත තුළට දමාගත්තේය.

"දැන් අපි කලාකෘති දමා තිබූ අල්මාරි පරීක්ෂා කරල බලමු වොට්සන්"

මෙම අල්මාරි පිහිටා තිබුණේ තරමක් ලොකු ගිනිලදුනක දෙපසය. ඒවා ඉදිරිපස විදුරුතහඩු සවිකර තිබූ ඒවා වූ අතර, දොරවල් විශාල පිත්තල යතුරු තහඩුවලින් ආරක්ෂිතව තිබිණි. කෙසේ වෙතත් මේ වෙලාවේ නම් ඒ දොර පියන් තිබුණේ අඩවන්වය. අල්මාරි තට්ටුවල දැන් හැඩ් ගිය්ව තිබූ අයුරු අපි දුටුවෙමු. වටිනා භාණ්ඩ ඉවත්ව ගියේ කොතැනකින්ද යන්න මේ අනුව අපට සිතාගත හැකිවිය.

සර් මැක්ස්වෙල් මුවුන් අප සිටි කාමරයට ඇතුළුවෙද්දී, මගේ මිත්‍රයා අල්මාරිය අසළ දණගසාගෙන, එය පරීක්ෂා කරමින් සිටියේය.

"ඒ ලියුම මට හමුවුණා" කී සර් මැක්ස්වෙල් ලිපිය හෝම්ස් අතට දුන්නේය. හෝම්ස් එය කියවා මා අතට පත්කළේය. එය මුද්‍රිත ලිපි ශිර්ෂයක් තිබූ කඩදාසියක ලියූ ලිපියකි.

## චිකාගෝ විශ්වවිද්‍යාලය

**ඉතිහාස අංශය**

1894 ඔක්තෝබර් 6 දා

ගිහවත් සර් මැක්ස්වෙල් මුවුන් වෙත,

එංගලන්තයේ ටියුඩර් රජ පෙළපත සමයේ ඉදිකෙරුණු ගම්බද වලව් සහ ඒවායේ ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳව, මම ග්‍රන්ථයක් සම්පාදනය කරමින් සිටිමි.

ඔබට අයත් වයිට්ස්ටෝන් මැදුර එලිසබෙත් යුගයේ අංගනයක් ද සහිතව, මනාව සංරක්ෂණය කෙරුණු තැනක් බව මට දැනගන්නට ලැබී ඇත. එබැවින් ඔබගේ ගෘහය පරීක්ෂාකර බලා, එහි ශ්‍රී විභූතිය ගැන මගේ ග්‍රන්ථයේ සඳහන් කිරීමට හැකි වන්නේ නම් එය මා වෙත ලබාදෙන විශේෂ වරප්‍රසාදයකි.

ඔක්තෝබර් අවසානයේ ලන්ඩන් නගරයට ළඟාවෙන මම නොවැම්බර් 1 වැනිද සිට 20 වැනිද අතර කාලයේ ස්ට්‍රැන්ඩ්හි පිහිටි වෙස්ලෝ හෝටලයේ නවාතැන් ගැනීමට





බලාපොරොත්තු වෙමි. මා වෙත එවන ඔබගේ ලිපිය එම හෝටලය වෙත යොමු කරන්නේ නම් කෘතඥවෙමි.

මෙයට

ජොනාස්. ටී. වැන්ඩර්බිල්ට්

ඉතිහාසය පිළිබඳ මහාචාර්ය

"ඔහුට එන්න කියලා ඔබ ලිපියකින් දැනුම් කරන්න ඇති?" හෝම්ස් ගෙහිමියාගෙන් විමසුවේය.

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. මං ඔහු නවාතැන් සිටි වෙස්ලෝ හෝටලයට ලියුමක් දැම්මා. මං කිව්වේ නොවැම්බර් 10 වැනිද උදේ 10.15 දුම්රියෙන් මෙහෙට එන්න කියලා. ඒ, අද ඔබ දෙදෙනා මෙහේ ආව දුම්රිය. මොකෝ? හෝම්ස් මහත්මයා. ඔබ අදහස් කරන්නේ ඔහු මේ හොරකමට සම්බන්ධයි කියලද? ඔහුගේ තිබුණේ හොඳ වැදගත් පෙනුමක්. ඔහුව ගෙදරට කැඳවාගෙන එන්න මං මගේ අශ්වකරත්තයත් යැව්වා."

"ඔහුගේ පෙනුම කොයි වගේද?"

"ඔහු සෑහෙන්න උසයි. අඩි හයකට වැඩි වුණොත් මිස අඩු නෑ. ටිකක් වයස්ගතයි. කොණ්ඩය මත්තෙන්ම පැහිලා සුදුපාටයි. උරහිස් ටිකක් ඉස්සරහට නැමිලා. කතාකළේ ඇමරිකානු උච්චාරණය සහිත ඉංග්‍රීසියෙන්. ටියුඩර් යුගයේ වාස්තු විද්‍යාව ගැන ඔහුට පුළුල් දැනුමක් තිබුණා."

"ගෙදර හැමතැනකටම, ඔබ ඔහුව කැඳවාගෙන ගිහින් පෙන්නුවද?" හෝම්ස් ඇසීය.

"හැමතැනක්ම නෙමෙයි" සර් මැක්ස්වෙල් කීය. "ප්‍රධාන කාමර හැමඑකකටම මං ඔහුව කැඳවාගෙන ගියා. මෙතැනටත් එක්ක ආවා. අපි දවල් කෑම කැම්වේ කෑම කාමරයේ. එතැනට ගියා. සමහර නිදනකාමර පෙන්නුවා. ඒ ලැබුණු අවස්ථාවෙන් ඔහු හරි සන්තෝෂයට පත්වුණා. ඔහු ආපසු ගියාට පස්සේ කෘතඥතාවය පළකරලා මට ලියුමක් එවලා තිබුණා....."

ප්‍රධාන ගෘහසේවකයා එතැනට පැමිණියෙන් සර් මැක්ස්වෙල්ගේ කථාවට බාධා ඇතිවිය. පොලිස් පරීක්ෂක බ්‍රවුන් පැමිණ ඉස්තෝප්පුවේ රැඳී සිටිනා බව ගෘහසේවකයා දැනුම් දුන්නේය.



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

"එහෙනම් අපි එතැනට යමු මැක්ස්වෙල් මහත්මයා"

"මහත්වරුනි" සර් මැක්ස්වෙල් කීවේ අප පොලිස් නිලධරයා සිටි තැනට පැමිණි පසුය. "මට මගේ පෞද්ගලික වැඩකට යන්න සිදුවී තිබෙනවා. මගේ ඉඩකඩම් සම්බන්ධව කටයුත්තක්. දහවල් ආහාරයට කලින් මං ඒක අවසන් කළ යුතුයි. ඒ අතරේ ඔබට පුළුවනි සොරකම ගැන පරීක්ෂණය කරන්න. මං ඉක්මනට එන්නම්" අප දෙදෙනා පොලිස් නිලධරයාට හඳුන්වා දුන් ප්‍රභුවරයා එතැනින් පිටවී ගියේය.

බිෆාන් එහි පැමිණ සිටියේ සහායක පොලිස් භටයෙකු ද සමගය. කෙටියට කැපූ දුඹුරු කෙස් හා අව්වට පිළිස්සුණු මුහුණක් තිබූ බිෆාන්ට තිබුණේ කෙටටු සිරුරකි. ඔහුගේ මුහුණේ තිබුණේ අප කෙරෙහි අප්‍රසාදය දක්වන හැසිරීමක් මිස මිත්‍රශීලී පෙනුමක් නොවේ. හෝම්ස් මෙහි පැමිණීම ගැන ඔහු කිසිසේත් කැමැති නොවූ බැව් අපි තේරුම් ගත්තෙමු. සුහද බවකින් තොරව අතට අත දුන් ඔහු කළ කථාවේ ද රැඳී තිබුණේ උපහාසයකි.

"තමන් කැමති ඕනෑම රහස් පරීක්ෂකයෙක් තැඳවන්න, සර් මැක්ස්වෙල්ට අයිතියක් තියෙනවා" බිෆාන් කීය. "ෂර්ලොක් හෝම්ස් මහත්මයා ඔබ සුප්‍රසිද්ධ කෙනෙක් බව අහලා තියෙනවා. ඒ වුණත් මේ ගැටලුව විසඳන්න නම් ඔබට හැකිවෙන්නෙ නෑ. හෝඩුවාවන් තියෙන්නෙ ඉතාම ස්වල්පයයි. ඉතින් මං අද උදේ මේ ගැන දැනුම්දීලා ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට විදුලිපුවතක් යැව්වා. කොයිගමාගොතෙ ගෝණුකට පිළිතුරක් ලැබේවි කියලා මං විශ්වාස කරනවා. මං ඔවුන්ගෙන් උදව් ඉල්ලුවේ මගේ බැරිකමකටම නෙමෙයි. හොරා මේ වත්තට ඇතුල්වුණ තැන මගේ මිනිස්සු හොයාගත්තා. ඒ මීට පැය බාගයකට විතර කලින්. මං හිතන්නේ නෑ ඔබට එතැන හොයාගන්න හැකිවුණා කියලා?"

"එහෙම තැනක් මට හමුවුණේ නෑ මහත්මයා" හෝම්ස් කීය. "ඒ වුණත් මං කැමතියි ඔය කියන තැන බලන්න"

බිෆාන්ගේ සිතට නැඟුණේ එතරම් ප්‍රසන්න හැඟුම් නොවන බව එක්වරම අපට වැටහිණ. තණකොළ වවා තිබූ තරමක් ලොකු මිදුලක් හරහා ඔහු අප කැඳවාගෙන ගියේය. ඒ තණබිම්කඩ අවසන් වූයේ උසට වැඩුණු පඳුරු සහිත තැනකිනි. එයද පසුකරගෙන ගිය අපට දකින්නට ලැබුණේ, ගඩොලින් ඉදිකර තිබූ උස තාප්පයකි.



http://sherlockholmesinsinhala.blogspot.com



"අන්න අතනින් තමා ඔවුන් වත්තට ඇතුළු වෙලා තියෙන්නේ" බිෆාන් කීවේ ජයග්‍රාහී හඬෙනි. "තාප්පය දිගටම විසිරී තිබෙන මල්වැල් එතැනදී ගළවා ඉවත්කරලා. ඒක පැහැදිලිවම පෙනෙනවා"

"ඒ වුණත් ඔවුන් කොහොමද ඔය තරම් උස තාප්පයට නැගලා මේ පැත්තට බැස්සේ?" හෝම්ස් ඇසීය. "මේක අඩි පහළොවකට වඩා උස තාප්පයක් නේ"

මේ තත්ත්වය ගැන සිතා නොසිටි බැවින්, බිෆාන්ගේ මුහුණ වහා අඳුරුවිය. කෙසේ වෙතත් එය ඉක්මනින් විසඳා ගැනීමට හෝම්ස් සමත්විය.

ඉනිමගක් රැගෙන ඒම සඳහා පොලිස් භටයෙකු යවන ලදී. ඉනිමග ගෙනා පසු මගේ මිත්‍රයා එයට නැගුණේය. මල්වැල් ඉවත්කර තිබූ තැන්වල තාප්පය මත තාප්පයේ ආධාරයෙන් පරීක්ෂා කළේය. ඉහළ නැගුණු හෝම්ස් තාප්පයේ මුදුන පරීක්ෂා කිරීමට මිනිත්තු කිහිපයක්ම ගතකළේය.

"සතුටුදායකයි" මගේ මිත්‍රයා කීවේ, ඉනිමගෙන් බැස දෑත්වල තිබූ දූවිලි ඉවත්කරමිනි. "මං ඔබට කලින් කිව්වා වගේමයි වොට්සන්. මේ හොරුන් දෙන්නා ඉතාමත් දක්ෂ පුද්ගලයින් දෙන්නෙක්. යමු යමු අපි පටන්ගත් වැඩේ ඉවර කරමු. යමු අපරාධය සිදුවුණු තැනට"

හිතාමතාම බිෆාන් ගැන නොසලකා හැර, නිවස දෙසට පා නැගූ මගේ මිත්‍රයා පිටිපස මම ද ආවෙමි. පොලිස් නිලධරයාට නොඇසෙන තැනකට ආ පසු හෝම්ස් මෙසේ කීය. "තාප්පයේ මුදුන කැපී ගිහින්. එකිනෙකට සමාන්තර ලකුණු දෙකක් සලකුණු වෙලා තියෙනවා. ඒ විධියේ ලකුණු ඇතිවෙන්නේ කඹ ඉනිමගක කෙළවරට සවිකර ඇති යකඩ කොකුවලින්. ඒ විදියේ ලණු ඉනිමගක් තියෙනවා නම් හොරුන්ගේ වැඩ බොහොම පහසුවෙනවා. තාප්පයට නැගලා වත්ත ඇතුළට එන්නත්, යළි පිටවී යන්නත්, ඔවුනට ගතවෙන්න ඇත්තේ මිනිත්තු කිහිපයයි. මං දන්නෙ නෑ බිෆාන් ඒ කරුණු තේරුම්ගත්තද කියලා. මිනිහා බොහොම ලොකුවට හිතට ගත්තු පොලිස්කාරයෙක්. ඒකයි මං හිතාමතාම ඔහුව ගණන් නොගෙන මේ පැත්තට ආවෙ."

අපි ආපසු හැරී බැලුවෙමු. ඉනිමග නොසෙල්වෙන ලෙස අල්ලාගෙන සිටින ලෙසට පොලිස්භටයාට අණ දුන් බිෆාන්, එයට නැගීමට සූදානම් වන අයුරු අපි දුටුවෙමු.



http://sherlockholmesinsinhala.blogspot.com

යළිත් වයිට්ස්ටෝන් මන්දිරයට පැමිණි පසු, හෝම්ස් අල්මාරිවල යතුරුතහඩු පරීක්ෂා කළේය. "හොර යතුරු හෝ වෙනයම් ක්‍රමයකින් මේවා ඇරපු මිනිස්සු කවුරු වුණත්, ඒ වැඩ ගැන විශේෂ දැනුමක් හා පුරුද්දක් ඇති අය. සිහිතල නඩුවල තියෙන්නේ ඉතාම සුළු සීරීම් ලකුණු කිහිපයක් පමණයි." හෝම්ස් කීවේ කාචය තම කබාසාක්කුවට දමාගනිමිනි.

දහවල් ආහාරය සූදානම් බවත්, සර් මැක්ස්වෙල් අප එනතුරු බලාසිටින බවත්, ප්‍රධාන ගෘහසේවිකාව අප වෙත දන්වා සිටියේය.

"හිටපු මහත්මයා නමට ලන්ඩනයෙන් විදුලි පුවතක් ඇවිත්" සර් මැක්ස්වෙල් කීය. "ග්‍රේට් වෝල්ඩන් පොලිස් ස්ථානයේ ඉඳල විදුලි පුවත අරගෙන පොලිස්භටයෙක් ආවා. ස්කොට්ලන්ඩ්යාඩ් එකෙන් පොලිස් පරීක්ෂකයෙක් එනවලු, තුනයි දෙකට එහෙන් එන දුම්රියෙන්"

"ඒ නිලධරයා කවුද කියල ඔබට දැනගන්න ලැබුණද?" හෝම්ස් විමසුවේය.

"මට මතක හැටියට ලෙස්ට්‍රේඩ් කියල කෙනෙක්"

හෝම්ස්ගේ මුවගට සිනාවක් නැගිණ. ඔහු මා දෙස බලද්දී ඒ සිනාව මුවපුරා වඩාත් පැතිරුණු බැව් මම දුටුවෙමි.

"සර් මැක්ස්වෙල්" හෝම්ස් කීය. "ස්කොට්ලන්ඩ්යාඩ් එකෙනුත් කවුරු හරි එනවා නම්, අපි තවත් මෙහෙ රැඳී ඉන්න එකේ තේරුමක් නෑ. ඔහු මෙහෙට එන්න කලින් අපි පිටත්වෙලා යන එක වඩා හොඳයි. නිලලත් රහස් පරීක්ෂකයන් අනුගමනය කරන පරීක්ෂණ විධි, අපේ විධිවලට වඩා වෙනස්. ඔවුන්ගේ ඒ කටයුතුවලට අපෙන් බාධාවෙන්න ඉඩහරින එක හොඳ නෑ. අනෙක් කාරණය මේකයි. මේ දෙගොල්ලෝ අපට කරන්න තිබුණු පරීක්ෂණ කටයුතු හැමදෙයක්ම අපි කරලා අවසන්. සර් මැක්ස්වෙල්, සැකයක් නෑ ඔබ අශ්වකරත්තය දුම්රිය පොළට යවනවා ඇති, ලන්ඩනයෙන් එන පොලිස් නිලධරයා කැඳවාගෙන එන්න. එහෙම නම් මටයි දොස්තර වොට්සන්ටයි පුළුවනි, ඒකෙම ග්‍රේට් වෝල්ඩන් යන්න. ගමන් දෙකක් යන්න වෙන එක, එක ගමනෙන් කරගන හැකිවේවි."

"ඒ වුණත් හෝම්ස් මහත්තයා, ඔබට ආපහු ලන්ඩන් යන්න දුම්රියක් මේ වේලාවෙ නැහැ කියලයි මං හිතන්නෙ. මීළඟ දුම්රිය





තියෙන්නේ හවස 4යි 12ට. ඔබට දුම්රියපොළේ පැයකට වැඩිකාලයක් රස්තියාදු වෙන්න සිදුවෙනවා."

"ඒ කාලය නාස්තිවෙවි කියල මං හිතන්නෙ නෑ මහත්මයා" හෝම්ස් කීය. "ග්‍රේට් වෝල්ඩන්වලදී මං කළ යුතු විමසීම් රාශියක් තියෙනවා. දුම්රියට වෙලාව එනතුරු අපට පුළුවනි ඒ කටයුතුවල යෙදෙන්න"

අපි සර් මැක්ස්වෙල් මුවුන්ගෙන් සමුගෙන, ඔහුගේ අශ්වකරත්තයෙන් දුම්රියපොළ බලා ගියෙමු.

"මොනවද හෝම්ස් ඔබට කරන්න තියෙන විමසීම්?" මා ඇසුවේ අප කරත්තයේ ගමන්ගන්නා අතරය.

"ජෝර්ජ් තානායමේ මා කළ යුතු විමසීමක් තියෙනවා මගේ හිතවත් මිත්‍රයා"

"ආ මට මතකයි. අපි මෙහේ ආ වෙලාවෙ ඔබ රියැදුරාගෙන් ඇහුවානේ, මේ නගරයේ තිබෙන හොඳම තානායම මොකක්ද කියලා. ඒත් ඒ වෙලාවෙ නම් මං හිතුවා ඇයි ඔබ ඒ ගැන සොයාබලන්නෙ කියලා"

"ඒ කාරණාව බොහෝම සරලයි නේද වොට්සන්?" හෝම්ස් ඇසීය. "අපි දැනටමත් නිගමනය කරලා අවසන් අපරාධකාරයින් ලන්ඩන් ඉඳලා මෙහේ ඇවිත් තියෙන්නේ දුම්රියෙන් විය යුතු බව. අනික් අතට ඔවුන් එන්න ඇත්තේ හුගක් රෑ වෙලා එන දුම්රියක වෙන්න බෑ"

"ඒ මොකද?"

"රෑ දුම්රියේ සෙනග අඩුයි. එතකොට මේ පළාතට නුපුරුදු මුහුණු ගැන කාටහරි සනිටුහන් ඉඳින්න ඉඩිවන්. ඒ හින්ද ඔවුන් එන්න ඇත්තේ මගීන් වැඩි දුම්රියක. මං විශ්වාස කරනවා ඒ අපරභාගයේ අන්තිම කොටසේ හෝ සන්ධ්‍යා කාලය පටන්ගනිද්දී, මෙහාට ළඟාවෙන දුම්රියක කියලා. ගෙවල් බිඳින අයත් බඩගින්නට කෑමකන්න ඕන. ඒ හින්ද ඔවුන් මෙහේ කොහේ හරි අවන්හලකින් රෑට කෑම කාවි. ඊළඟට ඔවුන් ජෝර්ජ් තානායමට යාවි කියල මට හිතුණා."

"ඔහොම ඉන්න" මම කීවෙමි. "ඇයි ඔබ කියන්නෙ ඔවුන් කෑම කන්න එතැනටම යාවි කියල. ඇයි නගරයේ තිබෙන අවන්හලකට හෝ තවාතැන් පොළකට එනායාවි කියල උපකල්පනය කරන්නේ?"



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

"කාරණාව මෙතුයි" මගේ නිලධාරී මිත්‍රයා" හෝම්ස් කීය. "හොරුන් කවුරුවුණත් දැන් ඔවුන් බොහොම ධනවත්. සර් මැක්ස්වෙල්ගේ නිරීක්ෂණයේ හැටියට මහාචාර්ය වැන්ඩර්බිල්ට් හොයාගෙන යන්නේ විශිෂ්ටතම ඒවා. හොරකමේ ආ වේලාවේ ඔහු දුටුවා, '67 අවුරුද්දේ නිෂ්පාදනය කළ වයින් බෝතලයක්. ඒකෙන් වීදුරුවක් රහ බලලා යන්න ගිහින මිනිහා....."

"ඔව්?"

"ඔබ හිතනවද එහෙම මිනිහෙක් ඊයේ රෑ කෑමට දෙවැනි පංතියේ හෝටලයකට යාවි කියලා? ඔහු යන්නේ නගරයේ තිබෙන හොඳම තැනට"

අශ්වකරත්තය දුම්රියපොළ වෙත ගෙන යෑමට පෙර, රියැදුරා අප ජෝජ් තානායම වෙත ගෙනගියේය. ඒ හෝම්ස් කළ ඉල්ලීම අනුවය. දුම්රිය සේවා ඇරඹීමටත් පෙර අශ්වකෝච්චි යුගයේ ඉදිකළ තැනක් වූ ජෝජ් තානායම, ඉතා විශාල එකක් බැව් දක්නට ලැබිණ.

හෝම්ස් එහි ප්‍රධාන වේටර්වරයා සමග කතාබහකට වැටුණේය. කුවුන් භාගයේ කාසියක් මගේ මිත්‍රයාගෙන් නැගි ලැබීමෙන් පසු, හෝම්ස්ට අවශ්‍ය තොරතුරු ලබාදීමට වේටර්වරයා උනන්දුවිය.

"ගිය සිකුරාද රෑ කෑමට මෙහේ ඇවිත් ගිය මිනිස්සු දෙන්නෙක් ගැන ඔබට මතකද මං දන්නෙ නෑ....." හෝම්ස් කීය. "එක්කෙනෙක් අතේ සෑහෙන තරම් ලොකු ගමන්මල්ලක් තිබුණා"

"පිටින් ඇවිත් රෑ කෑම කාලා පිටවී යන අය, මේ කාලෙ නම් හුඟක් අඩුයි. මහත්මයාට හොඳට මතකද ඒ අය ආවෙ ගිය සිකුරාද කියල?"

"ඔව් මට විශ්වාසයි"

තානායම් සේවකයා මඳ වේලාවක් කල්පනා කළේ තම මතකය අලුත් කර ගැනීමේ අදහසිනි.

"මහත්වරු දෙන්නෙක් ආවා. එක්කෙනෙක් උසයි. උසට හරියන මහත....." හෝම්ස් කීවේ යළිත් සේවකයාට හෝඩුවාවක් දෙමිනි.

"හරි මහත්මයා, මට දැන් මතකයි" ඔහු කීය. "ඔබ කියන උස මහත්තයා උඩැස් යුගළක් පැළඳගෙනයි හිටියෙ. ඔහුගේ මුහුණ වැහෙන්නම දුඹුරුපාට රැවුලක් තිබුණා. ඔබ කියන ගමන්මල්ල තිබුණෙ අනික් එක්කෙනා අතේ. එයා මිටියි සුදුමැලියි. ඔහුට තිබුණු





කර්පාට උඩුරැවුලක්. ඔවුන් මෙහේ එනකොට එච්චර රෑ වෙලා තිබුණෙ නැහැනේ"

"හරි. මං කියන්නෙත් ඔබ කියන පුද්ගලයින් තමා" හෝම්ස් කීය.

"ඔවුන් මෙහේ ආවෙ කීයටද, පිටවෙලා ගියේ කීයට විතරද කියල ඔබට මතකද?"

"ආ.....ඔව්. අපි රෑ කෑම දෙන වෙලාවට කලින්. ඒ කියන්නේ රෑ අටට කාලක් විතර තියෙද්දියි ආවේ. පිටවෙලා යනකොට..... මං හිතන්නේ..... රෑ දහය පහුවෙලා. හරි දැන් මට මතකයි. බිල ගෙව්වේ ඒ උස මහත්තයා. එයා තමයි හැමදේකම කතා කළේ. එයා කිව්වා රෑ දහයයි විස්සෙ ඉප්ස්විච් බලායන දුම්රියේ අල්ලගන්න තියෙනවා කියල"

"එයාල ගියේ ඉප්ස්විච්වලටද කියන එක නම් මට සැකයි" හෝම්ස් සිනාමුසු මුහුණෙන් කීවේ අප දුම්රියපොළ වෙත පානගන අතරේය.

විමසීමට හෝම්ස්ගේ ප්‍රශ්න යොමුවූයේ ග්‍රේට් වෝල්ඩන් දුම්රිය පොළේ සේවකයෙකු වෙතය.

"ලන්ඩන්වලින් එන දුම්රියක් මෙහෙට ළඟාවෙනවා රෑ නවයි හිප්පහට" ඔහු කීය. "ඒත් ඔය කියන විදිහේ මහත්වරු දෙන්නෙක් ගැන නම් මට නිච්චි නෑ මහත්තයා. ඒ මොකද ඔය දුම්රියේ හුඟක් සෙනග එනවා."

"සෙනසුරාදට එළිවෙන්න පාන්දර ලන්ඩන් බලා යනවා නම් මෙහෙන් අල්ලගන්න තියෙන පළවෙනි දුම්රිය මොකක්ද?" හෝම්ස් විමසුවේය.

"ඇයි මහත්තයා, උදේ පාන්දර පහයි දෙළහේ දුම්රිය තියෙනවා. ඒකට එච්චර සෙනගක් නෑ"

"දැන් කල්පනා කරල මතක් කර බලන්න" හෝම්ස් කීය. "අර මං කියූ මහත්වරු දෙන්නා හිටියද ඒකෙ ලන්ඩන් යන්න?"

"උස මහත්තයෙක් හිටියා වගේ මතකයි" ඔහු කීවේ මඳ වේලාවක් කල්පනා කිරීමෙන් පසුවය. "එයාගෙ හැඩරුව නම් මට ඒ හැටි මතක නෑ..... උස මහත එක්කෙනා නම් කොණ්ඩය පැහුණු කෙනෙක්. මිටි එක්කෙනෙක් නේද?..... ආ ඔව් ඔව්..... මිටි එක්කෙනෙක් හිටියා, ලොකු ගමන්මල්ලකුත් අරගෙන. එයාගෙ හැටි නම් මට එච්චර මතක නෑ. ඒ දෙන්නා එකට ආපු අයද?



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

ජගොල්ලො යාළුවො බවක් නම් පෙනුණෙ නෑ. ඒ මොකද දෙන්නා හිටියෙ වේදිකාවෙ කොන් දෙකක නේ."

"ඒ උස මහත මහත්තයාගෙ මූහුණ වැහෙන්න, දුඹුරුපාට රැවුලක් තියෙන්න ඇති?"

"දුඹුරුපාට රැවුලක්?" සේවකයා එවැනි ප්‍රතිරාවය කළේ තමා ඊට එකඟ නොවන බව හඟවමිනි. "මට මතක හැටියට එයාට රැවුලක් තිබුණෙම නෑ. රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකරලා"

එම වෙලාවේ ලන්ඩන් බලායන අපේ දුම්රිය වේදිකාවට ළඟාවිය. අපි පළමුවැනි පංතියේ මැදිරියකට නැඟුණෙමු. හෝම්ස් අසුනක් මතට ඇදවැටුණේ අතිශය සතුටෙන් බව මම තේරුම් ගතිමි.

"අද දවස අපි ඉතාහොඳ ප්‍රයෝජනවත් විදියට ගතකළා වොට්සන්. ප්‍රයෝජනවත් තොරතුරු රැසක් අපි එකතුකර ගත්තා. ඒ වුණාට රෑ කෑමවෙලාවට බේකර් වීදියට ළඟාවෙන්නත් අපට හැකිවේවි."

"මොකක්ද ඔබ ඊළඟට කරන්න බලාපොරොත්තු වෙන්නෙ? මහාචාර්යවරයා ගැන තොරතුරු විමසීමද?" මම ඇසීමි.

"ඔහු නම් මහාචාර්යවරයෙක් කියලා මං කොහොමටවත් හිතන්නෙ නෑ" හෝම්ස් කීය. "ජෝනාස්. ටී. වැන්ඩර්බිල්ට් කියන නමත් බොරු නමක්. ඒ වුණත් එයාගෙ ඇත්ත නම දැනගන්නා තුරු වැන්ඩර්බිල්ට් කියන නම අපිත් පාවිච්චි කරමු. ඔහු වෙස්වළාගැනීමට බොහොම දක්ෂයෙක් බව පැහැදිලියි. ඉතාම සූක්ෂම ආකාරයට මේ හොර තක්කඩි වැඩේ සැලසුම් කරන්නේ ඔහු. චිකාගෝ විශ්වවිද්‍යාලයේ ලිපි ශීර්ෂ මුද්‍රණය කරගෙනම තමයි, ඔහු වැඩ පටන් අරගෙන තියෙන්නේ. ඔහු තමන්ගේ බාහිර පෙනුම වෙනස් කරගන්නා ඉක්මන ඔබ තේරුම් ගත්තද වොට්සන්? නොවැම්බර් මාසයේ සර් මැක්ස්වෙල් හමුවෙන්න ආවෙ සුදුපැහැති කොණ්ඩයක් ඇති වයස්ගත මහාචාර්යවරයෙක්. සිකුරාද රෑ ජෝජ් තානායමේ කෑම කද්දි ඔහුගේ මූහුණ දුඹුරුපාට රැවුලකින් වැහිල තිබුණා. පහුවද පාන්දර දුම්රිය පොළේදී මුහුණෙ රැවුලක් නෑ. මේ අන්දමින් ඔහු වෙස්වළාගැනීම් කරන්නෙ පොලීසිය නොමඟ යවන්න බවට සැකයක් නෑ. කලින්ද රෑ එකට ගිය දෙන්නා පහුවද උදේ දුම්රියපොළේ තැන් දෙකක හිටියේ, නාඳුනන





දෙන්නෙක් විදියට. කොහොමවුණත් ඔළුකැන මොළකාරයා උස මිනිහා - වැන්ඩර්බිල්ට් විය යුතුයි. මිටි මිනිහා වෙන්න ඇති "යෙග්මන්""

"යෙග්මන්? ඒ කවුද?" මම ඇසීමි.

"යෙග්මන් කියලා අපරාධ ලෝකයේ හඳුන්වන්නෙ යකඩ සේප්පු බිඳින්නාට." හෝම්ස් කීය. "කාලෙකට පෙර ඇමරිකාවෙ ඉඳල තියෙනවා ඉතාම විශිෂ්ට ගනයේ අතිදක්ෂ යකඩ සේප්පු බිඳින්නෙක්. ඔහුගේ නම යෙග්. ඔහු මුදල් හා රන් ආබරණ අඩංගු යකඩ සේප්පු කඩමින් ගෙවල් ගණනක් ගියාලු. ඒ විදියේ හොරකම් කරන පුද්ගලයාට යෙග්මන් කියන නම වැටුණේ එහෙමයි. කොහොම නමුත් අර අතිදක්ෂයා අන්තිමට පොලීසියට අහුවුණා"

"අද ඔබ ප්‍රයෝජනවත් තොරතුරු රැසක් එකතුකරගත්තා කියල කිව්වා නේද? මොනාවද ඒ?" මම ඇසීමි.

"සේප්පු, අල්මාරි කඩන්න ඔවුන් ගෙනෙන අවිආයුධ, අඬු, කියත් ආදී දේවල් තියෙනවා. නමුත් ඊට අමතරව ඔවුන් තවත් දේවල් ගෙනැවිත් තිබුණා" මගේ මිත්‍රයා කීය. "ගෙවල් බිඳින හොරුන් ළඟ දකින්නට ලැබෙන කඹවලින් තැනූ ඉණිමං ආදිය. අන්න ඒ නිසා තමයි මං ජෝජ් තානායමේ වේටර්වරයාගෙන් ඇහුවෙ ඔවුන් ළඟ ලොකු ගමන්මල්ලක් තිබුණාද කියල. ඉණිමඟට අමතරව ඒ මල්ලෙ තියෙන්න ඇති, වෙස් වළාගැනීමට උවමනා වෙන බොරු රැවුල්, බොරු කොණ්ඩ සහ එකිනෙකට වෙනස් ඇඳුම් පැළඳුම් ආදිය.

අපරාධය සිදුවුණු දවසේ ඔවුන් කටයුතු කළ ආකාරය ගැන අපි තවදුරටත් හිතලා බලමු වොට්සන්. රෑ 7.35 වෙද්දි ග්‍රේට් වෝල්ටන් වෙත ළඟාවෙන දුම්රියේ ආවා. ජෝජ් තානායමෙන් කෑම කාලා රෑ දහයට එතැනින් පිටත්වුණා. ඔවුන් දුම්රියපොළේ ඉඳල වයිට්ස්ටෝන් මන්දිරයට යන්න ඇත්තේ අඩිපාරක. පයින් යන අයට සුදුසු එහෙම අඩිපාරක් මේ පළාතේ සිතියමේ මං දුටුවා. වලව්ව පිහිටි වත්තට පිවිසුණාම, ගෙදර අය නින්දට යනතුරු, ඔවුන් සෑහෙන වෙලාවක් හැංගිලා ඉන්න ඇති. නියමිත වෙලාව ආවාම, ෆෙල්ට් රෙදි සෙරෙප්පු පැළඳගෙන, ඔවුන් විසිත්ත කාමරයේ ජනේලයෙන් ගෙට ඇතුළුවෙන්න ඇති. තමන්ට ගෙනියන්න උවමනා පෞරාණික බඩු මොනවද කියන කරුණ,



www.sinhalaelibrary.com

වැන්ඩර්බිල්ට් කලින් තීරණය කළොයි ඉන්න ඇත්තෙ. ඒවා තිබුණු තැන ඔහු දැනගිටියා. ඉතින් අවශ්‍ය දේවල් තෝරාගන්න, ඔහුට ඒ හැටි වෙලාවක් ගතවෙන්න නෑ.

ගිය නොවැම්බරයේ ඔහු මෙහේ ආ වෙලාවෙ, ගෙදර උඩුමහලත්, සර් මැක්ස්වෙල් අමුත්තාට පෙන්වලා තිබුණනෙ. ඉතින් ගෙහිමියාගෙ නිදනකාමර, සේවක නිදනකාමර තියෙන තැන් ගැන වැන්ඩර්බිල්ට් ට හොඳ වැටහීමක් තියෙන්න ඇති. ගෙදර ආරක්ෂාවට බල්ලෙක් හිටියාද නැද්ද කියන කරුණත් ඔහු දැන හිටියා. උවමනාකරන බඩු ටික ගමන්මල්ලට දමාගෙන, ඇඳුම් මාරුකරගෙන, වයින් වීදුරුවක් බීලා ගෙයින් පිටවෙන්න ඇති. ඊළඟට ආපු පාරෙන්ම ශ්‍රේට් වෝල්ඩන් බලායන්න, ඔවුනට අපහසුවක් වෙන්න නෑ. පාන්දර පහයි දෙළහේ දුම්රිය අල්ලාගන්න කල්වේලා ඇතිව ඔවුන් දුම්රියපොළට ළඟාවුණා. ඒ කාරණා එකිනෙකට හොඳින් ගැළපෙනවා. සැකයක් ඇත්නම් ඒ..... මේකට තුන්වැන්නෙකුත් හවුල්ද කියන එකයි"

"තුන්වැන්නෙකුත්!" මම ඇසීමි. "ඒක වෙන්න බැහැ නේ. වයින් බීපු වීදුරු දෙකයි නේද තිබුණේ?"

"මං අදහස් කළේ හොරකමට තුන්දෙනෙක් හවුල්වුණා කියන එක නෙමෙයි" හෝම්ස් කීය. "මං අදහස් කළේ, මේ දෙන්නා හොරකම් කරන වටිනා බඩු විකුණගන්න, තුන්වැන්නෙකුත් හවුල්ද දන්නෙ නැහැ කියන එකයි. බාගවෙලාවට එහෙම අතරමැදියෙක් නැතිවත් ඇති. මේ වගේ මිල කළ නොහැකි පෞරාණික භාණ්ඩ එකතුකරන කෝටිපතියෝ ලෝකයේ නොයෙක් රටවල ඉන්නවා. එහෙම කෙනෙකු සමග ගනුදෙනුව කලින්ම කළේ වැන්ඩර්බිල්ට් වෙන්න පුළුවන්"

"හෝම්ස් ඔබ කියන්නේ, මේ මිනිහා කළේ කාගෙ හරි ඇණවුමකට බඩු සැපයීම කියලද?"

"එහෙම වෙන්නත් බැරිකමක් නෑ වොට්සන්. ඔබට මතක නැද්ද කාලෙකට ඉහත වෝල්පෝල් සිතුවම් එකතුවෙන් ෆ්‍රැගොනාඩ් චිත්‍රය සොරකම් කළ සිද්ධිය? මච්චර සිතුවම් එතැන තිබිලා, ඇයි ඒ සිතුවම විතරක් හොරකම් කළේ? හෙන්රි ද ලා බර්ට්‍රොන්ගේ නම් කෝටිපතියා ළඟ තිබුණු චිත්‍ර එකතුවේ, ඔහුට තිබුණු අඩුපාඩුව ෆ්‍රැගොනාඩ් චිත්‍රය පමණයි. ඔහු වෘත්තීය හොරෙකුට ඇණවුම දුන්නා, ඒ චිත්‍රය කොහෙන් හරි අරගෙන එන ලෙස. සමහරවිට





මෙහෙනත් සිදුවෙන්නෙ ඒ විදියේ දෙයක් වෙන්න පුළුවනි. ඇත්ත තත්ත්වය ඒක නම්, මේ එකතු කරන්නාට ඒ බඩු කවදාවත් මහජන ප්‍රදර්ශනය සඳහා තබන්න බැහැ. ඒ මොකද ප්‍රදර්ශනයකට ඒවා එළියේ තැබුවොත් අපට පුළුවනි හොර කණ්ඩායම අල්ලාගන්න"

"හෝම්ස්, ඔබේ කතාවෙන් පෙනෙන්නේ සැක නැතුව මේ හොරුන් අල්ලා ගැනීමට ඔබට හැකි බවයි. එහෙම නේද?"

"ඒක කරන්න පුළුවන් කියලා මට ලොකු විශ්වාසයක් තියෙනවා වොට්සන්"

බොහෝ වෙලාවල මා විහිළුවට ලක් කරන මගේ මිත්‍රයාට විහිළුවක් කිරීමට, මේ අවස්ථාව යොදා ගැනීමට සිතා, මම මෙසේ කීවෙමි.

"හෝම්ස්, ලෙස්ට්‍රේඩ් ඇවිත් මෙතැන වැඩ පටන්ගත්තාම තමයි ඔබේ අගය නැතිවී යන්නෙ. ස්කොට්ලන්ඩ්යාඩ් එකේ අපේ මිත්‍රයා ඔබව පරාජය කරල දිනුම් කණුව වෙත පහසුවෙන්ම යාවි. ඔබ අර හොවුටාවින් හොයාගත්තා වගේ, ඒවා හොයාගැනීම ලෙස්ට්‍රේඩ්ටත් අමාරුවෙන එකක් නෑ"

"මං කියන දේ විශ්වාස කරන්න වොට්සන්! මං ඕන මට්ටුවක් අල්ලන්නම්. සොයා බැලීම පටන්ගත්තෙ මින් කොතැනින්ද කියන එකවත් ලෙස්ට්‍රේඩ් දන්නෙ නෑ"

"ඔබ පටන්ගනිපු තැනින්ම පටන්ගනීවි"

"නැහැ මිත්‍රයා. මං අදහස් කළේ ඒක නෙමෙයි" හෝම්ස් කීය. "මං දන්නවානෙ ලෙස්ට්‍රේඩ්ගේ මොළේ ක්‍රියාකරන හැටි. ඔහු යොදගන්නා ක්‍රම සහ විධිත් මං දන්නවා. පහුගිය අවුරුදු දෙක ඇතුළත මේ විදියේ තවත් අපරාධ පහක් සිදුවුණා. නමුත් ඔහු ඒවා ගැන ක්‍රමානුකූල අධ්‍යයනයක් කරලා නැහැ. ඒවා ගැන දන්නෙවත් නැහැ. වයිට්ස්ටෝන් මැදුරේ හොරකම ගැන කරුණු කිහිපයක් ඔහු හොයාගනීවි. ඒකෙ සැකයක් නෑ. නමුත් ඊට සමානව සිදුවුණු අනික් හොරකම්වලින් මේ ගැටය ලිහීම පටන්ගන්න ඕන.

අපේ පොලිස් සේවයේ තිබෙන විශාලම අඩුපාඩුවක් තමයි, ඒක කොටස්වලට ප්‍රාන්තවලට බෙදා වෙන්කර තිබීම. එක් එක් ප්‍රාන්තයේ පොලිස් හමුද කටයුතු කරන්නේ වෙන්වෙන්ව. ඒක හරියට දඩබිම් භාරකරුවන් හොයාබලන්නේ ඔවුන්ගේ දඩබිමේ මායිම ඇතුළත ඉන්නා වල්සත්තු ගැන විතරයි වගේ. අපේ පොලිස්



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print

හමුදාවේ කටයුතු ප්‍රාන්තවලට බෙදාකිරීම නිසා, අපරාධ මර්දන කටයුතු සිදුවෙන්නෙත් ඒ වගෙයි. නමුත් වැන්ඩර්බිල්ට් වැනි අපරාධකාරයින්ට ප්‍රාන්ත සීමා, දේශ සීමා නැහැ. ඔවුන් නිදහසේ රටපුරාම අපරාධකරමින යනවා. කෙනෙකුට හිතේවි දුම්රියසේවය පටන් නොගත්තා නම් හොඳයි කියල. ඒ මොකද ඈත පළාතක අපරාධයක් කරලා සීඝ්‍රගාමී දුම්රියකින්, කෙටි කාලයකින් ලන්ඩනයට පැනඊම දැන් පුහුණු නිසා."

"ඉතින් ඒකට මොකක්ද ඔබ යෝජනා කරන ප්‍රතිකර්මය?"

"ප්‍රධානම දේ, අපේ ප්‍රාන්ත පොලිස් සේවාවන් හා ලන්ඩන් පොලීසියෙන් හොයාගන්න තොරතුරු, එක් ස්ථානයකට එක් රැස්කළ යුතුයි. ඉන්පසු ඒවා සියුම් ලෙස විශ්ලේෂණය කරනවිට පෙනේවි, වැන්ඩර්බිල්ට් වගේ සමහර අපරාධකාරයින්ට ප්‍රාන්ත සීමා නැතිබව. ඊළඟට එම මධ්‍යස්ථානයට පුළුවන් අර ප්‍රාන්ත පොලිස්සේවා නිතිපතා දැනුවත් කරන්න. කවදහරි මාව ස්කොට්ලන්ඩ්යාඩ් එකේ ප්‍රධානියා හැටියට පත් කළොත් (දෙවියනි එහෙම නොවේවා!) මං දන්නවා පොලිස් සේවය ප්‍රතිසංවිධානය කළ යුතු පිළිවෙළ.

වැන්ඩර්බිල්ට් සහ ඔහුගේ සගයා අල්ලාගැනීම මට අපහසුවෙන්නෙ නෑ. ඒ ඇයි කියල දන්නවද? මං ඔවුන් ගැන සියලුම තොරතුරු එක් රැස් කරලයි තියෙන්නෙ. වොට්සන් ඔබට පුළුවන්ද සිකුරාද හවස බේකර් වීදියට එන්න? හවස දෙකහමාරට විතර පොඩි නිවාඩුවක් ගන්න ඔබට අපහසු වෙන එකක් නැහැ නේද? මගේ හිතවත් මිත්‍රයා, ඔබට එහෙම එන්න බැරිවුණොත් ඒක මගේ බලාපොරොත්තු කඩවීමක්"

හෝම්ස් විසින් කරනු ලද ඉල්ලීමක් කොයි වෙලාවක හෝ ප්‍රතික්ෂේප කිරීම, පහසු දෙයක් නොහැකි. විශේෂයෙන්ම ඔහු සතුටු සිතින්, ජයග්‍රහණය පිළිබඳව විශ්වාසය තබා ඉන්නා මොහොතක ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම වඩාත් අපහසුය.

යොදාගත් පරිදි සිකුරාද දහවල් මම බේකර් වීදියේ නිවහනට ළඟාවූයෙමි. තට්ටු පෙළේ ඉහළට නැගීමට පෙර මට හමුවූයේ හඩ්සන් මහත්මියයි. සාමාන්‍යයෙන් සන්සුන් නැන්පත් ස්වභාවයක් ගන්නා ඇය කැලඹීමට පත්ව සිටි බවක් මට දකින්නට ලැබිණි. මම ඒ ගැන ඇගෙන් විමසුවෙමි. ඇය එක්වරම ඇගේ කෝපය පිටකරමින් පුපුරා ගියාය.





"මේ හෝම්ස් මහත්තයාගෙ වැඩ!" ඇයට කෑගැසිණ. "මට හරි තරහයි වොට්සන් මහත්තයා, දැන් දවස් දෙකක් තිස්සෙම කොයි වෙලෙත් කුස්සියට එනවා. ඇවිත් එක එක දේවල් ඉල්ල ඉල්ල කරදර කරනවා. පාන්පිටි ඉල්ලයි, විනාකිරි ඉල්ලයි, බේකිං පවුඩර් ඉල්ලයි, පීරිසි ඉල්ලයි. අරව මේව ඉල්ලනවා. හෙට අනිද්දා වෙනකොට තව මොනවා ඉල්ලාවිද මං දන්නෙ නෑ. මගේ පීරිසි එක්කොම වගේ උඩට අරගෙනගියා. මිනිහත් මිනුස්සයෙකුට තේ කෝප්පයක් දෙන්න පුළුවන් පීරිසිය පීරිසියක් දැන් ගේ හරියෙ නෑ. එච්චර විතරක් නෙමෙයි. ඔහු අද අපේ කිච්න්බෝයිටද මොකකටද දමන විදුරුකැලි අතින් අල්ලලා දෙන්න කියල එක එක්කෙනාට කියනවා. කුස්සියේ උයන්න ඉන්න කෙල්ලටයි, ගෙදර වැඩ කරන කොල්ලටයි විතරක් නෙමෙයි, ලියුම් බෙදන්න එන තැපැල්කාරයාටත් ඔහු ඒක කියනවා. ඒක මොකක්ද විද්‍යාත්මක පරීක්ෂණයක්ලු. ප්‍රශ්නය තියෙන්නේ ඒකා නිසා, මට මේ ගෙදර කුස්සිය පිළිවෙළකට තියාගන්නත් බෑ. පැවැත්ත කරගන්නත් බෑ. හැම එකක්ම අවුල් වෙනවා."

මේ පරීක්ෂණ සිදුකෙරුණේ කුමක් සම්බන්ධයෙන්ද යන්න මට පිනාගත හැකිවිය. එහෙත් ඒ සඳහා හෝම්ස් යොදාගෙන ඇති ද්‍රව්‍ය, මගේ සිතේ ඇතිකළේ කුතුහලයකි. මා උඩුමහලට නැග විසිත්ත කාමරයට පිවිසෙද්දී, මගේ මිත්‍රයා මේසය මතට පහත්වී යමක් නිරීක්ෂණය කරමින් සිටියේය.

"හෝම්ස්, මොකද මේ හඩ්සන් මහත්මිය කෑගහන්නෙ බේකිං පවුඩරුයි ඒවයි මේවයි කුස්සියෙන් අරගෙන යනවා; හරි කරදරයක් කියල?"

"ඇය එහෙනම් කල් ඇතුවම ඔබට හැමදේම දැනුම්දීලා වගෙයි." හෝම්ස් කීය. "ඇය ගතිගුණ අතින් ලෝකෙත්තම හොඳ තැනැත්තියක්. ඒකෙ සැකයක් නෑ. ඒත් සමහර වෙලාවට .....ඔව් ඉතින් බලාගෙන ගියාම ඇගේ පිළිවෙළත් අනික් ගෑනුන්ගේ විධියමම තමයි. ඇයටත් උවමනා කරන්නේ ගේ බොහොම ක්‍රමානුකූලව පිළිවෙළකට තියාගන්න. ඉතින් කුස්සියේ හෝ කෑමකාමරයේ ඒව මේව අදිනවට ඇය කැමති නෑ. ඇය දවස ගතකරන ආකාරය ටිකක් එහා මෙහා කරන්න ඇය එකඟ නෑ. මහොම පුළුවන්ද? ඇවිත් බලන්න වොට්සන්. මං කුස්සිය අවුල් කළා කීවට මොන තරමක් දේවල් කරල තියෙනවද කියල"



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

විවිධ ආකාරයේ බඩුබාහිරාදිය මේසය පුරා විසිරී තිබිණ. අණ්වීක්ෂය තුළට දමා, ඇසට නොපෙනෙන දේ නිරීක්ෂණය කිරීමට යොදා ගන්නා විදුරු කැබලි රාශියක් විය. විවිධ ද්‍රව්‍ය දමා තිබූ පීරිසි රැසක් ද මම දුටුවෙමි. එයින් මට හඳුනාගත හැකි ද්‍රව්‍ය වූයේ පාන්පිටි, දූලි, අඟුරු කුඩු හා සුරුට්ටු අළුය. දියසායම්වලින් චිත්‍ර පාට කිරීමට යොදා ගන්නා වර්ගයේ ලොකු කුඩා පින්සල් හතඅටක් මේසයේ තවත් තැනක විය. සියල්ලටම මැදින් තිබුණේ සර් මැක්ස්වෙල් බුවුන්ගේ නිවසෙන් ගෙන ආ වයින් විදුරු දෙක ය.

"වොට්සන්. ඔය උත්තල කාචය අතට අරගෙන මුලින්ම මේ වයින් විදුරු දෙක පරීක්ෂාකරල බලන්න. ඔබට දකින්න ලැබේවි එක විදුරුවක මහපටැඟිල්ලක හා සුළඟිල්ලක ලකුණු. අනික් විදුරුවේ මහපටැඟිල්ලක ලකුණක්; අනෙක් සලකුණු ගැන අමතක කරන්න. ඒවා බොඳවුණු නොපැහැදිලි සලකුණු"

මම ඔහු පැවසූ ආකාරයට කාචයෙන් පරීක්ෂා කර බැලීමි. මිනිත්තු කිහිපයක් එසේ කළ පසු ඔහු කී දේ දැකීමට මට හැකිවිය.

"හරි හරි. ඔබ කිවූ ඇඟිලි සලකුණු මට පෙනෙනවා" මම කීවෙමි. "ඔබ විදුරුව මත අතුරා තිබෙන සුදුපාට සියුම් කුඩු නිසා, විදුරුවේ අනෙක් හරියෙන් වෙන්වෙලා ඇඟිලිවල සටහන පැහැදිලිවම දකගන්න පුළුවනි"

"විශිෂ්ටයි වොට්සන්. ඔන්න ඕක තමා මගේ මේ පර්යේෂණයේ අරමුණ වුණේ. දැන් බලන්න මෙන්න මේ කඩදාසි දිහා. ඔබට පෙනෙනවා ඇති, අර ඇඟිලිවල සටහන් විදුරුවේ වැදී තිබුණු ආකාරය. මම ඒවා විශාල කරලා කඩදාසියේ ඇන්දා. ඒ අනන්ත අප්‍රමාණ ඉරිවලින් හැදුණු රවුම් රවුම් තියෙනවා. එක් එක් හැඩේ දූපත් වගේ ඒවා තියෙනවා. ලණුවකින් සාදා ගැට හෝ තොණ්ඩු වගේ ඒවා තියෙනවා. විදුරු දෙකේම තිබෙන මහපටැඟිලි සලකුණු එකිනෙකට වෙනස් බව ඔබට පෙනෙනවා ඇති. එකක තියෙනවා තොණ්ඩු දෙකක්. අනෙකේ එකයි. ඔබ මේවා අර විදුරු කැබලිවල තියෙන මහපටැඟිලි සලකුණු එක්ක සංසන්දනය කළොත් තවත් වෙනස්කම් පෙනේවි. ඒවා හඩ්සන් මහත්මියගේ, ලියුම් බෙදන්නාගේ සහ අපේ සේවක ළමයා බිලීගේ. ඒ සටහන්වලත් ඒවාටම විශේෂ වූ ලක්ෂණ තියෙනවා. වෙනත් වචනවලින් කියතොත් එකම විදිහේ ඇඟිලි සලකුණු දෙදෙනෙකුට තියෙන්න අවස්ථාවක් නැතිතරම්.





අපරාධ පරීක්ෂණයට මේ ක්‍රමය යොදාගන්න පුළුවන්ද කියන ඒකට රාජ්‍යාරක්ෂක දෙපාර්තමේන්තුවේ අවධානය යොමුවුණේ ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේදී. ඔබ දන්නවාද මං දන්නේ නෑ වොට්සන්, ටිරැප් නම් මහත්මයෙකුගේ සභාපතිත්වයෙන් කොමිසමක් පත්කෙරුණා. මොකටද? අපරාධකාරයින් හඳුනාගත්තාම ඔවුන් ගැන වාර්තා තබාගැනීම සඳහා, වඩාත් හොඳ ක්‍රමය මොකක්ද කියා, තෝරාගැනීම සඳහා. වඩාත් අපට හුරුපුරුදු ක්‍රමය වුණේ බර්තිලොන් ක්‍රමය තමා. එහෙත් කාර්යක්ෂම ඒකද නැත්නම් ඇඟිලි සලකුණු ක්‍රමයද කියලා විමසා බැලීමයි කොමිසමට භාරවුණේ."

"හෝම්ස්. මං හිතාගෙන හිටියේ ඔබ හැම විටම බර්තිලොන් ක්‍රමය අගය කළ කෙනෙක් කියලයි"

"ඇත්ත. මං ඒ කාලෙ අගය කළේ බර්තිලොන් ක්‍රමය තමා." හෝම්ස් කීය. "ඒ කාලෙ අපට තිබුණු එකම ක්‍රමය ඒක. අපරාධකාරයෙක් අල්ලා ගත්තාම විවිධ කෝණවලින් ඔහුගේ ඡායාරූප අරගෙන, මුහුණේ විවිධ මිනුම් අපි නිවැරදිව සටහන් කරගෙන වාර්තා ගතකළා.

නමුත් මේ විකල්ප ක්‍රමයේ අරකට වඩා වාසි රැසක් තියෙනවා වොට්සන්. මං මේක හොඳින් අධ්‍යයනය කරගෙන යද්දියි මට ඒ බව වැටහුණේ. ඔබ දන්නවා ඇති මේ ඇඟිලි සලකුණු ක්‍රමය ප්‍රචලිත කරන්න මුලින්ම මහන්සිවුණේ මානව විද්‍යාඥ ශ්‍රීමත් ෆ්‍රාන්සිස් ගැල්ටන් බව. ඔහු කියා තිබූ කරුණුවලටයි මගේ අවධානය මුලින්ම යොමුවුණේ. නමුත් ඔබ දන්නවාද මේ ක්‍රමයේ පුරෝගාමීන් ඉන්නේ දකුණු ඇමරිකාවේ බව? ඔවුන් අපව පරාජය කරලා. ආර්ජන්ටිනාවේ ලප්ලාටා මධ්‍යම පොලිස් සේවය ගැන ඔබ අහලා ඇති. අපරාධකරුවන් හඳුනාගැනීමට ඔවුන් මේ ක්‍රමය යොදාගෙන තියෙන්නේ මීට අවුරුදු හතරකට කලින් ඉඳලා. ජුවාන් වෙකියුටිච් නම් ආර්ජන්ටිනා අපරාධ පරීක්ෂණ විද්‍යාඥයාට තමයි ඒ ගෞරවය හිමිවෙන්නේ. මට හොඳටම විශ්වාසයි වොට්සන්, වැඩිකල් නොගිහිං ස්කොට්ලන්ඩ්යාඩ් එකත් පටන්ගනීවි ඇඟිලි සලකුණු අංශයක්* - ඒ මගින් අපරාධකාරයින් හඳුනාගැනීමට.

* ෂර්ලොක් හෝම්ස්ගේ අනාවැකිය නිවැරදි විය. 1901 දී සර් එඩ්වඩ් හෙන්රිගේ ප්‍රධානත්වයෙන් ස්කොට්ලන්ඩ්යාඩ් ඇඟිලි සලකුණු විමර්ශන අංශයක් අරඹන ලදී.

"මට මතක හැටියට මේ කරුණු මං මීට කලිනුත් ඔබට කියා තිබෙනවා වොට්සන්. ඉංග්‍රීසි ජාතිකයෙක් වන විලියම් හර්ෂල් තමයි මුලින්ම පුද්ගලයින් ගැන සටහනක් තබාගැනීමට ඇඟිලි සලකුණු භාවිත කරල තියෙන්නේ"

"ඔබ ඔය කියන්නේ ඉන්දියාවේ බෙංගාලයේ හූග්ලි දිස්ත්‍රික්කයේ පාලකයාව සිටි සර් විලියම් හර්ෂල් ගැනද?"

"අන්න හරි ඔහු තමා. වොට්සන් ඔබත් ඔහු ගැන අසා තිබෙනවා වගෙයි. සැකයක් නෑ. ඔබත් ඉන්දියාවේ සේවය කළානේ කාලයක්. සර් විලියම් මේක විවිධ අවස්ථාවලදී යොදා ගත් බවයි කියන්නේ. හූග්ලි හි බන්ධනාගාරයක රැඳවියන් ගැන වාර්තාවක් තබාගන්නත් මේ ඇඟිලි සලකුණු ක්‍රමය යොදාගත්තලු.

"මට නම් මතක හැටියට, ආචාර්ය හෙන්රි ෆෝල්ඩ්ස් නම් කෙනෙක් තමයි ඔය ඇඟිලි සටහන් ගැන මුලින්ම කතාකරන්න පටන්ගත්තේ." මම කීවෙමි.

"ඔබේ මතකය අපූරුයි වොට්සන්. ආචාර්ය ෆෝල්ඩ්ස් 1880 තරම් ඈතදී නේචර් සඟරාවට ලිපියක් ලියමින් ඇඟිලි සලකුණුවල වැදගත්කම එංගලන්තයට හෙළිකළා. මැනක් වෙනතුරු ඔය ක්‍රමය ගැන මගෙත් ඒ හැටි පැහැදීමක් තිබුණේ නෑ.

මේක හුඟක්ම ප්‍රයෝජනවත් වෙන්නේ අපරාධකාරයා අත්අඩංගුවට ගත්තට පස්සේ, ඔහු ඊට සම්බන්ධවුණු බව තහවුරු කරගන්න බව ඇත්තයි. නමුත් ඇඟිලි සලකුණු ක්‍රමයේ විශිෂ්ට අපූර්වත්වයක් තියෙනවා. ඒ තමයි ඔහුව අල්ලා ගැනීමට පෙර අපරාධකාරයාගේ හෝඩුවාවක් ලබාගැනීමට ඇති හැකියාව. ඒ ගැන හිතල බලන්න වොට්සන්. අපරාධයක් කළ හැමන ඔහු ඇඟිලි සටහන් ඉතිරි කරල යනවා. ඔහු, අප ළඟ වාර්තා තිබෙන අයෙකු නම්, ඔහු අල්ලා ගැනීමටත් පෙර අපට පුළුවනි, ඔහු හඳුනාගන්න. එහෙම නැතුව ඔහු අලුත් කෙනෙක් කියල හිතමු. එහෙම වුණොත් පසුව අල්ලාගන්නා තුරු අපට පුළුවනි ඒ හෝඩුවාව ආරක්ෂා කරගන්න. කොහොම හරි ඔහු ඒ අපරාධයට පැටලෙන්නේ, හරියට කවුරු හරි, ඒ මොහොතේ ඡායාරූපයක් ගත්තා වගේ."

"ඔබ කියූ කරුණුවල වැදගත්කම මට තේරෙනවා හෝම්ස්. ඒ වුණත් මොකටද මේ පින්සල් සහ පිරිසි?"

"ඒ මං කරන අත්හදා බැලීමක් වොට්සන්." ඇසට නොපෙනෙන ඇඟිලි සලකුණු එළියට මතුකර ගැනීම සඳහා යොදාගන්න, සුදුසු





කුඩු වර්ගය මොකක්ද කියල මං අත්හදා බැලීමක් කළේ. ඉතා සියුම් ලෙස කුඩුකළ රතුහුණු කුඩු ඉතාම හොඳ බව මට පෙනී ගියා. ඔවු ලෙස්ම යොදා හැදූ පින්සල් තුඩකින්, ඇඟිලි සලකුණ මතට හුණුකුඩු ඇතිරීම තමයි සුදුසුම ක්‍රමය. කොහොම නමුත් මේ ගැන තවදුරටත් අධ්‍යයනය කර, පර්යේෂණ කළ යුතුයි. ඒ පස්සේ පොත්පිංචක් වුණත් ලිවීමට මට හැකිවේවි."

"හෝම්ස් ඔබ මට අද එන්න කිව්වෙ ඔය ඇඟිලි සලකුණු ක්‍රමය ගැන ඔබ කළ සොයාගැනීම් විස්තර කරන්නද කියල මං හිතන්නෙ නෑ."

"කොහොමටවත් නෑ මිත්‍රයා." හෝම්ස් කීය. "ඔබට මතකද මං අද කිව්වා ලියුම් රාශියක් ලැබුණු බව? ඒවා බොහොමයකට පිළිතුරු යැව්වා. ඒ හැම එකක්ම කියවා බැලීම ඔබට අපහසුයි. ඒ නිසා ඒවල අඩංගු කරුණුවල සාරාංශය මං ඔබට කියන්නම් වොට්සන්.

පසුගිය අවුරුදු දෙකක කාලය තුළ ගෙවල් බිඳලා, බඩු සොරාගත්තාවට ගොදුරුවුණු පුද්ගලයින් පස්දෙනාම මට ලියුම් එවා තිබුණා. ඒ හැමදෙනාගෙම ගෙවල්වලට මං හිතූ විදියටම සොරුන් ඇවිත් තියෙනවා. එහෙම ඇවිත් තියෙන්නේ අපරාධය සිදුවීමට මාස පහකට, හයකට කලිනුයි. ඒවා ගැන තොරතුරු මං කෙටියෙන් කියන්නම්. එක ගෙදරකට ඇවිත් තියෙන්නේ අපේ මිත්‍ර මහාචාර්ය වැන්ඩර්බිල්ට්මයි. නමුත් ඔහුගේ හිසකෙස් සුදුයි. වයස අවුරුදු හතළිහක් පමණ. ඔහු එක්සත් ජනපදයේ ලොස් ඇන්ජලීස් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක්ලු. ගෙවල් දෙකකට ඇවිත් තියෙන්නේ ජර්මන් මහාචාර්යවරු. එක්කෙනෙක් මියුනිච් සරසවියෙන්. ඔහුට තිබුණලු නිකටේ එළ රැවුලක්. අනෙකා ජර්මනියේ ඩ්‍රෙස්ඩන් සරසවියෙන්. ඔහු රත්රන් රාමුවක් සහිත උපැස් යුගලක් පැළඳ හිටියලු. ඔහුගේ දෙකොපුලේ "සයිඩ් බර්න්ස්" මෝස්තරයේ පැසුණු රැවුලක් තිබුණලු. පස්වැනි තැනට ඇවිත් තියෙන්නේ ප්‍රංශයේ බෝඩෝ කෞතුකාගාරයේ අධ්‍යක්ෂක වරයෙක්. ඔහුට තිබිල තියෙනවා අලංකාර කළුපාට උඩුරැවුලක්. එපමණක් නොවෙයි, ඇවිදිනකොට ඔහු කකුලක ආබාධයක් නිසා කොරගසමින්ලු ඇවිද්දේ. ඔවුන් හැමදෙනෙකුම කියල තියෙන්නේ ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳ විශේෂඥයින් බවයි.

ඒ තැන්වලින් සොරකම් කරගෙන ගිහින් තිබෙන බඩුවල ලේඛනයක් මං සැකසුවා. එයින් කිහිපයක් පමණක් මං කියන්නම්.

මෙල්වුඩ් සාමිවරයාගේ ආවඩා ආයත්තු තිබූ මැණික්ගල් ඇල්ලූ අවානක්. ඒ පවුල්වල මුතුමිත්තන්ගේ ඇත්දත්වලින් කැටයම් කළ කුඩා ප්‍රතිමා රාශියක්. මෙඩ්වෝර්ඩ් සාමිවරයාගේ මිත්තණියට දෙවැනි චාල්ස් රජු විසින් පරිත්‍යාග කරන ලද රිදී ආභරණ..... මට මේ ලේඛනය තවත් දිගට කියවන්න පුළුවනි වොට්සන්. ඒ වුණත් ඔබට දැන් පෙනෙනවා ඇති මෙහි වැදගත්කම.

මට නම් හිතෙන්නේ මේ දේවල් හොරකම් කර තිබෙන්නේ කවුරුන් විසින් හෝ දී ඇති විස්තර ඇණවුමක් අනුව කියලයි. ඒ ඇණවුම කළ පුද්ගලයා, පෞරාණික භාණ්ඩ එකතුකරන්නෙක්. දැන් මගේ හිතේ චිත්‍රයක් මැවෙනවා, ඒ පුද්ගලයා ගැන. සිතුවමක් තරද්දී සායම් තැවරූ පින්සල්වල, එක් එක් පින්සල් පාර මගින් චිත්‍රය සම්පූර්ණ වෙනවා. ඒ විගේ ඔහු හොරකම් කර ඇති බඩු හා ස්ථාන ගැන එකින් එක කියවාගෙන යද්දී, ඔහු ගැන මගේ හිතේ ඇඳෙන චිත්‍රය සම්පූර්ණ වෙනවා. එක් දැක්මකින් ඔහු අතිශයින්ම ධනවත් කෝටිපතියෙක්. අනෙක් පැත්තෙන් ඔහු විකෘති මනසක් ඇති පුද්ගලයෙක්. මං එහෙම කියන්නේ ඇයි? හොඳ සිහිබුද්ධියෙන් ඉන්න කිසිම මිනිහෙක් වටිනා කලාකෘතීන් තමන් සතුකරගන්න, මේ වගේ වැඩපිළිවෙලක් අනුගමනය කරන නිසා. ඊට අමතරව ඔහු ස්වෝත්සාහයෙන් ධනවත්වුණු කෙනෙකු බව මට විශ්වාසයි. ඊළඟට ඔහුගේ දෙමව්පියන් හා නෑදෑ පරපුර ගැන තොරතුරු නොපැහැදිලියි. ඒව වැහිල තියෙන්නේ කළු වලාකුළකින්. බාගවෙලාවට ඔහුගේ හිතේ ඒ ගැන තියෙන්නේ ලැජ්ජාවක්. ඔහු කුඩා කාලයේදී අනාථවුණු කෙනෙකු වුණත් වියහැකියි."

"හෝම්ස්, මං හිතන්නේ ඔබ මෙහෙම දුරදිග යනවා වැඩියි කියලා. ඔහොම දිගින් දිගටම උපකල්පන කරන්න මොනවද ඔබට තියෙන දත්ත? අනාථයෙක්ද නැද්ද, හැදියාවෙන් අපකීර්තිමත් අයද, මේවා කොහොමද ඔබ තර්කානුකූලව නිගමනය කළේ?" මම ඇසීමි.

"මෙහෙමයි." හෝම්ස් කීය. "මේ මිනිහා වෙනුවෙන් වැන්ඩර්බිල්ට් හොරකම් කරලා තියෙන දේවල් ගැන බලන්න. ඒ හැමදෙයක්ම පෞද්ගලිකව පරිහරණය කළ දේවල්. කවුරු පරිහරණය කළ දේවල්ද? ඓතිහාසිකව වැදගත්, සමාජයේ සුප්‍රසිද්ධ





හෝ පුතු වංශවත් පරම්පරාවල අය පරිහරණය කළ දේවල්. එහෙම පුද්ගලයින් සතු වටිනා බඩු සොරකම් කර ගැනීම තමයි මේ පුද්ගලයාගේ එකම අරමුණ. මේ වගේ හොරකම් කරන අයට ඒ කාලේ යොදගත් නමක් තිබුණා. ඒ තමයි "ගිජුලිහිණියා" හැඳින්වීමේ පහසුව සඳහා මමත් ඒ නමම පාවිච්චි කරන්නම්. ඉතිහාසයේ වැදගත් නමක්, වැදගත් තැනක් තිබුණු දැනීත් තමන්ට හිටියේ නෑ. තමන් පුතු පරපුරක් කෙනෙක් නෙමෙයි. ඔහුගේ තියෙනවා හීනමානයක්. ඉතින් 'ගිජුලිහිණියා' මොකද කරන්නේ? එවැනි තැනක් හිමිව තිබූ අයගේ දේවල් හොරකම් කරනවා. මොකටද? තමන්ටත් පුතු පැලැන්තියේ දෙමව්පියන් මුතුන් මිත්තන් හිටි බවක් හිතේ මවාගන්න. ඔබ දන්නවා වොට්සන් මගේ පිළිවෙළ. නිශ්චිතව දකින්ට හැකි, නිරීක්ෂණ මගින් සොයාගත්, ප්‍රත්‍යක්ෂ කළ හැකි, කාරණා සාධක ගැන විමසීමයි, මං සාමාන්‍යයෙන් විශ්වාසය තියන්නේ. නොයෙකුත් දේවල් හිතේ මවාගෙන, සිහින ලෝකවල හැසිරීම මගේ පිළිවෙළ නොවෙයි. ඒ වුණත් මෙතැනදී මෙහෙම දෙයක් මතුවී පෙනෙනවා. වැන්ඩර්බිල්ට් ලවා හොරකම් කරවාගත් හොරබඩු කාමරයක පුරවාගෙන, ඒවාට මැදිවෙලා 'ගිජුලිහිණියා' ලොකු ආශ්වාදයක් විඳිනවා ඇති."

අපි මිනිත්තු කිහිපයක් නිහඬව සිටියෙමු. හෝම්ස් කළ විස්තරය අනුව මගේ හිතේ ද චිත්‍රයක් මැවිණ. ඊළඟට ඔහු යළිත් වරක් කථාව ඇරඹුවේය.

"අපට දැනගන්නට ලැබී තිබෙන කරුණු ගැන තවත් හිතාබලමු වොට්සන්. වැන්ඩර්බිල්ට් ගැන මෙතෙක් අප දැනගත් කරුණුවලට තවත් මොනවද එකතු කරන්න පුළුවන්?"

"ඔහු ලෝකය පුරා සංචාරය කරන්නෙකු විය යුතුයි." මම කීවෙමි. "ලොස් ඇන්ජලීස්වලින්, ලෙස්ඩන්වලින් ලියුම් එවන්න ඔහුට හැකිවුණා නම්, ඔහු ඒ පළාත්වල හැවසිලා පුරුදු කෙනෙකු වෙන්න ඇති"

"එහෙම වෙන්න ඕනෙම නෑ වොට්සන්. සමහරවිට ඔහුගේ ආධාරකාරයින් ඇති මේ නගරවල. වැන්ඩර්බිල්ට් ඔහුගේ ලියුම ලියලා කවරවල දමලා, ලිපිනයත් ලියලා තමන්ගේ මිත්‍රයන්ට යවනවා ඇති වෙනත් කවරයක දමලා. ඔහු ඉල්ලා හිටිනවා ඇති ඒ ඒ නගරවලින් තැපැල්කරන්න කියලා. කවුද දන්නේ? සමහරවිට ඒ

මිනිස්සුන් දන්නෙ නැතුව ඇති. මේවා අපරාධයක් කිරීමේ සැලසුමෙන් යවන ඒවා තියල.

ගෙවල් බිඳුම් සිදුවූ දිනයන්, මං ලිත සහිත දිනදර්ශනයක ලකුණු කළා වොට්සන්. එතකොට මට තවත් සිත් ඇදගන්නා කාරණයක් දකින්න ලැබුණා. ඒ තමයි, හැමවිටකම මේවා සිදුවෙලා තියෙන්නේ අමාවක දිනවල - ඒ කියන්නේ සඳක් නොමැති අන්ධකාර රාත්‍රිවල. අපට ඒක විශේෂයෙන් වැදගත් වෙනවා. ගම්බද මන්දිරවලින් ලියුම් ලැබිලා. ඊළඟට වැන්ඩර්බිල්ට් ගෙවල් බිඳින දිනය තීරණය කිරීමේදී ඒක වැදගත් වෙනවා.

මං ලියුම් යැවූ හැම කෙනෙක්ම මට පිළිතුරු එවලා නැහැ. නමුත් පිළිතුරු එවූ අය අතර ඉන්නවා, කෙන්ට් ප්‍රාන්තයේ වැනම් ප්‍රදේශයේ කෙනෙක්, ඒ තමයි අබර්ට්ලිනි ගමේ පදිංචි කර්නල් හීත් බෙනිංටන්. මගේ විශේෂ අවධානයක් ලබාගන්න ඔහුගේ ලිපිය සමත්වුණා. ඔහු පදිංචි හන්ට්ස්වුඩ්හෝල් මැඳුරේ. මට කරුණාකරල අර "ගම්බද වලව්" කියන පොත මෙහාට දෙන්න. එතකොට මං කියවන්නම්, මේ ලියුම එවූ තැනැත්තාගේ මන්දිරය ගැන තොරතුරු..... ස්තුතියි..... කෝ බලන්න.....ආ මේ තියෙන්නෙ.

හන්ට්ස්වුඩ්හෝල් මැඳුර - ජෝර්ජ් රාජ සමයේ ඉදිකර ඇති මෙම විශාල මන්දිරයේ, හැම කාමරයකම ජනේල හා උළුවහුවල, දහඅටවැනි ශතවර්ෂයට අයත් ලී කැටයම් දක්නට ලැබේ. එම මන්දිරයේ තැන්පත්ව ඇති පෞරාණික භාණ්ඩ රාශියකි. තම මුතුන් මිත්තන්ගෙන් පරම්පරාවෙන් – පරම්පරාවට උරුම වී ආ මේ කෞතුක වස්තූන් සුරැකීමට වත්මන් උරුමකරු සමත්වී සිටියි. මේ කෞතුක භාණ්ඩ අතර විශේෂම තැනක් හිමිවන වස්තූන් නම් පහත සඳහන් පරිදිය.

දහහත්වන සියවසේ රිදී කර්මාන්තකරුවන්ගේ සියුම් කැටයම්වලින් පිරුණු, පවුලේ බොහිස්ම බෙසම. මී මුත්තෙකු සතුව තිබූ "බුක් ඔෆ් අවර්ස්" නමින් හැඳින්වෙන පුස්තකය. මේ මැඳුරේ වර්තමාන අයිතිකරුවන කර්නල් හීත් බෙනිංටන්ගේ මව්පස මුත්තණුවන් කෙනෙකු වූයේ, නැපෝලියන්ට එරෙහිව යුද්වැදුණු සුප්‍රකට රණ ශූරයෙකු වූ වෙලිංටන් සාමිවරයා ය. ඔහුගේ හිසකෙස් ස්වල්පයක් තැන්පත්ව ඇති අලංකාර ලොකට්ටුවක් ද මේ මැඳුරේ ඇත. පිරිසිදු රත්තරනින් සාද, වටේට මරකත මැණික්



www.sinhalaelibrary.com



[illegible] තබාවා ඇති මේස, මිලකළ නොහැකි අගනාම කෞතුක වස්තුවක් ලෙස සැලකේ."

කියවීම අවසන් කර තමන් අතේ තිබූ පොත පසෙකින් තැබූ හෝම්ස්, ඊළඟට අතට ගත්තේ ලිපියකි.

"මේක තමයි කර්නල් හීත් බෙනිංටන් මට එවා ඇති ලියමන. පසුගිය ඔක්තෝබර් මාසයේ ඉතාලියේ ට්‍යුරින් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඇන්ජෙලෝ ගැලියානෝ, කර්නල් වෙත ලිපියක් එවා තියෙනවා. ඔහු කර්නල් ගෙන් අවසර ඉල්ලා තිබුණලු ගෙදර උළුවහු සහ ජනේලවල ලී කැටයම් නැරඹීමට. ඒකෙ සඳහන්ව තිබුණලු ඔහු 17 හා 18 ශතවර්ෂවල ලී කැටයම් ගැන විශේෂඥයෙකු බවත්, ළඟදීම ඒ ගැන දේශන මාලාවක් පවත්වන්න බලාපොරොත්තු වෙන බවත්. ඔහු නොවැම්බර් මාසයේ ලන්ඩනයට පැමිණීමට අදහස් කරන නිසා, මන්දිරය නැරඹීමට අවසරය දීලා, ලන්ඩනයේ හෝටලයකට ලියුමක් එවන්න කිව්වලු. ඒ අවසරය දීලා කර්නල්තුමා අදාල හෝටලයට ලියුමක් යවා තියෙනවා. ඒ අනුව ඉතාලි ජාතික මහාචාර්යතුමා පසුගිය නොවැම්බරයේ හන්ට්ස්වුඩ්හෝල් මන්දිරයට ආවාලු. ඔහු අවුරුදු පනස් ගණනක් වයසැති, දනුම් සම්භාරයකින් පරිපූර්ණ කෙනෙක්ලු. දුඹුරුපාට රැවුලකින් මුහුණ සම්පූර්ණයෙන්ම වැහිලා තිබුණු අතර, ඔහු උපැස් යුවළක් පැළඳහිටියලු"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! ඒ කියන්නෙ හෝම්ස්.....?"

"ඒ කියන්නෙ හීත් බෙනිංටන්ගේ ගෙදරත් බිඳිනවා කියන එක මට සහතිකයි" හෝම්ස් කීය. "නමුත් ප්‍රශ්නය තියෙන්නේ වැන්ඩර්බිල්ට් සහ යෙග්මන් හන්ට්ස්වුඩ්හෝල් මැඳුර බිඳින්නේ කවදද කියන එකයි"

"මට හිතෙන්නේ ඊළඟ මාසයේ හඳක් නොපායන අමාවක දවසේ. එහෙම නේද?"

"මගේ අදහසත් ඒක තමයි මිතුරා. අර ලිත් දින දර්ශනය අනුව ඒ දිනය ජූලි මාසයේ 14 වැනිදා....."

මේ මොහොතේ ඔහුගේ කථාවට බාධාකරමින් ඉදිරිදොරේ සීනුව නාදවන ශබ්දය ඇසිණ.

"විදුලිපුවතක් ඇවිත් වගෙයි" හෝම්ස් කීවේ අසුනෙන් නැගී සිටිමිනි.

"ඔබ කොහොමද දන්නේ?" මම ඇසීමි.

"එක හේතුවක් ඊයේ මං කර්නල් හීත් බෙනිංටන් වෙත යැවූ විදුලිපුවතට පිළිතුරක් බලාපොරොත්තුව සිටීම.

දෙවැනි හේතුව විදුලිපුවත ගෙනෙන සේවකයා ගෙදර සීනුව නාදකළ ආකාරය. ඔවුන් එය කරන්නේ ආචාරශීලීත්වයකින් තොරව. තමන් වෙනුව වහාම අවධානය යොමුකරන්න කියල ඔවුන් බලකරනවා"

මිනිත්තු කිහිපයකට පසු විදුලිපුවත රැගත් හඩ්සන් මහත්මිය අපේ විසිත්ත කාමරය වෙත පැමිණියාය. මුලින් මේසය මත තිබූ පිරිසි පේළිය වෙත බලා සිටි ඇය, මීළඟට හෝම්ස් වෙත නොරිස්සුම් කෝපය පළකරන බැල්මකි. අනතුරුව විදුලිපුවත මා අතට දී ඇය යන්නට ගියාය.

"විශිෂ්ටයි වොට්සන්" කවරය විවෘත කළ හෝම්ස් කීවේ අපමණ සන්තෝෂයකිනි. "මං කළ යෝජනාවට කර්නල් කැමැත්ත පළකරලා. උදේ 11.25ට ලන්ඩන් නගරයෙන් එන දුම්රියෙන් එන්නලු. අප එහි ළඟාවෙද්දී, අප කැඳවාගෙන යන්න, වැතම් දුම්රියපොළට ඔහුගේ අශ්වකරත්තය එවන්නාමලු"

"කවදටද?" මම ඇසීමි.

"හෙට"

"ඔබ අදහස් කරන්නේ මෙකට මාවත් කැඳවාගෙන යන්නද?"

"එහෙම නේන්නම් මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීය. "මං හිතුවා ඔබ ඒ ආරාධනයට කැමැතිවේවි කියලා. හෙට ඔබේ ශල්‍යාගාරයේ රෝගීන් ගැන බලන්න කවුරු හරි මිත්‍රයෙක් යොදාගන්න බැරිවෙන එකක් නැ. එහෙම නේද?"

"මා විසින්ම කළ යුතු ශල්‍යකර්මයක් මං හෙට දවසට යොදාගෙනයි තියෙන්නේ" මම කීවෙමි. "මට කණගාටුයි හෝම්ස් ඔබ සමග එන්න හැටියක් නැ."

"කණගාටුවට කරුණක්" හෝම්ස් කීය. "කමක් නැ. මං තනියෙන් ගිහිං කර්නල් හමුවෙන්නම්. හෙට රෑ අටට විතර ඔබට මේ පැත්තෙ එන්න හැකිවේවිද? එවිට ඔබට හැමදෙයක්ම කියන්න මට හැකිවේවි. කොහොම වුණත් ජූලි 14 වැනිද දවස නිදහස්ව තියාගන්න. වැන්ඩබිල්ට් සහ යෙග්මන් ලුහුබැඳ ගිහින් අල්ලාගැනීමේ කටයුත්ත යොදන්නෙ එදටයි. ඒක තනියම කරන්න





මට කොහොමටවත් හැකිවෙන්නෙ නැ. ඔබේ පැමිණීම අනාවශ්‍යයි"

පසුවදා ඔහු වැතම් බලා පිටත්ව ගිය අතර මම මගේ ශල්‍යාගාරයේ කටයුතුවල නිරත වූයෙමි. රාත්‍රි අටට පමණ මා බේකර් වීදියේ නිවහනට ගියේ, ගමන පිළිබඳ තොරතුරු හෝම්ස්ගෙන් අසා ගැනීමේ අරමුණෙනි. එහෙත් ඔහු ඒ විස්තර කිසිවක් මට හෙළිකළේ නැත. සියල්ල සතුටුදායක අයුරින් සූදානම් කරගැනීමට හැකිවූ බැව් පමණක් මට පැවසුවේය. ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ පරීක්ෂක වරයා වූ ගව් මහතා, බුද්ධිමත් මෙන්ම දක්ෂ පුද්ගලයෙකු ලෙස තමාට වැටහුණු බව හෝම්ස් කීය.

"ඒක නෙමෙයි වොට්සන්. 14 වැනිද අපි එහේට යද්දි ඊට හවානැන් ගැනීමට අවශ්‍ය ඇඳුම් පැළඳුම්, ගමන්මල්ලක අසුරාගෙන යා යුතුයි. ඊට අමතරව ශක්තිමත් බර සැරයටියක් ගෙන එන්න අමතක කරන්න එපා. වැන්ඩබිල්ට් සහ ඔහුගේ සහකරු ගේන් ආයුධ සන්නද්ධව වෙන්න පුළුවනි."

"මගේ රිවෝල්වරය ගේන්නද?"

"එපා. මේ සැරේට එපා" හෝම්ස් කීය. "මෙවර අපි කටයුතු කරන්නේ පොලිසිය සමග සහයෝගීතාවෙන් යුතුව. නිල නොලත් අප ළඟ පිස්තෝල තුවක්කු තබාගැනීම ගැන, ඔවුන් කැමැත්තක් දක්වන්නේ නැ. ශක්තිමත් සැරයටියක් ප්‍රමාණවත් වේවි. මං අරගෙන යන්නේ මට හුරුපුරුදු, ඊයම් පුරවා බරෙන් වැඩිකළ දඩයම්කසය. අපි චාරිංක්‍රොස් දුම්රියපොළෙන් හවස 5.24 දුම්රියෙන් පිටත්වෙන්න ඕන. ඒ නිසා කල්තියා එන්න. ප්‍රමාද වෙන්න එපා"

ඉන්පසු ගෙවී ගිය සති කිහිපයේම, හෝම්ස් හමුවීමට යෑමට මට අවකාශයක් නොලැබිණ. රෝගීහු දිගින් දිගටම මා වෙත පැමිණියහ. ඔවුනට ප්‍රතිකාර කිරීමට මගේ කාලය ගතවූ බැවින්, බේකර්වීදිය ගැන සිතීමටවත් මට ඉඩක් නොලැබිණි.

කෙසේ වෙතත් ජූලි 14 වැනිද සවස ගැන මම සිතේ තබාගෙන සිටියෙමි. එදා සවස මම බේකර් වීදියේ අපේ නිවහන වෙත ගියෙමි. හෝම්ස් ගමනට සූදානම්ව සිටියේය. චාරිංක්‍රොස් දුම්රියපොළෙන් 5.24ට වැතැම් බලා පිටත් වී ගිය දුම්රිය අල්ලා ගැනීමට අපට හැකිවිය. කර්නල් හීත් බෙනිංටන් ගේ අශ්වකරත්තය, අප එනතුරු



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

දුම්රියපොළ අසල වියගාලේ නවත්වා තිබිණ. වැඩි පමාවකින් තොරව අපි ඔහුගේ අලංකාර නිවහන වූ හන්ට්ස්වුඩ්හෝල් මන්දිරය වෙත ළඟාවූයෙමු.

සුවිසල් වතුයායක් මැද පිහිටි මෙම මැඳුර ජෝර්ජියානු යුගයට අයත් එකක් බව ගෘහනිර්මාණ ශිල්පය අනුව පැහැදිලිව පෙනිණ. මගේ මිත්‍රයා කර්නල් බෙනිංටන්ට මා හඳුන්වා දුන්නේය. රටලන්ඩ් අශ්වාරෝහක සේනාංකයේ නිලධාරියකු ලෙස කටයුතු කොට විශ්‍රාමලත් කර්නල් බෙනිංටන්, පවුලේ ඉඩකඩම් පරිපාලනය කරමින් හන්ට්ස්වුඩ්හෝල් හි ජීවත්විය. උස සිහින් සිරුරක් තිබූ ඔහු ක්‍රියාශීලී පුද්ගලයෙකු බැව් පෙනිණ. අත්ටියට සකස්කළ අලංකාර උඩුරැවුලක් ද රත්පැහැති මුහුණ ද නිසා ඔහුගෙන් දිස්වූයේ තේජාන්විත බවකි.

එදින රාත්‍රියේ අප විසින් ක්‍රියාත්මක කළ යුතු වැඩ සටහන, රාත්‍රී ආහාරය ගන්නා අතරේ කර්නල් බෙනිංටන් විස්තර කළේය. යුද්ධ හමුදාවේ ප්‍රහාරක මෙහෙයුමක ආකාරයට ඔහු සියල්ල මුලටම සැලසුම් කර තිබිණි.

"හෝම්ස් මහත්මයා, මහාචාර්යවරයා සහ ඔහුගේ උදව්කාරයා කොහේ හරි හැංගිලා අපේ නිවස ගැන සෝදිසියෙන් ඉඳීමට ඉඩ තියෙනවා කියල මට සැක හිතුණා."

"ඉතින්?"

"ඔබ මට උපදෙස් දුන්නා නේ පොලිස්භටයන් හත්දෙනෙක් සහ පොලිස් පරීක්ෂක ගව් හැන්දෑවේ මේ ගෙදරට ගෙන්වා ගන්න? මං මොකද කළේ, අපේ බේකරි හිමියාට තියෙනවා, පාන් බෙදා හැරීමට යොදාගන්නා සම්පූර්ණයෙන්ම ආවරණය වුණු අශ්වකරත්තයක්. මං ඒක ඉල්ලාගත්තා අද රාත්‍රියට පාවිච්චි කරන්න. ඒක මෙහෙට පදවාගෙන එන්නේ බේකරි හිමියාගේ ඇඳුමෙන් සැරසුණු පොලිස් සාජන්ට්වරයෙක්. පරීක්ෂක ගව් සහ ආයුධගත් භටයන් හත්දෙනා ඒ කරත්තය ඇතුළේ හැංගිලා එද්දී කාටවත් පෙනෙන්නේ නෑ. අපි කෑම කාල ඉවරවෙලා කෝපි බොන වෙලාවට ඔවුන් මෙහෙට ළඟාවේවි."

"ඔබේ සැලැස්ම විශිෂ්ටයි කර්නල්." හෝම්ස් කීය. "මොකක්ද ඒකෙ ඉතිරි කොටස?"

"ගෙදරට එන පොලිස් කණ්ඩායම පහන් නිවන තුරු රඳවා තියන්නේ සේවකයන්ගේ කාමරවල" කර්නල් කීය. "ඊ කෑම





අවසන් කරලා, ගෙදර පහන් නිවලා, සේවකයන් නිදාගන්න යනවා උඩුමහලට. හතරවටේම අඳුරුවුණාට පස්සෙ, අපි පොලිස් භටයන් තුන්දෙනෙක් යවනවා මිදුලට. ඔවුන් මිදුලේ පඳුරු අතරේ සැඟවී ඉන්නවා. ඒ, අපරාධකාරයින් ගෙයින් එළියට පැන්නොත් අල්ලාගැනීම සඳහා. පොලිස් භටයන් දෙදෙනෙක් ප්‍රධාන ශාලාවේ රඳවනවා. අනෙක් දෙදෙනා අප සමග විසිත්ත කාමරයේ. හොරකම් කෙරේවි කියල අපි විශ්වාස කරන මේ විසිත්ත කාමරයේ, එතෙකොට ලොකු සෙනඟක් ඉන්නවා. භටයන් දෙන්නාට අමතරව පොලිස් පරීක්ෂක ගව් මහත්මයා, ඔබ, දෙස්තුඩ් මහත්මයා සහ මම."

රාත්‍රී ආහාරය අවසන් වූ පසු අපි විසිත්ත කාමරයට පිවිසුණෙමු. කෝපි සංග්‍රහය පටන්ගනිද්දී ගව් මහතා අපට එක්විය.

පොලිස් පරීක්ෂකවරයාගේ පෙනුම දුටු මගේ බලාපොරොත්තු නැති වූ බැව් කිව යුතුය. තරබාරු පුද්ගලයෙකු වූ ඔහුගේ ක්‍රියාශීලී බවක් මම නුදුටුවෙමි. හිසකෙස් පමණක් නොව ඇහිබැමද පැසීගෙන ආ ඔහුට, පළපුරුදු අපරාධකාරයිනට එරෙහිව කොයිතරම් ඉක්මනට ක්‍රියාත්මක වීමට හැකිවේද? මේ පිළිබඳව මගේ සිතේ සැකයක් ඇතිවිය. එහෙත් ඔහුගේ මුහුණේ තිබුණේ බුද්ධිමත් පෙනුමකි. ලාතිල් පැහැති දෙනෙතේ තිබුණේ කාර්යශූර බවකි. එයින් මම සෑහීමට පත්වූයෙමි.

හොරුන් ඇතුළට පැනීමට හා යළි පැනයාමට ඉඩ ඇති ජනේලය ලෙස, එක් ජනේලයක් හෝම්ස් පෙන්වා දුන්නේය. ඒ අනුව හෝම්ස් හා එක් පොලිස්භටයෙකු ඒ සමීපයේම හැංගී සිටීමට තීරණය විය. කර්නල්වරයා විසිත්තකාමරයේ සිට ශාලාවට යන තැන දොර පිටිපස ද, මා විශාල සෝපාවක් පිටිපස ද, සැඟවී සිටිය යුතු බව, ගව් මහතා යෝජනා කළේය, සොරකම් කිරීමට ඉඩ ඇති වටිනා බඩු සියල්ල තැන්පත් කර තිබූ අල්මාරිය සමීපයේ අඳුරු මුල්ලක, පොලිස් පරීක්ෂකයා සැඟවී සිටිය යුතු යයි හෝම්ස් යෝජනා කළේය.

"මං අණ දෙන තුරු කිසිම කෙනෙක් ක්‍රියාත්මක වෙන්න එපා" ගව් කීය. "මම සංඥාවක් කළාම ශාලාවේ දොර ළඟ ඉන්න පොලිස් භටයන් දෙන්නා, ලන්තෑරුම් දෙක එළිය කරගෙන විසිත්ත කාමරයට කඩා වදිනවා. අපි හැමදෙනෙක්ම දිගටම ඉන්න ඕන ගන අන්ධකාරයේ."



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

මේ වනවිට රෑ දොළහ වූ බව ඔරලෝසුවක නාදයෙන් අපි දැනගතිමු. සියල්ල සතුටුදායක ලෙස සකස් වී ඇත්දැයි පරීක්ෂාකිරීමට කර්නල්වරයාට උවමනා විය. ඒ සඳහා ඔහු ගියේ පොලිස් පරීක්ෂක සමග ය. සේවකයන් සියලුදෙනා උඩුමහලට ගොස් ඇති අතර, නිවස සම්පූර්ණයෙන්ම අඳුරේ ඇති බව, ආපසු පැමිණි කර්නල් බෙනිංටන් කීය. තම භටයන් සියලුදෙනා නියමකළ තැන්වල සූදානමින් සිටින බව ගව් මහතා කීය. ඊළඟට විසිත්ත කාමරයේ තිබූ දීප්තිමත් පහන ද නිවාදමන ලදී. අපි අපට නියමිත තැන්වලට ගියෙමු. මගේ බරසැරයටිය අතට අනුවෙනි මානයේ තබාගෙන, මම සෝපාව පිටිපස සැඟවුණෙමි.

සොරෙකු ඇල්ලීමට සූදානමෙන් අඳුරේ සැඟවී බලාසිටීම, ස්නායුවලට පීඩනයක් ගෙනදෙන දුෂ්කර කටයුත්තක් බව, අමුතුවෙන් කිවයුතු නොවේ. මේ එවැන්නක් සඳහා අප සැඟවුණු පළමුවන වතාව ද නොවේ. එහෙත් එයට හැඩගැසීමට මට කවදාවත් හැකිවූයේ නැත. නමුත් මගේ මිත්‍රයා නම් එම කාර්යයට මනාව හැඩගැසී සිටියේය. අන්ධකාර කාමරයක, දෙර මුල්ලක හෝ ඇඳක් යට හෝම්ස් එලෙස රැඳී සිටිනු, මම කිහිපවාරයක්ම දැක ඇත්තෙමි. එවැනි අවස්ථාවල ඔහුට කිසිදු වෙහෙසක් හෝ අපහසුතාවයක් නොදැනිණ. එපමණක් නොව පැමිණෙන අපරාධකරුවා අල්ලා ගැනීම සඳහා හෝම්ස්, තම සියලුම සංවේදී ඉන්ද්‍රියයන් සීරුවෙන් තබාගෙන සිටියේය. අප හාටත් වටා තිබුණු අයුරින් අන්ධකාරයේ දැකීමට ඔහුට හැකියාවක් තිබිණ. ඉතාම සියුම් ශබ්දයක් පවා හඳුනාගත හැකි ශ්‍රවණේන්ද්‍රියක් ඔහු සතුවිය. මේ ගැන මම මීට පෙර ද සඳහන් කර ඇත්තෙමි. කෙසේ වෙතත් මෙබඳු කටයුතුවලදී මම මහත්සේ පීඩා විඳින්නෙමි. අතපය ඒකාකාරව තබාගෙන සිටීමෙන් ඒවා හිරිවැටීමට පටන්ගත් අතර, දණහිස් හා වළලුකර සන්ධිවලින් දැනුණේ දැඩි වේදනාවකි. මගේ හදවත වේගයෙන් ස්පන්දනය වන අයුරු මගේ දෙකනටම ඇසුණේ බෙර හඬක් ලෙසිනි.

බිත්ති ඔරලෝසුවේ එක නාදවූයේ සෑහෙන වේලාවක් ගතවූ පසු බව මම සිහිකළෙමි. මට නින්ද යාමට තරම් නිදිමතක් තිබියදී රාත්‍රි දෙක නාදවිය. එහෙත් සොරුන් පැමිණෙන ලකුණක් හෝ නොමැත.





හෝම්ස් නිවැරදි දිනය තෝරාගත්තාද? දිනය වැරදී තිබුණොත් අප මේ යෙදෙන්නේ නිෂ්ඵල ව්‍යායාමයක ය. හොරුන් ඔවුන්ගේ ඉලක්කය ලෙස මේ වලව්වම තෝරාගත් බව හෝම්ස් දන්නේ කෙලෙසද? ඔවුන්ගේ ඉලක්කය වෙනත් තැනක්ද? එසේත් නැතිනම් ඔවුන් අගෝස්තු මාසයේ අමාවක කළුවර දිනය වන අගෝස්තු 11 වැනිදට පැමිණියහොත්? මෙය හෝම්ස්ට වුණු වැරදීමක්ද? මෙසේ සිතමින් සිටි මට නිවසෙන් පිටත උද්‍යානයේ සියුම් හඬක් ඇසිණ. එය එතරම් තියුණු හඬක් නොවීය. කාගේ හෝ අඩි ශබ්දයක්ද? නැත්නම් වේගයෙන් හැමූ සුළඟ සමග මල්පඳුරුවල අතු සෙලවුණු ශබ්දයද?

ඉන්පසුව තිබුණේ දීර්ඝ නිශ්ශබ්දතාවයකි. එබැවින් මට අසන්නට ලැබුණේ සුළඟ නිසා ඇතිවූ හඬක් දැයි මම සිතුවෙමි.

මිනිත්තු කිහිපයකට පසු යළිත් ශබ්දයක් ඇසිණ. ඉතා මෘදු හඬක් වූවත් එය කුමක්දැයි හඳුනාගැනීම අපහසු නොවිය. ඒ සැබැවින්ම වීදුරුවක් මත ලෝහයක් ගැටෙන ආකාරයේ හඬකි. කිසිවෙක් වීදුරුව කැපීමට තැත්කරනවාද?

මැදින් වූ ජනේලයේ, වීදුරුව ආවරණය කරමින් තිබූ ජනෙල් රෙද්දේ, සෙලවීමක් ඇතිවන ශබ්දයක් ඇසිණ. ඒ සමගම හමා ආ සීතල සුළංධාරාව මගේ මුහුණ සිපගත්ත අයුරු මට දැනිණ. ජනේලයේ අගුළ "ක්ලික්" හඬින් ලිහිල් වූ හඬ, ඊළඟ මොහොතේ අසන්නට ලැබිණ. අනතුරුව ජනෙල් පියන ඇරුණු හැටිත්, ඒ සමගම පුද්ගලයන් දෙදෙනෙකු කාමරය තුළට පැනගත් අයුරුත් ඇසුණු ශබ්දය අනුව මම තේරුම් ගත්තෙමි. ඔවුන් ගෙන ආ කුඩා ආලෝක ධාරාවන් දෙකක් එක්වරම පෙනී නොපෙනී ගියේය. ඒ සමගම අසන්නට ලැබුණේ දෙදෙනෙකු හතිදමන ශබ්දයයි.

මිනිත්තුවක් පමණ යන තුරු කිසිදු සෙලවීමක් නොවීය. හතිදමන හඬ ද නැතිවී ගියේය. සිහින් ආලෝකධාරා යළි දැල්විණි. ඊළඟට යොමුවුණු ඒවා කාමරයේ අනෙක් කෙළවර දෙසට ගමන් කළ අයුරු දක්නට ලැබිණ. විසිත්ත කාමරයේ නොයෙක් අතට තබා තිබූ ඇඳිපුටුවල කකුල් මගහරිමින්, ඒවා ඉදිරියට ගියේ ශබ්දයක් නොනැඟෙන ලෙසටය. කාමරයේ අනෙක් කෙළවර දක්වා අනුපුරුණු මතින් හෙමින් හෙමින් ගිය ආලෝකධාරා, පෞරාණික බඩු තබා තිබූ වීදුරු අල්මාරියේ ඇතුළට එල්ල විය. එය



www.sinhalaelibrary.com

මොහොතකට දිස්වූයේ අඳුරක නිකුත්කළ විශාල කෑමින් දෙදෙනෙකු විලසිනි.

තත්පර කිහිපයක නිශ්ශබ්දතාවයක් පැවතිණ. පොලිස් නිලධර ගව් මහතා සැඟවී සිටි තැන වෙත මගේ නෙත් යොමු කළෙමි. නැමී තිබුණු ඔහුගේ සිරුර දිගහැරෙන අයුරක් මට යන්තමින් පෙනිණ.

"අල්ලපියව් කොල්ලනේ!" විධානය නිකුත්විය.

සොරුන් දෙදෙනා අතු තිබූ ආලෝකධාරා නිවී ගිය අතර එකෙකු තැතිගෙන නිකුත් කළ ඝෝෂක ශබ්ද අසන්නට ලැබිණ. ඒ සමගම ඔවුන් වෙත අපේ මිතුරෝ කඩාවැදුණහ. ශාලාවේ සිටි පොලිස් භටයෝ ද දල්වාගත් ලන්තෑරුම් එල්ලකරමින් පැමිණියහ. සිරුරු කිහිපයක් එකිනෙක වෙළී පොරබදන අයුරු මම දුටුවෙමි. මගේ සැරයටියෙන් පහර එල්ල කළ යුත්තේ කොතැනකටදැයි මට සිතාගැනීමට නොහැකි විය. යකඩකරඟු හඬ සමග කෝපයෙන් කෑගසන හඬ ද දිගටම ඇසිණ.

මිනිත්තු කිහිපයක් ගතවෙද්දී පොරබැදීම නැවතෙන ලකුණු පෙනිණ. දැන් දෙපා හතර අතට විහිදුවා ගත් මිනිසෙකු යටකරගෙන, ඔහු මර්දනය කරගෙන සිටියේ, මගේ මිතු ෂර්ලොක් හෝම්ස්ය. මුහුණ රත්පැහැයට හැරී, ඩහදිය වැගිරුණත්, ඔහුගේ මුහුණට නැගුණේ ජයග්‍රාහී සිනාවක් බැව් මම දුටුවෙමි. හෝම්ස් තම දඩයම් කසය ඉහළට ඔසවාගෙන සිටියේ කොයිමොහොතේ හෝ එය සතුරාට එල්ල කිරීමට සූදානමෙනි. අනෙක් හොරා හසුවී සිටියේ පොලිස් නිලධරයාටය. ඔහුගේ දැඩි ග්‍රහණය හමුවේ කුඩා සිරුරක් තිබූ සොරා නිශ්චලව සිටියේය. තමන්ට ගැළවීමට ඉඩක් නොමැති බැව් අපරාධකරුවන් ඉක්මනින් තේරුම් ගන්නට ඇත. ඔවුන් පාලනය කර ගැනීම තම භටයාට භාරකළ ගව් මහතා සාක්කුවලින් ගත් යකඩ විලංගුවලින් අපරාධකාරයින්ගේ දෑත් සිර කළේය.

යකඩ සේප්පු බිඳීමේ විශේෂඥයා - යෙග්මන් ලෙස පෙනී ගිය තැනැත්තා හරි හැටි පෙනුණේ, විසිත්ත කාමරයේ දීප්තිමත් පහන දල්වූ පසුය. මිටි පුද්ගලයෙකු වූ ඔහුට තිබුණේ කුඩා සිරුරකි. ඉරු එළිය හෝ වාතාශ්‍රය නොමැති අඳුරු කුටුවක දමා ඇතිදැඩි කළ පුද්ගලයෙකුගේ මෙන්, සුදුමැලි සමක් ඔහු සතු වූ අතර, හිසකෙස් ද කළුපැහැති විය. ඔහුගේ මුහුණේ තිබුණේ මීයෙකු මෙන් කෛරාටික පෙනුමකි.





අනෙක් පුද්ගලයා සෑහෙන තරම් උස, ඊට සරිලන මහතක් සහ වැදගත් පෙනුමක් තිබූ අයෙකි. පහරකෑ බල්ලෙකු මෙන් යෙග්මන් හඬ නගද්දී වැන්ඩර්බිල්ට් ගේ මුහුණට නැගුණේ සිනාවකි. ඔහුගේ දෑත්වල විලංගු පොලිස් නිලධරයා තදකරද්දී, අපරාධකරු මගේ මිත්‍රයාට හිසනමා ආචාර කළේය.

"මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයා වෙන්න ඇති කියල මං විශ්වාස කරනවා!" ඔහු ඇසුවේ විදේශීය උච්චාරණයකින් ආචාරශීලී ලෙසිනි. "මහත්මයා, ඔබ කවදහරි මගේ පසුපස්සෙන් එළවාගෙන ඇවිත්, මාව අල්ලාගනීවි කියන සැකය මගේ හිතේ තිබුණා. සෑහෙන කාලයක ඉඳන් මං හිටියේ ඒ බයෙන්. ඔබ මෙතරම් දක්ෂයෙකු වීම ගැන මගේ ප්‍රශංසාව පිළිගන්න. ප්‍රතිවාදියෙකු හැටියට ඔබ වැනි දක්ෂයෙකු මට කවදවත් හමුවෙලා නෑ."

"ඔබටත් ඒ අයුරින්ම ප්‍රශංසා කළ යුතුයි මහත්මයා" හෝම්ස් කීය. "ඔබ වැනි ප්‍රතිවාදීන් මට හමුවෙලා තියෙනවා නම්, ඒ බොහොම කලාතුරකින්. ඔබ පසුපස ලුහුබැඳ, ඔබ අල්ලාගැනීම මං කළේ බොහොම ආශාවෙන්.. අපේ මේ සටන තවමත් ඉවර නෑ. ගව් මහත්මයා ඔබ දෙදෙනා ඔහුගේ භාරයට ගන්න කලින්, කරුණාකර මගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න පුළුවන්ද?"

"මට හැකිනම් මං බොහොම සන්තෝෂයෙන් ඊට පිළිතුරු දෙන්නම්"

"ඔබ දෙදෙනා මේ කටයුතුවලට මෙහෙයවන පුද්ගලයාගේ නම නොදන්නා නිසා, අපි ඔහු හඳුන්වන්නේ "ගිජුලිහිණියා" යන නමින්." හෝම්ස් කීය. "මට හෙළිකරන්න කවුද ඔහු?"

"ගිජුලිහිණියා! හරි අපූරු නමක්", අපරාධකරු කීවේ සිනාසෙමිනි. "ඒ නම ඔහුට අපූරුවට ගැළපෙනවා. ඒ වුණත් මට කණගාටුයි මහත්මයා. මට ඔහුගේ නම ගම හෙළිකරන්න හැකියාවක් නෑ. මං එහෙම නොකරන්නෙ සාමාන්‍යයෙන් හොරුන් අතරේ තිබෙන ගිවිසුමක් වැනි දෙයක් නිසා නෙමෙයි. වෙනත් කාරණයක් නිසා. මං ඒක ඔබට කියන්නම්.

මෙහෙම හොරකමේ යද්දි මං කවද හෝ සිරභාරයට පත්වීමට ඉඩඇති බව මං ඔහුට කිව්වා. එහෙම තත්ත්වයක් ආවොත්, මා වෙනුවෙන් ඉතා විශාල මුදලක්.....ඉතාමත් විශාල මුදලක්, බැංකුවක



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

හැන්පත් කරන්න ඔහු පොරොන්දු වුණා. එහෙම කරන්නෙ නේ මා ඔහුගේ නම හෙළි නොකොළොත් විතරයි. මං කවදහරි හිරෙන් නිදහස් වූ දිනයක, ඒ මුදල ලබාගෙන මට ජීවත්වෙන්න හැකිවේවි. හෝම්ස් මහත්මයා ඔබට තේරෙනවා නේද? ඒ හේතුව නිසා මට රහස් හෙළිකරන්න බැරිබව! පොලිස් පරීක්ෂක මහත්මයා, ඉතින් ඔබේ ඉතිරි රාජකාරි කටයුතු අවසන් කරන්න හැකිනම් මං ස්තුතිවන්ත වෙනවා"

එසේ කී අපරාධකරුවා යළිත් වරක් හිස පහත්කොට හෝම්ස්ට ආචාර කළේය. එහෙත් එයට පිළිතුරක් ලෙස හෝම්ස් ගෙන් ආචාරයක් නොවීය. බලාපොරොත්තු කඩවීම නිසා ඔහු නිහඬ වූ බැව් මම තේරුම් ගත්තෙමි.

මගේ මිත්‍රයාගෙන් යළිත් මේ පිළිබඳව මට අසන්නට ලැබුණේ පසුවද අප ලන්ඩනය බලා යන අතර දුම්රියේදීය.

"බොහොම සතුටුදායක ලෙස ඔබ ඒ අභිරහස විසඳුවා. එහෙම නේද හෝම්ස්?" මම ඇසුවෙමි.

"ඔබට හිතෙන්නෙ එහෙමද වොට්සන්? සන්තෝෂවෙන්න හෝ ආඩම්බර වෙන්න තරම් දෙයක් මෙතැන තියෙනවා කියල මට නම් හිතෙන්නෙ නෑ. ඇත්තෙන්ම මගේ හිතේ තියෙන්නෙ කලකිරීමක්"

"මොනවා. ඒක හරි පුදුම කතාවක් නේ" මම කීවෙමි. "ඔබ ඉතාම තර්කානුකූල ලෙස මේ අභිරහස විසඳුවා. ඒ මගින් ඉතාම සටකපට හොරුන් දෙදෙනෙකු අල්ලා ගත්තා. ඔබ නොහිටින්න ඔවුන් අල්ලාගැනීම කරන්න, පොලිසියට කවදාවත් හැකිවෙන්නෙ නෑ. සැකයක් නෑ අපරාධකාරයින්ට දීර්ඝ සිරදඬුවම් ලැබේවි."

"ඔව්. අපි අල්ලාගත්තා ඒත් දෙන්නයි." හෝම්ස් කීය. "උවමනාම කරන තුන්වැනියා - "ගිජුලිහිණියා" අපට අල්ලාගන්න බැරිවුණා. ඔහු අපේ දැලෙන් බේරී පැනගියා. මට නම් හිතෙන්නේ මෙක අපේ ජයග්‍රහණයක් නොවෙයි, පරාජයක් කියලයි. ඒ ගැන තවත් කිසිම දෙයක් කථාකරන්න මං කැමති නෑ වොට්සන්. මේ ගැන වාර්තාවක් ලියල ඔබේ ලිපිගොනුවට දමාගන්නට කමක් නෑ. ඒත් කථාන්තරයක් ලියල ඔබේ පාඨකයන් වෙත ඉදිරිපත් කරනවාට මං කැමති නෑ මිත්‍රයා"


"....ඒ වුණත් හෝම්ස්...." මා මගේ අදහස් පැවසීමට උත්සාහ කළත් ඔහු ඊට බාධාකළේ තම අත ඔසවා සංඥාකරමිනි.





"වොට්සන්, මේ අහන්න. මේ අපරාධකාරයා පිළිබඳව දිගින් දිගටම සොයා බැලීම මං අත්අරින්නේ නෑ. මං හිතන්නේ නෑ ඔහුට හැකිවේවි කියල හැමදම ජයග්‍රහණය කරන්න.

ඔබ පාඨකයින් වෙත කථාවක් ඉදිරිපත් කළොත් කාටත් හැමරහසක්ම එළිකරන්න වෙනවා. අපි "ගිජුලිහිණියා" ගැන අර්ථානුකූලව සොයාගත් කරුණු රැසක් තියෙනවා. ඒවා හෙළිකිරීම අපට අවාසියි. තමන් සොරකම් කරගත් භාණ්ඩවලට බැඳීවෙලා "ගිජුලිහිණියා" මේ මොහොතේත් බොහොම සන්තෝෂයෙන් ඇති. ඔහු අල්ලාගෙන හිරභාරයට පත්කරලා, ඒ වටිනා දේවල් නියම අයිතිකරුවන් වෙත භාරදෙන තුරු, මට සැනසීමක් ලැබෙන්නෙ නෑ. ඒ නිසා මං ඔබෙන් ඉල්ලා සිටිනවා, මේකෙන් කථාන්තරයක් ලිව්වත්, ඒක සඟරාවකට ලබාදෙන්න එපා. දැනට ඒක "අභිරහස රහසිගත" ලිපිගොනුවේ තැන්පත් කරලා තියන්න"





www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

# ඉසදෝරා පර්සානෝ අබිරහස

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා යෙදුණු ඉතාම සුවිශේෂ පරීක්ෂණයකට සහභාගි වීමට, එක් අගෝස්තු මාසයක මට අවස්ථාව සැලසිණ. ඒ මා මේරි මෝස්ටන් මෙනෙවිය සමග විවාහ වූ අලුත එක් දිනයකි. එය දැඩි උණුසුමක් තිබූ සිකුරාද දිනයක් බව මගේ සටහනේ සඳහන්ව ඇත.

සති කිහිපයකින් මගේ මිත්‍රයා දකින්නට නොලැබුණු නිසා, ඔහු හමුවීමට බේකර් වීදිය 221b ට යාමට මම තීරණය කළෙමි. ඔහුගේ බුද්ධියට අභියෝග කළ හැකි පරීක්ෂණයක් නොලැබීම නිසා, හෝම්ස් සිටියේ දැඩි අසහනයකින් බැව් මම තේරුම් ගතිමි.

"ලන්ඩන් නගරයේ ඉන්න අපරාධකාරයන්ට මොනව වෙලාද වොට්සන්?" ඔහු විමසුවේ හාස්‍යය මුසු ස්වරයකිනි. "මෙහේ තියෙන උණුසුම දරාගන්න බැරුව මවුනුත් මුහුදුබඩ නිවාඩු නිකේතනවලට ගිහින්ද? කිසිම සිත් ඇදගන්නා සිදුවීමක් අද ඩේලි ටෙලිග්‍රාෆ් පත්තරේ වත් නැහැ. ඒකෙ ඔක්කොම තියෙන්නෙ තේම්ස් ගඟේ පවත්වන ඔරු පැදීමේ තරඟ ගැනයි, උද්‍යාන සම්භාෂණ ගැනයි. කාරණා සිදුවෙන්නෙ මේ පිළිවෙළට නම්....."

"ඔව්, එහෙම වුණොත් මොකක්ද ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ?" මම ඇසීමි.

"එහෙම වුණොත් මට සිදුවෙන්නෙ මේ රැකියාවෙන් විශ්‍රාම ගන්නයි. මං ඔබට කලිනුත් කියලා ඇති මිත්‍රයා, මං සසෙක්ස් ප්‍රාන්තයට ගිහිං මීමැස්සන් ඇතිකරන්න පටන්ගන්නවා"

එම වචන ඔහුගේ මුවෙන් පිටවූවා පමණි. විවෘතව තිබූ ජනේලයෙන් අපට ඇසෙන්නට ලැබුණේ, වේගයෙන් පැමිණි අශ්වකරත්තයක රෝදවලින් නිකුත්වූ හඬය. විය නැවැත්වූයේ අපේ නිවස ඉදිරිපිට බවත්, එයින් බිමට බට කවුරුන් හෝ, පාර හරහා වේගයෙන් ඇවිද ආ ශබ්දයත් අසන්නට ලැබිණ. මීළඟට එම නැනැත්තා කැලැඹීමට පත් අයකු ලෙසින් සීනුව කිහිපවරක්ම නාද කළේය.





"අඩි ශබ්දවල හැටියට නම් කාන්තාවක් විය යුතුයි" හෝම්ස් කීය. "ඇය මොකක් හරි ලොකු කරදරයකට මුහුණපාලා වොට්සන්. මීමැස්සන් ඇතිකිරීමට යන්න මං ගත් තීරණය වෙනස් කරන්න වෙයි වගේ"

ඒ මොහොතේ අපේ විසිත්ත කාමරයේ දොර වේගයෙන් විවෘත විය. ඇතුළට කඩාවැදුණේ තරුණ රූමත් කාන්තාවකි. ඇගේ කරවැහැති කේශ කලාපය කඩාලූ ගමන් ය. ඇඳුම් පැළඳුම් පවා හැලහිලිමත්ව නොව, හදිසියේ පටලවා ගත් එවා බැව් පෙනිණ.

"කවුද ෂර්ලොක් හෝම්ස්?" ඇය ඇසුවාය.

"මගේ මිත්‍රයා කලබල වී අසුනෙන් ඉහළට එසවුණේය. ඇය වහා ඒ අසලට පැමිණියාය.

"වහාම එන්න! වහාම! ඉසදෝරා! ඉසදෝරා! එයා කියනවා වහාම හෝම්ස් මහත්තයා එක්ක එන්නලු!"

විදේශීය උච්චාරණයකින් කියැවුණු එම වචනවලින් මම අන්දමන්ද වූයෙමි. එහි අගක් මුලක් තේරුම් ගැනීමට මට නොහැකි විය. නමුත් හෝම්ස් එයට දැක්වූයේ ඉක්මන් ප්‍රතිචාරයකි. තම කාමරයට ගොස් වහාම ඇඳුම් මාරුකරගත් ඔහු තීක්ෂණ දමාගත්තේය. අනතුරුව තමා පසුපස එන මෙන් මට සංඥා කොට, කාන්තාව පිටුපස තරප්පු පෙළේ පහළට දිවගියේය.

ඇය පැමිණි රෝද හතරේ ලොකු අශ්වකරත්තය, අප නිවස ඉදිරියේ නවත්වා තිබිණ. කාන්තාව කුලීරථ රියැදුරාට කෙන්සිංටන්හි ලිපිනයක් පැවසුවාය. ඒ අතුරේ මට යමක් කෙදිරීමට, හෝම්ස්ට අවකාශ සැලසිණ.

"මිනිහගෙ නම ඉසදෝරා පර්සානෝ. ජාත්‍යන්තර කීර්තියට පත් පුවත්පත් කලාවේදියෙක්. මගේ පරණ මිත්‍රයෙක්"

අශ්වකරත්තය පිටත්වූ පසු හෝම්ස් ඇය වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කළේය. විදේශික කාන්තාවක වූ ඇය හොඳින් ඉංග්‍රීසි දැන නොසිටියාය. ඊට අමතරව ඇය සිටියේ අතිශයින් කැලඹීමට පත්ව බැව් පෙනිණ. මේ නිසා ඇතිවී තිබෙන අර්බුදය කුමක්ද යන්න තේරුම් ගැනීම තරමක් අපහසු විණි.

ඇයගෙන් අපට අසන්නට ලැබුණේ මෙවැනි පුවතකි. එද අපරභාගයේ ඉසදෝරා පර්සානෝ නමට ලිපිනය ලියූ කුඩා පාර්සලයක් කිසිවෙකු විසින් නිවස වෙත ගෙනැවිත් භාරදී ඇත.



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

මෙය සිදුවුයේ හරියටම කියටද කියන්න නොපැහැදිලිය. එය භාරගත් සේවිකාව එම පාර්සලය, පුවාන් ඇල්බර්ට් නම් සේවකයා අතට පත්කොට ඇත. හැන්දෑවේ ඔහු එය රැගෙන ගියේ, උඩුමහලට වී ලේඛන කටයුතුවල නියැලී සිටි පර්සානෝ මහතා වෙතයි.

මේ අවස්ථාව වන විට පර්සානෝ මහත්මිය සිට ඇත්තේ නිවසේ පහළ මහලේය. සේවකයා පාර්සලය හාරදී පහළට ඇවිත් මිනිත්තු කිහිපයකින්ම, පර්සානෝ මහතා විකල්අලන් මෙන් කෑගහන ශබ්දයක් ඇයට අසන්නට ලැබී ඇත. ඇය වහා උඩුමහලට දිව ගියාය. ඇයට දකින්නට ලැබුණේ සිහිවිකල් වූවකු මෙන් හැසිරුණු ඇගේ සැමියාය.

"එයාට හොඳටම අමාරුයි!" ඇය කීවාය. "හොඳටම අමාරුයි!"

"ඒ කියන්නේ අසනීපයක්ද?" හෝම්ස් ඇසීය.

"නෑ මහත්මයා මුලුමනින් අමාරුවයි! විස්තු සිහි විකල්වෙලා! පාර්සලය ඇරලා පෙට්ටිය දිහා බලාගෙන මරලතෝනි දෙනවා. ඒ පෙට්ටිය ඇතුළෙ හිටියෙ පුංචි සතෙක්..... ආව ඉංග්‍රීසියෙන් කියන්නෙ මොකක්ද මං දන්නෙ නෑ..... සර්පයා වගේ එකෙක්..... සර්පයා නෙමෙයි. පස් ඇතුළෙ ඉන්නා බඩගාන සතෙක්!"

"බිම් පණුවෙක්ද?"

"අන්න හරි මහත්මයා. පණුවෙක් පණුවෙක්" ඇය කීවාය. "පුංචි පණුවා දිහා බලලා මගේ ඉසදෝරාගේ සිහිය විකල්වෙලා. "හෝම්ස් මහත්තයා එක්ක එන්න!" ඔහු කීවේ එච්චරයි."

"ඔබ කොහොමද මා ඉන්න තැන දැනගත්තෙ?" හෝම්ස් ඇසීය.

"කවද හරි ඔහුට භයානක ඉරණමකට මුහුණපාන්න වෙවී කියන හැඟීම, පර්සානෝ මහත්මයාගෙ හිතේ තිබුණා. ඒක නිසාද ඔහු එක දවසක් මට මෙහෙම කියලයි තිබුණේ.

"බේකර් වීදියේ අංක 221 බී දරන නිවසේ ඉන්නවා ෂර්ලොක් හෝම්ස් කියල මහත්මයෙක්. ඒ ලිපිනය ඔයාගේ දිනපොතේ ලියාගන්න ෆ්ලෝරින්. මට මොකක් හරි කරදරයක් වුණොත් වහාම ගිහින් ඔහුට කියන්න" - කියා පර්සානෝ මහත්මයා කිව්වා."

"ඔබට ඒ විදියේ උපදෙසක් දෙන්න පර්සානෝ මහත්මයා හිතුවෙ ඇයි? මොනවද ඔහුට තිබුණු කරදර?"

හෝම්ස් මෙම ප්‍රශ්නය ඉදිරිපත් කළත් එයට පිළිතුරක් නොලැබිණ. ඊට හේතුවූයේ අපේ ගමනාන්තය කරා අප පැමිණසිටීම ය.

කෙන්සිංටන්හි නිස්සබ්ද පරිසරයක මවුන් පදිංචි නිවස පිහිටා තිබිණ. කුලීරිය නවත්වන ලද්දේ තට්ටු කිහිපයක් උස්ගොඩනැගිල්ල





ඉදිරිපසය. එහි ඉදිරිදොර විවෘතව තිබිණි. අශ්වකරත්තයෙන් බිමට පිනූ සාන්තාව, නිවසේ තරප්පු පෙළ දිගේ ඉහළට දිවගියාය.

හෝම්ස් කුලීරථ රියැදුරා අතට කාසි කිහිපයක් දුන්නේය. මීළඟට අපි හැකි ඉක්මනින් පර්සානෝ මහත්මිය පසුපස ගියෙමු.

ගෙට ඇතුළු වූ විගසම අප ඉදිරියට පැමිණියේ දුඹුරු පැහැති මුහුණක් හා කුඩා සිරුරක් තිබූ මිනිසෙකි. එම ඔවුන්ගේ සේවකයෙකු යයි අපි අනුමාන කළෙමු.

වරකට තරප්පු තුන බැගින් නගිමින් පර්සානෝ මහත්මිය පියගැට පෙළේ ඉහළ නැගුණාය. හෝම්ස් ද එම වේගයෙන් ම නැගුණේ ඇය අනුගමනය කරමිනි. නිවසේ ඉහළම තට්ටුවට නැගුණු පසු කාමරයක දොර සතුටෙන් විවෘත කළ පර්සානෝ මහත්මිය දොර වියන හැරුණුවාය. එවෙලේ මට දකින්නට ලැබුණු දර්ශනය විස්තර කිරීමට පවා අපහසුය.

එම කාමරයේ බිත්ති කිහිපයක්ම වැසී තිබුණේ පොත් රාක්කවලිනි. කාමරය මැද කුඩා ලියනමේසයක් විය. එය තබා තිබුණේ විවෘතව තිබූ ජනේලයකට සෘජුකෝණිකාකාරවය. මේසය මැද කොළ පැහැති එළියක් විහිදු වූ පහනක් දල්වා තිබිණි. ජනේලය විවෘතවූයේ නිවසේ පිටුපස ගෙළයනට බැව් මම පසුව දුටුවෙමි.

මේසය අසල වූ පුටුවේ මිනිසෙකු වාඩිවී සිටියේය. ගිනිකූරු හොමැති හිස් ගිනිපෙට්ටියක් ඔහු ඉදිරියේ මේසය මත තිබිණ. මේසය අසල වූ මිනිසා, ඔහුගේ සම්පූර්ණ අවධානය යොමුකරගෙන සිටියේ ඒ ගිනිපෙට්ටිය වෙතය. හොඳින් වැඩුණු, උස් සිරුරක් තිබූ ඔහුගේ වයස අවුරුදු තිස්පහක් හෝ හතළිහක් වන්නට ඇත. උකුස්සෙකුගේ හොටයක් වැනි ඉදිරියට නැමුණු නාසයක් තිබූ ඔහුගේ මුහුණේ පැහැදිලි කැළලක් විය.

කලකට පෙර ඇතිවූ දිගු කැපුම් තුවාලයක් සුවවීමෙන් සෑදුණු මෙම කැළල තිබුණේ වම් කම්මුල මත ය. මේ වෙලාවේ ඔහුගේ මුහුණට නැගී තිබුණු සිහිවිකල් - බියරු බැල්ම නොවෙන්නට, එය කඩවසම් මුහුණක් වීමට ඉඩතිබිණ. මේ මොහොතේ නම් ඔහුගේ ඇස්ගෙඩි දෙක ඉහළට පෙරළී යාම නිසා, අපට හොඳින් පෙනුණේ සුදු කොටස මිස කළු ඉංගිරියාව නොවේ. වියරුවට පත්වීම නිසා, ඔහුගේම දත්වලින් තොල් හැපී, ඒවායෙන් ලේ වැගිරෙමින් තිබිණි. එය දකින්නන් භීතියට පත්කරවන දසුනක් විය. පහනෙන් විහිදුණු

කොළ පැහැති එළිය වැටී, අපට ඔහු පෙනුණේ මධ්‍යකාලීන යුගයේ යක්ෂයෙකුගේ චිත්‍රයක් ලෙස යයි කීවොත් වඩාත් නිවැරදිය.

මේ හොරතුරු සියල්ල දකින්නට මට තිබුණේ තත්පර දෙකක් හෝ තුනක් පමණි. විසරු පුද්ගලයා ඔහු වාඩිවී සිටි තැනින් නැගිට්ටේ ඔහුගේ පුටුව ද බිමට පෙරලා දමමිනි. ඒ සමගම ඔහුගේ මුවෙන් නිකුත්වූයේ භයානක මරළතෝනියකි. අප ගල්ගැසී දෙරටුව අසල බලාසිටියදීම ජනේලය අසලට පැමිණි ඔහු, ජනෙල්පඩිය උඩට නැගුණේය. අපායේ සියලුම බිහිසුණු යක්ෂයන් තමන් ලුහුබැඳ එන කලක මෙන් භයංකර විලාපයක් නැගූ ඔහු, එක් ක්ෂණයකින් ජනේලයෙන් එළියට පැන්නේය!

කාමරය තුළ එක් නිමේෂයකට නිශ්ශබ්දතාවයක් ඇතිවිය.

ඊළඟ මොහොතේ පර්සානෝ මහත්මිය ජනේලය වෙත පැන්නේ මරළතෝනි නගමිනි. වහා එතැනට පිනූ හෝම්ස් ඇය අල්ලා නොගන්නට, ඇය ද ජනේලයෙන් ඉවතට පනිනු නො අනුමානය. ඉක්මනින් ජනේලය එසා දැමූ හෝම්ස්, ඇය ඇගේ නිදනකාමරයට දමා දෙරවසා යතුරු දැම්මේය. අනතුරුව අපි තරප්පුපෙළ පහළට දිවගියෙමු. භීතියෙන් තුෂ්ණිම්භූතවූ සේවකයන් කටවල් ඇරගෙන බලා සිටියදී, අපි පිටුපස ගෙවත්තට පිවිසුණෙමු.

ක්ෂණික මරණයකට පත්වූ ඉසදෝරා පර්සානෝගේ මෘතශරීරය එහිවිය. ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස ඉන්දියාවේ ගතකළ කාලයේ, නොයෙක් ආකාරයට බිහිසුණු ලෙස තුවාල ලැබූ අය මම දැක ඇත්තෙමි. එහෙත් පර්සානෝ තුවාල ලබා වේදනාව ගෙන මරණයට පත්ව සිටි දෙස බැලීම පවා මට අපහසු විය.

නිවසේ පිටුපස ගෙවත්තේ මායිම ලෙස තිබුණේ උල් යකඩකූරු රාශියක් එකට පාස්සා සෑදූ වැටකි. ඉහළම තට්ටුවෙන් ඇදවැටුණු පර්සානෝ පතිත වී තිබුණේ මේ වැට මතය. යකඩ කූරු දෙකක් ඔහුගේ සිරුරේ ළය ප්‍රදේශය විනිවිද යාම නිසා, ඔහුට බරපතල තුවාල සිදුවී වේගයෙන් ලේ ගලායමින් තිබිණි. ඔහුගේ ජීවිතය ගළවාගැනීමක් ගැන සිතීම පවා නිෂ්ඵල ක්‍රියාවක් බැව් මම දැනසිටියෙමි. එහෙත් ඔහුගේ ගෙල ප්‍රදේශයට අත තබා ශීර්ෂපෝෂී ධමනියේ ස්පන්දනයක් යන්තමින් හෝ දැනේදැයි පරීක්ෂා කළෙමි.

"මට කණගාටුයි හෝම්ස්, ඔහු මියගිහින්" මම කීවෙමි.

මේ හදිසි මරණයෙන් හෝම්ස් දැඩි ලෙස කම්පාවට පත්විය. ඔහු මෙ අයුරින් කම්පාවට පත්වූ අවස්ථා මට දකින්නට ලැබී ඇත්තම්





ඒ ඉතා කලාතුරකිනි. මුළුතැන්ගෙයි දොර විවෘතව තිබූ නිසා, එයින් වැටුණු එළියෙන් හෝම්ස්ගේ මුහුණ මම පැහැදිලිවම දුටුවෙමි. එය සම්පූර්ණයෙන්ම සුදුමැලි වී තිබුණේ මල්මිනියක් විලසිනි. මෙම සංවේදනාත්මක ඉරණමට මුහුණපෑවේ ඔහුගේ ප්‍රාණ මිතුරෙකි. එබැවින් කම්පනයකට පත්වීම පුදුමයක් නොවේ.

මඳවේලාවක් ගතවෙද්දී, තම හැඟීම් ආත්මසංයමයෙන් පාලනය කරගැනීමට ඔහු සමත්විය. ඔහු තම සිතේ ආනුකම්පිත හැඟීම් පහළ නොකරන යන්ත්‍රයක් වැනි මිනිසෙකු යයි කලකට පෙර මා, හෝම්ස්ට දොස් කියූ අයුරු මට සිහිවිය. ඒ බොහෝ කලකට පෙරදීය. එහෙත් ඇත්ත නම් ඔහුට එම හැඟීම් පහළ නොවීම නොව, ඔහු ඒවා නොපෙන්වීමෙන් වැළකී සිටීමය.

උද්ගත වූ තත්ත්වය හැසිරවීම එකසිනියට මුහුණදෙමින් ඉදිරිපියවර ගැනීමේ කටයුතු හෝම්ස් භාරගත්තේය. ඒලි යථා තත්ත්වයට පත්වීමට ඔහුට මිනිත්තුවකට හෝ දෙකකට වඩා ගතවන්නට නැතැයි මා සිතුවෙමි.

"අපි වහාම මේක පොලීසියට දන්වන්න ඕන" කී මගේ මිතුරා මුළුතැන්ගෙය වෙත ගියේය. තම සටහන් පොතේ පිටුවක් ඉරාගත් ඔහු, එහි යමක් කුරුටුගෑවේය. ඊළඟට ඔහු පර්සානෝ නිවසේ තරුණ සේවිකාව එහි කැඳෙව්වේය.

"කුලීරියක නැගලා වහාම ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට යන්න" ඔහු කීය. "ගිහින් මේක දෙන්න එතැන සේවයකරන පොලිස්පරීක්ෂක ලෙස්ට්‍රේඩ්ට"

ගමනට අවශ්‍ය මුදල් හෝම්ස් අතින් ලබාගත් සේවිකාව නිවසෙන් පිටවූවාය. මීළඟට ඔහුගේ අවධානය යොමුවූයේ, රතුපැහැති මුහුණක් තිබූ මුළුතැන්ගෙයි සේවිකාව වෙතය.

"ඔයාට ඉංග්‍රීසි කථාකරන්න පුළුවන්ද?" හෝම්ස් විමසුවේය.

"ඔව් මහත්මයා" ඇය පිළිතුරු දුන්නේ අයිරිෂ් උච්චාරණයකිනි.

"එහෙනම් මේ දොස්තර මහත්තයත් එක්ක උඩුමහලට යන්න. ගිහින් බලන්න, හඬා වැලපෙමින් ඉන්නා ඔබේ ස්වාමිදුව වෙනුවෙන් ඔයාට මොනවා හෝ කරන්න පුළුවන්ද කියල"

පර්සානෝ මහත්මිය උඩුමහලේ සිට හඬා වැලපෙන ශබ්දය මේ වනවිට පහත මාලයට ද ඇසෙමින් තිබිණ. උඩුමහලට නැගුණු අපි ඇය වෙත අවධානය යොමු කළෙමු. මම ඇයට බියන්වී ස්වල්පයක්



www.sinhalaelibrary.com

බිමට දී, "ආඝ්‍රාණ ලවණය" ආශ්වාස කිරීමට ද සැලැස්සුවෙමි. පර්සානෝ මහත්මිය තවමත් සන්සුන් වූ පසු ඇය බලාගැනීම සේවිකාවට පැවරුවෙමි.

අප මේ කටයුතුවල යෙදෙන අතරේ හෝම්ස් යළිත් වරක් ඉහළම තට්ටුවට නැගී පර්සානෝගේ කුස්තෝරු කාමරයට ගිය හඬ මට ඇසිණ. පර්සානෝ මහත්මිය බලාගැනීම සේවිකාව කැමැත්තෙන් භාරගත් නිසා, මගේ මිත්‍රයාට හවුල්වීම සඳහා මම ඔහු සිටි තැනට ගියෙමි.

හෝම්ස් මේ වනවිටත් රාජකාරි අරඹා අවසන්ය. කාමරය හොඳින් ආලෝකමත් වන සේ ඔහු ගැස්ලාම්පුව දල්වා තිබිණි. ඒ නිසා කාමරය ඇතුළත වඩාත් හොඳින් දැනගැනීමට හැකියාවත් ලැබිණ.

එය එතරම් විශාල කාමරයක් නොවීය. පාවිච්චියට ගතහැකි ලෙස සාදන ලද ලෑලි අටුවකින් පිරීම සැකසී තිබිණ. ග්‍රීෂ්ම සෘතුව වූ නිසා ගිනිඋදුන නිවා දමා තිබූ අතර, ගුළිකර ඉවත දමන ලද ලියන කඩදාසි කිහිපයක් එහි විය. යම් යම් දේ ලියා තිබූ ඒවායේ තිබුණේ පර්සානෝගේ අත්අකුරු වියයුතු යයි මම අනුමාන කළෙමි.

මා කාමරයට පිවිසෙද්දී, හෝම්ස් ඒ ගිනිඋදුන අසල දණගසාගෙන සිටියේය. ඔහු එහි තිබූ කඩදාසි එකින් එක අතටගෙන පරීක්ෂා කළේ නොඉවසිල්ලෙනි. ඒ කටයුත්ත සඳහා හෝම්ස්ට සෑහෙන වේලාවක් ගතවිය. අන්තිමේදී ඔහු සෙවූ කඩදාසිය හමුවී, ඉන් ඔහු ප්‍රීති ප්‍රමෝදයට පත්වූ බැව් දක්නට ලැබිණ.

එය අනෙක් කඩදාසිවලට වඩා ස්වභාවයෙන් වෙනස් වූ කහපැහැති රළු කඩදාසියක් විය.

"වොට්සන්. මේක මොක්ක් කියලද ඔබ හිතන්නෙ?"

"මට පෙනෙනවා ඒකෙ තියෙනබව නැවුම් පාරවල් වගයක්" මම කීවෙමි. "ඒ අනුව මට නම් හිතෙන්නේ මේක මොකක් හරි පැකට්ටුවක් සාදන්න යොදාගත් කඩදාසියක් බව. රෝගීනට බොන්න බෙහෙත්කුඩු පැකට් කර දීමේදී, ඖෂධවේදීන් කොළ නමන්නේ මේ පිළිවෙළට. කඩදාසියේ එක් දාරයක අර තියෙන්නේ මැලියම් ස්වල්පයක් නේද? ඒකෙන් මට තේරුම් ගන්න පුළුවනි, යම් ද්‍රව්‍යයක් අසුරා, නමා තිබූ කඩදාසිය අලවා තැබුණු බව"

"ඔබේ ඒ නිරීක්ෂණය හා නිගමනය ඉතාම නිවැරදියි මිත්‍රයා" හෝම්ස් කීය. "මේ කඩදාසිය තිබුණේ අනික් ඒවාට උඩින්. ගිනිඋදුනේ





දුම්කවුළුවෙන් පහළට වැටුණු දලිකුණු ස්වල්පයක් ඒ කඩදාසිවල තිබුණා. නමුත් මේකෙ තිබුණේ නෑ. ඔබ ඒක දකින්න නැහැ. අනෙක මේ කඩදාසියේ තත්ත්වය ගැන ඔබට මොකක්වත් කියන්න බැරිවුණා. මේක විදේශයක නිෂ්පාදනය කළ බාලවර්ගයේ කඩදාසියක්. එය නමා තිබුණු තැන්වල රැලුණු, දුඹුරු පැහැති කුඩු ඉතාම ස්වල්පයක් තවමත් රැඳී තියෙනවා. මං හිතන්නේ නෑ විශ්ලේෂණයක් සඳහා ඒක අපට ප්‍රමාණවත් වේවි කියලා. අපි බලමු ඒ ගැන ලෙස්ට්‍රේඩ්ගෙ අදහස මොකක්ද කියන එක."

කඩදාසිය තම සටහන්පොත තුළට දමාගත් හෝම්ස් මා කාමරයේ අනෙක් කෙළවර වෙත කැඳවාගෙන ගියේය.

"බලන්න වොට්සන් මේ ලියනමේසය දිහා. මේක පරීක්ෂා කරලා කියන්න මට මොනවද හිතාගත හැක්කේ?"

"ප්‍රමාණයෙන් ලොකු ලියනමේසයක්" මම කීවෙමි. "ඔහු ජනේලයෙන් පනින්න ඉස්සර වෙලා, මේසයට වාඩිවෙලා යමක් ලියමින් හෝ කියවමින් සිටි බව පැහැදිලියි. හරි. ඔහු ස්පාඤ්ඤ භාෂාවෙන් ලියැවුණු මේ පොත කියවමින් ඉඳල තියෙනවා. බිම විසිරිලා තියෙනවා කඩදාසි කිහිපයක්ම. ඒ ඇරෙන්න වෙන මොකක්වත් මට නම් පෙනෙන්න නෑ....."

"වොට්සන් ඔබ අර බිම තියෙන දේ දුටුවද?"

".....මොකක්ද?.....පණුවෙක්?"

"ඒක මම කලින් දුටුවා. ඒ වුණත්" කී හෝම්ස් ගිනිපෙට්ටිය සමග ඒ තුළවූ පණුවා අතටගෙන මේසය උඩ තැබුවේය. "පර්සානෝ මහත්මිය කිව්වෙ මේ සතා ගැන තමයි. කලබලේට ඌ මේසය යටට විසිවෙලා"

ගිනිකූරු නොතිබූ ගිනිපෙට්ටිය තුළ අපට දකින්නට ලැබුණේ අමුතුම ආකාරයේ සත්ත්වයෙකි. පොළොව හාරද්දී පස් යට සිට හමුවන බිම් පණුවෙකුට හෙවත් ගැඩවිලෙකුට ඌ ප්‍රමාණයෙන් හා හැඩයෙන් සමාන විය. එහෙත් පෙනුමෙන් නම් ඌ ඊට ඉඳුරාම වෙනස් විය. මේ පණුවාගේ පිට දිගටම අපට දකින්නට ලැබුණේ තද කළු පැහැති තිත් රාශියකි. සිරුරේ ඉදිරි කෙළවර දක්වාම විහිදුණු මේ තිත් ඌගේ හිසේදී එකට සම්බන්ධ වූයේ නාගයින්ගේ හිසේ දක්නට ලැබෙන 'ප' අකුරේ හැඩය ගනිමිනි. ඌගේ සිරුරේ ඇතිවූ දඟලීමත් දැක මම වහා පිටුපසට පැන්නෙමි.



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

"දෙයියනේ සාත්තු හෝම්ස්! ඔබ කොහොමද මේ සතා? ඌ විෂ සහිත සර්පයෙක් වගේ එකෙක්ද? පර්සානෝට පිස්සු වැටුණේ මූ නිසාකාලද?"

"ඒ වගෙයි පෙනෙන්නේනේ" හෝම්ස් කිය. "අද හවස මේ ගෙදරට පාර්සලයක් ගෙනැත් බාරදුන්න කිව්වනේ. මූ දමල ඉන්න ගිනිපෙට්ටිය තමයි ඒකෙ තියෙන්න ඇත්තෙ. සැකයක් නෑ. ඔබ දකින්න ඇති අර මේසය ළඟ තියෙන "බුවුන්පේපර්" කඩදාසිය. පාර්සලය ඔතලා තියෙන්න ඇත්තෙ ඒකෙ. අපි අරගෙන බලමු." එය පරීක්ෂා කිරීම සඳහා හෝම්ස් ගත්තේ මිනිත්තු කිහිපයක් පමණි.

"මෙතෙ ලිපිනය ලියල තියෙන්නේ ඉංග්‍රීසි ජාතිකයෙකු නොවන බව මට විශ්වාසයි. සිංදෝක්‍රියෙකුගේ ලේඛන විලාසය දකගන්න පුළුවන්"

මගේ හිතේ ඇතිවූ කුතුහලය තවදුරටත් යටපත් කරගෙන සිටීමට මට නොහැකි විය.

"කවුද හෝම්ස් මේ ඉසදෝරා පර්සානෝ? කොහේදිද ඔබට ඔහුව හමුවුණේ?"

හෝම්ස් අසල වූ පුටුවේ හිඳගත්තේත්, මා දීර්ඝ පිළිතුරක් බලාපොරොත්තු වූ බැව් තේරුම් ගනිමිනි.

"ඉසදෝරා පර්සානෝ කියන්නේ ජාත්‍යන්තර කීර්තියට පත් පුවත්පත් කලාවේදියෙක්." හෝම්ස් කිය. "දකුණු ඇමරිකාව සම්බන්ධ කාරණා පිළිබඳව ඔහු විශේෂඥයෙකු ලෙස හඳුන්වන්න පුළුවනි. මොකක් හරි පරීක්ෂණයක් සඳහා මං පැරිසියට ගිය එක් වතාවකදී තමා මට ඔහු මුලින්ම හමුවුණේ. පීරු රටේ එක්තරා කලා නිර්මාණ වගයක්, කවුදෝ තක්කඩියෙක් වංචනික ලෙස සකසලා, පැරිසියේ අලෙවිකරලා තිබුණා. ඒක ගැන ගවේෂණයක් කරලා පුවත්පතකට ලිපියක් සම්පාදනය කරන්නයි පර්සානෝ පැරිසියට ඇවිත් හිටියේ. ඔහුගේ පියා ක්වෙචුවා රතු ඉන්දියන් ගෝත්‍රියෙක්ලු. මව, ස්පාඤ්ඤ සම්භවය ඇති කාන්තාවක්ලු. ඉන්කාවරුන්ගේ ලේ ඇති පර්සානෝ, ඉතාම නිර්භය පුද්ගලයෙකු ලෙසයි මට එද තේරුම් ගියේ. කොහොම වුණත් මේ මරණය සිදුවීමට ඔහුගේ ලේ නෑකම්වල සබඳතාවක් ඇති කියල මං හිතන්නේ නෑ.

සති කිහිපයකට කලින් මට, පර්සානෝ ගෙන් ලියුමක් ලැබුණා. මොකක් හරි පරීක්ෂණයක් සඳහා ඔහු මෙක්සිකෝවට ගියාලු. ඒක මොකක් සම්බන්ධ පරීක්ෂණයක්ද කියල ඔහු සඳහන් කරල තිබුණෙ





නැහැ. කොහොම හරි ඔහු මෙක්සිකෝවේ මාස හයක් ගතකරලා තමයි ලන්ඩනයට ඇවිත් තිබුණේ. ඔහු කියල තිබුණා අප දෙදෙනා ඉක්මනින් හමුවිය යුතු බව. නමුත් අවාසනාවකට වගේ ඒකට වෙලාවක් යොදගන්න බැරිවුණා. අර දියමන්ති මාලයක් සොරකම් කිරීම ගැන පරීක්ෂණයක මං දිගටම යෙදිල හිටිය නේ.

ඒක අවසන් කළ වහාම ඔහුට ලියුමක් යවන්නයි මං හිතාගෙන හිටියේ. ඒ අප දෙන්නාට හමුවෙන්න වෙලාවක් සහ තැනක් යෝජනා කරලා. දැන් ඉතින් ප්‍රමාද වැඩියි. ඒක කල් ඇතුව කරගන්න බැරිවීම, මගේ හිතට ලොකු වේදනාවක්"

"ඔහු ඔබට එවූ ලියුමේ, ඔහුගේ ජීවිතයට තර්ජනයක් ඇතිබව කියල තිබුණෙ නැද්ද?"

"එහෙම දෙයක් විස්තර සහිතව කියල තිබුණෙ නෑ වොට්සන්" හෝම්ස් කීවේ ශෝකී ස්වරයකිනි. "මෙක්සිකෝවේදී ඔහුට හුගක් සතුරන් ඇතිවුණු බව කියල තිබුණා. පර්සානෝ ද්වන්ධ සටන්වලට හරි දක්ෂයෙක්. කඩුවලින් කරන ඒවාට වගේම පිස්තෝලවලින් කරන ද්වන්ධ සටන්වලත් දක්ෂයෙක්. ඒ නිසා ඔහුට සතුරන් ඇතිවුණාට, ඒක පර්සානෝට ප්‍රශ්නයක් වේවි කියල මට හිතුණෙ නෑ. ඔහුගේ මුහුණේ තිබුණා තේද ලොකු තුවාල කැළලක්. ඒක සතුරු රතුඉන්දියානුවෙකුගේ පිහිපාරකින් ඇතිවුණු එකක්. ඔහු වරක් ඇමසන් වනාන්තරයට ගිහින් තිබුණා. ඒ වැසි වනාන්තරවලට ඇවිගෙන යන විනාශය ගැන ලිපියකට කරුණු හොයන්න. කැලෑ විනාශකරන අය එකතුවෙලා, පර්සානෝව ඝාතනය කරන්න කුලීමැරයෙක් එව්වා. පර්සානෝ තමන්ගේ මුහුණට වැදුණු පිහිපහර නොගෙන සතුරාගේ බඩට පාපහරක් එල්ල කරල තිබුණා. ඒක දුටු අනෙක් රතුඉන්දියානු සතුරන් පලාගිහිල්ලු. කොහොම වුණත් දැන් අන්තිමේදී සතුරන් ජය අරගෙන. ඔහු මේ විදියට මරණයට පත්වීම, මගේ හිතට ලොකු වේදනාවක් වොට්සන්. මට හිතෙන්නේ මට ඔහුව ආරක්ෂා කරගන්න බැරිවුණා කියල. ඔහු මොකක් හරි භයානක අනතුරකට මුහුණදීල ඉඳල තියෙනවා. ඒක තමයි හදිසියේ කරදරයක් වුණොත් මට දැනුම්දෙන්න කියල ඔහු ඊට කියල තියෙන්නේ. ඈ මං ප්‍රමාදවුණා වැඩියි"

"ඔහුගේ සතුරන් කවුද කියලා, පර්සානෝ මහත්මියගෙන් ඔබට දැනගන්න හැකිවේවි"

"ඔව්, ඇත්තමයි. මං ඒ ගැන ඇගෙන් ප්‍රශ්න කළ යුතුයි."

"ඒ වුණත් හෝම්ස් ඒක හෙටට කල්දාන්න ඔබට සිදුවෙනවා" මම කීවෙමි. "ඇය දැන් ඉන්නෙ හරස්ප්‍රශ්න අහලා, වෙහෙස කරවන්න තරම් හොඳ මානසික තත්ත්වයක නෙමෙයි."

"වෛද්‍යවරයෙකු හැටියට ඔබ දෙන අවවාදයට මං මගේ හිස නමනවා මිත්‍රයා." හෝම්ස් කීය. "නමුත් පස්සෙ වෙලාවක හරි, ඇය දන්නා හැම තොරතුරක්ම අහුළුකරගන්න අපි උත්සාහ දැරිය යුතුයි. හොඳයි, මගේ හිතවත් මිත්‍රයා, ලෙස්ට්‍රේඩ් එන්න කලින් අන්තිමවරටත් පරීක්ෂාවෙන් බලන්න. ඔහුගේ ලියනම්මිසයේ වැදගත් යමක් නිරීක්ෂණය කරන්න ඔබට හැකිවුණාද කියල මට කියන්න."

"මට නම් වෙන මොකුත්ම පෙනෙන්නෙ නෑ හෝම්ස්. පොත් කිහිපයක් සහ කඩදාසි පමණයි."

"හොඳයි හොඳයි" ඔහු කිවේ තරමක් පුදුමයට පත් හඬෙනි. එහෙත් මා දකීමට අසමත්වූයේ කුමක්ද යන්න, ඔහු මට පැහැදිලි නොකළේය. මිළඟට ඔහු පොත් රාක්ක වෙත ලංවී ඒවායේ වූ පොත්වල නම් විමසිල්ලෙන් කියවා බැලීය. මේ අතර පොලිස් පරීක්ෂක ලෙස්ට්‍රේඩ් එහි ළඟාවූයේ, තවත් පොලිස් නිලධරයන් කිහිපදෙනෙකුද සමඟිනි.

පර්සානෝ මහත්මිය බේකර් වීදියට පැමිණි තැන සිට, ඉසදෝරා පර්සානෝ ජනේලයෙන් පැන දිවි හානිකරගත් තැන දක්වා සිදුවීම්, හෝම්ස් පොලිස් නිලධරයාට පැවසුවේය. ලෙස්ට්‍රේඩ් නිහඬව ඒ සියල්ල අසා සිටියේය. හෝම්ස් තමාට හමුවූ තග හැඟැනි කොළ කැබැල්ල පෙන්වා ඒ ගැන යම් යම් දේ කියූවත් ලෙස්ට්‍රේඩ් ඒ ගැන සැලකිල්ලක් දක්වූයේ නැත. නමුත් ගිනිපෙට්ටිය තුළ සිටි පණුවා ගැන ඔහු දැඩි උනන්දුවක් දක්වීය.

"හරිම පුදුමාකාරයිනේ" ලෙස්ට්‍රේඩ් කීය. "මේ වගේ සතෙක් මං ජීවිතේට දැකල නෑ. හෝම්ස් මහත්තයා කියන්නේ මූ සර්ප විශේෂයක් කියලද? සර්පයන්ගේ ඇඟේ තියෙන ලකුණු නම් මූගේ ඇඟ මතු පිට තියෙනවා. එහෙම නේද? මූ මොකෙක් ද කියල සොයිසි කර බැලීම සත්ත්ව විද්‍යාඥයෙකුට භාරදෙන්න අපට සිදුවෙනවා. පර්සානෝගේ පිස්සුවට හේතුවුණේ මේ සතා කියන එක ගැන නම් මගේ හිතේ සැකයක් නෑ. ඔහු තමට තියෙන නිසා පාර්සලය ඇරියා. ගිනිපෙට්ටිය විවෘතකළා විතරයි, මූ දෂ්ට කරන්න ඇති. ඒකෙ සැකයක්





නෑ. ඌට තියෙන්නේ මහ භයානක පෙනුමක්. එහෙම නේද? බොහොම පරෙස්සමෙන් මූව මොකක් හරි භාජනයකට දමාගන්න ඕන"

මේ අයුරින් ලෙස්ට්‍රේඩ් තම අදහස් නොනවත්වාම කියාගෙන ගියේය. එහෙත් මගේ මිත්‍රයා නිශ්ශබ්දව බලා සිටියා මිස එයට කිසිත් නොකීවේය.

"හාමිසත්" ලෙස්ට්‍රේඩ් තම පොලිස් භටයෙකු ඇමතුවේය. "පහළ තට්ටුවට බැහැලා, මේ ගෙදර මුළුතැන්ගෙයට යන්න. අපට උවමනා දේවල් කිහිපයක් තියෙනවා. පියනෙ හොඳට වැහෙන ටින් එකක්, හම්වලින් මැසූ අත්වැසුම් කුට්ටමක් සහ ගිනි අඟුරු අල්ලන අඬුවක්. ඒවා මුළුතැන්ගෙයි සේවිකාවගෙන් ඉල්ලාගෙන එන්න. ඉක්මන් කරන්න."

පොලිස්භටයා මේ දේවල් ගෙන ආ පසු, අත්වැසුම් පැළඳගත් ලෙස්ට්‍රේඩ් තම රාජකාරියට සූදානම් වීය. ගිනිඅඟුරු අල්ලන අඬුවෙන් පණුවා සහිත ගිනිපෙට්ටිය ගත් ලෙස්ට්‍රේඩ්, එය හිස් ටිනය තුළට දැමීය. පොලිස්භටයෙක් එහි පියන වසා තද කළේය. හෝම්ස්ගේ කටින් එක වචනයක් හෝ පිටවූයේ ඉන්පසුවය.

"ඔබ හරි අපූරුවට ඒ වැඩේ කළා ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය.

පොලිස් නිලධරයා අප දෙස බැලුවේ ආඩම්බර ලීලාවෙනි. හෝම්ස්ගේ කටහඬේ තිබූ උපහාසාත්මක බව හෝ දෙනෙතේ තිබූ හාස්‍යය මුසු බැල්ම, ලෙස්ට්‍රේඩ් දුටු බවක් නොපෙනිණ.

"දැන් ඉතින් නපුරු සතා ඉන්නේ හිරකූඩුවේ නේ" ඔහු කීය. "මට පුළුවනි මේ ගැන පරීක්ෂණ කටයුතු අරඹන්න."

"ඔබ බලාපොරොත්තු වෙන්නේ, ඉස්සරවෙලා සේවකයන්ගෙන් ප්‍රශ්න කරල ඉන්නද?" හෝම්ස් විමසුවේය.

"මං මුලින්ම කැමතියි අර පාර්සලය භාරගත්තු සේවිකාවගෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න" ලෙස්ට්‍රේඩ් කීය. "අනිත් අයගෙන් කරුණු විමසීම පස්සේ කරන්නත් පුළුවනි. උවමනා වුණොත්. දැන්ම ඒකට කාලය ගතකිරීම, කාලය නාස්තිකිරීමක් කියලයි මට හිතෙන්නෙ. මේ ගෙදර කිසිම කෙනෙක් මේ අර්බුදයට සම්බන්ධ නැහැ කියලයි මං හිතන්නෙ. අපි දැනටමත් අපරාධකාරයා අල්ලාගෙන ඉවරයි. ඌ හිරකූඩුවට දමල යතුරත් දැම්මා. දැන් යතුර තියෙන්නෙ මගේ අතේ" ටින් එක වෙත ඇඟිල්ල දිගුකරමින් ලෙස්ට්‍රේඩ් තම විහිළුව ගැන සිනාසුණේය.



www.sinhalaelibrary.com

"මං කැමතියි සේවකයන්ගෙන් ප්‍රශ්න කරලා බලන්න" හෝම්ස් කීය. "ඊට ඔබේ විරුද්ධත්වයක් නැහැ නේද?"

"කිසිම ප්‍රශ්නයක් නෑ" ලෙස්ට්‍රේඩ් කීය. "ඔබට ඕනෙම දෙයක් අහන්න හෝම්ස් මහත්තයා. පොලිස් ශල්‍ය වෛද්‍යවරයා එනතුරු මට රාජකාරි හුගක් තියෙනවා. මං ඉන්නේ මෙහේ - උඩ තට්ටුවේ. ඒ අතරේ මළසිරුර මෘතශරීරාගාරයට ඇරීමේ කටයුතු සූදානම් කරන්න මට පුළුවනි."

කෙසේ වෙතත් අප එම ස්ථානයෙන් ඉවත්ව යාමට සූදානම් වෙද්දී, ඔහුගේ හිතේ සැකයක් ඇතිවූ බැව් පෙනිණ.

"හෝම්ස් මහත්තයා..... එයාලගෙ කුටුම්බ කතන්දරවල වැදගත් දේවල් කිව්වොත්, ඔබ ඒවා මට දනුම්නොදී ඉන්නෙ නැහැ නේද? ඔබේ අකමැත්තක් නැත්නම්, හෙට හැන්දෑවෙ මං බේකර් වීදිය පැත්තෙ එන්නම්. එතකොට අපට පුළුවනි, මේ සිද්ධිය ගැන අප දන්නා තොරතුරු සාකච්ඡා කරන්න"

"ඇත්තෙන්ම ඔව් ලෙස්ට්‍රේඩ්" හෝම්ස් එකඟවිය.

අපි පහළ තට්ටුව වෙත ගියෙමු. මෙක්සිකානු ජාතික සේවකයා දක්නට නොවීය. මුළුතැන්ගෙයි සේවිකාව හා අනෙක් මෙහෙකාරිය ඔවුන් මුහුණුදුන් සිහිසුණු අත්දැකීම ගැන කතාබස් කරමින් සිටියහ. පර්සානෝගේ මළසිරුර රෙද්දකින් වසා දමා තිබූ අතර, උද්‍යානය වෙත පිවිසෙන දොර වසා දමා තිබිණි.

කරුණු විමසීම සඳහා හෝම්ස් මුලින්ම තෝරාගත්තේ මුළුතැන්ගෙයි සේවිකාවය. ඔහාරා මහත්මිය නම් වූ ඇය අයිරිෂ් ජාතික කාන්තාවක වූවාය. අයිරිෂ් උච්චාරණය නිසා ඇය කැඩුණු ඉංග්‍රීසි තේරුම් ගැනීම, තරමක් අපහසුවිණි. කෙසේ වෙතත් ඇගෙන් දැනගත හැකිවූයේ, කරුණු ස්වල්පයක් පමණි. ඇය මේ නිවසේ සේවය සඳහා දිනපතා ඇවිත් ගිය තැනැත්තියකි.

"පර්සානෝ මහත්තයා මේ ගෙදර කුලියට ගත්තේ මීට මාස දෙකකට පෙර" ඇය කීවාය. "එද ඉඳලම මේ ගෙදර ඉවුම්පිහුම් කළේ මම. උයන්න ඕන මොනවද ඒ කොයිවෙලාවටද කියන එක මට කිව්වේ පර්සානෝ නෝනා. ඇය නිතරම වගේ කුස්සියට ඇවිත් මට උපදෙස් දුන්නා. මහත්තයා නම් අපට දකින්න ලැබුණේ හරිම කලාතුරකින්. ඒ මොකද ඔහු ගෙදර උඩතට්ටුවට වෙලා, නිතරම ලියන එකමයි කළේ. ගෙදරින් එළියට ගියා නම් ඒ කලාතුරකින්"





ගෘහසේවිකාව වූ පොලී ඇට්කින්ස් ලන්ඩන් නගරයේම උපත ලබා, එහිම හැදුණු වැඩුණු තැනැත්තියකි.

"පර්සානෝ මහත්තයා ගෙදරින් පිටවෙලා ගියේ කලාතුරකින් කියල ඔහාරා මහත්මිය කිව් කතාව ඇත්ත." පොලී ඇට්කින්ස් කීවාය.

"ඔහු හමුවෙන්න කියල අමුත්තෝ කවුරුවත් ආවෙ නැහැ. ඔහු නමට ලියුම් ලැබුණු බවක්වත් මට මතක නෑ."

"නමුත් හැන්දෑවෙ ඔහුට කුඩා පාර්සලයක් ලැබුණා" හෝම්ස් කීය. "එහෙම නේද? ඒක බාරගත්තෙ කවුද?"

"ඒක බාරගත්තෙ මම මහත්මයා" ඇය කීවාය. "හවස හතහමාරට විතර ඒක ගෙනාවෙ තරුණ කොලු ගැටයෙක්."

"ඔහුගේ පෙනුම විස්තර කරන්න පුළුවන්ද?"

"මතක හිටින විදියේ විශේෂ පෙනුමක් ඔහුට තිබුණෙ නැහැ මහත්මයා" ඇය කීවාය. "පාර්සලය ගොඩාක්ම හදිසි එකක් නිසා, ඒක වහාම පර්සානෝ මහත්මයාට භාරදෙන්න කිව්වා"

"ඉතින් ඔබ මොකද කළේ?"

"උඩතට්ටුවට අරගෙන යන්න කියලා මං ඒක ජුවාන් අතට දුන්නා. ඒ වෙලාවෙ පර්සානෝ මහත්මයා ලියන වෙලාව. එහෙම වෙලාවට ඔහුට බාධාවෙන විදියට ඇවිත් කතාකරන්න එපා කියල අපට අණ ලැබිල තිබුණේ. ඔහාරා මහත්මියත් මුළුතැන්ගෙයි වැඩ. ඉතින් මට හිතුණා පාර්සලය ගෙනිහිං දීම ජුවාන්ට භාරදෙන්න. පඩියක් ගන්න නිසා එයාගෙනුත් වැඩක් කෙරෙන්න එපායැ. එයා තමයි මහත්තයාගෙ පෞද්ගලික සේවකයා. පිගන් කෝප්ප පිරිසිදු කරන එකත්, මේසෙට කෑම අදින එකත් හැරෙන්න එයාට වෙන වැඩක් නෑ"

"කෝ ඔහු? මට පුළුවන්ද ඔහුට කතාකරන්න?"

"ඔව් පුළුවනි. මේ වෙලාවෙ එයා ඇත්තෙ බිත්ති අල්මාරිය ඇතුළෙ"

"බිත්ති අල්මාරියෙ?"

"ඔව් මහත්මයා" ඇට්කින්ස් මෙහෙකාරිය කීවාය. "එයා හරි බයයි. මොනවා හරි කලබලයක් වුණු ගමන්, තරප්පු පෙළ යට තිබෙන බිත්ති අල්මාරියෙ හැංගෙනවා. එයා එක්ක කතාකරන්න ගිහිං වැඩක් නෑ. එයාට ඉංග්‍රීසි එක වචනයක් බෑ"

කෙසේ වෙතත් බිත්ති අල්මාරිය වෙත ගිය හෝම්ස්, ඒ තුළ සැඟවී සිටි සේවකයා එළියට ඇදගෙන ආවේය.



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

කුඩා සිරුරක් තිබූ ඔහු දුඹුරු පැහැති සුමක් ඇත්තෙක් විය. ඔහුට තිබුණේ බිඳුණු හාස්‍යයක් සහිත රතු ඉන්දියානු මුහුණකි. ඔහුගේ වයස අනුමාන කිරීම මට අපහසු විය. කයෙන් නොමේරුවත්, මුහුණේ තිබුණේ මේරූ පෙනුමකි. නොයෙකුත් කට්ට කෙරාටිකකම්වලට දස්කම් දක්වූ, වයසට වඩා මේරූ ළමයි, ලන්ඩනයේ වීදිවල මම දැක ඇත්තෙමි. භයෙන් ත්‍රස්ත වූ සතෙකු මෙන් ඔහු බියපත්ව සිටියේය. හෝම්ස් තරුණියාගේ කමිස අතෙන් අල්ලාගෙන එළියට ඇදගෙන එද්දී, ඔහු සම බෙල්ලේ එල්ලාගෙන සිටි කුරුසිය දැතින්ම ග්‍රහණය කරගෙන සිටියේය.

එහෙත් අපට ඔහුගේ කටින් එක් වචනයක් හෝ ලබාගැනීමට නොහැකි විය. හෝම්ස් ස්පාඤ්ඤ භාෂාවෙන් එම ප්‍රශ්න ඉදිරිපත් කළත්, තරුණයා දුන් එකම පිළිතුර හිස දෙපසට වැනීම පමණකි. ඔහුගෙන් ප්‍රයෝජනයක් නොමැති බැව් දුටු විට හෝම්ස් සේවකයාගේ කමිසඅත අත්හැරියේය. ඔහු වහා පැනදිව්වේ තරප්පු පෙළ දිගේ ඉහළටයි.

"ඔන්න ඔහේ ගිහිල්ලාවෙ" හෝම්ස් කීවේ මා කොලුගැටයා පසුපස දුවයාමට සූදානම් වන අයුරු දුටුවිටය. "හෙට අපි පර්සානෝ මහත්මිය ඉදිරියේ ඔහුගෙන් ප්‍රශ්න කරමු. භාෂා පරිවර්තකයෙකු ලෙස කටයුතු කරන්න ඇයට හැකිවේවි. අපට තවත් මෙහෙ කළ හැකි දෙයක් නෑ වොට්සන්. කුලීරියක් අල්ලාගෙන අපි යමු බේකර් වීදියට"

කුලීරිය වැඩි පමාවකින් තොරව ම, අප බේකර් වීදියේ නිවහන දක්වා ගෙනගියේය.

"වොට්සන්. ඔබට පුළුවනි ඒකෙම ගෙදර යන්න" හෝම්ස් කීවේ කල්පනා කිරීම සඳහා ඔහුට තනිවීමට අවශ්‍ය බව හඟවමිනි. "මේ ගැන ගැඹුරටම කල්පනාකරන්න මං බලාපොරොත්තු වෙනවා. මේ සම්බන්ධ කාරණා කිහිපයක්ම හොයාබලන්නත් මට සිදුවෙලා තියෙනවා. මගේ හිතවත් මිතුරා. හෙට දවල් දෙකට විතර ඔබට මේ පැත්තෙ එන්න පුළුවන්ද? ඔබට එහෙම එන්න හැකි නම් මට ඒක සන්තෝෂයට කරුණක්."

අග්වකරන්නයෙන් බහිද්දී ඔහු කී දේ, මගේ සිතේ ඇති කළේ විමතියකි. "වොට්සන්. හඩ්සන් මහත්මිය ළඟ තියෙනවද දන්නෙ නෑ පොළොව හාරන සවලක් එහෙම?"

තමාගේ හිතවත් මිත්‍රයාගේ හදිසි මෙන්ම ඛේදජනක වියෝව නිසා, හෝම්ස්ගේ හිතේ ශෝකයක් ඇතිවූ බව මට තේරුම් ගත





හැක. ඒ නිසාම කාමරයේ තනිව කල්පනාකිරීමට තීරණය කිරීමද මට පැහැදිලිය. එහෙත් වැඩිදුර විමසීමකින් තොරව, ඔහුට හිතුණු හැටියේ මා ආපසු හරවා යැවීම ගැන, මගේ සිතේ ඇතිවූයේ කණගාටුවකි. උද්‍යානය හෑරීමට තමාට සවලක් අවශ්‍යවී ඇති බැව් ඔහු සඳහන් කළේය. මේ කරුණ මගේ සිතේ ඇතිකළේ කුතුහලයකි. පොළොව හාරා ඔහුට කිරීමට ඇති කටයුත්ත කුමක්ද?

ආපසු යන ගමනේදී මගේ සිතට දිගින් දිගටම නැගුණේ මෙම ප්‍රශ්නයයි. පසුවද, සවස දෙකට මම බේකර් වීදියේ අපේ නිවහන වෙත ගියෙමි. මා වෙනුවෙන් දොර විවෘතකරන ලද්දේ හඩ්සන් මහත්මිය විසිනි.

"හඩ්සන් මහත්මිය, හෝම්ස් මහත්මයා උද්‍යානය හාරන්න ඔබෙන් සවලක් ඉල්ලන්න ඇති. ඒක දෙන්න ඔබට හැකිවුණාද?" මම විමසුවෙමි.

"ඇත්තෙන්ම ඔව් දොස්තර මහත්මයා" ඇය කීවාය. "ඔහුට පොළොව හාරන්න උවමනා වුණේ මොන උවමනාවකටද කියල දෙයියො තමයි දන්නෙ. ඒ දෙතොළහාරි ආකම වෙනකං, හෝම්ස් මහත්තයා මගේ මල්පාත්ති ළඟ. ලුහුබැඳුමක් දල්වාගෙන පැය කීයක් පොළොව හෑරුවද මං දන්නෙ නෑ"

ඔහු මේ කටයුතුවල යෙදුණේ කුමන අරමුණකින්ද යන්න අනුමාන කිරීමට මට හැකිවිය. එහෙත් ඔහුට ප්‍රශ්නගතය කිරීමට තිබූ දෑ නැරඹීමට, මම තවමත් සූදානමෙන් නොසිටියෙමි.

"හෝම්ස්, මට මෙහෙම දෙයක් ආරංචි වුණා," මා කීවේ විහිළුවක් කරන ස්වරයෙනි. "මට ආරංචිවුණා, ඔබ මාළුබාන්න යන්න සූදානමෙන්, ඇමට අමුනන්න ගැඩවිලුන් හෙව්වා කියලා. කොහොමද වැඩේ සාර්ථක වුණාද?"

"ඇම කියන එකෙන් ඔබ අදහස් කළේ පර්සානෝට දුන් ඇමද?" හෝම්ස් ඇසීය. "මගේ උත්සාහය සාර්ථක වුණා. ඇවිත් මේක බලන්න වොට්සන්" ඔහු කීවේ මේසය දෙසට අතදිගු කරමිනි.

මේසය උඩ තිබූ පීරිසිය වෙත මම මහත් යොමු කළෙමි. එහි සිටියේ අප කලින්ද රාත්‍රියේ පර්සානෝ නිවසේදී දුටු, ගිනිපෙට්ටිය තුළ සිටි සත්ත්වයා ආකාරයේම එකෙකි. ඌගේ සිරුරේ ද කළු පැහැති තිත් තිබූ අතර, හිස කොළවරේ "ප" අකුරේ සලකුණ ද විය.



www.sinhalaelibrary.com
Reading Purpose Only...Not For Print
Reading Purpose Only...Not For Print

"මොන ලෝකෙහිද හෝම්ස් ඔබ මේ සතාව හොයාගත්තෙ?" මා විමසුවේ හිතේ මඳ සැකයක් ද ඇතිවය. මට හිතුණේ ලෙස්ට්‍රේඩ් ගෙනගිය පණුවා, හෝම්ස් කෙසේ හෝ යළි ගෙන්වාගන්නට ඇත කියාය.

"වෙන ලෝකෙකින් නෙමෙයි වොට්සන්" ඔහු පිළිතුරු දුන්නේ සිනාමුසු මුහුණෙනි. "මේ ලෝකෙම මේ මහපොළොවෙන්ම. වැඩි ඈතකින් නොවෙයි. හඩ්සන් මහත්මියගේ මුළුතැන්ගෙයි වතුර ටික ගලා යන, කාණුව කෙළවර මල්පාත්තියකින්. මට හැකිවුණා මේ අද්භූත සත්ත්වයින් තිදෙනෙකුම අල්ලාගන්න."

"තිදෙනෙකුම?" මට කෑගැසිණ. "මොකද මේ සතුන් වේගයෙන් බෝවෙලා වසංගත රෝගයක් ඇතිවීගෙන යනවද? දෙයියෝ සාක්කි! මේක බලාගෙන ඉන්න හොඳ දෙයක් නෙමෙයි. වහාම කාට හරි අපි මේ ගැන දැනුම් දෙන්න ඕන..., කාටද? පොලීසියට..... නැත්නං සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයාට..... වසංගත රෝග නිවාරණ අංශයට.....හෝම්ස්, මූ විෂඝෝර සර්පයෙක්ද?"

මා කියූ ඒ වදන්වලට හෝම්ස් කොක්හඬලා සිනාසුණේය. මිනිත්තු කිහිපයක් යනතුරු ඒ සිනාව නොනැවතිණි. මා පළකළ අදහස් එවැනි සිනාවකට ලක්කිරීම, මගේ සිතේ ඇති කළේ ලැජ්ජාවකි; එමෙන්ම කෝපයකි. එහෙත් කලින් දිනයේ ශෝකයෙන් තැවෙමින් සිටි හෝම්ස්, යළිත් සතුටින් සිටිනු දැකීම මගේ සැනසීමට හේතුවිය.

"මං කියන දේ විශ්වාස කරන්න මිත්‍රයා" ඔහු කීය. "මේකා සම්පූර්ණයෙන්ම අහිංසක ප්‍රාණියෙක්"—

"අහිංසක? ඒ වුණාට උගේ පිට දිගේ තියෙන අර කළුපාට තිත්? අර ඔලුවෙ තියන 'ප' අකුර?"

"ඒ ඔක්කොම ඉන්දියන් තීන්තවලින් මං කළ නිර්මාණ." ඔහු කීවේ පරීක්ෂණ සඳහා ඔහු යොදා ගන්නා මේසය වෙත මා කැඳවාගෙන යමිනි.

"බලන්න. මේ හැම [illegible] ඉන්නවා පණුවෙක්. ඒත් උන්ගේ පිටේ තියෙන කළුපාට තිත් එච්චර පැහැදිලි නෑ. බොඳවෙලා. ඒකට හේතුව මං යොදාගත් කළු වර්ණකය....

ඔය මේසය උඩ තියෙන්නෙ..... ලිවීමට ගන්නා කළුතීන්ත - ඒක හරිගියේම නෑ. කළුපාට සපත්තු පොලිෂ් - ඒක පෑන් තුඩකින් ගෑවා. නමුත් ඉක්මනට මැකී ගියා. යකඩ හා ලෑලි දොරවල්වල ගාන සායම්





- ඒක ද්‍රාවකයේ විදිහට ගෑවිලා මැකීගියා. නමුත් ඒකත් හරියටම හරිගියා. ඔබට බිම්පණුවෙකුගේ සම මත චිත්‍රයක් අඳින්න සිදුවුණොත් යොදාගන්න; මොනවද - කළුපාට ඉන්දියන් තීන්ත. ඒ කටයුත්තට හොඳහොම සියුම් තුඩක් සහිත පෑනක් භාවිත කරන්න."

"එහෙනම් පර්සානෝට පිස්සු වැටුණේ, මේ පණුවා දැකීමෙන් නොවෙයි?" මම ඇසීමි.

"කොහොමටවත් නෑ වොට්සන්" හෝම්ස් කීය. "පණුවො කොහොමද දණ්ඩ කරන්නෙ? නමුත් ඒ සතාව එතන තිබුණේ ඒ වගේ අදහසක් අපේ හිත්වලට එන්න. අපි නොමඟ යවන්න."

"හොඳයි. ඔහුගේ සිරුරට යම්කිසි විෂක් ඇතුළු නොවුණා නම්, ඔහු කොහොමද පිස්සු වැටුණේ?"

"අන්න ඒක තමයි මං අද පර්සානෝ මහත්මියගෙන් අහල දැනගන්න බලාපොරොත්තු වෙන්නෙ. ඒ අතරම මං හිතාගෙන ඉන්නවා තවත් කාරණයක් දැනගන්න."

"ඒ මොකක්ද?"

"ඊයෙ හැන්දෑවේ ඉසාදෝරා පර්සානෝගේ මේසය උඩින් තැබූ වීදුරුවේ දමල බොන්න දුන්නෙ මොනවද කියන එකත්"

"වීදුරුවෙ? මොන වීදුරුවෙද? මම නම් එහෙම දෙයක් දැක්කෙ නෑ."

"එහෙම දෙයක් තිබුණු බව දැනගැනීමට, අප බලන වෙලාවෙ වීදුරුවක්, භෞතික වශයෙන් එතැන තියෙන්න ඕනෙම නෑ" හෝම්ස් කීය. "බැංකුවට හොරෙක් ඇතුළුවෙලා, මුදල් අරගෙන ගිහින් කියල කළමනාකරු දැනගන්න, හොරා දකින්න උවමනාද? නැහැ. බැංකුවේ සේප්පුව පුපුරවා ඇති බව දුටුවාම ඒක හිතාගන්න පුළුවනි. මෙතැනත් එහෙමයි. වීදුරුව ඉවත්කරගෙන ගියත්, ඒක මේසය උඩ තබා තිබූ තැන, වළල්ලක ආකාරයක සටහනක් තිබුණා. ඔපදැමූ මේසය මතයි ඒ ලකුණ තිබුණේ. අපි එතැනට යද්දිත් ඒක හරිහැටි වියළිලා තිබුණෙ නැහැ. ඒකෙන් තේරෙන්නේ වීදුරුව ඉවත්කරලා තියෙන්නෙ, අප එතැනට යන්න මඳ වෙලාවකට කලින් බව.

ඔබට මතකද පොලී ඇට්කින්ස් කියූ කථාව? ඇයට උඩ තට්ටුවට යාම තහනම්. ඔහාරා මහත්මියටත් උඩ තට්ටුවට යෑමේ අවශ්‍යතාවයක් නැහැ. ඒ නිසා වීදුරුව මේසය උඩින් තැබුවේ එක්කො පර්සානෝ



www.sinhalaelibrary.com

මහත්මිය විසින්. නැත්නම් පුවාන් ඇල්බර්ට් නම් සේවකයා විසින්. ඒක කළේ ඒ දෙන්නාගෙන් කොයි එක්කෙනාද කියන එක, මං දැනගන්න බලාපොරොත්තුවෙනවා. එහෙනම් අපි යමු වොට්සන්. ඇයට දුන් ප්‍රමාණවත් තරම් සුවයක් ලැබිලා ඇති. සම්පූර්ණ සත්‍යය හෙළිකරන්න ඇයට බැරි නම්, සිද්ධවුණු පිළිවෙළවත් අපට කියන්න, ඇයට බැරිවෙන එකක් නෑ"

පර්සානෝ මහත්මිය ඇත්තෙන්ම සුවය ලබා සිටියාය. තම නිදන කාමරයේ ඇඳේ සිටිනු වෙනුවට, ඇය විසිත්ත කාමරයේ සෝපාවේ වැතිර සිටියාය. පොලිස් ඇට්කින්ස් අප කැඳවාගෙන ගියේ එතැනටය.

එය මා දැක තිබූ පුදුමාකාරම විසිත්ත කාමරයක් බව කිවයුතුය. එවැනි තැනක සාමාන්‍යයෙන් දකින්නට ලැබෙන මේස පුටු, මෙහි ද තිබිණ. එහෙත් කාමරයේ බිත්ති, ජනෙල් සහ පෑම අස්සක් මුල්ලක්ම වැසී තිබුණේ, දකුණු ඇමරිකානු කලාකෘතිවලිනි. මේවා පර්සානෝ විසින් ඔහුගේ සංචාරවලදී ගෙන එන ලද ඒවා විය යුතු යයි මට සිතිණ. ඒ අතර බුමුතුරුණු, සිතුවම් කරන ලද පිඟන් බඩු, කෙළන ලද පිළිම, දෙවිවරුන්ගේ, යක්ෂයන්ගේ හා සාන්තුවරයන්ගේ මුහුණු දක්වෙන වෙස්මුහුණු ද විය. මේවා සමහරක් ඉතා ප්‍රියජනක, සතුට පිළිබිඹු කරන ඒවා වූ අතර, අනෙක් ඒවායේ දිස්වූයේ වේදනාව හා ද්වේෂයයි.

සිතට සැනසිලි දයක සුවයක් ගෙන ආ හැකි සිසිවත්, මේ කාමරයේ මට නම් නොපෙනිණ. හවස්වරුවේ ඇතුළට ආ සැඩ හිරුරැස් වළකාලීමට, කළුවර තිරවලින් වසාතිබීම නිසා, කාමරයේ තිබූ බියකරු පෙනුම දෙගුණ තෙගුණ විය. මානසික සම්පනයෙන් සුවය ලැබීමට පර්සානෝ මහත්මිය මෙවැනි කාමරයක් තෝරා ගැනීම මගේ සිතේ ඇතිකළේ පුදුමයකි. එහෙත් මේ හැම දසුනක්ම ඇයට හුරුපුරුදු ඒවා විය යුතු බව මට පසුව සිතිණ.

ඇය අඩඅඳුරේ සෝපාවේ වැතිර සිටියාය. ඇය පොරවාගෙන සිටියේ මල් හා කුරුල්ලන්ගේ චිත්‍ර ගෙත්තම් කළ, කළු පැහැති සේද සළුවකි. අපි ඒ අසල වූ පුටු දෙකක හිඳගතිමු. බියකරු වෙස්මුහුණුවලට පිටුපස හැරෙන සේ, මම මගේ පුටුව සකස්කර ගත්තෙමි.

හෝම්ස් හා පර්සානෝ මහත්මිය අතර සංවාදය විටෙක ස්පාඤ්ඤ බසින් සිදුවුවත්, වැඩිපුරම යොදා ගැනුණේ ඉංග්‍රීසි බස ය. මේ





සාකච්ඡාවේ පූර්ණ විස්තරයක් මෙහි ඇතුළත් අතර වේ. සිය කතාබහ වරින්වර නැවැත්වූ පර්සානෝ මහත්මිය, විටෙක කඳුළු වගුරුවමින් හැඬුවාය; විටෙක සුසුම් හෙළුවාය. විටෙක තම හාමිපුරුෂයා ගැන දුක් අඳෝනා නැඟුවාය. කෙසේ වුවත් කථාව ටිකෙන් ටික දිගහැරිණ.

"ඉසදෝරා පර්සානෝ මහත්මයා මට මුලින්ම හමුවුණේ ගිය අවුරුද්දේ" ඇය කීවාය. "එයා ඒ කාලෙ "ලොමිංටන් ගැසට්" පුවත්පත වෙනුවෙන් ලිපි මාලාවක් ලියන්න කරුණු සොයමින් සිටියා. ඒ අතරවා, දකුණු ඇමරිකානු මහාද්වීපය ගැන ලියන්න බලාපොරොත්තු වුණු පොතකට කරුණු හෙව්වා. ඒ සඳහා මධ්‍යම හා දකුණු ඇමරිකාව හරහා ඔහු ආජන්ටිනාවට පැමිණියා.

අපි දෙන්නා අතර ඇතිවුණු ප්‍රේම සම්බන්ධය නිසා අපි විවාහවෙන්න තීරණය කළා. ආජන්ටිනාවෙන් පිටත්වෙලා අපි, චිලී, ඉක්වදෝර් හා බ්‍රසීලය හරහා මෙක්සිකෝවට පැමිණියා.

මෙක්සිකෝවේ කලින් පාලකයා වෙලා හිටියේ බෙනිටෝ ජුවාරෙස් ජනාධිපතිතුමා. හමුදා විප්ලවයක් නිසා ඔහුව බලයෙන් පහවුණා. බලය අල්ලාගත්තේ ජනරාල් ගුස්ටාවෝ ඩයස් නම් හමුදා නායකයා. ඒ 1876 අවුරුද්දේදී. ජනරාල් ඩයස් කටයුතු කළේ ධනවත් ඉඩම් හිමියන් සතුටුකරන්න මිසක්, පොදු මහජනතාවගේ යහපත වෙනුවෙන් නෙමෙයි. මේ ඉඩම්හිමියන් හැමදෙනෙක්ම වගේ ඒ කාලේ ස්පාඤ්ඤයෙන් සංක්‍රමණය වුණු විදේශිකයන්. ජනරාල් ඩයස් අසරණ රතු ඉන්දියානුවන්ගේ ගොවිබිම් රාජසන්තක කළා. ඊට පස්සේ ඒවා ස්පාඤ්ඤ ජාතික ඉඩම් හිමියන්ට බෙදා දුන්නා. මේකෙන් රටේ කලකෝලාහල ඇතිවුණා. ස්වදේශිකයන්ගේ ආහාර වගා විනාශකර දැමූ ස්පාඤ්ඤ ඉඩම්හිමියන් ඇවිලවී දැම්මොළා. ඒ නිසා රතුඉන්දියානු සම්භවය ඇති විශාල පිරිස් දහසකගණනින් හාමතේ මියගියා. මේකට විරුද්ධව ධනවත් නාගරික මෙක්සිකෝ ජාතිකයන් කිසිවෙක් ඉදිරිපත්වුණේ නැහැ. නිර්භීතව ඉදිරිපත්වුණු එකම පුද්ගලයා වුණේ පර්සානෝ මහත්මයා. ඔහු හැමදෙයක් සාධාරණත්වය, යුක්තිය ගරු කළ පුද්ගලයෙක්. දකුණු ඇමරිකාවේ ස්වදේශික සංස්කෘතිය ගැන ඔහුට තිබුණු දැනුම තවත් හේතුවක් වෙන්න ඇති. ඔහුගේ ඇඟේ දිව රතුඉන්දියානු ලේත් එක් හේතුවක් වෙන්න ඇති. මේ අපේ සේවකයා හැටියට ඉන්න ජුවාන් ඇල්බර්ට්, මොන්ටෙරේ නගරයේ පාරක, හාමතේ වැටිලා හිටි තරුණයෙක්. මියයන්න නොදී ඔහුව බේරාගත්තේ පර්සානෝ මහත්මයා.



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print

ස්වදේශිකයන්ගේ පැත්තට කතාකළ නිසා මහත්තයාට සතුරන් විශාල වශයෙන් ඇතිවුණා. මේ අතර හිටියා කාලෝස් විසෙන්ති ගැස්කා නම් ඉඩම් හිමියෙක්. බොහොම කෲර පුද්ගලයෙකු වුණු ඔහුගේ ම්ලේච්ඡ ස්වභාවය ගැන කවුරුවත් දන හිටියා. ඔහු තමන්ගේ වතුවල වැඩකළ ස්වදේශිකයනට අමානුෂික ලෙස වදහිංසා කළ බව ප්‍රසිද්ධ කරුණක්. මේවා වහාම නැවැත්වූයේ නැත්නම් තමා "වොෂිංටන් ගැසට්" පුවත්පතට ඒ ගැන හෙළිදරව් කරන බව කියන්න පර්සානෝ පසුබට වුණේ නෑ. හැඩවුණේ නෑ. ඒකට පිළිතුරු ලෙස ගැස්කා කිව්වේ, තමන් පර්සානෝව මරාදමන බවයි.

ඒ කිව් විදියටම මහත්තයාව මරාදමන්න කීපවාරයක් ඔවුන් උත්සාහ කළා. ඔහු අශ්වයා පිට යද්දී දෙවරක්ම ඔහුට වෙඩි ප්‍රහාර එල්ල කළා. ඒත් ඔහු මරණයෙන් බේරුණා. එක දවසක් ඒ අපි හිටි හෝටලයේ නිදනකාමරයට, පිහියක් රැගෙන මිනීමරුවෙක් කඩාවැදුණා. නමුත් ඔහු එක්ක සටන්කරලා පිහිය උදුරාගෙන, ඔහු පලවාහරින්න පර්සානෝ සමත්වුණා. ඔහු මරාදමන්න කළ උත්සාහයන් වැරදී ගියත්, ඔහු වෙත අනතුරු අඟවලා ලිපි එවන්න සතුරා අමතක කළේ නෑ. හිස්කබලක රූපයක් ඇඳලා, දිගටම මාරාන්තික ප්‍රහාර එල්ල කරන බවට ස්පාඤ්ඤ බසින් තර්ජනය කර තිබුණා. ඒවා එව්වේ විසෙන්ති ගැස්කා බවට සැක නෑ.

මේ විදියට දිගටම ඔහුව ඝාතනය කරන්න දරූ උත්සාහ නිසා, මෙක්සිකෝවෙන් පිටවෙලා එංගලන්තයට එන්න පර්සානෝ මහත්මයා තීරණය කළා. ඒ නිසයි මාව සහ පුවාන් ඇල්බර්ට් රැගෙන මෙහේ පදිංචියට ආවෙ.

එයා කිව්වෙ "එංගලන්තය නීති ගරුක රටක්. මැරවරයන්ට හා අපරාධකාරයන්ට නිදහසේ ක්‍රියාත්මක වෙන්න මෙහේ බෑ" කියලයි.

"මරණ තර්ජන ගැන අමතක කරලා, මට පුළුවනි, මගේ පොත් ලියන වැඩකටයුතු නිදහසේ කරන්න. පුවත්පත්වලට සපයන්න පොරොන්දුවුණු ලිපි ගණනාවක් ඇතුළු වැඩ කටයුතු ගොඩගැහිල තියෙනවා. මං ලන්ඩන් නුවර නිශ්ශබ්ද ගෙදරකට වෙලා, ඒවා ඉවරයක් කරන්නම්" ඔහු කිව්වා.

මීට සති දෙකකට කලින්, පර්සානෝ මහත්මයාට ලියුමක් තැපෑලෙන් ලැබුණා. ඒ අර මෙක්සිකෝවේදී ලැබුණා වගේ මරණ තර්ජන කර තිබූ එකක්. ඒ ලියුමේ හිස්කබලක රූපයක් ඇඳල තිබුණා.





ගැස්කා කොහොම හරි එංගලන්තයටත් ඇවිත් බව අපට වැටහුණා. පර්සානෝ මහත්තයා හැංගිලා හිටි තැනත් ඔහු හොයාගෙන.

එතකොට තමයි මහත්තයා මට මෙහෙම දෙයක් කිව්වේ.

"ඊලොරින්, මට කොයි මොහොතේ ප්‍රහාරයක් එල්ල වෙයිද කියන්න බෑ. ඒක මොන විදියේ එකක් වෙයිද කියලත් මට හිතන්න අමාරුයි. ප්‍රශ්නයක් ඇතිවුණොත් ඔයා වහාම යන්න ෂර්ලොක් හෝම්ස් මහත්තයා හමුවෙන්න. ඔහු මගේ පරණ මිත්‍රයෙක්. ඔහු රහස්පරීක්ෂකයෙක්. පදිංචි වෙලා ඉන්නේ බේකර් වීදියේ. ඔයා මෙතන ඇතුව ඔහුගේ ලිපිනය ලියාගන්න. අංක 221 බී බේකර් වීදිය" ඔහු කිව්වා.

"ඇයි ඉතින් ඔහු මාව මුණගැහෙන්න ආවෙ නැත්තෙ?" හෝම්ස් ඇසීය. "නැත්නම් මං ළඟට පණිවුඩකාරයෙක් එව්වෙ නැත්තෙ?"

"පර්සානෝ මහත්මයා හරි මුරණ්ඩු කෙනෙක්" ඇය කීවාය. "ඒ වගේම ආඩම්බරකාරයෙක්. මං කිව්ව කිසිදේකට කන් දුන්නෙ නෑ. රතුඉන්දියානු සම්භවයක් ඇති අයගෙ හැටි එහෙම තමයි. අනෙක් අයගේ අවවාද උපදෙස් පිළිගන්නෙ නෑ. ගිහින් හෝම්ස් මහත්මයා හමුවෙලා මේ ගැන දැනුම්දෙන්න කියලා, මං කොයිතරමක් කිව්වද. නමුත් ඇහුවෙ නෑ. ඔහු කිව්වෙ - මං ගෙදර ඇතුළට වෙලා ලියන වැඩේ කළොත් මට අනතුරක් නෑ"

"පර්සානෝ මහත්මිය. ඔය ගැස්කා කියන පුද්ගලයාගේ හැඩරුව පිළිබඳ විස්තරයක් මට කියන්න" හෝම්ස් ඉල්ලා සිටියේය.

"ඒ හැටි තොරතුරක් මට කියන්න අමාරුයි මහත්මයා" ඇය කීවාය. "මං ගැස්කාව දැකල තියෙන්නේ එක්වරයි. ඒකත් බොහොම ඈත ඉඳන්. ඔහු හුඟක් උසයි. උරහිස් පළලයි. කළු කොණ්ඩය අක්කමරු වෙලා. හොඳට ඉංග්‍රීසි කතාකරන්න ඔහුට පුළුවන්..... හරියට ඉංග්‍රීසි ජාතිකයෙක් වගේ"

මේ හේතුව නිසා ගැස්කා සොයාගැනීම ඉතාම අපහසු කරුණක් වන බව හෝම්ස් මට පසුව කීවේය. බොරු කොණ්ඩයකින්, කෙස්වැටිය වසාගත් පසු, ඉංග්‍රීසි ජාතිකයෙකු ලෙස පෙනීසිටීම ඔහුට අපහසු කරුණක් නොවේ.

"පර්සානෝ මහත්මිය" හෝම්ස් කීය. "ඔබේ මහත්මයා සිකුරාද දවස ගතකළ හැටි, දැන් මට විස්තර සහිතව කියන්න. මේක බොහොම වේදනා සහගත කටයුත්තක් බව මං දන්නවා. නමුත් ඒ සෑම පියවරක්ම හරිහැටි දැනගැනීම මට ප්‍රයෝජනවත්"



Reading Purpose Only, Not For Print
www.sinhalaelibrary.com

මිනිත්තුවක් හෝ දෙකක් ඉකිගසමින් කඳුළු වැගිරූ ඇය ඉන්පසු කථාව ඇරඹුවාය.

"ඒ හැම කාල ඉවරවුණු ගමන්, පර්සානෝ මහත්මයා ඔහුගේ කන්තෝරු කාමරයට ගියා. සිකුරාද දවස්වලට ඔහු කටයුතු කරන්නේ එම පිළිවෙලටමයි. ඒ මොකද "වෙස්ටමින්ස්ටර් ගැසට්" පත්‍රයට ඔහු ලියන ලිපිය, නොවරදවාම සඳුද උදේම තැපැල් කරන්න ඕන. ඒ නිසා සිකුරාද රෑත්, සෙනසුරාදාත් ඉරිදාත් ඔහු කාලය ගතකරන්නේ ඒ වෙනුවෙන්. සතියේ අනෙක් දවස්වල ඔහු කාලය යෙදෙව්වේ තමන් ලියමින් හිටි පොත සම්පූර්ණ කරන්න"

"ඔහු නමට පාර්සලයක් ලැබුණු බව ඔබ දනගත්තෙ කොයි වෙලාවෙද?" හෝම්ස් විමසුවේය.

"හුගක් හැන්දෑ වෙනකල්, මං ඒ ගැන දනගෙන හිටියේ නෑ" ඇය කීවාය. "පාර්සලය අරගෙන ආවේ කොලුවාගෙන්, ඒක බාරඅරගෙන තියෙන්නේ ගෘහසේවිකාව. මහත්තයාට ඒක ගෙනිහිං දෙන්න කියලා, ඇය ඒක ජුවාන් අතට දීල තියෙනවා. ඒ වෙලාවෙ මං හිටියේ විසිත්ත කාමරයේ. මං පොතක් කියවමිනුයි හිටියේ.

ඊ නවයට විතර මට ඇහුණා ඔහු කෑගැහූ ශබ්දය. මං උඩ තට්ටුවට දිව්වා. මං ඔබට කලිනුත් කිව්වා විශ්ෂටි දකින්න ලැබුණේ, ඔහු සිහිවිකල් වී වගේ හිටි හැටි. නමුත් ඔහු "හෝම්ස්! හෝම්ස්!" කියල කෑගැහුවා. එතකොටයි මං මතක්වුණේ, හදිසියකදී ඔබව දනුම් දෙන්න කියලා ඔහු කී බව. ඉතින් මගේ දිනපොතේ ඔබේ ලිපිනය ලියා තිබූ පිටුව ඉරාගෙන, කුලීරියකින් බේකර් වීදියට ආවා. මට කියන්න තියෙන්නේ එපමණයි"

"පර්සානෝ මහත්මිය" හෝම්ස් කීය. "මං හිතන්නේ ඔබට කීමට තවත් දේවල් තියෙනවා. ජුවාන් හැන්දෑවේ ඔබ පර්සානෝ මහත්මයාට බීමට යමක් ගෙනගියා. ඒ වීදුරුවක දමූ දෙයක්. එහෙම නේද? ඔබ වීදුරුවේ තිබූ දියරයට කඩදාසි කැබැල්ලක ඔතා තිබූ යම්කිසි කුඩු වර්ගයක් එකතුකළා. ඒ කඩදාසි කැබැල්ල හිනිලදුනේ තිබී මට හමුවුණා. වීදුරුව තබා තිබූ තැන, පෙනඅමනය සහිත රවුමක් ඉතිරි වී තිබුණා. මොකක්ද ඒ කුඩු වර්ගය?"

එම ප්‍රශ්නයට ඇය ක්ෂණිකව ප්‍රතික්‍රියාවක් දක්වුවාය. සෝපාවේ කුෂන මතට පෙරළුණු ඇ, දෑත්වලින් මුහුණ වසාගත්තාය. ඊළඟට ඇය ඉකිගසමින් හඬා වැලපීමට පටන්ගත්තාය.





"මොකුත් නෑ! මොකුත් නෑ! මං දිවුරන්නම්!" ඇය කීවාය.

"ඔබේ පිළිතුර ඒකද පර්සානෝ මහත්මිය?" හෝම්ස් ඇසීය. "එහෙම නම් මට වෙනත් විකල්පයක් ඉතිරිවෙලා නෑ. පොලිස් පරීක්ෂක ලෙස්ට්‍රේඩ්ට හැමදෙයක්ම දනුම්දෙන්න මට සිදුවෙනවා. ඔබට තේරෙන්නෙ නැද්ද? මේක මහා භයානක තත්ත්වයක්. පර්සානෝ මහත්මයාගේ මරණයට වගකිවයුතු ඔබය කියලා, චෝදනාවක් එන්න පුළුවනි. වැරදිකාරිය ඔබය කියා මම නම් විශ්වාස කරන්නේ නැහැ. නමුත් සම්පූර්ණ සත්‍යය ඔබ මට හෙළිකළ යුතුයි. එහෙම නොකළොත් මට නම් ඔබව බේරාගන්න ක්‍රමයක් නෑ"

ඇය මිනිත්තු කිහිපයක් ඉකිගසමින් හැඬුවාය. අපි දෙදෙනා නිහඬව බලාසිටියෙමු. ඇගේ හැඬීම නිසා මගේ සිතේ ශෝකයක් ඇතිවූ බව කිවයුතුය. එහෙත් හෝම්ස් ඒ දෙස බලාසිටියේ කිසිදු හැඟීමකින් තොරවය. අන්තිමේදී ඒක සුසුමක් හෙළූ ඇ අපට මෙසේ කීවාය.

"ඒ කුඩු වර්ගය ඇතට විෂ එකක් නොවෙයි. ඒක හදන්නේ ග්වාරනා ඇටවලින්. ග්වාරනා ගස් හැදෙන්නේ දකුණු ඇමරිකාවේ විතරයි, කියලයි මං අහල තියෙන්නේ. ඒ ඇට කෝපි ඇට වගේ. ලිපේ තියපු භාජනයක දමල බැදලා, කුඩුකරල ගත්තාම හොඳ බීමක්. කෝපිවලටත් වඩා ඇඟ ප්‍රබෝධමත් කරනවා.

මේක ඉස්සර කාලේ ඉඳල අපේ රටවල්වල පාවිච්චි කරන බෙහෙතක්. එය ලන්ඩනයේ මිලට ගන්න නැහැ. ඒක බිව්වාම කොහොමවත් නිදිමත වෙන්නේ නැහැ. ඇඟට ශක්තියක් දනෙනවා. පුවත්පත්වලට ලිපි ලිවීමට මහත්තයාට රෑක් නිදිමරන්න වෙනවා. එහෙම දට උණුසුම් කිරිවලට දමූ ග්වාරනා ස්වල්පයක්, මං ඔහුට රෑට බොන්න දෙනවා."

"කවදාටද ඔබ ඒක බොන්න දෙන්නේ?"

"හැම සිකුරාදම රාත්‍රියට. එතකොට මුළු රැයම නිදිමරාගෙන ලිවීමේ කටයුතු කරන්න ඔහුට පුළුවනි."

"ඔබ ඒ ඖෂධය ගබඩාකර තිබෙන්නේ කොතැනකද?"

"අන්න අතන" ඇය කීවේ කාමරයේ ඈත කෙළවරේ බිත්තියකට ලංව තබා තිබූ, ලාච්චු අල්මාරියක් දෙසට අත දිගු කරමිනි. අපි එතැනට ගියෙමු. හෝම්ස් එහි ලාච්චුවක් විවෘත කළේය. කලින්ද අප දුටු ආකාරයේ, කහ පැහැති රළු කඩදාසි තමා සෑදූ පැකට්ටු කිහිපයක් ලාච්චුව තුළ විය.



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

එයින් එකක් අතට ගත් මගේ මිතුරා එය දිගහැරියේය. එහි තිබුණේ දුඹුරු පැහැති කුඩු වර්ගයකි.

"සිතුරාද මං මනුට බොන්න දුන්නේ ඔන්න ඔය පැකට්ටුවක තිබුණු කුඩු" පර්සානෝ මහත්මිය ඇවසුවේ අප සිටි තැනට ළංවෙමිනි.

හෝම්ස් එම පැකට්ටුවක් රැගෙන තම සටහන් පොත තුළට දමාගත්තේ මා දෙසට හැරී යමක් කොඳුරමිනි.

"ඒක නම් මට සැකයි වොට්සන්. මේ ලාච්චුව යතුරු දමලා නැහැ. ඒකෙ උඩම තිබෙන පැකට්ටුව වෙනුවට වෙනත් ද්‍රව්‍ය අඩංගු පැකට්ටුවක් ගෙනැත් දමන්න, ඕන කෙනෙකුට පුළුවනි. ඒකට කිසිම අවහිරතාවයක් නෑ. දැන් මං බලාපොරොත්තු වෙනවා ජුවාන් ඇල්බර්ට්ගෙන් ප්‍රශ්න කරන්න. අපි පර්සානෝ මහත්මියට කියමු භාෂා පරිවර්තක හැටියට කටයුතු කරන්න කියල."

ඒ ප්‍රශ්නයට මා මැදිහත්වූයේ නම් මොහොතකදීය. එයින් ලැබුණේ භයානක ප්‍රතිඵලයකි. එහෙත් අපට එය දකින්නට ලැබුණේ පසුව ය. මා එසේ මැදිහත් නොවන්නට තවත් අනතුරක් වළක්වාගන්නට ඉඩ තිබිණ.

"මට ඒකට ඉඩදෙන්න බෑ හෝම්ස්" මම කීවෙමි. "පර්සානෝ මහත්මිය ඉන්නෙ පිස්සු වැටෙන්න ඔන්න මෙන්න තත්ත්වයෙන්. ප්‍රශ්න අසමින් දිගින් දිගටම ඇයව කරදර කරන එක සුදුසු නෑ. වෛද්‍යවරයෙකු හැටියට ඒ අදහස මං තීව්‍රයුතුමයි. සේවකයාගෙන් ප්‍රශ්න කිරීම සඳහා අපි මෙහෙ එමු. ඇයට සම්පූර්ණ විවේකයක් ලබාදිය යුතුයි. මං ඒ බව තදින්ම කියා සිටින්න කැමතියි."

හෝම්ස් එයට එකඟවූයේ කැමැත්තෙන් නොවේ. පර්සානෝ මහත්මිය බලාගැනීම මුළුතැන්ගෙයි සේවිකාව - ඔහාරා මහත්මියට භාරදී අපි එතැනින් පිට වී ගියෙමු.

අප බේකර් වීදියට ළඟා වූ වහාම මගේ මිතුරා ගියේ, විශ්වකෝෂයේ පොත් අසුරා තිබූ රාක්කය වෙතය. එහි 'ඩී' අකුර යටතේ වූ ග්‍රන්ථය අතට ගත් ඔහු, එය ඉක්මනින් පෙරළාගෙන ගියේය. අනතුරුව ඒක්තරා පිටුවක් සොයාගත් ඔහු, පොත මා අතට දුන්නේ, එය කියවා බලන මෙන් මට සංඥා කරමිනි. මට එහි දක්නට ලැබුණේ මෙම විස්තරයයි.





## සිහි විකල් කරන මත් ඖෂධ

මේවා නිෂ්පාදනය කිරීම සඳහා යොදාගන්නේ, ශාකවලින් ලබාගන්නා ද්‍රව්‍යයන්ය. මිථ්‍යාදෘෂ්ටික ආගමික උත්සවවලදී හා යාගහෝමවලදී මේවා බොහෝවිට භාවිත කෙරේ. ඒ, ඇතිමතාගේ හෝ ආතුරයාගේ සිත හා සිහිබුද්ධිය අවුල් සහගත තත්ත්වයකට ගෙන ඒමටය. තමාගේ සිරුර සැහැල්ලු වී දැන් තමා කුරුල්ලෙකු මෙන් පියාඹා යා හැකිය යන හැඟීම, මෙම ඖෂධයෙන් මත්වූ පුද්ගලයාට ඇතිවේ.

අප්‍රිකාවේ බොහෝ වනචාරී ගෝත්‍රිකයන්, ඔස්ට්‍රේලියානු ආදිවාසීන්, සයිබීරියාවේ ශාමන්වරු, උතුරු හා දකුණු ඇමරිකානු රතුඉන්දියන්වරුන් අතර මෙම මත්බිසු භාවිතය ප්‍රචලිතය. යුද්ධයකට යාමට පෙර සිතේ ප්‍රචණ්ඩ, බිහිසුණු බවක් ඇතිකිරීම සඳහා ස්කැන්ඩිනේවියානු වයිකිංවරු, මෙවැනි ඖෂධ යොදාගත්හ. ඒ සඳහා ඔවුන් ඒක්තරා හතුවර්ගයක් පාවිච්චි කළ බවට සාක්ෂි ඇත. මෙම සමහර ඖෂධ, ගිනිඅඟුරු මතට දමා, එවිට පිටවෙන වාෂ්පය ආඝ්‍රාණය කෙරෙන අතර, තවත් ඒවා කෑමෙන් හෝ බීමෙන් සිහිවිකල් බව ඇතිවේ. තවත් සමහර ඖෂධ, සම මත ආලේප කළවිට සමෙන් රුධිරයට උරාගනී.

ඉතා ප්‍රබල ලෙස සිහිවිකල් තත්ත්වයක් ඇතිකරන ඖෂධයක් වන්නේ "සයිලොසයිබ්" නම් හතුවර්ගයයි. මධ්‍යම හා දකුණු ඇමරිකාවේ සුලභව දක්නට ලැබෙන මෙය, ඇගරිකස් පවුලට අයත් හතු විශේෂයකි. මධ්‍යම ඇමරිකාවේ "ඇස්ටෙකා" රතුඉන්දියානුවන් මෙය හඳුන්වන්නේ "තියෝ නැනැක්ටාල්" යන නමිනි. එහි තේරුම "දිව්‍ය මාංශය" යන්නයි. මෙක්සිකෝවේ නගෝවා ගෝත්‍රික රතු ඉන්දියානුවන්ගේ ආගමික උත්සවවලදී මෙම සිහිවිකල් කිරීමේ ඖෂධ බහුලව යොදා ගැනේ. එම හතු විශේෂය වියළා කුඩුකරගෙන, දියරයකට මිශ්‍රකර පානය කිරීම සාමාන්‍ය ක්‍රමය යි. එය ක්‍රියාත්මක වීමට පැයක සිට පැය එකහමාරක් දක්වා කාලයක් ගතවේ. මෙම මත්ද්‍රව්‍යය නිසා නොයෙක් වර්ණ සහිත අද්භූත දර්ශන දිස්වේ. කාලය හා අවකාශය පිළිබඳ හැඟීම මනසින් ඉවත්වේ. කෙසේ වෙතත් මෙවැනි විෂ ද්‍රව්‍ය භාවිතය නිසා, රතුඉන්දියානු ගෝත්‍රිකයන් කඳුමුදුන්වලින් බිමට පැනීම, ගින්නට පැනීම හා ගංගාවලට පැනීම නිසා ජීවිතක්ෂයට පත්වන්නේ සියදහස් ගණනෙනි."



www.sinhalaelibrary.com
Reading Purpose Only.. Not For Print.

"ඔබට පෙනෙනවා නේද වොට්සන් මේ විෂදවනයෙන් ඇතිවෙන ප්‍රතිඵල?" හෝම්ස් ඇසුවේ මා එම පිටුව කියවා, පොත වසා දැමූ පසු ය. "පර්සානෝ පුවත්පත්වලට ලිපි සම්පාදනය කරන්න, මුළු රාත්‍රියම නිදිමරාගෙන වෙහෙසවුණු බව, ගැස්කා දැනගෙන ඉඳල තියෙනවා. ඒ සඳහා "ගුවාරනා" කුඩු දැමූ කිරි වීදුරුවක් බොන බවත් ගැස්කා දැන හිටියා. ඒ කුඩු පැකට්ටුවක් වෙනුවට "සයිලො සයිබ්" හතුවල විෂ කුඩු පැකට්ටුවක් මාරු කරල යොදවා තියන්න, ගැස්කා මේ ගෙදර කවුරු හරි යොදවා ගත්තා. ඒක පානය කරල පැයක් පමණ යද්දී ඉසදෝරා පර්සානෝගේ සිහිවිකල් වුණා. ඔහු ජනේලයෙන් එළියට පැන්නේ තමන්ට ඉගිලෙන්න පුළුවන් කියන හැඟීම බෙහෙත නිසා ඇතිවීමෙන්"

"හෝම්ස්, ඔබට හිතෙන්නේ මේක කළේ ජුවාන් ඇල්බර්ට් කියාද?"

"ඔව්. වෙන කෙනෙකු කියා හිතන්න අමාරුයි. පර්සානෝ මහත්මිය මේ දේ කළා කියල, මං මොහොතකටවත් හිතන්නෙ නෑ. ඒ මොකද ඔහුගේ මරණයෙන් ඇයට ලැබෙන දෙයක් නැහැ, හැමදෙයක්ම නැතිවෙනවා මිසක්. ඇය දැන් භාෂාදනන රටක තනිවෙලා, ආරක්ෂාවට කිසිකෙනෙකු නැතිව"

"ඒ වුණාට ගැස්කා සමග එකතුවෙලා, ජුවාන් ඇල්බර්ට් තමන්ගේ ස්වාමියා මරාදමන්න කටයුතු කළා කියල හිතන්න පුළුවන්ද?" මම ඇසීමි. "ඔහු මහ මඟ බඩගින්නෙ මැරෙන්න යද්දී, ඔහුව බේරාගත්තේ පර්සානෝ. එහෙම කළ තමන්ගේ ස්වාමියාට ජීවිත පරිත්‍යාගයෙන් කෘතඥ වෙනවා, වෙනුවට......"

"ගැස්කා කෙරෝටීක පුද්ගලයෙක්, එහෙම අය දන්නවා ඇල්බර්ට් වගේ අය රවටාගන්න හැටි" හෝම්ස් කීය. "වොට්සන්, ඔබ කියූ අර කෘතඥතාවය ගැන කියනවා නම්; විශාල පගාවක් ලැබෙන බව දුටුවාම, සමහර අයගේ කෘතඥතාවය පැල දෙරින් පලායනවා. එහෙමත් නැත්නම් ගැස්කා, ඇල්බර්ට්ට මරණ තර්ජන කරන්න ඇති. ඔහුට ගැස්කා ඒත්තු ගන්වන්න ඇති, මේ කුඩු වර්ගය කිසිම විෂක් නැති එකක් කියල. කොහොම හැමුත් ගැස්කා, ඔහුගේ ආයුධයක් හැටියට ඇල්බර්ට්ව යොදාගෙන ඇති බවට මට සැකයක් නෑ. ඔහුගෙන් අද හැන්දෑවෙම ප්‍රශ්න කරන්නයි මට තිබුණේ. නමුත් ඔබේ විරුද්ධත්වය නිසා.....

"ඒක හෙට කරා කියල ලොකු වෙනසක් ඇති වෙන්නෙ නෑ හෝම්ස්" මම කීවෙමි. "අද හැන්දෑවෙ ලෙස්ට්‍රේඩ් මෙහෙ එනවා.





ඒක මට හොඳටම විශ්වාසයි. ඔහුට කියලා සේවකයාව හිරභාරයට නොගන්නෙ ඇයි? ඇල්බර්ට්ගෙන් දිගින් දිගටම ප්‍රශ්නකරන්න ස්පාඤ්ඤ භාෂාව දන්න භාෂා පරිවර්තකයෙකුව යොදාගන්න ලෙස්ට්‍රේඩ්ට හැකිවේවි. එහෙම කළොත් පර්සානෝ මහත්මියට නිකරුණේ හිරිහැර වෙන්නෙත් නෑ"

"ඔබ කියන දේත් යම් ඇත්තක් තියෙනවා, මගේ හිතවත් වොට්සන්" හෝම්ස් මගේ අදහසට එකඟවිය. "ඒකට කටයුතු වහාම සූදානම් කරන්න ඕන. මට කිසිම සැකයක් නෑ, ගැස්කා මේ ලන්ඩන් නුවර කොහේ හරි හෝටලයක සැඟවී ඇති. රටෙන් පැනගන්න කලින් කොහොම හරි ඔහුව අල්ලාගන්න ඕන. පර්සානෝගේ මරණය ගැන දැනගත් වහාම, ගැස්කා රටෙන් පනිනවා. කරන දෙයක් ඊට කලින් කළ යුතුයි"

පැයක් ගතවීමට පෙර ලෙස්ට්‍රේඩ් අපේ නිවහන වෙත පැමිණියේය. ඔහුට උවමනා වී තිබුණේ, හෝම්ස් සොයාගත් දේට කන්දීමට වඩා, තමන් අද්භූත පණුවා ගැන සොයාගත් කරුණු ප්‍රකාශයට පත් කිරීමට ය.

"හරිම පුදුමාකාරයි මහත්වරුනි" ලෙස්ට්‍රේඩ් කීවේ අපේ විසිත්ත කාමරයට ඇතුළු වූ විගසම ය. "මං පොත් ගණනාවක් විමර්ශණය කළා. සත්ත්ව විද්‍යාව, උරගයන් ගැන, පණුවන් ගැන, දුර්ලභ සත්ත්වයන් ගැන, කොඳු නාරටියක් නැති සත්ත්වයින් ගැන, මිහිපිටින් වඳවී ගොස් ඇති සතුන් ගැන ලියැවුණු පොත්. මේ කිසිම පොතක සඳහන් වෙලා නෑ, මේ වගේ අද්භූත සත්ත්වයෙක් ගැන. මේක විද්‍යා ක්ෂේත්‍රය කිසිසේත් නොදන්නා අපූර්ව සොයාගැනීමක්. ඒකෙ සැකයක් නෑ. හෝම්ස් මහත්මයා, ඔබ හිතන හැටියට ඌ ආවෙ කොහෙන්ද? මං අහල තියෙනවා ඇමෙසන් වනාන්තරයේ තවමත්, සොයා ගැනීමකට ලක් නොවුණු සත්ත්ව වර්ග දසදහස් ගණනින් ඇති කියලා. මූ ආවෙත් ඇමෙසන් වැනි වනාන්තරවලින්ද? නැත්නම් මෙක්සිකෝවේ මඩගොහොරුවකින්ද?"

"නැහැ ලෙස්ට්‍රේඩ්. ලන්ඩනයේ උද්‍යානයකින්. නැත්නම් ගෙවත්තකින්"

"මොනවා? ඔබට හොඳටම විශ්වාසද?"

"විශ්වාස නේන්නම්" හෝම්ස් කීය. "ඔහොම ඉන්න මිත්‍රයා. මං හඩ්සන් මහත්මියගේ මල්පෝච්චියක් හාරලා එයින් එකෙක් හොයාගන්නා"

හෝම්ස් පිරිසියක දමා තිබූ කළුනිත් සහිත ගැඩවිලා ගෙනැවිත් ලෙස්ට්‍රේඩ්ගේ මුහුණට ළංකළේය. පොලිස් පරීක්ෂකයා භයෙන් තිගැස්සී පිටිපසට පැන්නේ, අසල වූ මල්පෝච්චියක් ද බිම පෙරළමිනි.

"දෙයියෝ සාක්කි හෝම්ස් මහත්මයා!" ලෙස්ට්‍රේඩ්ට කෑගැසිණ.

"භයවෙන්න කිසිම හේතුවක් නෑ ලෙස්ට්‍රේඩ්. ඌ සම්පූර්ණයෙන්ම අහිංසක සතෙක්" හෝම්ස් පැවසුවේ පිරිසිය මේසය මත තබමිනි. "ඌගේ පිටේ තිබෙන කළුපාට වයිරම, ඉන්දියන් තීන්තෙන් ඇන්දෙ මමයි"

"ඇන්දෙ ඔබයි?" ලෙස්ට්‍රේඩ් ඇසුවේ මවිතයට පත්වය. "ඒ සතා අහිංසක එකෙක් නම්, ඌ නිසා පර්සානෝ මරණයට පත්වුණේ කොහොමද? මට මේ මොකුත් තේරුම් ගන්න බෑ"

"ඒක ඉතාම කෛරාටික අපරාධකාරයෙකු විසින් සැලසුම් කළ ප්‍රයෝගයක්" හෝම්ස් කීය. "මේ සතා ගැන හොයාබලන්න පොලිසිය කාලය නාස්ති කරද්දී, අපරාධකාරයාට පුළුවනි රටින් පැනගන්න."

මීළඟට හෝම්ස් පර්සානෝ මහත්මියගෙන් දැනගත් කරුණු ලෙස්ට්‍රේඩ්ට දැනුම්දුන්නේය.

"මේ හැමදෙයක්ම පිටිපස්සෙ ඉන්නෙ ව්‍රිසන්ති ගැස්කා, ලෙස්ට්‍රේඩ්. ඔබට හැකිතරම් පොලිස් නිලධාරීන් යොදවා, හැම හෝටලයක්ම පරීක්ෂා කරන්න. ඔහු අල්ලා ගැනීම ඒ තරම් පහසුවේවි කියල මං හිතන්නෙ නෑ. ඒ මොකද ඔහුට ඉංග්‍රීසි කථාකරන්න පුළුවන්දු ඉංග්‍රීසි ජාතිකයෙකු වගේ. ඔහු ළඟ ඇති ව්‍යාජ ලියකියවිලි. ඔහුගේ පෙනුම කොයි වගේද කියල, සම්පූර්ණ විස්තරයක් අපට නෑ. පර්සානෝ මහත්මිය කිව්වේ ඔහු උස, පුළුල් උරහිස් තිබෙන කෙනෙක් කියලයි. සැකකටයුතු අපරාධකාරයෙක් ගැන හොයන්න ඒ විස්තර ප්‍රමාණවත් නෑ. කොහොම වුණත් ඔහු ධනවතෙක්. වැඩකටයුතු පහසුකරගන්න ඔහු ළඟ අඩු ගණනේ එක් සේවකයෙක් වත් ඇති. බොහොම වෙලාවට දෙන්නෙනෙක් ඇති. පාර්සලය අරගෙන ආව කොලුවා ගැන හොයන්න මහන්සිවෙන්න එපා. ඒක කාලය නාස්ති කිරීමක්. ඔහු මුදලක් ගෙවා ගැස්කා විසින් යෙදවූ පාරෙ රස්තියාදු වෙන කොලුවෙක් වෙන්න ඇති. අපි වහාම යමු පර්සානෝගේ නිවසට. ප්‍රශ්න කිරීම සඳහා ඇල්බර්ට් අත්අඩංගුවට ගතයුතුයි. ගුවාරනා කුඩු පැකට්ටුව වෙනුවට විෂ බෙහෙත් අඩංගු





පැකට්ටුවක් දමන්න, මොනවා හෝ උපක්‍රමයකින් ඇල්බර්ට්ව යොදවන්න ඇත්තෙ ගැස්කා තමයි"

එහෙත් අප ප්‍රමාද වැඩි බැව් දක්නට ඇතිණ. ජුවාන් ඇල්බර්ට් නිවසෙන් පැනගොස් සිටියේ ය.

"මහත්මයා නියම කළ විදියට මං ඉස්සරහ දොරටුව මුරකළා" ලෙස්ට්‍රේඩ් විසින් මුරට තැබූ පොලිස්කාරයා පැවසීය. "අර මෙක්සිකෝ ජාතික තරුණයා ආවා ගෙයින් පිටවෙන්න. ඔහුගේ අතේ තිබුණා තැපැල්කරන්න සූදානම් කළ ලියුමක්. ඔහු මට සංඥාවලින් පෙන්නුවේ ලියුම තැපැල්කරන්න යන්න උවමනා බවයි. ඒ යකා ඉංග්‍රීසි මොකුත් දන්නෙ නෑ. මං ඌට යන්න ඇරියා. තවමත් ආපහු ආවෙ නම් නෑ"

මේ කථාව ඇසූ ලෙස්ට්‍රේඩ් තද්දින්ම කෝපයට පත්විය. එහෙත් දැන් කළ හැකි දෙයක් නොමැත. ලෙස්ට්‍රේඩ් උපදෙස් දී තිබුණේ පිටතින් එන කිසිවෙකුට නිවස තුළට ඇතුළුවීමට ඉඩ නොදිය යුතු බවටය. නිවසෙන් කිසිවෙකු පිටවීයාම ඔහු තහනම් කර නොතිබිණි.

"ඒ යක්ෂයා කොහේ ගියාද කියල දෙයියො තමයි දන්නෙ" ලෙස්ට්‍රේඩ් කීවේ හෝම්ස් දෙසට හැරෙමිනි.

"ඔබට ඒක හිතාගන්න අමාරුද ලෙස්ට්‍රේඩ්?" හෝම්ස් ඇසීය. "පර්සානෝගේ මරණය ගැන ඔහුට චෝදනා එල්ලවෙන බව තරුණ සේවකයා දැන හිටියා. සැකයක් නෑ, ඔහු ආරක්ෂාව පතා යන්න ඇත්තෙ ගැස්කා ළඟට. හොයාගන්න එක්කෙනෙක්ව. ඔබට හමුවේවි අනෙකාවත්"

"ඔය කියන්න ලේසියි හෝම්ස් මහත්මයා. කරන්න අමාරුයි" ලෙස්ට්‍රේඩ් එසේ පැවසුවත්, කළහැකි සියලුම දේ කිරීමට ඔහු පියවර ගත්තේ ය. ජුවාන් ඇල්බර්ට්ගේ පෙනුම ගැන සම්පූර්ණ විස්තරයක් නිකුත්කොට, ඔහු දුටු තැන වහාම අත්අඩංගුවට ගතයුතු බවට, සියලුම පොලීසි වෙත දැනුම්දෙන ලදී. ගැස්කා පිළිබඳව ලන්ඩනයේ හෝටල්වල හා වරායවල රහසිගතව සොයාබැලීමට රහස් ඔත්තුකරුවන් යොදවන ලදී.

පරීක්ෂණයේ මෙම අංශය සාර්ථක කරගැනීම සඳහා, හෝම්ස්ට හෝ මට කළහැකි කිසිවක් නොවීය. අපි ආපසු බේකර් වීදිය බලාපිටත්ව ගියෙමු. තම කාමරයට වැදුණු මගේ මිත්‍රයා, ඔහුගේ කැලඹුණු සිත සන්සුන් කරගැනීමට උත්සාහ කළේය. ඔහු ඒ සඳහා කළේ වයලීනය අතටගෙන නුදක්ලාවම එය වාදනයේ යෙදීමයි.



www.sinhalaelibrary.com

එහෙත් එයින් ද හිත සන්සුන් කරගැනීමට නොහැකිව, ඔහු වරින්වර විසිත්තකාමරයට පැමිණියේය. පුවත්පත් බලමින් සිටි, මගේ ඒ කටයුත්තට ද බාධාකරමින් ඔහු තම අදහස් පැවසුවේය.

"මට හරි හිතට අමාරුයි වොට්සන්" ඔහු කීය. "ඉසදෝරා පර්සානෝ කියන්නේ නිර්භීත වගේම අවංක මිනිහෙක්. ඃ ඔහුගේ ජීවිතය බේරාගන්න මට බැරිවුණානේ. එක අතකින් මමත් ඒකට වැරැද්දකාරයෙක්. මගේ අවිවේකී බව නිසා, ඔහුව හමුවෙන්න මට බැරිවුණා. එහෙම හමුවුණා නම් ගැස්කා කර තිබූ තර්ජන ගැන මට දැනගන්න තිබුණා. එහෙනම් ඔහුගේ ජීවිතය ගලවාගැනීමට කළ යුතු යමක් ගැන, පර්සානෝට උපදෙස් දෙන්න තිබුණා"

තමාගේ නොසැලකිල්ල නිසා මේ මරණය සිදුවුණාය යන හැඟීම දිගින් දිගටම හෝම්ස්ගේ හිතට නැඟෙන්නට ඇත. එසේ වුවහොත් ඔහු මානසික අවපාතයකට ලක්වීම වැළැක්විය නොහැක. ඒ නිසා මගේ මිත්‍රයා තනිවන්නට නොදී, ඔහුගේ සැපදුක් සොයාබැලීමට මම දිනපතාම වාගේ බේකර් වීදියට ගියෙමි. සති දෙකක පමණ කාලයක් මා එලෙස ගියත්, පර්සානෝ සිද්ධිය ගැන අලුතෙන් යමක් හෙළි නොවිණි.

සති දෙකකට පමණ පසු, මා හෝම්ස් හමුවීමට ගිය එක් සැන්දෑවක අප කතාබහ කරමින් සිටියේ අපරාධකාරයා පැනගිය ආකාරය ගැනය. ඇඳිරිවැටීගෙන එද්දී, කිසිවෙකු අපේ දොරට තට්ටු කරන හඬක් ඇසිණි. එහි ඇතුළුවූයේ ලෙස්ට්‍රේඩ්ගෙන් ලියුමක් රැගෙන ආ පොලිස් භටයෙකි. එය කියවූ මගේ මිත්‍රයා ලිපිය මා අතට දුන්නේ ය.

**"ෂර්ලොක් හෝම්ස් මහතාණෙනි,**

**හැම්ස්ටෙඩ්හි ලිවර්ස්ටෝක් මාවතේ අංක 14 දරන තැන, පාළු නිවසක තිබී මළසිරුරක් හමුවිය. වහාම පැමිණ මට සහාය විය හැකි නම් කෘතඥ වෙමි.**

**ලෙස්ට්‍රේඩ්"**

කුලීරියක නැගී අපි වහාම එම ස්ථානය බලා පිටත්වී ගියෙමු. අප පිළිගත් පොලිස් නිලධරයා, ගෙවත්තේ මල්පඳුරක් ළඟට අප කැඳවාගෙන ගියේය. මා දුටුවේ පඳුර යට තිබූ ඇඳුම් පොදියකි. මෙම නිවස බදුදීම සඳහා වෙළෙඳ සේවකයෙකු එය ගැනුම්කරුවනට පෙන්වා ඇත. මළසිරුර මුලින්ම දකින්නට ලැබී ඇත්තේ ඔහුටයි.





එය පුවාන් ඇල්බර්ඩිගේ මළසිරුර බවට සැකයක් නොවීය. එය හඳුනාගැනීමට අපට වඩාත් උපකාරී වූයේ ඔහුගේ මුහුණේ පෙනුම නොව, ඇඳුම් පැළඳුම් සහ බෙල්ලේ පැළඳ සිටි රන්කුරුසිය බව කිව යුතුය. මරණය සිදුවූ ආකාරය පැහැදිලිවම පෙනිණි. හදවත ඉදිරියෙන් සිරුර තුළට යැවූ පිහියක මිට, එලෙසම ඉතිරි වී තිබිණි. මිටේ තිබුණේ මිනිස් හිසක රූපයකි. දිවත් එළියට දමාගෙන, දත් විළිස්සාගෙන, ඇස්ගෙඩි එළියට නෙරා ආ හැව, මිනිසෙකුගේට වඩා යක්ෂයෙකුගේ යයි මට සිතිණි.

"මේක මෙක්සිකානු පිහියක්" හෝම්ස් කීය. "මේ මිටේ රූපය ඇස්ටෙක් ශිෂ්ටාචාරයේ අයත් රූපයක්. අමීත ගැස්කා විසින් කළ වැඩක් බව අපට බැලූ බැල්මට කියන්න පුළුවනි. ගැස්කාට උවමනා වැඩකොටස ඇල්බර්ඩී ඉටුකළා. ඊට පස්සේ ඔහු ගැස්කා හොයාගෙන ආවා. එතකොට ගැස්කාට සිදුවුණා ඇල්බර්ඩිව මරාදමන්න. ඒ මොකද මේ තරුණයා ඕනෙවට වඩා කරුණු දැනසිටියා."

"අසල්වාසී ගෙවල් හැම එකකින්ම, මං අහල බැලුවා." ලෙස්ට්‍රේඩ් කීය. "පහුගිය සති කිහිපයක්ම, මේ ගෙදර කිසිකෙනෙක් පදිංචිවෙලා ඉඳල නැහැ. සැක සහිත කිසිම ශබ්දයක් මේ ඇත්තෙන්, කාටවත් ඇහිල නැහැ. මළසිරුර ගෙනැල්ලා මෙහෙට දමාගියේ කවුද, මිනීමැරුම සිදුවී ඇත්තේ කොහේද කියන ඒවට කිසිම සාක්ෂියක් නැහැ"

"ගැස්කා ඉඳිවි කියල හිතුණු හෝටල්වල ඔබ හොයා බැලුවා නේද?" හෝම්ස් ඇසීය. "ඒවායින් ලැබුණු ප්‍රතිඵල මොනවද?"

"ඒකෙනුත් කිසිවැඩක් වුණේ නැහැ හෝම්ස් මහත්මයා. පර්සානෝගේ මරණය සිදුවුණු වේලාවට, කාමරයෙන් පිටවී ඉඳපු අය ගැන අපට වාර්තා කීපයක්ම ලැබුණා. එකක් කොණ්ඩය සුදුවුණු ආබාධිත මහත්මයෙක් ගැන. ඔහුට ඉඳල තියෙනවා පෞද්ගලික සේවකයන් දෙදෙනෙක්. ප්‍රංශ ජාතික මහත්මයෙක් ඉඳල තියෙනවා, ඔහුගේ පුතා සහ සේවකයන් දෙදෙනා සමඟ. ඔවුන් සම දුඹුරු පැහැති පුද්ගලයන්. හෝටලයට කියල තියෙන්නේ, තමන් ඉතාලි ජාතිකයන් බවලු.

වරායවලිනුත් කිසිම දෙයක් දැනගන්න බැරිවුණා. ඒකට හේතුව ගැස්කාගෙ පෙනුම හරියටම මෙහෙමයි වගේද කියල අපි නොදන්න නිසා. සැකයක් නෑ. රටින්පිටට සංචාරය කිරීමේදී ඔහු යොදගන්නවා

ඇත්තේ හොර ලියවිලි. ඉතින් සියතට සියයක්ම ඔහු අල්ලාගන්න හැකිවේවි කියල අපට බලාපොරොත්තු තියාගන්න අමාරුයි."

පර්සානෝගේ මරණය ගැන කම්පාවට පත්ව කාලය ගෙවූ හෝම්ස්ගේ තත්ත්වය, ඇල්බර්ඩ්ගේ මළසිරුර හමුවූවත් සතුටුදායක අතට නොහැරිණි. දින ගණනාවක් ගිය පසු එය තරමක් සතුටුදායක අතට හැරුණේ, හෝම්ස්ට විසඳීම් සඳහා අලුත් ගැටලු දෙකක් ලැබුණු පසු ය. එයින් එකක් රැම්ස්ගේට් උන්මත්තකයා පිළිබඳ ගැටලුවයි. අනෙක ස්ටුඩ්බෙරි ආර්යාව පිළිබඳ අභිරහසයි.

අද්භූත බිම්පණුවා පිළිබඳ අභිරහස හෝම්ස් ඉවතට දැම්මේ, සාර්ථක ලෙස විසඳාගැනීමට නොහැකි වූ ගැටලුවක් ලෙසිනි. එක් පැත්තකින් ඔහුට මිත්‍රයෙකු අහිමි විය. අනෙක් අතට ඔහු පිළිබඳ තොරතුරු රැසක් දැනසිටියදීම, කෲර අපරාධකාරයෙක් නීතියේ රැහැණට හසුනොවී රටෙන් පැනගියේය.

"වොට්සන්, මං කැමතියි දවසක, ඉසැද්රා පර්සානෝ, ජුවාන් ඇල්බර්ඩ් දෙදෙනා මැරූ ඝාතකයා ගැන චෝදනා එල්ල වෙලා, විසෙන්ති ගැස්කා එංගලන්තයේ උසාවියක ඉන්නවා දකින්න" හෝම්ස් කීය.

ඒ අතර මේ අපරාධය පිළිබඳ කතාවක් ලියා පුවත්පත් සඟරාවල පළකිරීම ද ඔහු මට තහනම් කළේය. එහෙයින් මෙය ලියා සම්පූර්ණ කළත් අතිශය රහසිගත ලිපිගොනුවේ තැන්පත් කරමි. හෝම්ස්ගේ විශිෂ්ට පරීක්ෂණ ගැන තොරතුරු පාඨකයා වෙත ඉදිරිපත් කිරීමේදී, මේ සිද්ධිය පිළිබඳව මඳ ඉඟියක් සඳහන් කළෙමි. මහජනයා වෙත දැනුම්දීමට ඔහුගෙන් මට අවසර ලැබුණේ එපමණෙකි.



# ප්‍රදීපාගාරයේ වික්‍රමය

මා ළඟ රහසිගත ලෙස තබාගත් ලිපිගොනුවක් හා ලිපිලේඛන සොල්ලකාගෙන, ඒවා විනාශකර දැමීමට මෑතකදී කිසිවෙක් උත්සාහයක් දැරුවේය. මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා විසින් කරන ලද එක් විශේෂ පරීක්ෂණයකදී, ඔහු අභ්‍යාසයාගත් අතිශයින්ම වැදගත් කරුණු, එම ලිපිගොනුවේ අඩංගුව ඇත. ලිපිලේඛන පැහැරගැනීමට කුලී සේවකයින් යොදවා, මේ නින්දිත උත්සාහය දරන ලද්දේ දේශපාලනඥයකු විසින් බව අපට දැනගන්නට ලැබිණි. මගේ මිත්‍ර හෝම්ස් මහතා මට පැවසුවේ, මෙම පරීක්ෂණය ගැන වාර්තාව, පිටපත් දෙකකින් සකසන ලෙසයි. එයින් එකක් චාරිංක්‍රොස්හි, කොක්ස් සමාගමේ බැංකුවේ සුරක්ෂිතාගාරයේ තබන ලෙසට, ඔහු යෝජනා කෙළේය. අනෙක් පිටපත අප ළඟ සුරක්ෂිතව තබාගන්නෙමු. අපේ ලිපිලේඛන පැහැරගැනීමට යළිත් උත්සාහ දැරුවහොත්, රහසිගත තොරතුරු මහජනයාට හෙළිකිරීමට අපි ප්‍රමාද නොවන්නෙමු. මීට පෙර අද්භූත නේවාසිකයා කථාවේ ද, මම මේ පිළිබඳව දැනුම් දුන්නෙමි. එහෙත් අදාළ දේශපාලනඥයා එය තේරුම් ගෙන නොමැති බව පෙනීයයි. කෙසේ වෙතත් මෙහි රහසිගත බව තවදුරටත් ආරක්ෂා කිරීම සඳහා, මෙම අද්භූත සිද්ධිය වුණු කාල වකවානු හා නිවැරදි දිනයන් ඔබ වෙත හෙළි නොකරමි.

මෙය සිදුවන කාලයේදී මම බේකර් වීදියේ නිවහනෙන් ඉවත්ව ගොස්, ක්වීන්ඈන් වීදියේ මා මිලදී ගත් නිවසේ පදිංචි ව සිටියෙමි. මෙය සිදුවුණේ හෝම්ස් තම අපරාධ පරීක්ෂණ වෘත්තියෙන් සමුගෙන, මීමැස්සන් ඇතිකිරීම සඳහා සසෙක්ස් ප්‍රාන්තයේ පදිංචියට යාමට මඳ කලකට පෙරදී ය.

ජූලි මාසයේ මුල් සතියේ එක් සවස් යාමයක, හෝම්ස්ගෙන් මට දුරකතන පණිවුඩයක් ලැබිණි. හවස හය වෙද්දී බේකර් වීදියේ නිවහන වෙත පැමිණෙන මෙන්, ඔහු මගෙන් ඉල්ලා සිටියේය. කුලීරියක නැගී මා එහි යද්දී, මගේ හිතවත් මිත්‍රයා නොඉවසිල්ලෙන් කාමරයේ ඉහළ පහළ සක්මන් කළ ආකාරය මට දකින්නට ලැබිණි.



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

මා කාමරයට ඇතුළු වූ වහාම සූක්ෂමතා නවතා, ඔහු මා අතට ලිපියක් දුන්නේ ය. එසේ දෙමින් කීවේ එක් වචනයක් පමණි.

"මයික්‍රොෆ්ට්"

මේ තරම් කඩිමුඩියේ, හෝම්ස් මා කැඳවූයේ ඇයිද යන්න, මට සිතාගත හැකි විය. මේ ලිපිය එවා ඇත්තේ මයික්‍රොෆ්ට් නම්? එසේ නම් එය අතිශයින්ම සංකීර්ණ ගැටලුවක් විය යුතුය. මයික්‍රොෆ්ට් හෝම්ස් යනු, මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස්ගේ වැඩිමහල් සහෝදරයාය. එංගලන්තය පාලනය කළේ අගමැතිතුමා, සහ කැබිනට් මණ්ඩලය බව සැබෑය. එහෙත් ජාතික ආරක්ෂාව පිළිබඳ තීරණ ගන්නා ප්‍රධාන උපදේශකයා වූයේ මයික්‍රොෆ්ට් ය.

"ආණ්ඩුව? ආණ්ඩුව තියන්නෙ මයික්‍රොෆ්ට්" උමංදුම්රියේ අභිරහස් මරණය කථාවේදී හෝම්ස් මා සමග කියූ බව ඔබට මතක ඇතුවා නිසැකයි. මා අතට දුන් ලිපිය මම දිගහැර බැලුවෙමි.

ෂර්ලොක්,

ඉතා වැදගත් හදිසි කාරණයක් ගැන ඔබ සමග කථාකිරීමට, මට උවමනාවී ඇත. අද හවස - හරියටම හවස හයට නිගට ඩයොජිනීස් සමාජ ශාලාවේදී මා හමුවන්න. ඔබ කලින් වෙන්කරගත් වෙනත් හමුවීම් හා රාජකාරි ඇත්නම්, ඒ හැම එකක්ම වහාම අවලංගු කර දමන්න.

නුදුරු අනාගතය සඳහා තිබිය පරීක්ෂණයක්, ගැටලු විසඳීමක් භාරගන්න එපා. කැමති නම් දොස්තර වොට්සන් කැඳවාගෙන එන්න.

මයික්‍රොෆ්ට්"

මේ වැදගත් හදිසි කාරණය මොකක්ද හෝම්ස්?" මම ඇසීමි.

"මං දන්නෙ නෑ" හෝම්ස් කීය. "ඒ වුණත් ඒක ආණ්ඩුවේ කටයුතු සම්බන්ධ ප්‍රශ්නයක් වෙන්න ඇති. මයික්‍රොෆ්ට තියෙන ප්‍රශ්න එවා විතරයි නේ. ඔහුට කොයින්ද පෞද්ගලික ගැටලු? කොහොම වුණත් මොකක් හරි දෙයක් ගැන, මට හැකුරිනම් හොයාබලන්න සිදුවේවි. ඒක නේ මට වෙනත් අනුග්‍රහයක් භාරගන්න එපා කියල දනුම්දීල තියෙන්නෙ. හොඳ වෙලාවටයි මං වයලට් ප්‍රිට්ස් මෝගන් ආර්යාව පිළිබඳ පරීක්ෂණය අවසන් කරලා තිබුණේ. අපට යන්න කුලීරියක් කැඳවන්න කියලා මං බිලීට කිව්වා. ඒක ආව ශබ්දය මට මොහොතකට කලින් ඇහුණා. තවත් ප්‍රමාද නොවී අපි පිටත්වෙමු මිත්‍රයා. මේ ප්‍රදුමාකාර කැඳවීම මොකක්ද කියලා, එහේට ගිහින් දැනගනිමු"





ඩයොජිනීස් සමාජශාලාව පිහිටා තිබුණේ පෝල්මෝල් ප්‍රදේශයේය. මයික්‍රොෆ්ට් හෝම්ස් පදිංචිව සිටි නිවස ද, රාජ්‍යාරක්ෂක අමාත්‍යංශය ද පිහිටා තිබුණේ ඊට ඉතා සමීපයෙනි. එබැවින් මයික්‍රොෆ්ට්ගේ දවස ගෙවුණේ මේ ආයතන තුන සම්බන්ධ කරන රේඛාව ඇතුළත බව හෝම්ස් මා සමග කීය. මයික්‍රොෆ්ට් එතැනින් පිටවී, මලණුවන් හමුවීමට බේකර් වීදියට ආවා නම්, ඒ ඉතාමත් කලාතුරකිනි.

මට මුලින්ම මයික්‍රොෆ්ට් හමුවූයේ ග්‍රීක් භාෂා පරිවර්තකයා පිළිබඳ පරීක්ෂණයේදීය. එය ද ඩයොජිනීස් සමාජ ශාලාවේදී ම ය. මෙතැන නිදහසේ සුහද කතාබහ, සතුටු සාමීචි තහනම් බව, ඒ කථාන්තරයේදී මම ඔබට කීවෙමි. එවැනි කතාබහ සඳහා වෙන්කර තිබූ එකම කාමරයක් එහි විය. අපි එතැනට ලොගොක් වීමු:

අප එහි යනවිටත් මයික්‍රොෆ්ට් විශාල ජනේලයක් අසල වූ හාන්සි පුටුවක වැතිර සිටියේය. ෂර්ලොක් හෝම්ස්ට වඩා බොහෝ සෙයින් තරබාරු වුවත්, මයික්‍රොෆ්ට්, තීක්ෂණ බුද්ධියකින් මෙන්ම දුරදක්නා නුවණකින් යුත් පුද්ගලයෙකු බව, මම දැන සිටියෙමි. ඔහුගේ අළු පැහැති දෙනෙත් නිතර එහා මෙහා යොමුවූයේ, වටපිටාවේ චලන හා ශබ්ද වෙත අවධානයෙනි. ඊට අනුරූපව බුද්ධිමත් බව හඟවන පුළුල් නළල්තලයක් ද ඔහු සතුවිය. උමං දුම්රිය පරීක්ෂණයේදී මගේ මිත්‍රයා මට කියූ එක් කරුණක් මට එවිට සිහිවිය. එනම් මයික්‍රොෆ්ට්ගේ මොළයේ කරුණු දසදහස් සංඛ්‍යාවක් ගබඩාකරගෙන සිටින බවයි. අවශ්‍ය වූ විටක ඒවා කොටෙහෙ එළියට ගැනීමට ද, විශ්ලේෂණය කිරීමට ද, මයික්‍රොෆ්ට හැකිවිය. කැබිනට් ඇමතිවරුන්ට තීරණ ගැනීමේදී, මයික්‍රොෆ්ට්ගේ අදහස් නැතිවම බැරි විය. ඒ නිසාම බොහෝ අවස්ථාවලදී, "ජාතික ප්‍රතිපත්තිය" ලෙස ප්‍රකාශයට පත්කෙරුණේ මයික්‍රොෆ්ට් හෝම්ස් ගේ යෝජනාවකි.

සුපුරුදු ආචාර සමාචාර වලින් පසුව, ඔහු යළිත් වරක් තම අසුනටම බරවුණේය. මීළඟට ඔහු තම අත දිගු කළේ මේසය මත වූ විස්කි ඩිකැන්ටරය, සෝඩා සයිෆනය හා වීදුරු සහිත බන්දේසිය වෙත ය.

"ෂර්ලොක්, වාඩිවෙන්න කලින්" මයික්‍රොෆ්ට් කීය. "අපි තුන්දෙනාගෙම වීදුරු වලට විස්කි වක්කරන්න. ඒක මට පහසුවක්. මගේ ගෙදර තියෙන්නෙ පාරෙන් එහා පැත්තෙ. පාර පැනලා මේ



www.sinhalaelibrary.com

පැත්තට ආවත් මට හරි මහන්සියි. ඒකෙනුත් මට, එක හවස්වරුවකට උවමනා වෙන ශක්තිය වැය වෙනවා. ඔබට ස්තූතියි ෂර්ලොක්. වැඩිහිටියන්ට සලකන්න ඕන හැටි ඔබ හොඳට දන්නවා. හරි. දැන් ඉතින් මං මගේ මාතෘකාවට බහින්නම්.

මං මේ ඔබට ඉදිරිපත් කරන කාරණාව සුළුපටු එකක් නෙමෙයි. අපේ මාතෘභූමිය වන එංගලන්තයේ ආරක්ෂාව ගැන ඇතිවී තිබෙන ප්‍රශ්නයක්.

ඔබ දෙදෙනාම සමහරවිට දන්නවා ඇති, මේ කාලයේ එංගලන්තය අනෙක් රටවල් සමග පවත්වාගෙන යන මිත්‍ර සම්බන්ධතාවල තත්ත්වය ගැන. ජර්මන් අධිරාජ්‍යයත්, අපේ රටත් අතරේ තිබුණු හොඳහිත දැන් හුඟක් පළුදුවෙලා. තානාපති සබඳතා පවා ක්‍රමයෙන් බිඳවැටී යන තත්ත්වයක් තමා දැන් ඇතිවී තියෙන්නෙ. ජර්මනියේ කයිසර් රජතුමා 1897 දී මෙහෙම වැඩක් කළා. ඔහු සමුද්‍රාරක්ෂාව පිළිබඳ ඇමතිවරයා ලෙස අද්මිරාල් ෆොන් ටර්පිට්ස් පත් කළා. එයින් පස්සේ තමා මේ කරදර ඔක්කොම පටන්ගත්තේ. දැන් ජර්මන් නාවික හමුදාව ඉන්නේ ඉතාම ප්‍රබල තත්ත්වයක. ඔවුන් කොයිමොහොතක හෝ අපේ යටත් විජිතයක් ආක්‍රමණය කරන්න ඉඩ තියෙනවා. නිත්තම ඇල්ලුදාම සඳහා මුහුදේ සැරිසරණ අපේ නැව්වලට පහරදෙන්නත් පුළුවන්. මතක නේ ඇලිසියා නැව? කවුද දන්නෙ. බාගවෙලාවට ඔවුන් බ්‍රිතාන්‍යය දූපත් වලටම පහරදෙන්නත් පුළුවනි.

මේකට මොනවද අපි කරන්න ඕනෙ? මූලික වශයෙන් ගතයුතු පියවර කිහිපයක් අපි හඳුනාගත්තා. ඒ ගැන රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශය හා නාවික හමුදාව එකඟත්වයකට ඇවිත් අවසන්. එයින් අංක එක තමයි; අපේ යුද්ධ නැව්, නවීන කාලතුවක්කු හා යුද්ධායුධ වලින් සන්නද්ධ කිරීම. අංක දෙක; අපේ නාවික හමුදාවේ ප්‍රහාරක උපක්‍රම හා බුද්ධි අංශය ප්‍රතිසංවිධානය කිරීම. නමුත් සතුරාට විරුද්ධව සටනට අපට අත්‍යවශ්‍ය තවත් එකක් තියෙනවා."

"ඒ මොකක් ද?"

"වඩාත් ප්‍රබල, තාක්ෂණය අතින් පරිපූර්ණ, සුපිරි සබ්මැරීනයක අවශ්‍යතාවය. ඒ නිසා අපි මෙහෙම දෙයක් තීරණය කළා. කලින් සැලසුම් කළ බ්‍රෑස් පාටිංටන් සබ්මැරීනයේ සැලසුම මූලික අඩිතාලමක් හැටියට යොදාගෙන, වඩාත් ප්‍රබල, වඩාත් ජවසම්පන්න





සබ්මැරීනයක් නිෂ්පාදනය කිරීම. මුල් සබ්මැරීනය හදන්න යද්දී ඔබර්ස්ටයින් අපෙන් සොරකම් කළ සැලැස්ම ගැනත්, කාඩෝගන් වෙස්ට්ගේ ඛේදජනක මරණය ගැනත් අමුතුවෙන් කියන්න උවමනා නැහැනේ.

මං කියූ ඒ කාරණා සම්බන්ධයෙන් අපි මුල් පියවර තැබුවේ, මීට ටික කාලයකට පෙර. ඒ තමයි වූලිච් හි පිහිටි අපේ රහසිගත පර්යේෂණාගාරයේ ප්‍රධානියා හැටියට රොඩ්රික් ජෙෆ්රිස් පත්කිරීම. ඔබ දන්නවා ඇති, ඔහු විශිෂ්ට ගණයේ විද්‍යාඥයෙක්, මේ කටයුත්ත සඳහා තරුණ ඉංජිනේරුවරුන් සහ විද්‍යාඥයින් තෝරාගැනීම, අපි ජෙෆ්රිස්ටම භාරදුන්නා. ඔබට මෙහේ එන්න කිව්වේ අන්න ඒ සම්බන්ධ කාරණාවෙකට.

ප්‍රශ්නයක් මතුවෙලා තියෙන්නේ මෙහෙම බඳවාගත්තු එක් තරුණ විද්‍යාඥයෙකු ගැන. ඔහු තමා මොරිස් කැලිස්ටර්. ඔහු තීක්ෂණ බුද්ධියක් ඇති දක්ෂයෙකු බවට සැක නෑ. නමුත් ඔහු අමුතුම විධියේ පුද්ගලයෙක්. ඔහු වෙනත් කිසිවෙකු සමග ආශ්‍රයක් නැති, තනියම දවස ගතකරන පුද්ගලයෙක්. සමහරු කියන්නෙ, ඔහු ප්‍රසිද්ධියේ නොකිව්වත්, කැලිස්ටර්ගේ අදහස් පවා බහුබූත ඒවා බවයි. සමහර විට ඔබ ඔහු ගැන දන්නෙ නැතුවා වෙන්න පුළුවනි. ඒ වුණත් මොරිස් කැලිස්ටර්ගේ නිවුන් සහෝදරයා ගැන ඔබ අහල ඇති. ඔහු දේශපාලනයේ නියුතු කෙනෙක්......

"ඔබ මේ කියන්නෙ හියුගෝ කැලිස්ටර් ගැන ද?" ෂර්ලොක් හෝම්ස් විමසුවේය. "වෝට්ෆිල්ඩ් ආසනය සඳහා ස්වාධීනයෙන් තරගකර ජයගත් මන්ත්‍රීතුමාද? එයා ජාතික ආරක්ෂාව ගැන කතාබහක් යද්දී, හොඳ අදහස් ඉදිරිපත් කරන දක්ෂ කථිකයෙක්. එයාද?"

"හරියටම හරි ෂර්ලොක්" මයික්‍රොෆ්ට් කීය. "ඔහු යුද විරෝධී මතයක් දරන්නෙක් නෙ. කට ඇරියොත් කියන්නෙ නිරායුධකරණය ගැනමයි. දැන් ඔහු ආණ්ඩුවේ වැඩකටයුතු වලට මහා හිසරදයක් වෙලා. හියුගෝ කැලිස්ටර් දක්ෂ කථිකයෙක් බවට ඔබ කියන කරුණ නම් ඇත්තයි. මේ නිවුන් සහෝදරයන් දෙන්නා හිතන්නෙ, අනික් කිසිකෙනෙක් නොහිතන අපූරු විධියකට බව අපට පැහැදිලියි. හැබැයි හියුගෝගෙ මල්ලී මොරිස් කැලිස්ටර්, අමාත්‍යයෙන් හැංගෙන්නේ, ගොළුබෙල්ලෙක් කටුව ඇතුළට රිංගනවා වගේ. හියුගෝ කැලිස්ටර් ඒකෙ අනික්

පැන්න. ඔහු කාගේත් අවධානයට යොමුවෙන විධියට කැකෝ ගහනවා.

අභාවප්‍රාප්ත සර් ඩග්ලස් කැලිස්ටර් ගැන ඔබට මතක ඇති. ඔහුට හිටියේ පිරිමි දරුවන් දෙදෙනෙකු විතරයි. හියුගෝ සහ මොරිස් කියන්නේ, මෙන්න මේ දරුවන් දෙන්නා. සර් ඩග්ලස් බ්‍රිතාන්‍ය තානාපතිවරයෙක් හැටියට ලෝකයේ රටවල් ගණනාවක සේවය කළා. ඔහුගේ පුතුන් දෙදෙනා මේ විධියේ සිතුම්පැතුම් ඇති අය වුණේ කොහොමද කියන එකත් පුදුමයි. බොහෝවෙලාවට ඒකට හේතුවෙන්න ඇත්තේ, ඔවුන් හැදුණු වැඩුණු පසුබිම වෙන්න ඇති. සර් ඩග්ලස්ගේ බිරිඳ - කැලිස්ටර් ආර්යාව මේ නිවුන් දරු උපතේදී මිය ගියා. එද ඉඳන් ළමයින් දෙන්නා ඔවුන්ගේ පියා සමග ලෝකයේ විවිධ රටවල පදිංචි වී සිටියා. ඔවුන් ඈත පෙරදිග, ආසියාකරයේ සෑහෙන කාලයක් ගතකළා. ඊට පස්සේ සර් ඩග්ලස්, ජර්මනියේ බ්‍රිතාන්‍ය තානාපති ලෙස දිගුකලක් සේවය කළා. ඒ කාලයේදී මේ තරුණයන් දෙන්නා සහ පියා, ජර්මන් පවුලක් සමග බොහොම ළඟින් මිතුවුණු බවයි පැහැදෙන්නේ. මේ ජර්මන් පවුල තමා, තවුන්ට රුඩොල්ෆ් ෆොන් ස්ක්ලාබිට්ස් හොර්කර් පවුල. ඔවුන් ජර්මනියේ රජ පෙළපතට දැඩි සම්බන්ධයක් ඇති එවුන්. ඔවුන්ට හොර්කර්ගේ පුත්‍රයා ඔටෝ; හියුගෝ හා මොරිස්ගේ සමවයසේ. ඔහු සමග තමයි මොරිස් කැලිස්ටර් දැඩි මිත්‍රත්වයක් ඇතිකරගත්තේ. ඔවුන් දෙදෙනාගේ මේ සමීප මිත්‍රත්වයට හේතුවක් තියෙනවා. ඒ තමයි විද්‍යාත්මක පර්යේෂණ සඳහා දෙදෙනාගෙම තිබෙන දැඩි උනන්දුව. ෂර්ලොක් අන්න ඒ කාරණය මතක තියාගන්න. ඒක හරිම වැදගත්.

කැලිස්ටර් තරුණයන් දෙන්නා රටින් රට ගිය බව මං ඔබට කලින් කිව්වා. මේ නිසා එංගලන්තයේ අනෙක් ළමයින්ට වගේ විධිමත් අධ්‍යාපනයක් ලබන්න ඔවුනට හැකිවුණේ නෑ. උසස් පාඨශාලාවෙන් ඔවුන් විශ්වවිද්‍යාලයට ඇතුළුවුණේ නෑ. නමුත් විදේශ භාෂා ගණනාවක් හොඳින් ඉගෙනගත්තා. විදේශ ජාතීන්ගේ සංස්කෘති ගැන හොඳ අවබෝධයක් ලබාගත්තා. ඒකයි මං කියන්නේ - ඔවුනට පුළුල් ජාත්‍යන්තර දර්ශනයක් ලැබෙන්න ඇති කියල.

මෙතෙකින් හියුගෝ කැලිස්ටර් යොමු වුණේ එක් පැත්තකට. ඔහු ආර්ථික හා දේශපාලන සහයෝගිතාවයක් ගැන කතාකරන්න පටන් ගත්තා. හැම රටක් ම නිරායුධ කරලා, ඇති කළ යුතු සාම මාවතක්





ගැන තමයි, ඔහු නිතරම කියන්නේ. ඔහු යෝජනා කරනවා අපේ මේ රටවල් අතර තිබෙන දේශසීමා ඉවත් කළ යුතු බව; රටකින් තවත් රටකට යාම සඳහා ගතයුතු විදේශ සංචාරක අවසරපත් ක්‍රමය අහෝසි කළ යුතු බව. වෙළඳ සීමා අත්හැර දැමිය යුතුයිලු. මේ මුළු පෘථිවියම පාලනය කරන්න මධ්‍යම කමිටුවක් පත් කළ යුතු බවයි ඔහුගේ අදහස. හුෑ ඒක නිකං සැපපුටුවකට වෙලා මවන, සිහින ලෝකයක් විතරයි. සැබෑ ලෝකයේ තියෙන බල අරගලය දකින්නෙ අපි විතරයි.

ඔහුගේ සොහොයුරා මොරිස් ළඟ නම් ඔම් වගේ දේශපාලන අදහස් තියෙන බවක් පෙනෙන්නෙ නෑ. කොහොම වුණත් ඔහු විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන කාලෙ යම් යම් අදහස් පළ කරල තිබුණා. ඔහු කියල තිබුණේ විද්‍යාත්මක පර්යේෂණ වලින් ලබන දැනුම හා ප්‍රතිඵල, රටරටවල් අතරේ නිදහසේ හුවමාරු කරගත යුතු බව. තාක්ෂණික දැනුම බෙදා හදා ගැනීමේදී දේශසීමා ගැන අමතක කළ යුතු බවත් ඔහු කියා තිබුණා. ඒ කරුණත් හුඟක් වැදගත් ෂර්ලොක්"

මෙතෙක් වෙලා දැඩි අවධානයකින් තම සොයුරාට සවන්දුන් මගේ මිත්‍රයා ප්‍රශ්නයකට සමාන ප්‍රකාශයක් කළේය.

"සර් ඩග්ලස් කැලිස්ටරුත් දැනුම සම්භාරයකින් පරිපූර්ණ විද්වතෙක් කියල මං අහල තියෙනවා"

"ඒක ඇත්ත" මයික්‍රොෆ්ට් කීය. "ඔහු ඈත පෙරදිග දී අධ්‍යයනය කළ ක්ෂෙත්‍ර ගණනාවක් ගැන පොත් පවා ලියා තිබෙනවා. ජපානයේ නෝ නාට්‍ය සම්ප්‍රදාය, ජපානයේ සෙන් බුද්ධාගම, චීනයේ පෞරාණික පිගන් බඩු, චීනයේ පාරම්පරික සංගීතය ආදී විෂයයන් ගණනාවක් ඔහු හදාරලා, ඒ ගැන පොත් ලියා තියෙනවා. සැකයක් නෑ. විදේශ රටවලදී විවිධ සංස්කෘතීන් අධ්‍යයනය කරන්න පියාට තිබුණා ලොකු උනන්දුවක්. ඒ නිසා එවැනි කාරණා කෙරෙහි කුතුහලයක් පුතුන්ටත් උරුම වෙන්න ඇති.

විදේශ තානාපති සේවය අවසන් කරලා සර් ඩග්ලස් එංගලන්තයට ආවා. ඔහු පුතුන් දෙදෙනා ඔක්ස්ෆර්ඩ් සරසවියට ඇතුළු කළා. මොරිස් හැදෑරුවේ නවීන විද්‍යාව. ඔහු භෞතික විද්‍යාව විශේෂ උපාධියක් කරලා, පළමුවැනි පංතියේ ගෞරව සාමර්ථයක් ලැබුවා. ඊළඟට ගණිතය විශේෂ උපාධියත් හැදෑරුවා. ඒකෙනුත් ඔහුට පළමුවැනි පංතියේ ගෞරව සාමර්ථයක් ලැබුණා. පසුව භෞතික විද්‍යාව පිළිබඳ

රාජකීය විද්‍යායතනයේ ගෞරවනීය ආචාර්යවරයෙකු ලෙස මොරිස්ව තෝරාගනු ලැබුවා. ඔහු තරම් අඩු වයසකින් කිසිකෙනෙක් එම තත්ත්වයට පත්වෙලා නෑ. මෙන්න මේ කාලෙ තමා විද්‍යාඥ රොඩ්රික් ජෙෆ්රීස්ගේ අවධානය මොරිස් කැලිස්ටර් වෙත යොමු වුණේ. ඒ අනුව වැඩිදියුණු කළ සබ්මැරීනය සෑදීමේ කටයුත්තට ඔහුගේ නම යෝජනා වුණා. ඔහු වුලිච්හි පර්යේෂණාගාරයට පත්වුණේ එහෙමයි. මෙම පර්යේෂණයේ සෑම පියවරක් ගැනම, සෑම සැලැස්මක් ගැනම හොයා බලන්න, කැලිස්ටර්ට අවසරය තිබෙනවා.

හොඳයි. ඔන්න දැන් තමයි මං වැදගත්ම කාරණයට එන්නේ. මං කියන දේ හොඳින් අහගන්න. මොරිස් කැලිස්ටර් වුලිච් හිදී කරන පර්යේෂණවලින් ලබන ප්‍රගතිය ගැන තොරතුරු රටින් පිටවෙනවා! ඔබ ඒක අහන්නත් පුදුමවේවි. ඔහු මේ තොරතුරු ජර්මනියට ලබාදෙන බව අපට ආරංචියි. ලැබිල තියෙන සාක්ෂි වලට අනුව ඔහු මේ තොරතුරු රහසිගතව යවල තියෙන්නේ, ළමා කාලයේ මිතුයා ඔටෝ හොෆ්කර්ට්, ඔහුත් ජර්මනිය වෙනුවෙන් මේ වාගේ ම පර්යේෂණයක යෙදී ඉන්නා කෙනෙක්"

"කැලිස්ටර් තොරතුරු ජර්මනියට සපයනවා කියල ඔබ දැනගත්තේ කොහොම ද?" හෝම්ස් ඇසීය.

"ඒක බොහොම පැහැදිලි කරුණක් ෂර්ලොක්" මයික්‍රොෆ්ට් කීය. "අපේ රහස් ඔත්තුකාරයන් ජර්මනියේත් ඉන්නවා. කයිසර් රජතුමාගේ අවිආයුධ නිෂ්පාදනය ගැන තොරතුරු, ඔත්තුකරුවන් අපට නොකඩවා සපයනවා. අපේ මහරජතුමාගේ රාජාභිෂේකය ඉවරවුණු වහාම, ඒ ගැන රජයේ අවධානය යොමුවුණා. කැලිස්ටර්ගේ වැඩ කටයුතු ගැන හොයල බලන්න, විශේෂඥ කමිටුවක් වහාම පත්කරන්න කියල, ඔවුන් මට නියෝග කළා. ඒ කණ්ඩායමේ ප්‍රධානියා හැටියට මං තෝරාගත්තේ ඩ්‍රූරි නාම් කෙනෙක්. ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පරීක්ෂකයෙක් වන ඔහු, ඔබට මීට කලින් හමුවෙලා ඇති, මං හිතන්නෙ?"

"ඇත්තෙන්ම ඔව්" හෝම්ස් කීය. "ඔහු හොඳ දක්ෂයෙක්. අවුරුද්දකට පමණ කලින් වොට්සන් හා මා කළ පරීක්ෂණයකට ඔහු සම්බන්ධවෙලා හිටියා. ....... තලගනකට අත්වූ ඉරණම ගැන කළ සොයාබැලීමකදී"

"හරි. අන්න ඒ ඩ්‍රූරි තමා" මයික්‍රොෆ්ට් කීය. "දැන් මාස තුනක් තිස්සේ ඩ්‍රූරි සහ ඔහුගේ මිනිස්සු, මොරිස් කැලිස්ටර් ගැන හොඳ





සෝදිසියකින් ඉන්නේ. ඔහු තමන්ගේ මිත්‍ර ඔටෝ හොෆ්කර්ට්, සබ්මැරීනය ගැන තාක්ෂණික විස්තර යවන බවට අපට විශ්වාසයි. ඒකට යොදගන්න රහසිගත ක්‍රමය මොකක්ද? ඩ්‍රූරි මෙච්චර දවසක් උත්සාහ කළේ, අන්න ඒක හොයාගන්නයි. නමුත් තවමත් බැරිවුණා.

උපතේදී සිදු වූ යම් අනතුරක් නිසා, මොරිස් කැලිස්ටර්ගේ එක් උරහිසක් ආබාධිතව, විකෘතියි. සමහරවිට ඒ නිසා වෙන්නත් පුළුවනි, මොරිස් කැලිස්ටර් කිසිවෙකු එක්ක ආශ්‍රයකට යන්නෙ නෑ. ඔහුගේ කටයුතු, ගමනබිමන් හා හැසිරීම් ගැන වුලිච් පොලිස් හොඳ සෝදිසියකින් හිටියා. නමුත් එතැනදී මොකුත් රහස් පිටවීමක් සිදුනොවෙන බවයි හිතන්න තියෙන්නේ. පර්යේෂණාගාරය කිට්ටුව සාමාන්‍ය තත්ත්වයේ නිලනිවසක් ඔහුට ලැබිල තියෙනවා. අමුත්තන් කිසිම කෙනෙක් ඔහු හමුවෙන්න මේ නිවසට එන්නෙත් නෑ. උදේට ඔහු තනියම පර්යේෂණාගාරයට යන්නේ ඇවිදගෙන. හැන්දෑවට ගෙදර එන්නෙත් තනියම, පයින් ම යි. මගදී කිසිකෙනෙක් හමුවෙන්නෙත් නෑ. වුලිච් වල රැකියාවට ආවට පස්සේ, ඔහු තමන්ගේ සොහොයුරා වන හියුගෙ හමුවෙලාවත්, ඔහු සමග කතාබහ කරලාවත් නැහැ. ඒකෙ පුදුමයක් නැති බව මන්ත්‍රීවරයෙක් කිව්වා. ඒ මොකද අවිආයුධ නිෂ්පාදනයට හියුගෙ කැලිස්ටර් සම්පූර්ණයෙන්ම විරුද්ධයි."

"කැලිස්ටර්, ඔහු කරන සොයාගැනීම් රහසිගතව පිටට යවන්නේ පර්යේෂණාගාරයේ ඉඳලම වෙන්න බැරිද මයික්‍රොෆ්ට්?"

"නෑ මගේ ආදරණීය ෂර්ලොක්" මයික්‍රොෆ්ට් කීය. "ඒකට ඉඩක් නෑ. කාඩෝගන් වෙස්ට් සිද්ධියෙන් අපි හොඳ පාඩමක් ඉගෙන ගත්තා. සබ්මැරීනය නිෂ්පාදනයේ සැලසුම් හැම එකක්ම තියෙන්නේ එක් ප්‍රධාන යකඩ සේප්පුවක. ඒකට යතුරු තියෙන්නේ ජෙෆ්රි ළඟ විතරයි. මෙහෙම කියලා කැලිස්ටර්ට අගෞරවයක් වෙන එකක් නෑ. ඔහුට තියෙනවා ඉතා අසාමාන්‍ය විදිහේ බුද්ධියක් හා මතක ශක්තියක්. සැලැස්මක තොරතුරු හා අනික් විස්තර හැමදෙයක්ම, ඡායාරූප ගතකරනවා වගේ තමන්ගේ මතකයට ගන්න, කැලිස්ටර්ට පුළුවන්. ඕනෑ වෙලාවට ඒවා මතකයෙන් ඉවතට ගන්නත් ඔහුට පුළුවනි. ඩ්‍රූරිගේ මිනිසුන් දෙන්නෙක් සේවකයන් ලෙස, පර්යේෂණාගාරයේ සේවයට දමන්න අපට හැකිවුණා. කැලිස්ටර් කරන කියන හැමදෙයක් ගැනම ඔවුන් හොඳ සෝදිසියෙන් ඉන්නේ. විශේෂ අවසර පත්‍රයක් නැතිව කිසිකෙනෙකුට පර්යේෂණාගාරයට ඇතුළු වෙන්නත් බැහැ.

මේ පර්යේෂණාගාරයට තියෙන්නේ එකම දුරකතනයයි. ඒක තියෙන කාර්යාලයේ, ප්‍රධාන ලිපිකරුවා හැටියට ඉන්නේ චීරුවීගේ මිනිහෙක්. ඒ නිසා පිටත ඉන්න කිසිවෙක් එක්ක රහසිගත කතාබහකට කැලිස්ටර්ට ඉඩක් නෑ. ඔහුගේ නිවසට දුරකතන සම්බන්ධතාවයක් ඇත්තෙත් නෑ"

"පිටවෙන්න තියෙන හැම පුංචි සිදුරක්ම, ඔබ හොඳින් වසාදමල තිබෙන බවයි මට පෙනෙන්නේ" මගේ මිත්‍රයා කීය. "ඉතින් කොහොමද ඔහු රහස් පිටකරන්නේ?"

"අන්න ඒක තමා ෂර්ලොක් මටත් දැනගන්න ඕන?" මයික්‍රොෆ්ට් කීය. "හැබැයි මෙහෙම දේකුත් තියෙනවා. ඔබ දන්නවා ඇති කෝන්වෝල් ප්‍රාන්තයෙන් බිහිවුණු මිනිස්සු, තමන්ගේ ගම් ප්‍රදේශයට හරියට ආදරය කරන බව. කැලිස්ටර්ලත් කෝන්වෝල් වල අය. සර් ඩග්ලස් තානාපති සේවයෙන් විශ්‍රාම ගනිද්දී, කෝන්වෝල් වල වෙරළ කිට්ටුව කඳුගැටයක් මත, නිවසක් ඉදිකරගෙන එහි පදිංචි වුණා. ඔහු තමන්ගේ මරණය දක්වාම පදිංචිව හිටියේ, "ෆර්ස්" නම් මේ නිවසේ. පසුගිය මාස හයක හතරක ඉඳන්, මොරිස් කැලිස්ටර් සතිඅන්ත වල තමන්ගේ ගමට යන පුරුද්දක් තියෙනවා. සිකුරාද හවස දුම්රියෙන් කෝන්වෝල් යන ඔහු, ආපහු ලන්ඩන් එන්නේ ඉරිද හවසට. යන එන අතරේදී ඔහු කිසිම කෙනෙකු සමග රහස් ගනුදෙනුවක හෝ කතාබහක නොයෙදෙන බව අපට සහතිකයි. පැඩිංටන් දුම්රියපොළෙන් දුම්රියට නගින ඔහු, කෝන්වෝල් වල පෙන්සාන්ස් දක්වා යනවා. ඒ ගමනේදී ඔහු සමග එංගලන්ත ඔත්තු කාරයින් ගමන් කරනවා. ආපහු ගමනේදී ඔත්තු කාරයින් දෙදෙනෙකු එකඟ එනවා. ඒත් කැලිස්ටර් ගැන සැක සිතෙන විදියේ කිසිම සිදුවීමක් දුම්රියේදී සිදුවෙන්නෙ නෑ.

කෝන්වෝල් ප්‍රාන්තයේ උතුරු වෙරළ තීරය ගැන ඔබට මතක ඇති කියල මං හිතනවා. ඒකත් පෙන්හිඩ් නම් ප්‍රදේශය වෙත තමයි අපේ අවධානය යොමුකරන්න වෙලා තියෙන්නෙ. ඔය හරියේ මුහුදු වෙරළ, විශාල ගල් පර්වත ගණනාවකින් වැහිලයි තියෙන්නේ. 16, 17 හා 18 වැනි සියවස්වලදී, පෙන්හිඩ් පර්වතවල ගැටී විනාශ වුණු නෞකා ගණන අප්‍රමාණයි. මේ හේතුව නිසා පෙන්හිඩ්වල ප්‍රදීපාගාරයක් ඉදිකරලා ක්‍රියාත්මක වුණා. ඒ, නෞකාවලට යා යුතු නියම මඟ පෙන්වීමට. නමුත් මේ ස්ථානයේ ඇති ගල්පර සහිත බව





නිසාත්, එතැනට ගොඩබිමින් යාමට ඇති අපහසුව නිසාත්, පසු කාලයක වෙනත් තැනක අලුත් ප්‍රදීපාගාරයක් ගොඩනැගුණා. ඒ, යාමට ඒමට පහසුකම් තිබෙන, තවදුරටත් නැගෙනහිර දෙසට වෙන්න. ඒකෙන් මොකද වුණේ? පෙන්හිඩ් ප්‍රදීපාගාරය පාවිච්චියට නොගෙන අත්හැර දැමුණා. එතැනට ළඟාවෙන්න පහසු මගක් නැහැ. තුණාටු නොමැති කාලගුණය හොඳ දවසක, බෝට්ටුවක් පැදගෙන ගියාම එතැනට ළඟාවෙන්න පුළුවන් කුඩා වේදිකාවක්, දැන් එහි සකස් කරල තියෙනවා. ඒ වේදිකාවේ ඉඳලා ගල් සහිත පස් කන්දට තනා ඇති ගල් පඩි කිහිපයකින්, ප්‍රදීපාගාරයට ළඟාවෙන්න පුළුවනි.

මං කියන මේ විස්තර හැමදෙයක්ම හිතට ගන්න ෂර්ලොක්. ඒ මොකද ඒ හැමදෙයක්ම ඔබට පැහැදිලි අවශ්‍ය වේවි. මේ ප්‍රදීපාගාරයේ එක් කොටසක්, සර් ඩග්ලස් ජීවත්වෙද්දී චිත්‍රාගාරයක් බවට හරවා තිබුණා. ඔහු ඒක සාදාගත්තේ මොකටද? අනෙක් අයගෙන් ඈත්වෙලා, සුළඟෙන් හෝ අව්වෙන් පීඩාවක් නොවී, මුහුද අයිනට වෙලා චිත්‍ර අඳින්න. තෙල් සායම්න් දර්ශන සිතුවමට නගන්න. ඒ කටයුත්තට ප්‍රදීපාගාරය හොඳ තැනක් බව ඔහුට වැටහෙන්න ඇති.

අපේ මිත්‍රයා - මොරිස් කැලිස්ටර් සතිඅන්ත වල ගමට යන්න පටන්ගත් බව මං ඔබට කිව්වා. ඔහු දැන් මොකක්ද කර තිබෙන්නේ? තාත්තාගේ චිත්‍රාගාරය දැන් ඔහු පර්යේෂණාගාරයක් ලෙස සකස්කරගෙන. පාළු ප්‍රදීපාගාරයේ, ඔහු භෞතික විද්‍යා පර්යේෂණ අත්හද බලනවා. නොයෙකුත් විදියේ විද්‍යාත්මක උපකරණ, රසායන ද්‍රව්‍ය, යන්ත්‍ර කොටස්, ආහාරපාන, ඔහු ප්‍රදීපාගාරය වෙත ගෙනයන හැටි, චීරුවීගේ මිනිස්සු දැක තියෙනවා. "ෆර්ස්" මන්දිරයේ සතිඅන්තය ගෙවනවා කිව්වට, ඔහු සෙනසුරාදා හා ඉරිදා දවස්වල වැඩි කොටසක් ගතකරන්නේ ප්‍රදීපාගාරයේ.

ෂර්ලොක් මේ අහන්න. කැලිස්ටර් කෝන්වෝල් වෙත යන ගමන ගැන, සැක උපදවන, විස්මයජනක කරුණු දෙකක් මට පෙනීගියා. අන්න ඒ නිසා තමයි මට හිතුණේ, ඔහු පණිවුඩ හුවමාරු කරගන්නේ එහේ ඉඳල කියල. ඔහුට අයත් "ෆර්ස්" මන්දිරයේ ගෘහපාලිකාව ඉංග්‍රීසි ජාතික කාන්තාවක් නොවෙයි. ඇය චීන හෝ ජපන් ජාතික වයසක කාන්තාවක්. ඇගේ නම මායි මෙනෙව්ය. කැලිස්ටර් පවුල ඈත පෙරදිග ඉද්දී, ඔවුන්ගේ සේවයට එක්වුණු ඇය, දීර්ඝ කාලයක ඉඳලා සේවය කරන තැනැත්තියක්. ළමයි දෙන්නා කුඩා කාලයේ



www.Sinhalaelibrary.com

ඔවුන්ගේ ආයා හැටියට හිටියේ ඇයයි. සර් ඩග්ලස් ගේ අන්තිම කාලයේ ඔහු අසනීප වෙලා ඉඳිද්දී, හෙදියකගේ වැඩ කරලා තියෙන්නෙත් මායි මෙහෙවිය විසින් ම යි.

දැන් මං කියන්නම් පළමු වන විස්මයජනක කරුණ. මේ කාන්තාව කෙට්ටු වයස්ගත කාන්තාවක් බව මං ඔබට කලිනුත් කිව්වා. නමුත් ඇය ගෙදර පාවිච්චියට සතිපතා ඇණවුම් කරන ආහාර ප්‍රමාණය ඉතාම විශාලයි. ඒක ඇය වැනි කාන්තාවකට කාලා ඉවරකරන්න පුළුවන් ප්‍රමාණයට වඩා හොඳටම වැඩියි. කැලිස්ටර් සති අන්තයේ ගෙදර ඇවිත් කෑමවේල් කිහිපයක් ගන්නා බව ඇත්තයි. ඒ වුණත් මේ කෑම ප්‍රමාණය, එහෙම අවශ්‍ය වෙන ප්‍රමාණයට වඩා හොඳටම වැඩියි. ඉතින් මොකක්ද ඒකට හේතුව? ස්ථිර වශයෙන්ම මේ ගෙදර කෙනෙක් හෝ වැඩි ගණනක් හොරෙන් පදිංචිව ඇති. අපි සැක කරන්නේ අන්න ඒකයි. නමුත් එහෙම කෙනෙකුව දැකපු බවට සාක්ෂි නෑ.

ඔවුන්ට ළඟම තිබෙන නගරය පෝට්ස්ඩිතින්. ඒක ධීවර වරායක් තිබෙන කුඩා නගරයක්. මායි මෙහෙවිය ආහාර ඇණවුම් කරන්නේ මේ නගරයෙන්. සමහර වෙලාවලට මේ බඩු ප්‍රවාහණය කරන සේවකයන් විදියට, ඩිරූරිගේ පොලිස්කාරයන් මේ ගෙදරට ඇවිත් තියෙනවා. නමුත් ඔවුන් මේ කියන විදියේ අමුත්තෙකු හෝ අමුත්තන් දැක නැහැ. ඩිරූරි තවත් පැත්තක් වෙත ඔහුගේ අවධානය යොමු කළා. වෙළඳුන් විදියට රහස් පණිවුඩ හෝ ලිපි අරගෙන යන එන අය කවුරුන් හෝ ඉන්නවද? ඒ ගැන ඩිරූරි විමසිලිමත් ඉඳල තියෙනවා. ඒ ආකාරයට ලියුම් කැබලි හෝ පණිවුඩ හුවමාරුවක් නැහැ. ගෙදරට මාළු හා සමහර එළවළු ගෙන එන්නෙත් කෝන්වෝල් වල ගැමියන්. ඔවුන් දුප්පත් වුණත්, හුගක් වුණත් හොඳ දේශප්‍රේමී මිනිස්සු. ඔවුන් ජර්මන් ඔත්තුකාරයින් හැටියට කටයුතු කරාවි කියල මං හිතන්නේ නැහැ. පරීක්ෂා කිරීමෙන් දකින්න ලැබුණෙත් ඒකමයි.

මෙතැන තිබෙන දෙවැනි පුදුමාකාර දේය මේකයි. ඒ, "මාගරීටා" නම් ධීවර බෝට්ටුවක්. කැලිස්ටර් ගැන සෝදිසියෙන් ඉඳීම අපි පටන්ගත්ත දා. ඊට පස්සේ මේ බෝට්ටුවත් ඩිරූරිට වරින්වර දකින්න ලැබිල තියෙනවා. මේක නැංගුරම් දාගෙන ඉන්නේ, පෙන්හිඩි ප්‍රදීපාගාරයට ළඟින් මුහුදේ. ළඟින් කියල මං කියන්නේ, යාර





දෙසීයකටත් අඩු දුරකින් තිබෙන කුඩා දූපතක් අසල. හැබැයි සෑම සතිඅන්තයකම ඔවුන් එතැන ඉන්න බවත් දකින්න ලැබිල නෑ. ඔවුන් මෙම ස්ථානයට පැමිණීම අක්‍රමවත්ලු. ඩිරූරිගේ මිනිස්සු "මාගරීටා" බෝට්ටුවේ කටයුතු ගැන හොඳ අවධානයකින් ඉඳල තියෙනවා. ඔවුන්ගේ වැඩකටයුතු, රෑ දවල් දෙකේම ප්‍රබල දුරේක්ෂයකින් සෝදිසි කරල තියෙනවා. ඇත්තටම නම් පෙනිල තියෙන්නේ ඔවුන් අහිංසක ධීවරයන් ලෙසයි. බෝට්ටුවේ සේවකයන් කාලය ගතකරන්නේ ඇල්ලූ මාළු ගොඩවල් වලට වෙන් කරමින්, බෝට්ටුව සෝදා පිරිසිදු කරමින්, ඔවුන්ගේ මාළුදැල් හා අනෙක් ආම්පන්න අලුත්වැඩියා කරමින්. කැලිස්ටර් හා "මාගරීටා" අතර මොකක් හෝ සම්බන්ධයක් සොයාගන්න පුළුවන්ද කියල, ඩිරූරි උත්සාහ කරල බැලුවා. මේ දෙපක්ෂය අතර, මොනම විධියකවත් පණිවුඩ හුවමාරුවක් සිදුවෙන්නේ නෑ. මොන ආකාරයක වත් සංඥා නැහැ. ආලෝක සංඥා නැහැ. ඔවුන් රාත්‍රී කාලයේ හමුවන්නෙත් නෑ."

"ඒ වුණත් මයික්‍රොෆ්ට් ඔබ හිතන්නේ, කැලිස්ටර් තමන්ගේ ජර්මන් මිත්‍රයාට පණිවුඩ යවන්නේ මේ බෝට්ටුවේ උපකාරයෙන් කියල. එහෙම නේද?" ෂර්ලොක් හෝම්ස් ඇහුවේය.

"මට ඒක හොඳටම විශ්වාසයි. "මාගරීටා" බෝට්ටුව ඔතැන රැඳී සිටින එක පවා ඉතාම සැකසහිතයි." මයික්‍රොෆ්ට් කීය.

"ඇයි ඉතින් ඔබට බැරි, මොකක් හරි හේතුවක් දක්වලා, ඒක සෝදිසි කර බලන්න?" ෂර්ලොක් ඇසීය.

"මේක ඕලන්දයේ ලියාපදිංචි කළ බෝට්ටුවක්" මයික්‍රොෆ්ට් කීය. "කැලිස්ටර් ඇත්තෙන්ම අපරාධකාරී වැඩකට සම්බන්ධද කියලා, මුලින් අපි සහතික ලෙසම දැනගත යුතුයි. ඊට පස්සේ අපට පුළුවනි බෝට්ටුව සෝදිසි කරල බලන්න. ඒ වුණත් මගේ හිතේ තියෙන සැකය සාධාරණ බව, ඔබට තේරුම් ගන්න පුළුවන් නේද ෂර්ලොක්? අපි හිතමු මොනවා හරි රහසිගත ලියවිලි, කැලිස්ටර් මේ බෝට්ටුව වෙත ලබාදෙනව කියල. එතකොට බෝට්ටුවේ අයට පුළුවනි, ඔවුන් ආපහු ඕලන්දයට ගිය වහාම, ඒ ලියවිලි ජර්මනියට යවන්න."

"මට මෙන්න මේ කාරණය පැහැදිලිවම කියන්න මයික්‍රොෆ්ට්" හෝම්ස් කීය. "ඔබ කියන තැන බෝට්ටුව නැංගුරම් දමල තියෙන වෙලාවට, කැලිස්ටර් මොකක්ද කරන්නේ?"

"ඔව්. ඔබ ඒක ඇහු එක හොඳයි" මයික්‍රොෆ්ට් පිළිතුරු දුන්නේය. "බෝට්ටුව තිබුණත් නැතත් කැලිස්ටර් දවස ගතකරන්නේ එකම ආකාරයකටයි. මං ඒක ඔබට කියන්නම්.

"ෆර්ස්" නිවසෙන් උදේම පිටත්වෙලා මුහුදු වෙරළට එන ඔහු, ඔරුවක් පැදගෙන ප්‍රදීපාගාරය වෙත යනවා. ඔහු ගෙනියන්නේ, ඔහුගේ කෑම ද්‍රව්‍ය අඩංගු තරමක වේවැල් කූඩයක් පමණයි. එය රැගෙන ප්‍රදීපාගාරයට ඇතුළුවෙන ඔහු, දවස ගතකරන්නේ ඒක ඇතුළේ. සැකයක් නෑ ඔහු තමන්ගේ පර්යේෂණ කරනවා ඇති. හැන්දෑවට ඔහු ඒකෙන් එළියට එනවා. අතේ තියෙනවා මං කියූ අර වේවැල් කූඩය. ඔහු ඒකේ තියෙන ඉතිරි කෑම මුහුදු ලිහිණියන්ට දමනවා. ඊළඟට ඔහු යනවා තමන් සවිකරල තියෙන බිලිපිති ගැන බලන්න. ඒවලට අසුවෙලා ඉන්න මාළුන් අරගෙන, ඔහු ගෙදර යන්න පිටත්වෙනවා. තමන්ගේ ඔරුවට නැගලා, ඒක පැදගෙන මුහුදෙන්ම "ෆර්ස්" කිට්ටුව, ඔහුගේ තොටුපොළ වෙත යනවා. මේ දින චර්යාව, හැම සති අන්තයකම සිදුවෙන්නේ මේ පිළිවෙළටමයි. කිසිම වෙනසක් නෑ."

හෝම්ස්ගේ මුහුණෙන් ප්‍රකාශ වුයේ, ඔහුගේ උනන්දුව තවත් වැඩිවූ බවකි.

"බිලිපිති?" මගේ මිත්‍රයා විමසුවේය.

"ඔව්," මයික්‍රොෆ්ට් කීය. "ප්‍රදීපාගාරය ඉදිකරල තියෙන ගල් පර්වතය අවට විශාල ගල්කැබලි සහිත තැනක්. ඒවට හිරකළ බිලිපිති දෙකක් ඔහු අටවලයි තියෙන්නෙ. ඔහු උදේට ආවම ඒ දෙකේ බිලිකොකු වලට ඔහු ඇමක් බැගින් අමුණනවා. ඊළඟට හැන්දෑවට ආපහු යන්න පෙර ඒවා පරීක්ෂා කරල බලල, මාළු අසුවෙලා ඉන්නවා නම්, උන් තමන්ගේ කූඩයට දමාගෙන ගෙදර අරගෙන යනවා. එච්චරයි. මං විශ්වාස කරනවා, ඒ ගෙනියන මාළු රෑට උයාගෙන කනවා ඇති. ෂර්ලොක් ඔබට හිතෙන්නේ ඒ බිලිපිති දැමීමේ යම් වැදගත්කමක් තියෙනවා කියලද?"

"ඔව්. මේ වගේ අසාමාන්‍ය සිදුවීමකදී, මිනෑම සුළු කරුණක් පවා වැදගත් වෙන්න පුළුවනි. කැලිස්ටර් ගැන ඔබට කියන්න තියෙන අනෙක් තොරතුරු මොනවා ද?"

"තවත් බොහොම ස්වල්පයයි" මයික්‍රොෆ්ට් කීය. "මං ඔබට කලිනුත් කිව්වා වගේ, ඒ මිනිහාගේ හැසිරීමේ කොහොමටත්





තියෙන්නේ හරිම අසාමාන්‍ය බවක්. ඔහු අනෙක් හැමදෙනාගේම ආශ්‍රයෙන් වෙන්වෙලා, තනියම ජීවිතය ගතකරන කෙනෙක්. ඒ වුණත් පහුගිය ගිම්හාන සෘතුවේදී, ඔහුගේ හැසිරීම් රටාවේ වෙනසක් ඇතිවුණා. ඔහු තමන් රැකියාව කරන පුලිච් හි පර්යේෂණාගාරයෙන් මාසයක නිවාඩුවක් ඉල්ලුවා. ඔහුට ඒක ලැබුණා. ඊට පස්සේ ඔහු ගියේ ප්‍රංශයට. කැලිස්ටර් ගැන මං තොරතුරු හොයද්දී, ජෙෆ්රිස් මට මෙන්න මේ කරුණත් කිව්වා.

ජෙෆ්රිස්ට ඉන්නවා කුඩා දියණියක්. ඇය විනෝදාංශය ලෙස පින්තූර තැපැල්පත් එකතු කරනවා. ප්‍රංශයට ගිය කැලිස්ටර්, ඔහු ගිය හැම නගරයකින්ම, අර දැරිය වෙත පින්තූර තැපැල්පත් එවා තියෙනවා. මං ඒ නගරවල නම් ලියාගත්තා. ෂර්ලොක් ඔබට උවමනා නම්, මට පුළුවනි කැලිස්ටර්ගේ [illegible] අදාළව සහ වෙනත් විදියට එවන්න."

"කරුණාකර ඒක එවන්න මයික්‍රොෆ්ට්. එකම පිළිවෙළකට, එකම රටාවකට ජීවිතය ගතකරන කෙනෙක්, හදිසියේම ඒක වෙනසක් කළාම........"

"......... ඔව්, ඒක සැකයට කරුණක්" මයික්‍රොෆ්ට් එකඟ විය. "එහෙනම් ෂර්ලොක් මට හිතාගන්න තියෙන්නේ, මේ ප්‍රදීපාගාරයේ අභිරහස විසඳීම, ඔබ භාරගන්න කැමැති බව. එහෙම නේද? ඊයේ මට වාර්තාවක් ලැබුණා, "මාගරීටා" යාත්‍රාව ගැන. අපේ ඔත්තුකරුවන් නිරීක්ෂණය කරල තිබුණා, ඒ බෝට්ටුව අයර්ලන්තයට සමීප මුහුදේ මාළු අල්ලන බව. ඒ කියන්නේ සිකුරාද වෙද්දී, ඔවුන් ආයෙමත්, පෙන්හිච් බොක්කට ඇවිත් නැංගුරම් දමාවි. ඔබ දන්නව නේ ෂර්ලොක්. ඕව ගැන හොයා බලන්න යන්න තරම්, මට විවේකයක් නෑ. ඊටත් වඩා කඳු නගිමින්......., එල්ලම් බහිමින්, මුහුදු වෙරළෙයි, ගල් උඩයි ඇවිදින්න වෙන එක, ඊට අමතරව විදේශ වෙළඳ දූත කණ්ඩායමක් ඇවිත් ඉන්නවා. ඔවුන් සමඟ සාකච්ඡාවකට යන්නත් මට සිදුවෙලා තියෙනවා...."

"නෑ නෑ. ප්‍රශ්නයක් නෑ" මගේ මිත්‍රයා කීය. "මේ අභියෝගය මං භාරගන්නවා. මෙතෙන තියෙනවා යම් යම් සුවිශේෂ ලක්ෂණ. ඒවා මීට කලින් මගේ කිසිම පරීක්ෂණයකදී මට හමුවෙලා නෑ. ඔබේ ආරාධනය මගේ හිතවත් දොස්තර වොට්සන්ටත් එක්ක නේද?"

"ඇත්තෙන්ම ඔව්" මයික්‍රොෆ්ට් කීය. "ඔය දෙන්නව දෙපැත්තට කරන්න පුළුවන් හපනෙක් ඉන්නවද? ඔබ මේ පරීක්ෂණය භාරගන්නා



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

බව මං දැනගිට්යා, ඒ නිසාම අවශ්‍ය සියලු සුම්ගර දේවල් මං සූදානම් කරල තැබුවා.

මෙන්න තියෙනවා දුම්රිය ප්‍රවේශ පත්‍ර දෙකක්; කෝන්වෝල් බලා යෑමට හා ආපසු ඒමට, පළමුවැනි පංතියේ ප්‍රවේශ පත්‍ර. සිකුරාද උදේ පැඩිංටන් වලින් පිටත්වෙන දුම්රියෙන් යන්න. එතකොට ඔබට කැලිස්ටර් මගහරින්න පුළුවනි. ඔහු යන්නේ හවස දුම්රියේ. පොලිස් පරීක්ෂක ඩිරුරි, ඔබ හමුවෙන්න, පෙන්සාන්ස් දුම්රියපොළට ඒවි. ඊළඟට ඔහු ඔබව කැඳවාගෙන යාවී, කෝන්වෝල්හි ඔහුගේ රහසිගත මූලස්ථානයට. ඒ, කලකට පෙර වෙරළාරක්ෂක සේවයේ අය සතුව තිබූ පැරණි නිවසක්. ගමන්බඩු හුඟක් අරගෙන යන්න උවමනා නැ. ඒත් ඔබේ "දෙනෙතිය" අරගෙන යන්න අමතක කරන්න එපා. ඒක ඔබට අත්‍යවශ්‍ය වේවි.

ෂර්ලොක්. ඔබට මොනවා හරි ප්‍රශ්න තියෙනවා නම් දුරකතනයෙන් මාව අමතන්න. ඔබ යන තැනට මඳක් ඈතින් තමයි, සෙන්ට් ඔබන් පොලීසිය තියෙන්නේ. දුරස්ථ දුරකතන ඇමතුම් එතැනින් ගතහැකි. ඔබ කරන ඕනෑම කටයුත්තක් සඳහා රජයේ අනුමැතිය තියෙනවා. ඒ වුණත් මං ඔබට කල්තියා කියන්න කැමතියි; කැලිස්ටර් අල්ලා ගනිද්දී, ඔහුව උසාවියකට ඉදිරිපත්කිරීමට සාක්ෂි සහිතව ඔහුව අල්ලාගන්න. අපරාධය කරද්දීම ඔහුව අල්ලාගැනීම තමයි, ඉතාම හොඳ පිළිවෙළ. අප අතින් මොකක් හරි වැරැද්දක් සිද්ධුණොත් ඒක අල්ලාගන්න විපක්ෂයේ මන්ත්‍රීවරු බලාගෙනයි ඉන්නෙ. ඒකට ඉදිරියෙන්ම ඉන්නෙ නියුගේ කැලිස්ටර්. නිරායුධකරණය ගැන නොනවත්වාම දොඩවන නියුගේ කැලිස්ටර්ට, මේක හොඳ අවස්ථාවක් වේවි. ඊළඟට සාමක්‍රියාවලියක් ගැන නත් දොඩවන විපක්ෂ නායකතුමා, ඊළඟට කොයිවෙලෙත් අගමැතිතුමාට මඩගහන්න හදන විපක්ෂ මන්ත්‍රී දෙස්හර් රොජර් බැට්ල්ජේම්. ආණ්ඩුව අප්‍රසාදයට පත්කරලා, ආණ්ඩුව පෙරලා දමන්න ඔවුන් මේක හොඳ අවස්ථාවක් කරගනීවි. අගමැතිතුමා මේ ගැන හුඟක් වෙලා මා එක්ක කතාකළා. මේකෙ වැදගත්කම ඔබට අවධාරණය කරන්න කියලා එතුමා කිව්වා."

"මට තේරෙනවා," හෝම්ස් කීය. "වොට්සනුයි මායි පිටවී යන්න කලින් ඔබෙන් ඇසිය යුතු තවත් එක් ප්‍රශ්නයක් තියෙනවා. ඔහු ගැන ආරක්ෂක අංශ සෝදිසියෙන් ඉන්නා බව මොරිස් කැලිස්ටර් දන්නව ද?"





"බොහොම වෙලාවට දන්නවා ඇති" මයික්‍රොෆ්ට් කීය. "ඔහු බොහොම බුද්ධිමත් කෙනෙක්. කොහොම වුණත් අපේ ඒ කටයුතු තමන්ට තේරී ඇති බවක් ඔහු පෙන්වන්නේ නැහැ. මෙහෙම තත්ත්වයක් වෙන්නත් පුළුවනි. ඔහු ජර්මනිය වෙත රහස් යැවීමට යොදන්නේ අතිදක්ෂ උපක්‍රමයක් කියල හිතමු. ඒ නිසා අපට ඒක කවදාවත් හොයාගන්න බැරිවේවි කියා ඔහු හිතනවා ඇති"

"කැලිස්ටර් සතු තීක්ෂණ බුද්ධිය නිසා, ඔහු මට හොඳ ප්‍රතිවාදියෙක් වේවි" හෝම්ස් කීය. "ඔහු ගැන කිවහැකි තොරතුරු වෙන මොකක්වත් ම නැද්ද?"

"එක් කාලයක් විනෝදාංශයක් හැටියට ඔහුගේ උනන්දුවක් තිබිල තියෙනවා සර්කස්වලට" මයික්‍රොෆ්ට් කීය. "තමුන් පුළිම පර්යේෂණාගාරයේ රැකියාවට බැඳුණට පස්සේ අර උනන්දුව අත්හැරිලා. ඔහුගේ ලිපිගොනුව අද හැන්දෑවෙ මං ඔබ වෙතට එවනවා. විනෝදාංශ ගැනත් ඒකෙ සඳහන්. කියවල බලන්න"

අපි මයික්‍රොෆ්ට්ගෙන් සමුගෙන ඩයොජිනීස් සමාජයෙන් පිටත්වී ආවෙමු.

කැලිස්ටර්ගේ ලිපිගොනුව, බේකර් වීදියේ නිවහන වෙත ලැබෙද්දී මම එහි නොසිටියෙමි. ඩයොජිනීස් සමාජශාලාවේ සිට ආපසු එද්දී අපි දෙපැත්තට බෙදී වෙන්වී ගියෙමු. එබැවින් කැලිස්ටර් ගැන හෝ කෝන්වෝල් වෙත යන ගමන ගැන වැඩිදුර කතාබහකට අපට ඉඩක් නොලැබිණ. මගේ මිත්‍රයා මට යළිත් දකින්නට ලැබුණේ, සිකුරාද පැඩිංටන් දුම්රියපොළේදීය. ඒ පෙන්සාන්ස් බලායන සීඝ්‍රගාමී දුම්රිය අල්ලාගැනීමට හිමිදිරි උදයේම පැමිණි විටයි.

කැලිස්ටර් පිළිබඳ ලිපිගොනුව හෝම්ස් ගෙනැවිත් නොතිබුණත්, එහි සඳහන් කරුණු ඉතා හොඳින් ඔහුගේ මතකයේ තිබිණි. දුම්රියට නැගී, එහි පළමු වන පන්තියේ මැදිරියක හිඳගත් වහාම, ඔහු මගෙන් ප්‍රශ්න කිහිපයක් ඇසුවේය. "වොට්සන්, සර්කස් කියන වචනය ඇහුවාම ඔබට මොනවද මතක් වෙන්නෙ?"

"කෝලම්කාරයෝ, එක් මංචිල්ලාවක් පැදගෙන ගිහින් තවත් එකකට පනින කරණම් ශිල්පීන්...."

"අහා!" කී ඔහු නළල රැළි කරගෙන යමක් කල්පනා කළේය.

"එතකොට වොඩ්ඩන් වැරෙව්රිනෝ, ක්ලෙයාකෝට්, මොන්සෙරි?"



Reading Purpose Only. Not For Print

"ඒවා නම් මොනවාද කියල මම දන්නෙනු නැහැ. මට හිතෙන්නේ ප්‍රංශ භාෂාවේ වචන කියලයි?"

"හරියට හරි මිත්‍රයා" හෝම්ස් කීය. "පහුගිය ගිම්හාන සෘතුවේ කැලිස්ටර් ප්‍රංශයට ගිය වෙලාවේ. කුඩා නගර කිහිපයකට ගිහින් තියෙනවා. මං කියුවේ ඒ නගරවල නම්. ඒක පුදුමාකාර හෝරාගැනීමක්. එහෙම නේද?

ඊළඟට මම බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ පුස්තකාලයේ දින දෙකක්ම ගතකළා. මොනවා කියවීමටද? සර් ඩග්ලස් කැලිස්ටර් විසින් ලියා ඇති පොත්පත් කියවීමට. මෙයාලා ඉතාම පුදුමාකාර පවුලක්. එකිනෙකට බොහොම වෙනස් විෂයයන් තමයි, ඔවුන්ගේ සිත් ඇදගන්න සම්බන්ධවෙලා තියෙන්නේ. ජපානයේ නෝ නාට්‍ය කලාව, නිරායුධකරණය, මිං යුගයේ චීනයේ කලාත්මක පිඟන් නිෂ්පාදනය, සබ්මැරීන, බලන්න වොට්සන්. බුද්ධිමතුන්ගේ හිතේ ඇතිවන කුතුහලයද පුදුමාකාරයි. හරිම පුදුමාකාරයි. ඒ බුද්ධිමතුන් අපේ සිත්වල ඇතිකරන්නේත් පුදුමාකාර කුතුහලයක්"

එසේ කිවූ මගේ මිත්‍රයා, ඔහු ළඟ තිබූ කුඩා මල්ල විවෘතකොට, පොතක් එළියට ගත්තේය. ඔහු එහි පිටකවරය මට පෙන්විය.

### වෙරළාසන්නව හා කළපුවල වෙසෙන බ්‍රිතාන්‍යයේ පක්ෂි පරපුර

"ඉතින් වොට්සන් දැන් මං හදන්නේ අපේ හිතේ ඇතිවී තිබෙන කුතුහලය සංසිඳවාගන්නයි."

"මොකද ඔබට කුරුල්ලන් ගැන හදාරන්න හිතුණේ?" මම ඇසීමි.

"අපට ටිකදවසක් ගත කරන්න සිදුවෙන්නේ කෝන්වෝල් මුහුදුවෙරළ අසබඩ නේ. ඉතින් මට හිතුණා, මෙම කුරුල්ලන් ගැන හදාරන්න මේක සුදුසු අවස්ථාව කියලා"

එක දිගට කියවීමේ යෙදුණු ඔහු වරින්වර එය නවත්වා, පොතේ අඩංගු කරුණු මට පැවසුවේය. උදෑසන පුවත්පත් කියවමින්, හෝම්ස්ගේ සාකච්ඡාවලට සවන්දෙමින් සිටි මට, කාලය ගෙවියනු නොදැනිණ. අන්තිමේදී අපි පෙන්සාන්ස් වෙත ළඟාවූයෙමු.



Reading Purpose Only, Not For Print

www.sinhalaelibrary.com



පොලිස් පරීක්ෂක ඩිරූට් අප පිළිගැනීමට දුම්රියපොළ වෙත පැමිණසිටියේය. මීට කලින් පරීක්ෂණයකදී ඔහු හඳුනාගත් නිසා අප අතර හිතෛෂී බවක් ඇතිවී තිබිණි.

රතු මුහුණක් තිබූ, උස, තරබාරු පුද්ගලයෙකු වූ ඔහු, පරණ ට්විඩ් ඇඳුම් කට්ටලයකින් සැරසී සිටියේය. දුම්රියපොළ අසල නවත්වා තිබූ මෝටර් රියක් වෙත, ඔහු අප කැඳවාගෙන ගියේය. අර්ධද්වීපය හරහා අපි උතුරු වෙරළ දිසාවට ගමන් කළෙමු. මඟ දිගටම අපට දකින්නට ලැබුණේ ගම්බද මනරම් දසුන්ය. සෙන්ට් ඉවාන් ගම්මානය පසුකොට සැතපුම් කාලක් ගමන්කළ පසු, අපි ගම්මානයට ළඟාවී සිටියෙමු.

"මහත්වරුනි" ඩිරූට් අප ඇමතුවේය. "ගමෙහි ඉතිරි කොටස අපට යන්න වෙන්නේ පයින්. මේ පටුපාර තාන්ද වගේ ගිහිං කෙළවර වෙන්නේ පෙනහිඩිවලින්. පාරේ අන්තිම හරිය වැටී තියෙන්නේ කැලිස්ටර්ගේ ගේ අසලින්මයි. තවත් හැතැක්ම තුනක් විතර ඉදිරියට ගියොත් පෝට්ස්විකින් නම් කුඩා ධීවර ගම්මානය"

මුලින් අපට ගමන්කිරීමට තිබුණේ කන්දේ ඉහළට වැටුණු, ගල්බොරලු සහිත රළු මාවතකය. එය සිරුරට බොහෝ වෙහෙසක් දැනුණු ගමනක් විය. ඉන්පසු පාර වඩාත් ඇඹුම් සහිත විය. පාර දෙපස වැවී තිබුණු තණකොළ පඳුරු, අප වැසී යන තරම් ඉහළට වැවී තිබිණි. අපි මහා සාගරය ද ඇතින් දුටුවෙමු.

අපට නවාතැන් ගැනීමට තිබූ නිවස වෙත අපි ළඟාවූයෙමු. බොහෝ කලකට පෙර වෙරළාරක්ෂක නිලධරයෙකුගේ නිවසක් වූ එහි තිබුණේ අබලන් පෙනුමකි. ගල්ලැලිවලින් සෙවිලි කළ වහලේ පැත්තක් කඩාවැටී තිබිණි. මෙය බැලූ බැල්මටම වාසයට නුසුදුසු තැනක් සේ දිස්විය. කිසිවෙකුට නොපෙනී ගෙට ඇතුළුවීම සඳහා, අපි නිවසේ පිටුපසට ගොස්, එහි දොරෙන් ඇතුළුවූයෙමු. කලකට ඉහත මුරතැන්ගෙය ලෙස භාවිත කළ එම කොටසේ, ලෝහ උපකරණ මලබැඳී විනාශවී ගොස් ය. ඩිරූට් අප කැඳවාගෙන ගියේ නිවසේ ඉදිරිපසටයි. මෙය මිනිස් වාසයට සුදුසු ලෙස සකස්කරගෙන තිබිණි. එහි සිටි තවත් පොලිස් නිලධරයෙකු වූ සාජන්ට් සෙට් අපට හඳුන්වා දෙන ලදී. මැදිවයසේ සිටි ඔහුගේ මුහුණේ ලොකු උඩුරැවුලක් විය. එදා රාත්‍රී මුර සේවාව භාරවී තිබුණේ ඔහුට ය.

හඳුන්වාදීම අවසන් වූ පසු අප සඳහා වෙන් වූ කාමර පෙන්වා දෙන ලදී. අඩුම වශයෙන් දින දෙකක්වත් මේ ස්ථානයේ ලැගුම්



Reading Purpose Only, Not For Print

ගැනීමට අපට සිදුවෙනු ඇත. සියලුම ජනෙල්වල වීදුරු ආවරණය වන සේ, තද පැහැති රෙදි, ජනෙල් රාමුවට තබා ඇන ගසා තිබිණි. එබැවින් දහවල් කාලය තුළ වුවද කාමරවල තිබුණේ අන්ධකාර බවකි. සීලිමේ එල්ලා තිබූ ලන්තෑරුම් දෙකකින් අඳුර මඳක් අඩුවිය. පාවිච්චියෙන් පසු හකුලා ඉවතින් තැබිය හැකි කඳවුරු ඇඳන් (බුරු ඇඳන්) කීපයක් බිත්තියකට හේත්තුකොට තිබූ අතර, මේසයක් හා පුටු කිහිපයක් කාමරය මැද විය.

තවාතැනේ තිබූ පහසුකම් අවම වුවද, විරූප් සිටියේ තෘප්තිමත් ස්වභාවයකිනි. භූමිතෙල් ලිපක්, සාස්පාන්, කෑම ගබඩා කරගැනීම සඳහා ලෝහ පෙට්ටි කිහිපයක් ආදිය මිළඟ කාමරයේ ගොඩගසා තිබිණි. ඒ මුළුතැන්ගෙය ලෙස මුලින් යොදාගත් කාමරයයි. ගැල්වනයිස් බාල්දියේ පිරවූ වතුර ඉවුම් පිහුම් හා පිඟන් සේදීම සඳහා ය. එළියේ තිබූ නළ ළිඳ තවම ක්‍රියාත්මක නිසා, බීමට උවමනා තරම් පිරිසිදු ජලය ලැබෙන බව විරූප් කීය. නිර්සේ මහළුවර නානකාමරයක් විය.

"හෝම්ස් මහත්මයා" විරූප් කීවේ සංග්‍රහයකින් අනතුරුවය. "ඔබ කැමැති වේවි අපේ 'මුරකුටිය' බලන්න. තුන්දෙ එක් අයිනක මුහුදු පැත්තට නෙරා ගිය ගල්කුළක් තියෙනවා. එවට තියෙන ගස් නිසා, ඒක හොඳින් ආවරණය වෙලා. ඒක තමයි අපි ඔත්තු බලන මුරකුටිය. අපේ තුන්වැනි සාමාජිකයා මේ මොහොතෙ ඇත්තෙ එතැන. යමු බලන්න"

අප එහි කැඳවාගෙන ගිය විරූප්, අපට සාජන්ට් මැක්ග්‍රෙගර් හඳුන්වා දුන්නේය. ලාබාල තරුණයකු වූ ඔහු, තම රාජකාරිය සඳහා බෙහෙවින් උනන්දුවන්නෙකු බැව් අපි දුටුවෙමු.

"බොහොම සැපපහසු කුටියක්, එහෙම නේද හෝම්ස් මහත්මයා?" කී විරූප් අපට මුහුදු වෙරළ නිරීක්ෂණය කළ හැකි තැන පෙන්විය. "මේ පඳුරු අස්සෙන් බලන්න. තැනින් ඉදිරියට යන්න එපා. තවත් පියවර කීපයක් ඉදිරියෙන් ගම් හා වෙටම අවසන්. එතැනින් එහාට තියෙන්නෙ භයානක ප්‍රපාතයක් බව අමතක කරන්න එපා. ප්‍රපාතය පහළ තියෙන්නේ පටු මුහුදු වෙරළක්. වැඩි හරියක් තියෙන්නේ ගල් පර්වත. ඔබට පෙනෙනවා ඇති, මුහුදුරළ වේගයෙන් ගසාගෙන ඇවිත්, ගල්වල හැපිලා පෙණපිඬු විසිරී යන හැටි."

ඔහු පැවසූ අයුරින්ම එය සුන්දර අලංකාර දර්ශනයක් විය. අපට දකින්නට ලැබුණේ අඩසඳක හැඩය ගත් මුහුදු බොක්කකි. එහි පළල





සැතපුම් භාගයකට අඩුවිය. වෙරළ අයිනෙ දිගටම දකින්නට ලැබුණේ උස්ව පිහිටි ගල්පර්වත පෙළකි.

"මේ කෝන්වෝල් වෙරළ දිගටම මේ විදියට ගල්පර්වත පිහිලා" විරූප් කීය. "මං හිතන්නේ ඒක ඔබට අමුතුවෙන් කියන්න උවමනා නෑ. මුහුදු බොක්ක මැදින් පස් හා ගල්කුළු වලින් හැදුණු ගොඩබිම තීරයක් මුහුද මැදට දික්වෙලා තියෙනවා. අර බලන්න, දැක්කද? ඒක හරියට යෝධයෙකුගේ නැත්නම් යක්ෂයෙකුගේ අතක් වගේ. ඒ තමයි පෙන්හිඩි තුඩුව. මේ අතේ තියෙන්නේ ඇඟිලි පහක් නොවෙයි; ඇඟිලි දෙකයි. එවත් උඩට නැඹුණු ඇඟිලි දෙකක් වගේ යෝධ ගල්කුළු දෙකක්. හෝම්ස් මහත්මයා, ඔබේ "දෙනෙතිය" අරගෙන බලන්න. ඒ ගල්කුළු දෙකෙන් එකක් වඩාත් විශාලයි. ඒක උඩ තමා පෙන්හිඩි ප්‍රදීපාගාරය ඉදිකරලා තියෙන්නේ. පෙනෙනවද?"

ගල්පර්වතය මත වූ ප්‍රදීපාගාරය, අපට පැහැදිලිවම දැකගත හැකිවිය. මුහුදු බොක්කට ඈතින් වන තැන එය තිබුණේ, සුදු පැහැති ආරක්ෂක භටයකු විලසිනි.

එහා සාගරයේ යාත්‍රා කළ නෞකා, මුහුදු බොක්කට ගමන් කිරීම වැළැක්වීම, මේ ප්‍රදීපාගාරය ඉදිකිරීමේ අරමුණ වන්නට ඇත. කොත් කැරලි වැනි උල් තුඩු සහිත ගල් පර්වත රාශියක්, මුහුදු බොක්ක පුරා විසිරී තිබිණි. අන්ධකාර රාත්‍රියට මේවා පැහැදිලිව දකින්නට නොලැබෙන නිසා, එහි පැමිණෙන නෞකා, ගල්පර වල ගැටී විනාශවීම පුදුමයක් නොවේ.

අප සිටි තැනත් පෙන්හිඩි තුඩුවත් අතර, කුඩා දූපතක් ද අපට දැකගන්නට ලැබිණි. එහි වර්ගප්‍රමාණය, වර්ගයාර් තිහ හතළිහකට වැඩිවිය නොහැකි විය. ගල්කැබලි නිසා මුහුදෙන් ඉහළට මතුවී පෙනුණු මෙය, සම්පූර්ණයෙන්ම වැසී තිබුණේ නොයෙක් වර්ගවල මුහුදු පක්ෂීන්ගෙනි. උන් සමහරක් දූපත අසල මුහුදේ පිහිනමින් සිටි අතර, තවත් රැසක් ඒ ළඟින්ම අහසේ පියාඹූහ. නොයෙක් හැඩ හා වර්ණවල පක්ෂීන්ගේ චලනය නිසා, එම දූපතේ දක්නට ලැබුණේ ජීවයෙන් පිරුණු බවකි.

දූපත අසල රතු පැහැති බෝට්ටුවක් නවත්වා තිබූ බව, තවත් හොඳින් බලද්දී දැකිය හැකි විය. එහි නම "මාගරීටා" බව "දෙනෙතිය" ආධාරයෙන් දුටුවෙමු. බෝට්ටුව තුළ නාවිකයන් දෙදෙනෙකු සිටිනු පෙනිණ. ඉන් එක් අයෙකු සිටියේ, බෝට්ටුවේ එන්ජින් කාමරය



www.sinhalaelibrary.com

තුළය. අනෙකා බෝට්ටුවේ පිටුපස ඩිවුණු කොටසට වී විවේක ගනිමින් සිටියේය. සැන්දෑවේ ඉර බැසයද්දී ඇති සුන්දරත්වය නරඹමින් ඔහු පයිප්පයක් බොමින් සිටියේය.

බෝට්ටුව ඇතුළත සිටි තුන්වැන්නෙකු එළියට ආවේ අප බලාසිටියදී ම ය. මුලින්ම අතේ තිබූ බාල්දිය මුහුදට ඇළ කොට, බාල්දියේ තිබූ දෑ ඔහු මුහුදට හැළුවේය. මීළඟට එහි ගැට ගසා තිබූ කඹයෙන් අල්ලාගෙන බාල්දිය මුහුදට පහත්කොට වතුර පුරවාගෙන, යළි උඩට ගත් බාල්දිය බෝට්ටුව තුළට ගෙන ගියේ අපේ දර්ශන පථයෙන් ඉවත්වෙමිනි.

"මහත්වරුනි" ඩ්‍රූරි කීය. "පෙන්හිඩ් තුඩුවේ අර ගස් තියෙන පැත්තට දැන් ඔබේ "දෙනෙතිස්" යොමුකරන්න. අතුවලින් වැහිලා ඇති "ෆර්ස්" නිවස ඔන්න ඔබට පෙනෙනවා. ඔබට පෙනෙනවා ඇති ඒ ගෙදර ඉඳලා මුහුදු වෙරළට බැස එන්න සාදා ඇති ගල්පඩි පෙළක්. මේ තරප්පු පෙළ අවසන් වෙන්නේ, ලෑලි වලින් සෑදූ තාවකාලික ජැටියක් වැනි වේදිකාවක් ළඟින්. එහි එක් කණුවකට ඔරුවක් ගැටගසා ඇති හැටිත් ඔබ දකින්නට ඇති.

මුහුදේ අයින දිගේ තවත් ඈතට බලන්න, එවිට ඔබට පෙනේවි තවත් තුඩුවක්. ඒ තමයි පෝට්ස්විත් තුඩුව. අලුත් ප්‍රදීපාගාරය ඉදිකොට තිබෙන්නේ එතැන."

අඳුර වැටුණු නිසා අපි ආපසු නවාතැන වෙත පැමිණියෙමු. තම මුරසේවයෙහි දිගටම යෙදෙමින් මැක්ග්‍රෙගෝ එතැන නවතුරටත් රැඳී සිටියේය. නවාතැන වෙත අප පැමිණෙද්දී සාජන්ට් සෙට් රාත්‍රී කෑම පිළියෙල කර අවසන් කළේය. මීළඟට ඔහු ඉක්මනින් කෑම ගෙන නිවසෙන් පිටව යාමට සූදානම් විය. ඒ රාත්‍රී මුර සේවය සඳහා ගොස් සාජන්ට් මැක්ග්‍රෙගෝ මුදාහැරීම උදෙසාය.

"කැලිස්ටර් ලන්ඩන් වලින් පෙරළා ළඟාවෙන්නෙ අද රෑට." ඩ්‍රූරි කීය. "හෙට උදේ වෙනතුරු මොකක්වත් දෙයක් පටන් ගන්නෙ නෑ. ඔහුගේ දින චර්යාව හෙට උදේ ඉඳලම බලාගන්න හැකි."

* * *

පසුවද උදේ හය පහර වෙද්දී ඩ්‍රූරි අප අවදිකළේය. භූමිතෙල් ලිපමත තබාගත් සාස්පානක රතු සොසේජස් බදිමින් සිටියේ. බිත්තර හා බේකන් බැදීමෙන් අනතුරුව ය.





උදේ ආහාරය අවසන් කළ පසු, අපි නිවසෙන් එළියට බැස්සෙමු. හිරු දීප්තිමත්ව පායා තිබිණ. ජූලි මාසය නිසා අහසේ තිබුණේ වලාකුළු නොමැති පැහැදිලි බවකි. හිරුකිරණ මුහුද මතට වැටී, තැටපතකින් මෙන් යළිත් අපේ දෙනෙත් වෙත පරාවර්තනය විය. සෝදිසි "මුරකුටිය" වෙත අපි පිටත්වී ගියෙමු. එසේ යද්දී හිරු රශ්මියේ සැඩ බව නිසා, දෙනෙත් ආවරණය කරගැනීමට අපට සිදුවිය.

කලින්ද රාත්‍රියේ සැක කටයුතු කිසිවක් සිදුනොවූ බව සාජන්ට් සෙට් අපට සහතික කළේය. ඔහු එතැනින් පිටවී යද්දී අපි රාජකාරිය භාරගත්තෙමු. "මාගරීටා" ධීවර බෝට්ටුව, මා කලින් සඳහන් කළ කුඩා දූපත අසල නැංගුරම් දමා තිබිණ. එහෙත් බෝට්ටුවේ කිසිවෙකු නොසිටි බව අපි දුටුවෙමු. යමක් සිදුවීමේ පටන් ගැනුණේ උදෑසන අටට ළංවෙද්දී ය.

කැලිස්ටර්ගේ නිවස ලෙස අප හඳුනාගත් තැන වෙත අපේ නෙත් යොමුවිය. එහි පඩුරු අතරින් ආ පුද්ගලයෙක්, නිවසේ සිට මුහුද දෙසට තිබූ කඳුබෑවුම වෙත, ඉතා සෙමින් ගමන්කළ අයුරු අපි දුටුවෙමු. ඒ මොරිස් කැලිස්ටර් බව "දෙනෙතිය" ආධාරයෙන් හඳුනාගත හැකි විය. ඔහු ගල්පඩි මෙළෙ දිගේ පහළට බසින්නට පටන්ගත්තේය.

ඔහුට තිබුණේ කුඩා සිරුරකි. කොණ්ඩය කළු පැහැති විය. ඔහුගේ වයස අවුරුදු 35 කට අඩු වියයුතු යයි මම අනුමාන කළෙමි. මේ වෙලාවේ තිබූ දැඩි උණුසුම ගැන නොසලකා, ඔහු හැඳ සිටියේ ලිහිල් වැහිකබායකි. ඔහුගේ වම් උරහිස ආබාධිත නිසා, එය දකුණු උරහිසේ මට්ටමට වඩා ඉහළගොස් හිස දෙසට ඇල් වී තිබිණි. ඒ නිසාම ඔහු ගමන්කරද්දී, ගමනේ විකෘති බවක් ද විදු. ඔහු එක් අතක තරමක් ලොකු වේවැල් කූඩයක් රැගෙන ගියේය. විනෝද ගමන්වල යෙදෙන අය කෑමබීම රැගෙන යන තාලේ එකක් වූ මෙම කූඩය, තරමක් බර එකක් ලෙස සිතිය හැකිවිණි. තරප්පුව බැසීමට සූදානම් වූ කැලිස්ටර්, පහළට බැසීම පහසුවනු පිණිස පස් කණ්ඩියට සවිකර තිබූ අත්වැල අනෙක් අතෙන් අල්ලාගත්තේය.

ගල්තරප්පු පෙළේ පහළටම බැසගිය විද්‍යාඥයා, ලෑලි වලින් තනා තිබූ ජැටියට පිවිස, එතැනින් තම ඔරුවට නැගුණේය. මීළඟට එය බැඳ තිබූ කඹය ලිහා දමා හබල් ගසමින්, ඔහු ඔරුව පැදයන්නට

පටන්ගත්තේය. ඔහු යාත්‍රාකළේ ප්‍රදීපාගාරය දිශාවට බැව් අපි දුටුවෙමු.

යළිත් වරක් "දෙනෝනිය" මාගරීටා බෝට්ටුව වෙත එල්ල කළෙමි. එහෙත් එහි කිසිවෙකු සිටින බවක් නොපෙනිණ. කැලිස්ටර් තම අවධානය යන්තමින් වත් "මාගරීටා" දෙසට යොමු නොකළ බැව් මම තේරුම් ගතිමි.

ඔහු පැදගෙන ආ ඔරුව, ප්‍රදීපාගාරය පිහිටි ගල්පර්වතය වෙත ළඟාවිය. ඔහු එය මතට බොඩනැඟී, ඔරුවේ කෙළවරක් ගල්පර්වතයට බැඳ දැම්මේය. ඉන් පසු තම ආහාර අඩංගු කූඩය අතට ගෙන ප්‍රදීපාගාරයේ දොරටුව දෙසට ගමන් කළේය. මිළඟට කූඩය බිම තැබූ ඔහු, හිස පහතට නරවාගෙන වෙනත් යමක් පරීක්ෂා කිරීමට පටන්ගත්තේය. ඒ කුමක්ද යන්න මඳ වේලාවකදී අපට තේරුම් ගැනීමට හැකිවිණි. ඔහු එසේ අවධානය යොමුකළේ ගල් අතර හිරකර තැබූ බිලී පිති දෙක වෙතය.

මිළඟට ඔහු කරන්නේ කුමක්ද යන්න අපි ඉතා උනන්දුවෙන් බලා සිටියෙමු. බිලීපිත්තේ රෝලය කරකවමින් යොත් පොට ආපසු ඇදගත් කැලිස්ටර්, බිලීකොක්කේ ඇමක් සවිකර, එය යළිත් දියට දැම්මේය. දෙවැනි බිලීපිත්තට ද ඒ ආකාරයෙන්ම ක්‍රියාකොට, එතැනින් පිටත්වී ඔහු ගියේ, ප්‍රදීපාගාරයේ දොරටුව වෙතයි. සාක්කුවෙන් යතුරක් ගෙන දොර හැර ඔහු, දොරෙන් ඇතුළුවී අපට නොපෙනී ගියේය.

තම කබා සාක්කුවෙන් සාක්කු ඔරලෝසුවක් අතට ගත් ඩිරූරි එය පරීක්ෂා කළේය.

"මහත්වරුනි, ඔහු නිවසෙන් පිටත්වුණු වෙලාවෙ ඉඳල, ප්‍රදීපාගාරයට ඇවිත් නොපෙනී යන්න, මිනිත්තු 23 යි තත්පර 5 ක කාලයක් ගතවුණා. හැමදාමු මේ කටයුත්තට ඔහු ගතකරන්නේ එකම කාලයක් දැන් ඉතින් තවත් පැය 12 කට අපට ඔහුව දකින්න ලැබෙන්නේ නෑ"

ඩිරූරි පැවසූ දෙය නිවැරදි විය. කැලිස්ටර්ගේ ලකුණක් වත් අපට දැකගන්නට නොලැබිණ. එහෙත් "මාගරීටා" බෝට්ටුවේ යම් යම් කටයුතු සිදුවෙන බව අපි දුටුවෙමු. එහි පිටිපස තිබූ තට්ටුව වෙත පැමිණි බෝට්ටුවේ අය, මාළු තෝරමින් පිරිසිදු කිරීමට පටන් ගත්හ. මාළු කැබලි වලට කපද්දී ඉතිරි වූ රොඩු හා අනවශ්‍ය මාළු, බාල්දියකින් ගෙනැවිත් මුහුදට හැලීම සිදු කෙරිණ. ඉවත දැමූ මාළු





රොඩු ගිල දමන ලද්දේ, දූපත වටා එක්රොක් වී සිටි මුහුදු පක්ෂීන් විසිනි. කාර්ය මණ්ඩලය විසින් ඔවුන්ගේ බෝට්ටුව හොඳින් සෝදා පිරිසිදු කළ අතර, ඔවුන්ගේ ධීවර ආම්පන්න අලුත්වැඩියාව ද නිරතුරුවම සිදුවිය. මයික්‍රොෆෝන් පැවසූ අයුරින්, කැලිස්ටර්ගේ ක්‍රියාකලාපයේ කිසිදු අපරාධකාරී, සැකකටයුතු හැසිරීමක් දක්නට නොලැබිණ.

මුරකපොල්ලට වී පැය ගණනක් ගතකිරීම අපහසු කටයුත්තක් විය. එක් ආකාරයකටම දෙපා නමාගෙන සිටීම නිසා, ඇතිවූ හිරිවැටීම වලින් බේරීමට, පැය කිහිපයකට වරක් කෙටිදුරක් ඇවිදීමට අපට සිදුවිණි. හෝම්ස් තම කාලය සම්පූර්ණයෙන්ම පාහේ ගතකළේ, ඔහු රැගෙන ආ කුරුල්ලන් පිළිබඳ පොත කියවීම සඳහාය. එම පොත දිගහැරගෙන, එහි විස්තර කර තිබූ කුරුල්ලන් සජීවීව නරඹමින්, උන්ගේ හැසිරීම ඔහු අධ්‍යයනය කළේය. ඒ අතර යම් යම් අමතර තොරතුරු ද සටහන් කරගත්තේය. ග්‍රීෂ්මාන්ත සෘතුව නිසා රෑ අට පහමාරුත් ඉරඑළියක් පැවතිණ. අපට යළිත් වරක් කැලිස්ටර් දකින්නට ලැබුණේ කෙමෙන් ඉරබැස යන්නට පටන්ගත් පසුවය.

කලින් දිනයේ හවස "මාගරීටා" බෝට්ටුවේ පිටුපස කොටසට වී පයිප්පයක් උරමින් විවේක ගත් පුද්ගලයෙකු ගැන මම සඳහන් කළෙමි. ඔහු මෙදින ද බෝට්ටුවේ පිටුපසට පැමිණ පයිප්පය දල්වාගෙන සැඳෑසිරි නැරඹීමට පටන්ගත්තේය. කලින් දිනයේ මෙන් ඔහු අතේ ඉදිරි කොටස බෝට්ටුවේ ආරක්ෂක වැට මත තබාගෙන, මුහුණ මුහුද දෙසට ලංකරගෙන සිටියේ, එයින් ආශ්වාදයක් විඳින අයුරෙනි.

ප්‍රදීපාගාරයේ සිටි කැලිස්ටර් එම අතර එයින් එළියට පැමිණ, දොරවසා යතුරු දැම්මේය. මුලින් ඔහු ඇවිදගියේ බිලිපිති රඳවා තිබූ තැනටයි. බිලිපිතිවල යොත්පට ආපසු කරකැවූ ඔහු, බිම ඇණ තබාගත්තේය. කෑම කූඩය බිමින් නැඟූ කැලිස්ටර්, එහි මුදුන වසා තිබූ ආවරණය ඉවත්කොට යමක් එළියට ගත්තේය. මට පෙනුණු ආකාරයට ඒ ලොකු පාන් කැබැල්ලකි.

"මට පෙනුණු ආකාරයට" යයි මා කීවේ එම දර්ශනය මට පැහැදිලිව දැකගන්නට නොලැබුණු නිසාය. කැලිස්ටර් සිටියේ අපට පිටුපස හරවාගෙනය. ඊට අමතරව ඔහු හැඳ සිටි වැහි කබා වර්ගයේ ලිහිල් කබාය නිසා, ඔහුගේ දෑත් හා ඒ අවට දැකීමට මට හැකියාවක්



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

නොවීණි. කෙසේ වෙතත් සූදුපාටින් දිස්වුණු එම ද්‍රව්‍යය පාන් බවට සැක නැත. ඔහු ඒවා අහුරු අහුරු කූඩයෙන් එළියට ගෙන, මුහුදු පක්ෂීන් දෙසට විසිකළේය. ඔහු වටා එක්රොක් වූ කුරුල්ලෝ විවිධ හඬින් කෑගැසූහ. සමහරු කැලිස්ටර් වටා පියඹා ගිය අතර තවත් කුරුල්ලෝ පාන් කෑබලි අහසේදීම හොටෙන් ඩැහැගත්හ.

කුරුල්ලන්ට කෑම දීම අවසන් කළ ඔහු, මීළඟට ගියේ බිලීපිති රඳවා තිබූ තැනටයි. තවමත් අපට පිටුපස හරවාගෙන, බිලීපිති දෙකේ කොකුවල ඇමිණී සිටි මාළුන් නිදහස් කරගෙන, තම කූඩයට දමාගත්තේය. අවසන් වශයෙන් බිලීකොකු වලට ඇම අමුණා යළිත් වරක් මුහුදට විසිකළේය. අනතුරුව තම කූඩය අතට ගත් ඔහු, තම ඔරුව වෙත පැමිණ, ඔහු නිවස දෙසට පදවාගෙන එන්නට පටන්ගත්තේය.

මොරිස් කැලිස්ටර්ගේ දින චර්යාව, හැම අයුරකින්ම, මයික්‍රොෆ්ට් අපට කියා තිබූ ආකාරයටම සිදුවූ බැව් අපි දුටුවෙමු. "මාගරීටා" බෝට්ටුවේ කටයුතු සිදුවූයේ ද කලින් දිනයේ සිදුවූ පිළිවෙළටමය.

බෝට්ටුවේ පිටුපස කොටසට වී පයිප්පයක් උරමින් විවේක ගන්නා පුද්ගලයා, එම රාජකාරිය එලෙසම ඉටු කළේය. මඳ වේලාවකට පසු ඇතුළත සිට එළියට ආ අනෙකා, බාල්දියේ තිබූ රොඩුබොඩු මුහුදට විසිකොට, බාල්දිය මුහුදට පහත්කොට, එය පිරිසිදු මුහුදු වතුරෙන් පුරවා උඩට ගත්තේය. අනතුරුව සුපුරුදු ලෙස, බෝට්ටුවේ ඇතුළත තෙමී යන සේ, එම වතුර බාල්දිය ඇතුළට ගෙන, බාල්දිය ද රැගෙන බෝට්ටුව තුළ නොපෙනී ගියේය.

තම ඔරුව පැදගෙන ආ මොරිස් කැලිස්ටර් මේ වනවිට, තම නිවස සමීපයේ ලෑලි පාලම වෙත ළඟාවී සිටියේය. ඔහු තම ඔරුව එහි ගැටගසා, කූඩය ද අතින් ගෙන ගල්පඩි පෙළ දිගේ ඉහළට නැඟුණු සැටි අපි බලා සිටියෙමු. මිනිත්තු කිහිපයකින් "ෆර්ස්" නිවස ඉදිරිපිට ගස් අතරේ ඔහු නොපෙනී ගියේය. මඳ වේලාවකින් රාජකාරී භාරගැනීම සඳහා සාජන්ට් ලෙවී පැමිණියෙන්, නවාතැන වෙත යාම සඳහා අපට අවසර ලැබිණ.

"අසාමාන්‍ය දෙයක් සිදුවෙනවා කියලා, මට නම් පෙනෙන්නේ නෑ" මම කීවෙමි. "ඔහු නීතිවිරෝධී කටයුත්තක යෙදෙන බවට ලකුණක්වත් නෑ."

"දෙස්තර මහත්මයා, හැම සති අන්තයකම අපට දකින්න ලැබෙන්නේ ඔය ටිකමයි; ඔය පිළිවෙළටමයි" මගේ අදහසට එකඟ





වූ ඩරූරි කීය. "විද්‍යාඥයා වගේම "මාගරීටා" බෝට්ටුවේ අය හැමවිටම හැසිරෙන්නේ එකම පිළිවෙළට. එක අකුරකින් ඒක වෙනස් කරන්නේ නෑ. මේ දෙගොල්ලා අතරේ මොනවා හරි පණිවුඩ හුවමාරුවක් වෙනවද? එහෙම වෙනවා නම් ඒක වෙන්නේ මොන ආකාරයට ද? මට ඒක හිතාගන්නවත් බෑ. ජීවිත කාලයක් බලාගෙන හිටියත්, ඒක මට හිතාගන්න හැකිවේවි කියලා මං හිතන්නේ නෑ."

හෝම්ස් වචනයක් හෝ කථා නොකොට, නිහඬව අප දෙස බලා සිටියේය. ඔහුගේ නිහඬ බව ගැන අපි පුදුමයට පත්වූයෙමු.

"ඔබට එහෙම මොකුත්ම පෙනුණේ නැද්ද ඩරූරි?" හෝම්ස් ඇසුවේ මිනිත්තු කිහිපයකට පසුවය.

"මොනවා හෝම්ස් මහත්මයා?" විමතියට පත්වූ ඩරූරිට කෑගැසිණි. "ඔබ කියන්නෙ මේ දෙගොල්ල අතරේ පණිවුඩ හුවමාරුවක් වුණා කියලද? කොහොමද ඒක වුණේ? කියන්න බලන්න"

"ඔබ දුටුවද බෝට්ටුවට වෙලා පයිප්පය බොමින් හිටි මිනිහා?" හෝම්ස් ඇසීය.

"ඔව් මං දුටුවා" ඩරූරි කීය. "ඒ යකා නැමදමත් කරන්නේ, අත්දෙකෙන් ආරක්ෂක වැට අල්ලාගෙන පයිප්පය බීම විතරයි"

"අත් දෙකෙන් නෙමෙයි ඩරූරි. එක අතකින්" හෝම්ස් එය නිවැරදි කළේය. "ඔබ හොඳින් නිරීක්ෂණය කළා නම් දකින්න ඇති, ඔහු හිටියේ අපේ පැත්තට මුහුණදමලා නෙමෙයි. ඔහු හිටියේ පැත්තට. ඒ කියන්නේ, එක අතක් අපේ පැත්තට. අනෙක් අත අපට පෙනෙන්නේ නෑ. අපට පෙනුණු අත නම් ආරක්ෂක වැට මත තියාගෙන හිටි බව ඇත්තයි. එතකොට අනෙක් අතින් මොකද කළේ? ඊළඟට අර බෝට්ටුව ඇතුළේ බාල්දියක් අරගෙන එහා මෙහා ගිය මිනිහා ගැන කල්පනා කරලා බලන්න"

"ඒ මිනිහා බාල්දියේ තියෙන රොඩුබොඩු මුහුදට හලලා, මුහුදු වතුර එකක් බාල්දියට පුරවා ගන්නවා. එහෙම නේද?" මම ඇසීමි.

"මුහුදු වතුර විතරක් නෙමෙයි; අපට නොපෙනුණාට තවත් මොනවා හරි දෙයක් බාල්දියට පුරවා ගන්නවා" හෝම්ස් කීය. "කැලිස්ටර් අතේ ගෙනියන කෑම කූඩය ගැන මට සැකයි. ගෙදර ඉඳලා මොනවා හරි දෙයක් ඔහු කූඩය ඇතුළෙ හඟවලා, ප්‍රදීපාගාරයට ගෙනියනවා. ආපහු ගෙදර එද්දී මොනවා හරි අරගෙන එනවා.

අපි හෙට උදේට ඔහුව නවත්වලා ඒ කූඩය සෝදිසි කරලා බලමු. මං භය නැතුව කියන්නම්. කුරුල්ලන්ට කන්න දෙන පරණ පාන්



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

වලටයි, කැලිස්ටර්ගේ සැන්ඩ්විච්ස් වලටයි අමතරව යමක්, ඔය කූඩෙ ඇතුළෙ තියෙනවා. මගේ හිතවත් වොට්සන් සහ ඩ්රූරි මහත්මයා. මං ඔබට අවවාද කරනවා. ශුද්ධ වූ මතෙව්ගේ ශුභාරංචි පොත නැවත වරක් කියවා බලන්න. ඔබේ සැලකිල්ල යොමු කරන්න හයවැනි පරිච්ඡේදයේ 26 වැනි කාව්‍ය පාඨයට. ඒකෙ ලියල ඇති, "අහසේ පියාඹාගෙන එන පක්ෂීන් වෙත ඔබේ අවධානය යොමු කරන්න" කියලා. එහෙම කරද්දීම, සාගරයේ පිහිනාගෙන එන පක්ෂීන් වෙතත්, අවධානය සුළුවෙන් හෝ යොමුකරන්න, කියලා මං ඉල්ලා හිටිනවා"

හෝම්ස්ගේ කථාව අවසන් වෙද්දී අපි නවාතැන වෙත ළඟාවී සිටියෙමු. මේ වෙලාව වනවිට, මගේ මිත්‍රයාගේ මානසික ශක්තියට යම්කිසි උත්තේජනයක් ලැබී ඇති බව පැහැදිලිය. ඔහුගේ ප්‍රකාශයෙන් පුදුමයට පත්වූ අප බලාසිටියදී, හෝම්ස් ගෙට ඇතුළු වී සැපපහසු පුටුවක හිඳ ගත්තේය. මීළඟට තම සටහන් පොත කබාසාක්කුවෙන් ඉවතටගෙන, එහි යමක් ලියන්නට ඔහු පටන්ගත්තේය. එය වේගයෙන් ලියා අවසන් කළ ඔහු, ඉම පිටුව ඉරා මේසය උඩින් එය අප දෙසට තල්ලු කළේය.

"මෙන්න මේක කියවලා බලන්න" හෝම්ස් කීය. "උපකල්පනයක් ගොඩනගන්න මට උපකාරී වුණු සාධක, දම්වැක් ලෙස එකට බැඳී පවතිනවා. ඔතෙ අවසාන පුරුකත් දැන් නියම තැනට ඇමිණිලා ඉවරයි. මෙකෙ සිද්ධිත් හරි හැටි තේරුම ගන්න. එතකොට ඔබට හැකිවේවි, කැලිස්ටර්ගේ වංචනික කටයුතුවල මුල සිට අගටම දකින්න"

මම ඒ කඩදාසිය අතට ගත්තෙමි. ඩ්රූරි ඒයට පෙනේ හෙළුවේ මගේ උරහිසට ඉහළිනි.

1. ජපානය
2. ශුංගය
3. සර්කස්
4. මාධී මෙනෙවියගේ ආහාර ද්‍රව්‍ය ඇණවුම
5. ප්‍රදීපාගාරය
6. මාගරීටා යාත්‍රාව
7. කැම රැගෙන යන කූඩය
8. බාල්දිය





9. බිලිපිති

**10. මුහුදු පක්ෂීන්ගේ ආහාර ගැනීමේ චර්යාව, විශේෂයෙන්ම ෆැලක්‍රොකොරැක්ස් කාබෝ නම් කුරුළු විශේෂය.**

"හෝම්ස්" මම කීවෙමි, "මට නම් මේකෙ කිසිදෙයක් තේරුම්ගන්න බෑ, මොකක්ද මේ? ප්‍රහේලිකාවක් ද?"

"මොන ප්‍රහේලිකාවක් වුණත් මුල්දි පෙනෙන්නේ සංකීර්ණ විදියට" හෝම්ස් කීය. "නමුත් විමසා බලද්දි තමයි පෙනෙන්නේ, සංකීර්ණ වුණත් විසඳන්න පුළුවන් බව. ඔබ ඔය මාතෘකා මත කරුණු ගොඩනැගිය යුතුයි. එවිට ඔබට හැකිවේනවා, ඒවා එකින් එක සම්බන්ධ කරන්න. මොකුත් තේරුම් ගන්න බෑ? අයියෝ! මගේ හිතවත් වොට්සන්. ඔබ මගේ බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම කඩකරනවා. ඩ්රූරි මහත්මයා. ඔබට කොහොමද? මොකවා ඔබටත් බෑ? ඔබේ මුහුණෙනුත් ඒ බව මට පෙනෙනවා. හොඳයි. මේ ටික අහගන්න මුලින්. කාරණා තේරුම්ගන්න බැරිවුණත්, ඒ ගැන ක්‍රියාකරන්න සූදානම් වෙන්න"

"ක්‍රියා කරන්න?" ඩ්රූරි ඇසීය. "මොනවද හෝම්ස් මහත්මයා අප කළ යුතු ක්‍රියාවන්?"

"කැලිස්ටර් සහ ඔහුගේ අපරාධකරුවන් හිරභාරයට ගැනීමට, වරෙන්තුවක් සූදානම් කරගන්න ඔබට පුළුවන්ද?" හෝම්ස් ඇසීය.

"වරෙන්තුවක් සකස්කරගන්න පුළුවනි" ඩ්රූරි කීය. "නමුත් ඒක මහේස්ත්‍රාත්වරයෙකු අනුමත කරන්න ඕන"

"ඒක ඒ හැටි අමාරු වැඩක් වෙන්න බැහැ ඩ්රූරි මහත්මයා" හෝම්ස් කීය. "වේගයෙන් යාත්‍රාකළ හැකි බෝට්ටුවක් අපට වුවමනා වෙනවා. වෙරළාරක්ෂක සේවයෙන් ඒක ලබාගත හැකිවේවි කියල මං විශ්වාස කරනවා. ඒක වුවමනා වෙන්නෙ "මාගරීටා" බෝට්ටුව සොයිසි කරන්න. මං බලාපොරොත්තුවෙනවා මගේ සහෝදරයා මයික්‍රොෆ්ට දුරකතනයෙන් අමතන්න. අපට ඔහුගේ උදව් අවශ්‍ය වේවි. මයික්‍රොෆ්ට් බලාපොරොත්තුවෙන්නෙ රූකඩ ටික නටවන්න නම්, නූල් වල කොන් තමායගෙන ඒව අදින්න ඔහුට සිදුවේවි"

තවත් පමාතොවී එතැනින් පිටත්වී සෙන්ට් ඕබන් වෙත යෑමට අපි තීරණය කළෙමු.



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

"වොට්සන් ඔබ අවන්හලට යන්න" හෝම්ස් කීය. "මං ඩිරූරි එක්ක පොලීසියට යනවා. ඒ මට අවශ්‍ය කරන දුරකතන ඇමතුම් ටික දෙන්න, ඒව අවසන් කරල මං එන්නම් අවන්හලට"

"මම "ෆිශර්මන්ස් රෙස්ට්" නම් අවන්හලට පිවිස, එහි කෙළවරක වූ බංකුවක හිඳගත්තෙමි. මගේ මිතුරා පැමිණි විට, කාටවත් නොඇසෙන ලෙස කතාබහක යෙදීමට එවිට හැකිවනු ඇත.

පැයක් පමණ ගතවෙද්දී ඔහු ඇවිණියේය. හෝම්ස්ගේ දෙනෙතේ තිබූ දීප්තිය නිසා, ඔහුගේ අරමුණු සාර්ථක වී ඇති බැව් මම වටහාගත්තෙමි.

"මං මයික්‍රොෆ්ට් කථා කළා" ඔහු කීවේ රහසක් කියන අයුරින් මෑද හඬකිනි. "හැම දෙයක්ම සූදානම් කරන්න ඔහු පොරොන්දුවුණා. වෙරළාරක්ෂක සේවයේ ඔංගවන් ඝත්‍රාවක්, හෙට උදේ වෙනකොට පෙන්හිඩ් වෙරළට ළඟාවේවි. අපි වැඩකටයුතු පටන්ගත් වහාම ඔවුනට පුළුවනි ක්‍රියාත්මක වෙන්න"

"මාගරීටා" සොදිසි කිරීමක් කරනවද?"

"ඔව්. එංගලන්තයට හොර බඩු ගෙන එන ජාවාරමක යෙදෙන බවට පැමිණිලි ලැබුණා කියල "මාගරීටා" සොදිසි කරනවා. ඩිරූරි මේ මොහොතේ උත්සාහ කරමින් ඉන්නේ, හතරදෙනෙකුට ඉඩ තියෙන ප්‍රමාණයේ, හබල් ගාගෙන යාහැකි බෝට්ටුවක් හොයාගන්න. ප්‍රදීපාගාරයට නොපෙනෙන විදියට, අපි හැවනී ඉන්න ගේ කිට්ටුව මුහුදු වෙරළේ ඒක හංගලා තියන්න, ඔහු පියවර ගනීවි.

කැලිස්ටර් තමන්ගේ ඔරුව පැදගෙන ගිහිං, ප්‍රදීපාගාරය ඇතුළට යනතුරු, අපි ඉවසීමෙන් බලාගෙන ඉන්නවා. ඊට පස්සේ අපි අපේ බෝට්ටුව පැදගෙන යනු. අපි ගිහිං ප්‍රදීපාගාරය තියෙන තැනට ගොඩබහිනවා. මේ ගමන යද්දී ඩිරූරිගේ සාක්කුවේ තිබෙනවා ලියකියවිලි කිහිපයක්ම. ඒ තමයි, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් පිළිබඳ සැකපිට, කැලිස්ටර් සහ ආධාරකාරයා අත්අඩංගුවට ගන්න වරෙන්තු. ඔහුගේ "ෆර්ස්" නිවස සොදිසි කරන්න වරෙන්තු. අද රාත්‍රියේම පෙන්සාන්ස් නගරයේ ඉන්න මහේස්ත්‍රාත් වරයාට, ලන්ඩනයෙන් අණ ලැබේවි. උවමනා කරන වරෙන්තුවලට අස්සන් කරන්න, ඔහු බොහොම කැමැත්තෙන් එකඟවේවි. මේ අතරේ ඩිරූරි පෝට්ස්විතින් පොලීසියට කථා කරලා, ඔවුන්ගේ මෝටර් රිය ඉල්ලාගනීවි පෙන්සාන්ස්වලට යන්න."





"ඒ මොකටද?"

"ඒ මෝටර් රිය හෙට උදේ නවයහමාරට "ෆර්ස්" නිවස අසලට ගෙන්වාගන්න කියල මං ඔහුට කිව්වා. ඒ, කැලිස්ටර් සහ ඔහුගේ ආධාරකාරයා, වැඩිදුර ප්‍රශ්න කිරීම් සඳහා ලන්ඩනයට අරගෙන යන්න. වොට්සන් මේ මෝටර් රථය සහ දුරකතනය නවීන ප්‍රදීපාගාර නිෂ්පාදන නේද? මතකද? ඒ කාලෙ අපට හැම වෙලාවකම යොදාගන්න වුණේ අශ්වකරත්තයයි විදුලිපුවතයි. ඒවා එක්ක වැඩකටයුතු කරනවාට වඩා, දැන් වැඩකිරීම බොහොම පහසුයි. එහෙම නේද?"

"ඒක නම් ඇත්ත තමයි" මම කීවෙමි. "ඒ වුණත් මං කැමතියි ඔබ අර දුන්නු මාතෘකා දහය, මේ අපරාධයට අදාළ වෙන්නේ කොහොමද කියල පැහැදිලි කරනවා නම්. අද උදේ සිදුවූ සිද්ධීන් දමය?"

"ඒව මත්තෙකම ඔබට පැහැදිලි කරන්න. ඒ හැටි වෙලාවක් ඉතිරිවෙලා නෑ මිතුරා." ඔහු කීවේ සිනාමුසු මුහුණෙනි. "ඒ මොකද පෙන්සාන්ස් වෙත යන්න මෝටර්රිය බලාපොරොත්තුවෙන්, ඩිරූරි දැන් මේ අවන්හලට එවී. මං දීල තියෙන හෝඩුවාවන් උපයෝගී කරගෙන, ගැටලුව විසඳන්න උත්සාහ කරන්න වොට්සන්. ඒකෙන් ඔබේ මනසට කිසියම් මානසික ප්‍රබෝධයක් ලැබේවි. එහෙම නේද මගේ හිතවත් මිතුරා?"

* * *

පසුවද උදේ අපි සතරදෙනා ඩිරූරි, මැක්ග්‍රෙගෝ, හෝම්ස් සහ මම, නිරීක්ෂණ මුරපොළ වෙත පිටත්ව ගියෙමු. එසේ යන අතරත් මා කල්පනා කළේ හෝම්ස් අපට දුන් හෝඩුවාවන් පිළිබඳවය. එහෙත් ගැටලුව විසඳීමට තබා, ඒ අසලකට ඒමට වත් මට හැකිවූයේනැත. මගේ මිතුරා අපමණ සන්තෝෂයකට පත්ව සිටින්නේ කුමක් නිසාද? එයට හේතුවද මට තේරුම් ගැනීමට නොහැකි විය.

අපි "මුර කුටියට" වී මොරිස් කැලිස්ටර් වෙත අපේ අවධානය යොමු කළෙමු.

මොරිස් කැලිස්ටර් යළින් වරක් ක්‍රියාකළේ කලින් දවසේ ආකාරයටම ය. ගල්පඩි පෙළ බැස ගිය ඔහු, තම ඔරුවට නැගී ප්‍රදීපාගාරය දක්වා එය පැදගෙන ගියේය. ඔහු එහි ගොඩබැස මඳ වේලාවක් ගතවෙද්දී "මාගරීටාවේ" බාල්දියක් අතින් ගත් මිනිහා

අපට දකින්නට ලැබිණි. කඹ කැබැල්ලෙන් අල්ලා බාල්දිය මුහුදට පහත් කළ ඔහු, එය පිරෙන්නට වතුර පුරවා උඩට ගත්තේය. මේ සාමාන්‍ය කටයුතු වල වෙනස්වීම තිබුණා නම්, ඒ දෙකක් පමණි.

පළමුවැන්නා කලින් දිනයේ ආරක්ෂක වැට අල්ලාගෙන පයිප්පය බිව් මිනිහා, අද ලෑලි පෙට්ටියක් මත වාඩිවී මාළු දැලක් අලුත්වැඩියා කරමින් සිටියේය.

දෙවැන්නා බිලී කොකු වල ඇම සවිකිරීමට කැලිස්ටර් සෑහෙන කාලයක් ගතකළේය. එක් බිලීපිත්තක නංගුස්සට කොහේ හෝ පටලැවී තිබීම නිසා, එය නිදහස් කරගන්නට ඔහුට මිනිත්තු පහකට වැඩි කාලයක් ගතවිය. අන්තිමේදී බිලී පිති දෙකේම යොත් පොටවල් ආපසු හකුළා, බිලීකොකු වලට ඇම අමුණා, යළිත් ඒවා මුහුදට දැම්මේය. අනතුරුව තම කෑමකුඩය අතට ගත් ඔහු, ප්‍රදීපාගාරයේ දොර ඇරගෙන එයට ඇතුළුවිය.

මෙතෙක් වේලා කැලිස්ටර්ගේ කටයුතු ඇදහෙතියෙන් බලාසිටියේ මගේ මිත්‍රයාය. ඔහු එය පහත දැම්මේ අප්‍රමාණ සන්තෝෂයෙනි.

"දැන් අපට පුළුවනි ඔහුව අල්ලාගන්න" හෝම්ස් කීය. "ඩිරූරි, අපට යන්න බෝට්ටුව සූදානම් නේද? එහෙම නම් යමු වහාම! දැන් තියෙන්නේ අපේ බිලීපිත්තේ යොත් හකුළා මේ යෝධ මත්ස්‍යයා බෝට්ටුවට ඇදගැනීම පමණයි."

ඩිරූරි පෙරමුණ ගත්තේය. අපි ඔහු පසුපස ගියෙමු. අප ගියේ අප වෙනුවෙන් ගෙන්වා තිබූ විශේෂ බෝට්ටුව සඟවා තිබූ තැනටයි. බෝට්ටුව දියත්කරගෙන අපි සතරදෙනා එයට නැඟුණෙමු. බෝට්ටුව පෙන්හිඩ් ප්‍රදීපාගාරය දෙසට හරවා මැක්ග්‍රෙගර් සහ හෝම්ස් හබල්ගෑමට පටන්ගත්හ.

එය වලාකුළින් තොර දීප්තිමත් උදෑසනක් විය. සාගරය පිසගෙන හමා ආවේ මඳ සුළං රැල්ලක් පමණි. වැඩිවේලා යාමට පෙර අපි "මාගරීටා" බෝට්ටුව නැංගුරම් දමා තිබූ කුඩා දූපත වෙත ළංවූයෙමු. එහි සිටි මිනිස්සු, මේ වන විට බෝට්ටුවේ පහළ තට්ටුවට බැස, නොපෙනී ගොස් සිටියහ. අපි එයට සෑහෙන තරම් දුරෙන් යාත්‍රා කළෙමු.

අප බොහෝ සෙයින් බලාපොරොත්තු තැබූ වෙරළාරක්ෂක යාත්‍රාවේ සලකුණක්වත් නොවීය. උදේ නවය වනතුරු පෙන්හිඩ් තුඩුවට ළං නොවී, නොපෙනෙන මානයේ රැඳීසිටීමට





මයික්‍රොෆ්ට්ගෙන් ඔවුනට උපදෙස් ලැබෙන්නට ඇත. ප්‍රදීපාගාරයට ගොස් සියලු වැඩකටයුතු නිමකරද්දී, උදේ නවය වනු ඇතැයි හෝම්ස් නිශ්චය කොට තිබිණි.

අප එහි ළඟාවී ඇති බව කැලිස්ටර්ට දැනුම්දීමට "මාගරීටා" වෙතින් උත්සාහ දරනු නිසැකය. එහෙත් අපි ඊට පෙර ක්‍රියාත්මක වෙන්නෙමු. සිතූ වේලාවට මිනිත්තු පහක් තිබියදී, අපි ප්‍රදීපාගාරය වෙත ළං වූයෙමු. කැලිස්ටර්ගේ ඔරුව ගැටගසා තිබූ තැනම අපේ බෝට්ටුව ද ගැටගසා, ප්‍රදීපාගාරයේ දොරටුව වෙත දිව ගියෙමු. එහි දොර ඇතුළතින් අගුළු දමා නොතිබිණි. හොඳින් තෙල් දමා තිබූ දොර - සරනේරු වලින් හඬක් නොනැගිණි.

අප මුලින්ම පිවිසුණේ කුඩා බරාදයක් වෙතයි. අපේ වම්පසින් වූ කාමරයක් පුරා, කැටිකිරිගිය ලී බඩු කබඩාකොට තිබූ බවක් දුටුවෙමු. ඒ අසලින්ම ප්‍රදීපාගාරය ඉහළට නැඟිය හැකි, සර්පිලාකාර තරප්පු පේළිය ඇරඹිණ. හැකි ඉක්මනින් අපි එහි උඩට නැගීමට පටන්ගත්තෙමු. අප තරප්පු පෙළ නගිද්දී ඇතිවූ ශබ්දය, එළියේ මුහුදෙන් නැගුණු ඝෝෂාව නිසා යටපත්වන්නට ඇතැයි අපි විශ්වාස කළෙමු.

මෙසේ ඉහළ නගිද්දී පාවිච්චියට නොගෙන වසා තැබූ කාමර ගණනාවක් අපි පසුකර ගියෙමු. ප්‍රදීපාගාරයේ භාගයක් පමණ ඉහළට නැගුණු පසු, බිත්තිවල අලුතෙන් හුණු ආලේපකොට ඔපවත් කර තිබූ හැටි දුටුවෙමු. එතැන තිබූ තරමක කාමරයකට ඇතුළු වෙන දොරේ පවා තීන්ත ගා, අලුත් යතුරු කසඩුවක් සවිකර තිබූ බැව් දැකිය හැකිවිය. මේ කැලිස්ටර්ගේ පර්යේෂණාගාරය බැව් වටහාගැනීමට, අපට අපහසු වූයේ නැත.

මඳ වේලාවක් එතැන නැවතී, අපි මහන්සි ඇරියෙමු. හෝම්ස්ගේ සැලසුම වී තිබුණේ අප හතරදෙනාගේම ශක්තිය යොදා පර්යේෂණාගාරයේ දොර වෙත එක්වරම කඩාපැනීමටය. හෝම්ස් දුන් සංඥාවත් සමග අපි එය ඉටුකළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස දොරේ එක් සරනේරුවක් ගැළවී, අගුළ කැඩී ගියේය.

ඔහු කිසිසේත් බලාපොරොත්තු නොවූ ලෙස, අප කළ කඩාවැදීම නිසා විද්‍යාඥයා තිගැස්සී, භයෙන් ත්‍රස්ත වූ බව ඔහුගේ මුහුණෙන් පෙනිණ. කාමරයේ ඈත කෙළවරේ මේසයක් අසල පර්යේෂණයක යෙදී සිටි ඔහු, භයෙන් ගල්ගැසුණු අයුරක් අපි දුටුවෙමු.



www.sinhalaelibrary.com

කාමරය පුරා මේසය මත විසිරී තිබුණේ, විද්‍යාත්මක පර්යේෂණ උපකරණ රැසකි. බිත්ති බොහොමයක් වැසී තිබුණේ, ඒවාට සවිකළ කබඩ් හා වීදුරු අල්මාරි වලිනි. අප ඉදිරියෙන් ම විවෘතව තිබූ විශාල කවුළුවකින් අත්ලාන්තික් මහා සාගරය දැකිය හැකි විය. කාමරය තුළට මුහුදු සුළං නිදහසේ හමා ආ අතර, උදෑසන හිරුඑළියෙන් කාමරය ඇතුළත දීප්තිමත් විය. මෙම ජනේලයෙන් ක්ෂිතිජය දක්වාම දැකගැනීමට හැකියාවක් තිබිණ. 'මේ වන විට පෙත්තිඩි බොක්කට පිවිස, "මාගරීටා" දෙසට යාත්‍රා කරමින් තිබූ වෙරළාරක්ෂක සේවයේ යාත්‍රාව ද මම දුටුවෙමි.

මගේ දර්ශන පථයේ ඉක්මනින් සටහන් වී ගිය මේ දේවල් වලට අමතරව, කාමරයේ තිබූ අනෙකුත් දේවල් ගැන මට හරි හැටි මතක නැත. කැලිස්ටර් ළඟ වී සිටි මේසය මත වයර් කෑබලි, එන්ජිමක කොටස්, ඩයිනමෝ සහ විවෘතව තිබූ පොත් කිහිපයක් වූ බව නම් ස්ථිර වශයෙන් ම මට පැවසිය හැක.

මට වඩාත් හොඳින් මතක ඇත්තේ තරුණ විද්‍යාඥයාගේ ස්වරූපයයි. අප දුටු විගස බියෙන් නැගිටගත් ඔහු හැරී බලද්දී, ඔහුගේ ආබාධිත උරහිස, වඩාත් විකෘති ලෙස දිස්විය. ඊටත් වඩා මගේ නෙත් යොමුවූයේ ඔහුගේ හිස වෙතටයි කීවොත් වඩාත් නිවැරදිය. කුඩා වැහැරුණු සිරුරක් මත තිබුණේ, සාමාන්‍ය ප්‍රමාණයටත් වඩා විශාල ලෙස පෙනුණු හිසකි. එහි තිබූ දීප්තිමත් දෑස්, පුළුල් නළල් තලය, අදටත් මගේ සිතේ මැවී පෙනෙයි. ඔහුගේ හිස වැසී තිබුණේ, කැප් තොප්පියක් ලෙසින් හිසටම ඇලුණු කරකෙස් ස්වල්පයකිනි.

විද්‍යාඥයා සමීපයේ වූ ලෝහයෙන් කුඩා මේසයක් මත, ඔහු කැම රැගෙන එන වේවැල් කූඩය දකින්නට ලැබිණි. එය සෑහෙන තරම් විශාල එකක් වූ අතර, එහි ඇතුළතින් සවි කළ පුළුල් සම්පට් දෙකක් ද විය. වතුරට ඔරොත්තු දෙන ලෙස සකස් කළ, කළු පැහැති සේද රෙද්දෙන් මැසූ හනායක්, කුඩා මෙන් කිහිපයක් ද, කූඩය තුළ මම දැකෙමි.

අපගේ හදිසි ඇතුළුවීම නිසා කැලිස්ටර් නැගිටගෙන, සුදුමැලිවී සිටි බැව් මම ඔබට පැවසුවෙමි. එහෙත් මඳ වේලාවක් යද්දී ඔහු සන්සුන් විය. හෝම්ස් සහ ඩැරී දෙදෙනා එක්විටම ඉදිරියට පා නැඟූහ. තරුණ විද්‍යාඥයා සිරභාරයට ගැනීම ඩැරී කළ අතර,





හෝම්ස් මේසය පරීක්ෂා කර බැලීය. වතුර නොඇල්ලෙන සේ තෙල් ගායා සකස් කළ සේද මල්ලක් අතට ගත් හෝම්ස්, එය විවෘත කර බැලීය. එයින් ඔහුවූයේ සුරුට්ටුවක් ලෙස රෝල් කළ ලොකු කඩදාසි කෑබැල්ලකි. එය දිග හැර, කියවා බැලූ හෝම්ස්, ඊළඟට එම ලියවිල්ල ඩැරී අතට දුන්නේය.

"මේ මහත්මයාගේ දේශද්‍රෝහී ව්‍යවසාය කටයුතු ගැන සාක්ෂි ඔය ලියවිල්ලේ තියෙනවා" හෝම්ස් කීය. "ඉතිරි හරිය තියෙන්නේ මෙතන" මගේ මිතුරා කීවේ කෑම කූඩයට තට්ටු කරමිනි.

තමා කොටුවී ඇති බව තේරුම් ගත් පසු කැලිස්ටර් නිහඬව සිටියේ නැත.

"කවුද මේ ෂර්ලොක් හෝම්ස් මහත්තයාද?" ඔහු ඇසීය. "ඔබේ බුද්ධිමත් බව, ගැටලු විසඳීමට ඇති දක්ෂතාවය මං අගය කරන්නේ බොහොම කාලෙක ඉඳල. කොහොම වුණත් මං මේ කාරණයත් කිව යුතුයි. ඔබේ දක්ෂකම හැමදෙයක්ම, අපරාධකාරයන් පසුපස ලුහුබැඳීම වෙනුවෙන් යෙදවීම නාස්තියක්. ඔබේ කුසලතාවය මෙන්ම කාලය ද නාස්ති වී යමක්. ඔබ කීවූ සාක්ෂි පොලිස් පරීක්ෂක මහත්මයාට පෙන්වන්න, මට ඉඩදෙන්න".

වේවැල් කූඩයේ පියන වසා දමා තිබූ සම්පටි දෙකේ, ගාංචු ගැලවීම ඔහු පටන්ගත්තේය. ඒ සමගම ආපසු හැරී අප දෙස බැලූ විද්‍යාඥයාගේ මුහුණට නැඟුණේ සිනාවකි. ඒ කුමක් නිසාදැයි බැලීමට අපි එතැනට ලංවූයෙමු.

අපේ අවධානය වේවැල් කූඩය වෙත යොමු වූ මොහොතේ, කැලිස්ටර් එක් ක්ෂණයකින් ක්‍රියාත්මක විය.

හෝම්ස් මහ හඬින් කෑගසා අපට යමක් කීය. එහෙත් එය අනතුරු ඇඟවීමක් බව එක්වරම තේරුම් ගැනීමට අපට නුපුළුවන් විය. එම ප්‍රමාදය නිසා කැලිස්ටර් කළේ, මේසය මත තිබූ පොත් සියල්ල හා උපකරණ කෑබලි, මහා ශබ්දයක් නැඟෙන සේ බිමට විසි කිරීමයි. එම උස් හඬෙන් කලබල වී, වේවැල්කූඩය තුළ සැඟවී සිටි සතෙක් එළියට පැන්නේය. කළුපැහැති විශාල කුරුල්ලෙකු වූ ඌ, අත්තටු ගැසූ වේගය නිසා, එතැන ඇතිවූයේ, බෝම්බයක් පුපුරායද්දී ඇතිවන ශබ්දයක් හා කලබැගෑනියකි. එයින් අපි සැමදෙනෙකුම බියට පත්ව නැතිගත්තෙමු. මේ අවලක්ෂණ පක්ෂියා, උගේ අත්තටු අපේ මුහුණු ලඟින්ම සලද්දී, ඒ අත්තටු පහරු අපට ද එල්ල විය. අන් අය පමණක් නොව හෝම්ස් ද නැතිමගන පිටුපසට පැන්නේය.

මෙම කලබලය පැවැතියේ තත්පර කිහිපයක් පමණි. එහෙත් මොරිස් කැලිස්ටර් නම් විද්‍යාඥයාට ඒ කාලය ප්‍රමාණවත් විය. ඒ අවසරයෙන් අප ඉවතට තල්ලු කර දැමූ කැලිස්ටර්, කාමරයේ දොර දෙසට පැන්නේය. මොහොතින් දොර ඇරගෙන තරප්පුවට පිවිසි ඔහු, එය දිගේ ඉහළට නොපෙනී ගියේය.

සිදුවන්නට යන්නේ කුමක්ද යන්න අපට තේරුම් ගැනීමට හැකිවූයේ නැත. එහෙත් එය තේරුම් ගැනීමට හෝම්ස්ට ගතවූයේ එක් නිමේෂයක් පමණි. ඔහු පසුපස එන මෙන් අපට කෑගසා කියමින්, ඔහු කැලිස්ටර් පසුපස දුවනුවැන්දේය.

අපි ප්‍රදීපාගාරයේ මුදුනටම පැමිණියෙමු. එහි තිබුණේ අර්ධ කවාකාර කුටියකි. ආලෝකය නිකුත්කරන විශාල පහන සහ කරකැවෙන පරාවර්තනඳ තිබූ මෙම කුටිය, වීදුරු වලින් සම්පූර්ණයෙන්ම ආවරණය විය. මෙම කුටියේ ඇත කෙළවරේ කුඩා දොරකි. එයින් පිටවීමට හැකිවූයේ විවෘත සඳළුතලයකටයි. රවුමටම පිහිටි මෙම සඳළුතලය අඩිත දිගටම, ආරක්ෂක වැටක් විය. එය අපේ හිණේ මට්ටමට දක එකකි.

වේගයෙන් දිව ගිය කැලිස්ටර් ප්‍රදීපාගාරය මුදුනේ දී මා ඉහත සඳහන් කළ වීදුරු කුටියට ඇතුළු විය. අපි දැවහි පිවිසියෙමු. එවිට ඔහු කුටියේ ඇත දොරෙන්, සඳළුතලයට පැනගත්තේය. අපි වහා සඳළුතලයට ආවෙමු. එවිට විද්‍යාඥයා, කළේ කුමක්ද? ආරක්ෂක වැටේ උඩින්ම වූ හරස් පයිප්පය මතට නැගුණු ඔහු එහි දෙපා පටලවා ගත්තේය. ඔහු ඒ මත නැගී, දැත් එහා මෙහා කරමින්, කඹයක් මත ඇවිදින සර්කස් ශිල්පියෙකු මෙන්, සිරුර සමබර කළේය. මරණය පෙනී පෙනී ඔහු සිටි භයානක ඉරියව්ව දුටු අපි, භීතියෙන් තැතිගත්තෙමු. අපට කළ හැකි කිසිවක් නොවිය. තත්පර පහක්, හයක් එලෙස සිටි මොරිස් කැලිස්ටර්, ඊළඟ මොහොතේ ප්‍රදීපාගාරය මුදුනෙන් බිමට පැන්නේය!

එතෙක් ගල්ගැසී සිටි අප ඉදිරියට පැන්නේ සිතාමතා නොවේ. ඔහු බේරාගැනීමට නොහැකි බව තේරුම් ගෙන, ආරක්ෂක වැට අසලටම වී අපි පහත බැලීමු.

ඔහුගේ ලිහිල් වැති කබාය, වේගයෙන් හැමූ සුළඟ සමග පිඹී ගියේ, යෝධ කුරුල්ලෙකුගේ අත්තටු යුගලක් විලසිනි. එක් මොහොතින් ඔහු අපට නොපෙනී ගියේය. ඉන්පසු ඔහු බිම තිබූ ගල්පර්වත මතට ඇද වැටුණු බව අපි වටහාගත්තෙමු.





කැලිස්ටර්ගේ කෑමකුඩිය තුළ හැඟවී සිට, නිදහස් වූ පක්ෂියා, මේ වනවිට ජනේලයෙන් පිටවී, අහසේ පියාඹමින් සිටියේය. බිම පතිත වූ කැලිස්ටර්ගේ සිරුර පුනුව්පුනු වන්නට ඇත. ඔහුගේ පක්ෂියා තම ස්වාමියා අසලට පැමිණ, තුන්වරක් ඒ වටා පියාඹා, ඉන්පසු පෙන්හිඩි තුඩුව දෙසට ඉගිලී ගියේය. එය දුටු මගේ සිතේ ඇති වූ හැඟීම, අවංකව පැවසීමට කැමැත්තෙමි. ඔහුගේ පක්ෂියා ලෙස ගුවන් ගැබේ පියාඹා ඉවතට ගියේ, මරණයේ දී නිදහස් වූ කැලිස්ටර්ගේ ආත්මය ලෙස මට හැඟිණ. මම ඒ බව පසුව හෝම්ස් මිත්‍රයාට කිව්වෙමි. මගේ ඒ අදහස බහුබූත විකාරයක් බව කියමින්, හෝම්ස් අදටත් මට විහිළුකරයි.

කතාබහ හෝ විමසිල්ලට එදා කාලය, වේලාවක් නොතිබිණ. අපි වහාම ආපසු හැරී, ප්‍රදීපාගාරයේ තරප්පු පෙළ බැස ආවෙමු.

කැලිස්ටර් පහළට ඇදවැටුණු උඟත්, වේගයෙන්, ඔහු පතිත වුණු තැනත් දුටු අපි, ඔහු පණපිටින් දකින්නට බලාපොරොත්තු නොවූයෙමු. එහෙත් ඔහුගේ සිරුරේ ප්‍රාණය යන්තමින් හෝ රැඳී ඇද්දැයි සොයාබැලීම, වෛද්‍යවරයෙකු ලෙස මා සතු වගකීමක් විය. මම ඔහුගේ අත ඔසවා නාඩිවැටීම පරීක්ෂා කළෙමි. සිරුර අසල දණගසාගෙන මා නාඩි පරීක්ෂා කළ අයුරු, හෝම්ස් බලාසිටියේය. මේ සිදුවීම නිසා ඔහු අතිශය කැලඹීමටත්, කම්පාවටත් පත් වූ බව හෝම්ස්ගේ මුහුණෙන් මම තේරුම් ගතිමි.

"අපට දැන් මෙහෙම දෙයක් කරන්න වෙනවා වොට්සන්" ඔහු කීය. "මේ මරණය ඇසින් දුටු සාක්ෂිකාරයා ඔබ විතරයි. මැක්ග්‍රෙගෝවත්, ඩිරූව්වත් මංවත් මේකට පැටලෙන එක හොඳ නැහැ. එහෙම පැටලෙන්නෙ නැතුව ඉඳීම අත්‍යවශ්‍යයි.

අපි මළසිරුර ඔසවාගෙන ගිහිං, කැලිස්ටර්ගේ ඔරුව ළඟ ගල් පර්වතය උඩින් තියමු. ගල්පඩි පෙළ පාමුල දී, අපි වෙන් වෙන් කොටස් වලට බෙදී යායුතු වෙනවා. මැක්ග්‍රෙගෝ මුලින්ම යන්න. ඔබ යා යුත්තේ අර පොලිස් නිලධරයා වෙත. ගිහින් ඒකෙ ඉන්න රියැදුරාට දනුම්දෙන්න, අපට, ඔහුව උවමනා වෙනතුරු, මෝටර් රියත් අරගෙන කාටවත් නොපෙනෙන විදියට කැලෑරොදේ හැංගිලා ඉන්න කියල. ඔහු එළියට ආ යුත්තේ, ගමන පිටත්වෙන්න අපට උවමනා වුණාම. ඒ අතරේ ඩිරූව්යි මමයි "ෆර්ස්" මැඳුරේ උද්‍යානයට ගිහිං ඒකෙ හැංගිලා ඉන්නවා. වොට්සන් ඔබ තනියම "ෆර්ස්" වෙත



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

යා යුතුයි. ගිහින් මේ මරණය ගැන දැනුම්දෙන්න. මතක තියාගන්න මිත්‍රයා. මේක කැලිස්ටර් අතින් වුණු අත්වැරැද්දක් නිසා ඔහු මුහුණපෑ හදිසි අනතුරක්.

වොට්සන් ඔබ මෙහෙත් නිවාඩුවක් ගතකරන්න ඇවිත් බෝට්ටුවක් පදිමින් හිටියා. ඔබ හදිසියෙන්ම දුටුවා කෙනෙක් ප්‍රදීපාගාරයේ මුදුනේ ඉඳලා පහළට වැටෙන හැටි. වහාම එතැනට ගිහිං බලද්දී ඒ පුද්ගලයා මියගිහිං. ඔබ මේ මළසිරුර ජැටිය වෙත ඔසවාගෙන ආවා. නමුත් ගල්පඩිපෙළ දිගේ මේක තනියම ඉහළට අරගෙන එන්න, ඔබට හැකියාවක් නෑ.

ඔබ ෆර්ස් නිවසේ දොරට තට්ටු කරන්න. ගෘහපාලිකාව මායි මෙනෙවිය ඇවිත් දොර ඇරිවිට, අපට උවමනා කරන්නේ සෑහෙන වෙලාවකට ඇයව ගෙදරින් පිටකරලා තියන්න. ඒ හින්ද මොකක් හරි කාරණයක් කියලා ඇයව ගෙදරින් එළියට කැඳවාගෙන යන්න උත්සාහ කරන්න. ඩ්රූරී. පෞද්ගලික දුරකතනයක් තිබෙන ගෙයක් මේ හරියෙ තියෙනවද? මෙහෙට කිට්ටු කාගෙ ගෙදරද?"

ඩ්රූරී මඳ වේලාවක් කල්පනා කළේය.

"ආ.... දේවගැතිතුමාගේ ගෙදර දුරකතනයක් තියෙනවා" ඩ්රූරී කීය. "ට්‍රෙබර්ට් කියල කුඩා ගම්මානයක් මේ ළඟ තියෙනවා. දෙව්මැඳුර හා දේවගැති නිවස තියෙන්නෙත් එහේ. ඔය වතු උඩින් එහේට යා හැකි කෙටි පාරක් තියෙනවා."

"අන්න හොඳයි" යි හෝම්ස් මා දෙසට හැරුණේය. "වොට්සන්. ඇගේ හිතේ සැකයක් ඇති නොවෙන විදියට ඔබ කථා කළ යුතුයි. ඔබ ලන්ඩන් වෛද්‍යවරයෙක්. මේ මරණය ගැන වහාම පොලිසියට දැනුම් දෙන්න ඔබට උවමනායි. නමුත් දුරකතනයක් තියෙන තැනකට යන හැටි ඔබ දන්නේ නෑ. ඔබ මේ පළාතට අමුත්තෙක්. ඒ නිසා ලේසියෙන්ම පාර වරදින්න පුළුවනි. ඒ කාරණා කියලා, ඔබ කොහොම හරි මායි මෙනෙවිය ඔබ සමඟ කැඳවාගෙන යා යුතුයි. දේවගැති නිවසට ගියාම, ඔබ පෝර්ට්ස්විතින් පොලිසියට කථා කරනවා. මේ මරණය ගැන විස්තර වාචිකව කියනවා. ඒ අතරෙත් ඔබ ඇයව එහි රඳවාගත යුතුයි. ඊට පස්සේ ඔබට ආපහු "ෆර්ස්" වෙත එන්න පුළුවනි. නමුත් ආපහු ගමනටත් පුළුවන් තරම් වෙලා ගතකරන්න. හෙමින් හෙමින් නිවසට ආව කියමුකෝ. ඊළඟට පෝර්ට්ස්විතින් පොලිසියේ නිලධරයින් එනතුරු ඔබ "ෆර්ස්" නිවසේ රැඳී සිටිය යුතුයි.





ඔබ මේ කටයුත්තට ගිය අතරේ ඩ්රූරී, මැක්ග්‍රෙගෝ සහ මම නිවසට ඇතුළුවෙනවා. නිවස සෝදිසි කරන්න වරෙන්තුවක් අප ළඟ තියෙනවානෙ. කැලිස්ටර්ට උදව් කරමින් එහේ හැංගිලා ඉන්න උදව්කාරයා හෝ උදව්කාරයින් අපි අත්අඩංගුවට ගන්නවා. සාක්ෂි හැටියට අපට ප්‍රයෝජනවත් විය හැකි ලිපිලේඛන මොනවා හරි තියෙන්න පුළුවනි. අපි ඒවාත් අපේ භාරයට ගන්නවා. ඊට පස්සේ ඔබ මායි මෙනෙවිය සමඟ එන්න කලින්, අපි නිලරථයෙන් පිටත්වෙලා යනවා."

"මේ විදියට හැංගි හොරා කටයුතු කිරීමේ අවශ්‍යතාවද හෝම්ස්?" මා ඇසුවේ එවැනි සැලැස්මකට මගේ හිතේ තිබූ අකමැත්ත නිසාය.

"අවශ්‍ය තේන්නං" හෝම්ස් කීය. "කැලිස්ටර් පණපිටින්ම හිරභාරයට ගතයුතුයි නිසා. මයික්‍රොෆ්ට් කිව්වා ඔබට මතකද? අවාසනාවකට එයාගේ අත ඒක කරන්න බැරිවුණොත්. දැන් ඉතින් මෙහෙන් මහා හුටපටයක් ඇතිවෙන්න පුළුවනි. එහෙම දේකින් රජය අපකීර්තියට ලක්වීම අපි කොහොමහරි වළක්වාගන්න ඕන."

"ඒක හරි" මම කීවෙමි. "ඒ වුණාට හෝම්ස්, අපි ආපහු ඇවිත් බලද්දී, මායි මෙනෙවියට මොකක්ද දකින්න ලැබෙන්නෙ? ඔබ ඔය කියන මත්තුකාරයා හරි ආධාරකාරයා හරි ගෙදර නැතිවුණාම, ඇය හැමදෙයක්ම ගැනම සැක හිතන්න ඉඩ තියෙනවා. එහෙම නේද?"

"ඒ හරිය මං බලාගන්නම්" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේය. "ඒ ප්‍රශ්නය මතුවුණු වෙලාවට, මං ඒකට මොකක් හරි පිළියමක් යොදන්නම්. දැන් අපි ඉක්මන් කරන්න ඕන. අපට තියෙන්නේ සීමිත කාලයයි"

හෝම්ස් විසින් දෙන ලද විධානය, මම ඒ අයුරින්ම ක්‍රියාත්මක කළෙමි. කැලිස්ටර්ගේ මළසිරුර අපේ බෝට්ටුවට පටවාගත්තෙමු. ඊළඟට අපි ලැලිජැටිය දක්වාම එය පදවාගෙන ගියෙමු. එය ලී කණුවකට ගැටගසා, අපි එතැනින් පිටත් වූයෙමු. නිලරථයේ රියැදුරාට හෝම්ස්ගේ පණිවුඩය දීම සඳහා මැක්ග්‍රෙගෝ වහා පිටත්ව ගියේය. ඔහුගේ උපදෙස් මාලාවේ අවසන් කොටස මා වෙත දැනුම්දීම සඳහා හෝම්ස් සූදානම් විය. ගල්පඩි පෙළ මුදුනට ගිය පසු ඔහු ඒ සඳහා නැවතුණේය.

"වොට්සන්. ඔබේ වැඩකටයුතු ඔක්කොම ඉවර කළාට පස්සෙ අපේ නවාතැන - වෝර්ලාරක්කෙ නිවසට එන්න. එතකොට



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

හැමදෙයක්ම මං ඔබට පැහැදිලි කරලා දෙන්නම්. දැන් ඉතින් "ෆර්ස්" නිවසට ගිහිං ඉතුරු වැඩ කිරීම ඔබට භාරයි. මායි මෙනෙවිය හැකිතරම් කාල වේලාවක් මේ ගෙදරින් ඉවත්කර තැබීම ඔබේ රාජකාරිය. මං ඔබ ගැන විශ්වාසය තියනවා වොට්සන්"

එසේ පැවැසූ මගේ මිතුරා ඩ්රූරි සමග කැලෑරෝදට වැදී සැඟවුණේය. ගල්පඩි පෙළ මුදුනේ සිට "ෆර්ස්" නිවස දක්වා, වැටී තිබුණේ පටු පාරකි. මම තනිවම එහි ඉදිරියට ගියෙමි.

හෝම්ස් මට පැවසුවේ, මායි මෙනෙවිය ආපසු ගෙදර පැමිණීම හැකිතරම් ප්‍රමාද කළයුතු බවයි. එය ඉටු කිරීම සඳහා මා කුමක් කළ යුතු ද? මම ඒ ගැන කල්පනා කළෙමි. ඉක්මනින් ඇවිද යාමට මට අපහසු බවක් කීවොත්, ඇය ඒ ගැන සැක නොසිතනු ඇත. කකුලේ වළලුකර සන්ධිය ළඟ උළුක්කුවීමක් කීවොත්? එවැනි ආබාධිත තත්ත්වයකදී ඉක්මනින් ඇවිද යා නොහැක. එබැවින් මා "ෆර්ස්" මැඳුර වෙත ළඟාවූයේ එක් කකුලක් කොරගසමිනි.

නිවස ඉදිරිපට "ෆර්" ගස් විශාල සංඛ්‍යාවක් වවා තිබිණ. නිවසට ඒ නම ලැබෙන්නට ඇත්තේ එයින් විය යුතුය. මහා සාගරය දෙසින් හමා ආ වේගවත් සුළඟ අවහිර කිරීමේ අරමුණෙන් ඔවුන් මේ ෆර් ගස් සිටුවන්නට ඇත. එහෙත් කාලයත් සමග උස්ව වැඩුණු ඒවා නිසා, මිදුලට හා ආලින්දයට වැටෙන ආලෝකය සෑහෙන තරම් දුරට කපාහැරීමට ඒවා සමත්වී තිබිණ. ඒ නිසා නිවසේ තිබුණේ අන්ධකාර මුස්පේන්තු බවකි. ඉදිරියෙන්ම තිබූ ආලින්දය, සම්පූර්ණයෙන්ම ලෑලි වලින් තැනූ එකක් විය. කොරගසමින් ඇවිද ආ මම, තරප්පු කිහිපය අපහසුවෙන් නැග ඉදිරි දොරට තට්ටු කළෙමි.

මඳවේලාවකට පසු දොර විවෘත කරනු ලද්දේ කාන්තාවක විසිනි. ඇගේ හිසකෙස් පැසී සුදුපැහැ වී තිබූ අතර කහ - දුඹුරු පාට සම රැලිවැටී තිබිණ. ඇය චීන හෝ ජපන් සම්භවයක් තිබූ තැනැත්තියක බව ඇගේ මුහුණේ පෙනුමෙන් කියාගැනීම අපහසු නොවීය.

දකින්නට ලැබුණු අනතුර ගැන මම ඇයට දැනුම්දුන්නෙමි. ඇගේ දෑස් තරමක් විශාල වූ අතර, දෙතොල් වෙවුලන්නට පටන්ගත් බැව් මම දුටුවෙමි. එහෙත් ඊට වඩා කලබලයක් ඇගෙන් පළනොවීය.

"මේ හරියෙ දුරකතනයක් තියෙන්නෙ කොහේද?" මම ඇසීමි. "මං මේක පොලීසියට දැනුම්දෙන්න ඕන"





"මේ ගෙදරට නම් දුරකතන පහසුකම් නෑ" ඇගේ ඉංග්‍රීසි උච්චාරණයේ එතරම් අමුත්තක් නොවීය. "මං ඉක්මනට එනතුරු ඔහොම ඉන්න."

ගෙය ඇතුළට එන මෙන් ඇය මට ආරාධනා නොකළාය. ගේ දොරකඩ බලාසිටි මට, එහි අඳුරු විසිත්තකාමරය දකගන්නට ලැබිණ. එහි බිත්තිවල එල්ලා තිබූ චීන දියසායම් චිත්‍ර හා චීන පිඟන් මම දුටුවෙමි. නිවස ඇතුළතින් ඇය පිරිමියෙකු හා කතාබහ කළ හඬක් ඇසුණේ යයි මම සිතුවෙමි. එහෙත් ඒ ගැන මට නිශ්චිතවම පැවසිය නොහැක.

මඳ වේලාවකින් ඇය එළියට ආවේ දෙදොර වැසෙන සේ පටලාගත් සළුවක් ද ඇතිවය. "සර් මෙහෙව්වන්න මං ඔබත් එක්ක එන්නම්" ඇය කීවාය. ඇය නිවසෙහින් ඉබත්කරගෙන යාම සඳහා දැඩි උත්සාහයක් දැරීමට අවශ්‍ය නොවීණි.

එයින් පසුව සිදුවූ දෑ දීර්ඝ ලෙස විස්තර කිරීම අවශ්‍ය නොවේ. වතුපිටි හරහා, මායි මෙනෙවිය සමග, මම ට්‍රෙබවර් වෙත ගමන් කළෙමි. දේවගැතිතුමාගේ නිවසේ දී පොලීසියට දුරකතන පණිවුඩයක් දී ඇය සමග ආපසු පැමිණියෙමි. මගේ "පෙරළුණු" කකුල නිසා මා ගමන්කළේ, තැන් තැන්වල නැවතෙමින්, ඉතා සෙමින් ය. ඒ නිසා අපේ සම්පූර්ණ ගමනට පැය තුන්කාලක්වත් ගතවන්නට ඇත. සිය සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා හෝම්ස්ට ඒ කාලය ප්‍රමාණවත් වන්නට ඇතැයි මම විශ්වාස කළෙමි. අපි ආපසු "ෆර්ස්" නිවස වෙත පැමිණියෙමු. එහෙත් හෝම්ස්ගේ හෝ ඩ්රූරිගේ සලකුණක් නොවීය.

ආපසු පැමිණීමෙන් අනතුරුව කුඩා විසිත්ත කාමරයක් වෙත එන මෙන් මායි මෙනෙවිය මට ඇරයුම් කළාය. චීන සිතුවම් හා වෙනත් අරුමෝසම් බඩු වලින්, එය අලංකාර කොට තිබිණ. මා අසුනක වාඩිවෙද්දී, ඇය නිවස තුළට නොපෙනී ගියාය. සෑහෙන වේලාවක් යනතුරු ඇය ආපසු නොපැමිණියාය. මෙවර ගේ තුළින් මට අසන්නට ලැබුණේ, රහසින් කතාබහ කරන හඬවල් නොවේ. දොරවල් අරින වහන ශබ්දයන් ය. ගේ තුළ සැඟවී සිටි කිසිවෙකු සොයන්නාක් මෙන්, සෑම කාමරයක් පාසාම දොරවල් අරින හා යළි ඒවා වහන හඬ මට පැහැදිලිවම ඇසිණ. එයට හේතුවූයේ කුමක්ද යන්න, මට පසුව දැනගන්නට ලැබුණේ මගේ මිත්‍රයාගෙනි.

පැය භාගයක් පමණ ගතවිය. ෆොට්ස්විතින් පොලීසියේ සිට, පොලිස් භටයෝ දෙදෙනෙක් "ෆර්ස්" නිවස වෙත පැමිණියහ.

"හදිසි මරණයක් ගැන දුරකතන පණිවුඩයක් දුන්නෙ මේ මහත්තයද?"

"ඔව්"

"මහත්මයාගෙ නමයි ලිපිනයයි කියන්න"

මම ක්ෂණින් ඇන් විරීයේ, මගේ නිවසේ ලිපිනය ඔවුන් වෙත දුන්නෙමි.

"මෙහේ කෝන්වෝල් වල ඔබ නේවාසිකව ඉන්නේ කොහේද?" ඔවුහු විමසූහ.

"මෙහේ නැවතිලා නෑ" මම කීවෙමි. "අද උදේ පාන්දර මෙහේට ළඟාවුණා. පෙන්හිඩ් වේර්ලේ සංචාරය කරලා, අද හැන්දෑවෙ දුම්රියෙන් ලන්ඩන් බලා යන්නයි මං බලාපොරොත්තු වෙන්නෙ"

"වොට්සන් මහත්මයා, එහෙම නම් ඔබ පැදගෙන ආව බෝට්ටුවේ තිබෙන මළසිරුර, අපි මෙහාට අරගෙන එමු. ඒකට අපට උදව් කරන්න"

"ඒක නම් කරන්න මට අමාරුයි. ඒ මොකද ඔය ගල්පඩි පෙළ නගින්න ගිහින් මගේ කකුල පෙරළුණා. මං හිතන්නේ වළලුකර උළුක්කු වෙලා. මං ඇවිදගත්තොත් බොහොම අමාරුවෙන්"

"හොඳයි. හොඳයි. එහෙනම් කමක් නෑ" පොලිස්භටයෙක් කීය. "ඔබේ කට උත්තරයක් අපි ලියාගන්න ඕනේ. ඔබට කැමති නම් දැන් ගියාට කමක් නෑ. මරණ පරීක්ෂණ විභාගයට නම් ඔබට ලන්ඩනයේ ඉඳන් ආපසු එන්න වෙනවා."

"ඔව්, මම එන්නම්"

නිවසෙන් හා පොලිස්භටයන්ගේ දර්ශන පථයෙන් ඉවත් වූ පසු, කොරගැසීමේ අවශ්‍යතාවයක් මට නොවීය. අප නවාතැන් ගත් වෙරළාරක්ෂක නිවස වෙත, මම ඉක්මන් ගමනෙන් ගියෙමි. මා නොමැති අතර ෆර්ස් නිවසේ සිදුවූයේ කුමක්ද යන්න දැනගැනීමට, මම නොඉවසිල්ලෙන් බලාසිටියෙමි.

එසේ දීර්ඝ වේලාවක් බලාසිටීමට මට සිදු නොවීය. පැයක් ගතවීමට පෙර, මගේ මිතුරා ආපසු පැමිණියේය.

"පුටු දෙකකුත් අරගෙන අපි එළියට බහිමු වොට්සන්" ඔහු කීය. "වැට අයිනෙ පඳුරු පේළිය හුඟක් උසට වැවිලා තියෙන්නේ. ඒ





නිසා අපි ඉන්න බවක් කාටවත් පේනෙන එකක් නෑ. වොට්සන්. ඉස්සර වෙලා මට කියන්න ඔබ මුහුණ දුන්න අත්දැකීම. ඊටපස්සෙ මං කියන්නම් මගේ කථාව"

ෆර්ස් නිවසට ගිය තැන් සිට, මගේ අත්දැකීම මම ඔහුට විස්තර කළෙමි. ඔහු එයට සවන්දුන්නේ දැඩි උනන්දුවකිනි.

"අර මාතෘකා දහයක් ඔබ කඩදාසියක ලිව්වා නේ" මම කීවෙමි. "දැන් මං කැමතියි අන්න ඒක දැනගන්න"

"මගේ හිතවත් මිත්‍රයා, ඒ හැමදෙයක්ම මං ඔබට තේරුම් කරල දෙන්නම්" කී හෝම්ස් ඔහුගේ කබා සාක්කුවට අත දමා පයිප්පය හා දුම්කොළ පසුම්බිය එළියට ගත්තේය. ඔහු කාටව ඇරඹුවේ පයිප්පයේ කෝච්ච පුරවා, එය දල්වා ගැනීමෙන් අනතුරුවය.

"ඔබට මතක ඇති සර් ඩග්ලස් කැලිස්ටර්, බ්‍රිතාන්‍ය තානාපතිවරයා හැටියට දිගු කාලයක් ජපානයේ සේවය කර ඇති බව. ඒ නිසා මගේ උපකල්පන දාමය පටන්ගත්තේ ජපානයෙන්. ජපානයේ "නෝ" නාට්‍ය කලාව ගැන, සර් ඩග්ලස් පොතක් ලියා ඇති බව මට මතක් වෙයිකොෆ්ට්. ඉතින් මං අනුමානය කළේ, සර් ඩග්ලස් ලියා ඇති පොත් කියවා බැලීමේ අරමුණෙන් මං උදේවරුවක්ම ගතකළේ බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ. එතැනදී මට දැනගන්න ලැබුණා සර් ඩග්ලස්, එකිනෙකට වෙනස් මාතෘකා ඔස්සේ පොත් ගණනාවක් ලියා ඇති බව. එයින් එක් පොතක් ලියා තිබෙන්නේ ජපානයේ එක්තරා දූපතක, මසුන් අල්ලා ජීවත්වෙන ජනතාව ගැන. ඒක අපට වැදගත් වෙන්නේ කොහොමද කියලා මං ඔබට පසුව කියන්නම්.

ඔබට මතක ඇති මගේ උපකල්පන දාමයේ අංක 2 - ප්‍රංශය. ඒක සම්බන්ධවෙන්නේ, පහුගිය ගිම්හාන සෘතුවේ මොරිස් කැලිස්ටර් ප්‍රංශයට කළ සංචාරයට. එහිදී ඔහු ප්‍රංශයේ ඈත පිටිසර පෙදෙස්වල නගරයෙන් නගරයට සංචාරය කළා. මේ සංචාරයේ අරමුණ මොකක්ද? ඒක කොහොමද අපට වැදගත් වෙන්නේ? මං ඒ ගැන කල්පනා කළා. මේ නගරවල ඔහුගේ සිත් ඇදගන්නා දේවල් තිබෙන්නේ මොනවද? මං විදුලිපුවතක් යැව්වා පැරිසියේ ඉන්න මගේ හිතවතෙකුට. මං අහල ඇරියේ මේ නගර එකට සම්බන්ධ කරන මොකක් හරි සාධකයක් තියෙනවද කියලා. ඔහු එම ප්‍රදේශවලට අයත් ප්‍රාදේශීය පුවත්පත් පෝදිලීකර තිබුණා. ඒකෙදී ඔහුට දැනගන්න ලැබිල තිබුණේ, මං කිවූ නගර හැම එකකටම, ඔය කියන කාලෙ

සර්කස් කණ්ඩායමක් සංචාරය කර ඇති බව. ඔය කණ්ඩායමේ ඉන්නවා පියරි ලෙබ්ලැන්ක් නම් සර්කස් රංගන ශිල්පියෙක්. අපේ මොරිස් කැලිස්ටර් මේ ලෙබ්ලැන්ක් සමග හිතවත්කමක් ඇතිකරගෙන තිබුණා. අපි ලන්ඩන් වලින් ගෙන්වාගත්තු දෙවැනි වරෙන්තුව ලෙබ්ලැන්ක් අත්අඩංගුවට ගැනීම සඳහා.

මගේ උපකල්පනය දම්මේ අංක 3- සර්කස්. අංක 4- මායි මෙනෙවියගේ ආහාරද්‍රව්‍ය ඇණවුම. දැන් ඔබට පෙනෙනවා ඇති, ඇය මේ තරම් ලොකු ආහාර ඇණවුමක් දුන්නෙ ඇයි කියල. පැහැදිලිවම ලෙබ්ලැන්ක්ටත් එක්ක."

"ලෙබ්ලැන්ක් ප්‍රංශයේ ඉඳල කෝන්වෝල්හි කැලිස්ටර් නිවසට කැඳවාගෙන ඇවිත් එමන් නැවැත්තුවා." මම කීවෙමි. "ඒ ටික පැහැදිලියි. නමුත් ලෙබ්ලැන්ක් සහ ජපානය අතර තියෙන සම්බන්ධය මොකක්ද?"

"ඔබට ඒක පෙනෙන්නෙ නැද්ද වොට්සන්? කමක් නෑ. අපි යමු අංක 5, 6, 7, 8 වෙතට. ප්‍රදීපාගාරය, මාගරීටා බෝට්ටුව, කැමකුඩය සහ බාල්දිය"

"හෝම්ස් කැමකුඩයේ නම් අපට දකින්න ලැබුණා ලොකු පක්ෂියෙක්"

"හරියට හරි මගේ මිත්‍රයා. නමුත් ඌ අපට බහුලව හමුනොවෙන ඉතාම සුවිශේෂ මුහුදු පක්ෂියෙක්. ඒ තමයි ෆැලක්‍රොකොරැක්ස් කාබෝ ගෝත්‍රයට අයත් කෝමොරන්ට් නම් පක්ෂියා. ප්‍රංශය, ජපානය, සර්කසය සහ මගේ උපකල්පන දම්මේ අවසන් අංක දෙක, ඔක්කොම එකට සම්බන්ධ කරන්නේ අන්න ඒ නූල.

සමහර ජපන් දූපත්වල ධීවර ජනතාව මාළු ඇල්ලීම සඳහා කෝමොරන්ට් පක්ෂියාව පුහුණුකරල තියෙනවා. මේක බොහොම කාලයක ඉඳල යුරෝපීයයේ අය දැන හිටි කරුණක්. නමුත් මේක ගැන ගැඹුරින්ම අධ්‍යයනය කරල පොත්පිංචක් ලියුවේ සර් ඩග්ලස් කැලිස්ටර්. කෝවස් මැරිනස් නමින් ලතින් භාෂාවෙන් මේ පක්ෂියාව හඳුන්වනවා. එහි තේරුම මුහුදු කපුටා යන්නයි. උන්ගේ උගුරේ තියෙනවා අනෙකුත් බොහෝ පක්ෂීන්ට නැති, එක්තරා විශේෂ කොටසක්. ඒ තමයි කුඩා ආශයක්, නැත්නම් මල්ලක් හෝ සාක්කුවක් වගේ එකක්. ඒකෙ පුදුමාකාර තරමක් ලොකු මාළුවෙකුව ගිලදමන්නේ නැතිව රඳවාගන්න. ධීවරයන් මොකද කරන්නේ, මේ කුරුල්ලාගේ





උගුරේ පහළ කොටසට මුද්දක් වගේ එකක් දමල හිරකරල තියෙනවා. ඊළඟට ලණුවකින් ගැට ගැසූ කෝමොරන්ට් ව මුහුදට බස්සුවාම, ඌ මාළුවෙකු කටින් අල්ලාගෙන ගිලිනවා. ඒක අර ආශයේ නවතිනවා. අර හිරකරලා තියෙන මුද්ද නිසා මාළුවා සම්පූර්ණයෙන්ම ගිලදමන්න පක්ෂියාට බැහැ. එතකොට ධීවරයන් ගැටගසා ඇති ලණුවෙන් කෝමොරන්ට් බෝට්ටුව වෙත ඇදගෙන, ආශයේ තිබෙන මාළුවා ඉවත්කරගෙන, ඌව යළිත් වරක් මුහුදට දමනවා. ඒ තවත් මාළු ඇල්ලීම සඳහා.

කැලිස්ටර් ප්‍රංශයේ නගරයෙන් නගරයට ගිහිං සර්කස් නැරඹුවා. සර්කස් කණ්ඩායමේ ලෙබ්ලැන්ක්ට භාරව තිබූ කටයුත්ත මොකක්ද? ඔහු තමයි පක්ෂීන් පුහුණුකාරයා. උන් සර්කස් වැඩට යොදගත්තේ. සර්කස් ශාලාවේ හා වේදිකාව පිටුපස පරෙවියන් සඟවා තබලා, යම් යම් සංඥාවලින් උන් ප්‍රේක්ෂකයන් ඉදිරියට ගෙන්වා ගැනීම සර්කස් වල අපට දකින්නට ලැබෙන රංගනයක්. එම සර්කස් කණ්ඩායමේ මේ කටයුත්තත්, පක්ෂීන් පුහුණු කිරීමත් කළේ ලෙබ්ලැන්ක්. මේක දුටුවාම ඔහුගෙන් ප්‍රයෝජනගත හැකි ආකාරයක් කැලිස්ටර්ට තේරුම් යන්න ඇති. සුපිරි සම්මැලීනය නිෂ්පාදනයේ තාක්ෂණික රහස් ඔක්කොම, තමන්ගේ මිතුරු ඔටෝ හොඑකර්ට යවන්න, කැලිස්ටර්ගේ හිතේ බලාපොරොත්තුවක් තියෙන්න ඇති. ඒවා යැවීමේ ක්‍රමයක් තමයි ඔහුට නොතිබුණේ. කෝමොරන්ට් ගැන හැමදෙයක්ම කැලිස්ටර් දැනගිටියා. ආශයෙන් පුදුමාකාර වැඩ සඳහා පරෙවියන් පුහුණුකරන්න ලෙබ්ලැන්ක්ට හැකි නම්, මුහුදු පක්ෂියෙකු පුහුණු කරන්න ඔහුට බැරි ඇයි? උගේ උගුරේ රැඳෙන මාළුවා වමාරන්න කෝමොරන්ට්ට හැකි නම්, ඇයි ඌට පුංචි ලේඛනයක් වමාරන්න බැරි?"

මේ පරීක්ෂණය අත්හදා බැලීමට අවශ්‍ය හැම පහසුකමක්ම විද්‍යාඥයාට තිබුණා. පාළු පළාතක, පාළු අඩවියක පිහිටි ගෙයක්, අත්හැර දැමූ ප්‍රදීපාගාරයක්, මුහුදු වෙරළ අසබඩ ස්වාභාවිකව ගැවසෙන කෝමොරන්ට් පක්ෂීන්. ගාස්තුව වශයෙන් විශාල මුදලක් ගෙවන්න කැලිස්ටර් පොරොන්දු වුණා නම්, ලෙබ්ලැන්ක් ඒකට කැමතිවෙන්න ඇති. ඉතින් සැලැස්ම ක්‍රියාත්මක වුණා.

ප්‍රංශයේ ඉඳිද්දී කැලිස්ටර් මේ සැලැසුම ගැන තමන්ගේ මිත්‍රයාට පැහැදිලි කරල දෙන්න ඇති. මිලන්දයේ ලියාපදිංචි කළ ධීවර



www.sinhalaelibrary.com
Reading Purpose Only.. Not For Print

බෝට්ටුවක අවශ්‍යතාවය ගැනත් කියන්න ඇති. පහුගිය ග්‍රීෂ්ම සෘතුවේ ඔහු හොර රහසේම ලෙබ්ලෑන්ක් එංගලන්තයට කැඳවා ගත්තා. කාටවත් නොපෙනෙන විදියට ඔහුව "ෆර්ස්" නිවසේ සඟවාගෙන ඔහු ක්‍රියාත්මක වෙන්න ඇති. ඔවුන් උගුල් අටවලා, කෝමොරන්ට් පැටවුන් කිහිපදෙනෙකු අල්ලාගන්න ඇති. ඊට පස්සේ උන්ට කෑම දෙමින් හීලෑකරගෙන තමන්ගේ රහසිගත කටයුත්තට පුහුණු කරගන්න ඇති.

මගේ උපකල්පන දම්වැයේ ඉතිරි හරිය පැහැදිලි කරන්න අවශ්‍යද වොට්සන්? හරි. ඔබට උවමනා නම් මං කියන්නම්. කෝමොරන්ට් පක්ෂියා යම් යම් සංඥා වලට අවනත වන ලෙස පුහුණු කරලයි ඉන්නේ. ඌව කැමකූඩයට දමාගෙන, කැලිස්ටර් උදෙන්ම ගෙදරින් පිටවෙනවා. ඔහු යන්නේ ප්‍රදීපාගාරයිට. එදාට ඔහුට යවන්න උවමනා කරන සබ්මැරීන නිෂ්පාදනයේ අලුත්ම තොරතුරු, ඔහු කොළයක ලියලා, ඒක බොහොම කුඩාවෙන්න රෝල්කරලා, සේද රෙදිවලින් තැනූ කුඩා මල්ලට දමනවා. ඊළඟට පක්ෂියාට ඒක ගිලින්න බැරි විදියට අර මුද්ද තද කරලා, සේද මල්ල උගේ කටට දමනවා. ඌ ඒක අර ආශයේ රඳවාගන්නවා. මීළඟට පක්ෂියාව අර කැමකූඩය ඇතුළේ සඟවාගෙන ඔහු මුහුද අයිනට යනවා, ඔහු කුරුල්ලන්ට පරණ පාන් දමන්නේ, කූඩය වතුරට පහත්කරලා. පිටතට පෙනෙන්නේ ඒක. නමුත් ඒ අතරේ ඔහු රහසේම පක්ෂියාව කූඩයෙන් නිදහස් කරනවා. අර තරම් උණුසුම් වෙලාවෙත් ඔහු වැහිකබායක් ඇඳගෙන ඉන්නේ, දැන් දෙපැළට පිහිදූමාම ඔහුගේ කටයුතු ආවරණ කරගත හැකි නිසා. ඔහු දමන පාන් කන්න එන මුහුදු ලිහිණින් අහසේ ඉගිලෙන අතරේ, කෝමොරන්ට් මුහුදේ පිහිනාගෙන යනවා. නමුත් ඒක අපට පෙනෙන්නේ නෑ.

ඔබට මතකද අර "මාගරීටා" බෝට්ටුවේ පයිප්පයක් බිබී හිටිය මිනිහා? ආරක්ෂක වැඩ ළඟ, ඔහු හැමවිටම තියාගෙන ඉන්නේ එකම අත. අනෙක් අතින් ඔහු මොකක්ද කළේ? ඒකෙන් ඔහු බිලී පිත්තක් ක්‍රියාත්මක කළා. ඒ බිලීපිත්තේ දිග යොත්පොට කෙළවරට අමුණලා ඉන්නේ, දීප්තිමත් වර්ණයෙන් යෙදූ කෘතිම මාළුවෙක්. මේ මාළුවා ගොයාගෙන ඌ වෙතට ළං වීමට කෝමොරන්ට්ව පුහුණුකරලයි ඉන්නේ. ඌ අර බෝට්ටුවට ළංවෙලා මාළුවා ගිලදමන්න හදනකොට තමයි, මාගරීටා බෝට්ටුවේ දෙවැනි මිනිහා එන්නේ.





ඔහුගේ අතේ තියෙනවා බාල්දියක්. ඔහු ඒකෙ තිබුණු දේ මුහුදට හලලා, මුහුදු වතුර බාල්දියක් ගන්නවා වගේ, ගන්නේ කෝමොරන්ට්ව, බෝට්ටුවේ කැබින් කාමරය වෙත ඌ අරගෙන ගිහිං, උගේ උගුරේ සඟවලා තියෙන රහස් ලියවිල්ල ඉවතට ගන්නවා.

එද රෑට බෝට්ටුවේදී උගේ උගුරට දමන්නේ හොවකර්ගේ පණිවුඩය සහිත ලියවිල්ල. සබ්මැරීන නිෂ්පාදනයේ තමන්ට පැහැදිලි නැති තැන් වල විස්තර, ජර්මන් මිත්‍රයා, කැලිස්ටර්ගෙන් අහලා එවනවා ඇති. ඉතින් ආපුවද උදේට මාගරීටා බෝට්ටුවේ මිනිහා, බාල්දිය මුහුදට පහත්කළ වහාම, ඌ මුහුදේ පිහිනාගෙන යනවා, කැලිස්ටර් වෙත.

ඔහු ඊළඟට කළ දේ මතක් කරලා බලන්න වොට්සන්. ඔහු බිලීපිති දෙක වෙත පහත්වෙලා, ඒකෙ ඇමිනිලා ඉන්න මාළුවා ගලවා ගන්නවා. ඒක පක්ෂියාට ආපහු එන්න දෙන සංඥවක්. ඔහු වැහිකබායේ ආවරණය ඇතිව මොකක්ද කරන්නේ? තමන් වෙතට ගෙන්වාගත් පක්ෂියා කූඩයට දමා ගැනීම. ප්‍රදීපාගාරයේ කුටියට ඌ ගෙනගියාම, ඌ අරගෙන ආ පණිවුඩය සහිත කුඩා මල්ල වමාරනවා. ඒක තමයි මට අර කාමරයේ මේසය මත තිබී හමුවූ රෝල් කළ කඩදාසි කැබැල්ල. මොරිස් කැලිස්ටර් මේ විදියට අපේ රාජ්‍ය රහස් විදේශයකට දෙන බව, මයික්‍රෝෆිල්ම් හැක හීනල තියෙන්නෙ මැකසඳි නේ. ඊට කලින් ඉඳලම කැලිස්ටර් ක්‍රියාත්මක වෙලා තියෙනවා. ඒ කියන්නේ "මාගරීටා" බෝට්ටුව, පෙන්හිවි මුහුදු තීරයේ නැංගුරම් දමා තිබීම සහ කැලිස්ටර් බිලීපිති ඇටවීම පටන්ගත් ද ඉඳල.

ඔහු පුදුමයට පත්කරමින් අපි කැලිස්ටර් වෙත කඩාපැන්නේ නැත්නම් මොකක්ද සිදුවෙන්නේ? එහෙම නම් කැමකූඩය ඇතුළේ දමාගෙන කෝමොරන්ට් පක්ෂියා ෆර්ස් මැඳුර වෙත ආපහු ගෙනයාවි. ගෙනිහිං, "මාගරීටා" මුහුදුතීරයේ නැංගුරම් දන්න එනතුරු ඌව ගෙදර තබාගනීවි. ඊට පස්සෙ සබ්මැරීනය වෙනුවෙන් එංගලන්තයේ කළ අලුත්ම සොයාගැනීම්, සැලසුම් ඔළෝ හොවකර් වෙත යවාවි.

අතිදක්ෂ සැලසුමක්. එහෙම නේද මිත්‍රයා? මං මේ දේවල් සිදුවෙයි කියල උපකල්පන මගින් ගොඩනැගුවා. නමුත් ඒවා සියයට සියයක්ම නිවැරදිද කියල කොහොමද දැනගත්තේ? අද උදේ අත්අඩංගුවට ගත් පියර් ලෙබ්ලෑන්ක්, අපි පෙන්හිවිනින් පොලීසියට අරගෙන ගියා. එහේදී දිගින් දිගටම ඔහුගෙන් කළ ප්‍රශ්න කිරීම්වලට, ලෙබ්ලෑන්ක්

පිළිතුරු දුන්නා. මා සිතූ පිළිවෙළ ඉතාම නිවැරදි බව එයින් තහවුරු වුණා."

"කාටත් නොපෙනෙන විදියට "ෆර්ස්" මන්දිරයෙන් ඔහුව අරගෙන ගියේ කොහොම ද?"

"ඒක එච්චර අමාරු වුණේ නැහැ මිත්‍රයා" හෝම්ස් කීය. කැලිස්ටර්ගේ මරණය ගැන ඔහු මායි මෙනෙවියගෙන් දැනගත්තා. අපි ඒක ස්ථිරකරලා, කැලිස්ටර් සිදුවීම් නාගත් විස්තර හෙළිකළා. ඊළඟට ඔවුන් සිදුකළ මහාවංචාවේ හොරකුරු එළිදරව් වී ඇති බව දැනගත්තාම, පියර් ලෙබ්ලැන්ක්ට විකල්පයක් තිබුණේ නැ. අපි ඔහුට කිව්වා, මායි මෙනෙවියට මේ විදියට ලියුමක් ලියා තබන ලෙසට.

**"කැලිස්ටර්ගේ මරණයේ අද්භූත සැකකටයුතු ස්වභාවය නිසා පොලිස් පරීක්ෂණයක් වහාම පැවැත්වීමට ඉඩ ඇත. මේ නිසා මා වහාම එංගලන්තයෙන් පිටව් යා යුතුයි. කෙටි පාරවල් මගින් පෝට්ස්විතින් ධීවර වරාය දක්වා යාමට මං බලාපොරොත්තු වෙනවා. එතැනදී ධීවර බෝට්ටුවකින් ප්‍රංශයට පැනයාමට මට හැකිවේවි.**

**ලෙබ්ලැන්ක්"**

"හරි, මට දැන් තේරෙනවා හෝම්ස්" මම කීවෙමි. "ආපහු "ෆර්ස්" වෙත ගිය වෙලාවේ ඇය කාමර ගණනාවක දෙරවල් අරිමින් ලෙබ්ලැන්ක්ව හෙව්වා. ලියුම හමුවුණාට පස්සෙ තමා ඇගේ ඒ කටයුත්ත නවතින්න ඇත්තේ, ලෙබ්ලැන්ක්ට අත්වෙන්නෙ මොන වගේ ඉරණමක්ද?"

හෝම්ස් තම සාක්කු ඔරලෝසුව අතට ගෙන වෙලාව පරීක්ෂාකර බැලුවේය.

"පොලිස් පරීක්ෂක ඩිරූරි සහ සාජන්ට් මැක්ග්‍රෙගෝ දෙදෙනාට මැදිව්, ලෙබ්ලැන්ක් මේ මොහොතේ ලන්ඩන් බලා යනවා. ඔහුව වයිට්හෝල්හි මයික්‍රොෆ්ට්ගේ කාර්යාලය වෙත ගෙනයාවි. එතැනදී ඔවුන් ප්‍රංශ ජාතිකයාගෙන් දිගින් දිගටම ප්‍රශ්න කරාවි. අන්තිමේදී ඔහු කරන ප්‍රකාශය දීර්ඝ කථාන්තරයක් ලෙස සකස්වෙනවාට සැක නැ. කොහොමටත් ඔහු දින කිහිපයකට බන්ධනාගාර ගතවේවි, එංගලන්තය හා ප්‍රංශ ආණ්ඩු අතරේ සාකච්ඡාවක් ඇතිවෙලා, යම්කිසි එකඟතාවයකට ආවට පස්සේ තමයි, ලෙබ්ලැන්ක්ට නිදහස ලැබෙන්නේ. නීති විරෝධී ලෙස මෙරටට ඇතුළු වුණු පුද්ගලයෙකු කියලා එතකොට ඔහුව එංගලන්තයෙන් පිටුවහල් කරාවි."





"ඔහු මේ කථාන්තරය ප්‍රසිද්ධ කළොත් මොකක් සිදුවේවිද හෝම්ස්?" මම ඇසීමි. "බාග වෙලාවට ඔහු ඒ කථාව සතිඅන්ත පුවත්පතකට විකුණන්න ඉඩතියෙනවා"

"රටවල් වල ආණ්ඩු අතරේ වැඩකටයුතු සිදුවෙන පිළිවෙළ ගැන ඔබට දැනීමක් නැති හැඩයි වොට්සන්" හෝම්ස් කීවේ උපහාසාත්මක අයුරෙන් සිනාසෙමිනි. "රජ්‍යන් අතරේ සිදුවෙන හැම ගනුදෙනුවක්ම ලෝකයට හෙළිකරන්නේ නැ. ඒවා සම්පූර්ණ අතිශය රහසිගතයි. ලෙබ්ලැන්ක් ආපහු ප්‍රංශයට ගියාම, ඔහු එක වචනයක් කථාකරන්නේ නැ. ඒක සහතිකයි. ඒ මොකද කථා කළොත් ඒකට, තමන්ගේ ජීවිතෙන් වන්දිගෙවන්න සිදුවේවි කියන අනතුරු ඇඟවීම ගැන ඔහු දන්නවා. ඒ නිසා ඔහු නිශ්ශබ්දව ඉදීවි."

"මාගරීටා" බෝට්ටුවට මොකද වුණේ?" මම ඇසීමි.

"බෝට්ටුවට කඩාවැදිල, පොලීසිය සම්පූර්ණයෙන්ම ඒක සෝදිසි කළා" හෝම්ස් කීය. "ඔටෝ හොෂ්කර්ගේ නියෝජිතයෙකු කියල අපි හිතන සෙයිස් නම් පුද්ගලයෙකු සහ තවත් කිහිපදෙනෙකු හමුවුණා. ඔවුන්ගෙන් දිගින් දීගටම ප්‍රශ්න කරල තියෙනවා. බෝට්ටුවේ සඟවා තිබුණු ලියකියවිලි වගයක්, අත්අඩංගුවට අරගත්තාලු. ඊට පස්සේ බෝට්ටුවට ආපහු ඕලන්දය බලා යන්න අවසර දීල තියෙනවා. ඔවුන්ගෙන් ලබාගත් ලියකියවිලි වැඩිදුර පරීක්ෂාව සඳහා ඩිරූරි අතේ ලන්ඩනයට යවනවා. මේ වෙලාවේ ඕලන්දය සමග අමනාපයක් ඇතිකරගන්න අගමැතිතුමා කැමැති නැ. ඒ නිසා හොර බඩු ප්‍රවාහණය කියන චෝදනාව ඉදිරිපත් කරන්න හිටියා වුණත්, ඒක ඉවත්කර ගන්නවා.

වොට්සන්, මීළඟට අපි එන්නේ ඔබ සම්බන්ධ කටයුත්තට."

"මං සම්බන්ධ කටයුත්තට? ඒ මොකක්ද?"

"ඇයි කැලිස්ටර්ගේ මරණය ගැන පැවැත්වෙන මරණ පරීක්ෂණ විභාගය? ඒකෙදි ඔබට සාක්ෂි දෙන්න සිදුවෙනවා, නොවැ?"

"ඔව්, ඒක හරි" මම කීවෙමි. "මගේ භය තියෙන්නේ හදිසි මරණ පරීක්ෂකයා, මගෙන් හාරහාරා ප්‍රශ්න කරාවිද කියලා. එහෙම කළොත් මයික්‍රොෆ්ට් හංගන්න හදන කාරණා ඔක්කොම එළියට ඒවි"

"බයවෙන්න එපා මිත්‍රයා" හෝම්ස් කීය.

"ඒ වගේ ප්‍රශ්න ඉදිරිපත් නොවෙන විධියට මයික්‍රොෆ්ට් හැමදෙයක්ම සූදානම් කරාවි"

මගේ මිත්‍රයාගේ ඒ අනාවැකිය සැබෑවක් බවට පත්විය. මයික්‍රොෆ්ට් හෝම්ස්ගේ අධීක්ෂණය යටතේ සත්‍ය සිදුවීම වසාදැමීමට කටයුතු කෙරිණ.

සුප්‍රකට ෂර්ලොක් හෝම්ස්වත්, එරුරි ඇතුළු පොලිස් නිලධරයන්වත්, කෝන්වෝල් වෙත ගිය බවට වචනයකින් හෝ සඳහනක් නොවිය. මෙම මරණය වූ එකම පුද්ගලයා කෙටි නිවාඩුවකට කෝන්වෝල් බලාගිය වොට්සන් නම් දෙස්තර මහතෙකු පමණක් බව පුවත්පත්වල පළවිය.

මරණ පරීක්ෂණ විභාගයේදී මගෙන් අසන ප්‍රශ්න හා මා ඒවාට දියයුතු පිළිතුරු මයික්‍රොෆ්ට් මට කියාදී තිබිණි.

"මං කුරුල්ලන් ගැන උනන්දුවක් දක්වන කෙනෙක්" කෝන්වෝල්හිදී ජූරිය ඉදිරියේ මම කීවෙමි. "මුහුදු කුරුල්ලන්ගේ චර්යා රටාව නිරීක්ෂණය කරන්නයි මං කෝන්වෝල් වෙත ආවෙ. පෙන්ගිඩි බොක්කේ බෝට්ටුවක පදිමින් ඉන්නකොට මං දුටුවා මේ අනතුර. ප්‍රදීපාගාරය මුදුනේ ඉඳල කවුදෝ පහළට ඇද වැටුණා. මං බෝට්ටුව ගොඩබිමට ගෙනැවිත්, ඒ පුද්ගලයාට ප්‍රථමාධාර දෙන්න උත්සාහ කළා. නමුත් ඒ වනවිටත් ඔහු මියගිහින්. මං ඔහුව හඳුනන්නේ නෑ."

මගේ සාක්ෂිය ප්‍රශ්න කිරීමකින් තොරව පිළිගැනිණි. මරණය හදිසි අනතුරකින් සිදු වූ එකක් බවට නිගමනය විය.

අනුන්ගේ හුටපට හා මිථ්‍යාදෘෂ්ටික හාරා අවුස්සන "ඩේලි ප්ලැනට්" නම් පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයා වූ බිල් සහ හියුගෝ කැලිස්ටර් මන්ත්‍රීතුමා ද මරණ පරීක්ෂණ සඳහා පැමිණ සිටියහ. පසුවද උදෑසන "ඩේලි ප්ලැනට්" පුවත්පතේ මුල් පිටුවේ සිරස්තලය වූයේ

"රහසිගත පරීක්ෂණවල යෙදුණු විද්‍යාඥයා අභිරහස් ලෙස වැටී මියයයි!"

නවීන තාක්ෂණය සහිත සුපිරි සබ්මැරීනය නිර්මාණය කිරීමේ කටයුත්තේ නියැළි වූ මොහු අති දක්ෂ විද්‍යාඥයෙකු බවට එහි සඳහන්ව තිබිණ. සත්‍යය වසන් කිරීමට රජය උත්සාහ දරතත්, මෙය කිසිසේත් හදිසි අනතුරක් නොවන බවට එම පුවත්පතේ ඉඟිකොට තිබිණ.





තම සොහොයුරාගේ මරණය සිදුවූ ආකාරය ගැන ගැඹුරෙන්ම සොයා බැලීමට කොමිසමක් පත්කරන ලෙස, හියුගෝ කැලිස්ටර් මන්ත්‍රීවරයා රජයෙන් ඉල්ලාසිටියේය. එහෙත් අග්‍රාමාත්‍යවරයා කියා සිටියේ මෙය පසුපෙළ විපක්ෂ මන්ත්‍රීවරුන් හා විකල්ප පුවත්පත් එකතු වී, ආණ්ඩුවට මඩ ප්‍රහාරයක් එල්ල කිරීමට දරන උත්සාහයක් බවයි.

මෙහිදී මට අතිශයින්ම දුෂ්කර කාල පරිච්ඡේදයකට මුහුණදීමට සිදුවිය. මගෙන් කටඋත්තර ගැනීමට හා සාකච්ඡා ලබාගැනීමේ අරමුණෙන්, පුවත්පත් වාර්තාකරුවෝ, කවිඳින් ඈත් වීථියේ මගේ නිවාසයට කඩාවැදුණහ. මයික්‍රොෆ්ට්ගේ උපදෙස් පිට මම ගෙදරින් ඉවත්වී, බෙස්වෝටර්හි හෝටලයක, බොරු නමකින් තාවකාලිකව ලැගුම් ගත්තෙමි. මා හෝටලයේ සිටින අතරතුර කිසිවෙකු මගේ නිවසේ නිදනකාමරයට කඩා වැදී, සියලුම ලියකියවිලි අවුස්සා තිබිණ.

හොරු කවුරු වුණත්, ඔවුන් මුදල්, ඔරලෝසු හෝ වෙනත් වටිනා බඩු හොරකම් කරගෙන යෑමට උත්සාහයක් දරා නොතිබූ බැව් මම දුටුවෙමි. එහෙයින් මට නිගමනය කළ හැක්කේ, මෙය සාමාන්‍ය ගෙවල් බිඳින හොරෙකුගේ වැඩක් විය නොහැකි බවයි. කෙසේ වෙතත් එම පුද්ගලයා වෘත්තීය හොරෙකු මෙන්ම දක්ෂයෙකු බව මට විශ්වාසය. නිවසේ පිටුපස ජනේලයක අගුළ විවෘතකරගෙන, ඔහු ගෙට ඇතුළු වී ඇත. ඉන් පසු මගේ ලියන මේසයේ ලාච්චුවක් හොර යතුරු වලින් ඇරගෙන, මගේ සටහන් පොතේ පිටු ගණනාවක් ඉරාගෙන ගොස් ඇති බැව් මට පෙනී ගියේය. මේවා කෝන්වෝල්හි දී අප මුහුණදුන් සිද්ධියට සම්බන්ධ, ගමන්බිමන් කාල සටහන් සිහිපයකි. එබැවින් මේවාට අදාළ පුද්ගලයින් කවුද යන්න සිතාගැනීමට මට අපහසු නැත.

මේ නින්දා සහගත කටයුත්ත ගැන මයික්‍රොෆ්ට හා ෂර්ලොක් හෝම්ස්ට දැනුම්දී මම ඔවුන් සමඟ සාකච්ඡා කළෙමි. ඔවුන්ගේ අදහස වූයේ මෙයයි. වෘත්තීය හොරදෙටුවකුට මුදලක් ගෙවා කවුරුන් විසින් හෝ මෙය කර ඇති බවයි. හොරකම මෙහෙය වූ පුද්ගලයා හියුගෝ කැලිස්ටර් වියයුතු බව මයික්‍රොෆ්ට්ගේ අදහස විය. තමන්ගේ නමට ඉදිරියෙන් "ගරු" යන නාමය දරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, මෙවැනි නින්දිත කටයුත්තක යෙදෙතැයි මට නම්

සිතාගැනීමටත් අපහසුය. එබැවින් "අද්භූත නේවාසිකයා" කථාව ආරම්භයේදී මේ ගැන සඳහන් කර ඇත්තෙමි. ඒ මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් එදා මට දුන් උපදෙස් අනුවය.

"දේශපාලකයා, පුහුණු කළ කෝමොරන්ට් පක්ෂියා හා ප්‍රදීපාගාරය ගැන සත්‍ය සිද්ධිය සඳහන් කරල ඔබේ කථාව ලියන්න වොට්සන්. ඊටපස්සේ ඒක ඔබේ "අතිශය රහසිගත" ලිපිගොනුවේ ගොනු කරලා, බැංකු සුරක්ෂිතාගාරයේ තබන්න. නුදුරු අනාගතයේදී නම් ඒක ප්‍රසිද්ධියට පත්කරන්න අවස්ථාවක් ලැබෙයි කියල හිතන්න අමාරුයි. නමුත් අපි ප්‍රාර්ථනා කරමු, ඊළඟ පරම්පරාවල බිහිවෙන අයවත්, මරාගෙන මැරෙන යුද්ධමය ආකල්පය වෙනස් කරල, අනෙකා සමග සුහදව සාමදානයෙන් ජීවත්වෙන්න තීරණය කරාවි කියල. එහෙම දවසක මේ කථාව ප්‍රසිද්ධ කළාට කමක් නෑ. නමුත් අපි දෙන්නාගේ ජීවිත කාලය තුළදී එහෙම කාලයක් එළඹෙයිද කියන එක නම් මට සැකයි වොට්සන්"





# රතු කුඩැල්ලා

ඒ 1902 වසරේ සැප්තැම්බර් මාසයේ දිනයකි. අප දහවල් ආහාරය අවසන් කළා පමණි. අහස අඳුරු වූ දිනයක් වූ එදා මගේ මිතුයා, උඩුමහලේ ජනේලය අසලට වී, බේකර් වීදියේ මහජනයා සහ රථවාහන එහා මෙහා ගමන් කරන හැටි බලා සිටියේය. එදා ඔහු සිටියේ මා සමග කතාබහ කිරීමටවත් නුරුස්සන සිතකිනි. හෝම්ස්, කල්‍යාණ මිත්‍රයා පරීක්ෂණයක් සාර්ථකව විසඳා වැඩිදවසක් ගතවී තිබුණේ නැත. එහෙත් විසඳීම සඳහා අලුතෙන් තවත් ගැටලුවක් ඉක්මනින් නොලැබීම ගැන, ඔහු ළතවෙමින් සිටියේය.

"වොට්සන්. මේ නගරයේ ඉන්නවා, මිලියන හතරක ජනකායක්. මේ සෙනග අතරේ කිසිම කෙනෙකුට නැද්ද, මට කියල විසඳගන්න ගැටලුවක්? ඒක හරි පුදුමයක්. අඩුම ගණනේ ගෙදර තියෙන රිදී හැඳි හැරැප්පු ටික අරගෙන හොරෙන් පැනලගිය සේවකයෙකු ගැන පැමිණිල්ලක්වත්?" මගේ මිත්‍රයා නැවතුණේ අඩක් හාස්‍යය මුසු ස්වරයකිනි.

මඳ වේලාවක් නිහඬව කල්පනා කරමින් සිටි ඔහු එක්වරම සතුටෙන් කෑගැසුවේය.

"හොහෝ වොට්සන්! අනුග්‍රාහකයෙක් එනවා! මේක හරියට මගේ දුක්ගැනවිල්ල සුරංගනාවකට ඇහිලා, මගේ ආයාචනය එහාම ඉටුකරන්න තීරණය කරල් වගෙයි."

"හෝම්ස්, කෝ ඔබ කියන අනුග්‍රාහකයා?" මා ඇසුවේ අතේ තිබූ ඩේලි ටෙලිග්‍රාෆ් පුවත්පත ඉවතට විසිකොට ඔහු අසලට යමිනි.

"අර අතන ඉන්නේ තරබාරු මහත්මයෙක්" හෝම්ස් කීවේ බේකර් වීදිය දෙසට අත දිගුකරමිනි. රෝද හතරේ ලොකු කුලීරියක පැමිණි හැඩිදැඩි මහත්මයෙක් රියැදුරාට මුදල් ගෙව්වේය. ඉන්පසු ඔහු වීථිය දෙපස නිවාසවල අංක දෙස විමසිල්ලෙන් බලන අයුරු අපි දුටුවෙමු.

"ඒ ඔබේ අනුග්‍රාහකයෙක් කියල කොහොමද ඔබ ඔය තරම් විශ්වාසෙට කියන්නෙ?" මම ඇසීමි.



www.sinhalaelibrary.com

"මේ මහත්මයා ඇඳපැළඳගෙන ඉන්නෙ, නගරයේ රාජකාරි සඳහා සුදුසු විදියටයි" හෝම්ස් කීය. "බේකර් වීදියට අප හමුවන්න එන කෙනෙක් අඳින්නෙ එහෙම නෙමෙයි. හදිසියේම මතුවුණු මොකක් හරි ප්‍රශ්නයක් නිසයි, ඔහු ඒ ඇඳුමෙන්ම අප හමුවෙන්න එන්න තීරණය කරලා තියෙන්නෙ. මේ වගේ වෙලාවට කාන්තාවක් නම්, ඇගේ අත්බෑග් එක අල්ලාගෙන ඉන්නේ අත්දෙකෙන්ම, හරියට ඇගේ ආණ්ඩුකෙන්ද රැකිලා තියෙන්නෙ ඒක නිසා වගේ. මහත්මයෙක් නම් ඔහුගේ ලේන්සුව අතට අරගෙන, නළලේ තියෙන ඩහදිය බිඳු තෙතමාත්තු කරනවා. අහා! අර බලන්න වොට්සන්, මං ඔබට කිව්වෙ නැද්ද? එක අතකින් තොප්පිය ඉවතට ගත්තා. අනික් අත ගියා කබා සාක්කුවට. එළියට ආවා සේද ලේන්සුවක්. ඒක ගියා නළල දෙසට....."

"අන්න අපේ ගෙදර සීනුව නාද වෙනවා" මා කීවේ මිනිස් ස්වභාවය, මේ තරම් හොඳින් වටහාගෙන සිටීමට මා මිත්‍රයා සතු දක්ෂතාවය ගැන පුදුමයට පත්වෙමිනි.

මඳ වේලාවක් ගතවෙද්දී, අප දුටු පුද්ගලයා විසිත්තකාමරය වෙත කැඳවාගෙන එන ලදී. අවුරුදු පනහක් පමණ වයසැති කෙනෙකු වූ ඔහු, කෑමබීම වැඩියෙන් ඇති, ව්‍යායාම අඩුවෙන් ලැබෙන පුද්ගලයෙකු බැව් පෙනිණ. ඔහුගේ ඇඳුම් පැළඳුම් සියල්ල, මිල අධික, දීප්තිය අඩු නොවූ අලුත් ඒවා බැව් මම නිරීක්ෂණය කළෙමි. ඒ අනුව ඔහු ධනවතෙකු බැව් නිගමනය කිරීම අපහසු නොවීය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා?" හතිදමමින් හා තවමත් ලේන්සුවෙන් නළලේ ඩහදිය පිසදමමින් ඔහු විමසුවේය.

"මම තමයි ෂර්ලොක් හෝම්ස්" මගේ මිත්‍රයා කීය. "කරුණාකරල මෙහෙන් වාඩිවෙන්න. මේ මහත්මයාගේ නම.....?"

"විල්බර්ෆෝස්, ජෝර්ජ් විල්බර්ෆෝස්." අපේ අමුත්තා පැවසුවේ සැපපහසු පුටුවකට වාඩිවෙමිනි.

"මේ මගේ මිත්‍රයා දොස්තර වොට්සන්" හෝම්ස් කීය. "මං ඉදිරියේ කියන ඕනෑම දෙයක්, ඔහු ඉදිරියේත් කියන්න පුළුවනි. මෙම ගැටලු විසඳීමට මට උදව්වෙන මගේ සහකාරයා තමයි දොස්තර වොට්සන්. විල්බර්ෆෝස් මහත්මයා, මොකක්ද ඔබ අපෙන් බලාපොරොත්තු වෙන උපකාරය? මට පෙනෙනවා ඔබ මොකක්





හරි ලොකු කම්පනයකට මුහුණදී ඇතිබව. පහුගිය පැය කීපය ඇතුළත තමයි, ඔබ එවැනි දේකට මුහුණදී තියෙන්නේ. ඔබ මගෙන් උදව් ඉල්ලන්නෙත් ඒ සම්බන්ධයෙන් බව මට කියන්න පුළුවනි."

"ඇත්තෙන්ම ඔව් හෝම්ස් මහත්මයා" අමුත්තා කීවේ එය හිස සොලවා ස්ථිර කරමිනි. "එක්තරා දෙයක් මගේ හිතේ ලොකු කැලඹීමක් ඇතිකළා. ඒත් ඔබ ඒක දැනගත්තේ කොහොමද කියලා, මට හිතාගන්නවත් බෑ. නමුත් ඔබ නිවැරදියි. මගේ හිතවත්ම මිත්‍රයෙක් පැය කිහිපයකට කලින් අතුරුදන්වෙලා!"

"අතුරුදන්වෙලා?"

"ඔව් මහත්මයා" අමුත්තා කීය. "අද උදේ කාලයේ තමයි මේක සිදුවෙලා තියෙන්නේ. ඔහු ආගිය අතක් නෑ. ඔහුට වුණේ මොකක්ද කියන එක හොයාගන්න, මං ඉන්නේ නොඉවසිල්ලෙන්. හෝම්ස් මහත්මයා, ඔබ අහල ඇති ලොම්බාර්ඩ් වීථියේ විල්බර්ෆෝස් සහ ඩියාකින් සමාගම ගැන. මම තමයි එහි ජ්‍යෙෂ්ඨ හවුල්කාරයා."

"ඔව්..... ලන්ඩනයේ ඉතා දීර්ඝ සේවා ඉතිහාසයක් ඇති නීතිඋපදේශක සමාගම නේද?"

"අන්න හරි හෝම්ස් මහත්තයා" අමුත්තා කීය. "1811 දී අපේ සමාගම ඇරඹුවේ මගේ සීයා. අපේ අනුග්‍රාහකයන් හැමදෙනෙක්ම වගේ බොහොම ධනවත් අය. ඔවුන්ගේ මූල්‍ය කටයුතු ගැන උපදෙස් දීම, අපේ රාජකාරියේ එක කොටසක්.

පහුගිය අවුරුදු ගණනාවක ඉඳලා බැංකුකරුවන් වන මොට් සහ සමාගම එක්ක, අපි බොහොම සමීපව කටයුතු කරනවා. අපේ සමහර ගනුදෙනුකාරයන් අපෙන් අහනවා, ඔවුන්ගේ මුදල් ආයෝජනය කළ යුතු විධි. ඒ ගැන අපි හැමවිටකම රෙකමදරු කරන්නේ එක්තරා ස්ථානයක් පමණි. ඒ තමයි මොට් සහ සමාගමට අයත් කෝන්හිල් බැංකුව. මේ බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයට පත්වුණා ඇල්ගනොන් ක්‍රොස්බි කියල මහත්මයෙක්. කොටස් වෙළඳපොළේ ගනුදෙනු ගැන ඔහුට තියෙනවා, පුදුමාකාර විශේෂඥ දැනුමක්. ඒ වගේම ඔහු විශ්වාස කටයුතු අවංක කෙනෙක්. මුදල් ආයෝජනය ගැන මගේ අදහස් අහන ගනුදෙනුකාරයන් අප්‍රමාණයි. මං ඒ හැමකෙනෙක්ම, කෙළින්ම යවන්නේ ක්‍රොස්බි මහත්මයා ළඟට. ව්‍යාපාරික කටයුතු නිසා අප දෙදෙනා අතර ඇතිවුණු විශ්වාසය වැඩිදියුණු වුණා. අන්තිමට ඔහු මගේ හිතවත්



www.sinhalaelibrary.com

මිත්‍රයෙක් තරමට ළංවුණා. අපි දෙදෙනාම යන්නෙ එකම සමාජශාලාවට. මගේ බිරිඳ මියගියේ කලකට පෙර. ඔහුගේ බිරිඳත් මියගිහින්. ඒ නිසා අප දෙදෙනා අතර ඇතිවුණු යාළුකම වඩාත් ශක්තිමත් වුණා. ඉඳහිට දවසක අපි දෙන්නා හෝටලයකට ගිහින් එකට රෑ කෑම ගන්නවා. එහෙමත් නැත්නම් එකට නාට්‍යයක් නරඹන්න ගියා.

අද දහවල් කෑම වෙලාවේදී ක්‍රොස්බි හමුවෙන්න මං කල් ඇතුව වෙලාවක් යොදාගෙනයි තිබුණේ. ඒ මොකටද, මගේ ඉතාම වැදගත් ගනුදෙනුකාරයෙකුගේ මුදල් ප්‍රශ්නයක් ගැන, ක්‍රොස්බිගෙන් උපදෙසක් ගන්න. ඒ ගනුදෙනුකාරයා ප්‍රභූපංතියේ අන්තිම ඉහළම මට්ටමේ කෙනෙක්. ඒ නිසා ඔහුගේ අනන්‍යතාවය ඔබට හෙළිකරන්න මට පුළුවන් කමක් නෑ. නමුත් ඔහුට ඇතිවී තිබෙන ප්‍රශ්නය මං කියන්නම්.

ඒ ප්‍රභුවරයා මේ දිනවල විශාල මුදල් අර්බුදයකට මුහුණදීල ඉන්නවා. ඔහුට උවමනා කරනවා බැංකුවෙන් ලොකු ණයමුදලක් ගන්න. ඔහුගේ අරමුණ තමන්ගේ දේපොළවලින් කොටසක් විකුණලා මේ ණය ගෙවන්න. නමුත් මෙතැන ඇති අවුල් සහගත බව විසඳන්න පුළුවන් බැංකුකාර්මිකයෙකුට විතරයි.

මේක මං නොවරදවාම ඉටුකර දියයුතු කටයුත්තක්. ඒ ගැන කතාකරගන්න ක්‍රොස්බි එනතුරු බලාහිටියා. කොච්චර වෙලා බලාගෙන හිටියත් ඔහු ආවේ නැහැ. ඉතින් මං හරිම පුදුමයකටයි පත්වුණේ. තමන්ට එන්න බැරිබව කියලා, ඔහු පණිවුඩයක් එවලා තිබුණෙත් නැහැ. ඔහු හදිසියේ අසනීප වුණා කියල හිතමු. එහෙම නම් ඔහුට තිබුණා ඒ ගැන මට දන්වා එවන්න. ක්‍රොස්බි කියන්නේ එන්න පොරොන්දු වුණු තැනට නැවතින් ඉන්න කෙනෙක් නෙමෙයි. ඔහු නියම කරගත් වැඩක්, නියම වේලාවට නොවරදවාම කරන කෙනෙක්. ඉතින් මං ගියා මොට් සහ සමාගමේ ප්‍රධාන කාර්යාලයට. ඔහු අද උදේ වැඩට ඇවිත් නැහැ. ඒ බවයි ඔවුන් මට කිව්වේ. තමන් වැඩට නොඑන බවක් ක්‍රොස්බි මහත්මයා තමන්ගේ කාර්යාලයට කල්ඇතුව දන්වලාත් නැහැ. ඔහුගේ නිවස තියෙන්නේ චෙල්සීවල. මං කුලීරියක නැගලා ඔහුගේ ගෙදරට ගියා. ක්‍රොස්බිට වෙච්චදෙයක් ඒ ගෙදර අය දන්නෙත් නැහැ. මං මේ ගැන ගෙදර ගෘහපාලිකාව ගෙන් විමසුවා. ඇය කිව්වේ වෙනද විදියටම උදේ





අටහමාරට රැකියාවට යාමට පිටත්වී ගිය බවයි. නමුත් ඔහු බැංකුවට ගිහින් නැතිබව මං කිව්වාම, ඇය හරි පුදුමයකට පත්වුණා. ඔහු කොහේ ගියාද කියල හිතාගන්නවත් ඇයට පුළුවන් කමක් තිබුණේ නෑ. ඉතින් ඔහුට සිද්ධවුණේ මොකක්ද? ඒ ගැන මගේ හිතේ ඇතිවුණේ ලොකු භයක්. අන්තිමට මං තීරණය කළා ඇවිත් ඔබ හමුවෙලා මගේ ප්‍රශ්නය කියන්න"

මෙතෙක් වේලා මුහුණ පහතට හරවාගෙන අමුත්තාගේ කථාවට කන්දීගෙන හිටි මගේ මිත්‍රයා හිස එසෙව්වේය. ඔහු තම දෙනෙත් අමුත්තා වෙත යොමු කළේය.

"විල්බර්ෆෝස් මහත්මයා" හෝම්ස් කීවේ දෙබැම ඉහළට ඔසවා නළල රැළිකරමිනි. "ඔබ කාරණා සමහරක් කිව්වා. නමුත් හැමදෙයක්ම කිව්වේ නැහැ. සම්පූර්ණ සත්‍යම මට හෙළිනොකර, ඔබ කාරණා කිහිපයක් සඟවාගෙන ඉන්නවා. එහෙම නේද? ක්‍රොස්බි මහත්මයා ගැන ඔබ දන්නා හැමදෙයක්ම මට හෙළිකළ යුතුයි. එහෙම නොකොළොත් මේ ගැටලුව විසඳීම භාර නොගෙන, මට ප්‍රතික්ෂේප කරන්න සිදුවෙනවා. මගේ අනුග්‍රාහකයා මා ගැන විශ්වාසය තියලා හැමදේයක්ම හෙළිකළ යුතුයි. ඒක මං සැමවිටම බලාපොරොත්තු වෙන දෙයක්. එහෙම නැතුව ගැටලුව විසඳීම භාරගන්න, මං කොහොමටවත් කැමති නෑ."

අපේ අමුත්තාගේ මුහුණ ලැජ්ජාවෙන් රතුවිය. කිසිවක් කතා කරගත නොහැකිව ඔහු මොහොතක් බලා සිටියේ ය.

"හෝම්ස් මහත්මයා. ඔබ කියන දේ ඇත්ත තමයි" අන්තිමේදී ඔහු කීවේ ගොත ගසමිනි. "මං හැමදෙයක්ම කිව්වෙ නැහැ තමයි. නමුත් ඔබ ඒ බව තේරුම් ගත්තේ කොහොමද? මට නම් ඒක හිතාගන්නවත් බැහැ."

"ඒක බොහොම සරල දෙයක්" හෝම්ස් කීය. "තමන්ගේ ව්‍යාපාරික සගයෙකු ගැන ආරංචියක් නැතුව ගියා. ලන්ඩන් නගරයේ ඉහළම පෙළේ නීතිඋපදේශක සමාගමක අධ්‍යක්ෂකවරයෙක්, තමන්ගේ මිතුරා හොයමින්, නගරය පුරා ඇවිදින්නෙ නෑ. ඔවුන් ඒ කටයුත්තට කාර්යාලයේ ලිපිකරුවෙකු යවාවි. ඔබේ මිත්‍රයා නැතිවෙලා තවම පැය හයකට වඩා ගතවුණේ නෑ. ඒක ඔය තරම් කලබල වෙන්න කාලයක් නෙමෙයි. ඉතින් ඔබම දුව ඇවිදිමින් ඔහුව හොයන්නෙ ඇයි? අන්තිමට ඔබේ සෙවීමෙන්



www.sinhalaelibrary.com

සැහීමට පත්වුණෙත් නැ. ඒ සෙවීම කරන්න කියලා මගෙනුත් ඉල්ලා හිටිනවා. ඒ ඇයි? ඒකට මොකක් හරි වැදගත් හේතුවක් තියෙනවා. අන්න ඒක මට කියන්න"

විල්බර්ෆෝස් මහතාගේ නළලට යළිත් ඩා බිඳු නැගිණ. වහාම සාක්කුවෙන් ලේන්සුව ඇදගත් ඔහු, නළල තෙතමාත්තු කිරීමට පටන්ගත්තේය. මිනිත්තුවක් පමණ නිහඬව කල්පනා කළ ඔහු යළිත් කථාව ඇරඹීය.

"හෝම්ස් මහත්තයා" අමුත්තා කීය. "මං ඒ කාරණා හැංගුවේ, ඒවා මගේ පෞද්ගලික දේවල් නොවෙ, අනුන්ගේ ඒවා නිසා. ඒවා ක්‍රොස්බිගේ පෞද්ගලික රහස්. ඔහු මට ඒවා හෙළිකළේ රහසිගතව. නමුත් දැන් ඉතින් ඒවා ඔබට හෙළිකරනවා ඇරෙන්න, මට වෙන විකල්පයක් නැ. ඔබෙනුත් දෙස්තර වොට්සන්ගෙනුත් මං ඉල්ලා හිටිනවා, ඒ රහස් ආරක්ෂා කරන ලෙස.

පසුගිය මාස දෙකක කාලයක ඉඳලා, ක්‍රොස්බි නමට නිර්නාමික ලියුම් වගයක් ලැබෙන්න පටන්ගත්තා. ඒ හැම එකක්ම ක්‍රොස්බිට මරණ තර්ජන කර එවූ ලියුම්. මං මේවා දැනගත්තෙත් දවස් හයකට විතර කලින්"

"ඒ ලියුම් ඔහු ඔබට පෙන්නුවා ද?"

"ඔහු මට පෙන්නුවේ එකම එක ලියුමයි හෝම්ස් මහත්මයා. ඒ ඔහුට සතියකට පෙර, අන්තිමට ලැබුණු ලියුම. ඇතුළත තිබුණු ලියුමත්, කවරයත් දෙකම ලියා තිබුණේ රතු තීන්තෙන්, කැපිටල් අකුරු වලින්"

"එහි සඳහන් ව තිබුණේ කොහේ තැපැල් මුද්‍රාව ද?"

"ගිල්ඩ්ෆඩ් වල මුද්‍රාව

ඔහුට ලැබුණු හැම ලියුමකම තැපැල් කර තිබුණේ ගිල්ඩ්ෆඩ් වලින් බව ක්‍රොස්බි මට කිව්වා. ඔහුට ලියුම් ලැබුණේ ක්‍රමානුකූලව දින කිහිපයකට වරක් නොවෙයි. නමුත් ඔක්කොම ලියුම් හතක් ලැබී තිබුණා."

"ලියුම් ලියා තිබුණේ කොහොම ද?" හෝම්ස් විමසුවේය. "ඒවා ලියා තිබූ ආකාරයේ විශේෂත්වයක් ඔබට දකින්න ලැබුණාද? අත් අකුරු...."

"අත්අකුරු වල මට දකින්න ලැබුණේ විකෘති ස්වභාවයක්. මං හිතන්නේ කවුරු හරි නුපුරු දෑතින් ලියූ අකුරු. ඒ වුණත් අක්ෂර වින්‍යාසය වගේම විරාම ලක්ෂණත් නිවැරදිව තිබුණා"





"ඒ කියන්නේ මේ ලියුම් ලියූ පුද්ගලයා උගත් කෙනෙක්?"

"මට හිතුණේ එහෙමයි"

"මොනවද ලිපියේ අඩංගුව තිබුණු කරුණු? කොහොමද ඔහු ඒවා ඉදිරිපත් කරල තිබුණෙ?"

"හෝම්ස් මහත්මයා" අමුත්තා කීය. "එහි වාක්‍ය කිහිපයක්ම තිබුණා. ඒ නිසා එහි තිබූ දේ වචනයෙන් වචනයට සඳහන් කරන්න මට අමාරුයි. නමුත් ඒවායින් අදහස් වුණේ මෙහෙම දෙයක්. ක්‍රොස්බි මහත්මයා මිරාදමන්න. ඒ ලියුම ලියූ තැනැත්තා බලාපොරොත්තුවෙන් ඉන්නා බව, ඒක ලියූ තැනැත්තා පිරිමියෙකු විය යුතුයි කියලයි මට හිතුණෙ. ඒ දඩුල් දෙකේම පරෙස්සම් වෙන්න කියලා, ඔහු ක්‍රොස්බිට අනතුරු අඟවා තිබුණා. ඒ ලියුමේ තිබුණු අන්තිම වාක්‍යවල තිබුණේ දරුණු තර්ජනාත්මක බවක්. ඒ නිසාම ඒ වාක්‍ය මට මතකයි.

**"උඹ වගේ ලේ උරාබොන කුඩැල්ලන් වෙනුවෙන්ම හැදූ විශේෂ අපායක් තියෙනවා. ඒ අපායේ කුරිරු වධහිංසාවලට ලක්වෙලා උඹ දුක්විඳින හැටි බලන්න, මටත් අවස්ථාවක් ලැබේවි. එදාට ඒවා බලාගෙන ඉන්න කොට, මගේ හිතට ලොකු සතුටක් දැනේවි!"**

"ඒ ලියුමේ කුඩැල්ලා කියන වචනයම පාවිච්චි කර තිබුණාද?"

"ඔව් මහත්මයා. ඒ නිසාමයි මට ඒ වාක්‍යය මතක තිබුණේ"

"මේ ලියුම් එවන්නේ කවුද කියන එක ගැන ක්‍රොස්බි මහත්මයා දැනගිටියද? නැත්නං හිතේ සැකයක් හරි තිබුණාද?" හෝම්ස් විමසුවේය.

"නැහැ. තමන්ට මරණ තර්ජන කරමින් මේ ලියුම් එවන්නේ කවුද කියලා, ඔහුට හිතන්නවත් බැහැ කියලයි, ක්‍රොස්බි මට කිව්වේ. මෙතැන තියෙන අවදානම මට තේරුණා. මං ඔහුට ආයාචනා කළා මේ ලියුම් අරගෙන පොලීසියට ගිහිං පැමිණිලි කරන්න කියලා. ඒ වුණත් ඔහු ඒකට කැමැත්තක් දක්වුවේ නැහැ."

"ඒ මොකක් නිසාද?"

"ඒකට හේතුව මොකක්ද කියලා ඔහු මට කිව්වේ නැ" විල්බර්ෆෝස් මහතා කීවේ යළිත් වරක් නළල ලේන්සුවෙන් පිසදමමිනි.

"නමුත් ඒකට හේතුව ඔබ අනුමාන කරන්න ඇති?"



www.sinhalaelibrary.com

"මට යම් අදහසක් නම් ආවා"

"මොකක්ද ඒ අදහස?"

"කොහොමද මහත්මයා මං එහෙම දෙයක් ඔබට කියන්නේ?" අමුත්තා ඇහුවේ නොසැලැකිලිමත්තෙන් බව අපි තේරුම් ගත්තෙමු.

"එහෙම නම් මම කියන්නම්" හෝම්ස් කීය. "මේ ලියුම් එවන්නේ කවුද කියන එක ක්‍රොස්බි ඔබට නොකී බව ඇත්ත. ඒත් ඒ කවුද කියන එක ක්‍රොස්බි මහත්මයා අනුමාන කළා. කුඩැල්ලා කියන වචනය නිසා තමයි, ඔබටත් එය හොඳින් මතක තිබුණේ. කුඩැල්ලා කියන්නේ අනුන්ගේ ලේ උරාබීලා ජීවත්වෙන පරපෝෂිතයෙක්. මිනිසුන් ගැන කථාකරනකොට මේ වචනය යොදන්නේ කාටද? අනුන්ගේ රහස් හෙළිකරන බවට තර්ජනය කරමින්, කප්පම් මුදල් ලබාගන්නා කප්පම්කාරයන්ට. එහෙමත් නැත්නම් අසාධාරණ ලෙස ගිනි පොලියට මුදල් ණයට දෙන්නන්ට. එහෙම නේද?"

"හෝම්ස් මහත්මයා, ඔබේ ඒ කතාවට මං විරුද්ධයි." විල්බර්ෆෝස් මහතා කීය. "ක්‍රොස්බි මහත්මයා, ඉතාම අවංක සාධාරණ කෙනෙක්. බැංකු කාරයන් හැටියට..."

"හරියට හරි මහත්මයා" හෝම්ස් කීය. "ක්‍රොස්බි මහත්මයා බැංකු නිලධරයෙක්. ඔහු හැමවිටම කටයුතු කර තිබෙන්නේ අවංකව බවට මගේ හිතේ සැකයක් නෑ. නමුත් ඔහුගේ තනතුරේ හැටියට මෙවැනි ගැටලු සහගත තත්ත්ව වලට මුහුණ දෙන්න ඔහුට සිදුවෙන්න ඇති. ණය ආපසු ගෙවාගන්න බැරි පුද්ගලයෙකු ණයක් ඉල්ලුවාම, එය ප්‍රතික්ෂේප කරන්න ඔහුට සිදුවෙන්න ඇති. මං මොහොතකටවත් කියන්නේ නෑ, ඔහු මෙහෙම තීරණ ගත්තේ අසාධාරණ විදියට කියලා"

"ඇත්තෙන්ම ඔබ නිවැරදියි හෝම්ස් මහත්මයා" අනුග්‍රාහකයා කීය. "සිද්ධිය වටා ඇති කරුණු වලින් ඔබට නිගමන වලට එළඹීමට ඇති හැකියාව ගැන මං පුදුමයට පත්වෙනවා. මට පෙනෙන්නේ, ඔබ මගේ හිතේ ඇතුළේ තියෙන දේවල් කියවනවා වගෙයි. කොහොම වුණත් මං මේ කාරණයත් කිව යුතුයි. ක්‍රොස්බි හිතුවා මේ වැඩේට සම්බන්ධ, පසුගිය කාලයේ බැංකුව සමග ගනුදෙනුවක් කළ පුද්ගලයෙකු විය යුතුයි කියලා. නමුත් එහෙම විශේෂ කෙනෙකු ගැන මතක් කරන්න ඔහුට හැකියාවක් තිබුණේ නැහැ.





හෝම්ස් මහත්මයා, අධීක්ෂකයෙකු හැටියට මටත් ඔය වගේ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදුවෙලා තියෙනවා. කාලයකට ඉහත මං එක්තරා පුද්ගලයෙකු වෙනුවෙන් නඩුවකට පෙනී හිටියා. අපි නඩුවෙන් පරාජය වුණා. මගේ අදක්ෂකම නිසා ඒක වුණා කියලයි මගේ සේවාදායකයා කිව්වේ. ඔහු මට දිගින් දිගටම දොස් කිව්වා. නමුත් වාසනාවකට වගේ ක්‍රොස්බිට මෙන් මරණ තර්ජන මට එල්ල වුණේ නැහැ. එහෙම එල්ල වුණා නම්, ඒ ලියුම් අරගෙන පොලීසියට යන්න, මං මොහොතක්වත් ප්‍රමාද වෙන්නෙත් නෑ. මොට්ස් බැංකුව විශිෂ්ට කීර්තිනාමයක් දිනාගත් පැරණි බැංකුවක්. නරක ප්‍රචාරයක් ලැබුණොත්, ලන්ඩන් නගරය තුළ ඔවුනට ලැබී තිබෙන තැන අහිමිවෙන්න පුළුවනි. දැන් ඉතින් කාරණා හැම එකක්ම එළියට ඇවිත් නේ. මං විශ්වාස කරනවා මහත්මයා, ඔබ මේ පරීක්ෂණය නැවැත්තෙන් භාරගනීවි කියලා!"

"ඇත්තෙන්ම ඔව් විල්බර්ෆෝස් මහත්මයා" හෝම්ස් පිළිතුරු දුන්නේය. "කරුණාකර මට ඔහුගේ නිවසේ ලිපිනය දෙන්න පුළුවන්ද?"

"ඔව්. පෙන්රෝස් විලා, මෙරිඩිත් පෙදෙස, වෙල්සි"

"ඔහුගේ ගෘහපාලිකාවගේ නම?"

"ඩෙන්ටන් මහත්මිය"

"ක්‍රොස්බි මහත්මයාගේ පෙනුම ගැන හොඳ විස්තරයක් ඔබට කිව හැකි නම්, ඒකත් අපට ප්‍රයෝජනවත් වේවි" හෝම්ස් කීවේ සටහන් පොත අතට ගනිමිනි.

"ඔහු මට වඩා ටිකක් උසයි" විල්බර්ෆෝස් මහතා කීය. "ඒ කියන්නේ අඩි පහයි අඟල් අටක් විතර උසයි. ශරීරයේ මහත මගේ ප්‍රමාණයටමයි. වයස අවුරුදු පනස්පහයි. හිසකෙස් තැනින් තැන පැහිලා, සුදුවෙලා. මුහුණේ රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකරලා. ඔහු පුරුදු විදියට රැකියාවට යන අදහසින් ගෙදරින් පිටවුණා නම්, එහෙනම් ඇඳගෙන ඉන්න ඇත්තේ, මේ මං හැඳපැළඳ ඉන්නා පිළිවෙළට. ඒ කියන්නේ ටයිපටිය, කබාය, හිස්වැස්ම ආදියෙන් සම්පූර්ණව"

"මට දැනගන්න ඕවමනා එපමණයි." හෝම්ස් කීය. "ඔහු ගැන නිශ්චිත තොරතුරක් දැනගත් වහාම, මං එනවා ඔබ හමුවෙන්න"

විල්බර්ෆෝස් මහතා අපෙන් සමුගෙන පිටවී ගියේය. අපි ඉක්මනින් හැඳ පැළඳගෙන බේකර් වීථියට පිවිසියෙමු. කුලීරියක

හැඟී වැඩි පමාවකින් තොරව මෙල්සි වෙත ළඟාවීමට අපට හැකි විය. බැංකු නිලධරයාගේ නිවස පිහිටා තිබුණේ, ධනවතුන්ගේ නිවාස වලටම වෙන්වූ නිශ්ශබ්ද ප්‍රදේශයක බව දක්නට ලැබිණ.

නිවසේ සීනුව නාද කළ විට දොර විවෘත කරන ලද්දේ, වයස අවුරුදු හැටක පමණ කාන්තාවක විසිනි.

"මේ වෙන්ටන් මහත්මියද?" හෝම්ස් විමසුවේය.

"ඔව්?"

"මගේ නම ෂර්ලොක් හෝම්ස්. මම පෞද්ගලික අපරාධ පරීක්ෂකයෙක්. මේ මගේ හිතමිත්‍ර දොස්තර වොට්සන්. ඔබේ හාම්පුතා ආගිය අතක් නැති බව, විල්බර්ෆෝස් මහත්මයා ඇවිත් මේ දැන් මට පැමිණිලි කළා. මං මේ ආවේ ඒ ගැන විමසීම් කිහිපයක් කරන්න"

"පැමිණීම ගැන මං ඔබට ස්තුතිවන්ත වෙනවා හෝම්ස් මහත්මයා. කරුණාකර මේ පැත්තෙන් එන්න" කී ඇය, නිවසේ පිටුපස, ඇයටම වෙන්වූ කුඩා විසිත්ත කාමරය වෙත අප කැඳවාගෙන ගියාය.

"අද දවල් විල්බර්ෆෝස් මහත්මයා මෙහෙත් ආවා" ඇය කීවාය. "ඔහු තමයි කිව්වේ අපේ මහත්මයා ආගිය අතක් නෑ කියල. ඒ වෙලාවේ ඉඳල මගේ ඔලුව හොඳටම අවුල්වෙලයි මං ඉන්නෙ. අපේ ක්‍රොස්බි මහත්මයා රස්සාවටත් නොගිහිං කොහේ ගියා කියල හිතන්නද? ඔහු හරිම පිළිවෙළට, නීතියට වැඩකරන කෙනෙක්. ඒ නිසා ඔහු බැංකුවට නොදන්වා කොහේවත් ගියා කියන එක, මට හිතාගන්නවත් බෑ"

"ඔහු ගෙදරින් පිටවුණේ උදේ 8.30 ට ද?"

"ඔව් මහත්මයා"

"ඊට පස්සේ ඔහු සාමාන්‍යයෙන් මොකද කරන්නේ? මං අදහස් කළේ රැකියාවට යන පිළිවෙළ ගැන"

"ඔහු කිංස් පාර දක්වා යන්නේ පයින් ම යි. ඊළඟට කුලීරියක නැගිලා, කෝන්හිල් වල මොට් බැංකුව දක්වා යනවා"

"අද උදේ ලියුම් බෙදද්දී මහත්මයා ගෙදර හිටියද?"

"ඔව්" ඇය කීවාය. "ලියුම් බෙදන්නා ආවෙ 7.45 ට. ලියුම් ටික මහත්මයා අතට ගෙනිහින් දුන්නේ මම. ලියුම් තුනක් තිබුණා. එකක් ඩෙවොන් වල ඉන්නා ඔහුගේ සොහොයුරිය ගෙන්. එකක් ඔහුගේ





පරණ මිත්‍රයෙකුගෙන්. ඒකෙ තැපැල් මුද්‍රාව හෝම්බුර්ග් නිසා මං ඒක අඳුනා ගත්තා. ඒ දෙන්නාම මහත්මයාට නිතරම ලියුම් එවන අය. ඒ නිසා ඒ අත්අකුරු මං අඳුනනවා. හැබැයි තුන්වැනි ලියුම නම් කාගෙන්ද කියල මං දන්නෙ නෑ. ඒකෙ අත්අකුරු මට පුරුදු ඒවා නොවෙයි"

"ඒ කවරයේ ලිපිනය ලියල තිබුණේ රතුපාට කැපිටල් අකුරෙන්ද?"

"නෑ මහත්මයා" ඇය පිළිතුරු දුන්නාය. "ඔබ ඔය කියන විදියේ රතු තීන්තෙන් ලිපිනය ලියූ ලියුම්, පහුගිය කාලයේ අපේ මහත්මයාට ලැබුණා. එහෙම එකක් ලැබුණාම මහත්මයා ඉන්නෙ හරිම හිතේ කැලඹීමෙන්. ඒ ගැන මං හොඳට මතකයි. ඒ වුණත් ඒ ලියුම් එව්වෙ කවුද කියල මං අහන්න ගියේ නෑ. ඒවා මට අයිති වැඩ නොවෙයි නේ. මේ අද ආව ලියුමේ ලිපිනය ලියල තිබුණේ කළුපාට තීන්තෙන් වැල් අකුරෙන්"

"ඒකෙ තැපැල් මුද්‍රාව කොහේද කියල ඔබට මතකද?"

"ඒක නම් මට බලන්න බැරිවුණා මහත්මයා. ඒක ඒ හැටි වැදගත් ලියුමක් කියල මට හිතුණේ නෑ"

"හරි. ඔබ ලියුම ක්‍රොස්බි මහත්මයාට අතටම දුන්නා" හෝම්ස් කීය. "එතකොට ඔහු මොකක්ද කළේ? මොකක්ද ඔහුගේ ප්‍රතිචාරය? ඒ අත්අකුරු ඔහු හඳුනාගත්තද? ඔහුගේ හිතේ කැලඹීමක් ඇතිවුණාද?"

"එහෙම කැලඹුණු බවක් මට නම් පෙනුණේ නෑ. ඔහු ඒක දිහා බැල්මක් හෙළා ඒ ලියුම පැත්තකට දැම්මා. ඊළඟට ඔහුගේ සොහොයුරියගේ ලියුම කියවන්න පටන්ගත්තා"

"ඒ කියන්නෙ ඔහුත් ඒ අත්අකුරු හඳුනාගත්තෙ නෑ? ලියුම ඒ තරම් වැදගත් එකක් කියල සැලකීමක් කළේ නෑ?"

"මට නම් පෙනුණේ එහෙමයි" වෙන්ටන් මහත්මිය පිළිතුරු දුන්නාය. "ඒ වුණත් මිනිත්තු දහයකට විතර පස්සෙ සීනුව නාද කරලා, ඔහු මාව කැඳෙව්වා, මට කිව්වා ඔහුගේ කාමරයේ තිබෙන, මාර්ග සිතියම් තොරතුරු පොත අරගෙන එන්න කියලා"

"සාමාන්‍යයෙන් ඔහු ඒ පොත නිතර ඔබෙන් ඉල්ලා හිටින්නේ නැද්ද?" හෝම්ස් විමසුවේ දැඩි උනන්දුවකින් බව මම දුටුවෙමි.

"ඔහු කවදාවත් මට කියා ඒ පොත ගෙන්වාගෙන නැහැ"

"කෝ දැන් ඒ මාර්ග සිතියම් පොත?"

"උදේ කෑම පිගන් අස්කරන්න මං මේසය ළඟට ආවා. එනකොටත් ඒ පොත මේසෙ උඩ. ඉතින් මං ඒක අරගෙන ගිහිං ඔහුගේ කන්තෝරු කාමරයෙන් තිබ්බා."

"එනකොට අද උදේ ඔහුට ලැබුණු ලියුම් කෝ?" මගේ මිත්‍රයා විමසුවේය.

"උදේ ඒ වෙලාවෙ දන්නට පළමුව, මැ ඒ ලියුම් තවමත් ඇහැට දැක්කෙ නෑ මහත්තයා" ඇය කීවා. "තැපෑලෙන් එන ලියුම් වෙනදාට නම් ඔහු දමන්නේ ලියන මේසයේ දකුණු පැත්තේ උඩම ලාච්චුවේ"

"මං ඔහුගේ ලියන මේසය පරීක්ෂා කළාට කමක් නැද්ද?"

"ඒකෙ වැරැද්දක් නෑ, මං හිතන්නේ" ඇය පිළිතුරු දුන්නේ මඳක් පැකිළෙමිනි. "කොහොම වුණත් ඒකට ක්‍රොස්බි මහත්මයා ගෙන් කල් ඇතුව අවසර අරං තිබ්බා නම් හොඳයි"

"ඔබට මුහුණ දීමට සිදුවෙන ප්‍රශ්නය මට තේරෙනවා වෙන්ටන් මහත්මිය" හෝම්ස් කීවේ මිත්‍රශීලී සිනාවක් පාමිනි. මෙවැනි අවස්ථාවන්හි දී, කාන්තාවන්ගේ සිත් දිනාගැනීමට ඔහුට තිබූ දක්ෂතාවය ගැන මම දනසිටියෙමි.

"නමුත් ප්‍රශ්නය වෙලා තියෙන්නේ අවසර ගැනීම සඳහා ක්‍රොස්බි මහත්මයා මෙහි නොමැතිකමයි. ඔබ වගේ ම අපත් කටයුතු කරන්නේ, ඔහුගේ යහපත සඳහා, මං හිතන්නේ නෑ ඔහු මෙතන හිටියා නම් අපට විරුද්ධවෙයි කියලා"

"බලාගෙන ගියාම ඔබේ කතාව ඇත්ත හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "එන්න මේ පැත්තෙන්"

සාලය මැදින් අප කැඳවාගෙන ගිය ඇය, කාමරයක දොරක් විවෘත කළාය. එහි බිත්ති දිගට පොත් රාක්ක දෙකක් දක්නට ලැබිණ. සම්පලින් ආවරණය කළ සැපපහසු පුටු දෙකක් කාමරය මැද තිබූ අතර, ජනේලය අසල කෙළවරකට ලියනමේසයක් විය.

හෝම්ස් එහි දකුණුපස උඩම ලාච්චුව විවෘත කළේය. එහි තිබී ඔහුට හමුවූයේ ලියුම් දෙකක් පමණි.

"ක්‍රොස්බි මහත්මයාට අද උදේ ලැබුණු ලියුම් මේවාද?" හෝම්ස් විමසුවේ ඒවා සේවිකාවට පෙන්වමිනි.

"ඔව් මහත්මයා. ඇයි තවත් ලියුමක් එතැන නැද්ද?"





"නැහැ" හෝම්ස් කීය. "මං හිතුන්නේ තුන්වැනි ලියුම ඔහු අරගෙන ගිහින් වගෙයි"

මගේ මිත්‍රයා මේසයේ අනෙක් ලාච්චු ද පරීක්ෂාකර බැලුවේය. එහෙත් ඔහුට වැදගත් යමක් හමුවූ බවක් නොපෙනිණ.

"වෙන්ටන් මහත්මිය, අර ඔබ කියූ මාර්ග සිතියම් පොත මට අරගෙන දෙන්න පුළුවන්ද?" හෝම්ස් ඉල්ලා සිටියේ ය.

පොත් රාක්කයක් වෙත ගිය ඇය රතු පැහැති කවරයක් තිබූ පොතක් හෝම්ස් වෙත රැගෙන ආවාය. ඔහු එය මේසය මත තබා විවෘත කළේය. එය පහසුවෙන් විවෘත විය. ඇතැකදී ක්‍රොස්බි එය විවෘතකර තැබීම සඳහා පොතේ 'නාරටිය' තෙරපා තිබූ බවක් පෙනිණ. හෝම්ස් ගේ උරහිසට ඉහළින් මම එය බැලුවෙමි. විවෘතව තිබූ සිතියමෙන් දිස්වූයේ සරේ ප්‍රාන්තයයි. මගේ මිත්‍රයා ඒ මත දබරැඟිල්ල දුවවමින් ගිල්ඩ්ෆෝඩ් නගරය සෙව්වේය. එය පහසුවෙන් සොයා ගැනීමට හැකිවිණි. එතැනට නුදුරින් පිහිටි කුඩා ගමක නමක් යටින් පැන්සලෙන් ඉරක් ඇඳ තිබූ අයුරු මම දුටුවෙමි. ඒ ස්ටිපල් බාටන් නම් කුඩා ග්‍රාමයක් විය.

"වෙන්ටන් මහත්මිය, ස්ටිපල් බාටන් කියන්නේ ඔබට අහල පුරුදු ගමක නමක්ද?"

"නෑ මහත්මයා" ඇය පැවසුවේ හිස දෙපසට සොලවමිනි.

"ක්‍රොස්බි මහත්මයා හඳුනන කවුරු හරි එහේ පදිංචිව ඉන්නවද?"

"මං දන්න තරමින් නම් එහෙම කවුරුවත් නෑ මහත්මයා" ඇය කීවාය.

"හොඳයි කමක් නෑ" හෝම්ස් කීවේ මාර්ග සිතියම් පොත ආපසු ඇය අතට දෙමිනි. "මං හිතුන්නේ ක්‍රොස්බි මහත්මයා ළඟ බ්‍රැඩ්ෂෝගේ දුම්රිය කාල සටහන් පොත ඇති. මිනිත්තු කිහිපයකට ඒක මට ලබා දිය හැකි නම්......"

ඇය ඒ පොත ද මගේ මිත්‍රයා වෙත ලබා දුන්නාය. ඔහු එය විවෘතකර පරීක්ෂාකර බැලීමට ගතකළේ මිනිත්තුවක් හෝ දෙකක් පමණි. අනතුරුව එය ද වෙන්ටන් මහත්මියට ආපසු දී අපට උදව්කිරීම ගැන ස්තුති කළේය. අපි ඇයගෙන් සමුගෙන නිවසෙන් පිටවීමු.

"මං හිතන්නේ ඊළඟට අප යන්නේ ස්ටිපල් බාටන් වෙත?" මා ඇසුවේ අප කිංස් පාර ඔස්සේ ඇවිද එන අතරතුරදීය.



www.sinhalaelibrary.com

"හරි. මගේ බලාපොරොත්තුව ඒකයි, වොට්සන්. ඔහුට අද ලැබුණු තුන්වැනි ලියුමෙ ලියල තිබුණෙ මොනවද කියල, අපි තවමත් දන්නෙ නැහැ. නමුත් අද රාජකාරි සඳහා බැංකුවට යනවා වෙනුවට, ස්ටිපල් ගාටන් වෙත ඔහුව කැඳවන්න ඒ ලියුම සමත්වුණා. ඔහු මාර්ග සිතියම දිගහැරල, ඒ ස්ථානය ලකුණු කළ එකෙන්ම ඒ බව තහවුරු වෙනවා. මම ඔෆෙන්ටන් මහත්මියගෙන් බ්‍රැඩ්ශෝ කාලසටහන් පොත ඉල්ලුවා. නමුත් ක්‍රොස්බි ඒක ඉල්ලා තිබුණෙ නෑ. මොනවද වොට්සන් ඔබට ඒකෙන් හිතාගන්න පුළුවන් වෙන්නෙ?"

"මට හිතෙන්නෙ ඔහු ගමන් කළ යුතු දුම්රියේ වෙලාව, ඒ ලියුමෙ සඳහන් කර තියෙන්න ඇති" මම කීවෙමි.

"විශිෂ්ටයි වොට්සන්, ඔබේ නිගමනය නිවැරදියි." හෝම්ස් කීය. "දුම්රිය කාලසටහන මං බැලුවා නේ. වික්ටෝරියා දුම්රිය පොළෙන් උදේ 9.16 ට පිටවෙන බලායන දුම්රියක් තියෙනවා. ඒක අල්ලාගන්න ඔහුට ඉතිරිව තියෙන්නෙ ඇත්තෙන යන්තමින්. ඒ නිසයි ඔහු තමන්ගේ බැංකුවෙ වන් විල්බර්ෆෝස් මහත්මයාටවත් නොපැමිණෙන බව දන්වා විදුලි පුවතක් යොමු කළේ."

පාරේ ගිය කුලීරියක් අල්ලා ගැනීමට අපට හැකිවිණි. එයින් අපි වික්ටෝරියා දුම්රියපොළ වෙත යාමට පිටත්වුණෙමු. ඒ අතර හෝම්ස් තම අදහස් මෙසේ ප්‍රකාශ කළේය.

"ක්‍රොස්බිට පසුගිය මාස දෙක තුළ, තර්ජනය කරමින් ලියුම් ලැබුණු බව ඔහුගේ මිතුරා ප්‍රකාශ කළා. නමුත් අද උදේ ලැබුණු ලියුම නම් එහෙම එකක් නොවෙයි කියල අපට හිතන්න පුළුවනි. ඔහු කැලැඹීමකට පත්වුණු බවක් ඔෆෙන්ටන් මහත්මිය දකල තිබුණෙ නැහැ. අනික් අතට ඔහුගේ ජීවිතයට අනතුරක් වෙන තත්ත්වයක් තිබුණා නම්, ඔහු තනියම සාරේ ප්‍රාන්තය වෙත යයිද? වෙන කිසිවකු නැතුව තනියම එහෙම යාවි කියල හිතන්න අමාරුයි. ඒ කොහොම වෙතත් මේ මොහොත වෙනකොට, ඔහුගේ පරෙස්සම ගැන නම් මගේ හිතේ ලොකු සැකයක් මතුවෙනවා."

"ඒ මොකද හෝම්ස්?" මම ඇසීමි.

මගේ මිතුරා එම ප්‍රශ්නයට කෙළින්ම පිළිතුරක් දුන්නේ නැත. ඔහු කළේ අපේ ගැටලුව දෙස වෙනස් දෘෂ්ටි කෝණයකින් බැලීමය.





"වොට්සන්, අපි මෙහෙම හිතමු. ක්‍රොස්බිට මේ නිර්නාමික ලියුම් ලියන්නේ අපියි කියල මුලින්ම හිතමු. එහෙම හිතාගෙන කරුණු එකින් එක විසඳන්න බලමු.

මේ තර්ජනය කරන පුද්ගලයා පසුගිය කාලයක, යම්කිසි අවාසනාවන්ත සිදුවීමකට මුහුණදීලයි ඉන්නෙ. ඒ නිසා කෝපයට පත්වුණු ඔහු හිතාගෙන ඉන්නේ, අර සිදුවීමට වගකිවයුත්තා ක්‍රොස්බි කියල. ඒ නිසා ක්‍රොස්බිගෙන් පළිගන්න ඒ තැනැත්තා තීරණය කරල අවසන්.

නමුත් ක්‍රොස්බි ලන්ඩන් නගරය තුළ ඉන්න තුරු ඔහු ගොදුරු කරගැනීම ඒ පුද්ගලයාට අපහසුයි. ඒකට හේතුව මොකක් ද? ක්‍රොස්බිට විරුද්ධව ප්‍රහාරයක් එල්ල කරන්න, කෙනෙකුට අවකාශයක් තියෙන්නෙ ඉතාම සුළු වේලාවක විතරයි. ඔහු ගෙදර ඉඳල කිංස්පාරට පයින් එන හා හවසට ආපසු එන වෙලාවෙ. අනෙක් හැමවෙලාවකදීම බැංකු නිලධරයා ඉන්නෙ එක්කො ඔහුගේ කාර්යාලය ඇතුළේ; නැත්නම් නිවස ඇතුළේ.

තමන් අපරාධකාරයා කියල හිතාගෙන, ඒ දෘෂ්ටි කෝණයෙන් හිතල බලන්න වොට්සන්. ඔබ කොහොමද ඔහුට ප්‍රහාරයක් එල්ල කරන්නෙ, කාටවත් නොපෙනෙන විදියට? ඔහුට විරුද්ධව සාක්ෂි දීමට, ඇසින් දුටු සාක්ෂිකරුවන් නොමැති වෙන විදියට, ඔබ කොහොමද ක්‍රොස්බි තනියම අල්ලා ගන්නෙ?"

"ඔබ කියන දේ මට තේරෙනවා හෝම්ස්" මම කීවෙමි. "ඔබ කියන්නෙ අද උදේ ක්‍රොස්බිට ලැබුණු තුන්වැනි ලියුම ලියා තියෙන්නේ, මෙපමණ දවසක් තිස්සේ තර්ජන කරමින් ලියුම් එවූ මිනිහා කියල නේද?"

"හරියට හරි වොට්සන්. ඔහු තමයි. දැන් මෙන්න මේක හිතල බලන්න. ක්‍රොස්බි බොහොම පිළිවෙළකට වැඩකරන බුද්ධිමත් මිනිහෙක්. ඔහුගේ සාමාන්‍ය ක්‍රියා පිළිවෙතේ වෙනසක් කරලා, සාරේ ප්‍රාන්තයේ කුඩා ගමකට ඔහුව තනියෙන් ගෙන්වා ගන්නේ කොහොම ද?"

එයට නිසි පිළිතුරක් දීමට මට හැකියාවක් නොවීය. ඒ ගැන මා නිහඬව කල්පනා කරන බව දුටු හෝම්ස් පෙන්වූයේ නොඉවසිලිමත් බවකි.

"මොනවද මගේ හිතවත් වොට්සන්; ඔබට ඒක තේරුම් කරන්න බැරිද? ඒක බොහොම පැහැදිලියි නේ.



www.sinhalaelibrary.com
Reading Purpose Only - Not For Print

ඒ පුද්ගලයා වෙනත් කෙනෙකුට ලියන විදියට ක්‍රොස්බිට එවනවා ලියුමක්. ඔහු කියා එවනවා ස්ටිපල් බාටන් වෙත පැමිණ තමා හමුවන්න කියලා. එතකොට, ඔබට මේ විදියට මරණ තර්ජන කරමින් ලියුම් එවන තැනැත්තා ගැන හෙළි කරන්නම්. නැත්නම් අල්ලාදෙන්නම් කියලා. ක්‍රොස්බි ලන්ඩන් නගරයේ සිට පැමිණිය යුත්තේ මේ අහවල් වෙලාවට වික්ටෝරියා දුම්රිය පොළෙන් පිටත්වෙන දුම්රියේ කියලත් ඔහු සඳහන් කරනවා. ඊළඟට ඔහු ලියුමෙ සඳහන් කරන්න ඇති; "ඔබ ආ යුත්තේ තනියම. එතකොට මේ ලියුමත් නොවරදවාම අරගෙන එන්න. යන්නෙ කොහේටද, මොකටද, කියල කාටවත් කියන්න එපා" කියල. ඒ ලියුමෙ ඇති.

ඔබ ටිකක් වෙලා කල්පනා කරල මතක් කළොත් අර වික්ටර් හැඩ්ලි නම් හයිඩ්‍රොලික් ඉංජිනේරුවා සම්බන්ධව අප කළ පරීක්ෂණය.... අර ඇඟිල්ලක් අහිමි කරගත් මනුස්සයා. ඔබ මයි ඔහුව මා ළඟට කැඳවාගෙන ආවෙ. මතකයි නේද? ෆුලර්ස් අර්ත් හාරන යන්ත්‍රයක් ගැන බලන්න කර්නල් ලයිසැන්ඩර් ස්ටාක් එන්න කියල තිබුණේ.... තනියම. යන තැනත් ගැන කාටවත් නොකියා.

මෙතනත් ඒ වගේ. එතකොට ඒකට සැලැස්වෙන පරීක්ෂණ වලදී තමන්ව හොයාගන්න කිසිම හෝඩුවාවක් ඉතිරි නොවෙන බව ඔහු දන්නවා.

මරණ තර්ජන කරල දිගින් දිගටම ලියුම් ලැබීම නිසා, ක්‍රොස්බි හිටියේ හිතේ හරිම අසහනයෙන්. එතකොට, මේක කරන තැනැත්තා හෙළිකරන්නම් කියලා ලියුමක් ආව ගමන්, ක්‍රොස්බි රැවටුණා. ඔහු හිතුවේ තමන්ට එය දෙන පුද්ගලයා අල්ලා ගැනීම ගැන පමණයි. නමුත් මේ අඩිය තියන්නේ මාරක උගුලකට කියල ඔහු හිතන්න නැහැ. ඔහුගේ හිතට එන්න ඇත්තේ, තම සතුරා අල්ලා පොලිසියට භාරදීලා, මේකට අවසානයක් කරන්න"

හෝම්ස් කථාව මෙතෙකින් නැවැත්වීය. අප යමින් සිටි කුලීරියේ වහලට ඔහු සැරයටියෙන් තට්ටු කළේය. රියැදුරා කුඩා කවුළුව විවෘතකොට එබී බැලුවේය.

"රියැදුරු උන්නැහේ, ඔහේගෙ අශ්වයාට මීට වඩා හයියෙන් දුවන්න බැරිද? අපට තියෙනවා වික්ටෝරියා දුම්රියපොළෙන් 3.48 දුම්රිය අල්ලගන්න"

ඉන්පසු කුලීරිය වඩාත් වේගයෙන් ගමන් කිරීමට පටන් ගත්තේය. අසුනේ පිටුපසට හේත්තුවුණු මගේ මිත්‍රයා, තවත්





කිසිවක් කථා නොකොට කල්පනා කිරීමට පටන්ගත්තේය. ක්‍රොස්බි මහතාට මේ වනවිටත් භයානක ඉරණමකට මුහුණ පාන්නට වී ඇතිද යන සැකය, හෝම්ස් ගේ සිතට නැගී ඇති බැව් මම තේරුම් ගතිමි. මගේ හිතේ ඇතිවී තිබුණු භයත් එයයි. වික්ටෝරියා දුම්රියපොළෙන්, අප ගිල්ඩ්ෆෝඩ් බලා යන දුම්රියට නැඟුණ පසු ද, හෝම්ස් නිශ්ශබ්දවම කල්පනා කළේය. දුම්රිය මැදිරිය තුළදී ද ඒ නිහඬබව ඒලෙසම තිබිණ.

ගිල්ඩ්ෆෝඩ් දුම්රියපොළේ දුම්රිය නැවතුණු විගස, එයින් බට ඔහු දිවගියේ, මා ගැන ද අමතක කරමිනි. ඔහුගේ එම පුදුමාකාර හැසිරීම මට තේරුම් ගැනීමට අපහසු විය. මම ද ඔහු පසුපස දිව ගියෙමි. කුලීරථගාලේදී හෝම්ස් අල්ලා ගැනීමට මම සමත්වීමි. ඔහු දුම්රිය පොළේ කුලීරථ රියැදුරන්ගෙන් ප්‍රශ්න කරමින් සිටියේය.

"මට ඕනැවුණේ, ක්‍රොස්බි ගමන්ගත් කුලීරියේ රියැදුරාගෙන් ප්‍රශ්න කරන්න" ඔහු කීය. "දුම්රියෙන් ආ වෙනත් මගියෙක්, ඒ කුලීරිය කථා කරගෙන පිටත්වී තියෙනම් මට වෙන්නේ පාඩුවක්. මට හැකිවුණා ඊට කලින් ඒ රියැදුරාට කථාකරන්න. මේ අහන්න වොට්සන්.

"ඔබ ඔය විස්තර කරන විදියේ මහත්මයෙක් දුම්රියෙන් ආවා තමයි. ලන්ඩන් නගරයෙන් ඇවිත් මෙතෙන්ට 11.42 ට ළඟාවෙන දුම්රියෙන් ආවේ" රියැදුරා කීවේය.

"ඔබ කොහේටද ඔහුව ගෙනගියේ?"

"ස්ටිපල් බාටන් ගමේ රෝස් ඇන්ඩ් ක්‍රවුන් අවන්හලට"

"එහෙම නම් අපිත් එතැනටම එක්ක යන්න" හෝම්ස් කීවේ ඒ කුලීරියට නගිමිනි.

එය විනාඩි විස්සක පමණ කාලයක් ගතවූ ගමනක් විය. ඉතා රමණීය දර්ශන සහිත ගම්බද පෙදෙස් තුළින්, අපේ ගමන් මඟ වැටී තිබිණ. සැප්තැම්බර් මාසයට ළංවී තිබුණත්, සැන්දෑවේ හිරු එළිය දීප්තිමත් විය. පළාතේ සුන්දරත්වය ගැන මම යමක් ඉඳහිට කීවෙමි. එහෙත් මගේ මිත්‍රයා වෙතින් දිස්වූයේ මා කලින් දුටු නිහඬතාවයම ය.

ස්ටිපල් බාටන් යනු කුඩා ගම්මානයකි. එහි තිබුණේ ප්‍රධාන ගොඩනැගිලි දෙකකි. එනම් ගල් වලින් ඉදිකර තිබූ පෞරාණික දෙව්මැදුර සහ ඒ ඉදිරිපිට මෑතකාලයක ඉදිකරන ලද රෝස් ඇන්ඩ්



www.sinhalaelibrary.com

ක්‍රවුන් අවන්හලය. කඩසාප්පු යයි කිසිය හැකි, ප්‍රමාණයෙන් කුඩා ගොඩනැගිලි කිහිපයක් ඒ වටා පිහිටි තිබිණි.

අවන්හල සුදුහුණු ආලේප කර තිබූ, එතරම් උස්නොවූ ඉදිකිරීමක් විය. එයට තවමත් ගනුදෙනුකරුවන් එතරම් පැමිණ නොසිටි බැව් ඇතුළුවෙද්දීම අපි දුටුවෙමු. එහි එක් මුල්ලක වූ මේසයක් අසල, වයස්ගත පුද්ගලයෙක් බීරජෝගුවක් තොලගාමින් සිටියේය. ඒ අසලම සුදුපැහැති බල්ලෙකු ද සිටි බැව් දක්නට ලැබිණ. බල්ලා මෙන්ම ඔහුගේ අයිතිකරුවා ද සිටියේ අඩනින්දේ යයි කෙනෙකුට සිතෙන්නට ඉඩ තිබිණ. එහි සිටි අනෙක් පුද්ගලයා, අවන්හලේ අයිතිකරුවාය. අනුග්‍රාහකයන් නොමැතිවීම නිසා, හිතට දැනුණු පාළුව නිසාදෝ, දෑත් කවුන්ටරය මත තබාගෙන ඔහු සිටියේ කල්පනා කරමිනි. හෝම්ස් හා මා දුටු විගසම, ඔහුගේ මුහුණට එළියක් වැටිණි. මිටි කෙට්ටු පුද්ගලයෙකු වූ ඔහුට තිබුණේ කෙරාටික පෙනුමකි.

"මේ මහත්වරුද ලන්ඩනයෙන් එනවා කිව්ව මහත්වරු?" ඔහු ඇසුවේ හෝම්ස් කටඇරීමටත් පෙර ය

"ඔව්. අපි තමයි" හෝම්ස් ක්ෂණිකව පිළිතුරු දුන්නේය. එහෙත් එම ප්‍රශ්නයෙන් හෝම්ස් පුදුමයට පත් වූ බවක් ඔහුගේ මුහුණේ මම දුටුවෙමි.

"අපි මේ හොයමින් යන්නේ....."

"මං දන්නවා මහත්තයා. මං දන්නවා, ඔබ හොයමින් යන්නේ කවුද කියල මං දන්නවා." අවන්හල් කරු කීය. "ඔබ හොයන්නෙ අර ලන්ඩනයෙන් ආව මහත්තයා නේද? අර හිසකෙස් පැසුණු, තරබාරු, හැඩි දැඩි මහත්තයා නේද? අර මෙහේ තියල තිබුණු ලියුම ඉල්ලගන්න ආව මහත්තයා. එයා නේද?"

"මොන ලියුමද?" හෝම්ස් ඇසීය.

"අනේ. කිසි ලෝභකමක් නැති මහත්තයා. ලියුම මා ළඟ තියාගත්ත මහන්සියට කියලා, ක්‍රවුන් එකේ කාසියකුත් මට තෑගි කළා"

අවන්හල්කරු කීවේ හෝම්ස් ඇසූ ප්‍රශ්නය නොඇසුණු අයුරෙනි. මීළඟට මගේ මිතුරා තම කබාසාක්කුවෙන් ක්‍රවුන්බාගයේ කාසියක් ගෙන කවුන්ටරය මත තැබුවේය. එය ක්ෂණයකින් අතුරුදන් විය.





"මොන ලියුමද?" හෝම්ස් යළිත් වරක් විමසුවේය.

"ඇයි අර නෝනා කෙනෙක් උදේ මෙහේ තියලා ගිය ලියුම?"

"නෝනා කෙනෙක්?" හෝම්ස් ඇසුවේ අතිශය පුදුමයට පත් හඬෙනි. ක්‍රොස්බිට ලියුම එවූ නැනැත්තා පිරිමියෙකු යයි සිතා සිටි අපි, මෙයින් පුදුමයට පත්වීමු.

"ඒ නෝනා මොන වගේ පෙනුමක් තිබුණු කෙනෙක්ද?"

"උස කෙට්ටු නෝනා කෙනෙක්. ඇඳගෙන හිටියේ සම්පූර්ණයෙන්ම කළු ඇඳුමක්. හරියට ළඟදි මහත්තයා මැරුණු කෙනෙකු වගේ"

"ඇගේ මුහුණේ පෙනුම කොහොමද?"

"ඒක නම් මට කියන්න බෑ මහත්තයා" අවන්හල් කරු කීය. "එයා මුහුණ වැහෙන්නම කළු පාට වේල් එකක් දමාගෙනයි හිටියේ. මාත් එක්ක කථාකළේ කෙඳිරිගාන්න වගේ මෘදු කටහඬකින්. මට ඒ ලියුම දීලා කිව්වා.......

**"තව පැය කීපයකින් මාව හොයාගෙන මහත්තයෙක් ඒවි. මේක එයාට දෙන්න"**

එහෙම කියල ඒ නෝනා නොපෙනී ගියා"

"නොපෙනී ගියා?" අපි දෙදෙනාම එය පුදුමයෙන් ප්‍රතිරාවය කළෙමු.

"මෙහාට එන්නකො මං පෙන්නන්න" කී ඔහු කවුන්ටරයෙන් එළියට විත් අවන්හලේ ඉදිරි දොර වෙත පැමිණියේය.

"අර පැත්ත බලන්න මහත්වරුනි" ඔහු කීවේ දෙව්මැඳුරේ ගේට්ටුව අසලින් වැටී තිබූ මාර්ගය පෙන්වමිනි. පහළට බෑවුමක් සහිතව පිහිටි එය, විශාල ගස් රැසකින් හා ගෙවල් වල පියසි වලින් ආවරණය වී තිබූ බැව් අපි දුටුවෙමු.

"මේ අවන්හලට නෝනා කෙනෙක් ආව බව දුටුවාම මං හරි පුදුමයකට පත්වුණා. සාමාන්‍යයෙන් මත්පැන් විකුණන මෙහෙම තැන් වලට, නෝනලා එන්නෙ නැහැනෙ. අනික මේ උදේ පාන්දර. ඒ මදිවට එයා මං නොහඳුනන කෙනෙක්. ජීවිතේට දැකල නැති කෙනෙක්. ඊළඟට ලියුමක් මෙහේ තියලා යනවා කිව්වාම මං තවත් පුදුමයට පත්වුණා.

ඒ ගැනි ලියුම කවුන්ටරය උඩින් තියල, "සුරුප්" ගාල මෙහෙන් එළියට බැස්සා. මට හිතවුණා මෙයා කවුද, යන්නේ කොහේද



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

කියල බලන්න. මං මේ කවුන්ටරයේ ලෑල්ල උස්සල එළියට ඇවිත්, දොර ඇරල බැලුවා. මට එළියට යන්න කොච්චර වෙලා ගතවෙන්න ඇතියි කියලද ඔහේල හිතන්නේ?"

"මිනිත්තුවක්"

"හරියට හරි මහත්තයා. මං එනකොට ඒ මිනිත්තුවට ඒ ගෑනි නොපෙනී ගිහින්. .... හරියට මහපොළොවෙන් වාෂ්ප වෙලා ගියා වගේ. හූ!" අවන්හල්කරු තමා දකුණු අතේ ඇඟිලි දෙකකින් අසුර ගැසුවේ, තම විමතිය ප්‍රකාශකරමිනි. "මේ සැනින් නොපෙනී ගියා! දෙයියම්පා!"

"ඒක හරි පුදුමයක් නේ" හෝම්ස් කීය. "ඇය ගැන ඔහේට කියන්න තියෙන්නෙ එච්චරයිද?"

"ඊට පැය බාගයකට පස්සෙ තමයි අර මහත්තයා ලියුම ගන්න ආවෙ. ඔහු ඒක මෙතැනදීම ඇරලා කියෙව්වා"

"ඒක කියවලා ඔහේගෙන් මොනවා හරි ඇහුවද?"

"ඔව් ඇහුව තමයි" අවන්හල්කරු පිළිතුරු දුන්නේය. "මේ ලියුම තියල ගියේ කොහොම කෙනෙක්ද, කොහොමද ඇගේ පෙනුම කියල ඇහුවා. මට දකින්න ලැබුණු විදියට මං ඇගේ පෙනුම විස්තර කළා. ඊළඟට ඔහු ලියුම සාක්කුවට දමාගෙන මගෙන් ඇහුවා, බාටන් වනාන්තරයට යන පාර මොකක්ද කියලා. ඉතින් මම ඔහුට පෙන්නුවා. අර ඈතින් මහ යෝධ ගස් වගයක් පෙනෙනවා නේද?" අවන්හල්කරු ඇසුවේ දෙව්මැදුරට වම් පසින් දිශාවකට ඇඟිල්ල දිගුකරමිනි. "අන්න ඒ තණබිමෙන් තමා බාටන් වනාන්තරය පටන් ගන්නේ"

"හොඳයි, ඔබට බොහොම ස්තුතියි මහත්මයා" කී හෝම්ස් අවන්හලෙන් එළියට පිවිසියේය. ඔහු ඉදිරියට ඇවිදයාමට පටන්ගත්තේ වේගයෙනි. ඔහු පසුපස දිව යන අතර, මම ආපසු හැරී බැලුවෙමි. අවන්හල් අයිතිකරුවා පාරට බැස අප දෙස බලාසිටියේ ඉමහත් කුතුහලයෙනි.

II

දෙව්මැදුර පසුකොට යාර පනහක් පමණ යද්දී "බාටන් වන පෙදෙස" යනුවෙන් සඳහන් කොට, වමට ඊතලයක් ඇඳ තිබූ නාම පුවරුවක් අපි දුටුවෙමු. ඒ පාරට හැරී ඉදිරියට යද්දී හෝම්ස්ගේ





ගමනේ වේගවත් බව අඩුවිය. හිස ඉදිරියට නමාගත් ඔහු පාරේ වම් පැත්තේ අයින දෙස ඉතා ඕනෑකමින් බලමින් පියවර තැබුවේය.

මුලින් පාරක් ලෙස තරමක් පුළුල්ව තිබුණත්, එහි පළල ක්‍රමයෙන් අඩු විය. මෙම ගුරු පාරේ පොළොව වැසී තිබුණේ සිහින් දූවිල්ලෙනි. පාර දෙපැත්තේ දිගටම තිබුණේ කුඹුරු යායවල් බව අපි දුටුවෙමු. පාරේ වම් පැත්තේ, පාර සමීපයෙන්ම ගලා ගිය ඇළ පාරක් විය. මෙය කුඹුරු වලට ජලය සපයන දියපාරක් බව පෙනිණ. සමහර තැන්වලදී ඇළ උතුරාගොස්, ජලය පාරට ද ගලාවිත් එය මඩ වී තිබිණි. සැප්තැම්බර් මාසයේ අව් රශ්මිය එතරම් තාප්ටක නොවූ නිසාදෝ, මෙසේ මඩ වූ තැන් හොඳින් වියළී නොතිබිණි.

ගුරු පාරේ මේ අයුරින් මඩ වූ තැන් වෙත, මගේ මිත්‍රයා වැඩි අවධානයක් යොමුකළේය. එවැනි තැනක දණගසා ගත් ඔහු, කාචය අතට ගෙන මඩපාරේ සලකුණු පිරික්සුවේය.

"කළු ඇඳගත්තු ගෑනිය බොහොම ඉක්මනට නොපෙනී ගියා කියල, අර මිනිහ කිව්වා නේද?" හෝම්ස් මගෙන් ඇසීය. "ඒ කොහොම ද දන්නවද? ඒ ගෑනි ගිහින් තියෙන්නෙත බයිසිකලයකින්. ඒකෙ තියෙන්නෙ ගෙව්ගිය ඩන්ලොප් ටයර් .ඒ් කට්ට රටාව මේ මඩ මත පැහැදිලිව සටහන් වෙලා තියෙනවා"

"එතකොට මොකක්ද හෝම්ස් ඔබේ නිගමනය?" මම ඇසීමි. "ඔබ කියන්නේ ක්‍රොස්බිට තර්ජනය කරමින් ලියුම එව්වේ ඒ කළු හැඳගත් කාන්තාව කියලද? අද උදේ තැපෑලෙන් ඔහුට ලැබුණේ ඇය එවූ ලියුමක් ද?"

"මගේ හිතවත් මිත්‍රයා", හෝම්ස් කීය. "සතුටුදායක දත්ත නොමැතිව එහෙම නිගමනයකට එළඹීම බරපතළ වැරැද්දක්. අපි තවමත් මේ සෝදිසිය පටන්ගත්තා විතරයි. අවන්හලේ තැබූ ලියුම ලිව්වෙ ඒ කාන්තාව කියා, අපට හිතන්න පුළුවනි. නමුත් අනෙක් ලියුම ලිව්වෙත් ඇයද කියලා තවමත් තීරණය කරන්න අමාරුයි. මට හිතෙනවා මෙතැන ලොකු කුමන්ත්‍රණයක් සිදුවෙලා තියෙනවා කියල. දැනට පෙනෙන විදියට නම් ඒකට ගැහැනියක හා මිනිහෙකු සම්බන්ධයි. ඒත් සමහර විට මේ කළු හැඳගත් ගෑනි, මේ තර්ජන වලට සම්බන්ධ නැතිවා වෙන්නත් පුළුවනි. බාගවෙලාවට ඇය උත්සාහ කළේ, ක්‍රොස්බි මහත්මයාට අනතුරු අඟවන්න හෝ

ඔහුව ආරක්ෂා කරගන්න වෙන්නත් පුළුවනි. ඒත් ඒ ගැන මට සැකයි.

ක්‍රොස්බි මහත්මයා මේ වගේ පාළු පලාතක වනාන්තරයකට ගෙන්වාගන්න, පොළොඹිට්ටා ගත් බව ඇත්තයි. නමුත් කාන්තාවක් හමුවීමට ඔහුට ඇති උවමනාව මොකක්ද? ඒකට මේ පාළු වනාන්තරයක්ම යොදාගන්නෙ ඇයි? ලන්ඩන් නගරයේ උද්‍යානයකදී ඔවුනට හමුවෙන්න තිබුණා. මෙහෙම ආළු පලාතක වනාන්තරයක් යොදා ගැනීමෙම තියෙනවා, ඉතාම අප්‍රසන්න අන්තරාදායක බවක්. යමු වොට්සන් දැන් කරන්න දෙයක් නෑ. ගිහිල්ලාම බලනවා මිසක."

අප තවමත් වනාන්තරයට ඇතුළු නොවූ බව මම ඔබට කීවෙමි. තවමත් එය වැටී තිබුණේ කුඹුරු යාය මැදිනි. අන්තිමේ දී අපි වනාන්තරය ඇරඹෙන අඩවියට ඇළඹුණෙමු. පාර දුන් කඳු බෑවුම ඉහළට වැටී තිබිණ. වනාන්තරය රක්ෂිතයක් වූ බැවින්, එය ආරක්ෂා කරන වැට, පාරේ මායිම බවට පත්වී තිබූ අයුරු අපි දුටුවෙමු. තවත් යාර සියයක් පමණ ඉදිරියට ගිය පසු දෙවටක් අසල සිටවා තිබූ නාම පුවරුවකි.

## පහළ හේබ්රෑක් වෙත අඩිපාර

කොළ පැහැති තීන්තෙන් ඇඳ තිබූ නාම පුවරුවේ ඊතලයක් ඇඳ තිබුණේ සුදු රටහුණු වලිනි.

එම අඩිපාර වැටී තිබුණේ විශාල ගස් අතරෙනි. අපි එහි ඉදිරියට ගමන් කළෙමු. පාර අයිනේ වූ ගස්වල හා ගල්වල සුදු රටහුණු වලින් ඇඳි ඊතල රැසක් විය. කුඩා දරුවන් ලෙස පාසල් ගිය කාලයේ, ගස්වල ඊතල අඳිමින්, අප කැලෑබද පෙදෙස් වල යෙදුණු ක්‍රීඩාවක් මට සිහිවිය. [illegible] සිහිවූයේ ක්‍රොස්බි මහතාය. සිල්ක් හිස්වැස්මකින්, ටයිපටිය, කලිසම, කබාවලින් සැරසී සිටි ඔහුට, ඊතල සෙල්ලමක යෙදීමට සිදුවීම මොන තරම් කණගාටුවට කරුණක් ද? මේ අයුරින් අප අඩියෙන් අඩිය ගමන්කළේ වනාන්තරය මධ්‍යයටය.





අපට ගමන්කිරීමට තිබූ මඟ ක්‍රමයෙන් පළලෙන් අඩුවූයේ, විශාල ගස් එකිනෙකට ළංව වැවී තිබූ බැවිනි. කුමක් හෝ භයානක දෙයකට අපට ඉක්මනින් මුහුණ දෙන්නට සිදුවන බව, මගේ සිත හඬගා කියන්නට විය. ක්‍රොස්බි මහතාට අත්වූයේ කුමන ඉරණමක් ද? ඒ ගැන මගේ සිතේ ඇතිවූයේ කැළඹීමකි. දැන් ඝනව වැඩුණු පඳුරු නිසා ක්‍රමක්‍රමයෙන් අහස සම්පූර්ණයෙන්ම ආවරණය විය. පක්ෂීන්ගේ ගායනා ක්‍රමයෙන් අඩුවී ගොස්, ඉතිරි වූයේ පඳුරු අතරේ දඟලන සතුන්ගේ ශබ්ද පමණි.

පැය භාගයකට වැඩි කාලයක් අපි ඉම්හිසේ ඉදිරියට ගමන් කළෙමු. අපට කලින් කිහිපදෙනා මෙම මාර්ගයේ ගමන්කර තිබූ බවට සලකුණු ද විය. කුඩා අතුකිලි කැඩී බිඳී ගොස් තිබූ අයුරෙන්, ඒ බැව් සිතාගැනීමට අපහසු නොවිණි. එක්වරම අප පිවිසියේ විවෘත තණබිම් කඩකටය. ගස් හෝ පඳුරු කිසිවක් නොතිබූ මෙය, අප කිසිසේත් බලාපොරොත්තු නොවූවකි.

මා මෙය ලියන විට අප මේ අත්දැකීමට මුහුණදී, අවුරුදු තුනක් ගතවී ඇත. එහෙත් එද මා දුටු දසුන මගේ සිතෙන් මැවෙන්නේ, පැය කිහිපයකට පෙර දුටු එකක් විලසිනි. කුමක් හෝ ඛේදජනක දසුනකට අපට මුහුණදීමට සිදුවෙතැයි යන හැඟීමක්, අපේ සිත්වල තිබූ බව සැබෑය. එහෙත් එය මෙවැනි භයංකර එකක් වේ යයි අපි කිසිසේත් නොසිතුවෙමු. මෙවැනි අලංකාර වනඋයනක සුන්දරත්වය විනාශ කරමින් තිබූ, එම බිහිසුණු දසුන සැබැවින්ම භයංකර එකකි.

විවෘත තණබිම්කඩ රවුම් එකක් විය. ගස් අතරින් පෙරී වැටුණු දීප්තිමත් හිරු එළියෙන් එතැන ආලෝකමත් වී තිබිණ. ඒ මධ්‍යයේ වැටී සිටියේ සම්පූර්ණ ඇඳුමෙන් සැරසුණු, පැසුණු හිසකෙස් තිබූ පුද්ගලයෙකි. උඩුබැලි අතට වැටී සිටි ඔහුගේ, දෑත් දෙපසට විහිදී තිබුණේ, පුරාණ කාලයේ කුරුසයකට ඇණ ගැසූ චිත්‍රයක් සිහියට නංවමිනි. ඔහුගේ කළු පැහැති හිස්වැස්ම ඒ අසලම විය. කබාය හා කරපටිය ඉවත්කොට, සුදුපැහැති කමිසය ඉරා දමා තිබුණේ, ඔහුගේ පපුව සම්පූර්ණයෙන්ම එළියට විවෘත වන අයුරෙනි.

මෙම දසුනෙන් ඇතිවූ කම්පනයෙන් අපි තත්පර කිහිපයකට ගල්ගැසුණෙමු. ඊළඟ මොහොතේ හෝම්ස් වේගයෙන් ඉදිරියට යද්දී මම ඔහු පසුපස ගියෙමි.

www.sinhalaelibrary.com

බිම ඇද වැටී සිටි පුද්ගලයා ජීවතුන් අතර සිටීදැයි දැනගැනීමට, ඔහුගේ ශීර්ෂපෝෂී ධමනියේ ස්පන්දනය පරීක්ෂා කිරීමට අවශ්‍යතාවයක් නොවීය. සෑයෙකින් ඔහුගේ බෙල්ල හිරකර තිබූ සැටියෙන් හා මුහුණේ තිබූ විරූපී බව නිසා, සියල්ල අවසන් බැව් අපට සිතාගත හැකි විය. මළසිරුර දරදඬුවීම ද මේ වනවිට පටන්ගෙන තිබිණ. එම ඇඟිබැමට ඉහළින් නළලේ කැපී ගිය තැනකින් ලේ ගලාගොස්, එය ද නැවතී ඇති බැව් දැකිය හැකි විය.

මේ ගැන මගේ අදහස් හෝම්ස්ට කීමට මම සූදානම් වූයෙමි. එවිටම මළසිරුරේ පපුව මත තබා තිබූ යම් යම් දේවල් වෙත, මගේ අවධානය යොමුවිය. මළසිරුර අසල දණගසාගෙන සිටි හෝම්ස් ද ඒ දෙසට නෙත් යොමුකරගෙන සිටියේය.

හදවත කෙළින්ම එහුවේ වම්පස, සිරුර උඩ තබා තිබුණේ, රත්රන් සාක්කුඔරලෝසුවකි. හදවතේ ක්‍රියාකාරීත්වය නැවතී තිබුණත්, ඔරලෝසුව ක්‍රියාත්මක විය. පපුවේ දකුණු පස සුදු පැහැති පිහාටුවක් විය. එය අම්බරව කුරුල්ලෙක් ආකාරයට තැන්පත් කළ පැන්ස හමේ කාසි ඒසක් මම දුටුවෙමි. එහෙත් ඉතා පුදුමාකාර දෙය වූයේ, පපුව මත ඇදෙමින් සිටි, අඟල් තුනක් පමණ දිගු සත්ත්වයෙකි. ඒ රතුපැහැති කුඩැල්ලෙකු බව හඳුනාගතිමි. ඌ අසලින් තවමත් ලේ ගලායමින් තිබිණි.

භයෙන් ත්‍රස්තව මා ඒ දෙස බලා සිටියදී, හෝම්ස් දණගසාගෙන සිටි තැනින් නැගිටියේය. තම සටහන් පොත අතට ගත් ඔහු, එයින් පිටුවක් කඩා, එහි යමක් කුරුටු ගා මා අතට දුන්නේය.

"වොට්සන්, මේක අරගෙන ගිහිං රෝස් ඇන්ඩ් කුවුන් අවන්හලේ අයිතිකාරයාට දෙන්න. ඔහුට කියන්න මේක කවුරු හරි අතේ වහාම ගිල්ඩ්ෆඩ් පොලිසියට යවන්න කියල. මං මෙතැනම ඉන්නවා. අපරාධයට සම්බන්ධ හෝඩුවාවන් මොනවා හරි හොයාගන්න පුළුවන්ද කියල මං බලන්නම්"

ලිපිය ද රැගෙන මම ආපසු ඒමට පිටත්වූයෙමි. ගස් අතරින් රිංගමින්, පඳුරු උඩින් පනිමින් හැකි ඉක්මනින් ආපසු යාම, මගේ අරමුණ විය. කැලෑව හරහා විත් පටුමඟට වැටී, ගම්මානය වෙත පියවර නැගුවෙමි. අවන්හල අප පිටත්ව යද්දී තිබූ අයුරෙන්ම තිබිණි. වයසක මිනිසා බල්ලා සමග එතැනම සිටි අතර අවන්හල අයිතිකරු කවුන්ටරය අසල හිස්බැල්මෙන් බලා සිටියේය.





එහි කඩාවැදුණු මම, මගේ පණිවුඩය ඔහු වෙත දන්වා සිටියෙමි. එයින් කලබලයට පත්වූ ඔහු අවන්හලේ පිටුපස දෙර වෙත ගොස් "ඩික්! ඩික්!" යයි හඬගා කිසිවෙකු කැඳෙව්වේය. එයට ප්‍රතිචාර ලෙස උස තරුණයෙක් අවන්හල වෙත ඇවිතියේය.

"මේක අරගෙන වහාම ගිල්ඩ්ෆඩ් පොලිසියට යන්න" මා කීවේ අලසයකු ලෙස පෙනුණු තරුණයාට ය. "පොලිස් පරීක්ෂකට කියන්න මේක මිනීමැරුමක් කියලා!"

කට බාගෙට ඇරගෙන, මෝඩයෙකු මෙන් මා දෙස බලාසිටි තරුණයා, ඊළඟ මොහොතේ ආපසු හැරී ගියේය.

"ඩික්! ඩික්! අශ්වකරත්තෙත් පලයං. ඉක්මන් කරපං" අවන්හල් කරු කෑගැසුවේය.

"මොනවා මහත්තයා මිනීමැරුමක්?" ඔහු විමසුවේ මවිතයට පත්වය. "කෙනෙක් හම්බවෙන්න කැලෑවට එන්න කිව්වාම, ඒ නං හොඳකට නොමෙයි කියල මට ඒ වෙලාවෙම හිතුණා." ඔහු කීය. "මෙහෙන් ගිය මහත්තය අර කව් ඇඳගත්තු නෝනාව මරාදමලද? අනේ දෙයියනේ! කිසි සැකයක් නෑ. එය නුවපටෙට තවත් මිනිහෙක් පැටලිලා ඇති"

"අවන්හල්කරු මෙසේ දෙඩවද්දී හෝම්ස් වෙත යාමට, මා ආපසු හැරී අවසන්ය. "මිනීමැරුමක්" යන වචනය මගේ කටින් පිටවූ විට, අවන්හල්කරුගේ සිතේ මැවුණු චිත්‍රය ගැන මට සිතා පහළ විය. වැඩිවෙලා ගතවීමට පෙර කාන්තාවක මරාදමා ඇති බව ඔහු මෙම ගම්මානයේ සෑමට දනුම්දෙනු නොඅනුමානය.

## III

මම හති දමමින් හෝම්ස් සිටි තැනට ළඟාවීමි. අලුතෙන් ඔහුට හඳුනාගැනීමට හැකි වූ හෝඩුවාවන් මට පෙන්වීමට, ඔහු බලාසිට ඇත්තේ නොඉවසිල්ලෙනි. මට හුස්ම කටක් ගැනීමටවත් ඉඩනොදී, ඔහු මා කැඳවාගෙන ගියේ තණබිමේ එක් මායිමක වූ යෝධ ඕක් ගස් සෙවණටය.

"මේ බලන්න වොට්සන්. මෙතැන බිම තණකොළ සහ අනෙක් කුඩා පැළෑටි, පාවහන් වලට පෑගී පොඩිවෙලා. නමුත් මෙතැනදී මට ප්‍රශ්නයක් මතුවෙනවා. ඉතාම ගොරෝසුවට තණකොළ වැවී



www.sinhalaelibrary.com

තිබෙන නිසා, පා සටහනක් පැහැදිලිව හඳුනාගන්න බැහැ. වැලි හෝ මඩ සහිත තැනක් මේ අවට ඇත්තෙවත් නැහැ"

"ඉතින් මොකක්ද ප්‍රශ්නෙ?"

"මේ මිනී ගහේ හෙවණට වෙලා හිටියෙ එක්කෙනෙක්ද නැත්නම් දෙන්නෙක්ද කියන එක, මට හරියටම කියන්න අමාරුයි. නමුත් කවුරුන් හෝ පැහෙන වෙලාවක් රැඳී සිට ඇති බව පැහැදිලියි. ගිනිකූරක්, සිගරට් කොටයක්, සුරුට්ටු අළු හෝ එවැනි කිසිම දෙයක් නැහැ"

"එහෙම නම් ඔබට හිතෙන්නේ මේ අපරාධයට දෙදෙනෙක් සම්බන්ධයි කියලද?"

"එහෙම නිගමනයකට එන්න තරම් සාක්ෂි මට හමුවුණේ නැහැ වොට්සන්"

"කොයි පැත්තෙනද ඔවුන් පැනගිහින් තියෙන්නෙ?" මම ඇසීමි.

"කුඩා පඳුරු හා පැළෑටි කැඩී ගිය සලකුණු අනුව මං ඒ මග හොයා ගත්තා" හෝම්ස් කීය. "ඒක වැටිලා තියෙන්නෙ අපි මෙහේ ආව අඩිපාරට. ඒ කියන්නෙ පහළ හේබරුක් දක්වා යන අඩිපාර වෙතට. නමුත් පා සටහන් වැටිලා තියෙන්නෙ ස්ටිපල් බාටන් ගම්මානය දෙසට නෙමෙයි, පහළ හේබරුක් දෙසට. ඒ පාර හුඟක් අය පාවිච්චි කරන කෙටි පාරක් බවයි මට පෙනුණේ. විවිධ අයගේ අඩි සටහන් තිබුණා. බයිසිකලයක ටයර් පාරක් සලකුණු වී තිබුණා. සැක නෑ ඒක කළු හැඳගත් කාන්තාවගේ. ගෙවී ගිය ඩන්ලොප් ටයර වල සලකුණු ඉතාම පැහැදිලියි"

"එහෙනම් දෙන්නාම එක බයිසිකලයේ නැගලා ගියාද දන්නේ නෑ?" මම ඇසීමි.

"අන්න ඒක තමා මට අවුල්භාෂ" හෝම්ස් කීය. "ඒ මොකද බුරුල් පස හා වැලි ඇති වැදුණු ටයර් සලකුණ ඒ තරම් ගැඹුරට වැදිලා නැහැ. ඒ කියන්නෙ බයිසිකලයේ ගිහින් තියෙන්නේ එක් කෙනෙක් කියලයි. එහෙනම් අනික් එක්කෙනා කොහේට ද ගියේ? ඔහු සමහර විට ස්ටිපල් බාටන් ගම්මානය දෙසට ගියාද කියන්නත් බෑ. දෙදෙනෙකු එකතුවෙලා අපරාධයක් කරලා, දෙන්නා දෙපැත්තට පැනයාම බොහොම සුලභ දෙයක්

මෙතැන අපරාධකාරයන් දෙන්නෙක් ඉන්නවා කියල හිතමු. ඒ ක්‍රොස්බි මරාදැමූ අපරාධකරු සහ කළු හැඳගත් කාන්තාව. නමුත්





මෙතැන දෙන්නෙක් නැද්ද? එක්කෙනාද ඉන්නෙ? අන්න ඒකයි ප්‍රශ්නය"

"මෙහෙම වෙන්න බැරිද හෝම්ස්?" මම ඇසීමි. "කළු හැඳගත් කාන්තාව ලිපිය අවන්හලේ තියල ඇවිත්, ඊළඟට බයිසිකලය අපරාධකාරයාට දෙනවා. ඔහු ඇවිත් ඉතිරි කොටස සම්පූර්ණ කරනවා."

"බොහොම හොඳයි වොට්සන්. ඒකත් හොඳ උපකල්පනයක්" හෝම්ස් කීය. "දැන් අපි අර පැත්තට ගිහිං බලමු"

හෝම්ස් මගේ කබා අතෙන් ඇද්දේ, යළිත් තණබිම් කඩ තුළට මා කැඳවමිනි.

"මෙන්න මෙතැනත් බලන්න. තණකොළ පඳුරු කැඩිගිහින්, කුඩා පැළෑටි ඉදිරිලා. මට සෑහෙන්න විශ්වාසයි ක්‍රොස්බිගේ හුස්ම හිරකිරීම සිදුකරලා තියෙන්නෙ මෙතැන. ඒ අදහා ඔවුනට සෑහෙන පොරබැදීමක් කරන්න සිදුවෙන්න ඇති. ඒ මොකද ක්‍රොස්බි සෑහෙන තරම් ශක්තිමත් පුද්ගලයෙකු නිසා. ඔබ දුටුවා නේද ඔහුගේ ඇහිබැමේ තිබුණු කැපුම් තුවාලය. මෙන්න එයින් ගලා ගිය ලේ. මෙතැන බිම වැටී ලේකැටි සෑදී තියෙනවා. ඇහිබැමේ හා නළලේ තුවාල වලින් ලේ ගැලීම සාමාන්‍යයෙන් වැඩි නිසා සෑහෙන ලේ ප්‍රමාණයක් මෙතැනට වැටී තියෙනවා"

ඔහු පෙන්වූ නිසා ලේ ගලාගිය තැන මට පැහැදිලිවම දකිය හැකි විය.

"ඊට අමතරව මොනවද වොට්සන් ඔයාට දකිය හැක්කේ?"

"මට නම් වෙන මොකුත් පෙනෙන්නේ නෑ" මම කීවෙමි. "මගේ හිතවත් වොට්සන්. ඔහොම නැගිටලා ඉඳගෙන වටපිට බැලුවාම නම් මොකුත්ම පෙනෙන්නේ නැති බව ඇත්තයි. හොඳට පහත්වෙලා බලන්න. තණකොළ පොළොවේ දණගසාගෙන බලන්න. මුහුණ හොඳටම පොළොවට ළංකරන්න"

ඔහුගේ උපදෙස අනුව මම හිස පහත්කොට බැලීමි. තණකොළ පොඩිවී තිබුණු තැන සිට මළසිරුර තිබූ තැනට, තණබිම මත ඇඳී සමාන්තර රේඛා දෙකක් දකගත හැකිවිය.

"ඒ මොකක් කියලද ඔබ හිතන්නේ?" හෝම්ස් විමසුවේය.

"මං හිතන්නේ මළසිරුර එතැන ඉඳන් මෙතැනට ඇදගෙන ඇවිත් තියෙනවා" මම කීවෙමි. "ඔය සලකුණු ඇතිවෙලා තියෙන්නේ සපත්තු වල විළුම් පොළොවේ ඇදී ඒම නිසා"



www.sinhalaelibrary.com

"ඔව්. ඔබ නිවැරදියි වොට්සන්" ඔහු කීය. "ක්‍රොස්බි හා මිනීමරුවා අතර පොරබැදීමක් සිදුවුණා. මේ විදියට සිරුර ඇදගෙන ඒම ශක්තිමත් පිරිමියෙකු කළ වැඩක්. ක්‍රොස්බි රාත්තල් දෙසීයක් වත් බර කෙනෙකු කියලයි මට හිතෙන්නේ. ඒ තරම් බර අයෙකු සහ තණකොළ මතින් මේ තරම් දුරක් ඇදගෙන ඒමට, කළු හැඳගත් කාන්තාවට හැකියි කියල මම හිතන්නේ නෑ"

මා එතැනින් නැගී සිටීමටත් පෙර නැගී සිටි හෝම්ස් යළිත් මළසිරුර අසලට ගියේය.

"වොට්සන්, ඔබ කාව්‍ය ග්‍රන්ථ කියවනවද?"

"පාසල් යන කාලෙ නම් කියෙව්වා" මම කීවෙමි. "ඊට පස්සෙ කියවලා නෑ. ඇයි ඔබ එහෙම ඇහුවෙ?"

"කාව්‍ය ග්‍රන්ථ රචනා කරන කවියන් වගේ මේ අපරාධකාරයාත් සංකේත යොදගෙන තියෙනවා. මේ බලන්න. ක්‍රොස්බිගේ සාක්කු ඔරලෝසුව තියලා තියෙන්නේ ඔහුගේ හදවත උඩින්. ඒකෙන් කියන්නෙ මොකක් කියලද ඔබට හිතෙන්නේ?"

"හදවත නැවතිලා. නමුත් ඔරලෝසුව යනවා. ඒකෙන් අදහස් කරන්න ඇත්තේ ක්‍රොස්බිට මියයාමට කාලය පැමිණ ඇතිබව"

"එතකොට සුදුපාට පිහාටුව?"

"සුදුපාට පිහාටුවෙන් සංකේතවත් කරන්නේ බියගුල්ලෙක්"

"ඔබ හරි දක්ෂයි වොට්සන්. එතකොට කුරුසයක හැඩයට කාසි පපුව උඩ තැබීමේ අදහස මොකක්ද?"

"ඒක නම් මොකක්ද කියලා මට හිතාගන්න අමාරුයි"

"කාසි කීයක් තියෙනවද කියලා ඔබ ගණන් කරලා බැලුවද?"

"නැහැ, මෙහෙම ඉන්න බලන්න........ කාසි තිහයි"

"හහා! රිදී කාසි තිහක් තියෙනවා. එතකොට ඔබට මතක් වෙන්නේ කවුරුන්ද?" හෝම්ස් ඇසීය.

"හැබැහෙන්නම" මා කෑගැසීමි. "ජේසුතුමා පාවා දෙන්න, ජුදස් ඉස්කාරියොත් රිදී තිහක් ගත්තලු. ක්‍රොස්බිගේ අත් දෙකත් දෙපැත්තට විහිදලා තියෙන්නේ කුරුසයේ ඇන ගැසූ පිළිමෙවල සංකේතවත් කරන්න වෙන්න ඇති"

"විශිෂ්ටයි වොට්සන්. අද මගේ ප්‍රශ්න වලට ඔබ බොහොම ඉක්මනට පිළිතුරු ලබාදෙනවා. ශුද්ධවූ මතෙව්ගේ ශුභාරංචි පොතේ හැටියට, ජේසුතුමා පාවා දුන්නාට පස්සේ ජුදස්ට මොකක්ද සිද්ධවුණේ?"





"ඔහු එල්ලිලා මැරුණා. එහෙම නේද?" මම ඇසීමි.

"ඇත්තෙන්ම ඔව්" හෝම්ස් කීය. "මගේ මතකය නිවැරදි නම් ඒක සඳහන් වෙලා තියෙන්නේ 27 වැනි පරිච්ඡේදයේ. මේ විදියට,

ජේසුතුමා පාවා දුන්නාට පස්සේ, තමන් කළ වරද ගැන පසුතැවිලි වුණු ජුදස්, තමන්ට රිදීකාසි දුන් පූජකවරුන්ට ඒවා ආපහු දෙන්න උත්සාහ කළා. නමුත් ඒවා ලේ තැවුණු සල්ලි කියලා, ඒවා ආපහු භාරගන්න පූජකවරු කැමැති වුණේ නැහැලු. එහෙම නේද?"

"ඔව්"

"මෙතැනත් සංකේතවත් කරලා තියෙන්නේ ඒ වගේ දෙයක්. මට හිතෙනවා මේ අපරාධකාරයාට සෑහෙන්න පිස්සු තියෙනවා කියල. කෙනෙකු මනුෂ්‍ය ඝාතනයක් කරන්නේ පිස්සුවෙන් තමයි. නමුත් මොහු අනිත් අපරාධකරුවන්ට වඩා හුඟක් වෙනස්. මේ වගේ කෙනෙක් මගේ අපරාධ පරීක්ෂණ ඉතිහාසයේම මට හමුවුණු බවක් මතක නෑ"

"ඒක නම් මටත් හිතුණා හෝම්ස්"

"මේ අපරාධකාරයා අඳල තියෙන්නෙන් ක්‍රොස්බි සමග තදබල වෛරයකින්. මුලින් ඔහු බලාපොරොත්තු වෙන්නෙ ඇත්තේ ක්‍රොස්බිව ගහක එල්ලන්න. පස්සේ තීරණය කරල තියෙනවා බිම හාන්සි කරන්න. ඒ මොකටද, ඔහුගේ සංකේත ප්‍රදර්ශනය කරන්න හැකි විදියට. මෙන්න මේ සත්තා ගැන ඔබට මොනවද කියන්න පුළුවන්?" ඔහු විමසුවේ ක්‍රොස්බිගේ නිරාවරණය වූ පපුව හරහා තවමත් ඇදෙමින් සිටි රතු පැහැති සත්තවයා පෙන්වමිනි.

"මේ ලේ උරා බොන කුඩැල්ලෙක්. එහෙම නේද?"

"හරි වොට්සන්" හෝම්ස් කීය. "අද දවල් විල්බෆෝස් මහත්මයා සමග අප කළ සාකච්ඡාව සිහි කරන්නකෝ.... ක්‍රොස්බිට ලැබුණු ලියුම් වල ඔහු, ලේ උරා බොන කුඩැල්ලෙකුට උපමා කරල තිබුණා නේද? ගලාබ වෛද්‍යවරුන් විසින්, සමහර ප්‍රතිකාර ක්‍රම සඳහා යොදගන්නා කුඩැල්ලො වර්ගයක් ඉන්නවා. ඒ බව ඔබ හොඳින් දන්නවා ඇති වොට්සන්. නමුත් මේ නම් ඒ වර්ගයේ කුඩැල්ලෙක් නෙමෙයි. ඒකා හිරුඩෝ මෙඩිසිනාලිස් කියන වර්ගය නේ. මේකා ට්‍රොකිටා සබ්විරිඩිස් කියන උභයජීවී කුඩැල්ලන් වර්ගයේ එකෙක්. හාණු වල සහ තෙත් පසේ ඉන්න මොවුන් ගැඩවිලුන් වැනි



www.sinhalaelibrary.com

සතුන්ගේ ලේ උරා බොනවා. මං ශාන්ත බාර්තොලමියු රෝහලේ කායික හා ව්‍යුහ විද්‍යාව හැදෑරූ බව ඔබට කියල තියනවා නොවැ. ඇයි අපි එහෙදි හමුවුණේ? ඒ කාලෙ පරපෝෂිත සත්ත්ව විද්‍යාගාරයේදි කුඩැල්ලනුත් මගේ නිරීක්ෂණයට හසුවුණා.

මීළඟට අප එන්නේ මිනීමැරුම සිදුකර ඇති ස්ථානයටයි. ඔබ මෙන්න මේ කාරණය දුටුවාද වොට්සන්? ඇයි අපරාධකාරයා මේ කටයුත්ත සහ කැලෑව තුළ නොකර, එළිමහන් බිමක් ඒ සඳහා තෝරාගත්තේ? ඒ ගැන මොකක් හෝ අදහසක් ඔබ සතුව තියෙනවද?"

"මට නම් එහෙම දෙයක් කල්පනා වෙන්නෙ නැහැ"

"එහෙම නම් මගේ අදහස මං ඔබට කියන්නද? ගස්වැල් කිසිදෙයක් නැති වපුරු තණබිම් කඩක් මැදට ගෙනයාමෙන් පෙනෙන්නෙ මොකක්ද? මෙක අපි පුරාණ කාලෙ කෙරුණු විධියේ චාරිත්‍රානුකූල මරණයකට පත්කිරීමක් වගෙයි. හරියට මිථ්‍යා ආගම් අදහන්නන්ගේ බිලිපූජාවක් වගේ කියන්න පුළුවනි. ඒකෙන් අපට මේ අපරාධය සිදුකළ තැනැත්තා ගැනත් යම් යම් කාරණා එළිවෙනවා. ඔහු බුද්ධිමත් කමෙන් අඩු කෙනෙක් නොවෙයි කියලයි මට හිතෙන්නේ. නමුත් ඔහු එක්තරා මානසික ව්‍යාධියකට ලක්වුණු කෙනෙක්. ජේ.එම්. චාකෝ නම් මහා විද්‍යාඥයා ගැන ඔබ අහල ඇති. ඔහු මේ මානසික ව්‍යාධිය හැඳින්වූවේ "අයිඩී ෆික්සි" නමින්. ඔබට මතක ඇති මහා වෛද්‍ය විද්‍යාවේ ශ්‍රේෂ්ඨතමයා හැටියට සැලකෙන සිග්මන් ෆ්‍රොයිඩ්ගේ ගුරුවරයා වුණේ චාකෝ.

අපරාධකාරයාගේ සිතේ ගැඹුරේම තැන්පත්වුණු වෛරයක් තිබෙනවා, ක්‍රොස්බි සමග. මේකට හේතුව අපි හරියටම දන්නේ නැහැ. නමුත් අපට මෙහෙම දෙයක් අනුමාන කරන්න පුළුවනි. ක්‍රොස්බි බැංකු නිලධාරියෙක්. අපරාධකරු කලකට ඉහතදී ක්‍රොස්බිගෙන් විශාල ණය මුදලක් ඉල්ලන්න ඇති. ඒක ආපසු අයකරගත හැකි ක්‍රමයක් නොමැති නිසා, ක්‍රොස්බි ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්න ඇති. එහෙමත් නැත්නම් අපරාධකාරයා බැංකුවට නොගෙවා තිබූ ණයක් ගෙවන්න කියා ක්‍රොස්බි බලකරන්න ඇති. ඒකෙන් එම පුද්ගලයාගේ ආර්ථික බිඳවැටීමක් වෙලා, සමාජය තුළ අපේක්ෂාවට පත්වීමට ඔහුට සිදුවෙන්න ඇති. අපරාධකාරයා සලකන්නේ, මේක ඔහුට කළ අපහාසයක් නැත්නම්





ද්‍රෝහීකමක් හැටියට; ඔහුගේ ආත්මගෞරවයට පහරදීමක් හැටියට. ඒ ගැන කම්පාවට පත්වෙලා ඔහු සෑහෙන කාලයක් තිස්සේ සිත් වේදනාවෙන් ඉන්න ඇති.

ඒ අනුව අපට මෙහෙම දෙයක් හිතන්න පුළුවනි. මේ අපරාධකරු කාලයක් ධනවතෙකුව හිටි කෙනෙක්. නමුත් දැන් අන්ත දුප්පතෙකු බවට පත්වෙලා. මෑතකදී ඔහුට තවත් කණගාටුදායක ඉරණමකට මුහුණ දෙන්න සිදුවුණා කියල මට හිතෙනවා. ඒ ඔහු මේ ක්‍රියාව සැලසුම් කළ පිළිවෙළ අනුව. පවුලේ මරණයක්..... ඒ නිසා ඇතිවුණු ආර්ථික බිඳවැටීමක්. ගිනිකූරක්, ගිනිඅඟුරක් වෙත ළං කළොත් මොකක්ද වෙන්නේ? එක්වරම ගිනිගන්නවා. ඒ වගේ ඔහුගේ හිතේ එක්වරම පළිගැනීමේ චේතනාවක් ඇතිවෙන්න ඇති. දීර්ඝ කාලයක් තිස්සේ හිතේ වැඩුණු ක්‍රෝධය තමයි ඒකට ප්‍රධාන හේතුව.

මට තවත් දෙයක් කියන්න පුළුවනි. ඒ, ඔහු විද්‍යාව ගැන උනන්දුවක් දක්වන, සෑහෙන තරම් උගතෙකු බව. ප්‍රොතේරා සෙබටිවිස් නම් කුඩැල්ලන් වර්ගය සොයාගැනීමට ඔහුට හැකිවීමෙන් ඒ බව පෙනෙනවා. ඒ වගේම ඔහු සතුව නිර්මාණශීලී අදහස් ඇති බවත් මට කියන්න පුළුවුනි. යම් යම් දේ මළසිරුර මත සංකේතාත්මකව තැබුවේ ඒ නිසා. බොහෝම වෙලාවට ඔහුට මිත්‍රයන් ඇත්තේ ඉතාම සුළු ගණනක්. නැත්නම් මිත්‍රයන් ඇත්තේම නැහැ. අර කළු හැඳගත් කාන්තාවක් සිටි බව අපට අහන්න ලැබුණා. ඒ ඔහුගේ බිරිඳ ද? නැත්නම් සොහොයුරිය ද නැත්නම් මිතුරියක් ද?

මං විශ්වාස කරනවා ඔහු කඳිංම මේ අවට කියලා. ඒ මොකද ඔහුට බාටන් වනාන්තරය ගැන ගැඹුරු දැනුමක් තියෙනවා. කැලේ මැද තිබෙන මුඩු තණබිම් කඩක් ගැන ඔහු දැන හිටියා. ඔහු විද්‍යාවට සම්බන්ධ කෙනෙක් නම්, දුර්ලභ ඇල්ගී හා සතුන් ගැන අධ්‍යයනය කරන්න මේ කැලයට රිංගලා ඇති. ඒ නිසා මේ තණබිම් කඩ ගැන දැනගෙන ඉන්න ඇති. කළු හැඳගත් කාන්තාව ලියුම තැබුවේ රෝස් ඇන්ඩ් ක්‍රවුන් අවන්හලේ. ඒකෙනුත් පෙනෙන්නේ, ඔවුන් ස්ටිපල් බාටන් අවට අය බව.

මිනීමරුවා ගැන කියනවා නම් ඔහු යම් තරමක බුද්ධිමතෙක්. ක්‍රොස්බිව කපටිකමෙන් මෙහාට ගෙන්වාගෙන, කැලය තුළට කැඳවා ගැනීමෙන් ඒ බව පෙනෙනවා. අනෙක් අතට දරුණු ලෙස පළිගන්නා කුරිරු මෝඩයෙක්. මේ මිනීමැරුම ක්ෂණිකව සිතලා

කළ වැඩක් නොවෙයි. සියුම් ලෙස සැලසුම්කර කළ එකක්. ඒකයි මං කිව්වේ යම් තරමකට බුද්ධිමතෙක් කියලා.

"මෝඩයෙක් කියලා කිව්වේ?"

"අපරාධකාරයාට නීතියෙන් ගැළැවීයාම අමාරුයි" හෝම්ස් කීය. "කොහොම හරි ගැළවුණා කියමු. ඒත් ඔහුට කවදාවත් තමන්ගේ හෘද සාක්ෂියෙන් බේරෙන්න හම්බවෙන්නේ නෑ."

"මට හරි පුදුමයි හෝම්ස්" මම කීවෙමි. " ඔබ කොහොමද කවදාවත් දක නැති අපරාධකාරයෙකු ගැන මේ තරමට තොරතුරු හෙළිකරන්නේ?"

"මට ලැබී ඇති හෝඩුවාවන් රැසක් අනුව තමයි වොට්සන්" ඔහු කීය. "කාගෙ හරි පා සටහන් කිහිපයක් පරීක්ෂා කළාම, ඒ පුද්ගලයාගේ සපත්තුවේ ප්‍රමාණය කීම අමාරු නැහැ. ඔහුගේ පියවර දෙකක් අතර දුරෙන් ඔහුගේ උස නිශ්චය කරන්න පුළුවනි. කරුණු මඟහැරී නොයන්න නම්, අපරාධය සිදුවුණු තැන ඉතාම හොඳින් පරීක්ෂා කර බලන්න ඕනෙ වෙනවා. අහා පඳුරු හා ගස්වල අතු කැඩෙන ශබ්දයක් ඇහෙනවා. මං හිතන්නේ ගිල්ඩ්ෆඩ් පොලීසිය මෙහාට ළඟාවෙනවා. රතුනුණු වලින් ලකුණු කළ ඊතල දිගේ ආවොත්, පාර සොයාගැනීම පහසුවෙන්න මං මගේ ලියුම් කැල්ලේ ඔවුනට දැන්නුවා. එහෙනම් අපි ඉදිරියට ගිහින් ඔවුන් පිළිගන්න"

IV

හෝම්ස්ගේ කථාව අවසන් වෙද්දීම, නිලඇඳුමෙන් සැරසුණු නිලධරයෝ දෙදෙනෙක් ගස් අතරින් මතුවූහ. එක් අයෙකු පොලිස් පරීක්ෂකයෙකු වූ අතර, අනෙකා පොලිස් භටයෙකු විය. පැමිණීමට තිබූ මාර්ගයේ දුෂ්කර බව නිසා, ඔවුහු ඩහදිය වගුරුවමින් සිටියහ.

"මම ගිල්ඩ්ෆඩ් පොලීසියේ පරීක්ෂක වයිට්ලි" හිස පුරා තට්ටයක් සහ ඝන කළු උඩුරැවුලක්, හැඩිදැඩි සිරුරක් තිබූ නිලධරයා තමා හඳුන්වා දුන්නේය. "මේ මගේ සහායකයා හගින්ස්. ඔබ වෙන්න ඇති ෂර්ලොක් හෝම්ස් මහත්මයා..... මේ දෙස්තර වොට්සන්ද? හඳුනාගන්න ලැබීම ගැන සන්තෝෂයි මහත්වරුනි"

"වයිට්ලි මහත්මයා, අපි මෙතැනට ළඟාවුණේ මෙන්න මේ පිළිවෙළටයි" කී හෝම්ස් කථාන්තරය මුලසිටම පොලිස් නිලධරයාට විස්තර කළේය.





"ඒ නිසා මහත්මයා, මං යෝජනා කරනවා" හෝම්ස් කීවේ විස්තරය අවසානයේදීය. "ඔබේ පොලිස් භටයා වන හගින්ස්, මළසිරුර මුරකිරීමට මෙතැන රඳවා තබමු. ඊළඟට මං ඔබට කලින් කියූ විදියට මට දකින්න ලැබුණු, අපරාධකාරයාගේ හෝ අපරාධකාරයන්ගේ සලකුණු ඔස්සේ යමු. මට දකින්න ලැබුණේ ඒවා පහළ හේබිරුක් දෙසට වැටී ඇති බවයි. බාගවෙලාවට ඔහු පදිංචිව සිටින්නේ එහේ වෙන්නත් පුළුවනි."

හෝම්ස්ගේ කථාන්තරය අසා සිටි පොලිස් නිලධරයා, මගේ මිතුයා හෝඩුවාවන් විශ්ලේෂණය කළ ආකාරය, ගැන පැහැදීමට පත්ව සිටියේය.

"මෙතැන ඉඳලා අපරාධකාරයා පසුපස යන්න නම් රතුනුණුවලින් ඊතල ඇඳලා නැහැ" හෝම්ස් කීය. "නමුත් කැඩුණු අතු වලින් ඔවුන් ගිය පාර මං හොයාගත්තා. එය වැටී තිබුණේ හේබිරුක් යන අසි පාරට"

හෝම්ස්ගේ උපදෙස් අනුව මළසිරුර මුරකිරීමට, හගින්ස් නම් පොලිස්භටයා රඳවා තබා, අපි එතැනින් පිටත්වුණෙමු. පහළ හේබිරුක් වෙත වැටී තිබූ පාර, බොහෝ අය ගමන් කිරීමට යොදා ගත් එකක් නිසා නොයෙක් වර්ග වල පා සටහන් දෙදිසාවකට වැටී තිබිණි. මෙතැනදී හෝම්ස් තම අවධානය යොමු කළේ බයිසිකල් ටයර් සලකුණු වෙත පමණි.

වනාන්තර පෙදෙස අවසන් වූ පසු, මාර්ගය වැටී තිබුණේ කඳු ගැටයක් ඉහළට ය. එහි මුදුනටම අප නැගුණේ හති දමමින් ඩහදිය වගුරුවමිනි. මුදුනටම නැගුණු පසු පාර යළිත් බෑවුමක් සමග කන්දේ පහළට විහිදුණේය. ව්‍යාප්ත තණබිම් හා කුඹුරු මැදින් පාර වැටී තිබූ නිසා, ඈතින් වූ හේබිරුක් ගම්මානය අපි කලින්ම දුටුවෙමු. එය පෞරාණික දෙව්මැදුරකින්, ඒ වටා විසිරී තිබුණු ගෙවල් හා තැන් තැන් වල තිබූ කුඩා ගොවිපොළ වලින් සමන්විත විය.

කන්ද බැස ගම්මානය වෙත යද්දී, Y අකුරේ හැඩයට පාර, දෙකට බෙදී යන තුන්මංසලක් අපි දුටුවෙමු. ගම්මානය වෙත යන පාර දෙවර වැටී තිබුණේ දෙව්මැදුරේ සුසානභූමිය අසලින්මය. ඈතකාලයේ එහි මිහිදන් කෙරුණු අයගේ මිනී වළවල්, පාරට ඉතා සමීපයෙන්ම තිබෙනු දක්නට ලැබිණ. මේ ගම්බද සොභාවිම

පාරෙන් වෙන් කිරීමට තාප්පයක් තබා වැටක් වත් නොවීය. මෙම කොටසේ මිනීවළවල් මත ඉදිකෙරුණු ස්මාරක, මෑතකාලයේ ඒවා බැව් හඳුනාගැනීම අපහසු නොවීය. ඊට හේතු වූයේ ඒවා පෙඳ පාසි වලින් දුර්වර්ණ නොවී, ඒවායේ ආලේප කළ තීන්ත එලෙසින්ම තිබීමය.

තමන්ගේ ඉදිරිගමනේ වේගය අඩුකළ හෝම්ස්, සොහොන් මත වූ ස්මාරකවල සඳහන් දේ කියවා බැලීමට උනන්දුවක් දක්විය. එබැවින් ඔහු ගමන් කළේ තැන් තැන්වල නැවතෙමිනි. මේ නිසා හෝම්ස් එනතුරු බලා සිටීමට පොලිස් නිලධරයාට මෙන්ම මට ද මඟ නැවතීමට සිදුවිණි. අන්තිමේදී ඔහු බොහෝ වේලාවක් ගතකළේ, මෑතකදී භූමිදාන කෙරුණු කෙනෙකුගේ සොහොන පරීක්ෂා කිරීමටයි. එතැන ස්මාරකයක් හෝ සොහොන් කොත් කිසිවක් නොවීය. අලුත හාරා පස් වළ වටේට විසිරී තිබුණු අතර, මිනීවළ මත සවිකළ සුදු පැහැති ලොකු කුරුසියක් විය. ඒ අසලම බිම තිබුණේ වියළී, දිරවී ගිය මල් සහිත මල්වඩමකි. මගේ මිත්‍රයා එතැනට ළංවී මල්වඩමේ සවිකර තිබූ කාඩ්පත ඉතා උනන්දුවෙන් කියෙව්වේය.

අප, ඔහු එනතුරු නැවතී බලා සිටිනු දුටු හෝම්ස්, ඉක්මන් ගමනින් අප වෙත පැමිණියේය.

"මොනවා හරි වැදගත් දෙයක් නිරීක්ෂණය කරන්න ඔබට හැකිවුණා ද හෝම්ස්?" මම ඇසීමි.

"බොහොම කලාතුරකින් දකින්න ලැබෙන ආකාරයේ සොහොන් බිමක්." ඔහු කීය. "පාර දෙපැත්තේ වවා තිබෙන යූ ගස් අවුරුදු පනහක් හැටක් නැත්නම් ඊටත් වඩා පැරණි ඇති. මරණය හා ශෝකය සමඟ වෙළී තිබුණත් මේ සොහොන් බිම හරිම සුන්දරයි... දවසක අපි ආයෙත් එන්න "ඕන තැනක්" හෝම්ස් කීවේ හැඟුම්බරවය.

සොහොන්බිමේ සිට ගම්මානය වෙත, කඳුබෑවුමේ පහළට වැටී තිබුණු පාර, ක්‍රමයෙන් වඩාත් පුළුල් විය. එහෙත් එය ගල් හෝ තාර දමා සකස් කළ එකක් නොවීය. යාර දෙසියයක් පමණ ඇතින් ගම්මානය තිබෙන අයුරු අපි දුටුවෙමු. කන්ද බැසගිය අප යළිත් පිවිසියේ පාර දෙපැත්තම කුඹුරුයාය වලින් වටවූ අඩවියකටයි. ඇළ පාරෙන් හා කුඹුරු වලින් පාරට වතුර ගලා ඒම නිසා එය ද





තැනින් තැන මඩ වී තිබිණ. අධික ලෙස වැසි ඇදහැලෙන කාල වලදී, කුඹුරුවල එකතු වන ජලයෙන්, පාර ද ගංවතුරට යටවෙන බැව් සිතාගැනීම අපහසු නොවීය. හෝම්ස් යළිත් වරක් මඩ වූ තැන් ගැන අවධානය යොමුකරමින් ගමන් කළේය. ඒ බයිසිකල් ටයර් සලකුණු දකීමට බව මම දැන සිටියෙමි. විටෙක ඔහු පාරේ මිනිත්තුවක් දෙකක් නැවතී බලාසිටියේය. ඇවිදීමෙන් වෙහෙසට පත්ව සිටි පොලිස් නිලධරයා ඔහුගේ පමාව ගැන නොඉවසිල්ලට පත්වූ බව මම තේරුම් ගතිමි. බයිට්ලිගේ මුහුණේ මා දුටුවේ "මොකක්ද මේ ප්‍රමාදය. අපි ඉක්මන් කරමු" යන හැඟීමය.

කුඹුරුයාය පසුකොට ඉදිරියට යද්දී ගෙවල් තිබූ අඩවිය හමුවිණි. මේ හරියේ පාර අයින දිගටම, පාර දෙපැත්තේම, ක්‍රෝටන් පඳුරුවලින් සැකසුණු මල් වැටක් දිගින් වවා තිබිණ. ගෙවල්වලට ඇතුළුවීම සඳහා වූ ගේට්ටු සඳහා පමණක් එය කඩතොලු විය. යමින් ඉදිරියට ආ හෝම්ස් එක්වරම මග නැවතුණේය.

"බයිට්ලි මහත්මයා නවතින්න" හෝම්ස් කීය. "අපි මේ පැත්තට හැරෙමු"

"ඇයි ඔය පැත්තට?"

"බයිසිකල් ටයර් ලකුණු වැටී තිබෙන්නේ මේ පැත්තට"

දීර්ඝ විස්තරයකට පමා නොවූ හෝම්ස් අතුරුපාරට හැරී ඉදිරියට ගියේ ඉක්මන් ගමනෙනි. දඩයමේ යද්දී දඩබල්ලකුට හැලැපනෙකුගේ ඉවක් අසුවුණු විට, ඌ එය ලුහුබැඳ යන විලාසය මට සිහිවිය. හෝම්ස් දැඩි අවධානයෙන් දෙනෙත් බිමට යොමුකරගෙන ඉදිරියට ගියේ, මොහොතකට හෝ හිස ඔසවා නොබලමිනි.

මෙම අතුරුපාර පටු එකකි. එය කුඩා අශ්වකරත්තයක් ගමන් කිරීමට වත් පුළුල් නොවීය. මෙම පෙදෙස අඩු ආදායම්ලාභීන් පදිංචිව සිටි එකකැයි මට සිතිණ. ඊට හේතු වූයේ පාර දෙපස තිබූ ප්‍රමාණයෙන් කුඩා වූ නිවාසය. ඒවායේ එතරම් දකුම්කලු බවක් ද නොවීය. බොහෝ කලකට පෙර මඩවගුරක්ව පැවැති මෙය, ගොඩකර නිවාස තැනීමට යොදාගෙන ඇති බවක් පෙනිණ. පොළොව යටින් කාන්දු වූ ජලය නිසාදෝ, පාරේ තිබුණේ මඩ සහිත බවකි. පාරේ තවත් ඉදිරියට යද්දී නිවාස ගණන තවත් අඩුවිය. පාර දෙපස වල්බිහිවී තිබුණේ, පදිංචිය අතහැර දමූ පෙදෙසක්



www.sinhalaelibrary.com

විලසිනි. එහෙත් හැලැහෙරාද තුළ තිබූ ගෙයක් එක්වරම අපට දකින්නට ලැබිණ.

එය තනිතට්ටුවේ ඉතා කුඩා ගෙයක් විය. එහි තිබුණේ කුඩා දරුවෙකුගේ චිත්‍රයක වැනි සරල පෙනුමකි. ඉදිරියෙන්ම දොරක්, එය දෙපස ජනේල හා දෙපසට බෑවුම් වූ උළු වහලකි. පෙද පෙවෙල් වලින් කළු පැහැ වීම නිසා, එම උළු බොහෝ කලකට පෙර සෙවිලි කරන ලද ඒවා බැව් සිතාගත හැකිවිණි. හුණු ආලේප කර තිබූ බිත්ති දුර්වර්ණ වී පැල්ලම් සෑදී තිබිණි. චිත්‍රය සම්පූර්ණ කිරීමට නම් වහලේ තිබූ දුම්කවුළුවෙන් දුම් නිකුත්වෙමින් තිබිය යුතු විය. එහෙත් එවැන්නක් දක්නට නොවිය. කිසිවෙකු මෙහි පදිංචි බව හඟවන ශබ්දයක් වත් නිවස තුළින් පිට නොවිණි.

එහෙත් ගෙදර කවුරුන් හෝ පදිංචි බවට සැකයක් නොවිය. ඉදිරි දොර විවෘතව තිබූ අතර, එළිපත් බිත්තියකට හේත්තු කළ බයිසිකලයක් විය. එය මෙත පහත්වූ හෝම්ස් ටයර් පරීක්ෂා කිරීම සඳහා මොහොතකට නිහඬ විය. ඉන්පසු ඔහු හිස සෙලවූයේ අප පැමිණි තැන නිවැරදි බැව් අපට සංඥා කරමිනි. මීළඟට ඔහු තම සැරයටියෙන්, විවෘතව තිබූ දොරට තට්ටු කළේය.

"ගෙදර කවුරුවත් ඉන්නවද?" හෝම්ස් ඇසුවේ තරමක් උස් හඬිනි.

එහෙත් එයට පිළිතුරක් නොලැබිණි. කිහිප වාරයක්ම මෙසේ කතා කළත්, දොරට ඉවියගෙන් ගැසුවත් කිසිදු ප්‍රතිචාරයක් නොවිය.

කිහිප වාරයක් කතා කළත් පිළිතුරක් නොලැබුණු නිසා හෝම්ස් නිවස තුළට පිවිසියේය. අපි ඔහු පිටුපස ගියෙමු. අප ඇතුළු වුණු සාලයේ වම් පැත්තට හා දකුණු පැත්තට පිහිටි කාමර දෙකක දොරවල් වසා තිබිණි. හෝම්ස් දකුණු පැත්තට තිබූ කාමරයේ දොර විවෘත කොට හිස පොවා බැලීය.

ඔහුට හිතියෙන් හැ ගැසිණ. හෝම්ස්ගේ එවැනි හැසිරීමක් මා මීට පෙර දැක නොතිබිණි. හැඟැසූ විගසම හෝම්ස් එම කාමරයට කඩාවැදුණේය. වයිටිලි සහ මම, හෝම්ස් පසුපස කාමරයට පිවිසුණෙමු. දකින්නට ලැබුණු භයානක දසුන අප කිසිසේත් බලාපොරොත්තු වූවක් නොවේ.

කාමරයේ බිම පුටුවක් පෙරළී තිබිණ. අපට දකින්නට ලැබුණේ වහලේ බාල්කයකට සවි කළ කොක්කක කඹයකින් එල්ලී





සිටියෙකුගේ රුවකි. ඒ කළුපැහැති ඇඳුම් හැඳගත් කාන්තාවක බැව් අපි දුටුවෙමු.

බිම පෙරළී තිබූ පුටුව කෙළින් කළ හෝම්ස් එයට නැගී, අපෙන් උදව් ඉල්ලා කැගැසුවේය. ඔහු සිරුර දෑතින්ම බදාගෙන එය ඉහළට එසෙව්වේය. මුළුතැන් ගෙයට දිවගිය පොලිස් නිලධාරියා පිහියක් රැගෙන විත් කඹය කපා සිරුර පහතට ගැනීමට උදව් කළේය.

හීර්ෂපෝෂී ධමනිවල ස්පන්දනයක් තිබේදැයි පරීක්ෂාකිරීමේ අවශ්‍යතාවයක් මට නොවිය. ඇය පත්ව සිටි තත්ත්වය මට බැලූ බැල්මට පෙනිණ.

"අප ප්‍රමාද වැඩියි හෝම්ස්" මම කීවෙමි. "ඇයගේ ජීවිතය බේරාගන්නට අපට කළ හැකි දෙයක් නෑ"

හෝම්ස්ගේ මුහුණේ මා දුටුවේ තැලෑතුරකින් ඔහු වෙතින් දකින්නට ලැබෙන හැඟීම ය. දෙනෙත් ඇතුළට ගිලී, අළු පැහැයට හැරුණු මුහුණෙන් පළවුණේ සංවේගයයි.

"ඇය නෙමෙයි ඔහු!" හෝම්ස් කීය.

"ඔහු?"

"ඔව් වොට්සන්. මේ ගැහැනියක නොවෙයි. පිරිමියෙක්!"

මළසිරුර වෙත පහත්වූ හෝම්ස් එහි මුහුණ වසා තිබූ කළු පාට වෙල් රෙදි කැබැල්ල ඉවත්කොට, මුහුණ විවෘත කළේය. මුහුණපුරා වැවී තිබූ කළු රැවුල් කොට නිසා, මේ අවුරුදු විසිහතක අටක තරුණයෙකු බැව් හැඳිනගැනීම අපහසු නොවිය.

"මේ ගැහැනියක නොව තරුණයෙකු බව, ඔබ කොහොමද විශ්වාසෙට දැනගත්තේ?" මම ඇසීමි.

"ඔබ දුටුව නේද මං මෙහෙ එන අතරේ සොහොන් පිට්ටනියෙ හරියෙදි මග නැවතෙමින් මිනීවළවල් පරීක්ෂා කළ හැටි? මෑත කාලයක සිදුවුණු ගෝත්‍රපත්නක මරණයකට, මේ අභිරහස සම්බන්ධය කියන හැඟීම මගේ හිතේ ඇතිවෙලා තිබුණා. හුඟක්ම මෑතකදී මිනියක් වළ දැමූ තැනක නැවතිලා මං ඒ හරිය පරීක්ෂා කළා. මං දුටුවා වියළී ගිය මල්වඩමක්. ඒකට සවිකර තිබුණු කාඩ්පත මං කියෙව්වා. ඒකෙ මෙහෙම සඳහන් වෙලා තිබුණා.

"වැලපෙන නැමගේ සැනසුම වෙනුවෙන්
පළිගම් මතු යම් දවසක ඔහුගෙන්.
ඔබේ සුන්දරණීය පුත් රූපට ගෙන්
මගේ ආදරණීය අම්මාට"

මේ කියන කාන්තාවගේ මරණය සිදුවෙලා තිබුණේ මීට දින දහයකට කලින්. මං හිතන්නේ මේ තරුණයා, ඇල්ගනොන් ක්‍රොස්බිව මරන්න තීරණය ගත්තේ එදා තමයි"

"හෝම්ස් මහත්මයා, මේ තියෙන්නේ ඔහු ලියූ අන්තිම ලියවිල්ල" මේසය මත තිබූ කඩදාසියක් අතට ගත් පොලිස් නිලධරයා කීය. "මං මේක කියවන්නද?"

"ඇත්තෙන්ම ඔව් වයිට්ලි, අපි අහගෙන ඉන්නම්"

*"......... මට මුහුණදීමට සිදුවී ඇත්තේ වේදනාවෙන් පිරුණු ඉතා දුක්ඛිත ජීවිතයකටයි. මෙය මා තවදුරටත් ඉවසා සිටින්නේ කෙලෙසද? ඒ නිසා මගේ පවුලට විනාශය ළඟාකළ ක්‍රොස්බි මරා දැමීමට මම අවසානයේ තීරණය කළෙමි. මගේ තාත්තාගේ හා අම්මාගේ අකල් මරණ වලට වගකිව යුත්තේ ක්‍රොස්බි මිස අන් කවරෙක්ද? මගේ දීප්තිමත් අනාගතය විනාශය කරා යොමු කළ ඔහුට දියයුත්තේ කුමන දඬුවමක්ද?*

*බාටන් වනාන්තරයේ එළිමහන් තණබිම කඩක් මැද, ඔහුගේ මළසිරුර ඔබට හමුවෙනු ඇත. මෙයට සම්බන්ධ සියලුම තොරතුරු අඩංගු ලියකියවිලි, මගේ නිදනකාමරයේ ඇති යකඩ පෙට්ටියේ දමා ඇත.*

*රූපට් සෙෆ්ටන්"*

තරුණයාගේ සිරුර ගිල්ඩ්ෆර්ඩ් මෘතශරීරාගාරය වෙත ගෙනයා යුතුව තිබිණ. ඒ සඳහා කුලීරියක් ගෙනඒමට වයිට්ලි, හේබ්‍රුක් ගම්මානය වෙත ගියේය. ඒ අතර අපි සෙෆ්ටන් නිවස පරීක්ෂාකර බැලුවෙමු.

සෙෆ්ටන් මහත්මියගේ කාමරය මුලින් අපගේ අවධානයට ලක්විය. ඇගේ ඇඳුම් සියල්ල ලාච්චුවල අසුරා තිබූ අතර, ඇඳ සමීපයේ මේසය මත බයිබලයක් විය. ඇය විසින් අඳින ලද කළු පැහැති ඇඳුම් වලින් එකක් හා කළු වේල්පොටක්, තරුණියක ලෙස රඟපෑමට තරුණ රූපට් විසින් යොදාගෙන තිබූ බැව් අපි දුටුවෙමු.

ඔහුගේ කාමරයේ තිබුණේ බඩුබාහිරාදිය ස්වල්පයක් පමණි. ඇඳක්, විශාල ලාච්චු අල්මාරියක්, හා කුඩා මේසයක් ඒ අතර විය. ලාච්චු අල්මාරියේ අපට මුලින්ම හමුවූයේ මංගල ඡායාරූපයකි. ඒ





මෙම තරුණයා විවාහ වූ දිනයේ ගත් එකක් බැව් අපි දුටුවෙමු. ප්‍රීතිමත් සිනාවකින් මුව සරසාගෙන සිටි ඔහුගේ මනාලිය ද ප්‍රියංකර තරුණියක වූවාය. මෙම ඡායාරූපයට යටින් තවත් පැරණි මංගල ඡායාරූපයක් හමුවිය. ඒ ඔහුගේ දෙමාපියන්ගේ මංගල ඡායාරුව විය යුතු බවට අපි විශ්වාස කළෙමු. එහි සිටි කාන්තාවට තිබුණේ මෙම තරුණයාගේ මුහුණුවරම බැවි හඳුනාගැනීමට අපහසු නොවීය.

"එතකොට රූපට්ගේ බිරිඳට මොකද වුණේ?" හෝම්ස් විමසුවේ තරුණ යුවළගේ ඡායාරූපය යළිත් පරීක්ෂා කරමිනි. "මොකක් හරි ප්‍රශ්නයක් නිසා ඔහුට බිරිඳත් අහිමි වෙලාද දන්නෙ නෑ. එහෙම වුණා නම් මේ ඉරණමට එයත් බලපාන්න ඇති"

මේ අතර පොලිස් නිලධරයා අසු ප්‍රවාහනය කරන වර්ගයේ කුඩා අශ්වකරත්තයක් සොයාගෙන ආවේය. සෙෆ්ටන්ගේ මළසිරුර එයට පටවාගෙන ඔහු පිටත්වූයේ, ක්‍රොස්බිගේ මළසිරුර පටවාගැනීමට බාටන් වනාන්තරය වෙත ද යාමට ඇති බැව් වයිට්ලිට මතක් කරමිනි.

ඉන්පසු නිවස පරීක්ෂා කරන අතරේ එහි මුළුතැන්ගෙයි වූ බඳුනක් වෙත, හෝම්ස් මගේ අවධානය යොමු කළේය. එහි තිබුණේ වතුර මිශ්‍ර පස්වල දැමූ රතු කුඩැල්ලන් පොකුරකි.

රූපට් සෙෆ්ටන්ගේ කාමරයේ වූ යකඩ පෙට්ටියේ තිබී මෙම සිදුවීම පැහැදිලි කරන ලියවිලි ගණනාවක්ම අපට හමුවිය.

පුවත්පත් වලින් කපාගත් කොටස්, බැංකු වලින් එවන ලද ලිපි හා ගිණුම් වාර්තා ද ඒ අතර විය. මිළඟට කළු හැඳගත් කාන්තාව ලෙස වෙස්වළාගනිමින්, අවන්හල් අයිතිකරුට දී තිබී ක්‍රොස්බි ලබාගත් ලිපිය ද, එදා උදේ තැපෑලෙන් ක්‍රොස්බි වෙත යවා තිබූ ලිපිය ද ලියවිලි පෙට්ටියේ උඩින්ම විය.

*"ඇල්ගනොන් ක්‍රොස්බි මහතා වෙතටයි,*

*ඔබ වෙත මරණ තර්ජන කරමින් දිගින් දිගටම ලිපි එවන පුද්ගලයා ගැන මම හොඳින් දනිමි. මට අපහාස හා වධහිංසා කළ ඔහු, ඉඩක් ලැබුණොත් මා මරා දැමීමට ද බලාපොරොත්තු වෙයි. ඒ නිසා ඊට පෙර ඔහු ඔබට අල්ලා දීමට මම තීරණය කරගෙන සිටිමි.*

*කරුණාකර ඒ සඳහා අදම ගිල්ඩ්ෆර්ඩ් අසල ස්ටීපල් බාටන් ගම්මානය වෙත පැමිණෙන්න. වික්ටෝරියා දුම්රියේ පොළෙන්*

උදේ 9.16 ට පිටත්වෙන දුම්රියේ පැමිණ, ඕල්ඩ්ගාඩ් දුම්රියපොළෙන් බහින්න. කුලීරියක නැගුණු විට ස්ටිපල් බාටන් වෙත ඒමට ඔබට ගතවෙන්නේ පැය කාලක් පමණි.

මේ සඳහා ඔබ පැමිණිය යුත්තේ තනිවම බව අමතක නොකරන්න. ස්ටිපල් බාටන්හි රෝස් ඇන්ඩ් ක්‍රවුන් අවන්හලේ ඔබ එනතුරු මම බලා ඉඳිමි. මෙය ඉතා රහසිගත කටයුත්තක් නිසා, මේ ගැන කිසිවෙකුට නොදන්වන ලෙස මම ඔබෙන් අයැද සිටිමි. ඔබ පැමිණෙන විට, ඔබ හඳුනාගැනීම පහසුවීම සඳහා මෙම ලිපිය නොවරදවාම රැගෙන එන්න.

මෙයට
එලිසබෙත් කනිංහැම්"

මීළඟට මා ඔබ වෙත ඉදිරිපත් කරන්නේ සෝටන් තරුණිය කළු හැඳගත් කාන්තාව ලෙස, අවන්හල අයිතිකරුවා අනේ ක්‍රොස්බිට යොමු කළ ලිපියයි.

"මේක ලියන්නේ හදිසියෙන් හමුවෙන තැන වෙනස් කරන්න සිදුවුණා. තොරතුරු හැමදෙයක්ම ඔබට රහසිගතව හෙළිකරන්නම්. ඒ සඳහා ආරක්ෂා සහිත තැනක් අවශ්‍යයි. බාටන් වනාන්තරයේ සෙනග ගැවසෙන්නේ නැති තැනක් තියෙනවා. එතැනදී හමුවෙමු.

බාටන් වනාන්තරයට පිවිසෙන පාර දිගේ මුලින් එන්න. හැතැක්ම බාගයක් පමණ එද්දී "පහළ හෝබ්රුක් වෙත" යනුවෙන් ලියූ නාම පුවරුවක් දකින්න ලැබේවි. එතැන ඔබ ආ යුතු පිළිවෙළ රටනුණු වලින් ලකුණු කළ ඒතල වලින් දක්වෙන පාරේ එන්න. මම ඔබ එනතුරු බලා සිටිමි.

එලිසබෙත් කනිංහැම්"

මේ ලියුම්වලට අමතරව අපට හමුවූයේ, සෝටන් පවුලේ ඛේදජනක කථාන්තරය ලියා තිබූ පොත පමණකි. එය දීර්ඝ විස්තරයක් නිසා, එහි සාරාංශය වෙත ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

"කලකට පෙර අපි ඉතා ධනවත්, ජීවිතය සැපසේ ගතකළ අයවීමු. අප පදිංචිව සිටියේ ලන්ඩනයේ, සෙන්ට් ඇන්ස් වුඩ්ස් නම් අලංකාර පෙදෙසක ය. එහි වූ සුඛෝපභෝගී නිවසක මගේ ඒ ළමා කාලය ගෙවූ හැටි මට තවමත් හොඳින් මතක තිබේ.





මට උසස් අධ්‍යාපනයක් ලබාදීම සඳහා ඉහළම පෙළේ පාසලකට මා යැවීමට, මගේ පියාට දැඩි උවමනාවක් තිබිණි. ඔහුගේ ඒකම අරමුණ වූයේ, මා විද්‍යාඥයකු වනු දැකීමය. අනෙක් ළමයින් සමග ආශ්‍රයට නොගොස් මගේ සම්පූර්ණ කාලයම, මම ඉගෙනීම සඳහා කැප කළෙමි. සත්ත්ව විද්‍යාව හා උද්භිද විද්‍යාව ඉහළටම හදාරා, ස්වභාව විද්‍යාඥයෙකු වීමට මම සිහින සිටියෙමි. ඒ සඳහා අවසානයේ කේම්බ්‍රිජ් සරසවියට ඇතුළුවීම මගේ අධිෂ්ඨානය විය.

මගේ පියා ෆ්‍රෙඩ්රික් සෝටන් රැකියාවක් සොයා, තරුණ කාලයේම දකුණු අප්‍රිකාවට සංක්‍රමණය වූ අයෙකි. එහි රත්රන් ආකරවල රැකියාව කළ ඔහු, වෙහෙස මහන්සියෙන් විශාල ධනයක් උපයාගෙන ආපසු එංගලන්තයට පැමිණියේය. ඉපැයූ ධනය, අනාගතය සඳහා සාර්ථක ලෙස ආයෝජනය කළ හැකි ක්‍රමයක්, මගේ පියා සොයමින් සිටියේය. අන්තිමේදී ඔහු ඒ සඳහා ගියේ මෝට් බැංකුවේ ඇල්ගනොන් ක්‍රොස්බි නම් මහතෙකු වෙතය.

ක්‍රොස්බි පවුල මගේ මවගේ පවුලේ අසල්වාසීන්ව සිටි බැව් ඇය අපට කියා තිබිණි. ඒ ඔහු උසස් අධ්‍යාපනය ලබන කාලයේදීය. ක්‍රොස්බි පවුල එතරම් වත් පොහොසත්කම් නොතිබුණු දුප්පත් අය බව ද ඇය කීවාය. ඔහු තරුණ කාලයේ මගේ මව වෙත කිහිපවරක්ම විවාහ යෝජනා ඉදිරිපත් කර ඇත. ධනවතෙකු වූ මගේ මවගේ පියා, ඒවා සෑමවිටකම ප්‍රතික්ෂේප කළ බව අපේ ඇතිවරියකගෙන් මට පසුකලක දැනගන්නට ලැබිණි. ඇල්ගනොන් ක්‍රොස්බි පසුකලක බැංකු අධ්‍යක්ෂකවරයෙකුගේ දියණිය සමග විවාහ වී ඇත.

මගේ මව වර්ජිනියා පසුව විවාහ වූයේ, දකුණු අප්‍රිකාවේ සිට විශාල ධනයක් උපයාගෙන ආ මගේ පියා ෆ්‍රෙඩ්රික් සෝටන් සමගයි.

මා කුඩා කාලයේ දකිද්දී ක්‍රොස්බි අපේ පවුල සමග අමනාපයක් නොවීය. සෙන්ට් ඇන්ස් වුඩ්ස්හි අපේ නිවසට ඔවුන් නිතර පැමිණි අතර, අපි ඔවුන්ගේ වෙල්සිහි නිවසට ගියෙමු. මුදල් ආයෝජනය කළ යුතු ආකාරය ගැන මගේ පියාට, සියලුම උපදෙස් ලබාදුන්නේ ක්‍රොස්බි විසිනි.

"දකුණු අප්‍රිකාවේ රත්රන් මිල්ලම තවත් අවුරුදු සීයක් ගියත් ඉවර වෙන එකක් නොවෙයි ෆ්‍රෙඩ්රික්" ක්‍රොස්බි මගේ පියා අමතා



www.sinhalaelibrary.com

කිසූ අයුරු මට තවමත් මතක ඇත. "ඒක මං නොකිව්වට ඔබ දන්නවා නේ. ඔබ ළඟ තියෙන මුදල් සියල්ල බය නැතුව ඒකෙ ආයෝජනය කරන්න. ඔබට ලාභාංශ නොකඩවා ලැබෙන බව ඉර හඳ වගේ විශ්වාසයි."

"ඔබේ උපදෙස් භාරගෙන," මගේ පියා කීය. "මං බ්ලෝම්ෆොන්ටේන් පතල් සමාගමෙන්, ප්‍රිටෝරියා කැණීම් සමාගමෙන්, ඔකර්ස් ඇන්ඩ් තෝර්ප් ඛණිජ සමාගමෙන් කොටස් මිලට ගන්නා. මගේ හිතේ සැකයක් තියෙන්නේ ඩිව්ලියර්ස් සමාගමේ කොටස් ගැන"

"ඒ ගැන කිසිම භයක් වෙන්න එපා" ක්‍රොස්බි කීවේය. "මට දැනගන්න ලැබුණු විදියට දකුණු අප්‍රිකාවේ හොඳම රත්‍රන් ඉල්ලම අහුවෙලා තියෙන්නේ ඩිව්ලියර්ස්ලාට. දැන් ගත්තොත් ඒකෙ කොටස්, ඔබට ඉතා අඩු මුදලකට ගත හැකි වේවි"

මගේ පියා ඔහු සතු මුළු ධනස්කන්ධයම දකුණු අප්‍රිකානු රත්‍රන් පතල් සමාගම්වල කොටස් වලට ආයෝජනය කළේය. ඔහු තමන්ගේ මුදල් වෙනත් කිසිදු සමාගමක ආයෝජනය කළේ වත්, බැංකුවක ඉතිරිකළේවත් නැත.

'90 දශකයේ අන්තිම කාලය වෙද්දී රත්‍රන් පතල් කර්මාන්තයට වගුරු උළමා හඬන්නට පටන්ගත්තේය. එක් පැත්තකින් බෝවර් යුද්ධය ඇවිළී, මුළු දකුණු අප්‍රිකාව පුරාම කලකෝලාහල හටගැනී, රටම යුදපිටියක් බවට පත්විය. ඊට අමතරව උණ සන්නිපාතය හා කහඋණ වැනි වසංගත රෝග පැතිරී ගියේය. මිනිසුන් දහසදහස් ගණනින් මියයද්දී පතල් කර්මාන්තය මුළුමනින්ම කඩාවැටිණි. මගේ පියාගේ මුළු ධනස්කන්ධයම විනාශවී, ඔහු දුගී තත්ත්වයට ඇදවැටීමට ගතවූයේ මාස කිහිපයක් පමණි.

මගේ පියා එහාම පවුලේ මිතුරා මෙන්ම උපදේශකයා වූ ඇල්ගනොන් ක්‍රොස්බිගෙන් ණයක් ඉල්ලා සිටියේය. මොට සහ සමාගම කෝටි ප්‍රකෝටි ගණන් මුදල් තැන්පතු තිබෙන දැවැන්ත බැංකුවකි. මගේ පියාට සුළු ණයක් ලබාදීම ඔවුනට අමාරු කරුණක් නොවීය. නමුත් කිසිම ණයක් ලබාදීම ක්‍රොස්බි ප්‍රතික්ෂේප කළේය. මගේ මව සමග විවාහ වීමේ බලාපොරොත්තුවෙන් සිට, එය ප්‍රතික්ෂේප වීම නිසා, ක්‍රොස්බි හිත යටින් තමා අහග වෛරයෙන් සිටින බව මගේ පියා විශ්වාස කළේය.





අන්තිමේදී ලන්ඩනයේ අප සතු නිවසද මොට් බැංකුවට උකසට තබා ණයක් ගැනීමට, මගේ පියා තීරණය කළේය. ඒ සඳහා අපට ගෙවීමට සිදුවූයේ විශාල පොලියකි.

"වර්ජිනියා" ම පියා කීවේ මගේ මව අමතමිනි. "බැංකු කාරයන් කියන්නේ ලේ උරා බොන කුඩැල්ලන් වගේ ජාතියක්. උන්ට ඕන මනුස්සයින්ගේ ලේ උරා බොන්න. බීලා බීල මත්වෙලා ඒත් ඇතිවෙන්නෙ නෑ. මනුස්සයින් මැරෙනා තුරු උන් ලේ උරා බොනවා."

බෝවර් යුද්ධය අවසන් වූ පසු, රත්‍රන් කර්මාන්තය යහපත් අතට හැරේවියයි මගේ පියා විශ්වාසයෙන් සිටියේය. එසේ වූවා නම් ඔහුට යළිත් හිස එසවීමට ඉඩක් තිබිණ. නමුත් සිදුවූයේ කුමක්ද? යුද්ධයෙන් හා වසංගත රෝග වලින් මිනිසුන් දහසදහස් ගණනක් මිය යෑම නිසා, රත්‍රන් කර්මාන්තය යළි පණ ලැබුවේ නැත. මුදල් ආයෝජනය කළ සමාගම් බංකොලොත් වී ගියේ, ඒවායේ හවුල්කරුවන් විනාශමුඛයට ඇද දමමිනි. එක් පැත්තකින් බැංකුවේ පොලී ගෙවීමට සිදුවුවත්, අපට වෙනත් ආදායම් මාර්ගයක් නොතිබිණි. දුක් කල්කිරීමට එක් මගේ පියා කළේ මත්පැනේ පිහිට සෙවීමයි. අධික ලෙස මත්පැන් පානය කිරීම නිසා ඔහු රෝගී විය. මසක් ගතවීමට පෙර ඔහු හෘදයාබාධයකින් මියගියේ අපේ මුළු අනාගතයම අඳුරු අගාධයකට හෙළමිනි.

නිවස උකසට තබා ගත් ණයමුදල හා පොලිය පියවීමට නොහැකිවූ නිසා, අපේ නිවස බැංකුව විසින් ගිලගනු ලැබිණ. මගේ අම්මාත් මමත් මහමඟට වැටුණෙමු. ඇල්ගනොන් ක්‍රොස්බි වෙත නොපමණ ආයාචනා කළත් ඔහුගෙන් කිසිදු පිහිටක් නොලැබිණ.

ඉතාම අසරණ තත්ත්වයට පත්වූ අපි ලන්ඩනයෙන් පිට වී ඈත පිටිසර, පහළ හේබිරුක් හි පදිංචියට ආවෙමු. ඉතා අඩු කුලියකට පැරණි කුඩාගෙයක් ලබාගැනීමට අපට හැකිවිණි. මේ වනවිට මගේ වයස අවුරුදු දහහතකි. ස්වභාව විද්‍යාඥයෙකු වීමේ මගේ සිහිනය කඩා වැටිණි. මම පාසලෙන් ඉවත්වී රැකියාවක් සොයන්නට වීමි. මැහුම් ගෙතුම් කරමින්, ගෙවල්වල කුඩා දරුවන් බලාගනිමින් මගේ මව සුළු මුදලක් ඉපැයුවාය. නමුත් අපේ දිවිගෙන යාම සඳහා ඒ මුදල ප්‍රමාණවත් වූයේ නැත.

මගේ පියාණන් ඔහුගේ අවසන් කාලයේ කියූ කාරණා මගේ හිතේ යළි යළිත් මතුවෙමින් තිබිණ. "බැංකුකාරයන් කියන්නේ ලේ



www.sinhalaelibrary.com

"උරා බොන කුඩැල්ලන්" ඇල්ගර්නොන් ක්‍රොස්බි කෙරෙහි මගේ සිතේ ඇතිවූයේ දැඩි වෛරයකි; කැකෑරෙන ක්‍රෝධයකි.

රැකියා සොයමින් සිටි මට ඉක්මනින් රැකියාවක් ලැබිණි. ඒ ගිල්ඩ්ෆර්ඩ් නගරයේ ඖෂධ වෙළඳසැලක රැකියාවකි. ඖෂධ වෙළඳසැලේ බෙහෙත් කලවම් කරන්නෙකු ලෙස මට ඒ රැකියාව ලැබුණේ, පාසලේ දී මා රසායන විද්‍යා විෂයය උගත් නිසාය. එයින් ලැබුණු වැටුප අපට ජීවත්වීමට ප්‍රමාණවත් වූ නිසා, මගේ මවට ගෙදර නැවතීමට හැකි විය.

ඉතාම සුන්දර තරුණියක වූ ගර්ට්රූඩ් මට හමුවූයේ ඖෂධ වෙළඳසැලේ රැකියාව නිසයි. එහි වෙළඳ සේවිකාව වූ ඇය ස්ටීපල් බාටන් සමීපයේ පිහිටි නිවසේ සිට රැකියාවට ගියේ බයිසිකලයෙනි. මා පහළ ගේබ්‍රියස් සිට බයිසිකලයෙන් රැකියාවට ගිය නිසා, අප දෙදෙනා අතර සමීප මිත්‍රත්වයක් ඇතිවිය. එය ප්‍රේම සම්බන්ධයක් බවට පෙරළුණේ අප නොදැනුවත්වම යි.

"අපට පුළුවන් හැටියට ජීවත්වෙමු රූපට්" ගර්ට්රූඩ් කීවාය. "මම පොහොසත් පවුලක දුවෙක් නොවෙයි. මට දුක්විඳලා හොඳට පුරුදුයි"

ඉතින් අපි ඇගේ දෙමව්පියන්ගේ හා මගේ මවගේ ආශිර්වාදය මැද විවාහ වූයෙමු. අප දෙදෙනාගේ රැකියාවලින් ඉපැයූ මුදල නිසා කරදරයකින් තොරව ජීවත් වූයෙමු. එහෙත් වැඩිකල් නොගොසින් අවාසනාව යළිත් අප සොයා ආවේය. පියාගේ අකල් මරණයෙන් මෙන්ම අපේ පවුලට අත්වුණු ඉරණම ගැන ශෝකයෙන් තැවෙමින් කාලය ගතකළ මගේ මව, අංශභාග රෝගයට ගොදුරු වූවාය. වෛද්‍යවරුන් පැවසුවේ ඇය රෝහලක නවත්වා ප්‍රතිකාර ලබා දිය යුතු බවයි. එහෙත් අපට ඒ තරම් වත්කමක් නොතිබිණි.

අන්තිමේදී මව ගෙදර තබා ගෙන ඇයට සාත්තු සප්පායම් කිරීමට මම තීරණය කළෙමි. විශ්‍රාමලත් සාත්තු සේවිකාවක ඒ සඳහා යෙදවීමට අපට සිදුවිය. ඇයට සෑහෙන වැටුපක් ගෙවීමට සිදුවූ නිසා, අන්තිමේදී අපි යළිත් අගහිගකම් වලින් පීඩාවිඳීමට පටන්ගත්තෙමු. නැතිබැරිකම වැඩිවෙද්දී මා හා බිරිඳ අතර අඬදබර ද හටගැනිණි. අනම්ට නිගාවෙද්දී ඇගේ ආදරය පැලදෙරින් පලාගිය බැව් මම දුටුවෙමි. එක් අවාසනාවන්ත දිනක ගර්ට්රූඩ් මා අත්හැර දමා, සිය දෙමාපියන්ගේ නිවස වෙත ගියාය.





"රූපට්. ඔබ වැඩ කරන්නෙ බෝඩෙට පිස්සු හැදුණු මිනිහෙක් වගේ" දිනක් මගේ රැකියා ස්ථානය හිමිකරුවා කිව්වේ මා ගැන අනුකම්පාවෙනි. "ප්‍රශ්න නිසා ඔබේ හිත නරක්වෙලා. ඔබව මානසික රෝග පිළිබඳ වෛද්‍යවරයෙකුට පෙන්වන්න මං සූදානම් කරන්නම්"

"ඒක හොඳයි මහත්මයා" මම කීවෙමි. "මටත් හිතෙනවා දැන් මට පිස්සු හැදීගෙන එනවා කියල"

මගේ ප්‍රධානියා මට වෛද්‍යවරයෙකු හමුවෙන්න දිනයක් ලබා ගත්තේය. නමුත් ඊට කලින්ද, රාත්‍රියේ ඇගේ රෝගය උත්සන්න වී මගේ මව මියගියාය. මගේ හිතේ ඇතිවුණු ශෝකය මට ඉවසා ගැනීමට නොහැකි විණි.

මේ හැමදේකටම මුල, අපේ පවුල විනාශ කළ ක්‍රොස්බි බවයි මට හැමවිටම හිතුණේ. ආපහු රැකියාවට යන්න තරම් මානසික තත්ත්වයක් මට තිබුණේ නැත. මගේ පියා මා අත්හැරදමා මිය ගියේය. මගේ මව ද මියගියාය. මගේ ආදරණීය බිරිඳත් මා අත්හැර දමා යන්න ගියාය. මේ ලෝකයේ තවත් රැඳී ඉන්නට මට උවමනාවක් නැත. මට ඉතිරිවී තියෙන්නෙත් මේවාට වගකිවයුතු පුද්ගලයා සොයා නිසිදඬුවම දීමයි"

"රූපට් සෝර්ටන්ගේ අන්තිම කාලයේ මිනු තදබල මානසික රෝගයකට ගොදුරු වී ඇති බව පැහැදිලියි" හෝම්ස් කීවේ එම සටහන් පොත ඉවතෙන් තබමිනි.

"ඔහුට මුහුණදීමට සිදුවී තිබුණු ප්‍රශ්නවල හැටියට එහෙම වුණු එකේ පුදුමයක් නැහැ" මම පිළිතුරු දුනිමි.

"ඔව්. ඔබ කියන දේ ඇත්ත" හෝම්ස් කීය. "නමුත් මොන තරම් දරුණු, ප්‍රශ්න මතුවුණත්, ඒවාට සාර්ථකව මුහුණදීලා ජීවිතය ජයගත් මිනිස්සු එද හිටියා. අදත් ඉන්නවා. හෙටත් ඉඳීවි. එහෙම අය තමයි ශ්‍රේෂ්ඨයන් බවට පත්වෙන්නේ.

නැතිබැරිකම කණගාටුදායක දෙයක් බව ඇත්තයි. ඒ වුණත් ඒකට පිළිතුර අනුන් විනාශ කරගෙන, තමනුත් විනාශ වීම නොවෙයි. හපන්කම කියන්නේ මොන ආකාරයකින් හරි දුක දිනා ජීවිතය ජය ගැනීමයි. එහෙම නේද වොට්සන්?"

"ඔබේ ඒ මතයට මං එකඟවෙනවා හෝම්ස්"

"කොහොම වුණත් වොට්සන්, මේක ඔබේ කථාන්තර එකතුවට දමා මහජනයාට ඉදිරිපත් කරනවා ද කියන එක ප්‍රශ්නයක්" හෝම්ස්



www.sinhalaelibrary.com

කීය. "ඒ ගැන මං තවදුරටත් හිතලා බලන්න ඕන. මේක රහසක් ලෙස ආරක්ෂා කරගන්න කියලා, විල්බර්ෆෝස් මහත්මයා මුලදීම කිව්වා ඔබට මතක ඇති. දැනට මේක ඔබේ ට්‍රන්ක පෙට්ටියේ අතිගය රහසිගත ලිපිගොනුවට දමන්න"



# උපන්දින සාදය

ශ්‍රීමත් රේමන්ඩ් ස්පෙන්සර් තර්ස්ටන්ගේ අභිරහස් මරණය පිළිබඳව, මීට කලින් මා ලියූ කථාන්තර කිහිපයකම මම සඳහන් කළෙමි. එහෙත් එය විස්තර සහිතව ඔබ වෙත ඉදිරිපත් කිරීමට මට අවස්ථාවක් සැලසුණේ නැත.

ඒ 1898 වසරේ පෙබරවාරි මාසයේ එක් සීතල උදෑසනක් බව, මගේ සටහන් පොතේ සඳහන්ව ඇත. ශීත සෘතුවේ අයහපත් කාලගුණය ගැන නොසලකා, එළිමහනේ සැරිසැරූ මගේ මිත්‍රයා, සෙම්ප්‍රතිශ්‍යාවට ගොදුරු වී උණෙන් පෙළෙමින් සිටියේය. ඒ සඳහා ගතයුතු ඖෂධ වර්ග කිහිපයක්ම මම ඔහුට නියම කළෙමි. එහෙත් ඔහු කුඩා දරුවෙකු මෙන් තිත්ත බෙහෙත් බීමට මැලිකමක් දැක්විය.

"හෝම්ස්. නියම වෙලාවට බෙහෙත් ටික නොබිව්වොත් ඔබේ අසනීපය නම් හොඳවෙන එකක් නෑ" ඔහුට පෙරැත්ත කර බැරිම තැන මම කීවෙමි.

"වොට්සන්. ලෝකය දැන් කොයි තරම් දියුණුද? ඒත් ප්‍රණීත රසයක් ඇති බෙහෙත් වර්ග ඔවුන්ට හදන්න බැරි ඇයි?"

"කවුද දන්නෙ? කල් යද්දී නම් තිත්ත බෙහෙත්, උණු කළ සීනි වලට දමලා, ඖෂධ නිෂ්පාදන සමාගම්, බෙහෙත් පැණි රසට හදාවි" මම කීවෙමි. "ඒ පොඩි ළමයින්ට සහ ෂර්ලොක් හෝම්ස් මහත්මයාට බොන්න පුළුවන් වෙන්න. ඒත් ඒකට තවත් සෑහෙන කාලයක් යාවි. කොහොම වුණත් මේ සීතල කාලේ වැස්සට නොතෙමී හිටියා නම්, ඔබට ඔය ප්‍රශ්නය......"

අපේ කතාබහට බාධාකරමින් විසිත්ත කාමරයේ දොරට කිසිවෙකු තට්ටු කරන හඬ ඇසිණි. බෙහෙත් බඳුන මේසය උඩ තබා මම වහාම දොර වෙත ගියෙමි. පැමිණ සිටියේ හඩ්සන් මහත්මියයි. හෝම්ස් නමට එවුණු විදුලි පුවතක් ඇගේ අතේ තිබිණ.

"ඔක විවෘත කරල බලන්න වොට්සන්" ඔහු කී නිසා මම එය කියැවූයෙමි.



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print

හිතවත් ෂර්ලොක් හෝම්ස් මහත්මයාණෙනි,

ඊයේ රාත්‍රි සර් ජේමන්ඩ් තර්ස්ටන් සැකසහිත ලෙස මරණයට පත්වී ඇත. සෙවනෝක්ස්හි එඩ්මන්ටන් මන්දිරය වෙත වහාම පැමිණීමට ඔබට හැකිනම් කෘතඥ වෙමි.

ග්‍රෙග්සන්"

"දෙයියනේ සාන්ති!" හෝම්ස්ට කියැවිණි. "ඔය මනුස්සයගෙ හැටවෙනි උපන් දිනය සැමරුවේ ගිය සතියෙ නැත්නම්, ඊට කලින් සතියෙ නේද? ඔහුව ඝාතනය කරලා නම්, එහෙම කරන්න කවුරු හරි, ඒ මනුස්සයාට හොට පිරෙන කං බලා හිටිය වගේ. දැන් අපි මොකද කරන්නෙ?"

"හෝම්ස්, මම තුම ඔබට උපදෙස් දෙන්නෙ වෛද්‍යවරයෙක් හැටියට" මම කීවෙමි. "ඔබ ඔය පරීක්ෂණය සඳහා යන්නද හිතුවෙ? එහෙම නම් ඒ අදහස හිතෙන් අත්අරින්න. මේ තරම් උණෙන් සෙම්ප්‍රතිශ්‍යාවෙන් පෙළෙද්දී ඔවැනි කටයුත්තකට යාම කොහොමටවත් සුදුසු නෑ. විශේෂයෙන්ම මේ හිම වැටෙන ශීත සෘතුවෙ"

ඔහු දෑස් ලොකු කරගෙන මා දෙසු බලා සිටියේ, මා කියූ දෙය ඔහුට විශ්වාස කිරීමට පවා අපහසු යයි හැඟවෙන ආකාරයෙනි.

"ඒ වුණත් මගේ හිතවත් වොට්සන්........"

"ඒ වුණත් කියල හරියන්නෙ නෑ හෝම්ස්. සීතල හුළං වැදුණොත් ඔබේ ඔය උණ, අඩුවෙන එකක් නැහැ. එන්න එන්නම වැඩිවේවි. ඔබ ඉන්න ඕන. බ්ලැන්කට්ටු දෙකක් පොරවාගෙන ඇඳට වෙලා. මං ග්‍රෙග්සන්ට විදුලි පුවතක් යවන්නම්, ඔබට අසනීපයි, එන්න හැටියක් නැහැ කියලා...."

"........ මට පුහුන් කාලෙකින් වැදගත් පරීක්ෂණයක් ලැබුණෙත් නෑ වොට්සන්" ඔහු කීවේ ආයාචනාත්මක ස්වරයකිනි. "මෙතැන මොකක් හරි අවුල් සහගත, සංකීර්ණ බවක් ග්‍රෙග්සන්ට පෙනෙනවා ඇති. එහෙම නැත්නම් මට එන්න කියල ඔහු දන්වන්නෙ නෑ. මේක අත ඇරුණොත් මට විශාල පාඩුවක් තමයි වෙන්නෙ. ඔබ නියම කළ විධියට ඖෂධ හැම එකක්ම මං බිව්වා....."

"මක්කොම බිව්වෙ නෑ. තුම කළුපාට දියර බෙහෙත බිව්වෙ නැහැනෙ" මම තදින් කීවෙමි.





"හරි හරි, මං ඒකත් බොන්නම්" කී හෝම්ස්, මෙතෙක් වේලා ඔහුට මැලිකරමින් සිටි තිත්ත බෙහෙත, එක හුස්මට ගිල දැම්මේය.

"මං හිතන්නේ දැන් නම් මගේ ඇඟට එච්චර අමාරුවකුත් නැහැ වගේ" ඔහු කීවේ කට සොඳ දමමිනි.

මෙතෙක් වේලා අසනීපය නිසා කෙඳිරිගාමින් සිටි මගේ මිතුයාට ක්ෂණික සුවයක් දැනුණේ, අභිරහසක් ගැන දන්වමින් එවූ විදුලිපුවත නිසා බැව් මම දැනසිටියෙමි.

සෙවනෝක්ස් යනු ලන්ඩන් නගරයේ සිට එතරම් දුරබැහැරක් නොවේ. පරීක්ෂණ කටයුතු සඳහා ගියත්, සවස් වෙද්දී අපට ආපසු ඒමට හැකිවනු ඇත.

"මොකද දොස්තර මහත්මයා කියන්නෙ?" ඔහු විමසුවේය. "මං මේ අපරාධ පරීක්ෂණයට ගියාට කමක් නැහැ නේද?"

"ඔබට නොගිහිං ඉන්න කිව්වත් වැඩක් වේවි කියල මම නම් හිතන්නෙ නෑ. එහෙනම් එහෙදී බොන්න බෙහෙත් ටිකත් අරගෙනම යමු"

"ඒක විශිෂ්ට අදහසක් වොට්සන්" හෝම්ස් කීය. "දුම්රියපොළට ඇවිත් ඉන්න කියලා අපි ග්‍රෙග්සන්ට විදුලිපුවතක් යවමු. හොඳින් ආවරණය වුණු කුලීරියක යන්න පුළුවන් නම්, ඔබ කියන ඔය සීතල හුළං වැදීමේ අවදානමකුත් නැහැ. ඊළිට කියන්න, විදුලිපුවත භාරදීල එන ගමන්, කුලීරියක් කැඳවාගෙන එන්න කියලා. වොට්සන් ඔබ දන්නවද මේ සර් ජේමන්ඩ් තර්ස්ටන් ගැන තොරතුරු?"

"ඔහු ගැන ඊයෙ පෙරේද පුවත්පත් වල පළවෙලා තිබුණා මට මතකයි" මම කීවෙමි. "ඔහු කෝටිපතියෙක් බව මම දන්නවා. ඒ හැරෙන්න මම වෙන කිසිම දෙයක් දන්නේ නෑ."

"ඔහු ගැන වරින්වර පුවත්පත්වල පළවුණු තොරතුරු, මං කපා එකතු කරගෙන ඇති." හෝම්ස් කීය. "අපි ඒ හැමදෙයක්ම අරගෙන යමු. දුම්රියක් එනතුරු වික්ටෝරියා දුම්රියපොළේ අපට කොයිතරම් වෙලා ගතකරන්න වේවිද දන්නෙ නැහැ. ඒ අතරෙ මට පුළුවනි මං දන්නා තොරතුරු ඔබට කියන්න"

හෝම්ස්, ග්‍රෙග්සන් නමට ලියූ විදුලිපුවත් පෝරමය මා අතට දුන්නේය. මම පහළ තට්ටුවට බැස බිලීට උපදෙස් දී ආපසු පැමිණියෙමි. අප හැඳ පැලඳ ගන්නා අතරේ කුලීරිය පැමිණියේය.

උදේ ආහාරයට නොයිද්දී අපි ඉක්මනින් පිටත්වුයෙමු. පැය භාගයක් ගතවෙද්දී වික්ටෝරියා දුම්රියපොළ වෙත ළඟාවීමට අපට හැකිවිය.

ශීත සෘතුවේ උදෑසන කාලවලදී, ලන්ඩන් නගරයෙන් පිට පළාත්වලට යන දුම්රියවලට, එතරම් තදබදයක් නොතිබිණි. එබැවින් සසෙක්ස් බලා යන සීඝ්‍රගාමී දුම්රියක් අල්ලාගැනීමට අපට හැකිවිය. එහි පළමුවැනි පංතියේ පෙට්ටියක අපටම වෙන්වුණු මැදිරියකට වීම අමතර පහසුවක් විණි.

"දවස් දෙකක්ම මට ආහාර රුචියක් තිබුණේ නෑ" හෝම්ස් කීය. "ඔබේ ඖෂධ වලින් උණ අඩුවෙද්දී, දැන් හොඳ ආහාර රුචියක් දැනෙනවා. අපි භෝජනාගාරයෙන් කෑම ඇණවුම් කරමු, අනික් හැමදෙනාටම කලින්. එතකොට ප්‍රමාද නැතුව ඒ කටයුත්තත් ඉවරකරන්න පුළුවනි."

උදෑසන කෝපි කෝප්පය පමණක් පානය කර සිටි මට ද අධික බඩගින්නක් දැනිණ. භෝජනාගාර සේවකයා අපේ මැදිරියටම ගෙන ආ ආහාර ගැනීම අපි වහාම ඇරඹුවෙමු. කෑමකන අතරේ මගේ මිතුරා, ඔහුගේ ලිපිගොනුව පෙරලා බලමින්, මතකය අලුත් කර ගත්තේය. ඔහු තම කතාබහ ඇරඹුවේ කෑමබීම අවසානයේ පයිප්පය ද දල්වා ගැනීමෙන් අනතුරුව ය.

"සර් රේමන්ඩ් ස්පෙන්සර් - තර්ස්ටන් කියන්නේ එංගලන්තයේ වලව්කාර පෙළපතකින් බිහිවුණු කෙනෙක් නෙමෙයි. ඔහු බොහොම දුප්පත් පවුලක අයෙක්. 1850 - 60 කාලයේ එංගලන්තයේ බොහොම උග්‍ර රැකියා හිඟයක් තිබුණු බව ඔබ අහලා ඇති. ඒ නිසා අපේ තරුණයන් රැකියා හොයාගෙන බ්‍රිතාන්‍ය යටත් විජිතයේ රටවල් වලට ගියා. සමහරුන් ගියේ ඉන්දියාව ආදී ආසියාතික රටවලට. තවත් සමහරු ඕස්ට්‍රේලියාවට. තවත් සමහරු දකුණු අප්‍රිකාවට හා ඒ අවට රටවල් වලට. නමුත් ඔහු ඒ සඳහා තෝරාගත්තේ කැනඩාව. මිතුරන් අතරේ රේ තර්ස්ටන් නමින් හැඳින්වුණු ඔහු නැව් නැගලා තියෙන්නේ වයස අවුරුදු විස්සේදී. මුලින්ම සාන්ත ලෝරන්ස් මුහුදු මාර්ගය ඔස්සේ ක්විබෙක් දක්වා ගිය ඔහු, අවුරුදු දෙකක් තිස්සේ නොයෙකුත් රැකියාවල නිරතවෙලා තියෙනවා. එයින් සතුටුදායක ආදායමක් නොලැබුණු නිසා, ක්‍රමයෙන් කැනඩාවේ බටහිර ජනපද පැත්තට ගමන්කළ බවයි අහන්න ලැබෙන්නේ. අන්තිමට ඔහු ඇල්බටාවේ දුම්රිය සමාගමක සුළු රැකියාවක නිරතවෙලා ඉඳල තියෙනවා.





මේ කාලෙදී තමයි ඇල්බටාවේ පීස් ගඟා ඉවුරෙන් රත්රන් ඉල්ලම් මතුවෙන්න පටන්ගත්තේ. දුම්රියසේවයේ රැකියාව අතහැර දැමූ ඔහු, රත්රන් ඉල්ලම් හාරන කණ්ඩායමකට එකතුවුණා. ඔහුගේ වාසනාව පෑදුණේ එතැනදී. ඔහුත් තවත් මිතුරෙකුත් ෆෝට් වර්මිලියන් නම් ස්ථානයේදී, ඉතාම විශිෂ්ට ගණයේ රත්රන් ඉල්ලමක් හොයාගත්තා. ඔවුන් උපයාගත් මුදල් ප්‍රමාණය මිලියන ගණනක් බවයි කියන්නේ. අවුරුදු හත අටක් ඉල්ලම් හෑරූ ඔවුන්, එම පතල විකුණා දමලා, මහා ධනස්කන්ධයක් රැගෙන එංගලන්තයට ඇවිත් පදිංචිවුණා.

රේමන්ඩ් තර්ස්ටන් කෙන්ට් ප්‍රාන්තයෙන් ඉඩම් අක්කර දහස් ගණනක් මිලට ගත්තා. විශාල සැබිත මන්දිරයක් ඉදිකරලා, එහි පදිංචිවුණා. ඔහු එය "එඩ්මන්ටන්" යන නාමින් නම් කරන්න ඇත්තේ, තමනට වාසනාව ගෙනා ස්ථානය සිහිවීමට වෙන්න ඇති. ඔහුගේ ධනය ආයෝජනය කළ නිසා, අවුරුදු පතා රේ තර්ස්ටන්ට ලැබුණු ආදායම, රන් පවුම් මිලියන ගණනක් කියලයි කියන්නේ. ඔහු මේ තරම් ධනවතෙක් බව මමත් කලින් දැනගෙන හිටියෙ නැහැ. ඔහුගේ හැටවෙනි උපන්දිනය වෙනුවෙන් පැවැත්වුණු උත්සව නිසයි පුවත්පත්වල මේ කරුණු පළවුණේ.

රේ තර්ස්ටන් තමන් උපයාගත් ධනය සමාජයේ යහපත සඳහා පරිත්‍යාග කරන්නත් ඉදිරිපත් වුණා. ටන්බ්‍රිජ්වෙල්ස්හි අබලන් වී ගරා වැටෙමින් තිබූ සාන්ත ඇන්ඩ්‍රූස් රෝහලට, ඔහු ගොඩනැගිලි සංකීර්ණයක්, තමන්ගේ වියදමෙන් ඉදිකළා. ලන්ඩනයේ ටොරිංටන් ආර්යා ළමාරෝහලේ අංගන දෙකක්, වික්ටෝරියා කාන්තා රෝහලේ ශල්‍යාගාර හතරක් සහිත ගොඩනැගිල්ල, සම්පූර්ණයෙන්ම ඔහුගේ ධන පරිත්‍යාගයෙන් ඉදිවුණු ඒවා. මේ අතරේ රජපවුලේ අවධානයත් ඔහු වෙත යොමුවුණා. රේ තර්ස්ටන් විසින් කරන ලද සුවිශේෂ පරිත්‍යාග ගැන සලකලා මහරැජිනගේ උපන්දිනයට ඔහුට නයිට් නාමයක් ප්‍රදානය වුණා. ඊටපස්සේ තමයි ඔහු, සර් රේමන්ඩ් ස්පෙන්සර් තර්ස්ටන් වුණේ. තර්ස්ටන් ආර්යාව කැනේඩියානු ජාතික කාන්තාවක්. ඔවුනට දූවරුන්ම හතරදෙනෙකු ඉන්නවා. ඔවුන්ගේ වැඩිමහල් දියණිය වැඩිදුර අධ්‍යාපනය ලැබීම සඳහා නිව්යෝර්ක් සරසවියට යවා තිබූ බවයි පුවත්පත්වල පළවුණේ.



www.sinhalaelibrary.com

වයස හැටක් වුණත් සර් රේ තවමත් පෝලෝ ක්‍රීඩාවේ යෙදෙන බව මං පුවත්පත්වල කියෙව්වා. ඔහු කෙන්ට් හි ආදිපාදවරයාගේ ළඟම හිතවතෙක්. ඒ නිසාම මේ අභිරහස විසඳීම ගැන රජපවුල උනන්දුවන බවට මට සැකයක් නෑ......" එක්වරම ඇතිවූ කැස්ස නිසා හෝම්ස්ට කථාව නැවැත්වීමට සිදුවිය. අසනීප ගතිය තිබියදී, නොනවත්වාම කථාකිරීම නිසා එම තත්ත්වය ඇති වූ බව මම තේරුම් ගතිමි.

"හෝම්ස්, මං හිතන්නෙ ඔය පයිප්පය නිවාදමල, ඔබ ටිකක් විවේක ගත්තොත් හොඳයි. අපි කතාවෙ ඉතිරි හරිය, එහේට ගිහිල්ලම අහගමු"

වැඩි ප්‍රමාදයක් නොමැතිවම දුම්රිය සෙවනෝක්ස් දුම්රියපොළ වෙත ළඟාවිය. අපේ හිතවත් පොලිස් පරීක්ෂක ටෝබියස් ග්‍රෙග්සන් වේදිකාවේ බලාසිටි අයුරු මම දුටුවෙමි. ඔහු අප වෙනුවෙන් අශ්වකරත්තයක් සූදානම් කර තිබිණි. එබැවින් අයහපත් කාලගුණයෙන් පීඩා නොවිඳ, දුම්රියපොළෙන් පිටත්වී යෑමට අපට හැකිවිය.

"හෝම්ස් මහත්මයා, ඔබ නොවරදවාම එන බව මං දැනහිටියා" ග්‍රෙග්සන් කීවේ දුම්රියපොළෙන් පිටත්වූ අශ්වකරත්තය මහාමාර්ගයට පිවිසෙද්දීය.

"හෝම්ස් මහත්මයාට දින් දවස් හතරපහක ඉඳන් උණ" මම කීවෙමි. "ඔබෙ විදුලිපුවත ලැබුණේ ඔහු බෙහෙත් බොමින් සිටිද්දී. ඔහු මේ ගමන එනවට මම නම් කැමැතිවුණෙත් නෑ."

"හැබෑට? සමාවෙන්න වොට්සන් මහත්මයා, මං එහෙම දෙයක් දැනගෙන හිටියෙ නෑ" ග්‍රෙග්සන් කීය. "මේ අභිරහස් මරණය හුඟක් සංකීර්ණ එකක් වේවි කියල මට ඉවෙන් වාගෙ දැනෙනවා. ඒ නිසාමයි මං හෝම්ස් මහත්මයාට එන්න කියල යැව්වේ. මගේ මිත්‍රයා ලෙස්ට්‍රේඩ් මෙහේ ආවා නම්, ඔහු හෝම්ස් මහත්තයාව කැඳවන්නෙ නෑ. තනියම විසඳන්න උත්සාහ කරල, බැරිම වුණාම තමයි ඔහු හෝම්ස් මහත්තයාගෙන් උදව් ඉල්ලන්නේ. ඒ හරිය මං මොකට කියනවද, ඔබ දන්නවානේ. මේ තරම් අසනීප බවක් දන්නවා නම් මං හෝම්ස් මහත්මයාට කරදර කරන්න හිතන්නේ නෑ"

"ඒකට කමක් නෑ ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "වොට්සන් මහත්මයා ඔය කියන තරමටම මට අමාරු නැහැ. දවස් හයහතකට





කලින් මං ලොකු වැස්සකට අහුවුණා. ඒක නිසා කලින් ඉඳලම තිබුණු සෙම් අමාරුව වැඩිවුණා. ඒක තමයි. මෙතැන මොකක්ද සිදුවෙලා තියෙන්නෙ? ඔබේ කථාන්තරය අහන්න මං ඉන්නේ නොඉවසිල්ලෙන්"

"මෙහේ ඉඳල එඩ්මන්ටන් මන්දිරයට හැතැප්ම හතරහමාරක් තියෙනවා" ග්‍රෙග්සන් කීවේ සුරුට්ටුවක් මං අතට දී, ඔහු ද එකක් දල්වා ගනිමිනි. "සැකයක් නෑ හෝම්ස් මහත්තයාගෙ අසනීප ගතිය නිසා පයිප්පය බීම ඔබේ මිත්‍රයා තහනම් කරල ඇති"

මිනිත්තුවක් දෙකක් නොනවත්වාම සුරුට්ටුව ඉරූ ග්‍රෙග්සන්, ඉන්පසු රැල් බුරුල් හැර කථාව පටන්ගත්තේය.

"සර් රේ ඔහුගේ හැටවෙනි උපන්දිනය සැමරුවේ මීට සති දෙකකට විතර කලින්. ඒ විස්තර ඔබ පුවත්පත්වල දකින්න ඇති.

උපන්දින සැමරුමට අදාළ සම්භාෂණයක් ඊයේ - ඒ කියන්නේ සිකුරාද රාත්‍රියේ පවත්වලා තියෙනවා. මෙය පැවැත්වුණේ ඔහුගේ නිවසේ, එනම් එඩ්මන්ටන් මන්දිරයේ. පසුගිය සති කිහිපයක තිස්සේම උත්සවවලට සහභාගිවෙලා, සර් රේ ඉඳල තියෙන්නේ වෙහෙස මහන්සියට පත්වෙලා. තව තවත් උත්සව පවත්වන්නවත්, එවට සහභාගී වෙන්න වත් සර් රේ කැමැතිවෙලා නැහැ. නමුත් මෙක පවත්වමුයි කියල තදින් කියා හිටියේ, සර් රේගේ මිත්‍රයෙකු මෙන්ම ලේකම් වරයා ලෙස කටයුතු කරන, රෙජිනෝල්ඩ් නීල්සන් විසින්. මං ඔහු ගැනත් විස්තර කර හිටියොත්, ඒක ඔබට වැදගත් වේවි.

සර් රේ හා නීල්සන් දෙදෙනා ළමාකාලය ගතකරලා තියෙන්නේ, මේ සෙවනෝක්ස් ගමේ මයි. ඔවුන් පාසල් ගිහින් තියෙන්නේ වින්චෙස්ටර් විද්‍යාලයට. එහි නේවාසිකාගාරයේ එකට සිටි ඔවුන් හොඳ මිතුරන්. සර් රේගේ පවුල, ඒ තරම් වත්පොහොසත්කම් තිබුණු පවුලක් නෙමෙයි. ගුරුවරයෙක් වුණු ඔහුගේ පියා, දරුවා වින්චෙස්ටර් විද්‍යාලයට දැම්මේ ලොකු ධනයක් තිබිලා නෙමෙයි. අමාරුවෙන් හරි දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබාදෙන්නයි ඔහු හිතන්න ඇත්තේ. නමුත් පියාගේ හදිසි මරණය නිසා රේමන්ඩ් තර්ස්ටන්ගේ ඉගෙනීම අතරමග කඩාවැටුණා. ඔය කාලෙන්, ඊට පෙරත් ඉඳන් නීල්සන්, සර් රේ ට මුදලින් උපකාර කරල තියෙනවා.



www.sinhalaelibrary.com

කැනඩාවෙ අවුරුදු ගණනාවක් ගතකරලා මහා ධනස්කන්ධයක් උපයාගෙන, සර් රේ ඇවිත් පදිංචිවුණේ තමන්ගේ ගමේ ම යි. ඔහුගේ අනමිට සරු නිසා, පරණ යාළුමිත්‍රකම් අලුත් වෙලා, පාසලේ හිටි සමහර මිතුරන් ඔහු සමග යළි ආශ්‍රයට වැටුණා. ලන්ඩනයේ නැව් සමාගමක රැකියාව කළ නීල්සන්ට මේ කාලෙ වෙනකොට රැකියාව අහිමිවෙලා. ඔහු ලොකු දරු පවුලක් එක්ක අසරණ වෙලයි හිටියේ. රේ තර්ස්ටන් වහාම තමන්ගේ මිත්‍රයාට පිහිටවුණා. රෙජී නීල්සන් තමන්ගේ ලේකම්වරයා ලෙස බඳවාගත්තා. ඊයේ රාත්‍රි උපන්දින සාදය පැවැත්වුණේ නීල්සන්ගේ ඉල්ලීම පිට. ඒ වින්චෙස්ටර් විද්‍යාලේ ඔවුන් සමග එකට ඉගෙනීම ලැබූ මිතුරන්ට.

මේකට ඒ තරම් විශාල සෙනගක් සහභාගිවෙලා නැහැ. ආවේ දහදෙළොස් දෙනෙකු ප්‍රමණක් බවයි අහන්න ලැබුණේ. පහුගිය දවස් කීපයේම මේ පැත්තට තිබුණේ අයහපත් කාලගුණයක්. සුළු වශයෙන් නමුත් දිගින් දිගටම හිමවැටීම සිදුවුණා. ඒ නිසාම උපන්දින සාදයත් රාත්‍රි දහයමාර වෙද්දී අවසන් කළාලු. නීල්සන් ඇරෙන්න අනික් හැමදෙනෙකුම ඒ වෙලාවෙ වෙනකොට පිටවී ගිහින් තියෙනවා.

රෙජී නීල්සන්ගේ ගෙදර තියෙන්නේ, එඩ්මන්ටන් මැනරට හැතැක්ම අතක් පමණ ඈතින්, ක්‍රොස්හිල්ස් වල. ඒ නිසා, හුඟක් රෑ වෙනතුරු රාජකාරි කටයුතු හෝ, කතාබහ තිබුණු දවස්වලට නීල්සන් මේ ගෙදර නවාතැන් ගන්නවා. ඒක අසාමාන්‍ය දෙයක් නොවෙයි. ඒ නිසාම ඔහු වෙනුවෙන් වෙන් කෙරුණු කාමරයකුත් මේ ගෙදර තියෙනවා. ඒ කාමරය තියෙන්නේ බිම්මහලේ. එනම් ප්‍රධාන අංගනයේ. සර් රේටත් පහළ තට්ටුවේ අමතර නිදන කාමරයක් තියෙනවා. මේ දෙක වෙන් කෙරෙන්නේ යාබද නානකාමරයකින්.

සර් රේට තිබුණු දේපොළ ඉතා විශාල නිසා, ඒවායේ පාලනය ගැන හුඟක් දේවල් කතාබහ කරන්න තිබුණු එකේ පුදුමයක් නැහැ. එවැනි කතාබහ නිතර සිදුවුණාලු. සමහර දිනවල ඔවුන්, අසල්වැසි මිතුරන් සමග රෑ වෙනතුරු "විස්ට්" ක්‍රීඩාවේ යෙදිල තියෙනවා. මේ නිසාමයි, පහළ තට්ටුවේ තමන්ට අමතර නිදනකාමරයක් සකස්කරගන්න, සර් රේ තීරණය කරලා තියෙන්නේ. රෑට දොරවල් අරින වහන ශබ්ද වලින්, බිරිඳට හා දරුවනට හිරිහැරයක් එනකොට වෙන්නෙ නෑ.





මේ නිවසේ වැඩරාජකාරි සඳහා සේවකයන් හත්අටදෙනෙකු ඉන්නවා. නමුත් එඩ්මන්ටන් මන්දිරය ඇතුළෙම පදිංචිවෙලා, ගෙදර වැඩකටයුතු වලට කෙළින්ම මැදිහත් වෙන්නෙ හතරදෙනයි. මං ඒ අය ගැනත් කියන්නම්. ප්‍රධාන ගෘහසේවකයා, අවුරුදු පනහක් තරම් වයසැති කූපර් නම් කෙනෙක්. මේ පවුලට අවුරුදු දහයකට වැඩි කාලයක් සේවය කර ඇති ඔහු විශ්වාසවන්ත, කීකරු සේවකයෙක්. ආර්යාවගේ හා දියණිවරුන්ගේ වැඩට, ඈන් ග්‍රීන් නම් තරුණ සේවිකාවක් ඉන්නවා. ගෘහසේවිකාව එලිසා නම් මැදිවියේ කාන්තාවක්. මුළුතැන්ගෙයි සේවිකාව මහලු තැනැත්තියක්. මං මෙතෙක් වේලා කියූ දේවල් ඔබට පැහැදිලිද හෝම්ස් මහත්මයා?"

"හොඳටම පැහැදිලියි" හෝම්ස් කීය. "ඔබේ කථාව දිගටම කියන්න"

"මේ පවුලේ දියණියන්ම හතරදෙනයි." ෆර්ගසන් කීය. "එයින් වැඩිමහල් දියණිය සිබිල් තර්ස්ටන් වයස අවුරුදු විසිදෙකක තරුණියක්. මීට අවුරුද්දකට, එකහමාරකට කලින්, ඇය වැඩිදුර අධ්‍යාපනය සඳහා ඇමෙරිකාවේ, නිව්යෝක්හි විශ්වවිද්‍යාලයකට යොමු ලැබුවා. එහි අවුරුද්දක් පමණ ඉගෙනීම ලැබූ ඇය, දෙමව්පියන්ට නොදන්වාම ඇමෙරිකාවේදී විවාහ වුණාලු. මේ ගැන සර් රේ මෙන්ම තර්ස්ටන් ආර්යාවත් දැඩිලෙස විරුද්ධ වුණාලු. නමුත් එයින් වැඩක් වෙලා නැහැ. ඇය විවාහ වෙලා තියෙන්නේ ඩොනල්ඩ් හාට් නම් තරුණයෙකු සමග. ගිය අවුරුද්දේ මුල විවාහවුණු ඔවුන්, පදිංචිය සඳහා එංගලන්තයට ඇවිත් තියෙන්නේ පහුගිය ජූලි මාසයේ.

ඩොනල්ඩ් හාට් ඉංග්‍රීසි ජාතිකයෙක්. ඔහු හොඳ කඩවසම් පෙනුමක් ඇත්තෙක් බවයි ඉයදරි සේවකයා - කූපර් මට කිව්වේ. නමුත් හාට් හරි හැටි ඉගෙනීමක් ලැබූ කෙනෙකුවත්, රැකියාවකට පුහුණුවක් ලැබූ අයෙකුවත් නොවෙයි. ඩාබි හි අශ්වරේස් වලට අසරුවෙකු ලෙස ඔහු කාලයක් රැකියාව කරල තියෙනවා. ඒ රැකියාව අහිමිවෙද්දී නිව්යෝක් වෙත ගිහින්. එහි ධනවතෙකුගේ රේස් අශ්වයන් පුහුණු කරන්නෙකු ලෙස රැකියාවේ යෙදී හිටියලු. සිබිල් මෙනෙවියට ඔහුව හමුවෙලා තියෙන්නේ බාල් නැටුමකදී. ඔහුගේ කඩවසම් පෙනුමට හා බොරු කයිවාරුවට සිබිල් මෙනෙවිය රැවටී ඇති බවයි තර්ස්ටන් පවුලේ මතය. සිබිල් හා



www.sinhalaelibrary.com

විවාහ වූ පසු එංගලන්තයට ආවත් ඔහුට කුරිහැටි රැකියාවක් තිබිල නැහැ. පදිංචිය සඳහා නිවසක් කුලියට ගැනීමටවත් වත්කමක් තිබිලා නැහැ. අන්තිමේදී දුවට හා බෑනාට පදිංචියට නිවසක් දෙන මෙන් තර්ස්ටන් ආර්යාව, සර් රේට ආයාචනා කළා. ඒ අනුව වසා තිබූ, එහෙත් හොඳ දෙමහල් නිවසක් දෙන්න සර් රේ එකඟ වුණා. "සිටාඩෙල්" නම් මේ නිවස පිහිටා තියෙන්නේ, එඩ්මන්ටන් මන්දිරයට හැතැක්ම කාලක් පමණ දුරින් වතුයාය මැද්දේ.

ඊයේ රාත්‍රී එඩ්මන්ටන් මැනුරේ පැවැත්වුණු උපන්දින සාදය ගැන මං ඔබට කිව්වා. දහයමාර පමණ වෙද්දී, සාදය නිමවී අමුත්තන් පිටවී ගියාලු. ඊට පස්සේ තවත් පැයකට වැඩිකාලයක් සර් රේ සහ නීල්සන්, මොකක් හෝ කාරුණක් ගැන සාකච්ඡා කරමින් ඉඳල තියෙනවා. විසිත්ත කාමරයේදී පැවැත්වුණු මෙම සාකච්ඡාව තරමක උණුසුම් ස්වභාවයක් ගත්ත බව ගෘහසේවක කුපර් මට කිව්වා. සර් රේ මෙන්ම ඔහුගේ ලේකම්වරයාත් කෝපයට පත්වී යම් යම් දේ කියා ගත්තලු..... බහින්බස් වුණාලු."

"නීල්සන් මොනවද ඒ ගැන කිව්වෙ?"

"එහෙම බහින්බස්වීමක් ඇතිවුණු බව ඔහු පිළිගත්තා." ග්‍රෙග්සන් කීය. "සර් රේට අයත් කර්මාන්තශාලාවල සේවක පිරිසක්, සතියකට කලින් වැඩි අඩි ඉල්ලා උද්ඝෝෂණයක යෙදිල තියෙනවා. පඩි වැඩිකිරීමට සර් රේ එකඟවෙලා තියෙනවා. එහෙම තිබියදීත් සේවකයන් පස්දෙනෙක්, අනික් අයට වැඩට යන්න ඉඩදීල නැහැ. ඒ විතරක් නෙමෙයි, කර්මාන්ත ශාලාවේ අලුත්ම යන්ත්‍ර සූත්‍ර වලටත් දෙදෙනෙක් අලාභහානි සිදුකරලා. නීල්සන් මේ පුද්ගලයින් දෙන්නාම රැකියාවලින් නෙරපා දමල තියෙනවා. ඊයෙ හැන්දෑවෙ උපන්දින සාදය පැවැත්වෙන වෙලාවෙ ඒ කල්ලියේ නායකයන් වන මේ දෙන්නා එතැනට කඩාවැදිල තියෙනවා. ඒක ගැන සර් රේ දෙස් කියල තියෙන්නේත් නීල්සන්ට. සර් රේගේ උපදෙස් පිට, කුපර් අර මිනිසුන් දෙන්නාට කියලා තියෙනවා පොලිසිය කැඳවන්න සූදානම් බව. ඒත් වත්තට වෙලා කෑකෝගහමින් හිටි ඔවුන්, පිටවී යන අයුරක් තිබිලා නැහැ. අන්තිමේදී සර් රේ රයිෆලයත් අරගෙන මිදුලට බැහැලා තර්ජනය කළාම තමයි, ඒ සේවකයන් දෙන්නා පිටවී ගිහින් තියෙන්නේ. ඒ යද්දී ඔවුන් දෙන්නා සර් රේට බැණවැදුනාලු. "මෙවල ප්‍රතිඵල





තමුසෙට වැඩිකල් යන්න කලින් බලාගන්න පුළුවන් වේවි" කියල.

මෙම සිද්ධිය නිසා සර් රේ හරිම හිතේ කැලඹීමෙන් සිටි බව කුපර් කියනවා. මේ සිදුවීම ගැන දන්වලා, සර් රේ සෙව්නෝක්ස් පොලිසිය වෙත ඊයෙ ලිපියක් යවල තියෙනවා. ඉතින් මහත්වරුනි. අපි කතාවෙන් කතාවෙන් එඩ්මන්ටන් මන්දිරය ළඟටම ඇවිත්. කතාවේ ඉතිරි හරිය ඔබට මේ ගෙදර වැසියන්ගෙන්ම අහගන්න පුළුවනි."

ප්‍රධාන පාරේ සිට යාර දෙසීයක් පමණ දුරින් තැනිතලා බිමක ඉදිකර තිබූ එඩ්මන්ටන් මන්දිරය, ඉතා අලංකාර නවීන ඉදිකිරීමක් විය. නිවස වටේටම ඉතා විශාල බිමක, නිල්වන් තණකොළ, මල් පඳුරු හා අලංකාර ගස් වැවී තිබූ උද්‍යානයක් දක්නට ලැබිණ. එහි තිබුණේ ගෙවත්තක පෙනුමට වඩා උද්භිද උද්‍යානයක පෙනුම යයි මට සිතිණ.

ඇමරිකානු මෝස්තරයට ඉදිකොට තිබූ නිවසේ ප්‍රධාන කොටස තනිතට්ටුවේ එකක් විය. එය පිහිටියේ ඉදිරියෙන්ම ය. එහි සිට නැගෙනහිර දෙසට බටහිර දෙසට හා පිටුපසට සෑදූ දෙමහල් අංගන තුනක් විය. නැගෙනහිර පැත්තට තිබූ අංගනයේ උඩුමහල, පවුලේ නිදනකාමර සඳහා වෙන්ව තිබිණ. එහි බිම්මහලේ තිබුණේ දරුවන්ගේ පාසල්කාමර, පුස්තකාලය හා බිලියඩ් කාමරයයි. බටහිර පැත්තේ අංගනයේ, බිම්මහල කෑමකාමර, කුස්සිය හා ගබඩාකාමර සඳහා වෙන්වූ අතර, එහි උඩුමහලේ සේවිකාවන්ගේ නිදන කාමර තිබිණ. පිටිපස අංගනයේ බිම්මහලේ කාමර දෙකක් කුපර් විසින් ප්‍රයෝජනයට ගත් අතර අනෙක් කොටස් තවමත් ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබිණි. මේ සියල්ල මට දැනගන්නට ලැබුණේ පසුව ය.

තනිතට්ටුවේ ප්‍රධාන අංගනයේ නැගෙනහිර දෙසින් වූ ඉදිරිපසම කාමරය ඉතා විශාල එකක් විය. සර් රේගේ කන්තෝරු කාමරය වූ මෙය, නිදනකාමරයක් ලෙස ද ඔහු විසින් පාවිච්චිකර ඇත. ඔහුගේ මරණය සිදුවී තිබුණේ ද මෙය තුළය. මෙයට යාබදව පිටුපසින් නානකාමරයක් තිබූ අතර ඊට අල්ලා තිබුණේ නීල්සන් නවාතැන් ගත් කාමරයයි.

මුලින්ම අපට හඳුන්වාදෙනු ලැබුවේ, එතරම් හැඩිදැඩි සිරුරක් නොතිබූ, වයස අවුරුදු 30ක පමණ තරුණයෙකි. ඒ, සෙවනෝක්ස් පොලිසියේ අපරාධ අංශය භාර පරීක්ෂක වැප්මන් මහතාය. අනතුරුව මියගිය පුද්ගලයාගේ ලේකම් රෙජී නීල්සන් හඳුනාගන්නට ලැබිණි. අඩිහයකට වඩා උස, තරබාරු සිරුරක් තිබූ ඔහුගේ, හිසේ සම්පූර්ණයෙන්ම තට්ටය පෑදී තිබිණි. ඔහු නිතර වැගෙසන සේ වැඩු, සුදු මිශ්‍ර කළු රැවුල, උඩුරැවුල හා සම්බන්ධව තිබීම නිසා ඔහුට තිබුණේ හැබෑ කයිනාන්වරයෙකුගේ පෙනුමකි.

"හෝම්ස් මහත්මයා. ඔබ මුලින්ම මරණය වුණු තැන සෝදිසිකරලා ඉන්නවද?" වැප්මන් ඇසීය. "එහෙමත් නැත්නම් ආර්යාවගේ, ලේකම්ගේ හා සේවකයන්ගේ සාක්ෂිවලට කන්දීල ඉන්නවද? ඔබව ගෙන්වන්න ග්‍රෙග්සන් මහත්මයා තීරණය කළ නිසා, අපි ඒ කාමරයේ වැඩිදුර සෝදිසිකිරීම් මොකුත්ම කළේ නැහැ."

"ඒක හොඳයි වැප්මන්" හෝම්ස් කීය. "පොලිස් ශල්‍ය වෛද්‍යවරයා, මරණ පරීක්ෂණයට එන්න කලින්, කාමරය සෝදිසිකරල ඉන්න ඕන. අනෙක කාලය ගතවෙද්දී, සමහර හෝඩුවාවන් නොපැහැදිලි වෙනවා. ඒ නිසා ගෙදර අයගේ සාක්ෂිවලට කන්දීම අපි පසුව කරමු."

හෝම්ස් තම කබා සාක්කුවෙන් එළියට ගත්තේ, අලුත්ම සටහන් පොතකි. එහි පළමු පිටුවේම, ඔහු නිවසේ ඉදිරිකොටසේ සැලැස්ම ඇඳගත්තේය. අනතුරුව අදාළ කාමරයේ ජනේල හා දොරටු වල දිග පළල මැන සටහන් කරගත්තේය.

කාමරයේ ජනේලය සමීපයේ තබා තිබූ පුටුල් ඇද මත, සර් රේ තර්ස්ටන්ගේ මළසිරුර තිබිණි. ගින්නට අසුවීම නිසා එහි එක් පැත්තක් සැහෙන තරම් දැවී ගොස් තිබූ බැව් දකින්නට ලැබිණි. උසින් අඩි හයක් පමණ වූවත් සර් රේට තිබුණේ කෙට්ටු සිරුරකි. එහෙත් තරුණ කාලයේ කය වෙහෙසා වැඩ කිරීම නිසා, ඔහු මස් පිඬු හොඳින් වැඩී තිබූ ශක්තිමත් පුද්ගලයෙකු බව දැකිය හැකි විය.

මගේ මිතුරා මළසිරුර අවට සෑම තැනක්ම, ජනෙල් පඩිය, ජනෙල් රාමුව හා කාමරයේ පොළොව, ක්‍රමානුකූලව සෝදිසියකට ලක් කළේය. සමහර අවස්ථාවලදී ඔහු ඒ සඳහා, කාචය ද යොදා ගත් බැව් මම දුටුවෙමි. ඒ අතරම සටහන් පොතේ කරුණු ලියාගැනීමට ද ඔහු අමතක නොකෙළේය. මේ කටයුතු සඳහා සැහෙන වේලාවක් ගතවිය.





මීළඟට ඔහු අවධානයට යොමු කළේ නිවසෙන් පිටතය. කලින් දා රාත්‍රියේ යන්තමින් හිම වැටී තිබූ බවක් දක්නට ලැබිණ. එය දියවී යාමට කාලයක් නොවීය. ඒ නිසා ගෙවත්ත පරීක්ෂා කිරීමෙන් හෝම්ස්ට යම් වාසියක් සැලසෙතැයි මම විශ්වාස කළෙමි. නිවසේ සිට යාර පහක් පමණ දුර ගෙවත්ත සෝදිසි කළ ඔහු, සමහර තැන්වලදී බිම පෙයිළී හෝඩුවාවන් නිරීක්ෂණය කෙළේය. කරුණු සටහන් කරගත්තේය. හෝම්ස්ගේ පරීක්ෂණ විධි දැක පුරුදු මට සහ ග්‍රෙග්සන්ට මේවා අලුත් දේවල් නොවීය. ඒ නිසා, ඉස්තෝප්පුවේ පුටුවලට වී අපි නිහඬව සිටියෙමු. පොලිස් පරීක්ෂක වැප්මන් හා සුපර් හෝම්ස්ගේ කටයුතු ඉතා ඕනෑකමින් බලාසිටියහ.

නිවසෙන් පිටත පරීක්ෂා කිරීමෙන් පසු හෝම්ස් යළිත් පැමිණියේ මළසිරුර තිබූ කාමරය තුළටයි. සටහන් පොතෙන් ඉරාගත් කඩදාසි වලට කාමරයේ තිබූ දූවිලි ආදිය එකතුකරගත් ඔහු, ඒ කඩදාසි නවා සටහන් පොතේම තැන්පත් කරගත්තේය.

"පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පොලිස් ශල්‍ය වෛද්‍යවරයා පැමිණියා" ග්‍රෙග්සන් වෙත ළං වූ වැප්මන් කීය. ග්‍රෙග්සන් තම අසුනෙන් නැගිට්ටේ පොලිස් වෛද්‍යවරයාට සහයවීමේ සූදානමෙනි.

"මගේ සෝදිසි කිරීම් අවසානයි ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "ඔබට එහෙම පුළුවනි පශ්චාත් මරණ පරීක්ෂණය අරඹන්න. ඒ අතරේ මං නැවතියි පැය බාගයක පමණ විවේකයක් ගන්න. මමයි වොට්සනුයි පුස්තකාල කාමරයට එනවා එකොළහට. ඒ කාමරයට ඒ වෙලාවට සාක්ෂිකාරයන් එක්කෙනා බැගින් ගෙන්වාගන්න පුළුවන් නම් අප කාටත් පහසුයි."

මෙසේ කී මගේ මිතුරා ඉස්තෝප්පුවෙන් එළියට බැස්සේය.

"වොට්සන්. අසනීපගතිය නිසා දෙන්න ඇති. එක දිගට පරීක්ෂණයේ යෙදෙද්දී මට මහන්සි දැනෙනවා. ඔබට කම්මැලිද එළියේ ටිකක් ඇවිදින්න යන්න? කමක් නෑ. මං ටිකක් ඇවිදලා එන්නම්. ඒ අතරේ ඔබට පුළුවනි පුවත්පත් කියවන්න"

පුස්තකාල කාමරයේදී උදේ එකොළහට සාක්ෂි විභාගය ඇරඹිණි. කට උත්තරයක් දීම සඳහා මුලින්ම අප වෙත පැමිණියේ රෙජී නීල්සන්ය.

"මං කලිනුත් මේ විස්තර ග්‍රෙග්සන් මහත්තයාට කිව්වා," නීල්සන් කීය. "උපන්දින සාදය අවසන් වෙද්දී රෑ දහයමාර විතර වුණා.

කම්හලේ සේවකයන් අස්කිරීම ගැන අප දෙදෙනා අතරේ බහින්බස්වීමක් ඇතිවුණු බව ඇත්තයි. නමුත් රෑ එකොළහමාර වෙද්දී ඒක සමාදාන වුණා. අතට අත දීලා, තරහ මරහ අමතක කරලා, නිදාගන්න යන්න අපි දෙන්නා තීරණය කළා."

"ඒ වෙලාවෙ ඔබ දෙදෙනා මත්පැන් බීම නිසා වෙරිවෙලාද හිටියේ?" ෆෙර්ගසන් විමසුවේය.

"රේ කොහොමටත් ඒ තරමට මද්‍යසාරය පාවිච්චි කරන කෙනෙක් නොවෙයි." නිල්සන් කීය. "ඔහු ෂෙරි ටිකක් බිව්වා. අපි බිව්වෙ රෑ කෑමට කලින්. ඒ කියන්නේ රෑ අටටත් දහයටත් අතර. දහය වෙද්දී රෑ කෑම කෑවා. නමුත් මගේ මත්ගතිය නම් දිගටම තිබුණු බව මට මතකයි. ඒ නිසාම තමයි අප අතර ඇතිවුණු වචන හුවමාරුව උණුසුම් වුණේ. කොහොම වුණත් ඒව සමාදාන වෙලා ඇඳට වැටුණු ගමන්ම මට නින්ද ගියා."

"මේ මරණය ගැන ඔබ දැනගත්තේ කොයි වෙලාවෙද?" ෆෙර්ගසන් විමසුවේය.

"රෑට කොයිතරම් පරක්කු වෙලා නින්ද ගියත්, මට උදේ පහට ඇහැරෙනවා." නිල්සන් කීය. "ඒක දිගුකාලයක් තිස්සේ තියෙන පුරුද්දක්. අද පාන්දරත් පහට ඇහැරුණා. මට එක්වරම දැනුණේ ලොකු වතුර තිබහක්. සාමාන්‍යයෙන් සාලෙ කෑම මේසය උඩ වතුර පුරවපු ලොකු ඩිකැන්ටරයක් තියෙනවා. අපි කෑම කෑ වෙලාවෙ ඒක බීල ඉවර කරලා, අලුත් එකක් තියන්න කූපර්ට අමතක වෙලා. රේ නිදන කාමරේ සාමාන්‍යයෙන්, සේවකයා නොවරදවාම වතුර ඩිකැන්ටරයක් තියන බව මං දැනගෙන හිටියා. ඉතින් එහෙමවත් වතුර ටිකක් බොන්න හිතලා, මං ගිහින් රේගෙ කාමරේ දොර විවෘත කළා. මට එක්වරම දැනුණේ මොනවාදෝ හරි පිළිස්සෙන ගඳක්. ඒ කාමරයේ කෙළවරක සාමාන්‍යයෙන් කුඩා ලාම්පුවක් දල්වා තිබෙනවා. ඒකෙ එළියෙන් මං දුටුවා රේ වැටී තිබූ විනාශය.

ඔහුගේ මෙට්ටයෙන් දුම් නගිමින් තිබුණා. මට එක්වරම හිතුණේ, දුම්වැටිය කොට්ටය මතට වැටී එය ගිනිගෙන, මෙට්ටයටත් ගිනි ඇවිළෙන්න ඇති කියලයි. මං "රේ! රේ!" කියා ඔහුගේ ඇඟට අත තබා සොලවමින් ඔහු ඇහැරවන්න උත්සාහ කළා. නමුත් ඒකට ඔහු කිසිම ප්‍රතිචාරයක් දැක්වූවේ නැහැ. ඊට පස්සෙයි මං දුටුවේ ඔහුගෙ ඇඟේ පැත්තක් පිළිස්සී ඇති බව. ඔහු මරණයට පත්වී ඇති බව





තේරුම් ගත්තාම, මං තිගැස්සී එළියට ඇවිත් ගේ ඇතුළට දිවගියේ කෑගසමින්. මගේ කෑගැසීමට කූපර් අවදිවෙලා ආවා. ඊට පස්සේ කූපර් පොලිසියට කළ දැනුම්දීම අනුව වැට්මන් මහත්තයා අලුයමදීම මෙහේ ආවා."

"සර් රේ තර්ස්ටන් සමග අමනාප අය ඉන්නෙ කවුරුන්ද?" ෆෙර්ගසන් විමසුවේය.

"මට නම් හිතන්න පුළුවන් දෙන්දෙනෙක් ගැන පමණයි" නීල්සන් කීය. "ඒ ඊයේ රාත්‍රි මෙහේ ඇවිත් කලහකාර ගිය සේවකයන් දෙන්නා. ඔවුන් කම්හලේ යන්ත්‍ර දෙකකට අලාභහානි කර තිබුණා. ඒවා විශාල මුදලක් ගෙවා මිලට ගත් අලුත්ම යන්ත්‍ර. මේ තරම් අලාභහානි කරලා, අපට ඔහු වෙනුවෙන් මැණවදින සේවකයන් රැකියාවෙන් අස්කර දැමීමේ වරදක් මට නම් පෙනුණේ නැහැ."

"නමුත් එහෙම කළාට සර් රේ ඔබට දොස් කිව්වා?"

"ඔව්."

"මේ සේවකයන් දෙදෙනාගේ නම හා ලිපින මොනවාද?" ෆෙර්ගසන් ඇසීය.

"එක්කෙනෙක් ෆ්‍රෙඩ් විල්සන්. අනෙක් එක්කෙනා ක්‍රිස් මෙට්ලින්. එයාල පදිංචි තැන් වල ලිපින නම්, කම්හලේ ලිපිගොනුවේ ඇති. මං ඒවා ඉක්මනින් ලබාදෙන්නම්"

"සර් රේ සමග අමනාප අය තවත් කවුරුවත් හිටියද?" හෝම්ස් විමසුවේය.

"මං දන්න තරමින් වෙනත් කිසිවෙක් නැහැ" නීල්සන් කීය.

"සර් රේ ගේ බෑනා - ඩොනල්ඩ් හාවි කොහොමද?" ෆෙර්ගසන් ඇසීය.

"මුලින් නම් ඔවුන් අතර තරමක දුරස්ථිමක් තිබුණු බව ඇත්තයි." නීල්සන් කීය. "නමුත් කල් ගතවෙද්දී ඒ අමනාපකම මගහැරී ගියා."

මීළඟට කටඋත්තරය සඳහා කැඳවනු ලැබුයේ ගෙදර ප්‍රධාන මෙහෙකරු කූපර්ය. ඔහුට කීමට තිබුණේ ද, ලේකම්වරයා වූ රෙජී නීල්සන් අපට පැවසූ කරුණුමය.

"ඊයේ රෑ ඔබ නිදාගන්න ගියේ කීයටද?" හෝම්ස් ඇසීය.

"මං නිදාගන්න යනකොට රෑ දොළහ පහුවෙලා" කූපර් කීය. "අපේ මහත්තයා සාමාන්‍යයෙන් නුගත් රෑ වෙනතුරු අවදියෙන් ඉන්නේ නැහැ. නමුත් ඊයේ රෑ තිබුණු උපන්දින සාදය නිසා, ගෙදර



www.sinhalaelibrary.com

වැඩකටයුතු අවුල් වුණා. අපේ මහත්තයා සහ නීල්සන් මහත්තයා අතර බහින්බස් වීම තියෙන්න ඇති පැයකට විතර. ඒකෙන් තමා හුගක්ම ය් වුණේ. එතෙල් දෙවල් අඟුරු දමල වහලා, පහන් නිවලා, මං නින්දට යද්දි මං හිතුන්නේ ය් දෙලහමාරට කිට්ටුවෙන්න ඇති.

උදේ පාන්දරම හයුදෙට ඇවිත් මගේ දොරට ගහමින් කෑගහන සබ්දෙට තමා මට ඇහැරුණේ. දොර ඇරලා බැලින්නම් නීල්සන් මහත්තයා. මං එවෙලේම දුවගෙන ඇවිත් බැලුවා. මෙට්ටයෙන් දුම් නගිමින් තිබුණා. නාන කාමරයෙන් බාල්දිවලට වතුර ගෙනත් දමලා අපි ගින්න නිව්වා. නමුත් මහත්තයා මියගිහින්. ඊළඟට ඒ බව ආර්යාවට දනුම්දීලා, පියාවුණ ඇවදිකරගෙන මං පොලීසියට ගියා. පොලීසියේ වැප්ලන් මහත්තයා එවෙලේම ආවා."

මීළඟට අප හමුවට පැමිණියේ තර්ස්ටන් ආර්යාවය. සිහින් උස හැඩැත්තියක් වූ ඇය හොඳහෝ සුදුමැලිව සිටියාය. වයස අවුරුදු හතළිස්පහක් පමණ වූ ඇයට තිබුණේ රුමත් පෙනුමකි. කෙසේ වෙතත් මේ අවස්ථාවේ නම් ඇය සිටියේ තරාතිර ගැනීමට පවා අපහසු දුටි කම්පනයකින් බව මම තේරුම් ගතිමි. ෆ්‍රෙග්සන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු ලෙස ඇය මුලින්ම පෞද්ගලික තොරතුරු පැවසුවාය.

"විවාහයට කලින් මගේ නම එස්තර් රොබින්සන්. මං කැනඩාවේ, ඇල්බටා ප්‍රාන්තයේ එඩ්මන්ටන් නගරයේ කෙනෙක්. රේමන්ඩ් මුලින්ම කැනඩාවට ඇවිත් තිබුණේ '58 අවුරුද්දේ. එතකොට එයාට වයස විස්සයි. හරිහැටි රැකියාවක් නැතුව, අවුරුදු දෙකක් පමණ එයා තැන් තැන්වල රස්තියාදුවෙලා තිබෙනවා. ඊට පස්සෙයි එයාට ගෝට් වර්ම්ලියන් වල රත්රන් පතල හමුවුණේ. එහේ අවුරුදු අටක් පතල්වල වැඩකරලා, මුදල් හොයාගෙන, එයා එංගලන්තයට ඇවිත් තිබුණා. ඒ කාලෙම එයා විවාහවෙලා තියෙනවා. ඒ මේ කෙන්ට් ප්‍රාන්තයේම කාන්තාවක සමඟ. ඇය දරු ප්‍රසූතියේදී මියගිහින් තිබෙනවා. ඒ නිසා දරුවා හදාගැනීම එයා බිරිඳගේ ඥාතීන්ට භාරදුන්නාලු. එංගලන්තයේ අවුරුදු කිහිපයක් ගතකරලා එයා යළිත් වරක් කැනඩාවට ආවා. ඒ එයා සතුව තිබූ රත්රන් පතල්වල අයිතිය විකුණන්න සහ එහේ ගිණුම් වල තිබූ මුදල් ආපසු ගෙනැන්නීමට. මගේ පියා ඒ කාලයේ කැනේඩියන්





පැසිෆික් බැංකුවේ, ශාඛා කළමනාකාරවරයෙක්. බැංකු කටයුතු වලදී ඇතිකරගත් හැඳුනුම් කමක් උඩ, මං රේමන්ඩ් සමඟ විවාහ වුණා. ඒ 1874 අවුරුද්දේ. ඒ ඉක්මනින්ම අපි එංගලන්තයට බලා ආවා.

අපේ වැඩිමහල් දුව සිබිල් උපන්නේ 77 අවුරුද්දේ. අපට තවත් දියණිවරු තුන්දෙනෙක ඉන්නවා. මගේ සැමියා ඉතා යහපත් කෙනෙක්. එයා නරුදවත් සුදුවට ගියේ නැහැ. මත්පැන් වශයෙන් පානය කළේ බීර හෝ ෂෙරි වැනි සැර නැති මත්පැන් ස්වල්පයක් පමණයි."

"එයා දුම්පානය කළාද?"

"ඔව්. දවසට දෙතුන් වරක් සුරුට්ටු පානය කළා. මං දන්නා තරමින් එයාට සතුරන් හිටියේ නැහැ. නමුත් මේ කම්හලේ සේවකයන් සමඟ ඇතිවුණා තියන ප්‍රශ්න, කොයිතරම් දුරදිග ගියාද කියල මම දන්නේ නැහැ."

"ඔබගේ වැඩිමහල් දුවගේ විවාහය සම්බන්ධයෙන්, ඔබේ සැමියා ඩොනල්ඩ් හාවි සමඟ අමනාපව සිටි බවක් අපට අහන්න ලැබුණා. ඒක ඇත්තක් ද?" හෝම්ස් විමසුවේය.

"ඔව්" ආර්යාව කීවාය. "සිබිල් අපේ පවුලේ දේවල් ගැන තේරුමක් තියෙන කෙනෙක් නෙමෙයි. වැඩිදුර අධ්‍යාපනය සඳහා ඇය නිව්යෝක් විශ්වවිද්‍යාලයට යවමු කියලා යෝජනා කළේ මම. මගේ සැමියා මුලින් ඒ යෝජනාවට කැමැති වුණේ නැහැ. නිව්යෝක් වල පදිංචි මගේ ඥාතීන් ඉන්නවා. දුව ගැන හොයලා බැලීම මං ඔවුනට පවරලයි තිබුණේ. ඒ කොහොම වුණත් අපි කිසිවෙකුට නොදන්වා, ඇය ඩොනල්ඩ් හාවි සමඟ විවාහ වී තිබුණා. ඇය ඒ බවක් අපට දන්නුවේවත් නැහැ. මගේ ඥාතීන් තමා ඒ ගැන අපට දන්වලා එව්වේ."

"ඔබ මේ විවාහයට විරුද්ධවුණේ ඇයි?" ෆ්‍රෙග්සන් ඇසීය.

"අපි දෙන්නම ඊට විරුද්ධ වුණා" තර්ස්ටන් ආර්යාව පැවසුවාය. "ඊට එක හේතුවක් සිබිල් ඇගේ ඉගෙනීම සම්පූර්ණ කර නොගිනීමයි. ඇය විශ්වවිද්‍යාලයේ දේශනවලට සහභාගි වෙලා තිබුණේ අවුරුද්දකටත් අඩු කාලයක්. අනෙක ඩොනල්ඩ් හාවි කිසිම උගත්කමක් හෝ හරිහැටි රැකියාවක් නො තිබුණු කෙනෙක්"

"ඔබේ දුව හා ඇගේ සැමියා එංගලන්තයට ඇවිත් කොයිතරම් කාලයක් වුණාද?"



www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For Print.

"නවම අවුරුද්දක් වුණේ නැහැ" ඇය කීවාය. "ඔවුනට කිසිම ආදායම් මාර්ගයක් නැහැ. ජීවත්වීම සඳහා මුදල් දෙන්නේ මම. පදිංචිවෙන්න ගෙයක් තිබුණේ නැහැ. වතු කළමනාකරුවකු ගැනීමට අපේ වත්තෙම නිවසක් ඉදිකළේ මෑතකදී. ඒ අලුත් නිවස සිබිල්ලට පදිංචිය සඳහා දෙන්න, මම මහත්තයා කැමැතිකරවා ගත්තෙ බොහොම අමාරුවෙන්"

"වියදමට මුදල් හා පදිංචියට නිවස ඔවුනට ලැබුණෙ සර් රේ ගෙන් බව ඔබ කිව්වා. ඉතින් ඇයි අමනාපයක් දිගටම පැවතුණේ?" හෝම්ස් විමසුවේය.

"මීට මාස දෙකකට පමණ කලින් ඔවුන් විනෝද සංචාරයක් සඳහා ඉතාලියට සහ සිසිලි දූපතට ගියා" තර්ස්ටන් ආර්යාව කීවාය. "සිසිලියේදී මගේ දුව උණසන්නිපාත රෝගයට ගොදුරුවී රෝහල්ගත කර තිබෙනවා. මගේ මහත්මයා විශේෂ යාත්‍රාවක් යවලා තමයි ඔවුන් ආපසු ගෙන්වාගත්තෙ. මගේ දුව මෙහේ සාන්ත ඇන්ඩ්‍රූ රෝහලට ඇතුළත් කරද්දී බොහොම බරපතල ලෙස රෝගාතුරවයි හිටියේ. එත් ඇගේ සැමියාට ඒ ගැන කිසිගණනක් තිබුණේ නැහැ. ඇය අසාධ්‍ය තත්ත්වයෙන් දින ගණනක් හිටියා. වෛද්‍යවරුන්ගේ දක්ෂකමෙන් තමයි ඇගේ ජීවිතය බේරුණේ. ඇය මේ තරම් අසාධ්‍ය තත්ත්වයකින් රෝහලේ සිටියදී, ඩොනල්ඩ් ඒ රෝහලට ඇතුළුවුණා. ඒ ඔහුගේ කකුලේ යටිපතුලේ තිබූ ගල් කැලුම් වගයක් හා කැඩුණු නියපොත්තක් සැත්කමකින් ඉවත්කරවා ගැනීමට. මෙකට මගේ සැමියාට හොඳටම කේන්ති ගියා. වහාම රෝහලෙන් පිටවී නොගියොත්, අශ්වයින්ට තළන කසයෙන් ඩොනල්ඩ්ට තළන බව කියා මගේ සැමියා බැණවැදුණා."

"සර් රේ ඔහුගේ දේපොළ පිළිබඳව අන්තිම කැමති පත්‍රයක් ලියා තිබුණද?"

"ඔහු අන්තිම කැමැති පත්‍රය මුලින් ලියුවේ සෑහෙන කාලයකට පෙර" ආර්යාව කීවාය. "එහෙදී ඉඩකඩම් ඇතුළු සියලුම දේපොළ ඔහුගේ මරණයෙන් පසු මට හා දරුවන් හතරදෙනාට හිමිවෙන ලෙසයි ලිව්වේ. නමුත් මෑතකදී ඒක වෙනස් කළා. මීට මාසයකට විතර කලින්. ඔහුගේ උපන්දිනයට පෙර, නීතිඥයා කැඳවලා අන්තිම කැමැති පත්‍රය වෙනස් කළා."

"ඒ මොන විදියටද?"





"මෙතෙක් නොලියා තිබූ අක්කර විසිපහක ඉඩමක්, ඔහුගේ ලේකම් රෙජී නීල්සන් මහත්මයා නමට ලියුවා. ගෙදර සේවකයන්ටත් ඉඩම් අක්කරය බැගින් ලිව්වා. මට දේපළ අයිතිවෙන ආකාරයේ වෙනසක් කළේ නැහැ. නමුත් දේපොළ දරුවනට හිමිවෙන පිළිවෙළේ වෙනසක් කළා"

"ඒ මොකක්ද?"

"කලින් තිබුණු විදියට සැමියාගේ මරණයෙන් පසුව, වහාම, තමන්ගේ කොටස් දරුවනට අයිතිවෙනවා. නමුත් දැන් ඒවා ඔවුනට අයිති වෙන්නේ වයස අවුරුදු තිහක් සම්පූර්ණ වූ පසු. එතෙක් ඒවායේ භාරකාරත්වය මට පැවරුවා."

"මෙක කළේ කාගේ උවමනාවටද?" හෝම්ස් ඇසීය.

"සර් රේමන්ඩ්ගේ උවමනාවට වූ දි", ආර්යාව කීවාය. "ඔහු කුඩාකාලයේ දුක් විඳලා, බොහොම මහන්සිවෙලා මුදල් උපයාගත් කෙනෙක්. එය නිකරුණේ නාස්තිකර දමනවාට, වැරදි පුද්ගලයන් අතට පත්වෙනවාට මහත්මයා කැමැති වුණේ නැහැ. මේ හැඟීම ඔහුට වැඩියෙන්ම ඇතිවුණේ, දුවගේ හිතුවක්කාර විවාහය නිසා. ඔහුට උපදෙස් දුන්නේ අපේ නීතිඥ චර්චිල් මහත්මයා."

"ඔහු හමුවීමට අපට අවශ්‍ය වේවි" හෝම්ස් කීය. "කරුණාකර ඔහුගේ ලිපිනය අපට ලබාදෙන්න පුළුවන්ද?"

"චර්චිල් මහත්මයා පදිංචි හැනෝවර් චතුරශ්‍රයේ. සෙවනෝක්ස් තැපැල්කාර්යාලයට යාබද ගොඩනැගිල්ලේ"

"නීල්සන් මහත්මයාට ඉඩමක් ලිවීම කාගේ උවමනාවකට සිදුවුණු දෙයක්ද?" ග්‍රෙග්සන් විමසුවේය.

"ඒක අපේ මහත්මයාගේ උවමනාවටම කළ දෙයක්" ආර්යාව කීවාය. "දිගු කාලයක සිට ඔවුන්ගේ තිබෙන මිත්‍රත්වය නිසා ලියුවා වෙන්න පුළුවනි."

"තර්ස්ටන් ආර්යාවෙනි. මට මේ කරුණ කියන්න" හෝම්ස් කීය. "සර් රේ මේ විදියට හදිසියේ මරණයට පත්වීම ගැන ඔබට මොකක්ද හිතෙන්නේ? ඔහු තදින් බීමත් වන කෙනෙක් නොවන නිසා, දුම්වැටියකින් කොට්ටයට ගිනි ඇවිළී මියගියා කියල හිතන්න පුළුවන්ද?"

"ඒක මට හිතාගන්න අමාරුයි" ඇය කීවාය. "මේක කුමන්ත්‍රණකාරයින් කවුරුන් හෝ කළ අපරාධයක් කියලා මගේ හිතේ සැකයක් තියෙනවා"

මේ අවස්ථාවේ පුස්තකාල කාමරයේ දොරට කිසිවෙකු තට්ටුකරන හඬ ඇසිණි. ඒ සමගම දොර විවෘතකරගෙන ඇතුළට පිවිසියේ පොලිස් පරීක්ෂක වැප්මන් ය.

"පොලිස් ශල්‍ය වෛද්‍යවරයා පශ්චාත් මරණ පරීක්ෂණය මේ දැන් අවසන් කළා" වැප්මන් කීය. "මරණයට හේතුව හිත්තට අසුවී පිළිස්සීම නොවෙයි"

"එහෙනම්?"

"සර් රේමන්ඩ්ගේ හිසේ පිටුපස ඇතිවී තිබෙන බරපතළ තුවාල" වැප්මන් තියුණු තැපෑසි පිටුවක් අප වෙතට දිගු කරමින්. "මුවහත් උල් ආයුධයකින් හිසේ පිටුපසට ඇනීම නිසා අධික ලේ වහනය, හිස්කබලේ ඇටි බිඳීයාම. එයින් මොළයට ඇතිවූ තුවාල"

ග්‍රෙග්සන් සහ මා ඉවතින් පුදුමයට පත්වූවත් හෝම්ස් පුදුමයට පත්වූ බවක් නොපෙනිණි. ඔහුගේ දෙනෙත් දීප්තිමත් විය. ඔහු තම දෑත් එකට පිරිමැද්ද අයුරු මම දුටුවෙමි.

වැප්මන් පැවසූ දෙය අසා සිටි හර්ස්ටන් ආර්යාව හැලෙන්න වී ඇඬවැටුණාය. අපි වහාම ඇය ඔසවා, පුස්තකාල කාමරයේ වූ සුවපහසු සෝෆාවක් මත තැන්පත් කළෙමු. මා ඇයට ප්‍රථමාධාර දෙන අතරේ වැප්මන් නිවස තුළට දිවගොස්, සේවිකාවන් දෙදෙනෙකු කැඳවාගෙන ආවේය.

"මරණය ගැන අහලා ආර්යාව නැගිට්ටද්දී උදේ පහයි" එක් සේවිකාවක් කීවා ය. "කිසි දෙයක් කෑවෙ බිව්වෙ නෑ. අඬා වැලපෙමින් හිටියා. දැන් මේ සාත්තු දෙන්න එන්න කලින් මං වදකලාම කෝපි උගුරක් බිව්වා, එච්චරයි"

මඳවේලාවක් යද්දී හර්ස්ටන් ආර්යාවට සිහි ලැබිණි. ඇය ඉවතට කැඳවාගෙන යාමට අපි අවසර දුන්නෙමු. ඇයට කෑමබීම හා විවේකය ලබාදිය යුතු බවට මම උපදෙස් දුන්නෙමි.

"මෙතැනින් ඉදිරියට මොකක්ද අප ගත යුතු ක්‍රියාමාර්ගය?" වැප්මන් විමසුවේය. "ඒ ගැන ග්‍රෙග්සන් මහත්මයාගෙන් උපදෙස් ලබාගන්න මං කැමතියි"

"වැප්මන්, ඔබ මේ සිද්ධිය සම්බන්ධයෙන් මේ දක්වා කළේ මොනවාද යන්න දැනගැනීමට මං කැමතියි" හෝම්ස් කීය.

"සර් රේගේ මරණය ගැන මට දැනගන්න ලැබෙද්දී වෙලාව උදේ පහයි විස්සයි" වැප්මන් පැවසුවේ, තම කබා සාක්කුවේ වූ කුඩා





සටහන් පොත එළියට ගෙන පෙරළා බලමිනි. "පොලිස් භටයන් දෙදෙනෙකු සමග මං ඒ වෙලාවෙම පිටත්වෙලා ආවා. ඔබට කියන්න හෝම්ස් මහත්තයා, ළඟදීම මේ ගෙදර මොකක් හරි කලබලයක් වේවි කියල මට හිතිල තිබුණා."

"ඇයි ඔබට එහෙම හිතුණේ?" හෝම්ස් ඇසීය.

"සර් රේමන්ඩ් ඉතා යහපත් කෙනෙක්. නමුත් ඔහුටත් කරදර තිබුණා." වැප්මන් කීය.

"ඔබ කියන්නේ කර්මාන්ත ශාලාවේ සේවක ප්‍රශ්න වෙන්න ඇති?" ග්‍රෙග්සන් ඇසීය.

"ඔව්, එක පැත්තකින් එවා" වැප්මන් කීය. "කර්මාන්ත ශාලාවේ කලබල ඔක්කොම පැවතුණේ, නිල්සන් මහත්මයා සේවකයන් කිහිප දෙනෙකු අස්කර දැමීම නිසා. අර සේවකයන් දෙදෙනෙක් ඊයේ රෑ මේ ගෙදරට ඇවිත් කළ කලබලය ගැන, සර් රේ සේවකයෙකු අතේ පොලිසියට ලියුම් කැබැල්ලක් එවා තිබුණා. අද උදේ ඒ ගැන නිල වශයෙන් පැමිණිලි කරන්න පොලිසියට එන බව දන්වා තිබුණා."

"තව මොනවද ඔහුට තිබුණු කරදර?" හෝම්ස් ඇසීය.

"ඇයි ඔහුගේ බෑනා ඩොනල්ඩ් හාවි ගෙන් තිබුණු කරදර? ඒ මිනිහා අතේ පැන්සයක් නැති මහ රස්තියාදු කාරයෙක්. ඒ මිනිහගේ පොහොමටයි කයිවාරුවටයි, හර්ස්ටන් මෙණෙවිය අපරාදේ රැවටිලා. මං මේ ඔබට කියන්න සූදානම් වුණේ ඒ ගැන.

උදේ පහමාරටයි මං මේ ගෙදරට ආවේ. එතකොටම මට හිතුණා මේක හදිසි මරණයක් නෙමෙයි, මිනීමැරුමක් වියයුතුයි කියන හැඟීම. මේක අර කර්මාන්ත ශාලාවේ මැරවරයො දෙන්නගෙ වැඩක් වියයුතුයි කියලයි මට හිතුණේ. ඒ වුණත් ඩොනල්ඩ් හාවි ගැනත් විභාග කොට බලන්න මං තීරණය කළා.

මං එවෙලේම ලියුම් කැල්ලක් ලියලා, මගේ පොලිස් භටයෙකු අතේ දුම්රියපොළට එව්වා. සසෙක්ස් වලින් ලන්ඩන් බලායන සීඝ්‍රගාමී උදේ දුම්රිය, සෙවනෝක්ස් දුම්රියපොළේ නවත්වනවා. ඒකෙ ලන්ඩනයට පණිවුඩයක් යැව්වොත්, ස්කොට්ලන්ඩ්යාඩ් එකෙන් නිලධරයෙක් අප්‍රමාදව ගෙන්වා ගත හැකිබව මට වැටහුණා.

මගේ පොලිස් භටයා ඒ කටයුත්තට යවලා, උදේ පාන්දරම මං ගියේ කොහේටද? මියගිය සර් රේගෙ බෑනා ගේ ගෙදරට. අන්න



www.sinhalaelibrary.com

කරත්තයෙන් ගියොත් හඩක් නැඟෙන නිසා, මං ගියේ බයිසිකලයෙන්. ඒ ගෙදරට යාර පනහක් තිබියදී බයිසිකලය නවත්වලා, මං පයින්ම ඉදිරියට ගියා. මං නිශ්ශබ්දව කන්දීගෙන හිටියා, මොකුත් ශබ්දයක් නෑ. මේ ගෙදර පදිංචිව හිටියේ ඩොනල්ඩ් හාවි, ඔහුගේ තරුණ බිරිඳ හා සේවකයන් ලෙස වයස්ගත යුවළක් පමණයි.

මිනිත්තු කිහිපයක් දොරට තට්ටු කළාම, ඒ සේවකයා ඇවිත් දොර ඇරියා, මං ඇහුවා හාවි ගැන.

"හාවි මහත්මයා ගෙදර ඉන්නවා" සේවකයා කිව්වා. "මහත්මිය නම් නැහැ. ඇය ඇගේ මිතුරියක් එක්ක ලන්ඩනයට ගියේ පෙරේද"

"හරි, ඔබේ ස්වාමියාට එන්න කියන්න" මං කිව්වා. එතකොටම ගෙදර විසිත්ත කාමරයේ සෝපාවක නිදා උන් තරුණයෙක් නැගිටලා ආවා."

"කාවද හොයන්නේ?" ඔහු ගරුසරුවක් නැතිව ඇහැව්වේ, මං නිල ඇඳුමෙන් නොහිටි නිසා වෙන්න ඇති.

"මං සෙවනෝක්ස් පොලිසියේ පරීක්ෂක වැජ්මන්" මං කිව්වා. "ඊයේ රාත්‍රී සිදුවුණු කලබලයක් ගැන කටඋත්තර ගන්න පොලිසියට උවමනා වෙලා තියෙනවා. කෝ ඩොනල්ඩ් හාවි? ඔහු වහාම හමුවෙන්න මට උවමනායි"

මං කියූ දෙයට පිළිතුරු ලෙස මේ තරුණයා ඇඟිල්ල දිගු කළේ උඩුමහල දෙසට.

"මිනිහා තවමත් ඇන්දේ එහේ. හැබැයි අපි එයාව එළියට ගත්තොත් මිස එයාට තනියෙන් නම් එළියට එන්න බැහැ"

මෙහෙම කියූ ඔහු මේසයක් උඩ තිබූ යතුරු දෙකක් තියෙන කැරැල්ලක් අරගෙන මා අතට දුන්නා.

"මොකක්ද ඒ කතාවේ තේරුම?" මං ඇහුවේ පුදුමයෙන්.

"සිබිල් මේ දවස්වල ලන්ඩනයට ගිහිං. ඊයෙ රෑ අපි මෙහේ සාදයක් පැවැත්තුවා. ඒකට යාළුමිත්‍රයන් කීපදෙනෙක්ම ආවා. ඩොනල්ඩ් මත්පැන් බිව් ප්‍රමාණය හොඳටම වැඩියි. ඔහු සෝඩාවත් කලවම් නොකර පොඩ්කා බිව්වා. ඊළඟට ගෙදරට ආව අමුත්තන්ට බැණවදිමින් රණ්ඩු කරන්න පටන්ගත්තා. බලන්න ඔය බීම තියෙන්නෙ ඔහු තේන්තු ගිහින් පොළොවේ ගැසූ මල්වාස් එක. මං ඩොනල්ඩ්ව උඩට අරගෙන ගියේ බොහොම අමාරුවෙන්. ඊළඟට





ඔහුව නිදනකාමරයට දාලා යතුරු දැම්මා. ඔහු ටික වෙලාවක් දොරට තඩිබෑවත් මං ගණන් ගත්තේ නෑ. ටිකවෙලාවක් යද්දී ඔහුගේ ශබ්දය නැවතුණා. මගේ පෙම්වතියත් මේ සාදයට ආවා. අමුත්තන් පිටවී යද්දී, මං ඇයවත් කැඳවාගෙන ගිහිං ඇගේ ගෙදරට ඇරලුවා. මං ආපහු එනකොට ඔහු හොඳටම නිදි නිසා මං ඔහුගේ කාමරයේ දොර ඇරියේ නැහැ. මමත් නිදාගන්න ගියා."

"ඔබේ අමුත්තන් පිටවෙලා යද්දී වෙලාව කීයද?" මං ඇහුවා.

"රෑ දොළහමාර විතර වෙන්න ඇති" ජයිල්ස් නම් ඒ තරුණයා කිව්වා. "මං ආපහු ඇවිත් නිදාගන්න යද්දී ඔරලෝසුවේ එක වදින ශබ්දය මට ඇහුණා. ඇයි මේ විස්තර අහන්නේ?"

"ඒ විස්තර මං පස්සෙ කියන්නම්" මං කිව්වා. "දැන් අපි ගිහින් බලමු ඔබේ ඒ මිත්‍රයා තවමත් ඒ කාමරේ ඉන්නවද කියලා"

ඒ අනුව අපි දෙන්නාත් සේවක මහත්තයත් උඩ තට්ටුවට ගියා. උඩ තට්ටුවේ නිදන කාමරය ළඟට ආවාම ජයිල්ස් යතුරු කැරැල්ල මා අතට දුන්නා. යතුරුකටට ඒ යතුරත් හොඳමා, දොර නිකම් විවෘත කරන්න හැකිද කියලයි මං මුලින් බැලුවෙ. එහෙම හැකියාවක් තිබුණේ නෑ. ඊළඟට යතුර කරකැව්වා මං දොර විවෘත කළා.

ඩොනල් හාවි හොඳටම ගොරවමින් ඔහුගේ ඇඳේ නිදාහිටියා. මගේ ඉල්ලීම පිට ජයිල්ස් හාවිව අවදිකළා. ත්වමත් මත් ගතියෙන් සිටි ඔහු උත්සාහ කළේ යළිත් අනිත් පැත්තට හැරී නිදාගන්නටයි. නමුත් කට උත්තරයක් ගැනීමට මං පොලිසියෙන් ආ බව කිව්වාම, ඔහු රොස් පරොස් කියමින් ඇඳෙන් නැගිට්ටා. කලින්ද රාත්‍රියේ ඔහු පානය කළ මත්පැන්වල දුගඳ ඒ වෙලාවෙත් කාමරයේ තිබුණා. කෝපි කෝප්පයක් ගෙන එන මෙන් සේවකයාට නියෝග කළ හාවි නානකාමරයට ගියා. ඉන්පසු ඔහු දුන් කටඋත්තරය මං මෙහෙ සටහන් කරගත්තා" වැජ්මන් පැවසුවේ තම සටහන්පොත අපට පෙන්වමිනි.

"මගේ බිරිඳ සිකුරාදා උදේ ලන්ඩනය බලා ගියා. ඒ නිසා ඊයේ රෑ සාදයක් මේ ගෙදර පවත්වන්න ජයිල්ස්යි මායි තීරණය කළා. ඒකට සහභාගී වෙන්න කියලා අපේ යාළුවන් දෙතුන් පොලකටත් ඇරයුම් කළා.

රෑ නවය පමණ වෙද්දී අපේ සාදය පටන්ගත්තා. පැය දෙකක් විතර යද්දී අපි ගෙනැත් තිබුණු විස්කි බෝතල් ඉවරවුණා. විස්කි අරගෙන එන්න මගේ සේවක ක්‍රෝෆර්ඩ් යවන්න පිළිවෙළක්

තිබුණෙ නැහැ. ඒ මොකද ඔහු ඇග ඔහුගේ බිරිඳ තමා ඒ කෑම පිළියෙල කළේ. ඒ නිසා විස්කි වෙනුවට වොඩ්කා බොන්න කියලා මං මගේ අමුත්තන්ට කිව්වා.

නමුත් ඔවුන් ඒකට කැමැතිවුණේ නැහැ. ඒ ගැන එඩ්වඩ් බුචුන්ස් හා මා අතර බහින්බස්වීමක් ඇතිවුණා. ඒක සණ්ඩුවක් ලෙස දිග්ගැස්සුණා කියල මට යන්තමින් මතකයි. ඌ මගෙන්ම බීලා, මට බැණ වැදුණේ මහ නින්දිත විදියට. මං මොනවා කිව්වද මට මතක නෑ. ජයිල්ස් මාව බලුලන් වගේ උඩ තට්ටුවට අරගෙන යනවා මට යන්තමට මතකයි. ඔහු මාව කාමරය තුළට දමා යතුරු දමන්න ඇති. මං කොයිතරම් දොරට ගැහුවත් දොර ඇරියේ නෑ. අන්තිමට මං ඇඳට වැටුණා. ඊළඟට උදේ ඔබ හැමදෙනාම ඇවිත් අවදිකරන තුරු මං කිසිදෙයක් දන්නෙ නෑ.

පොලීසියෙන් ඇවිත් මගෙන් මෙහෙම කට උත්තර ගන්නෙ මං මොන වරදක් කළාටද? එඩ්වඩ්ට තදින් පහර දුන් බවක් මට මතක නෑ. අධික ලෙස මත්පැන් බී මත්වී සිටි නිසා, නොදැනුවත්වම ඔහුට මා අතින් තුවාල සිදුවුණාද කියා මා දන්නේ නෑ."

මෙ ලියවිල්ලට ඩොනල්ඩ් හාම් අත්සන් තැබුවේ කැමැත්තෙන්මයි. "ඊළඟට ජූලියස්ගේ හා ක්‍රොෆර්ඩ් නම් සේවකයාගේ කටඋත්තරත් මෙතැන තියෙනවා. හාම් ගේ කට උත්තරය ඒවායිනුත් සනාථ වෙනවා" චැප්මන් තම කථාව අවසන් කළේය.

"ඔබ ඉතාම හොඳින් ඒ රාජකාරිය කර තිබෙනවා චැප්මන්" හෝම්ස් කීය. "ඊයේ ඒ හාම්ගේ සාදයට ආ අමුත්තන් කවුද. ඔවුන්ගේ ලිපිනයන් මොනවාද කියා ඔබ ලියාගත්තද?"

"ඔව් මහත්මයා" චැප්මන් කීය. "මං ඒවාත් සටහන් කරගත්තා. මෙන්න අහගන්න."

එඩ්වඩ් බුචුන්ස් හා එම මහත්මිය,
අංක 12 ස්කිනර් පාර,
කෙන්ටිෂ් ටවුන්.

වින්ස්ටන් සිමන්ස් හා එම මහත්මිය
හෙව්ට්‍රි උද්‍යානය,
සෙවනෝක්ස්





ක්ලෙයා හියුම්ස් මෙනෙවිය,
දුම්රියපොළ මාවත
සෙවනෝක්ස්

මේ අන්තිමට තියූ ක්ලෙයා හියුම්ස් නමැති ජයිල්ස්ගේ පෙම්වතිය. ඔහු රාත්‍රි දෙළහමාරට පමණ ඇය සමග අශ්වකරත්තයකින් පිටත්වී ගිය බව ක්‍රොෆර්ඩ් ස්ථිර කළා."

"ඒ වෙලාවෙ හාම් දැමූ කාමරයේ යතුරු තැයල්ල තිබුණේ කොහේද?" හෝම්ස් ඇසීය.

"තමන් ඒක සාක්කුවේ දමා ගත්තාමත් ඊළියට දහන අමතකවුණා කියා ජයිල්ස් කිව්වා. ඒ නිසා හියුම්ස් මෙනෙවිය ඇරලවන්න යද්දි ඔහු ඒක ගෙනගිහිං තියෙනවා. ගෙදර සේවකයා ක්‍රොෆර්ඩ් ඒක ස්ථිර කළා."

"හොඳයි. මරණ පරීක්ෂණය සඳහා පැමිණෙන වෙලාවත් ගැලපුණා" හෝම්ස් කීය. "දැන් අපි බලමු සර් රේමන්ඩ්ගෙ මරණය සිදුවුණු වෙලාව ගැන පොලිස් ශල්‍ය වෛද්‍යවරයාට කියන්න තියෙන්නෙ මොනවද කියල.

...... ඔව්. මේ තියෙන්නෙ ඒ ගැන.

**ගෙදර සේවකයන්ගේ සාක්ෂි අනුව, සර් රේමන්ඩ් තර්ස්ටන් රාත්‍රී ආහාරය ගෙන ඇත්තේ රෑ දහයට පමණය. නොදිරවූ ආහාර සහ අර්ධව දිරවූ ආහාර ඔහුගේ ආහාර මාර්ගයේ ගමන් කළ දුර අනුව, මරණය සිදුවූ වේලාව ගැන නිගමනයකට පැමිණිය හැක. එනම් පාන්දර 2.30 සහ 3.00 අතර මරණය සිදුවී ඇති බවයි.**

**මෘතශරීරයේ කොටසක් ගින්නට අසුවී පිළිස්සී යාම, උදේ පහට පමණත් මෙට්ටයේ ගිනිදැල්වෙමින් තිබූ බවට සාක්ෂි තිබීම යන කරුණු නිසා, මරණය සිදුවූ වේලාව නිශ්චය කිරීමට මළසිරුරේ උෂ්ණත්වය යොදාගත නොහැක"**

"හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීවේ මරණ පරීක්ෂණ වාර්තාව හෝම්ස් මේසය උඩින් තැබූ පසුවය. "මේ අවුල විසඳීම පටන් ගන්න ඕන කොහෙන්ද කියල මට නම් හිතාගන්න අමාරුයි. ඔබ මොනවද ඒ ගැන කියන්නෙ?"

"මටත් ඒ ගැන හිතන්න තවමත් අමාරුයි ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "ඒ හින්ද මරණ පරීක්ෂණ වාර්තාවෙ තියෙන කාරණා මේ ටිකටත් අපි අවධානය යොමු කරලා ඉඳිමු."



www.sinhalaelibrary.com

හිසේ පිටුපස තුවාලය, උල් ආයුධයකින් ඇනීම නිසා සිදුවී ඇත. එයින් සුෂුම්නාවේ ඉහළ කොටස, ශිර්ෂපෝෂි ධමනිවලට, හිස්කබලේ අස්ථි හා මොළයට බරපතල තුවාල සිදුවී ඇත. මියගිය තැනැත්තා මුනින් අතට නිද සිටියදී මෙම තුවාල සිදුකරන්නට ඇතැයි විශ්වාස කළ හැක."

මගේ මිත්‍රයා නිහඬව මිනිත්තු කිහිපයක් කල්පනා කළේය. සාක්කුවේ තිබූ පිගන්මැටි පයිප්පය එළියට ගෙන, එයට දුම්කොළ පුරවා, ගිනි උදුනෙන් ගිනි අඟුරක් ගෙන හෝම්ස් පයිප්පය දල්වා ගත්තේය. මිනිත්තු දහයකට පමණ පසු, කළයුතු දේ ගැන ඔහු නිශ්චිත තීරණයකට පැමිණි බැව් පෙනිණි.

"පරීක්ෂණය පටන්ගන්න ඕනා මේ ගෙදරින්ම තමයි ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "අවමංගල්‍ය කටයුතු සූදානම් කිරීම සඳහා මළසිරුර, අවමංගල අධ්‍යක්ෂකවරුන් වෙත භාරදිය යුතුයි. තර්ස්ටන් ආර්යාව දැන් ඉන්නේ එම කටයුතු හොයලා බලලා කරන්න තරම් හොඳ මානසික තත්ත්වයක නෙමෙයි. එම හැම කටයුත්තක්ම කරන්න වෙන්නේ රෙජී නීල්සන් මහත්මයාට. මේ සඳහා අපට ඔබේ උදව් අවශ්‍ය වෙනවා වැප්මන්.

නීල්සන් මහත්මයා සමග සෙව්නෝක්ස් නගරයට යන්න. සර් රේගේ අවසන් කටයුතු ඉහළින්ම පවත්වන්න හැමදෙයක්ම සූදානම් කළ යුතුයි. ඔබ පැයක් වත් නීල්සන් සමග රැඳී සිටිය යුතුමයි. මතක තියාගන්න, සර් රේමන්ඩ් තර්ස්ටන් කියන්නේ රජපවුලත් හඳුනන කෙනෙක්. කෙන්ට්හි ආදිපාදවරයාගේ මිත්‍රයෙක්.

ග්‍රෙග්සන්. ඒ අතරේ අපි ගෙදර අනෙක් සේවකයන් හැමදෙනාගෙන්ම ප්‍රශ්න කළ යුතුයි. ඔවුන්ට කියන්න තියෙන්නේ මොනවද කියන එක විස්තර සහිතව දැනගත යුතුයි. ඒ හැමදෙයක්ම අසා සටහන් කරගැනීම මං ඔබට භාරකරනවා. එය මා කරන තරමම හොඳට ඔබට කළ හැකි බව මට විශ්වාසයි, ග්‍රෙග්සන්. නීල්සන් නොමැති නිසා සාක්ෂිකරුවන්ට කියන්න අමතර විස්තර තියේවි. කූපර්ගෙනුත් තවත් මොනවා හරි දැනගන්න හැකිවෙන එකක් නෑ.

වැප්මන්. ඔබ නීල්සන් මහත්මයා සමග කරන රාජකාරිය ඉවරකළාට පස්සේ ඊළඟට මොකක්ද කරන්න බලාපොරොත්තු වෙන්නේ?"





"මං ඒ ගැන තවමත් හිතුවේ නැහැ, හෝම්ස් මහත්මයා"

"වහාම හොයා බලන්න අර කම්හලේ සේවකයන් දෙදෙනා ගැන - මෙහේට ඇවිත් ඊයේ රෑ සර් රේට තර්ජනය කළ දෙදෙනා ගැන. ඔවුන් අත්අඩංගුවට ගන්නවාද නැද්ද යන්න තීරණය කිරීම ඔබට භාරයි.

වොට්සන්, ඔබේ අවධානය තර්ස්ටන් ආර්යාව වෙත යොමුකළ යුතුයි. ඇයට ඇතිවුණු කම්පනයේ හැටියට, ඇය රෝහල් ගතකරන්න වේවිද දන්නෙත් නැහැ. කෙසේ වෙතත් එය තීරණය කිරීමට සුදුස්සා ඔබ.

ඔබ හැමදෙනාම ඒ කටයුතු වල යෙදෙන අතරේ මං ටිකක් විවේක ගන්නම්." හෝම්ස් කීය. "මගේ හිතවත් වොට්සන් දොස්තර මහත්මයා, එන්න එපා කියා නියම කළ ගමනක් මං මේ ආවේ. මගේ බෙහෙත් වේල් ගිබාන්නත් දැන් පමාවෙලාද හරි. ඔබ මට නියම කළේ බෙහෙත් කුඩු සහ බෙහෙත් වතුර දවසට තුන්වරක් කෑමට පෙර කියලා. එහෙම නේද වොට්සන්. දැන් වෙලාව දෙළහමාරයි. එකහමාරට විතර අපට දවල් කෑමට යාහැකිවේවි. ඒකට මා සමග එකතුවෙන්න කියලා, ඔබ හැම දෙනාගෙන්ම මං ඉල්ලා හිටිනවා. ඒ කටයුත්තට මෙහේ තිබෙන හොඳම අවන්හල මොකක්ද වැප්මන්?"

"විවේකීව කෑමවේලක් ගන්න අපූරු තැනක් මේ කිට්ටුව තියෙනවා හෝම්ස් මහත්මයා" වැප්මන් කීවේය. "කන්දක් මුදුනේ හොඩ නංවපු අලුත් භෝජනාගාරයක් තියෙනවා. ඒකෙ නම යුනිකෝන්"

"අන්න හරි" මගේ මිත්‍රයා එකඟ විය. "වැඩ කටයුතු ඉවර කරලා දවල් එකහමාරට විතර අපි මෙහෙන් පිටත්වෙමු. වැප්මන්. රාජකාරි නිසා ඔබ එන්න ප්‍රමාද නම්, අපි ඔබ එනතුරු බලාගෙන ඉන්නවා"

සර් රේමන්ඩ්ගේ අවසන් කටයුතු සූදානම් කිරීම සඳහා නගරයට යායුතු බවට වැප්මන් නීල්සන්ට දැනුම් දුන්නේය. තමාට පැවරී ඇති වෙනත් රාජකාරි රැසක් ගැන පවසමින් නීල්සන් කතාබහක් ඇරඹුවේය. ඊට සවන්දීමට නොරැඳී ආර්යාවගේ තත්ත්වය පරීක්ෂා කිරීමට යෑමට මම සූදානම් වූයෙමි. ඒ බව මම ගෘහසේවක කූපර්ට දන්වා සිටියෙමි.

"එහෙම ඉන්න දොස්තර මහත්මයා" කූපර් කීය. "මං ගිහින් එලිසාට සහ ඈන්ට කියන්නම්, උඩ තට්ටුවේ විසිත්ත කාමරයක් තියෙනවා. ඔවුන් එතැන් සූදානම් කරාවි"

මිනිත්තු කිහිපයකින් පහළට ආ මම හා උඩුමහලට කැඳවාගෙන ගියේය. තර්ස්ටන් ආර්යාව උඩුමහලේ විසිත්ත කාමරයේ සෝෆාවක වැතිර සිටියාය. ඇගේ තත්ත්වය සෑහෙන තරම් යහපත් අතට හැරී තිබිණි. සිතේ ඇතිවූ කම්පනය නිසා හටගත් සුදුමැලි ගතිය, ඒ වන විටත් පහව ගොස් නොතිබිණ. දින දෙක තුනක් ගතවීමෙදී ඇයට යථා තත්ත්වයට පැමිණීමට හැකිවෙන බව මම පැවසුවෙමි. නගරයේ ඖෂධශාලාවකින් ගෙන්වාගෙන පාවිච්චි කිරීමට, ඖෂධ වර්ග දෙකක් ද මම ඇයට ලියාදුන්නෙමි.

මා පහළ තට්ටුව වෙත ආයේ හෝම්ස් හා ෆෙර්ගසන් අනෙක් සේවකයන්ගෙන් තොරතුරු විමසා සටහන් කරගනු දැකීමට ය. එහෙත් පුස්තකාල කාමරයේ සිටියේ ෆෙර්ගසන් පමණි. මගේ මිත්‍රයා එහි නොසිටියේය. පුස්තකාලයට ඇතුළුවන තැනම එළියේ අසුන් දෙකක වාඩිවී සිටියේ මුළුතැන්ගෙයි සේවිකාව හා අනෙක් ගෘහ සේවිකාව බවට මම අනුමාන කළෙමි.

වැඩිදුර පරීක්ෂාවන් සඳහා හෝම්ස් නිවසෙන් එළියට බහින්නට ඇතැයි මම විශ්වාස කළෙමි. එම වෙලාවේ හිම වැටීමක් නොතිබුණත්, තිබුණේ අධික සීතල කාලගුණයකි. හෝම්ස්ට තිබුණු අසනීපයේ හැටියට, මෙවැනි දවසක එළියේ ගැවසීම අනුමත කළ හැක්කක් නොවේ. මම ඉදිරිදොරෙන් එළියට බැස ගෙළයනේ ඇවිද්දෙමි. එහෙත් මගේ මිත්‍රයා නම් දක්නට නොලැබිණි.

එඩ්මන්ටන් මැදුරේ උද්‍යානසේවකයා නම් කිසිදු කම්මැලිකමකින් තොරව සේවය කළ අයෙකු විය යුතු යයි මට සිතිණ. මල්උයන පුරා තිඹිවන් තණ පිඩලි අල්ලා හිම සකස්කොට තිබිණ. එහි විවිධ වර්ගවල ගස් රෝපණය කර තිබුණේ ලන්ඩනයේ උද්භිද උද්‍යානයක දකගන්නට ලැබෙන අයුරෙනි. සීත සෘතුව නිසා මල් පිපී තිබුණේ ඉඳහිට තැනක දෙකක පමණි. අලංකාර උයනේ සිරි නරඹමින් මම සෑහෙන වේලාවක් ඉහළ පහළ ඇවිද්දෙමි. එහි එක් කෙළවරක සවිකර තිබූ උද්‍යාන බංකුවක වාඩිවී මම මදක් ගිමන් හැරියෙමි. දහවල් එක පමණ වී තිබුණත් අව්වක් වැටෙන ලකුණක් හෝ නොවිය. ලමයිතැනැත්තෙදී උදයේ මිලට ගත් පුවත්පත, නොකියවාම කබාය සාක්කුවට දමාගත් බව මට සිහිවිය. මම එය දිගහැර කියවන්නට පටන්ගතිමි.

"වොට්සන්. ඔබේ රාජකාරි ඉක්මනින්ම ඉවර කරලා වගෙයි" ෆෙර්ගසන් සමඟ මා සිටි තැනට ආ හෝම්ස් කීය. "මං හැමතැනකම ඔබව හෙව්වා"





"ආර්යාවගේ අසනීප තත්ත්වය සොයාබලා කරල බෙහෙත් ලියන්න පැය මිනිත්තු දහයකට වැඩිය ගියේ නැහැ. ඔබත් පෙනෙන්න නොහිටි නිසා, මං මල් උයනට ආවා. හෝම්ස් ඔබ කොහේද ගියේ?"

"මළසිරුර ඉවත්කරගෙන ගියා නේ" හෝම්ස් කීය. "ඊට පස්සෙ සර් රෙජිගේ කාමරෙත්, නානකාමරෙත්, අනිත් කාමරෙත් මං සෝදිසි කළා. ඒ කටයුත්ත සෑහෙන තරම් සාර්ථකයි කියන්න පුළුවනි. කොහොමද ෆෙර්ගසන් ඔබේ සාක්ෂි විමසීම?"

"අනික් සේවක සේවිකාවන්ට කියන්න තිබුණෙත් බොහොමදුරට අපි දැනගෙන හිටිය දේවල්ම තමයි" ෆෙර්ගසන කීය. "ඒ වුණත් අපේ හෝම්ස් මහත්තයා සොයාගත්තු තොරතුරු දෙක තුනකුත් සේවක සේවිකාවන්ගෙන් මට දැනගන්න ලැබුණා. අර කම්හලේ සේවකයන් දෙන්නෙක් උපන්දින සාදය වෙලාවෙ ඇවිත් කළ කලබල ගැසීම වැඩිවුණේ නීල්සන් මහත්මයා නිසාලු. සර් රෙජිනල්ඩ් මුලින් නීල්සන්ව එතැනට යවල තියෙන්නේ ඔවුන්ට අතට මුදල් දීලා. සර් රේ කිව්වලු ඔය මුදල් දුන්නම ඒ දෙන්නා නිශ්ශබ්දව පිටව යාවි කියල. නමුත් නීල්සන එතැනට ගිහිං, මුදල් දීලත් නැහැ, ඒ මිනිසුන්ට බැණවැදිලා, ඒකෙන් තමයි ප්‍රශ්නය දිග්ගැස්සිලා තියෙන්නෙ"

"අපි ඔය කලබලයට අදාළ හැම කෙනෙකුගෙන්ම ප්‍රශ්න කළ යුතුයි" හෝම්ස් කීය. "ඔය කර්මාන්ත ශාලාව මොකක්ද? ඒක තියෙන්නෙ කොහේද?"

"ඒක විස්කෝතු සහ රසකැවිලි කර්මාන්ත ශාලාවක්" ෆෙර්ගසන් කීය. "එඩ්මන්ටන් පාරේ තියෙන්නේ. ඒ තරම් දුර නැහැ."

මදවේලාවක් ගතවෙද්දී ලෙස්ලි නීල්සන් හා පොලිස් පරීක්ෂක වැල්මන් රැගත් අශ්වකරත්තය එඩ්මන්ටන් මැදුර වෙත ළඟාවිය.

"ඒ කටයුතු ඔක්කොම හරි" නීල්සන් කීය. "එහෙම නම් මං දැන් ගෙදර ගියාට කමක් නැද්ද මහත්වරුනි?"

"තවම නැ," හෝම්ස් කීය. "ඒ වුණත් ඔබේ ලිපිනය අපට දෙන්න. මේ දවස් දෙක තුන මේ නගරයෙන් පිටවෙලා නොයන්න එපා කියල මං ඔබෙන් ඉල්ලා සිටිනවා. නියම අපරාධකාරයා හෝ අපරාධකාරියන් අල්ලා ගැනීමට, අපට ඔබේ සහාය අවශ්‍ය වෙනවා. ඔබ සෙවණෝක්ස්හි රැඳීසිටීම අත්‍යවශ්‍යයි"



www.sinhalaelibrary.com

"හෝම්ස් මහත්මයා, ඔබ එහෙම කියනවා නම්, මං ඉන්නම්" නීල්සන් පිළිතුරු දුන්නේය.

ඔවුන් පැමිණි අශ්වකරත්තයේම නැඟී නීල්සන් පිටත්වී යන අයුරු අපි බලා සිටියෙමු. ඉන්පසු අපි හතරදෙනා කුලීරියක නැඟී දහවල් ආහාරය සඳහා යුනිකෝන් තානායම වෙත ගියෙමු."

"වොට්සන්" මගේ මිත්‍රයා මා ඇමතුවේ වේටර්වරයා කෑම රැගෙන එනතුරු අප බලා සිටියදීමය. "මගේ අසනීපය ගැන හිතහිතා මේ පරීක්ෂණය කරන්න අමාරුයි වගේ. ග්‍රෙග්සන් කිව් දේ ඇත්ත. මෙක බොහොම සංකීර්ණ ගැටලුවක්. අද රෑට ලන්ඩන් නොගිහින් අපි මෙහේ නැවතුනොත් හොඳයි කියලයි මට හිතෙන්නෙ. අපි ඒකට සූදානමින් නම් ආවෙ නැහැ, එහෙම නේද?"

"ඔබේ කතාව ඇත්ත හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීය. "දෙස්තර මහත්තයා කියන්නෙ ඔබට මහන්සිවෙන්න එපා කියලද? එහෙම නම් හොඳම වැඩේ, අද රෑට මේ තානායමේ නවාතැන් ගන්න එකයි. දුම්රියෙන් ඉහළ පහළ යෑම ඔබට අමතර කරදරයක් වේවි"

මෙම යෝජනාවට එකඟවීම හැර මට වෙන විකල්පයක් නොවීය. තවත් දින කීයක් [illegible] ගතකරන්න වේද යන්න අපි දන නොසිටියෙමු. කිහිපවාරයක් දුම්රියේ එහා මෙහා ගමන් කරනවාට වඩා, මෙහි නැවතීම පහසු බව මට ද වැටහිණ. ඒ අනුව එවේලේම තානායම් පාලකවරයා සමඟ කතාබස් කොට කාමර දෙකක් වෙන්කර ගත්තෙමු.

"හොඳයි. ඒ ප්‍රශ්නයත් විසඳුණා" හෝම්ස් කීය. "දැන් මේ ගැටලුව විසඳීමට අප ගත යුත්තේ මොන වගේ ක්‍රියාමාර්ගයක්ද? මං කැමතියි ඒ ගැන අනික් අයගේ අදහස් දැනගන්න. වැජ්මන් මොකද කියන්නේ?"

"මෙක හැම අතටම පැටලුණු අවුලක් හෝම්ස් මහත්තයා" වැජ්මන් කීය. "බැලූ බැල්මට නම් සර් රේජ් මරා දමන්න කැමති හෝ උවමනාකරන අය, එච්චර ගණනක් නැහැ. කම්හලේ සේවකයන් වන ෆෙඩ් විල්සන් සහ ක්‍රිස් මේබ්‍රික් දෙන්නා ගැන තමයි මගේ හිතේ මුලින්ම සැකය ඇතිවෙන්නේ"

"කෝ ඔබ ගියේ නැද්ද ඔවුන්ව හොයන්න?"

"ඒකට වෙලාව මදිවුණා හෝම්ස් මහත්තයා" වැජ්මන් පිළිතුරු දුන්නේය. "මං බලාපොරොත්තු වෙනවා කෑම කාල ඉවරවෙලා ඒ



Reading Purpose Only, Not For Print



කටයුත්තට යන්න. අප කිසිසේත්ම නොදන්නා වෙනත් හතුරෙක් ඉන්නවාද කියලා අප දන්නේ නෑ. එහෙම කෙනෙක් නැත්නම් සර් රේජ් හිටි එකම හතුරන් මේ දෙන්නා විතරයි."

"වැජ්මන්ගේ අදහසට මාත් එකඟවෙනවා" ග්‍රෙග්සන් කීය.

"මටත් හිතෙන්නේ එහෙම තමයි" මම කීවෙමි.

"ඔය විදියේ නිශ්චිත නිගමනයකට එන්න නරක, මට නම් තවමත් පැහැදිලි සාක්ෂි මදි" හෝම්ස් කීය.

"සර් රේජ් රයිෆලයක් අරගෙන එළියට ඇවිත් විතරක් කියල ගිහාන්න අමාරුයි" ග්‍රෙග්සන් කීය. "සමහරවිට ඔහු අර දෙන්නාට මරණ තර්ජන කරන්නත් ඇති. සර් රේජ් බොහොම නිපුණ තරුණයාවන්ත පුද්ගලයෙකු නිසා සැකයක් නෑ. එහෙම අයට ලේසියට කේන්ති යන්නේ නෑ. කිසිදායි කේන්ති ගියොත්, එදා අන්තිම දරුණු වෙන්න පුළුවනි. සර් රේජ්ගේ තර්ජනයෙන් භය පත්වෙලා තමයි, සේවකයන් දෙන්නා වහාම පිටත්වෙලා යන්න ඇත්තේ. ඔවුන් දරුණු පුද්ගලයින් නම්, පළිගැනීමේ චේතනාවෙන් මොනවා හරි තීරණයකට ආවාද දන්නෙත් නැහැ"

"කොයි එකටත් වහාම ඔවුන් ගැන හොයාබලන එක හොඳයි කියල මං පිළිගන්නවා" වැජ්මන් කීයි.

"වැජ්මන්, මෙන්න මේ කරුණු ගැන අවධානය යොමුකරන්න අමතක කරන්න එපා" හෝම්ස් කීය. "මේ දෙන්නාගේ සම්පූර්ණ නම් සටහන් කරගෙන පොලිස් වාර්තා පොත් වල ඔවුන් ගැන ලියවිලා තියෙන්නේ මොනවද කියල හොයාබැලීමක් කළ යුතුමයි. මෙහේ විතරක් නොවෙයි, ස්කොට්ලන්ඩ්යාඩ් එකෙනුත්. ඊළඟට ඔවුන් ඊයේ රාත්‍රිය ගතකළේ කොහේද, ඒ කොහොමද කියන එක ගැන බලන්න"

තානායමේ සේවකයා දහවල් ආහාරය ගෙන ආවේය. කෑම ගැනීම ඇරඹුණු පසු තවත් කතාබහක් නොකෙරිණි.

"හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීවේ කෑම කා අවසන් කළ පසු ඔරලෝසුව දෙස බලමිනි. "ඔබ මේ පරීක්ෂණය භාරගත් නිසා මගේ කරමත පැටවී තිබුණු ලොකු බරක් ඉවත්වෙනවා. ඒ වුණත් මා කළ යුතු මොනවා හරි වැඩ කොටසක් ඔබ මට නියම කරනවා නම්, මං කැමතියි ඒක භාරගන්න. මෙතුන්ම වැඩක් දැනට නැත්නම් මං කැමතියි ආපහු ලන්ඩනයට ගිහිං එන්න"



Reading Purpose Only, Not For Print

දනාට නම යමට භාරදිය යුතු බඩු කොටසක් ගැන මට හිතාගන්න අමාරුයි ෆර්ගසන්." හෝම්ස් පිළිතුරු දුන්නේය. "එහෙම දෙයක් තෙතුවන්නේ පරීක්ෂණය ඉදිරියට කරගෙන යද්දී. මං විශ්වාසකරනවා තවත් දවසක් හෝ දෙකක් ගතවෙද්දී ඔබට භාරදීමට යම්කිසි කරුණක් පෙනේවි කියලා."

"ඒක මොකක්ද කියලා මං දැනගන්නේ කොහොමද හෝම්ස් මහත්මයා?"

"ඔබ මේ පැත්තෙ නොනාවොත්, මං ඊළඟ [illegible] එකට විදුලි පුවතක් එවන්නම්."

"අන්න හොඳයි" ෆර්ගසන් පිළිතුරු දුන්නේය. "එහෙම නම් 3.20 දුම්රියෙන් මං ආපහු යනවා. ඔබෙන් ලැබෙන විදුලිපුවතක මං බලාගෙන ඉන්නවා."

ෆර්ගසන් හා වැට්සන් අපෙන් සමුගෙන පිටත්ව ගියහ.

"මගේ හිසේ කැක්කුම ආයමත් නැඟීගෙන එනවා වගෙයි වොට්සන්" හෝම්ස් කීවේ නම තලල දකුණු අත්ලෙන් තදින් තෙරපමිනි. "අද ටිකක් විවේක ගැනීම තමයි මට සුදුසු. එහෙම නේද?"

"ටිකක් නෙමෙයි. ඔබ හුඟක් විවේක ගතයුතු අසනීප තත්ත්වයක" මම කීවෙමි. "ඔබ සීතල පළිමහනෙන් ඇවිද්ද අසනීපය ගැන සම්පූර්ණයෙන්ම අමතක කරලා. ඔය අසම්ප්‍රතිශ්‍යා උණට එක ප්‍රතිකාරය, මං නියම කරන්නේ, හැකිතරම් දියර පානය කරමින් හැකිතරම් විවේක ගන්න කියලයි."

"ඒ වෛද්‍ය උපදේශය මං ඉතාළින්ම පිළිගන්නවා" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේය.

තම සෙම්ප්‍රතිශ්‍යාව මට ද බෝවීමට ඉඩ ඇති නිසා, තානායමේ තනි කාමර වෙන්කරගැනීමට ඔහු කටයුතු කළේය. හෝම්ස් එයට පිවිස නිදන්නට සූදානම් වෙද්දී, මම පුවත්පත් දෙක තුනක් එකතු කරගෙන මගේ කාමරයට ගියෙමි.

ලන්ඩනයේ සිට දුම්රියෙන් පැමිණි දිගටම වෙහෙස මහන්සි වූ නිසා, පුවත්පත ගෙන ඇඳට ගියත් මට දැනුණේ තද නිදිමතකි. මං ඇහැරෙන විට සවස හයට ලංවී තිබිණ.

අවදි වූ වහාම මගේ මිතුරා ගැන සොයා බැලුවෙමි. ඔහුගේ කාමරයේ දොරට කිහිපවරක් තට්ටු කළත් පිළිතුරක් නොලැබිණ.





හෝම්ස් හවස පහට පමණ [illegible] ගිය බව තානායම් පාලකයා මට පැවසුවේය. ඒ අසා මම ඉමහත් පුදුමයට පත්වීමි. අසනීපයට බෙහෙත් ගනිමින් සිටි මගේ මිතුරා, මට ද නොදන්වා එසේ පිටව ගියේ ඇයි? මට එය විශ්වාස කිරීමට පවා අපහසු විය. හදිසියේ කුමක් හෝ වැදගත් කරුණක් හෙළිවී ඒ ගැන සොයාබලන්නට යන්නට ඇතැයි මම අවසානයේදී නිගමනය කළෙමි.

ඔහු ආපසු පැමිණෙන විට රාත්‍රී නව පමණ වී තිබිණ.

"හිම වැටෙන මේ සීතල කාලගුණයේ ඔබ එළියට ගිය එක නම් නුවණට හුරු නෑ හෝම්ස්" මම කීවෙමි.

"මං ඔබට කිවූ අර හිසකැක්කුම ඉක්මනින් සුවවුණා" ඔහු කීය. "ඒ වෙලාවෙ වැහිබර ගතියක් තිබුණෙ නෑ. ඒකයි මං ගියේ. දැන් නම් ටික ටික හිමවැටෙන්න පටන් අරගෙන."

තානායමේ සේවකයා ගෙන ආ කෝපි කෝප්පය පානය කොට පයිප්පය දල්වාගත් ඔහු කීවේය. දිගු කථාවක් ඇති බැවි මම තේරුම් ගතිමි.

"මං මුලින්ම ගියා හොට්ස්ට, සර් රේමන්ඩ්ගේ නීතිඥයා එර්විල් මහත්මයා හමුවෙන්න. ඔහු අවුරුදු 60 ක් පමණ වයසැති බොහොම කාරුණාවන්ත, ප්‍රියමනාප කෙනෙක්. ඔහු මට කිව්වා මෙහෙම දෙයක්.

සති දෙකකට පමණ කලින්, තමන්ගේ අන්තිම කැමැති පත්‍රය වෙනස් කිරීම සඳහා සර් රේ. එර්විල්ව කැඳෙව්වලු. එතකොටයි සර් රේ උපදෙස් දීලා තියෙන්නේ, ළමයින්ගේ වයස අවුරුදු තිහ එනතුරු, දේපොළ හිමි නොවෙන විදියට, අන්තිම කැමැති පත්‍රය වෙනස් කරන්න. ඊට අමතරව ඉඩම් අක්කර විසිපහක් මරජ් නීල්සන් නමටත් ලියන්න කීවාලු. තමන්ට මේ ගැන කෙළින්ම අහන්න අයිතියක් නැති නිසා එර්විල් මහතා ඒ ගැන අහල තියෙනවා.

"මං බොහොම දුප්පත්ව පාසල් යන කාලෙ නීල්සන් මට උදව් කරල තියෙනවා." සර් රේ කිව්වලු. "මුදල්, කෑමබීම හා ඇඳුම් පැළඳුම් පවා පරිත්‍යාග කරල තියෙනවා. ඉතින් මේ ණය මං ගෙවිය යුතුයි. එය සදාකාලිකව ගෙවියන්න තමයි, ඉඩම්කැල්ලක් ඔහුට තෑගි ඔප්පුවකින් පවරන්න හිතුවෙ."

මෙහෙම කියූ සර් රේගෙන් දැනගත්තු තවත් කරුණු නීතිඥයා මට කිව්වා.

"හෝම්ස් මහත්මයා, මේ දේවල් මං කිසිකෙනෙකුට හෙළිකරන දේවල් නෙමෙයි. නමුත් මගේ අනුග්‍රාහකයා මෙන්ම හිතවත් මිත්‍රයා - සර් රේ මිය ගියේ අභිරහස් විදියට, ඒ රහස හෙළිකරගන්න උවමනා නිසා මං හැමදෙයක්ම ඔබට කිවයුතුයි.

ඉස්සර කාලෙ බොහොම ලොකු ධනවතුන්ව හිටි රෙජී නීල්සන්ලා, අවුරුදු කිහිපයකට කලින් අන්ත දුගී දුප්පත් තත්ත්වයට ඇදවැටුණා. නීල්සන් සතුව තිබුණු ඉඩකඩම් හා පරම්පරාගත වලව්ව විකුණා දමන්න ඔහුට සිද්ධවුණා. සර් රේ කෝටිපතියෙක් හැටියට එංගලන්තයට ආවෙ නීල්සන්ගෙ මහා අද වෙලාවට. එහෙම නොවෙන්න නීල්සන් හිගන්නෙක් වගේ මියයන්න තිබුණා. ඔහුගේ සුරාසූදු සහ අනිකුත් නාස්තිකම නිසා තමයි නීල්සන් රටටම ණයවෙන තත්ත්වයට ඇදවැටුණේ. ඔබ දන්නවාද හෝම්ස් මහත්මයා, නීල්සන් නීතිඥයෙකු වෙන්න ඉගෙනගෙන දිවුරුම් දීලා නීතිඥ වෘත්තියට ඇතුළු කෙනෙක්. නමුත් ඔහු කළ බරපතළ වැරදි වැඩ කිහිපයක් නිසා ඔහුගේ නම, නීතිඥ ලේඛනයෙන් කපා හැරුණා. සර් රේ නීල්සන්ව ලංකරගත්තේ මේ කිසිදෙයක් නොදැන, තමන්ගේ යාළුමිත්‍රයාට උපකාර කරනවා කියන සිතිවිල්ලෙන්. නමුත් තමන් ලංකරගත් පැරණි මිත්‍රයා නරකම කුක්කුවියෙක් බව සර් රේ දැනගනිද්දී, ඔහු ප්‍රමාදවුණා වැඩියි. මං හිතන්නේ ඉවක් කැල්ලකුත් ලියාදීලා, ලේකම් තනතුරෙන් ඈත්කර දමන්නයි සර් රේ බලාපොරොත්තුවෙන් හිටියේ."

චර්චිල් නීතිඥයා එහෙම කියූපාම මම පුදුමයට පත්වුණා වොට්සන්. ඒ මොකද මේ වගේ තත්ත්වයක් අපි කොහොමටවත් දැනහිටියෙ නැහැනේ. ඊළඟට මං නීතිඥයාගෙන් විමසුවේ මගේ හිතේ ඇතිවූ තවත් සැකයක් ගැන.

"චර්චිල් මහත්මයා, මට දැනගන්න ලැබුණා සර් රේ කැනඩාවෙ ඉඳල මුලින්ම එංගලන්තයට ආ දිනවලම විවාහ වුණු බව. එම කාන්තාව දරු ප්‍රසූතියේදී මියගිය බව. දරුවා හදවඩාගැනීම බිරිඳගේ ඥාතීනට භාර දුන් බව. ඔවුන් ගැනත් යමක් කියන්න ඔබට පුළුවන්ද? ඒ කරුණු මට හුඟක් වැදගත් වෙන්න ඉඩ තියෙනවා."

"ඔව්, මං දන්න දේවල් කියන්නම්" චර්චිල් මහත්මයා කිව්වා. "තර්ස්ටන් - ඒ කාලෙ අපි ඔහුව හැඳින්නුවෙ ඒ විදියට; කැනඩාවෙ ඉඳල ආපහු එංගලන්තයට ආවෙ 1868 අවුරුද්දෙ. ඔහු විවාහවුණේ





'69 අවුරුද්දෙ. ඒක මට හොඳට මතකයි. ඒ මොකද මං නීතිඥවරයෙකු හැටියට වැඩකරන්න පටන්ගත්තෙත් ඒ අවුරුද්දෙමයි. ඔහුගේ පුතා උපන්නේ '70 අවුරුද්දේ. ඔබ කියූ විදියට ඒ දරුවාගේ උපත සිදුවී දින කීපයකින් දරුවාගේ මව මියගියා.

දරුවා හද වඩා ගැනීමට තර්ස්ටන්ට මුදල් හදල් තිබුණත්, අම්මා කෙනෙකුගේ සෙනෙහස ලබාදෙන්න ඔහුට හැකියාවක් තිබුණේ නෑ. මියගිය තර්ස්ටන් මහත්මියගේ වැඩිමල් සොයුරිය, අවුරුදු කිහිපයකට කලින් විවාහ වී සිටි කාන්තාවක්. ඇයට දරුවන් හිටියෙ නෑ. ඒ නිසා කුඩා දරුවා හදවඩා ගැනීම ඇය බොහොම කැමැත්තෙන් භාරගත්තා. ඇගේ සැමියා ඉලිංවර්ත් නම් සහකාර දුම්රිය ස්ථානාධිපතිවරයෙක්. මුලදී සර් රේ තම දරුවා හදගැනීම වෙනුවෙන් ඉලිංවර්ත්ලාට යහමින් මුදල් දුන් බව මම දැන හිටියා. පසුකාලයක ඉලිංවර්ත් දුම්රිය ස්ථානාධිපති තනතුරකට උසස්වීමක් ලබලා ඈත පළාතකට මාරුවී ගියා. මං හිතන්නේ ඒ අවුරුදු විස්සකට විසිපහකට කලින්. දැන් ඒ දරුවා තරුණයෙක් වෙන්න ඇති. ඔවුන් කොහේ ඉන්නවාද කියා මං දැනහිටියෙත් නැහැ. මෑතකදී එක එක්කෙනාගේ කටවල් වලින් කියැවුණු දූසමාන ආරංචි හැරෙන්න, ඒ ගැන මං මොනවත් දන්නෙ නැහැ. කොහොම වුණත් මුල් විවාහයේ දරුවා වෙනුවෙන්, සර් රේ දේපොළෙන් කිසිවක් නොලියූ බව නම් මං දන්නවා"

"චර්චිල් මහත්මයා, වෙනත් අයගේ කටවල් වලින් ඔබට අහන්න ලැබුණු දූසමාන ආරංචි මොනවාද? කාගෙන්ද ඒවා ඔබට අහන්න ලැබුණේ?" මං ඇහුවා.

"මේවා ඔබට කියන එක හරිද මං දන්නෙ නෑ" නීතිඥයා කිව්වා. "මේක ඇත්තද බොරුද කියලා මං දන්නෙ නෑ"

"කමක් නෑ, මට කියන්න. ඔබට ප්‍රශ්නයක් නැත්නම් ඒක කියූ කෙනා කවුද කියලත් මට කියන්න. මං ඒ හැමදෙයක්ම රහස් ලෙස ආරක්ෂා කරගන්නම්"

"හෝම්ස් මහත්මයා, මට ඔබ විශ්වාසයි" චර්චිල් කියූවේ සුසුමක් හෙළමින්. "මේක මට කියූවේ සර් රේගේ වැඩිමහල් දියණිය සිබිල් හා ඇගේ සැමියා හාවි. සර් රේගේ පළමු විවාහයේ පුත්‍රයා ලන්ඩන් නගරයේ ඉන්නවාලු. ඔහු හද වඩාගත් මව හා පියා මියගිහින්ලු. කිසි



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

උගත්කමක් හා රැකියාවක් නැති ඔහු වරින්වර ඇවිත් සර් රේගෙන් මුදල් ඉල්ලාගෙන යනවා කියා හාවි මා සමග කිව්වා. තමන්ට මුදල් දීමට සර් රේ ලෝභ වුණාට, මේ නාස්තිකාර පුතුයාට මුදල් දීමට සර් රේ කිසිම ලෝභකමක් නැහැලු. නොයෙල් ඉලිංවර්ත් නම් එම තරුණයාට, තර්ස්ටන් ආර්යාවගේ ළමයි වත් කැමැති නැති නිසා, ඔහු දවාලට එඩ්මන්ටන් මන්දිරයට එන්නේ නැහැලු. ඔහු රාත්‍රි කාලවල ඇවිත් රහසේම මුදල් අරගෙන යන බවයි සිබිල් කිව්වේ. ඔවුන් මේවා දැනගෙන තියෙන්නේ නිවසේ සේවිකාවන් වන එලිසාගෙන් සහ ඈන් ග්‍රීන්ගෙන්. සර් රේගේ එම පුතුයා පෙනුමෙන් හරියටම සර් රේ වගේලු. තමාගේ දේපොළ භාරදෙන්නට, තම නම ගෙනියන්නට පුතෙකු නොසිටීම ගැන, සර් රේ කණගාටුවෙන් සිටි බව මං දන්නවා. එම පුතුයාට නීත්‍යානුකූලව දේපොළ යමක් ලිවීමට හැකිව තිබියදීත්, එහෙම නොලිව්වේ ඇයි කියන එක ලොකු ප්‍රශ්නයක්. හෝම්ස් මහත්මයා මං ඔබට කලින් වරක් කිව යුතුයි, මේ මට හාවි යුවළගෙන් අහන්න ලැබුණු තොරතුරු. ඒවා කොයිතරම් දුරට ඇත්තද කියල මං දන්නෙ නෑ."

නීතිඥ වර්විල් මහත්මයාට "කියන්න තිබුණේ එපමණයි වොට්සන්. මං ඔහුට ස්තුති කරලා අනතුරුව පිටත්වුණා. මීළඟට මං ගියේ පොතේලිඩ හා සිබිල් හාවි දැඩි "සිටාඩෙල්" නම් නිවසට. මෙන තියෙන්නේ සර් රේගේ එඩ්මන්ටන් මන්දිරයට නැතැක්ම කාලතරයක් අඩු දුරක. [illegible]

මං යද්දි ඒ ගෙදර හිටියේ සේවකයෙක් පමණයි. හාවි මහත්මිය ලන්ඩන් නගරයෙන් ආපහු ඇවිත් නැහැ. හාවි මහත්මයා ඇය බලාපොරොත්තුවෙන් දුම්රියපොළට ගිහින්. නිවසේ කොටසක් පාලු දමා වසා ඇති බව සේවකයා කිව්වා. ඒ නිවස පරීක්ෂා කර බලන්න මට උවමනාවක් තිබුණත් ඒ වැඩේ හරිගියේ නැහැ. ඉතින් මං ආපහු ආවා."

"ඔබ ඒ නිවස පරීක්ෂා කර බලන්න යළිත් වරක් හෙට යන්න බලාපොරොත්තු වෙනවද?"

"ඇත්තෙන්ම ඔව් වොට්සන්. මං ඊතට හෙට උදේ යා යුතුයි. මං ඒ බව ගෙදර සේවකයාට කියලා ආවා. ඔවුන්ගේ නාම්පුතා එහි යද්දී සිටීම අනවශ්‍ය බව මං කිව්වා."





"ඔහු එහෙම නොඅඳ මඟ ඇරලා ගියොත්?" මම ඇසීමි.

"එහෙම ගියොත් ඒකෙන් තේරෙන්නෙ, ඔහුට හංගන්න මොනවා හරි තියෙනවා කියන එක නේ" හෝම්ස් කීය. "එහෙම වුණොත් නිවස සෝදිසි කරන්න වරෙන්තුවක්, මහේස්ත්‍රාත්වරයෙකු මගින් අපි වහාම ලබාගන්නවා. ඊට පස්සෙ අපේ කටයුත්ත පහසුයි"

පසුවදා උදේ කුලීරියක නැඟී අපි "සිටාඩෙල්" නිවස වෙත පිටත්වී ගියෙමු. එඩ්මන්ටන් මන්දිරයේ සිට සැතපුමක පමණ මෑතට වැටී තිබූ පාර ගල් දමා සකස් නොකළ ගුරු පාරක් විය. එම පාරේ කෙළවර සිටාඩෙල් නිවස පිහිටා තිබිණි.

කළු ගල් වලින් තැනූ තට්ටු දෙකක් ගස්තිමක් මැදුරක් වූ එය සැහෙන තරම් අලුත් දෙයක් විය. අශ්වකරත්ත තුනහතරක් නැවැත්වීමට වුවත් මිදුලේ ඉඩකඩ තිබිණ. ස්වාභාවිකව වැවී තිබූ විශාල ගස් ඉතිරිකොට, නිවස ඉදිකර තිබූ බැව් දක්නට ලැබිණ. අවුරුදු හතලිහක් පනහක් වැරණි යෝධ ඕක් ගස් දෙකක්, [illegible] ගසක්, හෝස් චෙස්ට්නට් ගසක්. නිවස වටේට මිදුල සෙවණ කළේය. ඒවායේ අතු නිවසේ වහල දක්වාම විහිදී තිබිණ. උඩුමහලේ සඳළුතලයකට වී සිගරට්ටුවක් බොමින් සිටි පුද්ගලයෙකු අපි ඇතදීම දුටුවෙමු.

"මේ ෂර්ලොක් හෝම්ස් මහත්තයා වෙන්න ඇති?" ඔහු ඇසුවේ අප අශ්වකරත්තයෙන් බිමට බසිද්දීම ය. ඔහු බැහැරක යාමට මෙන් හොඳින් හැඳ පැළඳ සිටියේය. "ඔබ ඊයෙ ඇවිත් ගිය බව මට අහන්න ලැබුණා. මං ගෙදර නොහිටියට මට සමාවෙන්න. මං දුම්රියපොළට ගියා. ඒ මොකද මං හිතාගෙන හිටියේ මගේ බිරිඳ ඊයෙ හවස පහමාරෙ දුම්රියේ ලන්ඩන් ඉඳල එයි කියලයි. නමුත් ඇය ආවෙ නැහැ"

"ඔබ ඇයට මරණය ගැන දන්වලා යැව්වෙ විදුලිපුවතකින්ද?" හෝම්ස් විමසුවේ ඔහු අපට අතට අතදීමට සූදානම් වෙද්දීය.

"ඇය ලන්ඩන් ගියේ ඇගේ පාසල් මිතුරියක සමග" තරුණයා කීය. "ඔවුන් ගිහිං නවතින්නේ ඔවුන්ගේ තවත් මිතුරියකගේ ගෙදර, ඒ බ්‍රිස්ටන් වල. මරණය ගැන ආරංචි වුණු වහාම මං විදුලිපුවතක් යැව්වා. ඒක නොලැබුණා කියමු. ඊයේ හවස පත්තර හැම එකකම පුල්පිටුවේ මාමාගේ හදිසි මරණය ගැන සඳහන්වෙලා තිබුණා. මේ මහත්මයා කවුද?"

තරුණයා හෝම්ස්ගෙන් ඇසුවේ මා දෙසට අතදිගු කරමිනි.

"මේ දෙස්තර වොට්සන්. මගේ හිතවත් මිත්‍රයෙක්. අපරාධ පරීක්ෂණ වලදී මට උදව් වෙන්නේ ඔහු තමයි"

"හඳුනාගන්න ලැබීම ගැන සන්තෝෂයි" කී තරුණයා අප දෙදෙනා නිවස තුළට කැඳවාගෙන ගියේය. ඉන්පසු අපට සංග්‍රහ කිරීමට බීම ගෙන එන මෙන් සේවකයාට නියම කළේය.

"හෝම්ස් මහත්මයා" ඩොනල්ඩ් හාවි කීය. "මාමාගේ මරණය ගැන දැනුම්දෙන්න පොලිස් පරීක්ෂක චැප්මන් ඊයේ උදේ පාන්දරම මෙහේ ආවා. ඔහු එනකොටත් මං හොඳටම නිදි"

"ආ ඔව්" හෝම්ස් කීය. "ඒ ගැන ඔක්කොම විස්තර චැප්මන් මා එක්ක කිව්වා. සාමාන්‍යයෙන් මිනීමැරුමක් වුණාම අපට සෝදිසි කරන්න වෙන නිවාස ගණන අප්‍රමාණයි. ප්‍රශ්න කරන්න වෙන පුද්ගලයන් ගණන අප්‍රමාණයි. මං මේ නිවස සෝදිසි කළාට ඔබේ විරුද්ධත්වයක් නැතුව ඇති මං හිතන්නේ......"

"කිසිම විරුද්ධත්වයක් නෑ මහත්මයා" හාවි කීය. "ඔබට ඕනෑම තැනක්, ඕනෑම ප්‍රමාණයක් සෝදිසි කරන්න. එකම ප්‍රශ්නය ඔබට උදව්වෙන්න මට පුළුවන්කමක් නැති එක. තවත් පැයක් දුම්රියපොළට යන්න කියලයි මං මේ කල්තියා කළේ. මගේ බිරිඳ අද උදේ දුම්රියේ එන්න බොහොම දුරට ඉඩ තියෙනවා."

"ඔබ ගියාට කමක් නෑ මහත්මයා" හෝම්ස් කීය. "ඔබේ සේවකයා ඉන්නවා නේ"

මද වේලාවකින් ඩොනල්ඩ් හාවි තම අශ්වයා පිටේ නැගී පිටත්ව යන සැටි අපි බලාසිටියෙමු.

"මිනිහා ගිය එක අපට ලොකු පහසුවක් වොට්සන්" හෝම්ස් මගේ කනට කෙඳිරුවේ සිනාමුසු මුහුණෙනි. "දැන් ඉතින් කරන සෝදිසියක් නිදහසේ කළ හැකියි"

හෝම්ස්ගේ ඒ ප්‍රකාශය වැරදී යාමට මිනිත්තු දහයක් වත් ගත නොවීය. අශ්වයකු පිටේ නැගී කිසිවෙකු නිවස වෙත පැමිණෙන හඬ අපට ඇසිණ. අපි පරීක්ෂණය නවත්වා මිදුලට බැස්සෙමු. ඒ පැමිණියේ හාවි නොව මිටි කෙසග තරුණයෙකු බැව් දක්නට ලැබිණ.

"ඒ ආවේ ජයිල්ස් මහත්මයා" සේවක ක්‍රෝෆර්ඩ් කීය. ඔහු නිවස වෙත පිවිසෙද්දී අපට හඳුන්වා දෙන ලදී.





"මං මෙහේට එන්න කියලා ඇඳගෙන එද්දී දුම්රියපොළට යන ඩොනල්ඩ් හමුවුණා. ඉතින් ඔහු මට අශ්වයා දීල කුලීරියක ගියා. නවයයි පහේ දුම්රියෙන් සිබිල් එයි කියලයි ඔහු හිතන්නේ. ඉතින් මහත්වරුනි මොනවද මගෙන් කෙරෙන්න ඕනෑ?"

"ඔබ මේ ගෙදරදීම හමුවුණු එක බොහොම හොඳයි ජයිල්ස් මහත්මයා" හෝම්ස් කීය. "සර් ජේම්ස්ගේ මරණය ලොකු අභිරහසක් බව ඔබ පුවත්පත්වලත් දකින්න ඇති. මේ ගැන සම්පූර්ණ සැකය යොමුවෙලා තියෙන්නේ අර මෙබ්‍රික් හා විල්සන් දෙන්නාට. නමුත් සිරිතක් වශයෙන් මියගිය පුද්ගලයාගේ ළඟම ඥාතීන් හා හිතවතුන්ගෙන් අප සාක්ෂි සටහන් කරගත යුතුයි. මං කටයුතු කරන්නේ ස්කොට්ලන්ත් යාඩ් පොලිසිය වෙනුවෙන්. කොහේ හරි තැනක් සෝදිසි නොකර අපි අත්හැරියොත්, පුවත්පත් වලින් අපට විරුද්ධව දෙස් නගන්න පටන්ගන්නවා; අතන සෝදිසි කළාද? මෙතැන සෝදිසි කළාද ආදී වශයෙන්. ඒකයි මේ සෝදිසිය. ඉතින් අපට ඔබේ උදව් උපකාර අවශ්‍යවෙනවා. මට මුලින්ම පෙන්වන්න ඩොනල්ඩ් හාවි මහත්මයාගේ නිදන කාමරය. ඔබ අගුළු දමා යතුරු දමා තැබුවා කිව්වේ......"

ජයිල්ස් අප උඩුමහලට කැඳවාගෙන ගියේය. තරප්පු පෙළ අවසන්වුණු තැනම පිහිටි එම කාමරය, යතුරු දමා වසා තිබිණි. එහෙත් එකට ඇමිණූ යතුරු දෙකක්, යතුරු කටේ තිබිණ. ජයිල්ස් එය කරකවා දොර විවෘත කළේය.

"මොහොතක් ඉන්න" කී හෝම්ස් එම යතුර ඉවතට ගෙන, ඒ සමග වූ අනෙක් යතුර දමා කරකවා බැලීය. එයින් ද අගුළ ක්‍රියාත්මක වූ බව අපි දුටුවෙමු.

"මේ යතුරු දෙකම, මේ දොරේ අගුළු-තහඩුවට ආව යතුරු" ජයිල්ස් කීය. "එකක් වෙන්කරලා තියන්න මොයාල උනන්දුවෙලා නෑ. නැතිවුණොත් දෙකම එකවර නැතිවෙයි"

"ඔව්. ඒක හැබෑව" කී හෝම්ස් තම කබා සාක්කුවෙන් කාචය ගෙන, දොර අසල දණ ගසාගෙන යතුරු තහඩුව පරීක්ෂා කළේය. එයට මිනිත්තු දෙකක් පමණ ගත කළ ඔහු එතැනින් නැගී සිටියේ, "දැන් අපි යමු කාමරය ඇතුළට" කියමිනි.

එය සෑහෙන තරම් විශාල කාමරයක් විය. එහි එක් කෙළවරක ඇඳන් යුගලක් හා මේසයක් විය. කාමරයේ අනෙක් කෙළවරේ



www.sinhalaelibrary.com

ඇඳුම් අල්මාරියක්, ඇඳුම් දමන රාක්ක හා කැබිනෙට්ටුවක් විය. කාමරයට ආලෝකය ලැබුණේ විශාල ජනේල දෙකකිනි. හෝම්ස් එක් ජනේලයක පියන් දෙකම විවෘත කළේය. මේවා පියන් එළියට තල්ලු කරන වර්ගයේ ඒවා මිස ඉහළට ඔසවන වර්ගයේ ජනේල නොවීය. කාමරය තුළට හොඳින් ඉරඑළිය වැටිණි. නිතර විවෘත කරන ජනේලය එය බැව් අපට සිතාගැනීමට අපහසු වූයේ නැත. ලී රාමුවට ආලේප කළ තීන්ත කැපීගොස් තිබූ අතර ජනෙල් පඩිය අපවිත්‍ර වී තිබිණ. මීළඟට හෝම්ස්ගේ අවධානය යොමුවූයේ අනෙක් ජනේලය වෙතයි. එහි පියන් ඇරීමට උත්සාහ කළත් එය තරමක් අපහසු වූ බැව් පෙනිණ.

"ඔය ජනේලය එච්චර අරින එකක් නෙමෙයි." ජයිල්ස් කීය. "අර ඕක් ගහේ අතුයි හෝප් ලවුස්ටනට් ගහේ අතුයි නිසා ඔතැන ටිකක් අවහිරයි"

එය සත්‍යයක් බැව් අපට පෙනිණ. කෙසේ වෙතත් අගුළු මුරුල් කළ හෝම්ස්, තරමක අපහසුවකින් එක් අඩියක් බාගයක් දුර විවෘත කළේය. එතැනින් එහාට ජනේල පියන තල්ලු කිරීම අපහසු වන සේ ඕක් අත්තක් පිහිටා තිබූ බැව් අපි දුටුවෙමු. ඔහු ජනේලය වසා දැම්මේය.

මීළඟට හෝම්ස්ගේ අවධානය යොමු වූයේ රාක්ක මත වූ මත්පැන් බෝතල් තුන වෙතය. ඒවා වොඩ්කා නම් රුසියානු මත්පැන් වර්ගය බැව් ලේබලය දුටු මම තේරුම් ගතිමි. එය විස්කි වලටත් වඩා ප්‍රබල මත්පැන් වර්ගයක් බැව් මා අසා තිබිණ.

"ඩොනල්ඩ් තාවි මහත්මයා බොන්නේ වොඩ්කා වගෙයි" හෝම්ස් කීවේ අඩක් හිස්ව තිබූ බෝතලය අතට ගනිමිනි. එහි අඩංගු මද්‍යසාරය ද වතුර මෙන් අවර්ණ එකක් විය.

"ඔව්. එයාගෙ බීම ඒක." ජයිල්ස් කීය. "අපි කවුරුවත් වොඩ්කා වලට කැමැති නෑ. ඊයෙ රෑ ඔහු කාමරයට ඇදගෙන එද්දී අතේ තිබුණෙ ඔය බෝතලේ මං හිතන්නෙ"

"වොඩ්කා බොහොම සැර බීමක් කියල මං අහල තියෙනවා." හෝම්ස් කීවේ අඩක් හිස්ව තිබූ බෝතලය අතට ගනිමිනි. "ඒත් කවදාවත් මං ඒකෙ රස බලල නෑ. ඒකෙ තියෙන්නෙ ලෙමන් සුවඳක්ද?"

එසේ විමසූ මගේ මිතුරා බෝතලය විවෘත කර එය නාසයට ළංකර බැලුවේය. ඔහුගේ නළල රැළි වැටී, දෙබැම ඉහළට එසවුණේ





මත්පැනේ වාෂ්පය ප්‍රබල එකක් බව පෙන්වමිනි. අසල තිබූ වීදුරුවක් අතට ගත් ඔහු බෝතලයෙන් ඉතා ස්වල්පයක් වත්කර රස බැලුවේය.

"මේක හරි සැරයිනේ" හෝම්ස් කීය. "මේව හොඳ රුසියානුවන්ටම මිස අපට නොවෙයි" මීළඟට ඔහු එතැන තිබූ තවත් වොඩ්කා බෝතලයක් අතට ගත්තේය. එය තුන්කාලකටත් වඩා හිස්වී ඉතිරිව තිබුණේ මත්පැන් ඉතා ස්වල්පයක් පමණි. එය ද විවෘත කොට ස්වල්පයක් වීදුරුවට දමා රස බැලුවේය. තුන්වැනි බෝතලය අතට ගත්තත් එය මුද්‍රාව නොකැඩූ අලුත්ම බෝතලයක් බව දුටු ආපසු තැබීය. ජයිල්ස් මේ සියල්ල බලා සිටියේ අප්‍රසාදය පළකරන මුහුණකිනි.

"අපි කවුරුවත් වොඩ්කා බොන්නෙ නෑ" ජයිල්ස් කීය. "පෙරේද රණ්ඩුවක් ඇතිවුණෙත් ඕක නිසා. ඇවිත් හිටි දෙන්නයි මමයි බොන්නෙ විස්කි පමණයි. ගෙනැත් තිබුණු විස්කි ටික ඉක්මනට ඉවරවුණා. ඒ දෙන්නටත් මටත් වොඩ්කා බොන්න කියලා ඩොනල්ඩ් තදින්ම කිව්වා. මං දන්නවානෙ ඔහුගේ පිළිවෙළ. මං කිව්වා මං ඒවා කොහෙත්මටවත් බොන්නෙ නැහැ කියලා. ඊළඟට ඔහු එඩ්වඩ්ටත් බලෙන් පොවන්න උත්සාහ කළා. ඒකට එඩ්වඩ්ගේ බිරිඳ පැමෙලාට හරියට තේන්ති ගියා. එහෙදටම බලා හිටි ඩොනල්ඩ්, වොඩ්කා බෝතලයක් ඉහළට ඔසවාගෙන, අපි හැමෝටම බැණවදින්න පටන්ගත්තා. මල්වාස් එකට පයින් පාරක් දීලා ඔහු ඒක බිඳ දැම්මා. මං හිතුවා ඊළඟට අතේ තිබුණු බෝතලෙන් එඩ්වඩ්ගේ ඔලුවට ගහවී කියලා. ඒ නිසයි මං ඩොනල්ඩ්ව ඇදගෙන ගිහිං කාමරයට දමල යතුරු දැම්මේ. සාදය එතැනින්ම අවසන් වුණා. මගේ පෙම්වතිය හැර අනෙක් අමුත්තන් යන්න ගියා. ඊට පැය භාගයකට විතර පස්සේ මං ගිහින් ඔහුගේ කාමරයේ දොර ඇරල බැලුවා. එතකොට ඔහු නිදි"

"එතකොට වෙලාව කීයද?"

"මං හිතන්නේ දොළහමාරට කිට්ටු ඇති" ජයිල්ස් කීය. "ක්ලෙයා ගෙදරට ඇරලන්න මං ගියේ ඊට ටිකකට පස්සෙ. ආපහු ගෙදර ආවට පස්සේ ඔහු ගැන සොයිසි නොකර මං කෙළින්ම නිදාගන්න ගියා"

ජයිල්ස්ට කීමට තිබූ දේ අවසන් වූ පසු, හෝම්ස් "සිටාඩෙල්" නිවසෙන් පිටත පරීක්ෂා කිරීමට පටන්ගත්තේය. එවේලේ පැවැති



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

අධික ශීතල නිසාදෝ ඔහු පයිප්පය දල්වාගෙන තම කටයුතු වල යෙදෙන අයුරු දක්නට ලැබිණ. ඔහුගේ බෙහෙත් වේල් නියම වෙලාවට බීම ද හෝම්ස්ට අතපසු වෙමින් තිබිණ. මේ අයුරින් ශීතලට නිරාවරණය වීමෙන් ඔහුගේ සෙම්ප්‍රතිශ්‍යාව නියුමෝනියා රෝගයට හැරේවි යයි මගේ සිතේ බියක් ඇති විය.

"ජයිල්ස් මහත්මයා" හෝම්ස් කීවේ ශලික් ගෙට ඇතුළුවෙමිනි. "මං කැමතියි අර හාවි බින්දු කිව මල්වාස් එකේ කැබලි පරීක්ෂා කරන්න. ඒ ගැන ඔබේ විරුද්ධත්වයක් නැහැ නේද?"

"කිසිම විරුද්ධත්වයක් නෑ

වීදුරු කැබලි බිඳී තිබූ තැන හෝම්ස් දණගසා ගැනීමට සූදානම් වූයේ එහි වූ කුසා චිමටා ඉවතට තල්ලුකරමිනි. එසේ කරද්දී හෝම්ස්ගේ කබාය ටීපෝවක කෙළවර පැටළුණු බවක් දක්නට ලැබිණි. බොත්තමත් සමග කබා කෙළවර ටීපෝවේ ලෑල්ල ගැළවී තිබූ තැනක හිරවිණි.

"කරුණාකරලා, මට කතුරක් ගෙනැත් දෙන්න පුළුවන්ද ක්‍රෝෆර්ඩ්?" හෝම්ස් ඉල්ලා සිටියේ ගෘහසේවකයාගෙනි. "බොත්තමත් එක්ක කබායේ රෙද්ද ටිකක් කපන්න වෙනවා. නැත්නම් මේක දිගටම ඉරී යාවි"

සේවක ක්‍රෝෆර්ඩ් නිවස තුළට දිවගොස් රෙදි කපන කතුරක් ගෙන ආවේය. එහි ආධාරයෙන් කබායේ බොත්තමත් හා රෙද්දෙන් කොටසක් කැපූ මිතුරා කබාය නිදහස් කරගෙන බිම දණගසා ගෙන පරීක්ෂාව ඇරඹීමට සූදානම් විය.

"කෝ වොට්සන් මගේ කාවය? ඔබ ඒක අරගත්ත නේද?" මගේ මිතුරා විමසුවේය.

"එමෙ කාවය?" මම ඇසීමි. "මං නම් ගත්තෙ නෑ"

"එහෙමද? එහෙනම් මට ඒක උඩ තට්ටුවේ අමතක වෙන්න ඇති" හෝම්ස් කීය. "මම අසනීපගතිය නිසා දූන් මගේ සිහිකල්පනාවත් අඩුයි. මං උඩට ගිහින් කාවය හොයාගෙන එන්නම්"

එසේ කී හෝම්ස් තරප්පු පෙළේ උඩට නැඟුණේය. ඒ අතරේ මම ජයිල්ස් සමග කතාබහ කළෙමි. එංගලන්තයේ ප්‍රාන්තයක් වෙනුවෙන් පාපන්දු ක්‍රීඩාකළ කණ්ඩායමක ඡායාරූපයක් බිත්තියේ එල්ලා තිබිණි. මම ඒ පිළිබඳව ඔහුගෙන් විමසුවෙමි. ඒ කලකට





පෙර ඩොනල්ඩ් හාවි, මැංචෙස්ටර් යුනයිටඩ් පිල වෙනුවෙන් ක්‍රීඩා කරද්දී ගත් ඡායාරූපයක් බැව් ජයිල්ස් පැවසුවේය.

තම කාවය සොයාගෙන පහළට ඒමට මගේ මිතුරාට මිනිත්තු දහයක් වත් ගතවන්නට ඇත.

"මගේ කාවය දැම්මෙ කොහේද කියලා මට හොයාගන්න හරි අමාරු වුණා" හෝම්ස් කීය. "අන්තිමේදී ඒක තිබුණේ අර ජනේල පඩියක් උඩ"

මිනිත්තුවක් පමණ බිඳී ගිය වීදුරු කැබලි පරීක්ෂා කළ හෝම්ස් තම කටයුතු අවසන් කළේය.

අන්තිමේදී ජයිල්ස්ගෙන් සමුගෙන අපි "සිටාඩෙල්" නිවසෙන් පිටත් වී ආවෙමු.

"ජයිල්ස්ගේ කට උත්තරය ගැන ඔයාට මොනවද වොට්සන් හිතුණෙ?" මගේ මිතුරා විමසුවේ අපි ලග්වකාරන්තයෙන් ආපසු එන අතරය.

"මට නම් හිතුණෙ ඔහු කිව්වෙ ඇත්ත කියලා" මම කීවෙමි.

"ඊයේ මේ ගෙදර සේවකයා ක්‍රෝෆර්ඩ් මා එක්ක කියූ විස්තර එක්ක නම් ජයිල්ස්ගේ කට උත්තරය ගැලපෙනවා." හෝම්ස් කීය.

"කල් ඇතුවම දෙන්නා තුන්දෙනා එකතුවෙලා කතාවක් සැලසුම් කර නොගත්තා නම්"

"හෝම්ස්, ඔබ මොනවද ඊළඟට කරන්න බලාපොරොත්තු වෙන්නෙ?" මම ඇසීමි.

"ප්‍රශ්න කළ යුතු අය නම් කිහිප දෙනෙක්ම ඉන්නවා" හෝම්ස් කීය. "සොයිසි කළ යුතු තැන් කිහිපයක්ම තියෙනවා. අපට කාලවේලා මදිකමයි ප්‍රශ්නය වෙලා තියෙන්නේ. නමුත් මම වැඩිය කැමැතියි ඉස්සරවෙලාම, අර එඩ්වඩ් බ්‍රවුන්ස්ගෙන් ප්‍රශ්න කරලා හිටින්න. ඔවුන් නේද හාවි එක්ක සණ්ඩුවකට පැටළුණා කිව්වෙ?"

"ඔව්. ඒත් ඔවුන්ගේ ලිපිනය?"

"ඒක මා ළඟ තියෙනවා" හෝම්ස් කීවේ තම සටහන් පොත දිගහරිමිනි. "මේ තියෙන්නෙ එඩ්වඩ් බ්‍රවුන්ස්, අංක 12 ස්කිනර් පාර, කෙන්ටිෂ් ටවුන්"

කුලීරියක නැගී අපි එම ස්ථානය බලා ගමන් ගත්තෙමු. එය කුඩා තානිතට්ටුවේ නිවසක් විය.

"එඩ්වඩ් රස්සාවට ගිහින්" අප කළ විමසීමට පිළිතුරු දුන්නේ ගේට්ටුව ළඟට වී අසල්වැසියකු සමග කතාබස් කරමින් සිටි තරබාරු කාන්තාවකි. "ඔබ කවුද? මොනවද දැනගන්න උවමනා?"

"මම සර් රේමන්ඩ්ගේ මරණය ගැන පරීක්ෂණ පවත්වන රහස් පරීක්ෂකයෙක්" හෝම්ස් කියද්දී මම පුදුමයට පත්වීමි. රහස් පරීක්ෂණ වලදී තමන්ගේ වෘත්තිය හෙළිකිරීම ඔහුගේ සාමාන්‍ය සිරිත නොවේ. "ජූලි 7 වැනිදා ඒ ඩොනල්ඩ් හාවිගේ නිවසේ තිබුණු උත්සවයකට ඔබ හා බුවුන්ස් මහත්මයා සහභාගිවුණු බව අපට දැනගන්න ලැබුණා. ඒ ගැන කරුණු කිහිපයක් දැනගන්න මට උවමනායි. බුවුන්ස් මහත්මයා ඉඟුදර ආවට පස්සේ මං එන්නද?"

"ඔබට දැනගන්න උවමනා ඩොනල්ඩ්ගේ උත්සවය ගැනද?" ඇය විමසුවාය. "ඒක ගැන නම් මටත් කියන්න පුළුවනි. ගේ ඇතුළට ඇවිත් වාඩිවෙන්න. මේරි! ඔය දෙර ඇරල මේ මහත්වරු විසිත්ත කාමරයට එක්ක යන්න" ඇය සේවිකාවකට කෑගැසුවාය.

අප විසිත්ත කාමරයේ අසුන්ගෙන මිනිත්තු කිහිපයක් ගතවෙද්දී, බුවුන්ස් මහත්මිය හැඳපැළඳගෙන අප හමුවට ආවාය. රතු පැහැති මුහුණක් හා මිටි තරබාරු සිරුරක් තිබූ ඇය, ඕනෑම පිරිමියෙකු සමග වුවත් සණ්ඩුවට සූදානම් කටකුරු ගැහැණියක යයි මට සිතිණි. මෙවැනි අය සමග කතාබහ කිරීම රහස් පරීක්ෂකයානට ඉතාම ප්‍රයෝජනවත් බව හෝම්ස් නොයෙක් විට මං සමග කියා ඇත.

"අපි මේ ගමේ මිනිස්සු?" ඇය කීවාය. "මං සිබිල්ව අඳුනන්නෙ සෑහෙන කාලයක ඉඳල. ඇය ගෙදර හැතිවේලාවෙ ඇගේ ගෙදර සාදයකට යන්න මං කැමැති වුණෙත් නැහැ. අපට එන්න කියල ඩොනල්ඩ් සහ ජයිල්ස් වද කළා. ඒක පටන්ගනිද්දි මොකුත් ප්‍රශ්නයක් තිබුණෙ නැහැ. ටික වෙලාවක් යද්දි විස්කි බෝතල් හිස්වුණා. ඒ වෙනුවට වොඩිකා බොන්න කියල අර මිනිහා එඩ්වඩ්ට කරදර කළා.

"කවුද එහෙම කළේ?"

"වෙන කවුද ඩොනල්ඩ් මිස?" ඇය ඇසුවාය. "එයා රැකියාවක් කරන්නෙ නැති නිසා එයාට ප්‍රශ්නයක් නෑ. නමුත් මගේ මහත්තයා දුම්රියපොළේ රැකියාවක් කරනවා. සීමාවක් නැතුව බිව්වොත් ඔහුට සෙනසුරාදට රැකියාවට යන්න බැරිවෙනවා. ඒ නිසා මහත්තයා එපා කියද්දි ඩොනල්ඩ් වද කළා."

"ඒ එයා අතේ තිබුණු බෝතලයෙන්ම බොන්න කියලද?" හෝම්ස් විමසුවේය.

"නැහැ නැහැ" ඇය කීවාය. "එයා අතේ තිබුණු බෝතලයෙන් ඩොනල්ඩ්, වෙන කාටවත් වොඩිකා දුන්නෙ නැහැ. කොච්චරවත්





ඒ බෝතලය කටේ ගහ ගහ ඔහු එකෙනුත්මයි බිව්වෙ. අනෙක් අයට බොන්න කිව්වෙ සාලෙ තිබුණු අලුත්ම බෝතලයකින්. මං හිතන්නෙ ඒකෙ මුද්‍රා කඩල තිබුණෙත් නැහැ. ඊළඟට එයා ගෙන්තියෙන් මල්වාස් එකකුත් බින්ද, ඒක හැටි හොඳ නැති හින්ද අපි තීරණය කළා, කැමටත් නොඉඳ ගෙදර එන්න. එතකොට තමයි ජයිල්ස් අපට ඉන්න කියලා, ඩොනල්ඩ්ව බලෙන් වගේ උඩ තට්ටුවට ඇදගෙන ගිහින්, කාමරයකට දමලා වහලා යතුරු දලා ආවේ."

"එහෙම කළාට පස්සෙත් ඔහු කලබල කළාද?" හෝම්ස් ඇසීය.

"ඔව්. මිනිත්තු කිහිපයක් ඔහු කෑගැහුවා දොරට ගහමින්" ඇය කීවාය.

"බුවුන්ස් මහත්මිය, මට මේ කාරණා කිහිපයත් කියන්න" හෝම්ස් කීය. "ඔය සාදය හොඳින් සංවිධානය කරල තිබුණද? මොනවද තිබුණු මත්පැන් වර්ග. එක් එක් අය බිව් මත්පැන් මොනවාද කියා ඔබට මතකද?"

"ඒක හරි පිළිවෙළකට සංවිධානය කරල තිබුණෙ නෑ" ඇය කීවාය. "ගෙදර ඉන්න ගැහැනිය ගමනක් ගිය වෙලාවෙ, පවත්වන උත්සව මොනවද මහත්මයා? සේවිකාවට මීන පිළිවෙළට කෑම මොනවා හරි උයල තිබුණා. පිරිමින් තුන්දෙනෙකුටම බොන්න තිබුණේ කුඩා ප්‍රමාණයේ විස්කි බෝතලයක් විතරයි. එයාලා බීමට නොගන්නා වොඩිකා බෝතලයක් නම් තිබුණා. කාන්තාවන් තුන්දෙනාට වයින් බෝතලයක් තිබුණා. සිමන්ස්ගේ බිරිඳ ඇන්, ත්‍රලයා සහ මම වයින් බිව්වා. එඩ්වඩ්, සිමන්ස් හා ජයිල්ස් විස්කි බිව්වා. ඩොනල්ඩ් වොඩිකා බිව්වා."

"ඔබට බොහොම ස්තුතියි බුවුන්ස් මහත්මිය" කී හෝම්ස් අසුනෙන් නැගිට්ටේය. "තවත් තොරතුරු දැනගන්න උවමනා වුණොත් අපි යළිත් එන්නම්"

අපි ඇයගෙන් සමුගෙන යුනිකෝන් තානායම වෙත ආපසු පැමිණියෙමු.

"මගේ මේ සෞම්‍යප්‍රතිගතා අමාරුවේ හොඳවීමක් නැහැ නේ වොට්සන්" හෝම්ස් කීවේ තානායමේදී කෑම ගැනීමට සූදානම් වන අතරේය. "මගේ හිසේ කුළක්කුමින් උණගතියත් ආයෙමත් හැදීගෙන එනවා වගෙයි"



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

"ඒකෙ නම් පුදුමයක් නෑ මිත්‍රයා" මම කීවෙමි. "ඔබ නියමිත ඖෂධ නියම වෙලාවලට ගන්නෙත් නැහැ. ඔබේ සෙම් අමාරුවට ඉතාම අගුණ, සීතල හුළඟට, හිම වැටීමට ඔබ නිරාවරණය වුණා. මේ පරීක්ෂණයට සහභාගි නොවී විවේක ගමු කියලා, මං කොයිතරමක් කීවාද? ඔබ ඒවා ගණන් ගත්තෙත් නෑ. ඔය අසනීපයට උවමනා කරන්නේ ඖෂධ, විවේකය සහ වැඩිපුර දියර පානය. ඔබ ඒ තුනම අමතක කරලා. ඉතින් අසනීපය වැඩිවීම පුදුමයක් නැහැ"

"වොට්සන්, නිසි පිළිවෙළට නොමැති වුණත් මං ඖෂධ නම් වරින් වර ගත්තා" හෝම්ස් කීය. "ඔබ ඔය තරමටම කියන නිසා මං හිතුවා අර දියර පානය වත් වැඩිපුර කරන්න"

"හැබෑට? දුන් ද මතක්වුණේ?" මම ඇසීමි. "මං එහෙනම් තානායමේ සේවකයෙකුට නියමකරන්නද දෙහියුෂ දමූ උණුවතුර අරගෙන එන්න කියලා?"

"මං අදහස් කළේ, දෙහියුෂ නෙමෙයි වොට්සන්"

"එහෙනම්?"

"මං කල්පනා කළේ දෙහියුෂ වෙනුවට මිදියුෂ - වයින් ටිකක් බොන්න. ඒකත් දියර පානයක් නේ" කී හෝම්ස් මහ හඬින් සිනාසී තම කාමරයේ දොර වසා ගත්තේය.

දහවල් එකට පමණ අප තානායමේ භෝජනාගාරය වෙත පැමිණෙද්දී හෝම්ස්ගේ හිස කැක්කුම අඩුවී ඇති බැව් ඔහු කීය.

"හෝම්ස්, මට පෙනෙන හැටියට ඔබ දිගින් දිගටම එළවන්නෙ ඩොනල්ඩ් හාව් පස්සෙ" මම කීවෙමි. "ඒ වුණත් මට නම් තේරෙන්නෙ නැහැ, දොර යතුරු දමපු උඩුමහලෙ කාමරේක, මත්පැනින් සිහිවිකල් වෙලා හිටි මිනිහෙක් ගැන, ඔබේ හිතේ සැකයක් ඇතිවුණේ ඇයි කියල. ඇයි ඔබේ හිතේ වෙනිං කවුරුවත් ගැන සැකයක් ඇති නොවුණේ?"

"වෙනිං කවුරුවත් කියන එකෙන් ඔබ අදහස් කළේ කවුද?" හෝම්ස් ඇසීය.

"සමහර වෙලාවට මෙහෙම අපරාධ කරන්නෙ අපි කවුරුවත් කලින් නොහඳුනන බාහිර පුද්ගලයෙක්" මම කීවෙමි. "අපි හිතමු මුදල් හොරකම් කරන්න ගෙදරට ආ හොරෙක් කියලා..."

"වොට්සන්, මගේ හිතවත් මිත්‍රයා, ඊයේ මං කළ නිරීක්ෂණ වලින් පෙනීගියා, ගෙදරට ආ පුද්ගලයා නාඳුනන හොරෙක් නෙමෙයි කියලා"





"එහෙනම් ඔහු මේ ඝාතනය කළේ ඇයි? පළිගැනීමකට ද?" මම ඇසීමි.

"වෙන්න පුළුවනි" හෝම්ස් කීය.

"එහෙම නම් මට හිතෙන්නේ මේක අර කම්හලේ සේවකයන් දෙන්නාගෙ වැඩක්" මම කීවෙමි.

"ඒ බවට සාක්ෂි නම් මට තවමත් සොයාගන්න බැරිවුණා" හෝම්ස් පිළිතුරු දුන්නේය. "සර් ඉර්වගෙ පළමුවැනි විවාහයේ පුත්‍රයා - අර ඉලිංවර්ත් නම් අරගෙන ඉන්න තරුණයා ගැනත් මගේ හිතේ සැකයක් ඇතිවුණා. ඔහු ගැන සොයා බලන්නම් කියල හිතද්දී..."

හෝම්ස්ට ඒ වාක්‍යය සම්පූර්ණ කිරීමට ඉඩ නොලැබිණි. අපේ කෑම මේසය වෙත කඩාවැදුණේ පොලිස් පරීක්ෂක චැප්මන්ය.

"හෝම්ස් මහත්තයා! හෝම්ස් මහත්තයා!!" ඔහු කීවේ හතිදමමිනි. "අර දෙන්නා පැනලා ගිහින්!"

"කොයි දෙන්නද?"

"අර සර් රේගේ කම්හලෙන් අස්කළ සේවකයන් දෙන්නා - විල්සන් සහ මේබ්‍රික්" චැප්මන් කීය. "කම්හලෙන් ලිපින අරගෙන මං ඔවුන්ගේ ගෙවල් වලට ගිහිං සෝදිසි කළා. සිකුරාද හැන්දෑවෙ ගෙදරින් පිටවුණාට පස්සෙ ආපහු ගෙදර ඇවිත් නැහැලු"

"හැබෑට?" හෝම්ස් කීවේ තරමක පුදුමයකට පත්වෙමිනි. "ඔවුන් එදා ඒ කලබල කරල, සර් රේට කෑගහල ගියාට, මට හිතුණෙ නෑ මේකට පටළැවිල ඇති කියල"

"මං ඔවුන් ගැන පොලිස් වාර්තා හොයල බැලුවා හෝම්ස් මහත්තයා" චැප්මන් තවදුරටත් කීය. "ක්‍රිස් මේබ්‍රික් කියන්නෙ ආයුධ සන්නද්ධව මංකොල්ලකෑමකට හිරේ ගිහින් ආව මිනිහෙක්. ෆ්‍රෙඩ් විල්සන් අවුරුදු අටකට කලින් රක්ෂිත බන්ධනාගාරයේ ඉඳල තියෙනවා. ඒ මිනීමැරීමකදී බර්ටන් නම් අපරාධකාරයෙකුට ආධාර හා අනුබල දීම උඩ. නඩුවේදී බර්ටන් එල්ලුම්ගසට නියමවුණාලු. ෆ්‍රෙඩ් විල්සන්ට විරුද්ධව තිබුණු සාක්ෂි ප්‍රමාණවත් නොවුණු නිසා ඔහු නිදහස් වුණාලු. සර් රේ මේ වගේ මිනිස්සු තමන්ගෙ කම්හලේ රැකියාවට අරන් තියෙන්නේ, කලින් හොයල බලන්නෙ නැතුවද, මං දන්නෙ නෑ. මේ පුද්ගලයන් දෙන්නාගෙ පෙනුම හා අනෙක් විස්තර මං ස්කොට්ලන්ඩ්යාඩ් එකට දන්වා යැවුවා. ග්‍රෙග්සන් මහත්තයා ඒ ගැන නිසි පියවර ගනීවි"

"ඔබ කටයුතු කර ඇති ආකාරයේ ඉතාම නිවැරදියි වැජ්මන්" හෝම්ස් කීවේ තැම ගැනීම අවසන් කර මේසයෙන් නැගිටිමිනි. "මෙතැනින් ඉදිරියට අප කළ යුත්තේ මොනවද? ඒක මගෙන් අහගන්න නේද ඔබ ආවෙ? මේ ගැන මං තවදුරටත් කල්පනාකර බැලිය යුතුයි. එහෙම නැතුව කළ යුත්තේ කුමක්ද කියල එක්වරම කියන්න අමාරුයි. ඔවුන් පළපුරුදු අපරාධකාරයින් වෙන්නත් පුළුවනි. එහෙම වුණොත් ඔවුන් හොයාගැනීම ඒ තරම් ලෙහෙසිවෙන එකක් නැහැ."

"හෝම්ස් මහත්මයා, මොකක්ද ඔබ මට දෙන උපදේශය?"

"විල්සන් සහ මෙයින් දෙන්නා සම්බන්ධයෙන් නම් ඔබට කළ හැකි වෙනත් දෙයක් තියෙනවා කියල මං හිතන්නේ නෑ" හෝම්ස් කීය. "ස්කොට්ලන්ට්යාඩ් එකෙන් මේ දෙන්නා ගැන ප්‍රචාරය කරල හොයන්න පටන්ගත්තාම, ආරංචි ලැබෙන්න ඉඩ තියෙනවා. එතකොට ඔබට වැඩ තියෙයි. ඒ අතරේ පවුල්වල අයගෙන් සහ නෑදෑමිත්‍රයන්ගෙන් ප්‍රශ්න කරල බලන්න. ගෙවල් වල අය මොනවා කිව්වත්, මේ දෙන්නා හැංගියන්න ඇත්තේ ආපහු ගෙවල් වලට ගිහිං, ඇඳුම්පැළඳුම් හා මුදල් සූදානම් කරගෙන. අපි ටිකක් ඉවසීමෙන් බලා ඉඳිමු."

අපෙන් සමුගත් වැජ්මන් යන්නට ගියේය. නානායමේ විසිත්ත කාමරයට වී මම පුවත්පත් කියවීමට පටන්ගත්තෙමි. ඒ අතරේ මගේ මිත්‍රයා තම කාමරය වෙත ගියේය. පැයකට පමණ පසු මා එහි යනවිටත් ඔහු පයිප්පය දල්වාගෙන හාන්සිපුටුවකට වී කල්පනා කරමින් සිටියේය.

"තවමත් අපට අහුවුණේ නැති අබිරහසක් මෙතැන තියෙනවා වොට්සන්" හෝම්ස් කීවේ පයිප්පය නිවා එය ඉවතින් තබමිනි. "ඒක හරියටම මොකක්ද කියන්න මට තේරෙන්නේ නෑ. සර් රේ ඔහුගේ බිරිඳටවත් නොකියූ රහස මොකක්ද? මේ ගැටලුව බොහොම දුරට රැඳී තියෙන්නෙ ඒ රහස වටා"

ඔහු ඒක තමන්ගේ බිරිඳටවත් කිව්වේ නැත්නම්, දැන් එය ඔබට දැනගත හැකි ක්‍රමයක් ඇති කියල මං හිතන්නේ නෑ" මම කීවෙමි.

"වොට්සන්, මං කල්පනා කළේ එඩ්මන්ටන් මන්දිරයට ගිහිං, සර් රේගේ පෞද්ගලික ලියකියවිලි පරීක්ෂා කරල බලන්න" හෝම්ස් කීය. "ඒක අපට බොහොම ප්‍රයෝජනවත් වෙන්න පුළුවනි.





තර්ස්ටන් ආර්යාව තවමත් ඉකිගසා හඬා වැලපෙමින්. ඉතින් පෞද්ගලික ලිපිලේඛන අවුස්සා බලන්න අවසර ඉල්ලන්න, මට හිතක් තිබුණේ නෑ. නමුත් දැන් ඉතින් වෙන කරන්න දෙයක් නෑ. අපට අහු නොවුණු පොට හොයන්න, ඒක කරන්න වෙනවා"

සවස හතරට පමණ කුලීරියක නැගී, අපි එඩ්මන්ටන් මන්දිරය වෙත ගියෙමු. සර් රේගේ වැඩිමහල් දියණිය වූ සිබිල් සිය සැමියා සමග මැඳුරට පැමිණ සිටියාය. සිහින් උස් සිරුරක් තිබූ ඇයට තිබුණේ තර්ස්ටන් ආර්යාවගේ මුහුණුවරමය. පියාගේ හදිසි වියෝවෙන් හඬා වැලපෙමින් සිටි ඇය සැනසෙමින් සිටියේ. ඇගේ සැමියා ඩොනල්ඩ් හාට් මහතා ය. සිය මිතුරියන් දෙදෙනෙකු සමග ස්කොට්ලන්තය බලා ගොස් සිටි ඇයට, සර් රේගේ මරණය ගැන දන්වා යැවූ විදුලිපුවත ලැබී නොතිබිණි. දින දෙකකට පසු තමා, එය දැනගත්තේ පුවත්පත් මගින් බව සිබිල් හාට් පැවසුවාය.

තර්ස්ටන් ආර්යාව සමග වචන කිහිපයක් කථාකිරීමට හෝම්ස් අවසර ඉල්ලා සිටි බැවින් ඇය අප සමග මිදුලට පැමිණියාය.

"ආර්යාවනි" හෝම්ස් කීය. "අපරාධකාරයා හොයාගැනීමට අපට තවමත් හැකිවුණේ නෑ. දැන් ඉතින් අපට සර් රේමන්ඩ්ගේ පෞද්ගලික ලිපිලේඛන පරීක්ෂා කිරීමට සිදුවෙනවා. මෙක ඔහුගෙන් පළිගැනීමට කළ අපරාධයක් බව මට සෑහෙන තරම් විශ්වාසයි"

"ඒ වුණත් හෝම්ස් මහත්තයා, ඔහු කාටවත් වැරැද්දක් කළ කෙනෙක් නෙමෙයි" ආර්යාව කීවාය.

"ඔබ කියන දෙය මං එකහෙළාම පිළිගන්නවා ආර්යාවෙනි" හෝම්ස් කීය. "සර් රේමන්ඩ් කියන්නේ රටක් වටින උතුම් මිනිසෙකු බව, රටවාසීන් විතරක් නෙමෙයි, මහරැජිනියත් පිළිගන්නා. සර් රේත් මනුෂ්‍යයෙක්. ඔහු අතින් නොදැනුවත්කමින් සුළු වරදක් වුණා වෙන්න පුළුවනි. ඒ සුළු වරදට සර් රේගෙන් පළිගන්න, අධම නීච මිනිසෙකු තීරණය කරා වෙන්නත් පුළුවනි. සර් රේගේ මරණය නිසා වාසියක් සැලසෙන්නේ කාටද කියා අපි හොයා බලන්න ඕන. ඊකට සර් රේගේ ලිපිලේඛන බැලිය යුතුමයි. ඒ සඳහා අපට සහාය වෙන්න ඔබට හැකිනම්......"

"මගෙන් ප්‍රශ්නයක් නෑ" ආර්යාව කීවාය. "ඔබට කැමති දෙයක් පරීක්ෂා කර බලන්න හෝම්ස් මහත්තයා. මටයි දරුවන්ටයි ඔහු

අහිමිවුණාට පස්සේ, දැන් ඉතින් ඒක කුළේ කවුද කියන එක දැනගැනීමෙන් වත් මට වැඩක් නෑ"

"ඔබේ කතාව ඇත්ත" හෝම්ස් කීය. "ඒ වුණත් අදාළ පුද්ගලයා හොයාගෙන ඔහුට නීතියෙන් දඬුවම් කරන්න අප බැඳී සිටිනවා. ඔය අමුත්තන් පිටවෙලා යනතුරු අපි ගෙවත්තේ ඉන්නම්. ඊටපස්සේ ඔබ තාත්තෝරු කාමරයට එන්න. කැමැති නම් ඔබේ දියණියක හෝ සේවිකාවක කැඳවාගෙන එන්න. ලිපිලේඛන පරීක්ෂාව අප කළ යුත්තේ ඔබ ඉදිරිපිට මයි"

එයට තම එකඟත්වය පළකළ හර්ස්ටන් ආර්යාව ආපසු නිවස තුළට ගියාය. අපි ගෙවත්තේ ඇවිදීමට අටන්ගත්තෙමු.

"අපට මෙහෙම විවේකයක් ලැබුණු එකත් හොඳයි වොට්සන්. මේ ගෙවත්තේ අත්තරා විශේෂ ලක්ෂණ කිහිපයක් ඔබට පෙන්වාදෙන්න මේක හොඳ අවස්ථාවක්" හෝම්ස් කීවේ සර් රේගේ කාමරයේ ජනේලය තිබූ පැත්තට ගමන්කරමිනි.

"මෙහේ ඉන්න උද්‍යාන පාලකයා කවුද කියල හොයල බලන්න වටිනවා" හෝම්ස් කීය. "ඔහු ඉතාම දක්ෂයෙක් බවට කිසිම සැකයක් නෑ. ගෙවත්තේ වවන්න ගස් හා පැලෑටි වර්ග තෝරාගැනීමේදී, ඔහුත් හරියට සැලකිලිමත් වෙලා තියෙනවා. ඔබ දුටුවද මේ ගෙවත්තේ තියෙන ගස් වර්ග?"

"ඔව්, සමහරවිට එහෙම තෝරාගන්න ඇත්තෙ සර් රේගේ කැමැත්තට අනුව වෙන්නත් පුළුවනි" මම කීවෙමි.

"විශිෂ්ටයි වොට්සන්" හෝම්ස් කීය. "මටත් හිතෙනවා ඔබේ ඒ නිගමනය නිවැරදියි කියලා. සමහරවිට හර්ස්ටන් ආර්යාවගේ රුචිකත්වයත් මෙතැනදි බලපාන්න ඇති. බලන්න අර හරියෙ තියෙන අඩි පනහළොවක් විතර උසට වැවුණු ගස් ඔබ හඳුනනවාද කියල"

"අර රතු පාටට හුරු කොළ තියෙන ගහ මේපල් ගහක් නේද?" මම ඇසීමි.

"ඔබ ඉතාම දක්ෂයි වොට්සන්. ඒක විතරක් නෙමෙයි. බලන්න මේ ගෙවත්තේ මේපල් ගස් හතරක් වවලා තියෙනවා. තවමත් ඒවා විශාල වෘක්ෂ බවට පත්වෙලා නැහැ. මේපල් කියන්නේ කැනඩාවෙ ජාතික ලාංඡනය. අවුරුදු කිහිපයක් කැනඩාවෙ ගතකරලා, තමන්ගේ බිරිඳ හා වාසනාව ඔහු සොයාගත්තෙ, ඒ





රටෙන්. ඉතින් ඔහු කැනඩාවෙ මේපල් ගහට ආදරයක් දක්වීමෙ පුදුමයක් නැහැ. ඊළඟට ඔබට පෙනේවි, මේ උද්‍යානය වටේටම වගේ බ්ලූ ස්ප්‍රූස් සහ පොප්ලර් ගස් වවා ඇති හැටි. බලන්න අර පැත්තේ තියෙන්නේ පොප්ලර් සහ සිල්වර් බර්ච් ගස්. වොට්සන් මේ කොහේ හරි දුටුවද ඕක් ගහක්? කොහේවත් නැ. එද මං තැන් දෙකක දුටුවා බීච් පැළ කිහිපයක්. ඒත් ඕක් නෑ. ඒ මොකක් නිසා කියලද ඔබ හිතන්නෙ?"

"මට හිතාගන්න බෑ හෝම්ස්" මම කීවෙමි.

"ඕක් ගස් හොඳින් වැඩෙන්නේ මැටි ගතිය වැඩි පොළොවේ" හෝම්ස් කීය. "බාගවෙලාවට මේ වත්තෙ මුලින් ඕක් ගහක් තිබුණා කියල හිතමු. ඒකෙන් ලැබෙන සෙවණ නිසා කිසිම අලංකාර ගසක්, පත්තේ වවාගන්න බැහැ. ඒ මොකද ඕක් ගහේ අතු පුළුල්ව විහිදෙනවා. ඒ නිසා හර්ස්ට් ඕක් ගහ කපා ඉවත් කරලා, ඊට වඩා පුමාණයෙන් කුඩා එහෙත් අලංකාර ගස් වර්ග වවන්න ඇති"

"හෝම්ස්. ඔබේ ඔය වනවගාව පිළිබඳ දැනුම කොහොමද, මේ අපරාධය විසඳීමට උදව් වෙන්නෙ?" මම ඇසීමි.

"වනාන්තර හා පැලෑටි අපේ ජීවිතයට ඉතාම සමීපයි" හෝම්ස් කීය. "දැන් බලන්න මේ හරියේ කෝණයක ඔබ දුටුවාද පර්ණාංග හෙවත් මීවන පැළයක්? දුටුවෙ නැහැ නේද? මීවන කියන්නේ පොත් සහිත අඳුරු වනාන්තරවල වැවෙන වල්පැලෑටියක්. හොඳ උයන්පල්ලෙක් කවදාවත්, තමන්ගේ උද්‍යානයේ මීවන වැවෙන්න ඉඩහරින්නෙ නෑ. විශාල ගස් වල කඳන් මතත් සමහර මීවන වර්ග වැවෙනවා. බලන්න මේ ගස් වල කඳන් ඉතාම පිරිසිදුයි. පරපෝෂිත, අපිශාක, මීවන කිසිවක් නෑ"

මේ වෙලාවේ හෝම්ස්ගේ උද්භිද විද්‍යා දේශනයට බාධාකරමින් හර්ස්ටන් ආර්යාව එහි පැමිණියාය.

"හෝම්ස් මහත්මයා. ඔබ කියූ ලියවිලි පරීක්ෂාව දැන් කරන්න පුළුවනි" ඇය කීවාය.

සර් රේමන්ඩ්ගේ කන්තෝරු කාමරය සෑහෙන තරම් විශාල එකක් බැව් මම කලින් කීවෙමි. එහි දොර අසල වූ පුටුවක, ආර්යාව හිඳගත්තාය. ඇගේ බාල දියණියත් පැමිණ තවත් පුටුවක හිඳගත්තාය. ශෝකාකුල හිස් බැල්මකින් සිටි ඇය, වයස අවුරුදු පහළොවක පමණ දැරියකි.

කාමරයේ එක් බිත්තියක් පුරා තිබුණේ බිත්ති අල්මාරි කිහිපයකි. ඒ හැම එකක්ම විවෘතකර, අවුස්සා බලමින්, හෝම්ස් සෙව්වේ කුමක්ද යන්න මා දැනසිටියේ නැත. කාමරයේ එක් කෙලවරක රාක්කයක් පුරා තිබුණේ, කැනඩාවේ නොයෙක් ප්‍රාන්ත පිළිබඳ, අලංකාර සිතුවම් සහිත සඟරා රාශියකි. අසල වූ පුටුවකට වී මම ඒවා කියවන්නට පටන්ගත්තෙමි. කාලය ගෙවී යනු මට නොදැනිණ.

මේ අතර හෝම්ස් සෙවූ දේ අන්තිමේදී ඔහුට හමුවී තිබූ අයුරක් දකින්නට ලැබිණ. තරමක් ලොකු පොතක් ඔහු අතේ විය. ඔහු තර්ස්ටන් ආර්යාවට මඳ හඬින් යමක් පවසනු ආකාරයත්, ඇය හිස සොලවමින් එය තේරුම් ගත් ලෙසින්, ස්වන් යොමු කරන හැටිත් දිස්විය. මීළඟට හෝම්ස් ආර්යාවගෙන් අවසර ගෙන, පොතේ සඳහන් කරුණු සටහන් කරගැනීමට පටන්ගත්තේය. ඒ හැමදෙයක්ම වැඩි පමාවක් නොමැතිව මගේ මිත්‍රයා මට පවසන බව මම දැනසිටියෙමි.

"අපි ඉක්මනටම ඔබතුමිය හමුවෙන්න එනවා" හෝම්ස් කීවේ කාර්යය නිමකොට අසුනෙන් නැගීසිටිමිනි. "මේ ප්‍රශ්නය ගැන පැටළී තිබුණු තැන් හුඟක්, දැන් අප්ට පැහැදිලි වෙමිනුයි තියෙන්නේ" හෝම්ස් කීවේ ඇයගෙන් සමුගනිමිනි.

"හෝම්ස්, ඔබ ඇයට කිව්වා නේ, පැටළුණු තැන් හුඟක් දැන් පැහැදිලියි කියල. මොනවද ඒ තැන්?"

"සර් ජෝර්ජ්ගේ පෞද්ගලික ලිපිලේඛන පෙරලා බලන්න මට හැකිවුණු එක, ලොකු සෙතක් වුණා. තවමත් ඒ තරම් රෑ වුණේ නැහැ නේද වොට්සන්? හැන්දෑවෙ දුම්රිය අල්ලාගත්තොත් අපට රෑ වෙන්න කලින් ලන්ඩන් යන්න බැරිවෙන එකක් නැහැ. අපට රෑ කෑම සූදානම් කරල තියන්න කියල අපි හඩ්සන් මහත්මියට විදුලි පුවතක් යවමු"

වහාම ආපසු ලන්ඩනය බලා යාමට ඔහු තීරණය කළේ කුමක් නිසාද යන්න, මට තේරුම් ගැනීමට නොහැකි විය. ඔහු එයට හේතුව මට පහදා දුන්නේ ද නැත. කුලීරියක නැගී යුනිකෝන් තානායමට ගොස් අපේ කුඩා මලු ද රැගෙන වහා දුම්රියපොළට පැමිණියෙමු.

දුම්රියපොළේ රැඳී සිටි පැය භාගයක පමණ කාලයේදීත්, අප දුම්රියෙන් ලන්ඩන් බලා යන අතරතුරත්, මගේ මිත්‍රයාගේ තිබුණේ





දැඩි නිහඬබවකි. ඔහු දල්වාගත් පයිප්පය, නිවී යද්දී, අලුතෙන් දුම්කොළ දමා එය දල්වා ගත් හෝම්ස්, තළල රැළි කර ගනිමින් කල්පනා කළේය. ඇඟිලිතුඩින් දුම්රිය අසුනට තට්ටුකරමින්, විටෙක හිස කසමින්, කල්පනා කළ ඔහුට බාධා නොකොට, මම නිහඬව සිටියෙමි. ඔහුගේ නිහඬතාවය බිඳුණේ අප බේකර් වීදියේ නිවහනට ළඟාවූ පසුවය.

"මගේ හිතවත් වොට්සන්, මං කල්පනා කරන වෙලාවට නිහඬව ඉඳීමෙන් ඔබ දක්වන සහයෝගය මං අගය කරනවා මිත්‍රයා. ඒක මට විශාල සහයෝගයක්. සිතිවිලි දමයක් කරුණු එකින් එක ගොඩනගමින් යද්දී, කොහෙන් හෝ බිඳීමක් ආවොත්, ඒක මට විශාල කරදරයක් වෙනවා. ඔබ වැනි මිත්‍රයකු ලැබීම මගේ වාසනාවක්.

අපි එකදිගට දවස් දෙකක් මහන්සි වුණා. ඒ මහන්සිය ඔබේ මුහුණෙන්ම පෙනෙනවා වොට්සන්. ඔබට කරන්න තියෙන්නේ ඉක්මනින්ම කෑම කාල නින්දට යාම"

"ඇයි ඔබ මොනවද කරන්න හදන්නේ?" මම ඇසීමි.

"මට තියෙනවා මෙතෙක් හොයාගත් කරුණු විශ්ලේෂණය කර බලන්න" ඔහු කීවේ දකුණු අතේ දබරැඟිල්ල දකුණු කන ඉදිරියෙන් හිසමත තබා තට්ටු කරමිනි.

පසුවද උදේ මා අවදිවන විට දහය පමණ වී තිබිණි. මට දකින්නට ලැබුණේ හෝම්ස් උදේ ආහාරය ද ගෙන නිවහනෙන් පිටවී ගොස් ඇති බවය.

ඔහු ආපසු පැමිණෙන විට සවස තුන පමණ වී තිබිණි.

"මගේ වැඩ කටයුතු වලට හුඟක් වේලා ගියා වොට්සන්" ඔහු කීය. "ඒ නිසා මං මගදී දවල් කෑම කෑවා"

"කොහොමද ඔබ ගිය වැඩකටයුතු සාර්ථක ද?" මම ඇසීමි.

"සෑහෙන තරම් සාර්ථකයි කියන්න පුළුවනි" කී හෝම්ස් හාන්සි පුටුවේ වැතිර පයිප්පය දල්වා ගත්තේය.

"හෝම්ස් මං දුටුවා ඔබ අන්වීක්ෂය එළියට අරගෙන, ඊයෙ රෑ මොනවා හරි පරීක්ෂාවක යෙදී ඇති බව. සැකයක් නෑ ඒ, මේ දිනවල යෙදෙන පරීක්ෂණය ගැන වෙන්න ඇති?"

මගේ මිත්‍රයා එයට පිළිතුරු දීමට පෙර අපගේ නිවසේ සීනුව නාදකරන ශබ්දයක් ඇසිණ. මීළඟට සේවක ළමයා වූ බිලී දොර විවෘත කළ හඬත්, තරප්පු පෙළේ ඉහළට එන දෙදෙනෙකුගේ



www.sinhalaelibrary.com

පාවහන් ශබ්දන් මට ඇසිණ. මොහොතකින් අපේ විසිත්ත කාමරයට පිවිසියේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක ග්‍රෙග්සන් හා සෙවන්ඕක්ස් පොලීසියේ වැප්මන් ය.

"ඇතුළට ඇවිත් පහසු තැනකින් අසුන්ගන්න මහත්වරුනි" හෝම්ස් කීය. "මගේ විදුලි පුවත් වලට ඉක්මනින් ප්‍රතිචාර දක්වීම ගැන මං ඔබට ස්තුතිවන්ත වෙනවා. මේ මහත්වරුන්ට එන්න කියා යැව් බව, මට වොට්සන්ට කියන්නත් බැරිවුණා. මොනවද සෙවනෝක්ස් පැත්තෙ ආරංචි? අපරාධකාරයින් අල්ලාගත්තද? කොහොමද වැප්මන් ඔබේ වැඩකටයුතුවල සාර්ථකත්වය?"

"විල්සන් සහ මෙට්‍රික් දෙදෙනා ගැන අපි රට පුරා පොලීසි වලට දැනුම් දුන්නා. ඒත් තවමත් කිසිම ආරංචියක් නෑ" වැප්මන් කීය.

මිනිත්තු දෙක තුනක නිහඬතාවයක් කාමරය තුළ පැවැතිණ. තම පයිප්පයෙන් නිල් පැහැති දුම් ගුළි පිටකළ හෝම්ස් ඔහුගේ කථාව පටන්ගත්තේය.

"මහත්වරුනි, මං ඔබට එන්න කිව්වෙ, මේ අපරාධය පිළිබඳව මා විසින් කළ, නිරීක්ෂණ හා නිගමන ඔබට දැනුම්දීමටයි.

අපරාධ පරීක්ෂණ සඳහා අන්වීක්ෂය යොදගත යුතුයි කියන කාරණාව, මං බොහොම කාලයක ඉඳල කියනදෙයක්. ස්කොට්ලන්ඩ්යාඩ් එකත් ඒ බව පිළිගත්තා. නමුත් ඔවුන් ඒක සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන බවක්, මට නම් තවමත් දකින්න ලැබුණෙ නැහැ.

මේ අපරාධය කළේ විල්සන් හා මෙට්‍රික් දෙදෙනා බවටයි අප හැමදෙනාගේම සිත්වල සැකයක් ඇතිවුණේ. ඒක සාධාරණයි. නමුත් දැන් ප්‍රශ්නයක් මතුවෙනවා. මේ දෙන්නා කොහොමද සර් රේගේ කාමරයට ඇතුළුවුණේ?

ඒක බොහොම සරලයි. අපරාධකරු ගෙට ඇතුළුවුණේ ජනේලයෙන්. එය ඇතුළින් තියන්න අගුලක් හෝ ග්‍රිල් නොමැතිවීම නිසා කරන්න තියෙන්නේ, ජනෙල් පියන ඇරගැනීම පමණයි. නමුත් ඇතුළෙන් අගුළු දමා තියෙන ජනේලය ඇරියෙ කොහොමද? එක්කො වීදුරු කපා හෝ කඩා දමා ඇතුළට අත දමා එය කළ යුතුයි. නමුත් මෙතැන එහෙම වෙලා නැහැ. කවුරු හරි ගේ ඇතුළේ සිට අගුළ ඇරලා තියෙනවා. හැමදම හවස හතරට මේ ජනෙල් පියන් වසා අගුළුදමීම කරන්නේ කූපර් විසින්. මං ඔහුගෙන්



www.sinhalaelibrary.com



අහල බැලුවා. ඔහු සුපුරුදු ලෙස ජනේල වහලා ගිනිදූන දැල්වුවාලු. කූපර් කිව්වේ ඇත්තක් බවට මට සැකයක් නෑ. ඊළඟට මෙන්න මේක දිහා බලන්න"

හෝම්ස් වීදුරු තහඩු කැබලි දෙකක් අතර තිබූ යමක් ගෙන අපට පෙන්වීය. ඒ ගසක පත්‍රයකි.

"සර් රේගේ කාමරයේ ජනේලයේ පියන ළඟට වැසෙන එක නැවැත්වීමට ඇති චක්‍රාකාර රඳවනයේ පැටලී තිබී, මට මෙන්න මේ දේ හමුවුණා. වඩාත් උනන්දුවෙන් බැලුවොත් ඔබට පෙනේවි මේක ලපටි ඕක් කොළයක් බව. මේ එඩ්මන්ටන් මන්දිරය අවට උද්‍යානයම අප පරීක්ෂා කළා. ඒත් අපට එක් ඕක් ගසක්වත් දකින්න ලැබුණේ නැහැ. ඒ නිසා මේක ජනේලය උඩට ආවේ කොහොමද? නිසැකවම අපරාධකාරයාගේ සපත්තුවේ අඩියේ ඇලී තිබී, ඔහු ජනේලයෙන් ඇතුළට පනිද්දී නොදන්නේ පැටලිලා. මීළඟට මේ නිවස තුළ තිබී තවත් ශාක වර්ගයක ඉත්තක් මට හමුවුණා"

හෝම්ස් සටහන් පොත තුළ තිබී ගත් කඩදාසිය දිගහැර එය අපට පෙන්වීය.

"මේක මට හමුවුණේ සර් රේගේ ඇඳිරිය කොළොවට ගලා ගිය තැනක ඇලී තිබී. මෙය දුර්වර්ණ වීමට හේතුව ලේ. මේකෙ පත්‍ර ඉතාම සුවිශේෂ හැඩයක් ගන්නවා. කලාතුරකින් දකින්න ලැබෙන මේ ශාකය, විනස් මෙඩින්හෙයා නම් පර්ණාංගය හෙවත් මීවන.

එඩ්මන්ටන් මන්දිරය අවට ගෙවත්ත සෝදිසි කළාම, එම මීවන වර්ගයේ එකම පැලයක්වත්, ගෙවත්තේ මට දකින්න ලැබුණේ නෑ. ඊට හේතුව, මේක විශාල වෘක්ෂවල කඳන් මත වැවෙන අපිශාකයක්. සමහර ගස්වල පොත්තට තුවාලයක් වුණාම ගසෙන්ම මැලියම් ගලා ඇවිත් එය ආවරණය වෙනවා. මේ මැලියම් ස්වල්පයක් අපරාධකාරයාගේ සපත්තුවේ යටිපැත්තේ තැවරෙන්න ඇති. ඒ මත ඇලුණු පත්‍ර දෙකක් තමා මං ඔබට පෙන්නුවේ.

සර් රේ මියගියේ ගින්නට අසුවීමෙන් නොවන බව මට මුලදීම තේරුම් ගියා. ඒ මොකද ඔහුට තුවාල සිදුවෙද්දී ගලා ගිය ලේ, ඇඳ යටට ගලාගිහින් තිබුණා. ඇඳ ඉදිරිපස අපට පෙනෙන හරියේ තිබූ ලේ, කවුරුන් හෝ රෙද්දකින් පිසදමා තිබුණා. ලේ ගලාගිය බව වසන් කරන්නට උත්සාහ කළේ කවුද? වෙන කවුද අපරාධකාරයා හෝ ඊට හවුල් වුණු කෙනෙකු මිස?

අපරාධකාරයන්ගේ අරමුණ වුණේ මොකක්ද කියන එක අපට දැන් ටිකෙන් ටික පැහැදිලි වෙනවා. උල් ආයුධයකින් ඇන සර් රේ මරාදම්මාට ඔවුන් උත්සාහ කළේ, ඔහුගේ මෙට්ටයට ගිනිතබා, ඔහු මියගියේ ගින්නට අසුවීමෙන් බව පෙන්වන්න. නමුත් ඒක සාර්ථක කරගන්න බැරිවුණා. වියළි දරගොඩකට ගිනි ඇවිළෙනවා වගේ මෙට්ටයට ගිනි ඇවිළුණේ නැහැ. ඔබට මේ දක්වා කාරණය පැහැදිලිද?"

"ඔව්" අපි සියලු දෙනාම පිළිතුරු දුන්නෙමු.

"දෙස්තර වොට්සන් තර්ස්ටන් ආර්යාවගේ සැපසනීප බැලීමට උඩතට්ටුවට ගිය වෙලාවේ, ඔබට මතක ඇති ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "ඊට මොහොතකට කලින් තමා, මගේ ඉල්ලීම පිට රෙජී නිල්සන් සමග චැප්මන් සෙව්න්නොක්ස් නගරයට ආවෙ. ඒ අවමඟුලේ කටයුතු පිළිවෙළක් කරන්න. ග්‍රෙග්සන් ඒ ගෙදර සේවකයන්ගේ කටඋත්තරය ලියාගත්තා. ඒ අතරේ පරීක්ෂාවේ යෙදුණු මට මෙන්න මේ දේ හමුවුණා." වැහිකබායක් දිගහැරී හෝම්ස්, ඒ තුළ තිබී ලේ තැවරුණු නාන තුවායක් එළියට ගත්තේය. කහ පැහැති තුවායක් වූ එය දුඹුරු පැහැති ලේ පැල්ලම් වලින් වැසී තිබිණි.

"මේක මට හමුවුණේ මං එය සෙව්ව නිසයි" ඔහු කීය. "සර් රේගේ කාමරයට යාබදව නාන කාමරයක් තිබුණා. ඒකට අල්ලා තිබූ කාමරයේ, එනම් නිල්සන්ගේ කාමරයේ තිබී මං මේක සොයාගත්තේ. කොහේ තිබුණද? රෙජී නිල්සන් නිදාගත් ඇඳේ මෙට්ටයට යටින් ඇඳ පොළව මත තිබිලා. මං මේක මෙහෙ අරගෙන ආවෙ තර්ස්ටන් ආර්යාවගෙන් අවසර ලබාගෙන. දැන් මේක මං පොලීසියට භාරදෙනවා, භාරගන්න ග්‍රෙග්සන්"

"දෙයියන් සාක්කි හෝම්ස් මහත්මයා. ඔබ අපට මෙහෙම දෙයක් කිව්වෙ නැහැනේ" ග්‍රෙග්සන් කීය.

"ඔව්. මං ඒක හෙළි නොකළේ මේ පරීක්ෂණය සාර්ථකව අවසන් කර ගැනීමේ අරමුණෙන්" හෝම්ස් කීය. "දැන් ඔබට හිතාගන්න පුළුවන් ඇති සර් රේගේ කාමරයේ ජනේලයේ අගුළ ඇර තැබූ තැනැත්තා කවුද, නානකාමරයෙන් අලුත් තුවායක් අරගෙන බිම තිබූ ලේ පැල්ලම් පිස දැමූ පුද්ගලයා කවුද කියන එක. කවුද?"





"රෙජී නිල්සන්ද?" අපි එක්වරම ඇසුවෙමු.

"හරියට හරි මහත්වරුනි" හෝම්ස් කීය. "ඔබ ඔය තුවාය තවත් පරීක්ෂා කර බැලුවොත් පෙනේවි මං කිවූ අර මීවන - වීනස් මේඩ්න් හෙයා ශාකයේ ඉති කැබැල්ලක්, ලේ සමග තුවායට ඇවිත් ඇති බව.

හොඳයි. මීළඟට මගේ අවධානය යොමුවුණේ නිවසෙන් එළියේ පිහිටි හෝඩුවාවන් පරීක්ෂාවට. සීකුරාද හැන්දෑවේ ඉඳන් ස්වල්ප වශයෙන් හිම වැටීම නිසා, පොළොව තුනී හිම තට්ටුවකින් වැසී තිබුණා. අපරාධ පරීක්ෂණයේදී පළමුවෙන්ම අවධානය යොමු කළ යුතු දේවල් කිහිපයක් තියෙනවා. එයින් මුල්තැන ගන්නේ පා සටහන්. තව අවුරුදු සීයක් ගියත් අපරාධ ගැන සෙවීමේදී, අපරාධ පරීක්ෂකයන්ට පාසටහන් හරිම වැදගත් වේවි

සර් රේගේ ජනේලය වෙත ආ අපරාධකාරයෙකුගේ පාසටහන්, ඉතාම පැහැදිලි ලෙස තුනී හිම මත සටහන්වී තිබුණා. සර් රේ ඝාතනයෙන් පසු අපරාධකරු එළියට ඇවිත් තියෙන්නෙත් ඒ ජනේලයෙන්මයි. ජනේලයෙන් පැන්න ඔහු, ආපහු ගිහින් තියෙන්නෙත් දුවගෙන. ඒ බව පා සටහන් වලින් කිව හැකියි. පියවර දෙකක් අතර දුර වැඩියි. අනෙක පාවහනේ ඉදිරි කොටස තමා හොඳින් ගැඹුරට බිම සලකුණු වෙන්නේ.

පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා වෛද්‍යවරයා මැදුරට පැමිණි වෙලේ, ග්‍රෙග්සන් හා චැප්මන් ඔහුට අවුල්වීමට ගියා. සීතලේ ඇවිදින්න යන්න වොට්සනුත් උනන්දුවක් දැක්වුවෙ නෑ. මං තනියම ඇවිදින්න ගියා. අපරාධකාරයෙකුගේ පා සටහන් පසුපස යාම, මට මේ තරම් පහසුවුණේ නෑ කවදාවත්. විශාල ගස් නිසා පාරේ හිම නොතිබුණු තැන් වල, පස් හෝ මඩ මත පා සලකුණු තිබුණා. මං ඒ පසුපස්සේ ඇවිදගෙන ගියා. මං ගියේ කොහේට කියලද වොට්සන් ඔබ හිතන්නේ?"

"මට හිතාගන්න අමාරුයි" මම කීවෙමි. පොලිස් නිලධරයෝ ද නිහඬව බලා සිටියහ.

"මහත්වරුනි. මගේ ගමන අවසන් වුණේ "සිටාඩෙල්" මන්දිරයේ ගේට්ටුව ළඟින්" හෝම්ස් කියද්දී අපි මවිතයට පත්වූයෙමු. "දැන් ඔබට හිතාගන්න පුළුවන් ඇති අපරාධකාරයා කවුද කියලා"

මෙම අපරාධයට වගකිවයුතු පුද්ගලයන් කවුද කියා හඳුනාගැනීම එකක්. නමුත් ඒක ඔප්පුකර පෙන්වීම පහසු නොවෙන බව මං තේරුම් ගත්තා.



www.sinhalaelibrary.com

ඊයේ උදේ "සිටාවෙල්" නිවස පරීක්ෂා කරන්න මං වොට්සන් සමඟ ගියා. ඩොනල්ඩ් හාවි එහැන නොසිටිදී මග ඇරල ගියා. මගේ ප්‍රශ්නකිරීම්වලදී ඔහුගෙන් පරස්පර දේවල් කියවේවි කියල සමහරවිට ඔහුට භය හිතෙන්න ඇති. අප දෙන්නා මගහැරල ගියත්, අප ගැන සෝදිසියෙන් සිටීමට ඔහු එව්වා ජයිල්ස් නම් ඔහුගේ මිත්‍රයා. ජයිල්ස් කියන කථාව තමයි, සිකුරාදා රාත්‍රියේ එකොළහේ පමණ සිට, පසුවද උදේ වැජම්බන් ඒ ගෙදරට යනතුරු හාවි නිදන කාමරය තුළ යතුරු දමා හිටි බව. කාමරය යතුරු දමා තිබුණු බව ඇත්තයි කියමු. නමුත් ඔහුගේ කාමරයේ ජනේලය ඇරලා, ඕක් ගසේ අත්ත දිගේ හාවි ගෙදරින් පිටවෙලා තිබුණා. ජනේල පියන තදින් ඇරීමේදී අත්ත ලෙවාල වී තිබූ හැටි අප දුටුවා. අනෙක ඕක් ගසේ කඳ මත වැවුණු, වීනස් මැස්සන්කනයා ශාකයේ කොටස්, ඔහුගේ සපත්තුවේ අඩියේ ඇලුණෙත් ඒ වෙලාවේදී.

ඩොනල්ඩ් හාවිගේ කාමරය පරීක්ෂා කරද්දී, මට තවත් වැදගත් හෝඩුවාවන් දෙකක් සොයාගන්න හැකිවුණා. එයින් එකක් තමයි සිකුරාද රාත්‍රී සාදයේදී, ඔහු නොකඩවා මත්පැන් පානය කළා කියන වොඩ්කා බෝතලය. කාටවත් බීමට නොදී, ඔහු දිගින් දිගටම තමන්ගේ අතේ ම තියාගෙන "බීගෙන" හිටි බවට, බ්‍රවුන්ස් මහත්මියත් සාක්ෂි දුන්නා. ඒ බෝතලයේ තිබුණේ පිරිසිදු වතුර මිස වොඩ්කා නොවන බව මං සොයා ගත්තා. එතකොට අපට පෙනෙනවා, ඔහු කිරිද ගෙදර නැති වෙලාවේ, සාදයක් සූදානම් කර අමුත්තන් ගෙන්නුවේ ඇයි කියලා. අධික ලෙස මත්පැන් පානය කරලා, සිහිවිකල් වෙලා රණ්ඩු කළ මිනිහා, කාමරයකට දමලා යතුරු දමා හිටි බවට සාක්ෂි තියෙනවා. පසුවද උදේ පොලිස් පරීක්ෂක වැජම්බන් ඒ ගෙදරට ඇවිත්, ඩොනල්ඩ් හාවි තවමත් ඒ කාමරයේ මත්ගතියෙන්. ඉතින් මං කොහොමද ඔහුට විරුද්ධව සාක්ෂි ඉදිරිපත් කරන්නේ?"

"මොකක්ද හෝම්ස් ඔබට ඒ කාමරයෙන් හමුවුණු අනික් හෝඩුවාව?" මම ඇසීමි.

"හාවිගේ කාමරයේ ඇඳුම් රාක්කයට එහා පැත්තේ තිබුණා, කිළිටි ඇඳුම් දමන වේවැල් කූඩයක්. මෙක ඇතුළෙ ප්‍රයෝජනවත් යමක් තිබිය හැකි බව මට ඉවෙන් වගේ තේරුණා. නමුත් හාවිගේ යාළුවා ජයිල්ස් අප දිහාම ඇහැ තබාගෙනයි හිටියේ. ඒ නිසා, ඇඳුම්



www.sinhalaelibrary.com



කූඩය ඒ වෙලාවේ පරීක්ෂා කිරීම යෝග්‍ය නොවන බව මං තේරුම් ගත්තා. ඒ සඳහා මොකක් හරි ප්‍රයෝගයක් යෙදිය යුතු බව මං හිතාගත්තා. අපි ආපහු පහළ තට්ටුවට බැහැපු වෙලාවේ, මගේ කබාය ටීපෝවක යකඩ කොක්කක පටලවාගන්න මට හැකිවුණා. ඒක නිදහස් කරගන්න කියා බ්‍රෝෆර්ඩ්ගෙන්, කතුරක් මං ඉල්ලා ගත්තා. ඊළඟට මගේ කාචය නැතිවුණු බවක් කියමින්, ඒක හොයන්න කියලා, ජයිල්ස් මගහැර උඩතට්ටුවට දිවයන්න මට හැකි වුණා. කිළිටි ඇඳුම් කූඩය ඇතුලේ තිබුණා, ඩොනල්ඩ් හාවිගේ දිගකලිසමක්. ඒ කලිසම් කකුල්වල අග්ගිස්සේ බිම ගෑවෙන, සපත්තුවට පෑගෙන, යට කෙළවරවල් දෙක ඉක්මනින් කපාගෙන, මගේ කබාසාක්කුවට දමාගන්න, මට මිනිත්තු පහක් ගතවුණේ නෑ. මෙන්න ඒවා"

හෝම්ස් ලාච්චුවෙන් ඉවතට ගත් කළ, කිළිටි රෙදි කැබලි දෙකක් අප වෙත ඉදිරිපත් කළේය. අපි ඒවා පරීක්ෂා කර බැලුවෙමු. එයින් එක් රෙදි කැබැල්ලක දාරයේ දුඹුරු පැහැති පැල්ලමක් විය.

"වොට්සන්. ඔබට මතකද අපි දෙන්නා මුලින්ම හමුවුණු දවසේ මං කළ සොයාගැනීම?" හෝම්ස් ඇසීය. "මනුෂ්‍ය රුධිරය හඳුනාගැනීමට සුවිශේෂ පරීක්ෂණයක් මං එද සොයාගත්තා. වොට්සන් ඔබ ලෝහිත පරීක්ෂණය නමින් ලියූ කථාවේ මුලිනුත් ඒ ගැන සඳහන් කළා මං හිතන්නෙ. එහෙම නේද?"

"ඔව්. මගේ පාඨකයන් ඒ ගැන දන්නවා"

"විශිෂ්ටයි" මගේ මිත්‍රයා කීය. "මේ රෙදි කැබැල්ලේ තිබෙන දුඹුරු පැල්ලමෙන් ස්වල්පයක් කපලා මං 0.9% සේලයින් සහිත පරීක්ෂණ නළයකට දමා රත්කළා. ඊට පසු ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණය කළාම මට ලැබුණු ප්‍රතිඵලය මොකක්ද? නිසැකවම මේ තියෙන්නේ මනුෂ්‍ය රුධිරයි ඒ තරම් දුරට මා නිවැරදියි. ඔබට පැහැදිලිද මහත්වරුනි?"

"ඔව් පැහැදිලියි හෝම්ස් මහත්මයා," ග්‍රෙග්සන් කීය. "ඔබේ කථාව දිගටම කියන්න"

"හොඳයි. සර් රේ ගේ මළ සිරුරෙන් කපාගත් හිස කෙස් ස්වල්පයක් මං ඔබේ අතට එද දුන්නා කඩදාසියක ඔතලා. ඒක ඔබ ළඟ තවමත් තියෙනවාද ග්‍රෙග්සන්?"

"ඔව්. මං ස්කොට්ලන්ඩ්යාඩ් හි මෙම අපරාධය ගැන ලිපිගොනුවේ එය සුරැකිව තැන්පත් කළා" ග්‍රෙග්සන් පිළිතුරු දුන්නේය.

"බොහොම හොඳයි" හෝම්ස් කීය. "මේ කලිසම් රෙදි කැබැලි දෙකේම තිබී මට මනුෂ්‍ය හිසකෙස් දෙළහක් පමණ හමුවුණා. නොයෙක් වර්ණවල හා නොයෙක් වර්ගවල ඒවා. ඒ අතරේ කෙස්ගස් පහක් තිබුණා, තදරතු පැහැති, අත් බමරු හිසකෙස්. ඒවා තැනින් තැන පැසී ගොස්, රතු ඩයි වර්ගයක් ආලේප කරපුවා. දැන් ඔබ කල්පනා කළොත් ඔබට මතක්වේවි තද රතුපැහැති, අඩක් පැසුණු අත්බමරු හිසකෙස්, තිබුණේ කාටද කියන එක. ඒ සර් රේට පමණක් බව. එක් කලිසම් කැබැල්ලකට එම කෙස් ඇලී තිබුණේ ලේ සමග. හාවි සහ ජයිල්ස් දෙදෙනාගේම කෙස් කළු පාටයි. ක්‍රෝෆර්ඩ් ගේ කොණ්ඩය සුදුපාටයි. නීල්සන්ගේ හිසේ එක කෙස්ගහක්වත් නැහැ. ඉතින් සර් රේගේ කාමරයේ තිබූ, ඔහුගේ හිසෙන් ගැළවී ගිය කෙස්ගස්, හාවිගේ කලිසම් කකුල් වලට ආවේ කොහොමද, ලේ ස්වල්පයක ඇලී?"

"දැන් අපට හැමදෙයක්ම පැහැදිලියි හෝම්ස් මහත්මයා" චැප්මන් කීය. "නමුත් මෙහෙම දෙයක් සිදුවෙන්න හේතුව මොකක්ද? ඇයි නීල්සන් හා හාවි එකතුවෙලා අර අසරණ මනුස්සයාව ඝාතනය කළේ?"

"ඒ හරියට මං එන්නම් චැප්මන්" හෝම්ස් කීය. "මං ඊට කලින් කිවයුතු දෙයක් තියෙනවා. මේ විස්තරේ මං හොයාගත්තෙ අද උදේ - ස්කොට්ලන්ඩ්යාඩ්හි අපරාධ ලේඛනාගාරයෙන්. ඔබ අහල තියෙනවද මයිකල් හන්ටර් ගැන?"

පොලිස් නිලධරයන් දෙදෙනා නළල් රැළිකරගෙන මුහුණට මුහුණ බැලුවා මිස පිළිතුරු නොදුන්හ.

"දැනට අවුරුදු හතරකට කලින්, ලිවර්පූල්හි රාත්‍රී සමාජ ශාලාවකදී මහ කෝලාහලයක් ඇතිවුණා" හෝම්ස් කීය. "එකෙදී මයිකල් හන්ටර් නම් තරුණයෙක් සමාජශාලාවේ කළමනාකරුට හා සේවකයෙකුට පිහියෙන් ඇන මරාදැම්මා. මේක ඇසින් දුටු සාක්ෂිකරුවන් කිහිපදෙනෙකු හිටියත් මයිකල් හන්ටර්ව අල්ලාගන්න බැරිවුණා. ඔහු රටෙන් පැන්නා කියලයි ආරංචිය ගියේ..."

"...... දැන් මට මතකයි හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීය. "ඔය පරීක්ෂණය භාරවෙලා තිබුණේ ලෙස්ට්‍රේඩ්ට"

"අන්න හරි. නිව්යෝක් බලා යාත්‍රා කරන නැවක හැංගිලා, එද රෑම මයිකල් හන්ටර් එංගලන්තයෙන් පැනගියා. දැන් මේ ඩොනල්ඩ්





හාවි කියා බොරු නමක් අරගෙන වංශවත් තරුණියක විවාහකරගෙන, ආපහු එංගලන්තයට ඇවිත් ඉන්නේ හන්ටර් කියා ඔබ හිතෙනකින් වත් හිතුවාද?"

"දෙයියෝ සාක්කි!" ග්‍රෙග්සන්ට කෑගැසිණ.

"ඔහු පිළිබඳ සම්පූර්ණ විස්තරය ඔබේ ලේඛනාගාරයේ තියෙනවා" හෝම්ස් කීය. "එද ඔහුගේ මුහුණ පුරා තිබුණු රැවුළ දැන් සම්පූර්ණයෙන්ම මුඩු කරලා. එද දුඹුරු පැහැයට තිබූ කොණ්ඩය දැන් කළුපාට කරගෙන. නමුත් ඇස්දෙක, නාසය, කට ඒ විදියමයි. මට දැන් හිතෙනවා, ඔහු එද වොට්සන්ට හා මට හරි හැටි මුහුණ නොදී මගහැරලා ගියෙත්, අප ඔහු හඳුනාගනීවි කියල ඔහුගේ හිතේ තිබූ භය නිසා වෙන්න ඇති."

"සර් රේගේ දියණිය සමග විවාහවෙලා ඉන්නේ මයිකල් හන්ටර් නම්, ඔහු මේ වගේ අපරාධයක් කළ එකේ පුදුමයක් නෑ" ග්‍රෙග්සන් කීය. "ඒත් ඇයි රෙජී නීල්සන් වගේ කෙනෙක් මෙහෙම දෙයක් කළේ?"

"අන්න ඒ ටික තමයි මම අවසාන වශයෙන් කියන්න තියෙන්නේ" කී හෝම්ස් ඔහුගේ සටහන් පොත අතට ගෙන ඒ තුළ තිබූ කඩදාසි කිහිපයක් අතට ගෙන දිගහැරියේය.

"මට මතකයි එක් වතාවක් මං වොට්සන්ට මෙහෙම දෙයක් කිව්වා" හෝම්ස් කීය. "මෙතැන මට තේරුම් ගන්න බැරි අබිරහසක් තියෙනවා. ඒ රහස සර් රේ, තමන්ගේ බිරිඳටත් හෙළි නොකළ රහසක්. ඉතින් මං කොහොමද මේක විසඳගත්තේ" කියල. අන්තිමට සර් රේගේ පෞද්ගලික ලියවිලි අවුස්සා බලන්න මං තර්ස්ටන් ආර්යාවගෙන් අවසර ඉල්ලුවා. ඊට ඇය අවසර දුන්නා.

සර් රේ ගේ දිනපොතක ඔහු මේ කථාව ඉතා දීර්ඝ වශයෙන් ලියා තිබුණා. මං එහි අපට අදාළ කොටස විතරක් ආර්යාවගේ අවසර ඇතුව පිටපත් කරගත්තා. බොහෝවෙලාවට මේක උසාවියට ඉදිරිපත් කිරීමටත් අපට සිදුවේවි. ඒ නිසා මං මේ ලියවිල්ල කියවා ඉවරවෙලා ග්‍රෙග්සන්ට දෙන්නම්. මෙන්න අහගන්න.

මගේ ආදරණීය එස්තර්,

මේ තොරතුරු ඔබට පෞද්ගලිකව නොකියා, මේ විදියට දිනපොතක ලියා තැබීම ගැන මට සමාවෙන්න. කවද හෝ දවසක

මං හදිසියේ මියගියොත් මේ තොරතුරු දැනසිටීම ඔයාට වැදගත් වෙනවා නිසාකයි.

මගේ පළමු විවාහය ගැනත්, එහිදී ලැබුණු පුතුයා ගැනත් මං ඔබට කියා ඇති. මගේ බිරිඳ මියගිය පසු ඔහු හදා ගැනීමට, බිරිඳගේ අක්කා වන එමිලිට හා ඇගේ සැමියා බොබ් ඉලිංවර්ත්ට භාරදුන් බවත් ඔබ දන්නවා. ඔවුනට ජීවත්වීම සඳහා මං වරින්වර මුදල් දුන්නා. නමුත් ඔවුන් පිටිපළාත්වලට මාරුවී යද්දී එය ක්‍රමයෙන් අතපසු වී ගියා. ඒකට මමත් වැරදිකාරයෙක්. බොබ් ඔහුගේ රැකියාවෙන් විශ්‍රාමගත් පසු ඔවුන් ලන්ඩනයේම පදිංචි වුණා. ඒ නිසා අප අතර ළඟ සම්බන්ධයක් තිබුණේ නෑ.

මගේ පුතා නොයෙල්, වෙළඳ නැව් සමාගමක නාවිකයෙකු ලෙස රැකියාවට බැඳෙන්න හදන බව, එමිලි අක්කා මට දන්වා එව්වා. මං ඒකට විරුද්ධ වුණා. මට උවමනා වුණේ ඔහු කාර්මික විද්‍යාලයකට යවලා අධ්‍යාපනයක් ලබාදෙන්න. නමුත් මං කියූ දෙය ඔවුන් ගණන් ගත්තේ නැහැ. නොයෙල් හදාවඩා ගත් දෙමාපියන් හැටියට, ඔවුන් ගත් තීරණයට දිගින් දිගටම විරුද්ධ වෙන්න, මට හැකියාවක් තිබුණේ නැහැ. නාවිකයෙකු ලෙස ඔහු ගියා ගියාමයි; එයින් පසු පුතා ගැන සෑහෙන කාලයකට කිසිම ආරංචියක් ලැබුණේ නැහැ.

නොයෙල් ආපහු එංගලන්තයට ආවේ බොබ් හා එමිලි මියගිහින් අවුරුදු දෙකකට පස්සෙ. ඔහු මහත්මයෙකු හැටියට ආවා නම් මට ලොකු සන්තෝෂයක්. නමුත් ඔහු ආපහු එංගලන්තයට ආවෙ බේබදු මැරවරයෙකු හැටියට. ඔහු ඒ කාලවල ඇවිත් වරින් වර මගෙන් මුදල් ඉල්ලාගෙන ගියා. ඒ බව සේවකයන් මගින් ඔබට ආරංචි වෙන්න ඇති. නමුත් ඔහු ගැන තොරතුරු මං කාටවත් හෙළි නොකර රහසක් හැටියට තබා ගත්තා.

මීට අවුරුද්දකට විතර කලින් මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවේ රිජන්ට් වීදියේ ශාඛාව බිඳලා, මුදල් මංකොල්ල කෑ සිද්ධිය ඔබට මතක ඇති. ඒ සිද්ධියේදී ආරක්ෂක භටයන් දෙදෙනෙකු මරණයට පත්කරලා රන්පවුම් තිස්දහසක් කොල්ලකෑ බව පුවත්පත් වල පළවුණා.

ටික දවසකට පස්සේ ඒ චෞර කල්ලිය පොලිසියෙන් අල්ලා ගත්තා. පුවත්පත් වල පළවුණු ඒ ප්‍රවෘත්තිය ගැන මට කිව්වේ රෙජී නීල්සන්.





"රේ. මේ පත්තරය කියවා බලන්න. මේ මංකොල්ල කල්ලියේ නායකයා නොයෙල් ඉලිංවර්ත් නම් කෙනෙක්. ඒ ඔබේ පුතාවත්ද?" ඔහු ඇසුවේ උපහාසාත්මක සිනාවක් පාමින්.

"ඇයි ඔබ එහෙම කියන්නේ?" මං ඇහුවා.

"මේ පත්තරේ තියෙනවා, හොරාගේ පියා කෙන්ට් ප්‍රාන්තයේ ඉපදී, දුම්රිය ස්ථානාධිපති වරයෙකු බවට පත්වී මියගිය, රොබට් ඉලිංවර්ත් නම් තැනැත්තෙක් කියලා. ඒ ඔබේ මස්සිනා විය යුතුයි. ඔහුට හිටියේ ඔහු හදාගත් ඔබේ පුතා විතරයි."

මං පුවත්පත අතට අරගෙන කියවා බලද්දී මාව වෙව්ලුවා. කතාව ඇත්ත. මේ අපරාධ කල්ලියේ නායකයා මගේ පුතා. ඔහු මැරවරයින් අතර ප්‍රසිද්ධවෙලා ඉඳල තියෙන්නේ හෝල්බෝන්හි නොයෙල් යන නමින්. දෙවියනේ සාක්කි! මේ මගේ ලෙයින් බිහිවුණු මගේම පුතා නේද? ඔහු මේ වගේ මැරවරයෙකු වුණේ කොහොමද? මට හිතාගන්නවත් බැරිවුණා. ඔහු බේරාගැනීමට මං නීතිඥයින්ට විශාල මුදලක් වියදම් කළා. ඒ නීල්සන් හරහා. නමුත් වැඩක් වුණේ නැහැ, නොයෙල් ජීවිතාන්තය දක්වා හිරේට නියමවුණා.

එදා ඉඳන් නීල්සන්ගෙන් මට කිසිම ගැලවීමක් තිබුණේ නැහැ. ඔහු මාව ප්‍රාණ ඇපකාරයෙකු කරගෙන මගෙන් කප්පම් ගත්තා. මගේ පුතා හිරේ ගිය මිනීමරු අපරාධකාරයෙකු බව හෙළිකළොත්, මට මුහුණ දෙන්න වෙන්නේ විශාල අපකීර්තියකට බව, නීල්සන් නැවත නැවතත් මට මතක් කළා. ඔහු මගෙන් මේ විදියට ගරාගත් මුදල් වියදම් කළේ ඔහුගේ පවුලේ යහපත වෙනුවෙන් නම් මට ඉවසා ඉන්න තිබුණා. නමුත් ඔහු ඒ සියල්ලක්ම වියදම් කළේ, අශ්වරේස් වලට, රේස් ඔට්ටු ඇල්ලීමට. එයින් ඔහු හැමදාමත් පරාජය වුණා.

අන්තිමේදී ඔහුගෙන් නිදහස් වෙන්න බලාගෙන මං ඔහුගේ නමට ඉඩම් කැල්ලක් ලියන්න තීරණය කළා. ඒ ඉඩම් කැල්ලත් මුදල් පාරිතෝෂිකයකුත් අරගෙන මගේ රැකියාවෙන් ඉවත්වෙලා යන්න කියලා, මං නීල්සන්ගෙන් ඉල්ලා හිටියා. නමුත් ඔහු ඊට කැමැති වුණේ නැහැ. මාව අත්හැරදමා යන්න ඔහුගේ බලාපොරොත්තුවක් තිබුණේවත් නැහැ. මගේ කම්හලේ සේවකයන් උසිගන්වලා ඔවුන් වැඩවර්ජනයකට යොමු කළෙත් නීල්සන් බව මං දැන හිටියා.

අන්තිමට දැන් ඔහු මගෙන් ඉල්ලා හිටින්නේ, මගේ විස්කෝතු කම්හලේ අයිතියෙන් භාගයක් ඔහුට පවරන ලෙස. මං එය කෙළින්ම ප්‍රතික්ෂේප කළා. මං ගැන හැමදෙයක්ම පුවත්පත්වලට

www.sinhalaelibrary.com

හෙළිකරන බව කියමින් ඔහු මට තර්ජනය කරනවා. මං අමාරුවෙන් හරි හම්බකරගත් දේපොළ හිමිවිය යුත්තේ මගේ බිරිඳට හා දරුවනට මිස මේ වගේ තක්කඩියෙකුටද?

සිබිල් ඇගේ සැමියා සමග ඇමරිකාවේ සිට ආ ද පටන් මගේ කරදර තවත් වැඩිවුණා. ඔවුනට පදිංචියට නිවසත්, නිතිපතා මුදලුත් දුන්නත්, ඩොනල්ඩ් ඉන්නේ මා සමග වෛරයෙන්. මට එරෙහිව ඩොනල්ඩ්ව කුපිත කරන්නේ නීල්සන් බව මං දන්නවා. ඔහුට උවමනා වී තිබෙන්නේ මාව තවත් අසරණ තත්ත්වයට පත්කර, ඔහුගේ පාලනයට යටත්කර ගැනීමට. මේ දෙන්නා නගරයේ හෝටලයක මත්පැන් තොල ගාමින් නිතර නිතර රහස් කතාබහක යෙදෙන බව මට ආරංචිවුණා. සැක නෑ. ඒක මට එරෙහිව මොකක් හරි කුමන්ත්‍රණයක් වෙන්න ඇති. ඒ මොන අරමුණක් ඉටුකරගන්න ද කියා දෙවියන් තමා දන්නේ. දෙවියන් කවද කෙසේ නම් මේ ප්‍රශ්න විසඳයිද?......."

"මහත්වරුනි ඒ ලිපියේ තවත් හුගක් කරුණු තිබුණා. නමුත් දැනට මේ හරිය ප්‍රමාණවත් වේවි කියල මං විශ්වාස කරනවා" කියා හෝම්ස් තම කථාව අවසන් කළේදී ග්‍රෙග්සන් සහ වැප්මන් තම අසුන් වලින් නැගී සිටියහ.

"හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීය. "අපි ඔබට මුළු හදින්ම කෘතඥ වෙනවා. මහා අවුල් ජාලයක්ව තිබුණු මේ ගැටලුව ඔබ සම්පූර්ණයෙන්ම විසඳා දුන්නා..."

"මට ස්තුති කරන්න ප්‍රමාද වෙන්න එපා ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "වහාම ගිහින් අපරාධකාරයන් දෙන්නා අත්අඩංගුවට ගන්න"

* * *

සර් රේමන්ඩ් තර්ස්ටන් ඝාතනය ගැන නඩු විභාගය සති තුනක් තිස්සේ විභාගයට ගැනිණ. ඩොනල් හාඩි හෙවත් මයිකල් හන්ටර් කලින් ද්විත්ව මිනීමැරුමකට පොලීසියට අවශ්‍යව සිටි පුද්ගලයෙකු නිසා එම නඩුව ද අධිකරණය වෙත ගෙන ඒමට කටයුතු කෙරිණි.

සර් රේමන්ඩ් ඝාතනය සිදුකරන ලද්දේ ඩොනල්ඩ් හාඩි විසින් බව ඔප්පුවීම නිසා ඔහු එල්ලුම්ගස්ට නියම විය. රෙජී නීල්සන් වෙත ද මරණ දඬුවම නියම වුවත් පසුව අභියාචනාධිකරණයේදී ඔහුගේ දඬුවම ලිහිල් වී ජීවිතාන්තය දක්වා සිරදඬුවමක් නියම විය.

නිමි

www.sinhalaelibrary.com

Reading Purpose Only. Not For Print

# ප්‍රදීපාගාරයේ විභ්‍රමය

සහ තවත්
ෂර්ලොක් හෝම්ස් කථා

**THE ADVENTURE AT THE LIGHT HOUSE**

- ප්‍රදීපාගාරයේ විභ්‍රමය
- ඉසදෝරා පර්සානෝ අභිරහස
- වැහැම් හි ගැටලුව
- රතු කුඩැල්ලා
- උපන්දින සාදය

මිල රු. 225/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන

www.sinhalaelibrary.com